
ආචාර්ය මහා බූවා ඤාණ සම්පන්නෝ හිමියන් විසින් රචිත

# අති උත්තම ආචාර්ය
# මන් භූරිදත්ත මහා තෙරුන්ගේ
# අධ්‍යාත්මික චරිතාපදානය



සිංහලට පරිවර්තනය
ආචාර්ය භික්ඛුනී කුසුමා විසිනි

# අති උත්තම ආචාර්ය මන්

# භූරිදතත මහා තෙරුන්ගේ

# ආධ්‍යාත්මික චරිතාපදානය

මෙම පුස්තකය ධර්මදානය පිණිසයි.
නොමිලේ බෙදා හැරීමට පමණි.

# අති උත්තම ආචාර්ය
# මන් භූරිදත්ත මහා තෙරුන්ගේ
# ආධ්‍යාත්මික චරිතාපදානය

**ආචාර්ය මහා බූවා ඤාණ සම්පන්නො**
**හිමියන් විසිනි.**

තායි භාෂාවෙන් ඉංග්‍රීසියට පරිවර්තනය
**භික්ඛු ඩික් සීලරතන හිමියන්**

විසින්

ඉංග්‍රීසි භාෂාවෙන් සිංහලට පරිවර්තනය
**ආචාර්යා භික්ඛුනී කුසුමා විසිනි.**

**වට්පා බාන් ටාඩ් හි වන වාසී හිමි.**

මෙම පුස්තකය නොමිලයේ බෙදා හැරීමට පමණි
ධර්මදානය පිණිසයි.

**Copyright © 2005**

**by Venerale Acarya Maha Boowa Nyanasampanno**
**All commercial rights reserved**

This book is a *free gift of Dhamma* and may not be offered for sale; for as the Venerable Acarya Maha Boowa Nyanasampanno has said, *"Dhamma has a value beyond all wealth and should not be sold like goods in a market place"*

Commercial reproduction of this book, in whole or in part or in any form, or by any mechanical or electronic means, is prohibited. Permission to reproduce in whole or in part, by any means, for free distribution as a gift of Dhamma, however, is hereby granted, and no further permission need be obtained.

*Inquiries may be addressed to:*
Forest Dhamma Books
Bann Taad forest Monastery
Banin Taad, Ampher Meung
Udorn Thai 41000
Thailand.

email: fdbooks@gmail.com
www.forest dhammabooks.com

ISBN 974-92007-4-8

U.D. Copyright office registration number TX5 - 864-808

Third Printing January 2005

Printed in Thailand by *Silpa Siam Pakaging & Printing Co., Ltd. Tel: (662) 444 3351-9*

Official Maha Boowa Website: *www.luangta.com/english*

# පටුන

පරිවර්තකගේ හැඳින්වීම i-xiii
කතීෘවරයා හැඳින්වීම xiv

1. මූලික අවධිය
අනාවැකිය 2-4
සංඥාව 4-10
ආචාර්ය සාඕ කන්ටසීලො 10-15
සරිකා ගල්ගුහාව 15-26
අර්හත් ශ්‍රාවකයන්වහන්සේලා 26-32

2. මධ්‍යම අවධිය
ධූතාංග පුහුණුව 41-47
අවතාර පිළිබඳ භික්ෂුවකගේ භීතිය 48-56
ගම්බද සිරිත් සහ ඇදහිලි 56-64
දුෂ්කරතා සහ අසරණවීම 64-71
ක්‍රමානුකූල ඉගැන්වීම 71-78
වෙනස්කම් ඇත්තේ සිතුවිලිවල 78-81
ළිඳ සෑරීමේ සිද්ධිය 81-90
සියලු පව්වලින් මිදුන උතුම් මනුෂ්‍යයෙක් 90-99

3. හදවතේ විමුක්තිය
ආධ්‍යාත්මික සහකාරිය 114-120
ඉතා උතුම් අගය කිරීම 121-126

4. වියාං මායි හි වැඩ සිටි කාලය
මල්ලව පොර ශූරයා 139-143
වෙස් වලාගත් කොටි 144-156
ප්‍රබල විජ්ජා 156-161
ලොකු අයියා වූ ඇත් රජා 162-166
පිරී ඉතිරී ගිය යෞවනය 167-173
කර්මයේ ගුප්ත විපාක 173-179
සා ගින්නෙන් පෙළෙන ප්‍රේතයෝ 179-187
උග්‍ර විවේචනාත්මක නාගයා 188-195
රහතුන්ගේ පරිනිර්වාණය 195-199
ධාර්මික යුද්ධ භටයා 199-212

5. **අසාමාන්‍ය ප්‍රශ්න, බුද්ධිමත් පිළිතුරු**
පරිපූර්ණ ආත්ම විශ්වාසය 215-222
ඉහත ආත්ම 222-232

6. **අවසාන කාලය**
උෟරන් සමග සහවාසය 242-256
රළු පරුෂ හික්මවීම් ක්‍රම 252-262
ධර්මය තුලින් රෝග චිකිත්සාව 262-270
කොටි ඉතා හොඳ ගුරුවරු වෙති 270-280
උන්වහන්සේගේ අවසාන රෝගය 280-293
ආදාහනය 294-299

7. *දායාදය The Legacy*
ධාතු පරිවර්තනය 306-312
අනිකුත් ප්‍රාතිහාර්‍ය්‍ය 312-323
ආචාර්‍ය්‍ය චොබ් ගේ නිර්හිත ක්‍රියා 323-331
අවසානය 331-340


උපග්‍රන්ථය 1 341-343

උපග්‍රන්ථය 2 344-348

About the translations 349-349



අතිපූජනීය ආචාර්ය මන් භූරිදත්ත තෙරුන්



ආචායර්‍ී මන්ගේ ආදාහනයෙන් පසු ශේෂ වූ ඇට කැබලි කල් යාමේදී පළිඟු කැට වැනි විනිවිද පෙනෙන නා නා වර්ණවත් පාරභාසක (පාර වර්ණක) ධාතුවලට පරිවර්තනය විය.

# පරිවර්තකයාගේ හැඳින්වීම

නවීන තායි බුදු දහමේ අති ශ්‍රේෂ්ඨ පුද්ගලයා ලෙස පූජණීය ආචාර්‍ය මන් භූරිදත්ත හිමි ප්‍රසිද්ධ වී ඇත. උන් වහන්සේගේ ජීවිත කාලයේදී දස අත පැතිරී ගිය ගුණ සමුදාය වූයේ ප්‍රධාන වශයෙන් උන් වහන්සේ තුළ පැවති අසාමාන්‍ය ධෛර්‍යය, තපස සහ තම අනුගාමිකයින් වෙත දැක්වූ ප්‍රබල විනය ගරුක භාවය වේ. පරිනිර්වීමෙන් දැන් වර්ෂ 50ක් පමණ ඉක්ම වී ඇතත් බෞද්ධ ජනතාවගේ ගෞරවණීය පිළිගැනීමේ විශිෂ්ටත්වයක් ඇත. එනම් බුදුරජාණන් වහන්සේගෙ ' ආර්‍ය පර්යේෂණය තුළින් ජීවිත පරිනාමය වූ අපූර්ව සිද්ධිය මුන්වහන්සේගේ ජීවිත පරිනාමයේ ද දැක ගත හැකි බවය.

ආචාර්‍ය මන් භික්ෂුන්වහන්සේගේ ජීවිත චරිතය ලිය වී නොතිබුණ නමුත් උන්වහන්සේගේ ළඟින් ඇසුරු කළ ශ්‍රාවකයන් වහන්සේලාගේ එම චරිතය පිළිබඳ චමත්කාර සිද්ධීන් අලලා උන්වහන්සේගේ පරිනිර්වීමෙන් අවුරුදු 20කට පසු මෙම ග්‍රන්ථය සම්පාදනය කළහ. මෙම ග්‍රන්ථයේ සුවිශේෂ ජනප්‍රියතාවය නිසා තායි බෞද්ධයන් තුළ බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මයේ සත්‍යතාවය හා නිර්වාණාවබෝධය කිරීමේ හැකියාව අද දිනත් ඇති බව තහවුරු වී ඇත. අවු. 2500කට ප්‍රථම දස දහස් සංඛ්‍යාත රහතුන්වහන්සේලා සිටි බවත් ''මගඵල'' ලබා ගැනීමේ භාග්‍යය අදටත් වලංගු බවත් තායි බෞද්ධයෝ පිළිගනිති. ආචාර්‍ය මන් ගේ නිවන් අවබෝධය පිළිබඳ කථා පුවත මෙම ග්‍රන්ථයේ අඩංගු වී ඇත. එය ඉතිහාස ප්‍රවෘත්තියක් හෝ වියැලී ගිය අදෘශ්‍යමාන සත්‍යයක් නොවේ. එය අප අතට පත් ජීවමාන දායාදයකි. සත්‍ය තොරතුරකි. දීප්තිමත් ආලෝකයකි. උතුම් නිර්වාණ අවබෝධය පිණිස යමෙක් වෙර වඩා නම් ඔහුට එය ලබා ගත හැකි බව ඔප්පු වී ඇත. බුදු සව්වෝ චීවර ධාරී ආරාමික ජීවිත ගත කරන බුද්ධ ධම්ම සංඝ සංකේතයක් පමණක් නොව සමහර බුදු සව්වෝ බුදු දහම අවබෝධ කළ සජීවී උතුමන් බව මෙම පුස්තකයෙන් මනාව පැහැදිලි වේ.

ආධ්‍යාත්මික සුවය ලබා ගැනීමේ අති උතුම් චේතනාව සාක්ෂාත් කර ගැනීමට නම් අදාළ පිළිවෙත් අනුගමනය කළ යුතුය. බුදුරජාණන් වහන්සේ දෙසූ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ යුතුය. අත්තකිලමථානුයෝගය හෙවත් ශරීරයට දැඩි දුක් දීම බුදු රජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ නමුත් සුවිශේෂ තවුස් ජීවිතයට අදාළ ධූතාංග පිරීම නිසා සම්මා වායාම සපිරෙන බව වදාළ සේක. මධ්‍යම ප්‍රතිපදාව යනු සැප පහසු ලැබීමට දුක් මග හැරීමක් නොව, එය මනසේ හට ගන්නා කෙළෙස් හොඳාකාර මර්දනය කරමින් සියලු බාධක මැඬ පවත්වමින් තම ඉලක්කය කරා ගෙන යන සාර්ථක ප්‍රතිපදාවකි. ආධ්‍යාත්මික

දියුණුව දැඩි උත්සාහයකින් අනන්ත බාධක හිරිහැර මධ්‍යයේ සිදු කළ යුතුය. මක්නිසාද යත් තම අධ්‍යාත්මික බලවේග, පුරුදු තුළින් කෙළෙසුන් උද්ගතවී තමාටම අභියෝගයක් වන බැවිනි. එබැවින් ආධ්‍යාත්මික සටන ගෙන යන භටයා තුළ මානසික හා ශාරීරික ශක්තිය තිබිය යුතුය. මැලිකම, තණ්හාව, මානය, උඩඟුකම ආදිය බලවත් බාධක වෙති. මෙවැනි සියුම් කෙළෙස් මර්දනය කිරීමට ධූතාංග රැකීම ඉතා අවශ්‍ය බව බුදුරජාණන් වහන්සේ දෙසූ සේක. එම තවුස්දම් තුළින් භික්ෂුවකගේ දෛනික ජීවිතය ඉතාම සරල, නිහතමානී, ආත්ම සංයමයකින් ලෙස ඉතා තීක්ෂණ ලෙස නිරීක්ෂණය කළ යුතු බව පැහැදිලි වේ. ධූතාංග රැකීමේදී මේ අවශ්‍යතාවය සපිරේ. එබැවින් ධූතාංග රකින භික්ෂුව බුදුරජාණන් වහන්සේගේ විශේෂ ගෞරවයට පාත්‍රවිය.

මෙසේ බෞද්ධ භික්ෂුවක් ගිහිගෙය හැර දමා සිවුරු පිරිකර දරමින් පිඬු සිඟා යමින් ආරණ්‍යවාසය ප්‍රිය කරයි. බෞද්ධ භික්ෂුවකගේ නියම ස්වරූපය ධූතාංග භික්ෂුව තුළින් පිළිබිඹු වේ.

මෙවැනි දුෂ්කර ජීවන රටාවක් අනුගමනය කරමින් භාවනායෝගීව වාසය කරන භික්ෂුව ''ධූතාංග කර්මස්ථාන'' රකින්නෙකැයි හැඳින්වේ. මෙම ප්‍රතිපත්තිය තුළින් ලෝභ, ද්වේශ, මෝහය නිසා හට ගන්නා සියුම් කෙළෙස් පවා උදුරා දැමිය හැකිවේ. එහෙයින් සසර පැවැත්ම සිඳී යයි. කර්මස්ථාන යනු භාවනා දියුණු කිරීමයි. ධූතාංග යනු එම භාවනාවට අවශ්‍ය දුෂ්කර ප්‍රතිපත්ති වේ. මේ දෙක එකිනෙකට උපකාරක ධර්මයන්ය. විනය නීති රැකීම නිරායාසයෙන්ම සිදුවන බැවින් බෞද්ධ භික්ෂුවකගේ ප්‍රතිපත්ති රැකීමේ ප්‍රබල අඩිතාලමක් ලෙස ධූතාංග ක්‍රියාත්මක වේ.

ආචාර්‍ය මන්ගේ උපදේශන මේ තාපස ජීවිතය තුළ ගැබ් වී ඇත. පැවිදි ජීවිතය ආරම්භයේ සිට අවසානය දක්වා උන්වහන්සේ අනුගමනය කළ රූක්ෂ ප්‍රතිපත්ති තම ගෝල බාලයින්ට පමණක් නොව මුළු මිනිස් සංහතියටම කදිම ආදර්ශයකි. තායිලන්තය තුළ ධූතාංග කර්මස්ථාන ප්‍රතිපදාව නැවත ලෝකයාට හැඳින්වූ මහා පුරුෂයෙක් ලෙස උන්වහන්සේ පිළිගෙන ඇත. උන්වහන්සේ අනුග මනය කළ මේ ධූතාංග පූරණය අද දක්වා තායිලන්තයේ විශේෂ ගෞරවයකට පාත්‍රවෙමින් පවතී.

උන්වහන්සේ තුළ අග්‍ර ගණයේ ගුරුවරයෙකුගේ සහජ හැකියාවක් තිබ-ුණි. උන්වහන්සේගේ උපදේශනය ලැබූ බොහෝ භික්ෂුන්වහන්සේලා උත්තරීතර මනුෂ්‍ය ධර්ම පූර්ණ කරමින් තමනුත් ලෝකය පිළිගත් ආචාර්‍යයවරුන් ලෙස නොයෙක් රටවල දක්නට ලැබේ. එය තුළින් ධූතාංග කර්මස්ථාන පුහුණුව ලෝකයේ ප්‍රචලිත වෙමින් පවතී. උන්වහන්සේගේ අති උතුම් ප්‍රතිපදාව ජීවිතය

අවසාන කාලයේ බොහෝ අයගේ පිළිගැනීමට පත් විය. එය උන්වහන්සේගේ පිරිනිවීමෙන් පසු තව තවත් විකාශනය වී අද මුළු තායිලන්තයම උන්වහන්සේ ''ජාතික වස්තුවක්'' ලෙස පිළිගනිති. විසිවෙනි ශත වර්ෂයේ ජීවත් වූ ආයඍ සංඝ රත්නයක් ලෙස ලොව පුරා පිළිගනිති.

සසර දුක් කෙළවර කිරීමේ අදහසින් උන්වහන්සේ නෛෂ්ක්‍රම්‍ය ගුණය පිරූහ. පා ගමනින් ගමින් ගමට හුදකලාව යමින් කඳු මුදුන් කැලෑ ආදී නිහඬ පරිසරය සොයමින් භවනා මනසිකාරය පූර්ණ කළහ. මුළු ජීවිතයම එළිමහනේ අව් වැසි සීත උෂ්ණ, මැසි මදුරු පරිසරයේ ගෙවී ගියේය. ඒ නිසා පරිසරයේ සුන්දරත්වය බොහෝ අගය කළහ. කඳු හෙල් වන පෙත් ගංගා ගිරි ගුහා උන්වහන්සේගේ ප්‍රියතම පරිසරයන්ය. කොටි, වලස් ආදී ලොකු කුඩා වන සතුන්ගෙන් පරිසරය ගහණ විය. මිනිස් ජනාවාස ඈතින් පිහිටියේය. උන්වහන්-සේ පිණ්ඩපාතයෙන් ජීවත් වූ බැවින් ඉතා දුප්පත් ගැමියන්ගේ භක්ති ආදරයට පාත්‍ර විය.

ඉතා දුෂ්කර දිවි පෙවෙතක් වුවද ආරණ්‍යවාසී භික්ෂුවකට එම පරිසරය සුවදායක නිවෙස් විය. පාසැල විය. අත්දැකීම් ලබන පුහුණු මධ්‍යස්ථානය විය. බුදු දහම නියම ආකාරයටම පිළිපදින විට එය තම ආරක්ෂාව විය. තායිලන්තයේ නොදියුණු ගම්බද කැලෑ පරිසරය 20 වෙනි ශත වර්ෂයේ වුවද ඉතා පැරණි ශිෂ්ටාචාරයකි. එය බුද්ධ කාලීන අවුරුදු 2500කට ප්‍රථම තිබූ මිනිස් ජීවිතය පිළිබිඹු කරන්නකි.

ආචායඍ මන් ගේ මෙම ජීවන ගමනට පසුබිම වූ සම්ප්‍රදායික පරිසරය ගැන දැන ගැනීම සුදුසුය. 19-20 වෙනි සියවසේදී තායිලන්තයේ ප්‍රාන්ත ප්‍රදේශ අගනුවරෙ පැවති ආණ්ඩු බලයට යටත් නොවීය. ඊට හේතුව විශාල ඝන කැලෑවලින් ගහන වූ නිසාත් තාර පාරවල් නොමැති බැවින් ගමනාගමන දුෂ්කරතා නිසාත්ය. 80%ක් පමණ තායිලන්තය මෙවැනි වල්බිහි වූ මිනිස් වාසයක් නොවූ විශාල ඝන වනාන්තරයන්ය. ඉතා සුළු වශයෙන් ජීවත් වූ ආදී මිනිසා මෙන් මෙහි ප්‍රාන්තයන්හි ගම්වාසීන්වන සත්වයින් ඝාතනය කරමින් විසූ වැද්දන්ගේ ස්වරූපය විය. ඉතා සුළු ගොවිපලවල් තිබුණි. අධික බිය ගෙන දෙන අලි කොටි ආදීන්ගෙන් බිය පැමිණෙන බැවින් ඔවුහු කුඩා ජනාවාස වලට සීමා වූහ. එක ගමක සිට අනිත් කිට්ටුම ගමට යාමට මහ වනාන්තරය තුළ අඩි පාරවල් ඔස්සේ මුළු දවසක් ගමන් කළ යුතු විය.

මෙම අඩවියේ විසූ මිනිසා ස්වභාව ධර්මයට අනුව තම ගති පැවතුම් පවත්වා ගැනීමේ සම්ප්‍රදායකට හැඩ ගැසී සිටියහ. අමනුෂ්‍ය වාසයට වඩා යෝග්‍යවීම නිසා අලි කොටි වලස් ආදී භයානක සත්ත්වයින් පමණක් නොව භයානක යක්ෂ භූත ආදීන්ගෙන් ද ගහණ වියි. විශාල බෙන්ගාල කොටින්ගේ

නිජ භූමිය විය. එහි වාසය කළ මිනිසුන්ට පමණක් නොව වනවාසී භික්ෂූන්ට ද මෙම පරිසරය එකසේ බිය එලවන්නක් විය.

එසේ හෙයින් මෙම භයානක වනාන්තරයේ හුදකලා ගමන් කිරීම යනු මහත් ආශ්චර්‍යයකි. මෙවැනි පරිසරයක ආචාර්‍ය මන් සහ ධූතාංග භික්ෂූහු සැරිසරූහ. උන්වහන්සේලාට තිබූ එකම ආයුධය තම භාවනා බලය පමණි. මෙවැනි වනාන්තර කඳු හෙල් එම භික්ෂූන්ට තම අධ්‍යාත්මයට කිඳා බැස කෙළෙස්වල තත්ත්වය වටහා ගැනීමට කදිම පුහුණු මධ්‍යස්ථානයක් විය. තමාගේ නැගී එන කෙලෙස් සමඟ උග්‍ර සටනක යෙදීමට සිදුවිය.

ආචාර්‍ය මන් බුදුරජාණන්වහන්සේගේ ධර්මයට අනුව උග්‍ර තපස් රකිමින් ජීවත් වූ ආකාර, ඇසූ දුටුවන් මවිත කරමින් උන්වහන්සේගේ ආර්‍ය සඟ ගුණ විදහා දක්වයි. ආර්‍ය සංඝයාගේ අතීත ප්‍රවෘත්ති අප පැරණි ධර්ම ග්‍රන්ථයන්ගෙන් කියවා මවිත වෙමු. ඒ හා සමාන ආචාර්‍ය මන්ගේ ජීවිත කථාව මුල සිට අග දක්වා චමත්කාරය. බුදු දහමට අනුව තම කෙළෙස් දුරු කිරීමට ගත් ප්‍රයත්නය මිනිසාට කළ හැකි බව ඔප්පු කිරීමකි. එසේ හෙයින් 2500 අවුරුදු පැරණි මේ බුදු දහම තුළින් මිනිසාග් සියළු දුක් නසා නිවන් අවබෝද කිරීමට අදත් හැකි බව පිළිගත යුතුය.

එබැවින් මේ ජීවිත කථාව ලියන්නේ ආචාර්‍ය මන්ගේ ජීවිත කථාව පමණක් නොව නිවන් මාර්ගය සොයමින් යන පින්වතුන්ට විශාල ආභාෂයක් ඇති කිරීමට ගත් ක්‍රියා මාර්ගයක් ලෙසය. එබැවින් සියලු අඩංගු කරුණු සම්පූර්ණ තොරතුරු නොවන බව පිළිගත යුතුය. මෙම පුස්තකය තායි භාෂාවෙන් ලියූ ලේඛකයාගේ අරමුණ නිවැරදි ප්‍රවෘත්ති සැපයීමට වඩා තමා අත්දුටු සත්‍යයන් ප්‍රකාශ කිරීමය. මෙහි අඩංගු කරුණු සම්‍යක් සංකල්පනාවට පාත්‍ර වේවායි මෙම පිළිවෙත් මාර්ගය ආදර්ශයක් වේවා !

ආචාර්ය්‍ය මන්ගේ ඉගැන්වීම් ක්‍රම සුවිශේෂ බව මෙම ග්‍රන්ථයෙන් පැහැදිලි වේ. උන්වන්සේට අමනුෂ්‍යයන් සමඟ සම්බන්ධ වී අදහස් හුවමාරු කිරීමට දක්ෂතාවයක් තිබුණි. නිරන්තරයෙනම දෙවිවරු බ්‍රාහ්මණයන් පමණක් නොව නාග, යක්ෂ, ප්‍රේත ආදී නොයෙක් අමනුෂ්‍යයන් සමඟ ද අපාය තිරිසතුන් සමඟ ද කථා බහ කළ බව පනේ. උන්වහන්සේට දිබ්බ චකඛුව සහ දිබබ සෝතය ඇති බව ඉන් පැහැදිලිය.

විද්‍යා තාක්ෂණයේ පිළිගත් සිද්ධාන්ත වලට වඩා දියුණු මනසකින් ලැබිය හැකි දැනුම ඉතා වෙනස් වේ. නොයෙක් තරාතිරමේ දෙවිවරු ඇති බවත් ඒ අය ඉතා සියුම් තීක්ෂණ ඉන්ද්‍රියන් පරිහරණය කරන බවත් මෙම කථා පුවත් අනුසාරයෙන් පෙනේ. මිනිසාගේ ප්‍රකෘති ඉන්ද්‍රියන්ට විෂය නොවූ අපට නොපෙනෙන ලෝක

අනන්ත අප්‍රමාණ ඇති බව සිතිය හැකිය. ඒවා භෞතික මට්ටමෙන් නිරාවරණය නොවේ. මෙසේ අතින්ද්‍රිය ශක්තීන් නිසා සම්මුති සත්‍යය අභිබවා පරමාර්ථ සත්‍ය අවබෝධ කිරීම පහසු වේ.

මෙවැනි අධිමානුෂික ශක්තීන් උපයෝගී කොට ආචාර්ය මන් බුදු දහම දේශනා කිරීමට මහත් ආයාසයක් ගත් සේක. අමනුෂ්‍යයන්ගෙන් ගහණ වූ එම පරිසරය තුළ උන්වහන්සේගේ ධර්මය ශ්‍රවණය කළ මාර්ගය පුහුණු කළ භික්ෂූන්වහන්සේලාට සහ මිනිසුන්ට වඩා අමනුෂ්‍යයෝ වූහ.

ආචාර්ය මන් මෙවැනි ආශ්චර්යමත් සිද්ධීන් හැඳින්වූයේ ''හදවතේ ගුප්ත බලය'' යනුවෙනි. අපි ජීවත්වන පරිසරය අපට නිසැකව අවබෝධ වන්නාක් මෙන් අපට නොපෙනෙන නමුත්, එම ලෝක වාසීන්ට අපට මෙන්ම ඔවුන්ගේ පරිසරය සත්‍යයකි. තායි භාෂාවෙන් ''හදවත'' ''මනස'' එකම අදහසක් ඇති පද වුවද ''හදවත'' යනු මනසට වඩා සංකීර්ණ වේදනා - සඤ්ඤා - සංඛාර තුළින් හැඟීම් ඇති කරවන තත්ත්වයකි. හදවත යනු සියලු ජීවින්ගේ උසස්ම ඉන්ද්‍රිය වේ. එබැවින් ධර්මය අවබෝධ කිරීමට ඇතිවන හදවතේ අරගලය උන්වහන්සේ පෙන්වා දෙයි.


මනස හෙවත් චිත්තය යන වචනය උන්වහන්සේ යොදන්නේ ''දැනීම'' ගෙන දෙන ඉන්ද්‍රිය ලෙසය. මෙවැනි වචනවලට ඉංග්‍රීසි වචන සෙවීම දුෂ්කර බැවින් පාලි වචනය යොදා ඇත.

කර්තෘ - ආචාර්ය මහා බූවා ඤාණ සමපනෙනා

වර්තමාන තායි බෞද්ධයන් අතර ගරු ආචාර්ය මහා බූවා ඤාණස-



මපනෙනා හිමියන් ශ්‍රේෂ්ඨ ස්ථානයක්  දරයි. උන්වහන්සේගේ දේශනා වන්ගේ



ශෛලිය සහ අද්විතීය පුහුණුව නිසා සෑම තරාතිරමේම පුද්ගලයන්ගේ ගෞරව සම්භාවනාවට පත් වී ඇත. උන්වහන්සේගේ ගති පැවතුම් හා නිහතමානීභාවය නිසා ආචාර්ය මන්ගේ ජීවිත ප්‍රවෘත්තිය, ලෝකයාට හඳුන්වාදීමට ඉතාම සුදුසු හිමි නමකි. උන්වහන්සේ අචාර්ය මන්ගේ ශ්‍රේෂ්ඨතම ශිෂ්‍යයෙකි. ධූතාංග රැකීම පිළිබඳ සාම්ප්‍රදායික දැනුම හා විනය ගරුක භාවය විශිෂ්ටය. දුර්ලභ ගණයේ තපස්වරයෙකි. උන්වහන්සේගේ සහජ දක්ෂතාවය නිසා ආචාර්ය මන්ගේ තත්ත්වය ගැනීමට ඉතාම සුදුසු විය.

උතුරු නැගෙනහිර ප්‍රදේශයේ උදෙන් තාහි ගමේ 1913දී උපත ලත් ආචාර්ය මහා බූවා මහණ උපසම්ප්‍රදාව ලැබුවේ 1934 දීය. මුල් අවුරුදු 7 බෞද්ධ නිකාය ග්‍රන්ථ ඉගෙන පාළි භාෂාව හදාරා උපාධියක් ලදහ. ඉන්පසු ''මහා'' යන ගෞරව නාමය ලැබුණි. උන්වහන්සේ බොහෝ කාලයක් ආචාර්ය මන් සොයමින් ධූතාංග භික්ෂුවක් වශයෙන් සංචාරය කළේය. අවසානයේදී 1942 දී ආචාර්ය මන් මුණගැසුනි. ඉන්පසු උන්වහන්සේගේ ශිෂ්‍යයෙකු වී ධර්ම කරුණු හදාරමින් 1949යේදී ආචාර්ය මන්ගේ අපවත්වීම දක්වා ළඟින් සිටියේය.

ආචාර්ය මන්ගේ අපවත්වීමෙන් පසු ඉතා දැඩි ලෙස ධූතාංග කර්මස්ථාන පරපුර ස්ථාවර කිරීමට මහත්සේ වෑර දැරූහ. එහෙයින් අචාර්ය මන්ගේ පිළිවෙත් මාර්ගය අකුරටම පිළිපදින ලදී. තවද එය අනාගත පරම්පරාවට හඳුන්වාදීමට ගත් ප්‍රයත්නයේ ප්‍රතිඵලය වූයේ මේ ජීවන ප්‍රවෘත්තිය ලිවීමය.


1960 වන විට වනාන්තර බොහෝ සෙයින් කපා මිනිස් ජනාවාස බවට පත්වීම නිසා වනවාසී ධූතාංග භික්ෂූන්ට තම ශික්ෂණය ඒ ආකාරයෙන් ගෙන යෑමට නොහැකි විය. ඝන වනාන්තරයේ සංචාරය කිරීමට නොයෙක් බාධක පැමිණියේය. එබැවින් ආචාර්ය මහා බූවා ස්ථිර පදිංචියට සුදුසු කැලෑ පරිසර වල ධූතාංග භික්ෂූන්ට ආරණ්‍ය සෙනසුන් ඉදි කළේය. එහි ලක්ෂණය වූයේ උග්‍ර තවුස් ජීවිතය හා විනය ගරුක බවත් භාවනා බලයත්ය. බොහෝ වනවාසී භික්ෂූන් මෙම ආරාණවල භාවනා කළහ. වට් පා බාන් ටාඩ් නම් වූ ආරණ්‍ය සේනාසනය නිරායාසයෙන්ම බිහි කළේ එහි පැමිණි යෝගීන් විසින්මය. උදෙන් තාහි නම් ප්‍රදේශයේ පිහිටි මෙම සේනාසනය බටහිර යෝගීන්ට පවා සුදුසු විය. ඊට හේතුව උසස් ආචාර්යවරයෙකුගේ මඟ පෙන්වීම ලබන හෙයිනි. එහි වාසය කළ නා නා ජාතික භික්ෂූන් වහන්සේලා මෙම පිළිවෙත් මාර්ගය අනුගමනය කර තම තමන්ගේ රටවල ව්‍යාප්ත කළහ. අද මුළු ලෝකයේම මෙම වනගත සේනාසන බිහි වී ඇත.


අද දක්වාත් බොහෝ දෙනාගේ ගෞරව සම්මාන ලබමින් ආචාර්ය මන්ගේ පිළිවෙත් මාර්ගය අනුගමනය කරමින් ආචාර්ය මහා බූවා විශාල සේවයක් භික්ෂූන්ට සහ ගිහි යෝගීන්ට ඉටු කරත්. මෙම පිළිවෙත් මාර්ගයේ මුඛ්‍ය දේශනාව


ප්‍රඥාව දියුණු කිරීමයි. එය ඉතාම ප්‍රායෝගික පහසු පිළිවෙත් මාර්ගයකි. භාවනා දියුණුව ලබා ගැනීමේ මෙම මාර්ගය බොහෝ අයට උපකාර වී ඇත.

## ලේඛක සංඥාපනය


ආචාර්ය මන් භූරිදත්ත තෙරුන්ගේ ළඟ ඇසුර ලත් ඒ ඒ වකවානුවේ සිටි











สถานะเดิม
นามเดิม มั่น
นามสกุล แก่นแก้ว
นามบิดา
เกิดปี
เดือน
ตำบล
อำเภอ
จังหวัด

පැවිදි ආචාර්යවරු හා ශිෂ්‍යයන් ගණනාවකගේ පර්යේෂණාත්මක නිගමන අනුව සකස් කළ මෙම පුස්තකය උන්වහන්සේගේ අති උතුම් ශික්ෂණය හා ප්‍රතිපදාව පැහැදිලි කිරීමකි.

මේ ජීවන ප්‍රවෘත්තිය ගොනු කිරීමට, මම ඒ ආචාර්යවරු සොයා ගොස් උන්වහන්සේ පිළිබඳ දැරූ ආකල්ප මතකයෙන් විස්තර කළ කථා පුවත් පටිගත කළෙමි. එහෙත් මෙම කරුණු පිළිබඳ මම සෑහීකට පත් නොවෙමි. මක්නිසාදයත් එම ආචාර්යවරුන්ට ආචාර්ය මන් ගේ බොහෝ තොරතුරු ලබා ගැනීමට දුෂ්කර විය. උන්වහන්සේ බොහෝවිට හුදකලාව ගමින් ගමට සංචාරයේ යෙදුන බැවිනි. එහෙත් ඒ සියලු පුවත් උකහා ගැනීට නම් විශාල කාලයක් හා ශ්‍රමයක් ගත විය හැකිය. එවිට මෙම පුවත් බොහෝවිට අමතක වන්නේය. එවිට මේ ප්‍රයත්නය වුවද නිෂ්ඵල වේ. මේ ජීවිත කථාව මම ගොනු කළේ යම් තරමකින් හෝ ආචාර්ය මන් පිළිබඳ දැනුම නිසා බොහෝ පාඨකයින්ට සෙත සැලසෙන බැවිනි.

ආචාර්ය මන්ගේ දැනුම හා අවබෝධය ද දෛනික චර්යා පිළිබඳවද යම්ක-සි ප්‍රමාණයක විස්තරයක් මෙම ග්‍රන්ථය තුළින් ඔබ වෙත පිරිනැමීමට මම උත්සාහ දරමි. ඈත අතීතයේ බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ හා රහතන්වහන්සේලාගේ අති උතුම් ජීවන චර්යා මේ තුළින් ඔබට පැහැදිළි වේ. ධර්මය නිසි ආකාර අනුගමනය කිරීම කුමක්දැයි ඔබට ඉන් වැටහේ. මගේ විස්තර පුවත් යම් විධියකින් උන්වහන්සේට අවමන් වේ නම්, ඒ පිළිබඳ වගකීම දරණ අතර සමාව අයදිමි. එහෙත් මේ කරුණු සත්‍ය ප්‍රවෘත්ති වේ. ඒ උන්වහන්සේගේ වචනයෙන් අසාදැන ගත් බැවිනි. මෙම පුස්තකය ගැන මා සෑහීමකට පත් නොවූවද මුද්‍රණ කිරීමට එකඟ වූයේ පාඨකයාට වටිනා අත්දැකීම් ලබාදීමටය.

# 1

**මෙ**කල ලෝකයේ පහළ වූ අති උත්තම විපස්සනා භාවනා ගුරුවරුන් අතුරෙන් අති ශ්‍රේෂ්ඨ ගණයේ ගුරුවරයෙක් ලෙස තම ශිෂ්‍යයින්ගේ ප්‍රශංසාවට ලක් වූ ආචාර්ය මන් භූරි දත්ත තෙරුන් වහන්සේගේ ඇසුරට පැමිණි අය තුළ ධර්මය පිළිබඳ කිසිම ගැටළු හෝ සැක නොවීය. තායිලන්තයේ පමණක් නොව ලාඕස් රටේ හා නොයෙක් ප්‍රදේශවල අප්‍රමාණ ගිහි පැවිදි ශිෂ්‍යයෝ සිටියහ.

උන්වහන්සේගේ ජීවන ප්‍රවෘත්තිය සැබවින්ම චමත්කාරය. මුල් යුගයේ සිට බෞද්ධ භික්ෂුවක් ලෙස උග්‍ර තපස් රකිමින් අවසාන මොහොත දක්වා කළේ එකම ප්‍රාතිහාර්යයකි. එය පුදුම එලවයි. මහා මැණික් රාශියක් එක්රැස් කිරීමට වඩා මෙවැනි අඛණ්ඩ ගුණ සමුදායක් එක්රැස් කිරීම නූතන යුගයේ කළ නොහැකි දෙයකි.

එළුවාගේ වර්ෂයේ 1870 ජනවාරි 20 වෙනි බ්‍රහස්පතින්දා බෞද්ධ පවුලක මෙම බිළිඳු උපත ලදහ. උබෝන් රචතානි ප්‍රාන්තයේ බොන්පියම් බන් කම්බොං ගමේ උපත ලැබුවේ වැඩිමහල් දරුවා ලෙසය. පාරම්පරික නාමය කළුන්කළුවි පියාගේ නම ඛම්දුවං. මවගේ නම ජන්. පවුලේ දරුවන් අට දෙනෙකි. උන්වහන්සේගේ පරිනිර්වාණයේදී ජීවත්ව සිටියේ දෙදෙනෙක් පමණි. උන්වහන්සේ කුඩා සිරුරකින් යුතුව ඉතාම උද්‍යෝගී මනා වැටහෙන නුවණ ඇති අයෙකු වූහ. පැහැපත් සුදු පාට සිරුරකි.

වයස අවු. 15 දී සාමණේර ප්‍රවෘජ්‍යාවෙන් ගමේ පන්සලේ සසුන් ගත වූ උන්වහන්සේ ධර්මය හැදෑරීමට, වනපොත් කිරීමට, අති දක්ෂ විය. ගුරුවරුන් සහ අවශේෂ ඇසුරු කරන්නන්ගේ විශේෂ ගෞරවයට පාත්‍ර විය. කිසිවෙකු උන්වහන්සේට චෝදනා නොකළහ. එතරම් අහිංසක විය. අවුරුදු දෙකකට පසු පියාගේ අසරණ භාවය නිසා සිවුරු හැර යාමට සිදුවිය. එහෙත් තම කාර්යභාරය ඉටුකර නැවත පැවිදිවීමට මහත් උනන්දුවක් ඇතිවිය. එය උන්වහන්සේ තුළ වූ අචල ශ්‍රද්ධාව විය. වයස අවු. 22දී නැවත පැවිදි වීමට බලවත් කැමැත්තක් විය. දෙමාපියන්ගෙන් සමුගෙන නැවත පැවිදි විය. ඒ අය එතුමාගේ අදහස යම්කිසි දිනක පැවිදීම බැවින් විරුද්ධ නොවූහ. එබැවින් පැවිදිවීමට අවශ්‍ය පිරිකර සපයා දුන්හ. 1893දී උබොන් රචඡථනී නම් ප්‍රාදේශීය නගරයේ පිහිටි වට්ලියප් විහාරයේදී නැවත සසුන්ගත වූය.

උන්වහන්සේගේ උපසම්පදාවේදී උපාධ්‍යාය වූයේ ගරු ආරිකව් හිමියන්ය.

ආචාර්ය වූය් ප්‍රා කෲ සිටා හිමියන්ය. අනුශාසනාචාර්ය වූයේ ප්‍රා කෲ ප්‍රජුක් උං-බාන්බුන් හිමියන්ය. උන්වහන්සේගේ පැවිදි නම භූරි දත්ත විය. උපසම්පදාවෙන් පසු ආචාර්යය සාඕ හිමියන්ගේ වට් ලියප් නම් විපස්සනා භාවනා මධ්‍යස්ථ ානයේ පදිංචි වූහ.

## අනාවැකිය

ආචාර්යය මන් විපස්සනා මධ්‍යස්ථානයේ වාසය කරමින් නිරන්තරයෙන්ම ''බුදෙධා'' යන වචනය කර්මස්ථානය ලෙස ජප කළේය. බුද්ධානුස්සතිය අතිශයින් ප්‍රිය කළ බැවිනි. එහෙත් තම සිතේ සමාධිය ඇති නොවීය. මෙම කර්මස්ථානය පිළිබඳ සැක පහළ වුවද දිගටම රෑ දවල් මෙම ''බුදෙධා'' වචනය ජප කළේය. අන්තිමේදී යම්කිසි සමාධියකට පත්විය.

එක් රාත්‍රියක මෙම සිහිනය දුටුවේය. උන්වහන්සේ තම ගමෙන් පිට වී විශාල කැලෑවකට පැමිණි සේක. එහි ඝන වනාන්තරයක ඇති ගහ කොළ වලින් ගැවසී තිබුණි. මාර්ග සළකුණක් නැත. ඉතා වීර්යයෙන් මෙම දුෂ්කර ප්‍රදේශය පසුකර අනිත් කෙළවරට පැමිණියේය. එහි විශාල කුඹුරකි. පෙනෙන තෙක් මානයේ වෙන කිසිවක් නොවීය. මෙම කුඹුර හරහා බොහෝ දුර ගමන් කළවිට විශාල ''ජාති'' නම් ගස පතිත වී තිබුණි. ''ජාති'' යනු ''උප්පත්තිය'' සඳහා භාවිතා වන පර්යාය පදයකි.

බොහෝ කාලයකට පෙර මේ ගස කපා ඇත. කොටසක් පොළොවේ ගිලී තිබුණි. ගස දිරාපත් වී ඇත. උන්වහන්සේ මේ ''ජාති'' ගස දිගේ ඇවිද්දේය. මනසින් කල්පනා කරන විට මෙම ගස නැවත රෝපණය නොවන බව වැටහුණි. එය තම ජීවිතය මෙනි. තමා නැවත නූපදින බවත් පශ්චිම භවිත බවත් වැටහුණි. තම ප්‍රතිපත්තිය දිගටම ගෙන ගිය විට සසර දුක තරණය කළ හැකිය. අග මුල නැති විශාල කුඹුර සංසාරය සංකේතවත් වුණි. මේ පිළිබඳ සංකල්පනා කරන විට විශාල සුදු අශ්වයෙක් පැන පැන අවුත් ''ජාති'' දැව කඳ ළඟ සිටියේය. උන්වහන්සේට මේ අශ්වයා පිට නැගීමට සිත් විය. නිරායාසයෙන් අසුපිට නැගී මහත් වේගයෙන් ගමන් ගති. කොහේ යන්නේද, මක්නිසා යන්නේදැයි හැඟීමක් නැත. ඉතා වේගයෙන් මේ අසු ගමන් කරයි. කුඹුර හරහා යන දුර ප්‍රමාණය අසීමිතය. මෙසේ යන විට ත්‍රිපිටක පොත් තැන්පත් කළ ලක්ෂණ කැබිනට් අල්මාරියක් දිස්විය. එය රිදී කැටයමින් දර්ශනීය ලෙස සාදා තිබුණි. අශ්වයා කිසි පැකිලීමක් නොමැතිව මෙම කැබිනටය ඉදිරියේ නැවතී සිටී. අසු පිටින් බැස ආචාර්යය මන් කැබිනටය විවෘත කොට පොත් ගන්ට සූදානම් විය. එම ක්ෂණයේදී අසු අතුරුදහන් විය. මේ සිටින්නේ කුඹුරේ එහා කෙළවරේ බව හැඟුණි. ඈත

ක්ෂිතිජයේ ඝන වනාන්තර දිස්වී. කැබිනටය විවෘත කිරීමට පටන් ගත් නමුත් එය නොහැකි විය. එවේලේ නින්දෙන් පිබිදුණි.

මේ සිහිනය උන්වහන්සේගේ අනාගත ව්‍යායාමයෙන් නිවන් මග සපුරා ගත හැකි බව ''නිමිත්ත''කි. එබැවින් නොනවත්වාම ''බුද්ධො'' මන්ත්‍රය ජප කළේය. තම දෛනික වැඩ කටයුතු කළේ මෙසේ භාවනා කරමින්ය. තම උපසම්පදාවේදී පුහුණු වූ ධූතාංග රැකීම දිගටම කෙරිණි. සිවුරු මසා ගත්තේ තැන් තැන්වල විසී කළ රෙදි කැබලි කපා මූට්ටු කිරීමෙනි. දායකයින්ගේ චීවර ප්‍රතික්ෂේප කළේය. පිණ්ඩපාතයෙන් ජීවත් විය. නිරාහාරව සිටින දිනයන්හි පිණ්ඩපාතයෙන්ද වැළකුණි. තම පාත්‍රයෙන් පමණක් වැළඳුවේය. දිනකට එක් වරක් වැළඳුවේය. ආරණ්‍ය සේනාසනයක, ඝන වනාන්තරයක වාසය කළේය. නිදා ගැනීම, භාවනා කිරීම, මේ කඳු හෙල් - වන සතුන් ඝහණ කැලෑවේ විය. සමහරවිට ගස් වැල තුරුලතා යට සැතපුණි. නැතහොත් ගල් ගුහාවක හෝ ගිරි ගුහාවක සැතපුණි. තිචීවරය පමණක් පරිහරණය කළේය. දෙපට සිවුර, තනිපට සිවුර, අඳනය ආදී වශයෙනි. නාන කඩක් භාවිතා කළේය.

ධූතාංග 13න් ඉතිරි ධූතාංග පහසු වේලාවලදී සපුරණ ලදී. නමුත් ඉහත සඳහන් ධූතාංග 7 නොකඩවා රැකීම නිසා එය තමන්ගෙ ජීවන චර්යා රටාව විය. මෙවැනි පුහුණුවීමක් අද කාලයේ දක්නට ලැබීම අති දුර්ලභය.

තමාගේ ජීවිතයේ අර්ථය උන්වහන්සේට පැහැදිළිය. කිසිවිට නොපැකිලව තම පිළිවෙත් නිසි ආකාරයේ ඉතා උනන්දුවෙන් ඉටු කළහ. එකම අරමුණ වූයේ සසර දුක තරණය කිරීමය. එනම් තම සිතේ පහළවන කෙළෙස් තරණය කිරීමය. උන්වහන්සේගේ සිතේ තණ්හාව, මාන, දිට්ඨි නැගී සිටීමට අවස්ථාව නැති අන්දමින් ඉතාම නිහතමානි විය. කෙලෙස් නැගී එන සෑම අවස්ථාවම සති සමපජඤ්ඤයෙන් මැඩ පැවැත්විය.

මෙසේ තම සමාධි සිත දියුණු වූ විට ''නිමිත්ත'' වූ සිහිනය ගැන විතර්ක විචාර කළේය. මහණ උපසම්පදා වීම යනු ලෞකික ගිහියන්ගේ මට්ටමෙන් තම චිත්තය මුදවාගෙන ලෝකොත්තර ගතියට පත්වීමය. සිතේ ප්‍රකෘති ස්වභාවය කිසි පිළිවෙලක් නැති ඝන වනාන්තරයේ ගස්වැල්, වන සතුන්ගෙන් ගැවසීගත් භයානක පරිසරය මෙනි. සිතේ බිය සැක දුක නිරන්තරයෙන් හට ගන්නේ එම නිසාය. මේ සිතේ මට්ටම අර තැනිතලා හිස් බවක් මෙන් සන්සුන් කළ යුතුය. එවිට එම සිත තුළ දුක, බය ආදී කෙලෙස් ඇති නොවේ.

රාජකීය සුදු අශ්වයා යනු පිළිවෙත් පිරීමකි. එම අශ්වයා පිට නැගී භයානක සංසාර කාන්තරය තරණය කළ යුතුය. ත්‍රිපිටක ධර්මය කැබිනටය තුළ සැඟ වී ඇත. එය විවෘත කිරීට තරම් අධ්‍යාත්මික ගුණ වගාවක් නොතිබුණි. දර්ශන

මාත්‍රය පමණක් ලැබීමට හේතු විය. මෙම ධර්මය තුළට කිඳා බැස අවබෝධ කිරීමට චතුපටිසම්භිදා නුවණ තිබිය යුතුය. යමෙක් තුළ මෙම ඥාණය ඇත්නම් ඒ උතුමා තුන් ලෝකයටම ශ්‍රේෂ්ඨ වූවෙකි. ධර්මය හඳාරා එය අනුන්ට ඉගැන්වීමට ශක්තිය ලබයි. දෙව් මිනිසුන්ගේ අද්විතීය ගුරුවරයෙකි. මහා සාගරය වැනි ධර්මය ගලා ඒ. අහස මෙන් ධර්මය නිරාවරණය වේ.

උන්වහන්සේ ධර්ම පුස්තකයන්ගේ වටිනාකම මතු පිටින් දුටහ. කවදා නමුත් චතුපටිසම්භිදා ඥාණ ලබා ගැනීම කළ යුතු වේ.'' උන්වහන්සේ ඉතා නිහතමානී බැවින් ''මම උගන්වන ධර්මය මාර්ගය පෙන්වීමක් පමණ'' යැයි නිතර පැවසීය. නමුත් ඒ දේශනාවට සවන් දුන් අයට උන්වහන්සේගේ තීක්ෂණ බුද්ධිය වැටහේ. ඒ ඉතා ආශ්චර්යයමත්ය. අනුශාසනී ප්‍රාතිහාර්යයකි. අද ලෝකයේ එවැනි දේශනා ඇසීමට උගහටය. එහෙත් අද ලෝකයට එය ඉතාමත් උචිත වේ.

## සංඥාව

ආචාර්යය මන් එක් අවස්ථාවක වට් ලියප් භාවනා මධ්‍යස්ථානයේ සමාධි භාවනා කරමින් සිටින විට සිත බලවත් ඒකාග්‍රතාවකට පත්වුණි. එවිට දර්ශනයක් ඇතිවිය. එනම් මෘත ශරීරයකි. එය ඉදිමී ඕජස් ගලමින් නව දොරින් ඕජා වැගිරෙමින් දිස්විය. ගිජු ලිහිණියෝ, සුනඛයෝ මෙම කුණු වූ මස් ඇද කමින් හැම තැනම විසුරුවමින් සිටියහ. අවසානයේදී එය මස් කැබලි ගොඩක් විය. මෙම දර්ශනය දුටු විට උන්වහන්සේ නොසිතූ අන්දමට අප්‍රිය, අප්‍රසන්න වී පිළිකුල් ස්වභාවය නිසා ගත සිත සලිත විය.

එතැන් පටන් ආචාර්යය මන් මෙම සංඥාව තම භාවනා අරමුණ කර ගත්තේය. ඇවිදින, හිඳින, භාවනා කරන හැම ඉරියව්වේදීම දිනපතා වැඩ කරන විටද, මෙම අරමුණ දිස්විය. මෙසේ භාවනා කරමින් කලක් යන විට මෙම අරමුණ වෙනස් වී කවාකාර විනිවිද පෙනෙන තැටියක් මෙන් ඉදිරියේ එල්බ තිබුණි. මෙය දෙස තීක්ෂණව බලා සිටින විට එය අතුරුදහන් වී වෙන වෙන අරමුණු ඇති විය. මෙය සෑහින් වෙනස් වෙමින් අප්‍රමාණ අරමුණු දිස්විය. උදාහරණ වශයෙන් කවාකාර තැටිය වෙනුවට දැන් ඉතා උස් කඳු ගැටයකි. ආචාර්යය මන් එහි ඇවිදිමින් සිටී ඝන සපත්තු දාගෙන තියුණු කඩුවක් අතේ ලෙල දෙමින් ඇත. එවිට විශාල තාප්පයකි. එහි විශාල දොරටුවකි. උන්වහන්සේ එය විවෘත කර ඇතුළ බැලුවේය. එහි භික්ෂුන්වහන්සේලා කීප දෙනෙක් භාවනා කරති. මෙම තාප්පය අසල මහා කඳු බෑවමකි. එහි තිබූ ගල්ගුහාව තුළ තාපසයෙක් වාසය කරයි. එහි ඉදිරිපට තොටිල්ලක් වැනි වාහනයක් කඹයකින් එල්ලෙමින් තිබුණි.

උන්වහන්සේ එම වාහනයට නැගී සේක. සැනෙකින් එම කඹය ඇදී ගොස් කඳු මුදුනට නැගුණි. කඳු මුදුනේ චීන නාවික යාත්‍රාවකි. එහි තුළ හතරැස් මේසයකි. එල්ලෙන ලන්තෑරුමෙන් එන දීප්තිමත් ආලෝකයෙන් මුළු කඳු මුදුන ප්‍රභාස්වර විය. උන්වහන්සේ ආහාර වැළඳුවේය. මේ ආදී අනේකවිධ දර්ශන දිස්වෙමින් තිබුණි. එහි නිමාවක් නැත. එම දර්ශන සියල්ල අප්‍රමාණ බැවින් මතක නැති බව උන්වහන්සේ පැවසූ සේක.

තුන් මාසයක් මෙසේ උන්වහන්සේ භාවනා කරමින සිටි සේක. සමාධි වූ විගස ඉන් මිදී විනිවිද පෙනෙන කවාකාර තැටිය දෙස බලමින් විමර්ශනය කළේය. එවිට නොයෙක් ආකාර දර්ශන දිස්විය. නමුත් මෙය නියම මාර්ගය නොවන බව උන්වහන්සේට වැටහුණි. මෙවැනි දර්ශන දැකීම නිසා උන්වහන්ස්ගේ පරිසරය බියකරු විය. අවට පරිසරයේ ශබ්ද, රූප පිළිබඳ තියුණු ලෙස කැමැත්ත අකමැත්ත ඇතිවිය. මානසික අසහනකට පත්විය. මනසේ ස්ථාවර භාවයක් හෝ සමතුලිත භාවයක් නැත.

මෙම තියුණු සංවේදීතාවය නිසා එය වැරදි සමාධියක් ලෙස වැටහුණි. තම භාවනා මනසිකාරය නිසා තමන්ට සාමය, ප්‍රීතිය, පස්සද්ධි නැත්තේ ඇයි ? භාවනා නොකරන අයෙකුගේ විසිරී ගිය මනසක් මෙන් සිත නොසන්සුන් විය ඊට හේතුව කුමක්ද ? බාහිර රූප දෙස බැලීම තම අභ්‍යන්තරය බැලීම මෙන් නොවේ. මෙය භාවනාවේ මූලික අඩිතාලම දෙදරා යාමකි. බලාපොරොත්තු වූ සුවය, සතුට නොලැබුණේ ඒ නිසාද ?

මෙසේ අවබෝධ කරගත් එතුමා බාහිර දෙසට අරමුණු නොකර තම සිරුර තුළට බැස අරමුණ කළේය. ඉන්පසු තම භාවනාව කායානු පස්සනාව විය.

ප්‍රබල සති සමාධියෙන් මෙසේ තම සිරුර හිසේ සිට පාදාන්තය දක්වා ද පැත්තෙන් පැත්තටද ඇතුළත පිටද, සෑම අංගයක්ම නිරීක්ෂණය කළේය. මුලදී සක්මන් කරමින් මෙම සම්මා සංකල්පනාවෙහි යෙදුණි. සක්මන් කිරීම වෙහෙස වූ විට හිඳිමින් මෙනෙහි කළේය. තම සිත පුරුදු සමථ සමාධියට යා-මෙන් වැළැක්වීය. මහත් වීර්‍යයෙන් සිත සමාධියෙන් මුදවා සිරුර දෙස බැලීය. චිත්තය වේගවත්ව සිරුරේ එක් එක් කොටසක් නිරීක්ෂණය කළේය. රාත්‍රි නින්ද යන තුරුත් මෙම කායානුපස්සනාවෙන් සිටි සේක.

මෙසේ කීප දිනක් පසු වූ විට භාවනා පර්‍යංකයෙන් සිට මෙම කායානුපස-සනාව තුළින් සිත සමාධිගත කිරීමට වෑයම් කළේය. මෙම සමාධිය කෙසේදැයි කුතුහලයක් විය. කායානුපස්සනාව නොකඩවා කිරීම නිසා සිත දැඩි වෙහෙසට පත් වී තිබුණි. නමුත් ඉතාම ඉක්මණින් නොසිතූ අන්දමට සිත සමාධි ගත විය. මෙය නම් නිවැරදි මාර්ගය බව වහා වැටහුණි. මෙම සමාධිය නිසා සිත කයෙන්

වෙන් වී ගියේය. දෙකට පැලුනාක් මෙනි. බලවත් සම්මා සතිය පැවතුණි. සිත අන්කිසි අරමුණු කරා නොගියේය. මෙසේ කායානුපස්සනාව මූලික කර්මස්ථානය විය.

මින්පසු කායානුපස්සනාවෙන් සිත සමාධිගත කිරීමට හැකිවිය. තුන් මාසයක් කවාකාර තැටිය දෙස අරමුණු කර ඉන් ඇති වූ මායාකාරී අරමුණු බලමින් කාලය අපතේ ගිය බව තේරුණි. මෙම මනසිකාරය තුළින් තම සිත ප්‍රකෘතිමත් විය. අවට පරිසරය නිසා අසහනයට පත් නොවීය. මේ ප්‍රවෘත්තිය ඉතාම වැදගත් වන්නේ ගුරුවරයෙක් නැතුව මෙවැනි භාවනා කිරීමේ ප්‍රතිඵල අහිතකර බවක් තේරුම් ගැනීමටය. විටින් විට ගුරු ඇසුර ඇතොත් තම මාර්ග ය නිවැරදි කරගත හැකිය. ආචාර්යය මන් ගේ මේ අත්දැකීම කාටත් හොඳ නිදර්ශනයකි. ගුරු ආශ්‍රයක් නොමැතිව භාවනා කිරීම නිසා ප්‍රතිඵල පමාවීම පමණක් නොව අහිතකර වීමටද ඉඩ ඇත.

මුල් කාලයේදී ආචාර්යය මන් ගේ සංචාරක ජීවිතය බොහෝ අයට තේරුම් ගත නොහැකි විය. ඒ කම්මට්ඨාන දූතාංග පූරණය ගැන නොදත් බැවිනි. මෙම පිළිවෙත් අමුතු දෙයක් ලෙස බොහෝ අය සිතූහ. බුදු සසුනේද මෙවැනි භික්ෂුන් නැතැයි ද සමහරු සිතූහ. වෙල් යායේ ඈත කෙළවර මේ ධූතාංග රකින භික්ෂුවක් දුටු පමණින් මිනිස්සු විශ්මයට පත් වූහ. භයින් ත්‍රස්ත වී නිවෙස් කරා දුව ගියහ. කැලෑවේදී දුටුවොත් ගස් ගුම්භයන්හි සැඟ වුනහ. එබැවින් ධූතාංග භික්ෂුවකට මෙම නුහුරු පරිසරයේ කිසිවෙක් මුණ නොගැසුණි. මාර්ගය අසා දැන ගැනීමට හෝ නොහැකි විය.

ගමේ ගෑනු කම කුඩා දරුවන් සමඟ ළඟ පාත කඳු මුදුන් වල පළා නෙලීමට, පළතුරු එකතු කිරීමට නිතර යති. සමහරු වතුර ඇලවල මාළු බාති. ධූතාංග භික්ෂුන් කීප නමක් ඈත දුටුවොත් ''ධම්ම හාමුදුරුවෝ එනවෝ'' කියමින් කෑ ගසා, අත තිබූ බඩු බාහිරාදිය එතනම බිම දමා, දරුවන් සමඟ දුවති. තම කූඩ ආදිය කැඩී බිඳී යති. කැලයේ සැඟ වී සිටිති. ගෙවල්වලට දුවති.

කුඩා දරුවන් මවගේ විලාපය අසා කෑ ගසති. අඬමින් දුවති. වැඩිහිටියන් සමඟ දිවීමට නොහැකිය භයින් කෑ ගසති. මව් කැලෑවේ සැඟ වී ඇත. දරුවෝ ඒ මේ අත කෑ ගසමින් දුවති. දරුවා ගෙන යාමට හෝ නොඑති. නිකරුනේ මේ සිදුවන දේ නිසා සිනා පහළ විය. මේ තත්වය තරමක බැරෑරුම් නිසා ධූතාංග භික්ෂූන් වහන්සේලා එම පළාත හැර දමා ගියහ. ළමයි ළඟට යාම හෝ කථා කිරීම නිසා ඒ අයගේ අස්ථාන බිය වැඩිවේ. මානසික රෝගයක් මෙන් මේ ගෑනු සහ දරුවන් උන්වහන්සේලා නොපෙනී යන තුරුත් කෑ ගැසූහ. පසුව මුළු ගමේ උදවිය එක්රැස් වී කතිකා කළහ.

මේ සිද්ධියට හේතු ඇත. භික්ෂූන් වහන්සේලා භාවනා යෝගීව ගමන් කරණ බැවින් කථා කිරීමක් හෝ සිනාසීමක නැත. උන්වහන්සේලා ගේ සිවුරු තද දුඹුරු පැහැය වේ. කොස් පාඩු වලින් පාට කර ඇත. මේ දර්ශනය තරමක් බිය උපදවන්නකි.

තවද, කුඩාරමක් වැනි විශාල කුඩයක් කරේ එල්ලාගෙන ඇත. අනිත් උරහිසේ පාත්‍ර සිවුරු දරති. පිළිවෙලින් එකම පේලියට ඇවිදිත. එය දුටුවන් මවිත කරවන දර්ශනයකි. ගමට ආසන්න කැලෑවක උන්වහන්සේලා ලැගුම් ගනිති. ගමේ මිනිස්සු සමඟ හිතවත් වීම හා දාන මාන ලැබීමට අවශ්‍ය බැවිනි. ගම්වාසීහු උන්වහන්සේලාගෙන් බණ ඇසීමට සතුටු වූහ. කාලයක් ගතවන විට ඒ අය ශ්‍රද්ධා භක්තියෙන් උපස්ථාන කළහ. කලින් පැවති බිය සැක පහ විය. මෙසේ යම් බොහෝ අය ධූතාංග භික්ෂුන්ට ආදර ගෞරව පැවැත්වීමට පෙළඹුණි.

ගමට හුරු පුරුදු වූ විට උන්වහන්සේලා වෙනත් ප්‍රදේශයකට සංචාරණය කරති. නිහඬ පරිසරයන් සොයමින් යාම උන්වහන්සේලාගේ ප්‍රතිපත්තිකි. ආචාර්යය මන් මෙසේ වස් කාලය ඉවර වූ විට චාරිකාවේ ගියහ. කැලෑවේ කඳු මුදුන් අතරින් පා ගමනින් වෙනත් ප්‍රදේශකට ගොස් වෙන තැනක ලැගුම් ගනිත්. දාන මාන ලැබීමට අසල ගම්මානයක් ඇත. තායිලන්තයේ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ මෙසේ සංචාරණය කළහ. නබොන් ෆානොම්, සකොන් නාබොන්, උදෙන් නාහි, නොං බයි, ලොඉ, ලොම්සක් අදී පළාත්වල නිතර ගමන් කළහ. මේකොං ගඟ අසබඩ ලාඕස් රට ආසන්න ථා බෙක්, වියන්ටියානෙ, ලුඅං ප්‍රබං ආදී ප්‍රදේශ ඝන වනාන්තරයෙන් ගැවසී තිබුණි. කඳු සිබර අතරින් උන්වහන්සේ හුදකලාව ගමන් කළේය.

කොතැනක සිටියත්, මොනයම් වේලාවේ වුවත් ආචාර්යය මන්ගේ ප්‍රාථමක අවධානය එකමය. එනම් අනලසව තම භාවනා පිළිවෙත් පිරීමයි. උන්වහන්සේගේ ජීවිතයේ ඉතාම වැදගත් අරමුණ මෙයයි. ස්වභාවයෙන්ම ආරාම පන්සල් ඉදිකිරීමට උන්වහන්සේ නොකැමැති විය. ආධ්‍යාත්මික ගුණ දියුණු කිරීමට උත්සාහ කළේය. සමාජය හෝ අන් භික්ෂූන් සමඟ සබඳතාවයකට ප්‍රිය නැත. හුදකලා ජීවිතයම ප්‍රිය කළහ. එසේ සිටින විට තිබුණේ එකම කාර්යයකි. එනම් දුක ඉක්මවීමයි. බලවත් අවංකභාවය හා උත්සාහය උන්වහන්සේගේ චරිත ලක්ෂණයකි. තමනුත් රවටා අනුනුත් රැවටීමේ ගතියක් නැත.

උන්වහන්සේ දැක්වූ වීර්යය සිතීමට පවා නොහැකිය. ඉවසීමේ සීමාවක් නැත. තම සිත, වචනය, ක්‍රියා පිළිබඳ අවධානය විස්මය ජනකය. මෙම ගති පැවතුම් නිසා සමාධි, පඤ්ඤා වැඩී ගියේය. කිසිම පසු බැසීමක් නැත. කායානුපස්සනාව හඳුනාගත් දිනයේ සිට එය කිසිවිටක අත් නොහළේය. නැවත

නැවතත් තම කය දෙස සූක්ෂම අන්දමින් පඤ්ඤාවෙන් විච්ඡේදනය කළහ. ශරීරයේ හැම කොටසක්ම උන්වහන්සේගේ අවධානයට යොමු විය. අවසානයේදී මුළු සිරුරම සතර මහා භූතයන්ට බෙදා දැකීමට හැකිවිය.

පිණ්ඩපාතයේ යන විටද, මිදුල අතුගාන විටද, පඩික්කම සෝදන විටද, සිවුරු මසන, පඬු පොවන විටද ආහාර ගන්නා විටද, නැත්නම් නිකමට කකුල් දික් කිරීමේදී ද ආදී කුදු මහත් හැම කාර්යයකදීම සති, පඤ්ඤාවෙන් එම කාර්යය ඉටු කළේය. නොනිදා සිටින හැම මොහොතම තම අවධානය තිබුණි. නින්දට යන විටදී පමණක් එම භාවනාව ලිහිල් විය. එහෙත් පිබිදුන විගස නැගී සිට නැවත සතිය පැවැත්වීය. නින්දෙන් පිබිදුන විට තවමත් නිදිමත ඇත්නම් සක්මන් භාවනාවේ යෙදිණ. හිඳගන භාවනා කරන විට නිදි කිරා වැටීම වැලැක්වීමට හෙමින් ඇවිදින විට නිදිමත වුවොත් ඉක්මණින් ඇවිද්දේය. නිදිමත හොඳටම නැතිවිට පමණක් හිඳිමින් එළිවෙන තුරු භාවනා කළහ.

එළි වී ටික වේලාවකින් පිඩු පිණිස යාමට සූදානම් වුණි. තුන් සිවුර හොඳාකාර හැඳ පොරවා පාත්‍රය කරේ එල්වා ළඟම පිහිටි ගම්මානයට වැඩිය. ඉතාම සන්සුන් භාවයකින් මුළු පිණ්ඩපාත චාරිකාවම සතියෙන් කෙරුණි. එය සක්මන් භාවනාවක් විය. අඩියෙන් අඩියට සතිය පැවැත්වීය. බාහිර අරමුණු නිසා සිතේ විපිලිසරභාවයක් නොවීය. ආරාමයට පැමිණි පසු එම පිණ්ඩ පාත ආහාරය පමණක් වැළඳීය. වෙනත් අය දුන් ආහාර නොපිළිගති. බොහෝ කාලයකට පසු වයස්ගත වූ විට පමනක් දායකයින් ගෙනැවිත් පිළිගන්වන ආහාර වැළඳුවේය.

ආහාර වැළඳීමේදී කුස ගින්න නිසා ආහාරවලට තණ්හාව ඇති විය හැකිය. එබැවින් ප්‍රත්‍යවේක්ෂා කරයි. කුසගින්න නිසා අභ්‍යන්තර අපා ගිනි මෙන් දුක හට ගනී. එබැවින් රස තෘෂ්ණාව හට ගනී. මේ අවස්ථාවේදී ආහාරයේ පිළිකුල් භාවය මෙනෙහි කළේය. සතර මහා භූතයන්ගෙන් සෑදුනු ආහාර බාහිර ලෝකයෙන් ලැබී ඇත. එය මෙත්තා, කරුණා පෙරදැරිව හැම කටක් පාසා විකීම, ගිලීම ආහාර ඉවර වන තාක් ආවර්ජණා කරයි. එවිට තෘෂ්ණාව හට ගැනීමට නොහැකිය. ඉන්පසු පාත්‍රට සෝදා, පිසදා ඉර එළියේ ටික වේලාවක් වේලා රෙදි කවයේ බහා නියම තැන තැන්පත් කරයි. ඉන්පසු භාවනා කරන්නේ සති, පඤ්ඤාවෙන් තම සිතේ හටගත් කෙළෙස් මැඩලීමටය. සමුච්ඡේද ප්‍රඥාවෙන් කෙළෙස් මුලින් සිඳ දමයි.

එහෙත් මෙය ලෙහෙසි දෙයක් නොවේ. අපි මහත් වීර්‍යයයෙන් කෙළෙස් විනාශ කර පුළුස්සා දැමීමට වැර දැමූ නමුත් කෙළෙස් අප පිළිස්සීමට පටන් ගනියි. එවිට කෙළෙස් දුරු කිරීමට ගත් උපාය මාර්ගය අත් හරින්නට වේ. ඒ

කෙළෙස් මර්දනය කිරීමට ගත් ක්‍රියා මාර්ගය දුෂ්කර යැයි සිතන බැවිනි. එවිට කෙළෙස් අප සිතේ රජ කරයි. කෙළෙස් වලට වසඟ වී ඒ අවශ්‍යතාවය සපුරාලයි. අවාසනාවකට මෙන් ලෝකයේ සුළු ප්‍රමාණයක් පමණක් මෙ කෙළෙස්වල ක්‍රියාකාරිත්වය හඳුනා ගනිත්. එබැවින් තුන් ලෝකයේ සියලු දෙනාම පාහේ කෙළෙස් වලට වසඟ වෙති. මේ කෙළෙස් මුලින් උපුටා දැමීමේ ප්‍රතිපදාව හඳුනා ගන්නේ සම්මා සම්බුදු කෙනෙක් පමණි.

මේ ධර්මය සොයාගත් පසු බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයාට අනුකම්පාවෙන් තම ශ්‍රාවකයින්ට ඉගැන්වූ සේක. එම ශ්‍රාවක පිරිස මෙම ධර්මය අනුගමනය කොට කෙළෙස් දුරු කළහ. මේ උතුම් මාර්ගයේ අවසානය නිවනයි. මේ උතුම් ශ්‍රාවක සංඝයා කෙළෙස් වලින් සදහටම වෙන්විය. එම ආර්‍ය්‍ය සංඝයාට ලෝකයා මේ දක්වා භක්ති ආදරයෙන් නමස්කාර කරති.

ආචාර්‍ය්‍ය මන් එවැනි කෙළෙස් දුරු කිරීමේ මාර්ගය අනුගමනය කළේය. උන්වහන්සේගේ ශ්‍රද්ධා බුද්ධිය වචනයට සීමා වූ දෙයක් නොවේ. හීල් දාන-යෙන් පසු තම සක්මන් මළුවට ගොස් භාවනාවේ යෙදේ. ඉන්පසු හිඳීමෙන් භාවනා කරයි. පසුව සුළු විවේකයක් ගනී. ඉන්පසු නැවතත් කෙළෙස් ප්‍රහාණය පිණිස, අනන්ත දුක් දෙන මෙම කෙළස් යටපත් කළ යුතුය යන අදහසින් තම ශාරීරික ශක්තිය යොදමින් භාවනා කරයි. එබැවින් කෙළෙස් වලට නැඟී ඒමට අවකාශ නැත. සමාධි භාවනාවේ යෙදෙමින් විටින් විට විපස්සනා කරයි. මෙසේ නොනවත්වාම සමථ විපස්සනාවේ යෙදුනෝය. සමථ හෝ විපස්සනාව අඩු වැඩි නොවිය. එබැවින් තම සිත ඉතාම සන්සුන් විය.

එනමුත් භාවනා දියුණුව අඩු අවස්ථාවන් ද විය. ඊට හේතුව උපදෙස් ලබා ගැනීමට කිසිවෙක් නැති වීමයි. දින ගණනක් යම්කිසි ප්‍රශ්නයක් විසඳාග ැනීමට මහන්සි ගත්හ. තමාගේ ව්‍යායාමය වැරදි වුවහොත් ඊට කළ යුතු ප්‍රතිකර්මය කුමක්ද ? එවැනි අවස්ථා දැක අත්හැරිය යුතුය. හොඳ ගුරු ඇසුර ඉතාමත් වටින්නේ මෙවැනි අවස්ථාවේදීය. නැතහොත් කාලය ශ්‍රමය අපතේ යයි. උන්වහන්සේට ගුරු ඇසුරක් නොලැබුන බැවින් පසු බැසීම් ඇතිවිය.

## ආචාර්‍ය්‍ය සාඕ කනතසීලෝ

මුල් කාලයේදී විටින් විට උන්වහන්සේ ආචාර්‍ය්‍ය කනතසීලෝ සමඟ ගමන් කළේය. හොඳ ආචාර්‍ය්‍යවරයෙක් උන්වහන්සේට අනුග්‍රහය දැක්වූහ. යම් ගැටළුවකදී උපදෙස් ඉල්ලූ විට ආචාර්‍ය්‍ය සාඕ මෙසේ කීවේය. ''මගේ භාවනා අත්දැකීම් ඔබ වහන්සේගේ අත්දැකීම් වලට වඩා වෙනස්ය. ඔබතුමාගේ සිත

අධිවේගීය, නිර්භීතය. නිතරම අනන්තයට යයි. එක් විටක මහත් වීර්‍යයෙන් අහස උසට යයි. අනිත් මොහොතේදී පොළොවට පතිත වේ. මුහුදු පත්ලට කිඳා බැස ඊළඟ මොහොතේ අහසේ ගමන් කරයි. ඔබගේ සිත දෙස බලා සිටිය හැක්කේ කාටද ? ඔබ වහන්සේම ඒ ප්‍රශ්න වලට විසඳුම් සෙවිය මැනවි.'' මෙ-සේ උන් වහන්සේට උපදෙස් ලැබුනේ නැත. එබැවින් තනිවම විසඳුම් සෙවීය. සමහරවිට මාරාන්තික සටනකට වැදී ප්‍රශ්නය නිරාකරණය කළහ.

තම ගුරුවරයා ගැන සඳහන් කළේ ''ඉතාම ශාන්ත දැමුණු ඉන්ද්‍රිය ඇති කෙනෙකි.'' සැමගේ ප්‍රසාදය, ශ්‍රද්ධාව උන්වහන්සේට ලැබුණි. සමාධි භාවනාවේ යෙදෙන විට ශරීරය පොළොවෙන් ඉහළට යයි. තමා අහසේ පාවෙන බව දකි-න්නට ඇස් ඇරිය විට නැවත පොළොව මත පතිත වේ. එවිට තම තට්ටම බිම වැදී දින කීපයක් රිදුණි. ඇත්තෙන්ම අඩි 3ක් පමණ පොළොවෙන් උඩ සිටී. සති සමාධිය ඇති විට පහත වැටුණේ නැත.

මේ සිද්ධිය උන්වහන්සේට බොහෝ දෑ දැන ගැනීමට ඉවහල් විය. පරීක්ෂණ පැවැත්වීය. යම් පොඩි රෙදි කැබැල්ලක් වහලේ පොල් අතුවල රැඳෙව්වේය. පසුව සමාධිගත වූ විට ඉහළට ඇද යන බව හැඟුණි. එවිට තම සිත එකඟ කරගෙන සමාධියෙන්ම වහලේ තිබූ දෙය තම අත දිගු කර අතට ගත්තේය. තවමත් සමාධියෙන් තමා සිටි තැනට පත්විය. මෙසේ තමාට අහසින් යා හැකි බව ස්ඵුට විය. භාවනා කරන හැම විටම එය සිදුනොවේ. ආචාර්‍යය සාමි මුළු ජීවිත කාලයම මෙවැනි භාවනා අත්දැකීම් වලින් සිත සන්සුන් කර ගත්හ. උන්වහන්සේගේ අත්දැකීම් සහ චරිතය ආචාර්‍යය මන්ට වඩා හාත්පසින්ම වෙනස් විය. උන්වහන්සේට භයානක දේ කිරීමට ද කැමැත්තක් නැත. එබැවින් නොයෙක් විධියේ අද්භූත දේ කිරීමට නොහැකි විය.

ආචාර්‍යය සාමි බොහෝ කාලයකට පෙර පසේ බුදු බව ප්‍රාර්ථනා කළ බව ආචාර්‍යය මන්ට කීවේය. මේ නිසා බොහෝ කාලයක් සසර සැරි සැරීමට සිදුවේ. එබැවින් මේ අත්බැව්හි නිවන් ප්‍රත්‍යක්ෂ කිරීමට කැමැත්තන් නොතිබුණි. පසුව මෙම අධිෂ්ඨානය අත්හළහ. හැකි ඉක්මණින් නිවන් අවබෝධ කිරීමට වෑයම් කළහ.

මෙසේ භාවනා කර නොබෝ කාලයකින්ම උන්වහන්සේ පැතූ මාර්ග ඵල ලැබුවේය. එහෙත් ධර්මය කියා දීමේ හැකියාව නැත. එය උන්වහන්සේගේ මුල් ප්‍රාර්ථනාව නිසා විය හැකිය. පසේ බුදුවරු තමන් සම්‍යක් සම්බෝධිය සාක්ෂාත් කරණ නමුත් අන් අයට ධර්මය දේශනා නොකරති. තවද උන්වහන්සේගේ මුල් අධිෂ්ඨානය එතරම් ස්ථාවර නොවූහෙයින් ඉන් වෙනස් වීමට හැකිවිය.

බොහෝ කාලයකට පෙර ආචාර්යය මන් එවැනි ප්‍රාර්ථනාවක් කළහ. ඒ බව

උන්වහන්සේ භාවනා කරණ අවස්ථාවේදී දැන ගත්තේය. එනම් සම්මා සම්බුදු වීමටය. එබැවින් මේ අත්බැව්හිදී මාර්ගඵල ලබා ගැනීමට මැලිවිය. ධූතාංග කර්මස්ථාන භාවනාවේ යෙදුන විට මෙම ප්‍රාර්ථනාව අත්හලහ. බුද්ධත්වය ලැබීමට කල්ප ගණනක් සසර සැරි සැරිය යුතුය. ඉපදීම, දිරීම, ව්‍යාධිය, මරණයට බොහෝ කාලයක් තිස්සේ පත්වේ. ඉමක් කොනක් නතිව දුක් වින්ද යුතුය.

එබැවින් එ ප්‍රාර්ථනාව අත්හළ මොහොතේ සිට ඉතා ඉක්මණින් භාවනාව සාර්ථක විය. උන්වහන්සේ එතරම් දැඩි අධිෂ්ඨානයකින් පාරමිතා සපුරා නැති බැවින් ඉන් බැහැරවීමට හැකිවිය.

බොහෝවිට උන්වහන්සේලා දෙනම උතුරු නැගෙනහිර ප්‍රදේශයේ චාරිකාවේ යෙදුනහ. දෙදෙනාගේ චරිත ලක්‍ෂණ බෙහෙවින් වෙනස් වුවද ඉතා සුහද මිත්‍රත්‍වයක් තිබුණි. ආචාර්යය සාඕ වැඩිපුර කථා නොකරයි. ගිහියන් ආශ්‍රය කිරීමට, ධර්ම කියාදීමට මැලිවිය. කලාතුරයකින් ගිහියන්ට බණ කීවේ ඉතාම සුළු වේලාවකි. උන්වහන්සේගේ දේශනා මෙසේ දැක්විය හැකිය.

''ඔබ අකුසල් අත්හැර කුසල් දියුණු කරන්න. මිනිසත් බවක් ලැබීමේ භාග්‍යය ඔබට ඇත. එය අපතේ දමන්න එපා. මිනිසත් බව ඉතා දුර්ලභ දෙයකි. එබැවින් තිරිසන් ගත සතුන් මෙන් හැසිරීම් නොවටී. එසේ වුවහොත් ඔබ තිරිසන් ගණයට අයත් වේ. තිරිසනාටත් වඩා දුඃඛිත වේ. අපාගත වූ විට තිරිසනුන්ගේ දුකට වඩා වැඩි දුක් විඳියි. එබැවින් වැරදි කිරීමෙන් වෙන් වෙන්න.''

මෙපමණක් දේශනා කර තමන් වහන්සේගේ කුටියට ගියේය. පිරිස ගැන කිසිම හැඟීමක් නැත. උන්වහන්සේ කථා කරන්නේ වචන ස්වල්පයකි. මුළු දවසකටම වාක්‍ය කීපයකි. එහෙත් පැය ගණන් භාවනාවේ යෙදේ. උන්වහන්සේට තේජාන්විත ගතියක් ඇත. උන්වහන්සේට සැමෝගෙම ආදරය, ගෞරවය ලැබුණි. එම තැන්පත් ලක්‍ෂණ දේහය දැකීමෙන් ආස්වාදයක් ලැබේ. ආචාර්යය මන් මෙන් බොහෝ ශිෂ්‍යයෝ සිටියහ.

මෙම ආචාර්යයවරු දෙදෙන ඉතාමත් සුහද මිත්‍රයන් බව කවුරුත් දනිති. මුල් කාලයේදී එකටම විසූහ. මධ්‍යම යුගයේදී වෙන් වුනි. එහෙත් ඈත් වූයේ නැත. විශාල ශිෂ්‍ය පරම්පරාවක් සිටි නිසා වෙන් වෙන්නට වි. ශිෂ්‍යයන් ආ විට මුලින්ම අසන්නේ ආචාර්යය තුමාගේ සුව දුක් පිළිබඳවය. මෙම ශිෂ්‍යයන් තුළින් දෙදෙනා අතර කිට්ටු සම්බන්ධ ඇති කළහ. කථා කරන විට මේ දෙදෙනා වහන්සේලා අතිශයින් අනිත් ආචාර්යයවරයාගේ ගුණ කථනය කරති. කිසිවිටක විවේචන නොකළේය.

ආචාර්යය මන්ගේ භාවනාව කලින් සඳහන් කළාක් මෙන් ඉතාම සූක්‍ෂම විය. සිත මොහොතකින් ශරීරයෙන් ඉවත් වී ඈත අහසේ සංචාරණය කරයි.

නැතහොත් පොළොවෙහි කිඳා බැස නොයෙක් දේ අරමුණු කරයි. නොයෙක් විශ්මය ජනක දර්ශන දකිත්. මුල් කාලයේදී දුටු ඉදිමී ගිය මළ කඳ සහ විනිවිද පෙනෙන කවය ආදිය පසු කාලයේදී නොපෙනුණත් සමාධියත් සමඟ සිත පිටට ගමන් කරයි. සමහරවිට ශරීරයක් අහසේ පාවෙනවා දැනේ. පැය ගණන් දිව්‍ය ලෝකවල දිව්‍ය මන්දිර දකියි. සමහරවිට පොළොව තුළට කිඳා බැස අපායේ දුක් විඳින තිරිසතුන් දකියි. තම කර්ම ඵල අනුව භයානක දුක් විඳින සත්ත්වයන් දැක මහත් කරුණාව පහළ වේ. මේවා දෙස බලමින් සිටින විට කාලය ගතවන වගක් නොදැනේ. ඒ මුල් කාලයේදී මෙම දර්ශන සැබෑ නැත්නම් සිතේ මැවෙන මනඃකල්පිත රූපදැයි නොදනී. පසු කාලයකදී ඒවායේ ඇත්ත ස්වභාවය අවබෝධ වුණි. සමාධිය ප්‍රඥාවෙන් මොහොතකට තොර වූ විගය සිත සැනින් පැන යයි.

දිනක් උන්වහන්සේ මෙසේ පැවසීය. ශරීරයේ අවයව දෙස විපස්සනාවෙන් බලා සිටින විට එය නැවතී සිත ශරීරයේ යටිකය පසාරු කර පොළොවේ කිඳා බැස්සේය. එවිට සිත නැවතත් කය වෙත යොමු කළ වහාම හිස් මුදුනින් පලාගෙන අහසේ ඔබ මොබ හැසිරෙන්නේය. නැවත ශරීරයට ඇතුල්වීමට උනන්දුවක් නැත. අමාරුවෙන් සිත ආපසු ශරීරයට ගෙන කායානුපස්සනාවේ යෙදීමට සිදුවේ.

මුල් කාලයේදී සිත ඉතා ඉක්මණින් සමාධිගත විය. කඳු මුදුනකින් වැටෙන්නාක් මෙනි. නැතහොත් ළිඳකට වැටෙන්නාක් මෙනි. සතියෙන් සමාධිය නවත්වා ගැනීමට නොහැකිවිය. අමාරුවෙන් උපචාර සමාධියෙහි පිහිටියේය. බොහෝ දර්ශන දකින බැවින් වෙහෙසට පත්වුණි. කායානුපස්සනාවේ සිට කය විපස්සනා කිරීමට නොහැකිවිය. සති පඤ්ඤාවෙන් එම බලවත් සමාධිය නතර කළ නොහැකි විය.

මුල් කාලයේදී මේ තත්ත්වය ගැන කිසියම් අවබෝධයක් නොතිබුණ බැවින් භාවනාව වැරදි අතකට යන බව සිතුණි. මෙය තමාගේ අත්දැකීමක් නිසා කිසිවෙකුට කීමට නොහැකි විය. ඉතා අපහසුවෙන් සති, පඤ්ඤා වඩා මේ තද සමාධිය මෙල්ල කිරීමට නොයෙක් උපක්‍රම යෙදීය. අන්තිමේදී තමාගෙ " සිත තමා කැමති අරමුණක පිහිටුවා ගැනීමට හැකිවිය. එවිට සමාධි, සති, පඤ්ඤා එකසේ බලවත් වුණි. සිත මැජික් පළිඟු බෝලයක් මෙනි. තමා කැමති පරිදි නා නා අරමුණු හැසිර විය.

ආචාර්යය මන් නිර්භය බලවත් චරිතයකි. ඉතාම නුවණැතිය. උන්වහන්සේගේ දැඩි ප්‍රතිපත්ති කිසිවෙකුට අනුගමනය කළ නොහැකිය. එය සිතීමට පවා

උගහටය. මගේ මතකයේ හැටියට මෙස් සඳහන් කරමි. ''උන්වහන්සේ අති උත්තම පුරුෂයෙකි. උන්වහන්සේගේ සිත ඉතා ඉක්මන්ය. උන්වහන්සේ තම සිත පාලනය කළේ මහත් වීර්‍යයකිනි. දෘඪ හික්මීම උන්වහන්සේට ආවේණික විය. ඉතා තද ලෙස ද ඉතා මෘදු ලෙසද හික්ම විය. පාලනයෙන් තොර වූ විගස සිත වේගයෙන් ගමන් කිරීම නිසා මහත් ගැටළු ඇතිවිය.

තම සිත පාලනය කිරීමට බලවත් වෙහෙස් දැරීය. උපදෙස් ලබා ගැනීමට කිසිවෙක් නැත. ආචාර්‍යය මන් සමහර විට මහත් කම්පාවට ලක්විය. තමන් ඔළුව ගල් පර්වතයක ගහ ගත්තාක් මෙන් සිතුණි. පසුකාලයේදී ගුරුවරයෙක් නැතිව භාවනා කිරීම නුසුදුසු බව තම ශිෂ්‍යයන්ට තරයේ කියා සිටියේය. එසේම ඔවුන්ගේ සියළු ගැටලු නිරාකරණය කළහ. තමන් විඳි දුක ශිෂ්‍යයන්ට නොදුණි.

මහණ උපසම්පදා වී ටික දිනකින්ම ආචාර්‍යය මන් නබොන් ෆනොම් ප්‍රදේශයේ ධූතාංග කර්මස්ථාන භාවනාවේ යෙදුණි. මීකොං ගඟ හරහා ගොස් ලාඕස් හි ටාබෙක් කඳු කරයේ වාසය කළහ. මෙම ඝන වනාන්තරය විශාල භයානක කොටින්ගෙන් ගහණය. ගඟේ අනිත් ඉවුරේ තායි කොටි එතරම් භයානක නැත. නිතරම පාහේ ගමේ මිනිසුන් අල්ලාගෙන භක්ෂණය කළහ. එතරම් භයංකාර වුවත් එහි නිවැසි වියට්නාමයෙන් ඇවිත් පදිංචි වූ මිනිස්සු කොටින්ට බිය නොවෙති. කොටි නිතර මිනිසුන් මරා කෑවත් ඔවහු ගැන භය නොවූහ. නැවත නැවතත් එම වනාන්තරයේ හැසිරෙති. එවැනි සිද්ධීන් ස්වාභාවික යැයි පිළිග නිති. එහෙත් තායි ලාඕස් ජාතිකයින් මහත් සේ භයංකර වේ.

වියට්නාම් ජාතිකයින් තුළ තිබූ අනිත් පුදුම එලවන පුරුද්දකි. එනම්, විශාල කොටියෙක් එකවිට කැළෑ රොදකින් පැන තම සගයා මරා දමන විට ඔහු බේරා දැමීමට ප්‍රයත්නයක් නොදරා ඔහු එතනම හැර දමා දුව, පැන යති. සමහර විට ගම්වැසි කීප දෙනෙක් කැලයේ නිදති. එක්වරම කොටියෙක් පැන ඉන් එක් මිනිසෙකු අල්ලාගෙන යති. අනිකුත් අය පිබිදී පැන දුවති. ඉන්පසු කැලේ වෙන තැනක නිදා ගනිති. මෙවැනි දේ ගැන කිසි කනස්සල්ලක් නැතිව පොඩි ළමයි මෙන් හැසිරෙති. මේ මහා මෘග සතා පැන එක් මිනිසෙකු ඇදගෙන ගිය නමුත් තමන්ට එසේ වෙතැයි නොසිතා සිටිති.

කොටින්ට භය නැති සමහර වියට්නාම් ජාතික මිනිසුන් මා දැක තිබේ. අපේ රටට පැමිණ මහා ඝන වනාන්තරයේ වාසසථාන සාදාගෙන ඔව්හු ජීවත් වෙති. කොටි සහ වන සතුන්ගෙන් මේ ප්‍රදේශය ගහණය. මහ කැලේ මැද දැව කැපීමට යත්. රෑ බෝ වූ විට එහිම නිදත්. ගමෙන් බොහෝ ඈතය. කිසිම බියක් ඔවුන් තුළ නැත. තනිවම වුවත් කැලේ නොබියව නිදා ගනිත්. තනිව ගමන් යාමට මහා රාත්‍රියේ වුවද භය නැත. එහෙ මෙහෙ කැලෑවේ ඇවිදිති. ''ඔවුන්ගෙ

" රටේ කොටි මිනී මස් කන නමුත් තායි රටේ කොටි මිනී මස් නොකති. ඔවුන් මිනිසාට භය වෙති.'' යනු ඔවුන්ගේ මතයයි. තමාගේ රටේ එසේ නොව, රාත්‍රී ගත කිරීමට කැලෑවේ එම ප්‍රදේශය ආවරණය කළ යුතුයි. එම ස්ථානය උගුරු මඩ වලක් වැනිය. නැතහොත් ආපසු ගට යාමට නොහැකි බව කියති. කොටි රාත්‍රි කාලයේ ගමටද පනිති. කිසිවෙක් රෑ බෝ වූ විට ගෙයින් එළියට නොයත්. කළුවර කැලෑ රොදකින් එකවිට කොටියා පැන මිනිසුන් ඩැහැගෙන යති. වියට්නාම් ජාතිකයෝ මෙසේ නිර්භය වෙති. ''තායි මිනිසුන් මහා බිය ගුල්ලෝ යැයි ඔව්හු නින්දා කරති. තායි මිනිසුන් තනිවම කැලේ සංචාරය නොකරති.'' යි ඔව්හු සරදම් කරත්. මේ ආදී කරුණු නිසා ආචාර්යය මන් වියට්නාම් ජාතිකයින් කොටින්ට භය නැතැයි පවසයි.

ආචාර්ය මන් වියට්නාම් කැලේ වාසය කරන විට එහි සිටි කොටි කිසිවිටක උන්වහන්සේට තර්ජනයක් නොවීය. රෑ කාලයේ ඔවුන් ගොරවන ශබ්දය මුළු කැලය දෝංකාර කරයි. ඔවුන් ගමන් කරන අඩි පාරවල් දක්නට ඇත. ඒවා කැලෑවේ සාමාන්‍ය ශබ්ද ලෙස සිතා බිය සැක නොකරයි. උන්වහන්සේගෙ " එකම බිය වූයේ තමන් වහන්සේට මේ අත්බැව්හි සංසාර දුක ඉක්මවන්නට නොහැකි වේද ? යන්නයි. මේ අත්බැව්හි නිවන් ශාක්ෂාත් කළ යුතුය යන්න එකම අධිෂ්ඨානය විය.

මේකොං ගඟ හරහා යන විට තමන් වහන්සේ බිය වූයේ දැයි අසන විට ''නැත'' යන පිළිතුර ලැබුණි. මෙවැනි අභියෝගවලට මට මුහුණ පාන්නට වුණි නම් ගමේ මිනිසුන්ට මාව රැකීමට සිදුවන්නේය. මා කැලේ සක්මන් කරන විට කොටින්ගේ ගොරවන නාදය ඇසී භයින් ත්‍රස්ත වී ඇවිදීමට නොහැකි වුණි. කොටියා දැන් දැන් මා ඉදිරියට ඒවි යන භීතිය ඇතිවිය. කොටි ඉතාම දරුණු වන සතුන් බව කුඩා කාලයේ සිට දෙමාපියන්ගෙන් අසා ඇත. මේ බිය මගේ සිතේ ස්ථිරව පදිංචි වී ඇත. එබැවින් කොටින්ට බිය නොවී සිටිය නොහැකිය. තවමත් මේ බිය ඉක්මවා නැත.

ආචාර්යය මන් මුල් කාලයේදී උතුරු තායිලන්තයේ නොයෙක් ප්‍රදේශයන්හි සංචාරණය කළහ. පසු කාලයේදී තමන් බලවත් සමාධියට පත් වු නිසා බාහිර අරමුණු වලින් සිත චංචල නොවීය. එවිට දකුණ බලා ගමන් කළේය. ධූතාංග රකිමින් ක්‍රමයෙන් බැංකොක් නගරයට පැමිණුනි. එහි වට් පැතුම්වන් ආරාමයේ වස් විසුවේය. මේ කාලයේදී වට් බොරොමනිවට් ආරාමයෙහි වැඩ විසූ චඕ ඛන් උපාලි ගුණූපමාචාර්යය භික්ෂූන් වහන්සේ නිතර ඇසුරු කරමින් ප්‍රඥාව දියුණු කරන අන්දම විචාළේය.

වස් අවසානයේ ආචාර්යය මන් පා ගමනින් ගොස් ලොප්බුරි ප්‍රදේශයේ ෆාන්ගම් කඳු මුදුනෙහි පිහිටි ෆයික්වං ගල් ගුහාවේ ලැගුම් ගති. මෙම අතිශයින්

යෝග්‍ය වූ පරිසරයේදී භාවනා බලය තවත් දියුණු විය. ඉන්පසු සිංටො ගුහාවෙහි වාසය කළහ. මේ කාලයේදී සිත බලවත් විය. පරිසරයේ කිසිම දෙයකින් කම්පා නොවීය. එබැවින් මහත් සේ නිර්භය විය. මේ වන විට උන්වහන්සේගෙ සමාධිය ගලක් මෙන් ස්ථාවර විය. මේ සමාධියේ පැවතෙමින් නොනවත්වාම ධම්මානුපස්සනාවේ යෙදෙමින් ප්‍රඥාව වැඩිය හැකි ක්‍රම සහ විධි අධ්‍යයනය කළහ. ටික කාලයකට පසු නැවතත් බැංකොක් නුවර වට්බොරොමහි වට්හි විසූ චඕ බුන් උපාලි තෙරුන් සමඟ සාකච්ඡා කළහ. තම සැක දුරු කරමින් සෑහීමකට පත්වුණි. මාර්ගය පිළිබඳ දැන් පැහැදිලිය. උන්වහන්සේගෙන් සමුගෙන නබොන් නොයෙක් ප්‍රදේශයේ කො යයි කඳු මුදුනේ පිහිටි සාරිකා ගල් ගුහාවට පැමිණියහ.

## සාරිකා ගල්ගුහාව

ආචාර්ය මන් සාරිකා ගල් ගුහාවෙහි අවුරුදු 3ක් භාවනා කරමින් සිටියහ. මුළු කාලය තුළම අද්භූත සිද්ධීන්ගෙන් යුක්ත වූ බැවින් මෙම කාලය උන්වහන්සේගේ ජීවිතයේ අමතක නොවන කාලයකි. මගේ මතකයේ හැටියට මුලින්ම ගියේ ගල් ගුහාවට ආසන්න බන් ගලු ඒ ගම්මානයටය. මෙම පලාත නොදන්නා බැවින් ගැමියන් සමඟ ගල් ගුහාව සොයා ගියහ. ගැමියෝ අනතුරු ඇඟවූහ. මෙම ගල් ගුහාව නොයෙක් අද්භූත හාස්කම් වලින් යුක්තය. ඉතාම පිරිසිදු සිල් නැති ඇත්තන්ට එහි වාසය කළ නොහැකිය. නොයෙක් භික්ෂූන් වහන්සේලා එහි වාසයට ගොස් තද බල ලෙස රෝගාතුර විය. සමහරු වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට පෙර මරණයට පත්වුණි. මහා විශාල ශරීර ඇති අමනුෂ්‍යයෝ එහි සිටිති. ඔවුන්ට අද්භූත බල ඇත. සැර පරුෂ ගති ඇත. එහි යෝධ අමනුෂ්‍යයෝ ගල් ගුහාව ආරක්ෂා කරත්. නොසිතූ විධියට එහි අමුතු දේ සිදුවේ. මෙම අමනුෂ්‍යයෝ භික්ෂූන් වහන්සේලාට අභියෝග කරති. යක්කු එලවන්ට හැකිදැයි විමසති. නොයෙක් විධියේ භය, භීතිය නිසා රෝගාතුර වී මරණයට පත්වෙති. ගැමියෝ එහි නොයන ලෙස ආචාර්ය මන්ට ආයාචනය කළහ. මෙම කෝපා විෂ්ට වන දුෂ්ට කළු අමනුෂ්‍යයා ගැන විස්තර ඇසූ විට ගැමියෝ මෙසේ කීහ. යමෙක් මෙම ගුහාවට ආ මුල් රාත්‍රියේම භයංකාර සිහිනක් දකී. මහා විශාල යක්ෂයෙක් තමා ඉදිරියේ සිටී. ඔහු මරණ තර්ජන කරයි. ''මෙම ගුහාව මට අයිතිය. කිසිවෙකුට සිටීමට මෙහි ඉඩ නැත. මෙහෙන් එළියට ඇද දමා මරනවා, ඉතාමත් සිල්වත්, කරුණා, මෛත්‍රී ඇති ගුණවත් අයෙකුට පමණක් ඉන්ට ඉඩ ලැබේ. එවැන්නන් ආරක්ෂා කරනු ඇත. නරක වැරදි කරන අය විනාශ කරනවා'' ආදී වශයෙනි.

බොහෝ භික්ෂූහු මේ අත්දැකීම නිසා බිය පත් වී ගුහාව හැර යති. සාමා-

න්‍යයෙන් දිනක් හෝ දෙකක් ලැගුම් ගනිත්. භයින් වෙව්ලමින් ඉන් බැස යති. නැවත කිසි දිනක ආවේ නැත. සමහරු මෙම ගුහාවට නැංගා පමණි. බහින්නට ලැබුණේ නැත. ගැමියෝ මෙසේ ආචාර්‍යය මන් වැළැක්වූහ.

සමහර භික්ෂූන්ට බනින්ට ලැබුණේ නැත්තේ ඇයිදැයි ඇසූ විට මීට ටික කාලයකට පෙර ඉතාමත් සිල්වත් භික්ෂූන් වහන්සේලා 4 නමක් එහි මළහ. උන්වහන්සේලා ද යම් දෙයකට භය නැති බව කීවාහ. අමනුෂ්‍යයන් මර්දනය කිරීමට තමා ළඟ බලගතු යන්ත්‍ර, මන්ත්‍ර ඇති බව කීහ. මෙසේ නොයෙක් ලෙස කී නමුත් ආචාර්ය මන් එහි යාමට තීරණය කර කඳු මුදුන යන්ට පාර විචාළේය. ගැමියෝ අකමැත්තෙන් වුවද පාර පෙන්වා දුන්හ.

ආචාර්ය මන්ට මෙම ගල් ගුහාව දකින්නට කුතුහලයක් තිබුණි. මේ ගැමියෝ කියන්නේ ඇත්තක්ද ? සති, පඤ්ඤා, වීර්‍යය වැඩීමට මේ භයානක අරමුණු උපකාර වේ. සත්‍යය සෙවිය යුතුය. යම් දුෂ්කරතාවයක් වෙතොත් ගමට පැමිණෙන බව කීහ.

ටික දවසක් යන තුරු උන්වහන්සේට කිසිම අමුත්තක් නොදැණුනි. අවට පරිසරය නිහඬය. සතුන් දඩයම් කිරීමේදී ඇතිවන ශබ්ද පමණි. ඉන්පසු බඩේ රිදුමක් හට ගති. එය සාමාන්‍ය දෙයක් ලෙස සිතුවත් ඉක්මණින් වැඩිවිය. කිසිම ආහාරයක් දිරවන්ට බැරිවිය. ලේ සමග සියලු ආහාර මළ පහ කළේය. උන්වහන්සේ මෙසේ සිටියොත් ගැමියන් කී පරිදි 5වෙනි භික්ෂූන් වහන්සේ මෙන් මරණයට පත්වේ. ගිහියන් උන්වහන්සේ දැකීමට ආ විට මෙම ආබාධයට යම් කැලෑ කොළ මුල් කොටා තම්බා පානය කරන්ට අවශ්‍ය බව කී විට එම බෙහෙත් ද්‍රව්‍ය ලබා, ඒවා පානය කළහ. කිසිම බෙහෙතකට මෙම රෝගය සුව නොවීය. දවසින් දවස ශරීරය ඉතාම දුර්වල විය. මනසද දුර්වල විය.

උන්වහන්සේ මේ පිළිබඳ සිතන්නට වුණි. මෙතරම් බෙහෙත් බීවත් මෙම ආබාධය සුව නොවේ. බෙහෙත් නිසා රෝගය වැඩි වෙනවාද? බෙහෙත් නවතා උන්වහන්සේ ධර්ම ශක්තියෙන් ලෙඩේ සුව කිරීමට තීරණය කළහ. ජීවත් වුණොත් හොඳයි මැරුණත් කමක් නැහැ මෙසේ සිතා සියලු බෙහෙත් නවතා භාවනාවේ යෙදුණි.

මම මග්ගඵල නිවන කරා යන මාර්ගය දිකිමි. මේ ශාරීරික දුක ඉවසමි. මෙවැනි වේදනාවක් උසුලන්නට බැරි ඇයි ? මෙසේ දුර්වල වී මම පරාජිත වෙමි. මරණයේදී කොහෙත්ම භයානක දුක ඉවසන්නේ කෙසේද? මේ ආදී වශයෙන් සිතා බෙහෙත් නැවැත්විය.

සියලු කායික මානසික ලෙඩ රෝග වලට එකම පිළියම මේ මගේ

ධර්මතාවයයි. මෙසේ මරණානුස්සතිය භාවනා කළේය. තම සිත, කය, විපස-සනා කළහ. අධික සති, පඤ්ඤා, විරිය උපදවිය. තම ශරීරයේ ඇති භයානක තත්ත්වය අමතක වි. මරණ බිය ද පහ විය. දුක් වේදනාව මෙනෙහි කළහ. නාම රූප වෙන් කර විපස්සනා කළහ. ශරීරයේ කොටස් වෙන් කරමින් එහි ස්වභාවය මෙනෙහි කළහ. වේදනා, පඤ්ඤා මෙනෙහි කළහ. සංඛාර උපදවන බවත් මතකයෙන් සඤ්ඤා එන බවත් මෙනෙහි කරමින් සවස යාමයේ සිට රාත්‍රී මධ්‍යම යාමය යන තුරුත් භාවනා කළහ. සිතේ කයේ ඇති සම්බන්ධය පෙණුනි. මෙසේ විපස්සනා කරන විට සිත සමාධිගත විය. සියළු වේදනා අතුරුදහන් විය.

ඉතා සුළු වේලාවක් සිත නිහඬ විය. ඉන්පසු උපචාර සමාධියට පත්වුණි. තම ආලෝකමත් සිත ශරීරයෙන් පිට වී ගියේය. ඒ මොහොතේදී විශාල ශරීරයක-ින් යුතු කළු මිනිසෙක් දුටහ. අඩි 30ක් පමණ උසැති මේ මිනිසාගේ අතේ යකඩ මුගුරකි. අඩි 12ක් පමණ දිග මිනිසෙකුගේ කකුලක් පමණ මහතය. මේ දැවැන්ත මිනිසා උන්වහන්සේ ළඟට ඇවිත් මේ මොහොතේම තලා පොළොවට සමතලා කරණ බව කීහ. දැන්ම පිටවෙන්ට අණ කළේය. ජීවිතයට ආසා ඇත්නම් යව. ඔහුගේ කථාව දෙදුරුම් කෑවේය. ඔහුගේ මුගුර කර උඩය. ඉන් එක පහරකින් දැවැන්ත ඇත් රාජයෙක් පොළොවට සමතා කළ හැකිය.

ආචාර්ය මන් ඔහු සමඟ කථා කළේය. කිසිම වැරැද්දක් නොකළ කෙනෙකුට එවැනි සාහසික දඬුවම් පමුණුවන්නේ මක් නිසාදැයි ඇසීය. එම කන්ද ඔහුට අයත්වේ. එයට අරක්ගෙන් සිටින නිසා කිසිවෙකුට ඔහුගේ බලය නැතිකළ නො-හැක. මෙතැනට එන සියලු දෙනා විනාශ කරණ බව කීය.

ආචාර්ය මන් ඔහුට බැණ වැදුණි. ''මම මෙහි ආවේ කාගේවත් අයිතිවාසිකම් උදුරා ගැනීමට නොවේ. මම ආවේ භාවනා කිරීමට මගේ සිතේ පහළ වන කෙළෙස් වල අයිතිය නැති කිරීමට සිල්වත් භික්ෂුවකට හිංසා, පීඩා කිරීම බලවත වරදක්. මම බුද්ධ ශ්‍රාවකයෙක්මි. උන්වහන්සේගේ කරුණා, මෛත්‍රී ගුණය මුළු විශ්වයේ පැතිරී පවතී. ඔබගේ ඔය මානාධික බලය ඊට වඩා උසස්ද ? ධර්ම, කර්ම නීතිය මුළු විශ්වයම ආණ්ඩු මට්ටු කරයි. මේ බව ඔබ දන්නෙහිද ?

''නැත ස්වාමීනි'', ඔහු පිළිතුරු දුනි.

අප සම්මා සම්බුදුරජාණන් වහන්ස්ට ශක්තිය බලය තියෙනවා. හිතේ පැන නගින ඔය වැනි මානාධික බලය පෙන්වමින් පුරසාරම් කියන බලය විනාශ කරන්ට. උන්වහන්සේගේ සිතේ අනුන්ට හිංසා, පීඩා කරන, මරණයට පත් කරන වැරදි සිත් පලවා හැර ඇත. උඹ සිතනවාද නුඹ මහා දක්ෂයෙක් කියා ? ඔබේ හිතේ ඇතිවන ඔය භයානක කෙළෙස් නැති කිරීමට කුමක් කළ යුතුදැයි ඔබ

දන්නෙහිද ?

''තාම නැත ස්වාමීනි'' යැයි පිළිගති.

මං ඔබ සිත් ඇති භයානක අකුසල් නිසා ඔබ ඉතා කෲර කෙනෙකි. ඔබේ බලය කෙතරම් තිබුණත් ඔබ සිතේ ඇති කෙළෙස් යටපත් කිරීමට බලයක් නැත. ඔබේ මැජික් බලයෙන් මිනිසුන් භය කර මරා දැමීම නිසා ඔබ ඊට වඩා භයානක ගින්නෙන් දැවෙන්නේය. මහා අකුසල කර්ම කර අපාගත වන්නේය. එය මදිවාට මා වැනි අහිංසක ධර්මයට අනුව ජීවත්වන අයෙකු මරන්ට තැත් කරයි. ඔබේ ගුණ ධර්ම මොනවාද හැසිරීම මෙතරම් භයානක සාහසික නොවේද ? ඔබ තරම් නරක කෲර අය නැති තරම්ය. මම උග්‍ර තපස් රකින සිල්වතෙක්මි. මම ධර්මය පිළිපදින්නේ මගේ සෙත පිණිසත් අන් අයගේ සෙත පිණිසත්ය. ඒ නමුත් ඔබ මා මරා පොළොවට සමතලා කිරීමට තැත් කරයි. ඔබ අපායට ඇදගොස් භයානක දුක් විපාක විඳින බව නොදන්නේද ? ඔබේ මහා බල ශක්තියෙන් කර්ම විපාක වැළැක්විය හැකිද ? ඔබේ බලය මේ ධර්ම කර්මයට වඩා වැඩිනම් මාව දැන් මරා දමනු මැනවි. මම මරණයට බිය නොවෙමි. අද නොමළත් යම් දිනක මැ-රෙන්නේය. ලෝකයේ සියලු දෙනාම මැරෙති. ඔබ කොතරම් බල පුළුවන්කාරයෙක් වුවත් ඔබද මැරෙන්නේය.

මේ අරුම පුදුම පුද්ගලයා මේ සියල්ල අසා සිටියේය. කෙලින් සිටිගෙන ගල් පිළිමයක් මෙනි. මහා මුගුර කර උඩ ඇත. මනුෂ්‍යයෙක් නම් ලැජ්ජාවෙන් භයෙන් ත්‍රස්ත වී සිටිතියි කියන හැකිය. හුස්ම හෙලන්නේ වත් නැත. ඔහු අමනුෂ-ෂ්‍යයෙක් නිසා හුස්ම ගන්නේ නැත. එහෙත් ඔහු ලැජ්ජා හයින් මිරිකී සිටින බව ආචාර්ය මන්ට පෙනේ. මහත් ආයාසයකින් ඔහුගේ දුක සඟවාගෙන සිටී.

ආචාර්ය මන් කථාව අවසන් කළහ. ඒ ක්ෂණණයෙහිම මේ දැවැන්ත පුද්ගලයා තම කරේ තිබූ විශාල මුගුර බිම හෙළුවේය. ඒ සමඟම මේ මහා කළු පුද්ගලයා සාමාන්‍ය උපාසක මහත්මයකුගේ හැඩයට පරිවර්තනය විය. යටත් පහත් ලීලාවකින් සිටගති. ඉන්පසු හද පත්ලෙන්ම ගෞරවයෙන් ආචාර්‍යය මන් ළඟට පැමිණියේය. ඉන්පසු මහත් පසුතැවිල්ලකින් සමාව ඉල්ලා සිටියේය. ඔහුගේ කථාවේ සාරාංශය මෙයයි.

''මම විස්මයට හා භීතියට පත් වුනේ ඔබ වහන්සේ මුලින්ම දුටුවිටය. ඔබ වහන්සේගේ මුළු ශරීරය තුළින් පුදුමාකාර දීප්තිමත් ආලෝකයක් විහිදුණි. ඔබ වහන්ස් මාව අභිබවා මගේ බලය නැති කරත්යැයි සිතුණි. මට කිසිවක් කර කියා ගන්ට නොහැකිවිය. මම ඔබ වහන්සේ මරණයට තැත් කළේ හදවතේ ඇති තරහකින් නොවේ. මගේ මානයට පහර වැදුණු බැවිනි. බොහෝ කාලයක් සිට මේ මුළු කන්ද අඩවිය මට අයත්යැයි මම සිතුවෙමි. අමනුෂ්‍යයෝ මට භය භීරන්ත

වෙති. නරක ගති ඇති දුස්සීල මිනිස්සු ද මට බිය වෙති. මගේ තද මානය හා ආත්ම දෘෂ්ටිය නිසා ඔබ වහන්සේ යටත් කරන්ට සිතුවෙමි. එහෙත් මගේ සිතේ භයක් සැකක් තිබුණි. ඔබ වහන්සේ මට වඩා බලපුළුවන්කාරයෙක් යැයි දැනුණි. මම අනුන්ට සළකන්නේ පහත් ලෙසය. ඔවුන් භය කිරීම, එය මගේ පුරුද්දයි. මට ඔබ වහන්ස් සමාවුව මැනවි. මින්පසු මම දුෂ්ට ගති අත් හරිමි මට තව දුක් විදීමට නොහැක. මීට වඩා දුක් විඳීමට සිදුවේදැයි භය වෙමි.''

ආචාර්ය මන් පිළිතුරු දුනි. ''ඔබට මහත් බල ශක්තියක් ඇත. ඔබේ ශරීරය ඝන ස්වභාවයක් නොවේ. ඔබට මිනිසුන්ට මෙන් ශාරීරික දුක් වේදනා නැත. බඩගිනි වේදනා නැත. රැකියා කර මිල මුදල් උපයන්නට නැත. ඔබට ඇති දුක කුමක්ද ? ඔබගේ දිව්‍ය ආත්මයත් දුකක් නම් දුක් නැත්තේ කොතැනද?

''මතුපිටින් බලන විට මිනිසුන්ට වැනි දුක් දේවා තම එල නැත. මිනිසුන්ට වඩා අපේ ශරීරයෙන් අපි සැප විඳිමු. එහෙත් ශරීරයෙන් දුක් තරමක් ලැබේ. උසස් හීන ආත්ම වල තරා තිරම් අනුව දුක් සැප ලැබේ.''

මෙම සාකච්ඡාව ඉතාම සංකීර්ණ නිසා එහි ස්වභාවය මට තේරුම් ගත නොහැක. එබැවින් මේ වචන වලින් ඔබට යම්කිසි අදහසක් දීමට උත්සාහ කරමි. එය සාර්ථක නොවීම ගැන සමාවුව මැනවි.

මෙම සාකච්ඡාව අවසානයේදී මේ අරුම පුදුම පුද්ගලයා ධර්මයට ගෞරව කර තෙරුවන් සරණ ගියේය. ''ඔබ වහන්සේ සරණ යමි'' කීවේය. ''ඔබ වහන්සේ මගේ ශ්‍රද්ධාවට සාක්ෂි වේවා'' මෙසේ කියා උන්වහන්සේ ආරක්ෂාකරණ බව කියා ගල් ගුහාවේ වැඩ වසන ලෙස ආරාධනා කළේය. උන්වහන්සේට ආරක්ෂාව සලසා විශාල කුසලයක් අත්පත් කර ගැනීමට ඔහු කැමති විය. ඇත්තෙන්ම ඔහු එහි වසන වෘක්ෂ දේවතාවන්ගේ අධිපතියාය. භුම්මා දේවා යනුවෙන් හැඳින්වෙන මේ දේව කොට්ඨාසය භූමියට ආසන්නව වාසය කරති. විශාල ගස් මුදුන්වල විමාන සාදා පවුල් පිටින් වාසය කරති. ඔව්හු වෙස් වලාගෙන මහා යක්ෂයෙක් මෙන් මිනිසුන් භය කළහ. මුළු නබොන් නයොක් කඳු කරය ඔවුන්ගේ අඩවිය වේ.

ආචාර්ය මන් මෙසේ සමාධියට සමවැදී මේ දෙවියන් සමග අළුයම 4 දක්වා සාකච්ඡා කළහ. ඉන්පසු සමාධියෙන් නැගී ස්වාභාවික තත්ත්වයට පත්වුණි. උන්වහන්සේගේ බඩේ රෝගය අතුරුදහන් වී තිබුණි. තමාගේ බලවත් රෝගය සුව වීමට භාවනා බලයෙන් හැකි බව විස්ම ජනකය. උන්වහන්සේට එය විශාල අත්දැකීමක් විය. ශරීරය වඩාත් ශක්තිමත් විය. මුළු රාත්‍රිය සමාධිගත වූ නමුත් වෙහෙසක් නැත. එබැවින් එළිවෙන තුරු භාවනා කළේය.

ධර්මයේ හාස්කම් උන්වහන්සේට ප්‍රත්‍යක්ෂ විය. මහා භයානක

අමනුෂ්‍යයෙකුගේ සිත වෙනස් කර ශ්‍රද්ධා භක්ති සම්පන්නව තෙරුවන් සරණ ගොස් උන්වහන්සේට අවනත විය. ඔහුගේ මානාධික බලය බිඳ වැටුණි. උන්වහන්සේගේ සිත පැය ගණන් බලවත් තෘප්තිමත් සතුටකට පත්විය. උන්වහන්සේගේ භාවනා දියුණුව ගැන දැන් සතුටට පත්වුණි. කිසිම සැකයක් දැන් නැත. නොයෙක් දර්ශන දැක්කේය. ඉන් සිත ඉතාමත් පිරිසිදු ප්‍රභාශ්වර විය. බොහෝ කෙළෙස් දුරුවිය. එම ප්‍රඥාව තුළින් උන්වහන්සේගේ මුළු චරිතය වර්ධනය විය.

ඊළඟ මාස ගණනාවක් උන්වහන්සේගේ භාවනාව ඉතා සාර්ථක විය. ඉන් කියන්ට බැරි තරම් සියුම් ආස්වාද ලදහ. ශාරීරික මානසික නිරෝගී බව ලදහ. සමහරවිට මැදියම් රාත්‍රියේ භූමාටු දෙවිවරු විශාල පිරිස් වශයෙන් අවුත් උන්වහන්සේ සමඟ කථා කරති. එම අධිපති දෙවියා. මුළු දේව සමාගම් වලට උන්වහන්සේ ගුණ නුවණ ගැන ප්‍රකාශ කර ඇත. මෙසේ අමුත්තන් නැති විට උන්වහන්සේ භාවනා කරති.

එක් සන්ධ්‍යාවක උන්වහන්සේගේ භාවනා ආසනය හැර ගල් ගුහාව ඉදිරිපිට එළිමහනෙ වැඩ සිටියහ. ධර්මය මෙනෙහි කරමින් බුදුරජාණන් වහන්සේ මෙතරම් හාස්කම් ඇති ධර්මයක් අවබෝධ කළේ යැයි ද මිනිස් වර්ගයාට මෙම දායාදය දුන් සේකයැයි ද මෙය නියම විධියට අනුගමනය කිරීම ඉතාම දුෂ්කර වුවද තමන් වහන්සේ යම්කිසි ප්‍රමාණයකට සාර්ථක වූයේ යැයිද එබැවින් කෙතරම් වාසනාවන්ත යයිද වශයෙන් ආවර්ජනා කළහ. තවමත් අවසාන මාර්ග ඵල නොලැබුණත් මේ මාර්ගයේ ගමන් කිරීමෙන් ලැබූ සතුට ආස්වාදය කිය නොහැකි තරම්ය. අවසාන අර්හත්වය ලබා ගැනීම හැකි බව වැටහුණි. මරණයට පත් නුවුනොත් එය ලැබේමය. එවිට සියලු දුක් ඉක්මවති.

මේ මොහොතේදී වඳුරෝ රැලක් කෑම සොයමින් උන්වහන්සේ ඉදිරියෙහි සිටියහ. වඳුරු නායකයා උන්වහන්සේ දැක විපිලිසර වී ගස් අතරින් දුව පනිමින් වඳුරු රැල වැළැක්වූහ. ''ගොකේ, ගොකේ'' ශබ්දය ඔවුන්ගේ වඳුරු භාෂාවෙන් කියන පිණිවිඩ විය. ඔවුන්ගේ ශබ්ද ආචාර්ය මන්ට තේරේ. එකිනෙකා කථා කරමින් තම බිය ප්‍රකාශ කළහ. ''ඒ කුමක්ද ?, මොකක්ද දන්නේ නැහැ. භයානක දෙයක්ද ?'' ''කොහෙන්ද කොනේද'' ''මේ මෙතැන මේ මෙතන'' ආදී වශයෙන් ආචාර්ය මන් පිළිබඳ අසති. වඳුරු නායකයා තම රැළ රැකීමට වෙහෙසේ. ආචාර්ය මන් ඔවුන්ගේ සැක බිය දැන මෛත්‍රී කරමින් මෙසේ සිතුවේය. ''මම මෙහි ආවේ භාවනා කිරීමට. ධර්මයට අනුව පිළිවෙත් පිරීමට. කිසිවෙකුට මගෙන් හානියක් නැත. මා කෙරෙහි භය නොවව් ! ඔබේ ආහාර කැමති පරිදි සොයා ගන්න. හැමදාම මෙහි ඇවිත් කෑම සෙව්වත් කම් නැත.''

එකෙනෙහිම වඳුරු නායකයා පණිවිඩය රැළට දුනි. එය බලාසිටීමට මහත්

විනෝදයකි. ''ගෝකේ ගෝකේ'' ''හෙමින් හෙමින්, දුවන්ට පනින්ට එපා'' ඉන්පසු මුළු රැළම ගුහාව ඉදිරියට පැමිණියහ. රැළේ නායකයාට ආචාර්ය මන් මහා කුතුහලයකි. ඉතාම කිට්ටුවට අවුත් විපරම් කරයි. ඔහුගේ බිය සැක මහත්ය.

ආචාර්ය මන් ඔවුන්ගේ කථා බස් හොඳින් තේරුම් ගත්තේය. ඔවුන් ගැන අනුකම්පා විය. ඔවුන්ගේ කෑ කෝ ගැසීම අපට ශබ්දයක් පමණි. එහෙත් ආචාර්ය මන් ඉතා සාවධානයෙන් අසා ඒ ඒ ශබ්දවල අර්ථ හඳුනයි. මුලු රැළම මහා හයියෙන් කෑ ගසති. එහෙ මෙහෙ දුව පනිමින් ප්‍රශ්න කරති. උත්තර දෙති. මනුෂ්‍යයන් මෙන් ඇවිස්සී සිහි මුලාවෙති. ආචාර්‍ය්‍යය මන් සිටින තැනට අවුත් එකිනෙකා බලා සිටිති. ගස් අතරින් පැන පැන දුවයති.

මේ කථාව ආචාර්ය මන් පුනරුක්තියෙන් කියයි. එය උන්වහන්සේගෙ ' අත්දැකීමේ සියුම් භාවයයි. වල් වඳුරෝ මිනිසුන්ට භය වන්නේ මිනිස්සු මහා ම්ලේච්ඡ කෲර අන්දමට සතුන් විශාල වශයෙන් මරන බැවිණි යැයි උන්වහන්සේ කීහ. සතුන් ඒ ඒ ශබ්ද තේරුම් ගන්නේ මිනිසා තම භාෂාවේ ශබ්ද තේරුම් ගන්නා මෙනි. හිත ප්‍රධාන වී මේ ශබ්ද පහළ වේ. එහි සුවිශේෂ තේරුම් ඇත. වෙනත් භාෂාවන් වල ශබ්ද අපට නොතෙරේ. එම භාෂාව නොදත් බැවිණි. ශබ්ද ඉතා සාවධානව අසන විට ඒ ඒ ශබ්ද වලින් වෙනස් අදහස් පළ කරන බව පැහැදිලිව පෙනේ.

අන්තිමේදී වඳුරු රැළවල් ආහ. ආචාර්ය මන් ගැන කිසිම වික්ෂිප්තයක් නැත. නිදැල්ලේ දුව පැන ආහාර සොයති. ආචාර්‍ය්‍යය මන් ගැන වගක් වත් නැත. ඔවුන්ගේ නුවණ ඇත්තේ ආහාර සෙවීමට හා සැඟවී තම ජීවිතාරක්ෂා කර ගැනීමට පමණි.

එක් සන්ධ්‍යාවක උන්වහන්සේ බුදුගුණ අරමුණ නැති වී සිත හිස් විය. මුළු ලෝකයම හිස්විය. ශූන්‍යතාවයක් දිස්විය. මෙම සමාධියෙන් නැගී සිට බුදුගුණ මෙනෙහි කළේය. බුදුරජාණන් වහන්සේගේ අසිරිමත් ප්‍රඥාවෙන් සත්ත්වයාගේ කෙළෙස් දුරු කරණ අන්දම වදාළහ. සති පඤ්ඤා කෙතරම් බලවත්ද, සාමාන්‍ය දෛනික කටයුතු කරණයට ආහාර වැළඳීම, මළපහ කිරීම, ආදිය වුවද සති පඤ්ඤාවෙන් කරණවිට එම කාර්‍ය්‍යය නිසි ආකාරයෙන් කෙරෙයි. එම ක්‍රියා වැරදි විධියටම කිරීම නිසා සීලාචාර බව නැසේ. මේ පිළිබඳ විශාල ලෙස පුරුදු පුහුණු විය යුතුවේ. සිතේ ඇතිවන සිතුවිලි පිළිබඳවද සති පඤ්ඤාවෙන් පාලනය විය යුතුයි. මේ සති පඤ්ඤා ලිහිල්වූ විට තමාගේ හැසිරීම විකෘති වේ. තම වයස, ස්ත්‍රී, පුරුෂ භාවය, සමාජතත්වය ගැන නොතකා සිතට වහල් වී නොයෙක් අශීලාචාර දේ කරත්.

සාමාන්‍ය මිනිසා පොඩි ළමයින් මෙනි. පොඩි ළමයින්ට වැඩිහිටියන්ගේ පාලනය අවශ්‍ය වේ. බොහෝ අය පෙනුමෙන් වයස්ගත වුවද, තත්වය, මානය, මමත්වය වැඩි වී ගියද හරි හැටි සිතීමට නොහැකිය. තමාටත් අනුන්ටත් හිතකර විධියට හැසිරීමට නොදනිති. ඒ අය භෞතික වශයෙන් පරිනත වුවද සති පඤ්ඤාවෙන් පරිනත නොවේ. මෙම ධර්ම කරුණු තමාගේ සිතේ පුහුණු කිරීමට ද මැලිවෙති. එබැවින් යන යන තැන ප්‍රශ්න උද්ගත වේ. මේ අවාසන-ාවන්ත තත්ත්වය ගැන මෙනෙහි කරන විට ආචාර්‍යය මන් මහත්සේ සංවේග යට පත්වුණි.

සාරිකා ගුහාවට නැගිය යුතු කඳු පාමුල විපස්සනා භාවනා මධ්‍යස්ථානයක් තිබුණි. එහි වයස්ගත භික්ෂුන්වහන්සේ නමක් වාසය කළේය. උන්වහන්සේ ගිහි ජීවිතයේදී භාර්‍යයාවන් දරුවන් සමඟ සිට වයස්ගත වී මහණ වූවෙකි. දිනක් ආචාර්‍ය මන් මෙම භික්ෂූන් වහන්සේ සිතුවිලි ගැන තම භාවනා දිබ්බ චක්ඛුවෙන් බලන විට උන්වහන්සේගේ සිත විසිරී ගොස් තම පවුල බිරිඳ සහ දරුවන් ගැන සිතුවිලි පහළ කරන බව පෙණුනි. එදින රාත්‍රියේදී ආචාර්‍ය මන් මෙම භික්ෂුවගේ සිතිවිලි දෙස බැලූ විට ඒත් එම සිතුවිලිමය. එළිවෙන පාන්දරද එම භික්ෂුවගෙ ' සිතුවිලි තම දරුවන්, බිරිඳ ගැනමය. ඉතා කඩිසරයෙන් තම දූ දරුවන් හා මුනුබුරු, මිනිබිරියන් ගැන සිතයි. ගිහි ජීවිතය ගැන කල්පනා කරයි. සසර අනන්ත ජීවිත ලැබීමට හේතුවේ.

එදින උදේ පිණ්ඩපාතයෙන් පසු ආචාර්‍ය මන් මේ භික්ෂුවගේ කුටියට ගොඩ වී මෙසේ කීවේය. ''කොහොමද සැප දුක් ? ඔබ නැවතත් අළුත් ගෙයක් සාදා බිරිඳත් සමඟ විවාහ වී ඉන්ටද කල්පනාව. රෑ එළිවන තුරුත් ඒ ගැන සිතමින් සිටියා නොවේද ? දැන් සියල්ල සැළසුම් කර ඉවරද ? මම හරිද ?''

එම භික්ෂුව මහත්සේ ලැජ්ජාව පත් වී තම රහස දත් බැවින් මඳ සිනාවක් පහළ කර ''ආචාර්‍ය මන්, ඔබ වහන්සේ විස්මිතයි මගේ සිත මුළු රාත්‍රිය පුරා දුටුවෙහිද ?

ඔබ වහන්සේ මට වඩා ඒ සියල්ල දනී. එබැවින් මගෙන් ඇසීමෙන් වැඩක් නැත. ඔබ වහන්සේ නිදා ගත්තේම නැත. දැනුත් ලැජ්ජාවක් නැතිව ඒ සිතිවිලි සිතයි. සති, පඤ්ඤාව තුළින් මේ සිතිවිලි නවත්වන්ට බැරිද ? එම සිතිවිලි අනුව ඔබ ක්‍රියාකරන්නටද යන්නේ ?

මෙසේ කියනවිට ඒ වයස්ගත භික්ෂුව සුදුමැලි වී කලාන්තවීමට මෙන් මහත් ලැජ්ජාවට පත් වී සිටියහ. පිස්සෙක් මෙන් මොනවාද තොල් මතුලේය. මේ දැක ආචාර්‍ය මන් තම දිගට සාකච්ඡා කිරීම අනතුරුදායක යැයි සිතා වෙනත් දේ ගැන කථාකර තමන් වහන්සේගේ කුටියට වැඩියහ.

තුන් දිනකට පසු ගිහි දායකයෙක් ආචාර්‍ය්‍ය මන්ගේ කුටියට පැමිණි විට වයස්ගත භික්ෂුව ගැන ඇසුවේය. ඊයේ උදේ උන්වහන්සේ නොකියාම යන්ට ලෑස්ති වුනා. ඇයි මෙතරම් ඉක්මණින් යන්නේ යැයි ඇසූවිට මම මෙහේ ඉන්නේ කෙසේද ? ඊයේ උදේ ආචාර්ය මන් මට නොයෙක් විධියෙන් කථා කළා. මම ඒ වෙලේ කලාන්ත වී ගියා. තව කීවා නම් මම මැරී වැටෙනවා. ඉතින් මට මෙහි ඉන්ට බැහැ. අදම යනවා. ආචාර්‍ය්‍ය මන් ඔබ වහන්සේට බැන්නද ? නැහැ ටිකක්වත් බැන්නේ නැහැ. නමුත් මගෙන් ඇසූ ප්‍රශ්න බැනුමකට වඩා රිදුණා. උන්වහන්සේ ඇසූ ප්‍රශ්න මොනවාදැයි ඇසූවිට එය නම් අහන්න එපා. මම මැරෙන තරම් ලැජ්ජාවෙමි. යම් කෙනෙක් දැන ගත්තොත් මට පොළොවේ පස් කන්නට වේවි. මම එකක් කියන්නම්. යම් යම් අය හොඳ නරක දේ දෙකම හිතනවා. තමාගේ සිතිවිලි නවත්වන්ට පුළුවන් කාටද ? ආචාර්ය මන් මගේ සිතිවිලි සියල්ල දන්නවා. මට මෙහි වසන්ට බැහැ. ඊට වැඩිය හොඳයි කොහේ හරි ගිහින් මැරෙන එක. මට මෙහි සිටියොත් විලි ලැජ්ජවේ ඉන්ට වෙනවා. ඊයේ රෑ මම නිදාගත්තේ නැහැ. මේ ගැන සිතමින් හිටියා.

ඔබ වහන්සේගෙන් ආචාර්ය මන්ට කිසි වැරැද්දක් වී නැහැ. උන්වහන්සේගේත් වැරැද්දක් නැහැ. තමන් වැරදි නම් උන්වහන්සේගෙන් උපදෙස් ලබා ඊට සුදුස්සක් කළ යුතුයි. එය ආචාර්ය මන්ට කරණ ගෞරවයක්. එවැනි සිත් ඇති වූවිට කුමක් කළ යුතුදැයි අසන්න. එවිට සති පඤ්ඤාව ඔබට පහළ වේවි. මෙහේ දාල යනවාට වඩා එය හොඳයි. නොවේද ?

මට සතිය පැවැත්වීමට වඩා ආචාර්‍ය්‍ය මන් ගැන බියක් තිබේ. මම උන්වහන්සේ ළඟ සිටීම පූස් පැටියෙක් මහ ඇතෙක් ළඟ සිටිනවා මෙනි. මගේ සිතිවිලි උන්වහන්සේ දනී යැයි සිතීම පවා මට මටහත් කම්පනයකි. මම මෙහි සිටියොත් මැරෙනවා යැයි කීහ.

උපාසක තෙම මේ වයස්ගත භික්ෂුව කෙරෙහි අනුකම්පා කළේය. ඔහුගෙ මුහුණ සුදුමැලි වී ඇත. ඇත්තෙන්ම බියපත් වී ඇත. ඔබ වහන්සේ කොහේ යනවාදැයි ඇසූවිට දන්නේ නැහැයි කීය. නොමැරුණොත් නැවත අපි හමුවෙමුයි කීය. මම පොඩි පිරිමි ළමයෙක් පසු පස යැව්වෙමි. එහෙත් උන්වහන්සේ යන තැන කීවේ නැත. ඒ මහළු භික්ෂුව ගැන මම කණගාටුවෙමි.

මෙය මේ තරම් තමා වෙත එල්ල වූ අභියෝගයක් ලෙස සැලකුවේ මන්දැයි මම දුක්වෙමි.

ආචාර්ය මන් බොහෝ සෙයින් කම්පා විය. උන්වහන්සේ හොඳ චේතනාවෙන් කී දෙය මෙතරම් බැරෑරුම් තත්ත්වයකට පත් වී ඇත. උන්වහන්සේ කාරුණිකව මෙය කියා ඇත. ඇත්තටම උන්වහන්සේ සුදුමැලි වූ නිසා මෙවැනි

දෙයක් වේයැයි අනුමාන කළහ. එදිනට පසු උන්වහන්සේ තම සිත අනුන් කෙරේ යොමු කළේ නැත. මෙවැනි දෙයක් උද්ගත වේ යැයි භය විය. උන්වහන්සේගෙ " පරචිත්ත විජානනය සත්‍යයකි. ''මම කථා කළේ එම වයස්ගත භික්ෂුව සමඟ යහළු මිත්‍රයෙක් මෙනි. යහළුවෝ සමහර විට විහිළු කරති. සමහර විට වැදගත් දේ කියති. මෙතරම් බැරෑරුම් තත්ත්වයක් ඇතිවේ යැයි ද තම අසපුව හැරදමා යාමට සිදුවේ යැයි ද උන්වහන්සේ නොසිතූහ.

මෙය ආචාර්යය මන්ට වැදගත් පාඩමක් විය. උන්වහන්සේ හමුවීමට එන නොයෙක් පුද්ගලයන් ගැන හැසිරිය යුතු අන්දම කථා කළ යුතු අන්දම ගැන ප්‍රවේසම් විය යුතුය. ඉන්පසු කිසිවෙකුගේ සිතුවිලි ගැන අනතුරු ඇඟවීමක් නොකළේය. එය වක්‍රාකාරයෙන් ''මෙසේ සිතන අය අතැ''යි කියති. කෙළින්ම නොකියති. මිනිසුන්ගේ සිත් පොඩි ළමයි වැටි වැටි ඇවිදින්නාක් මෙනි. ඔවුන්ට තාම ඇවිදින්ට හුරු නැත. වැඩිහිටියෝ අවධානයෙන් රැක බලති. එහෙත් වැඩිපුර ආරක්ෂා නොකරති. මිනිසාගේ සිතත් එසේමය. ඔවුන්ගේ ප්‍රත්‍යක්ෂයෙන් සිත ගැන විමසුම් කළ යුතුය. සමහර විට හරි විධියට සිතත්. සමහරවිට වැරදි විධියට සිතත්. සමහරවිට හොඳයි. සමහරවිට නරකයි. මෙය ස්වාභාවිකයි. හැම මොහොතේම හරි විධියට සිතිය යුතුයැයි බලාපොරොත්තු විය යුතු නැත.

සාරිකා ලෙනේ සිටි කාලය ආචාර්‍ය්‍යය මන්ට විශාල ඵලදායි විය. නොයෙක් සත්‍ය කරුණු වැටහුණේය. තම අභ්‍යන්තර සිතුවිලි සහ ඒවාට අරමුණු වූ බාහිර ලෝකය ගැන පර්යේෂණ කිරීමට හැකිවිය. තම කාර්‍ය්‍යයන් කෙරෙහි කෙතරම් උද්‍යෝගි වුවද කිවහොත් කාලය අමතක විය. දින, මාස, අවුරුදු ගතවන වගක් මතක නැත. භාවනා දියුණුව නිසා සිත නිතර ප්‍රබෝධයෙනි. නිතර ප්‍රඥාව විපස්සනා නුවණ පහළ විය. එය වතුර ගලන්නාක් මෙන් නොනැවතී පහළ වුණි. හොඳ කාලගුණය ඇති සවස් යාමයේ උන්වහන්සේ කැලෑව මැදින් ගමන් කළේය. ගස්, කොළන්, කඳු ලස්සන පරිසරය චිත්තාදකර්ෂණීය විය. භාවනා මනසිකාරය තිබුණි. සවස් යාමයේ කළුවර වී යන විට ගුහාවට වැඩියේය.

ගුහාව අවට ප්‍රදේශය වන සතුන්ගෙන් ගහණ විය. එහි ගස් වැල් පළතුරු බොහෝය. නොයෙක් වඳුරු වර්ග ඇත. ලැන්ගුආ, ගිබන්, හම්බාවා ආදී කැලෑ පළතුරු කන සතුන් බොහෝ ඇත. උන්ගේ වැඩ ගැන මිස ආචර්‍ය්‍යය මන් ගැන කිසිම හැඟීමක් නැත. ඔවුහු එහේ මෙහේ පනිමින් සෙල්ලම් කරති. ඔවුන් සමඟ මහත් මිත්‍ර සම්බන්ධයක් තිබුණි. ඔවුහු තමාගේ සමානයෝය. උප්පත්තිය, දිරීම, ලෙඩවීම, මරණය, සාධාරණය. සතුන් වුවත් ඔවුන් තුළ යම්කිසි කුසලතාවක ගුණයක් ඇත. මිනිසාගේ හෝ සතුන්ගේ රැස් කර ඇති කුසල් අකුසල් වෙනස් වේ. සත්ත්ව ලෝකයට ඉපදුනත් බොහෝ සතුන්ට සමහර මිනිසුන්ට වඩා පින් ඇත. තම පාපයකින් ලබා ගත් උප්පත්තිය නිසා තාවකාලික දුක් ඇත.

මිනිසාටත් එසේමයි. යම් පිනකින් මිනිසත් බව ලැබුවත් බොහෝ අකුසල විපාක කාලයන්හි දුක් පීඩා විඳිති. එම කර්ම විපාකය ගෙවී ගියවිට නැවතත් හොඳ කාලයක් ඇතිවේ. මෙලෙස කර්ම විපාක ඒ ඒ පරිසරය තුළින් ගෙන දේ. මේ නිසා කිසිවෙකුගේ අවාසනාව ගැන අවමන් කළ යුතු නැත. තම තමා විසින් කරණ හොඳ හෝ නරක කර්ම විපාක තමා පසුපස දායාදයක් මෙන් ගමන් කරයි.

දවල් යාමයේදී ආචාර්ය මන් තම ගල්ලෙන ඉදිරි පිට අතු ගා පිරිසිදු කරයි. සවස භාවනාවේ යෙදේ. මාරුවෙන් මාරුවට හිඳිමින් සක්මනින් කල් යවයි. සමාධිය බලවත් නිසා සිතේ නිතර ප්‍රීති, සුඛ, පස්සධිය ඇත. කායානුපස-සනාවෙන් තම ශරීරය ඉතා සූක්ෂ්ම ලෙස විච්ඡේදනය කර බැලුවේය. ඒ හැම දෙයකම ඇති ත්‍රිලක්‍ෂණය අවබෝධ විය. මෙසේ දිනෙන් දින උන්වහන්සේගෙ ශ්‍රද්ධාව දියුණු විය.

## ශ්‍රාවක රහතන් වහන්සේලා

සාරිකා ගල් ගුහාවෙ වාසය කරන කාලයේ ආචාර්යය මන්ට තම සමාධි නිමිත්ත හේතුවෙන් ශ්‍රාවක රහතන් වහන්සේලා සමඟ ආශ්‍රය කිරීමට හැකිවිය. ඒ හැම රහතන්වහන්සේම ධර්මය දේශනා කළහ. ආර්ය ශ්‍රාවකයන්ගේ ප්‍රතිපත්ති ගැන බොහෝ විට දේශනා කළහ. එහි සාරාංශය මෙසේය.

සක්මන් භාවනාව ඉතා සන්සුන් ලීලාවකින් සංයමයකින් සිදු කළ යුතුය. තමාගේ කාර්යය පිළිබඳ සතිය යොමු කරන්න. ඔබ ශරීරය දෙස හෝ ස්කන්ධයන් දෙස බලනවා නම්, නැත්නම් යම් ධර්මයක් දෙස බලනවා නම් තමාගෙ සතිය ඒ පිළිබඳ තදින් කා වැදී තිබිය යුතුයි. තමාගේ අවධානය වෙන කිසි අරමුණක් කරා නොයවන්න. එසේ වෙන අරමුණු කරා යන්නේ ඔබට ස්ථාවර අධ්‍යාත්මික ශක්තියක් නැති බැවිනි. එහෙයින් තම අධ්‍යාත්මයේ සරණ - පිහිට නැත. ඔබගේ සියලුම දෛනික කටයුතු වලදී සතිය පවත්වන්න. එම වැඩ තමා නින්දෙන් කරන දේ මෙන් ඒ මේ අත හැරි හැරී සතියෙන් තොරව කරන්න එපා. නින්දේදි ඔබගේ සිහින කෙතරම් විචිත්‍ර විධියට ඒ මේ අත ඉබාගාතේ යනවාද ? උදේ පිණ්ඩපාතය, ආහාර වැළඳීම, ශරීර කෘත්‍යය ආදී දිනපතා කරණ දේ ගැන සම්ප්‍රදායානුකූලව හැසිරෙන්න. එය බුදු සිරිත වේ. තමා ධර්ම විනය පිළිබඳ පුහුණුවක් නොලත් කෙනෙක් මෙන් කිසි විටෙක හැසිරෙන්න එපා. නිතරම තමා නියම ශ්‍රමණයෙක් ලෙස හැසිරෙන්න. ශාන්ත දාන්ත ලෙස ඉරියව් පවත්වන්න. බුද්ධ ශ්‍රාවකයෙකුගේ ලක්ෂණ තිබිය යුතුයි. එහි තේරුම නිතරම සති පඤ්ඤාවෙන් ඉරියව් පැවැත්වීමයි. එවිට හදවතේ ගැඹුරේ සැඟවී ඇති

කෙළෙස් දුරුකළ හැකිය. තමා ගන්නා ආහාරය හොඳාකාර ප්‍රත්‍යාවේක්ෂා කරන්න. රස ඇති ආහාර නිසා සිත විෂ වේ. ප්‍රත්‍යාවේක්ෂා නොකර ආහාර ගන්නා විට ශරීරය පුෂ්ටිමත් වුවද සිත දුර්වල වේ. සතියෙන් තොරව ගන්නා ආහාර නිසා සිත දුර්වල වූ විට ඔබ විනාශයට පත්වේ.

ශ්‍රමණයෙක් තම සැප පහසුව සඳහා අනුන්ගේ සැප පහසුවට හානි වෙන ලෙස ලජ්ජා නැති අකුසල් නොකළ යුතුයි ඉන් තමන්ට පමණක් නොව ඉන් අනුන්ටත් හානි සිදුවේ. බුද්ධ පුත්‍රයන්ගේ පිළිගැනීම අනුව සියලුම කෙළෙස් ඉතා භයානකය. හිතේ කෙළෙස් දුරු කිරීමට මහත් වීර්‍ය්‍ය වැඩිය යුතුයි. හැම කෙළෙසක්ම ගිනි හුලක් මෙන් තම ගමන් මාර්ගය දවයි. තම විනය තම සිතින් ඇති කර ගන්නා බුද්ධ පුත්‍රයන්ගේ විනය, තම ආත්ම සංයමයෙන් සිදුවේ. මෙය හැම විටම තිබිය යුතුයි. ඇවිදින, සිටින, හිඳින, නිදන, කන, මළපහ කරන. කථ ා කරණ, සමාජය ඇසුරු කරණ හැම විටම සංවර විය යුතුයි. වැරදි දේ විනය විරෝධි ක්‍රියා සියල්ලක්ම කෙළෙස් නිසා සිදුවේ. ඉන් සසර උපත හා මරණයට පත්වේ. සංසාර පැවැත්ම ඉක්මවීමට කැමති පුද්ගලයා එවැනි වරදවලින් වෙන් විය යුතුයි. එම හැසිරීම නිසා තමා විශාල ප්‍රපාතයකට වැටේ. ලෝකයේ ඇති ඉතාම පිළිකුල් පුද්ගලයෙකු වේ. එනම් කාලකණ්නි, අප්‍රිය නිවසක ඉන්ට සතුටු නැත. අප්‍රිය ඇඳුම් අඳින්ට කැමති නැත. ඒවා දෙස බලන්ටත් අප්‍රියයි. සාමාන්‍යයෙන් මිනිස්සු අප්‍රිය, අප්‍රසන්න දේ බැහැර කරති. අප්‍රිය මනසක් ඇති, අප්‍රිය පුද්ගලයෙක් කොතරම් අප්‍රසන්නද ? මේ ලෝකයේ අනන්ත අප්‍රිය පුද්ගලයා ඒ කාලකණ්ණි බුද්ධ පුත්‍රයෙක් ලෙස මහණ වී සිටින්නා ශ්‍රමණයාය. ඔහුගෙ පිළිකුල් බව හොඳ නරක සියලු දෙනාගේම හදවත එකසේ සිදුරු කරයි, දෙවි බඹුන්ගේ හදවත එකසේ සිදුරු කරයි. එබැවින් යමෙක් නියමාකාර ශ්‍රමණයෙක් වීමට උත්සාහ ගත යුතුයි. සතියෙන් හැම විටම සිටිය යුතුයි. තම විනය තමන් විසින්ම ඇති කර ගත යුතුය. ලෝකයේ මිනිසා අගය කරණ බොහෝ දේ අතුරෙන් ඉතාම අගනා දෙය මිනිස් සිත වේ. සත්‍යයෙන්ම සිත තරම් වටිනා මේ ලෝකයේ තවත් දෙයක් නැත. එබැවින් සිත ආරක්ෂා කරන්න. සිතේ ස්වභාවය දැන ගැනීම යනු ධර්මය අවබෝධ කිරීමයි. සිත දැන ගැනීමට ධර්මය දැනගත යුතුයි. සිත දැනගත්තායින් පසු ධර්මය දැන ගත්තා වේ. සිතේ සත්‍ය ස්වභාවය දැන ගත්තා යනු නිවන් අවබෝධ කිරීමයි. සිත යනු මිල කළ නොහැකි තමා තුළ ඇති වස්තුවකි. එය නාස්ති කරනවා යනු බලවත් අපරාධයකි. සිත නරක් කරගත් අය ඉතා දුඃඛිත ලෙස උපත ලබත් සිය දහස් වරක් එසේ උපදී. අප හිතේ වටිනාකම තේරුම් ගත් පසු ඒ ගැන නොසැලකිලිමත් විය යුතු නොවේ. මක්නිසාද ඒ නරක් වූ සිත නිසා පසුව බලවත් පසුතැවිල්ලට පත්වන බැවිණි. ඒ පසුතැවිල්ලෙන් කිසිකලෙක බේරීමක් නැත. සිත නරක් කර ගැනීම කිසිසේත් නොකරන්න.

මිහිපිට ජීවත්වන සියලු සත්ත්වයින් අතුරෙන් මිනිසා වඩාම බුද්ධිමත්ය. එබැවින් මෝහයෙන් මුලාවෙන් සිටිය යුතු නැත. සමහරු මේ මෝහය, අවිද්‍යාව නිසා තම ජීවිත විනාශ කර ගනිති. කිසිම සතුටක් නොවිඳී. නියම ශ්‍රමණයාගෙ ' ලෞකික, ලෝකෝත්තර ගුණ වගාව මිනිසාට ආදර්ශයකි. උන්වහන්සේගේ කාර්යය පිරිසිදුය. නිවැරදිය. නිදොස්ය. උන්වහන්සේ කුසලතාවයෙන්, උපේක්ෂා-වෙන් සියලු වැඩ කටයුතු ඉෂ්ට කරති. එබැවින් ඔබ නියම ශ්‍රමණයාගේ ගතිගුණ මහත් වීර්‍යයෙන් පුරන්න. එවිට එය ඔබගේ පුරුද්ද වේ. එවිට කොතැනදී වුවත් ඔබගේ ප්‍රතිපත්තිය ගරු ගාම්භීර වේ. යම් ශ්‍රමණයෙක් තම සීලය රැක බලා ගන්නේ නම්, සමාධිය, සතිය, පඤ්ඤාව, වීරිය රැක බලා ගන්නේ නම් ඔහු ඒකාන්තයෙන්ම අති උත්තම ශ්‍රමණයෙකි.

මම මේ කියා දෙන්නේ මිනිසෙකුගේ වීර්‍යය, නොපසුබට බව, ආධ්‍යාත්මය සමග යුද වැදුන සෙබළෙකු වැනි කෙනෙකුගේ ධර්මය වේ. උන්වහන්සේ දිනුවෙකි, මහා පුරුෂයෙකි. දුක සම්පූර්ණයෙන්ම ඉක්මවිය. සියලු සංයෝජන කඩා දැමීය. පරම සුවය ලදහ. බුද්ධත්වය අත්පත් කළහ. ලෝකයොගේ ශාස්තෘවරයාය. තුන් ලෝකයේ ගුරුවරයාය. මේ ධර්මයේ හාස්කම් ඔබ දන්නේ නම් ඔබටද සියලු ක්ලේශයන් ජය ගත හැකිය. මා මේ ධර්මය ඔබ වෙත පිරිනැමුවේ මේ පිළිබඳ උපරිම අවධානය යොදා වී යන අදහසින්. එසේ පිළිවෙත් රකින විට ඔබ සිතේ ඇතිවන පුදුමාකාර ස්වභාවය ඔබට ප්‍රත්‍යක්ෂ වේ. එයම මහත් භාග්‍යයකි.

ශ්‍රාවක රහතන්වහන්සේ මේ ධර්මය දේශනා කර නොපෙනී ගියහ. ආචාර්ය මන් එය ඉතා නිහතමානී භාවයෙන් පිළිගත්හ. එහි සෑම අවවාදයක්ම පිළිබඳ කල්පනා කළහ. විච්ඡේදනය කළහ. මේ ආකාරයෙන් නැවත නැවතත් ශ්‍රාවක රහතන් වහන්සේලා ධර්මය දේශනා කළහ. පිළිවෙත් මාර්ගය ඉතාම පැහැදිලි විය. එම ධර්මයට සවන් දුන්විට තම භාවනා කිරීමේ උනන්දුව වැඩිවිය. එවිට ධර්මය වඩා පැහැදිලි විය.

මෙවැනි ශ්‍රාවක රහතන් වහන්සේලාගේ ධර්මය ශ්‍රවණය කරණ විට තමන් බුදුරජාණන් වහන්සේ අභියස සිට අසන්නාක් මෙන්යැයි ආචාර්ය මන් පැවසීය. නමුත් බුදුරජාණන් වහන්සේ හමු වී ධර්මය ශ්‍රවණය කිරීම උන්වහන්සේගේ මතකයේ නැත. ඒ බණ අසන විට මුළු ලෝකයම අමතක වුණි. තම ශරීරය නො-ාදැනී ගියේය. බලවත් සමාධියට පත්විය. සිත පමණක් දීප්තිමත්ව බැබලේ. මෙම සමාදියෙන් මිදුන විට පමණක් තමා කෙතරම් පීඩාකාරී බරක් ගෙන යන්නේදැයි තේරුණි. එනම් තම ශරීරය ඇති බව දැනීමය. මේ ශරීරය අනිත් සතර ස්කන්ධ-යන් එසවීමට කේන්ද්‍ර ස්ථානය වේ. ඒ හැම එකක්ම දුක් ගොඩකි.

සාරිකා ගල් ගුහාවේ ගත කළ කාලයේදී මෙසේ බොහෝ රහතුන්

වහන්සේලාගේ ධර්මය ශ්‍රවණය කිරීමට හැකිවිය. එහෙයින් සාරිකා ගල්ගුහාව උන්වහන්සේගේ අද්විතීය වාසස්ථානය විය. එහිදී අනාගාමී ඵලයට පත්විය. බෞද්ධ ග්‍රන්ථ අනුව අනාගාමී ඵලයේදී සංයෝජන 5ක් කැඩී යන්නේය. එනම් සක්කාය දිට්ටි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ යමෙක් මේ තත්ත්වය ලබයිද ඔහු නැවත මිනිස්ලොව නූපදී. පඨවි, ආපො, තෙජෝ, වායො යන සතර මහා භූතයන්ගෙන් සෑදෙන ශරීර ඇති භවයන්හි නූපදී. මරණයට පෙර රහත් නොවුනොත් පංච ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකවල උපදී. එනම් අවිහට අතප්ප, සුදස්ස, සුදස්සි, අකනිඨා ආදියයි. තමන්ගේ සමථ භාවනා අනුව මේ භූමියේ උපදී. තමන් වහන්සේ අනාගාමී ඵලයට පත් වූ බව උන්වහන්සේ ළඟම ශිෂ්‍යයින්ට පමණක් දැනුම් දී ඇත. එහෙත් මම මෙසේ පුස්තකයට ඇතුළත් කළෙමි. මෙහි යම් දෝෂයක් ඇතොත් එහි වරදකරු මම වෙමි.

එක් රාත්‍රියක උන්වහන්සේ බොහෝ වේලා භාවනා කර අවසානයේදී අසාමාන්‍ය කරුණාවක් අනිකුත් භික්ෂූන් වහන්සේලා කෙරෙහි ඇතිවිය. ඒ වන විට පුදුමාකාර නුවණ පහළ විය. සිත තදබල සමාධි ඵලයට පත්වුණි. මුල් කාලයේදී සමාධිය වෙනත් මාර්ගයක ගිය බැවින් ඉන් වූ හානිය මතක් වී ඇස් කඳුළින් තෙත් වී ගියේය. එනමුත් ඒ ගත් ව්‍යායාමය නිෂ්ඵල වූයේ නැත. අද අදිකතර විපස්සනා ඥාණ පහළ විය. බුදු ගුණ නොයෙක් ආකාරයෙන් දිස්විය. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය නිසා තමන් වහන්සේගේ අවබෝධ කළ ධර්මය අනුන්ට වදාළහ. බොහෝ දෙනා නිර්වානගාමී විය. තමාගේ කර්ම විපාක සහ අන් අයගේ කර්ම විපාක ගැන අවබෝධයක් ඇතිවිය. සත්ත්වයා කර්ම හේතුවෙන් උපදී. කර්මය තමාගේ එකම අයිතිය වේ. මේ බුද්ධ ධර්මයේ මුඛ්‍ය ඉගැන්වීමයි.

මෙසේ නුවණ පහළ වුවද තම සියලු දුක් නැසීමට මේ මාර්ගයේ යා යුතුය. තමන් වහන්සේගේ මුළු ශක්තිය මේ කාර්යයට යෙදවිය යුතුය. තමන් වහන්සේගේ අසාධ්‍ය බඩේ රෝගය දැන් නිෂ්ටාවට සුව වී ඇත. දැන් මාර්ග ය ඉතා පැහැදිලිය. සිත ස්ථාවරය. කලින් තමා කළුවරේ අතපත ගා ගියේය. තමන් උතුම් අර්හත්වයට අනාගතයේ ලබන බව නිසැකය.

සති, පඤ්ඤා ඒකාකාරව වැඩී ඇත. ඒ පිළිබඳ වෙහෙස වීමක් නැත. නිරායාසයෙන් පවතී. රෑ, දවල් දෙකේ නොනවත්වාම සති පඤ්ඤා ක්‍රියාත්මක වේ. ගණන් කිරීමට බැරි තරම් දර්ශන දුටහ. ප්‍රඥාව පහළ විය. මේ ධර්මයේ අවබෝධය වැඩිවීමත් සමඟ භික්ෂූන් වහන්සේලා ගැන මහා කරුණාවක් පහළ විය. සාරිකා ගුහාව අත්හැර යාමට එය හේතු විය. එබැවින් නොකැමැත්තෙන් වුවද මේ භාග්‍ය සම්පන්න සාරිකා ගුහාවෙන් පිටත් විය. තමන් වහන්සේ මුලදී ඇසුරු කළ ධූතාංග භික්ෂූන් වහන්සේලා සෙවීමට උතුරු නැගෙනහිර ප්‍රදේශය

බලා ගියහ.

සාරිකා ගුහාවෙන් පිට වී යාමට දෙතුන් දිනකට පෙර රාත්‍රියේ රුක් දේවතාවෝ සමූහයක් ධර්මය ශ්‍රවණය පිණිස ආහ. එහි ප්‍රධානියා අපි මුලින් සඳහන් කළ අරුම පුදුම, බිය ගැන්වූ රුක් දෙවියාය. ධර්මය අවසානයේදී තමන්වහන්සේ සාරිකා ගුහාව ටික දිනකින් හැර යන බව දැන්වීය. ඒ සියලු දෙනා මහත් සේ කම්පා වී තව කල් ඉන්ට කන්නලව් කළහ. තමන් වහන්සේ මේ ගුහාවට වැඩියේ යම් කිසි කාර්‍යයක් පිණිසය. දැන් අත්හැර යන්නේත් යම් හේතු ඇතිවය. උන්වහන්සේ ඉබාගාතේ එහෙ මෙහෙ සංචාරය නොකරන බව පැවසුවේය. එය වැළැක්වීම නුසුදුසු බව ඔවුන්ට අනතුරු ඇඟවීමක් කළහ. එහෙත් අවශ්‍ය වූ විටක නැවත පැමිණීමට පොරොන්දු දුනි. මේ දේව සමූහයා තමන්ගේ අවංක ආදර භක්තිය නොයෙක් ලෙස පුද කළහ.

සාරිකා ගුහාවෙන් පිටත් වන දිනයට පෙර දින රාත්‍රී 10 ට පමණ උන්වහන්-සේගේ මිත්‍ර ජවො බුං උපාලි තෙරුන් මතක් විය. උන්වහන්සේ වට් බොරොමනිවට් හි වෙසෙති. එවෙලේ උන්වහන්සේ සිතිවිලි කුමක්දැයි පරීක්ෂා කිරීමට පරචිත්ත විජානන ඍද්ධිය පෑහ. එවිට ''අවිද්‍යාව සහ පටිච්ච සමුප්පාදය'' මෙනෙහි කරමින් සිටියහ. ආචාර්ය මන් ඒ දිනය සහ වේලාව සනිටුහන් කොට තැබීය. පසුව ටික කාලයකින් බැංකොක්හිදී උන්වහන්සේ හමුවිය. උන්වහන්සේ සිතමින් සිටි දෙය ගැන ඇසූ විට එය සැබෑ යැයි කියා මහත් සේ සතුටු වී සිනාසුණේය. ඉන්පසු නොයෙක් විදියෙන් ප්‍රශංසා කළහ.

''ඔබ සැබවින්ම දක්ෂයෙකි. මම ද බොහෝ අයගේ ප්‍රශංසා ලබන ආචාර්‍යයවරයෙක්මි. එහෙත් ඔබ තරම් දියුණු වී නැත. ඒ ගැන මම ලැජ්ජාවට පත්වෙමි. ඔබ ඇත්තෙන්ම ආචාර්යවරයෙකි. බුදුරජාණන් වහන්සේගේ අති උතුම් ශ්‍රාවක සංඝ ගණයට අයත් වේ. අපට බැරි වුණත් කවුරු නමුත් බුදුරජාණන් වහන්සේගේ නියම ප්‍රතිපදාව රැකිය යුතුය. අද කාලයේ එවැනි ශ්‍රාවකයින් නැතැයි එවැනි දේ කළ නොහැකියි මැලි වෙති. පරාජිත වෙති. ඔබ වහන්සේ ධර්මයේ අකාලික ගුණය දක්වන්නේය. නැතහොත් සත්‍ය ධර්මය අතුරුදන් වෙයි. බුදුරජාණන් වහන්සේ මේවැනි ඍධි ප්‍රාතිහාර්‍යය ගැන සඳහන් කර ඇත. එය ඔබ වහන්සේ ප්‍රත්‍යක්ෂ කර මට ඔප්පු කළහ. බුදුරජාණන් වහන්සේගේ ධර්මය මේ ආකාරයෙන් පිළිපැදිය යුතුය.'' ආදී වශයෙනි.

ආචාර්ය ජම් බුන් උපාලි තමන් වහන්සේට බොහෝ ගෞරව දක්වන බව ආචාර්ය මන් කීහ. සමහර විට විසඳන්නට බැරි ප්‍රශ්න පිළිබඳ කියා එවති. මෙසේ මේ ආචාර්යවරු සුහද ලීලාවෙන් සිටියහ. තමන්ට උතුරු නැගෙනහිර බලා යාමට සුදුසු කාලයේදී උන්වහන්සේ බැංකොක් නගරයෙන් පිටත් විය.

සාරිකා ගුහාවේ වාසය කිරීමට පෙර උන්වහන්සේ යාබද බුරුමයට ගොස් උතුරු තායි ප්‍රදේශයේ චියාං මයි පලාතයට පැමිණ පසුව ටික කාලයක් ලාඕස් හි නැවතී භාවනා කරමින් ලුවං ප්‍රබංහි සිට, පසුව ලිඔයි ප්‍රදේශයේ බන් බොක් ගමේ වස් විසූහ. ඊළඟ වස ඊට නුදුරින් පිහිටි ෆා පු ගුහාවේය. ඊළඟ වස ෆා බිං ගල් ගුහාවේය. මේ සියලුම පළාත් වල් සතුන්ගෙන් ගහණය. ගම්මාන ඈතින් පිහිටියේය. මුළු දවසක් ගමන් කරලත් ගමක් දකින්නට නැත. පාර වැරදුණොත් එය රාත්‍රී කාලය නිදා ගන්ට වන්නේ කොටි වලස්සු ඉන්නා කැලේය.

එක් අවස්ථාවක ආචාර්ය මන් මේකොං ගඟ හරහා ගොස් ලාඕස් ප්‍රදේශයේ කඳුකරයේ මහ ඝන වනාන්තරයේ ලැගුම් ගත්තේය. විශාල බෙන්ගාල් කොටියෙක් නිතරම එම කුටිය ආසන්නට පැමිණියේය. හැමදාම රාත්‍රියට අවුත් උන්වහන්-සේ සක්මන් භාවනාව කරමින් ඔබිනොබ යන දෙස බලා සිටී. ඔහු කිසියම් හානියක් කරන්ට තර්ජනයක් නැතත් විටින් විට ගොරවයි. ඒ මේ අත ඇවිදියි. වල් සතුන්ට පුරුදු බැවින් උන්වහන්සේ ඔහු ගැන තැකීමක් නැත. මේ කාලයේ උන්වහන්සේ සමඟ ආචාර්ය සිතා විසුවේය. උන්වහන්සේ ආචාර්ය මන්ට වඩා සුළු කාලයකින් උපසම්පදාවෙන් වැඩිමහල් වෙති. ආචාර්ය සිතා භාවනාවෙන් අග්‍ර වෙයි. මෙවැනි ඝන වනාන්තර ප්‍රිය කළහ. කඳු සහිත මේ ලාඕස් ප්‍රදේශයේ වාසය කරයි. කලාතුරකින් මේකොං ගඟ හරහා තායිලන්තයට ගියත් ඉක්මණින් නැවත තම කුටියට පැමිණේ.

මේ කාලයේ ආචාර්ය මන් සහ ආචාර්ය සිතා නුදුරින් වාසය කළහ. වෙනම ගම්වලින් පිණ්ඩපාත කරත්. එක් රැයක් ආචාර්ය සිතා සක්මන් භාවනාවේ සිටින විට විශාල බෙංගාල් කොටියෙක් දිස්විය. ගස් අතරින් ඌ රිංගා අවුත් සක්මන් මාර්ගයේ අසල අඩි 6ක් පමණ ඈතින් සිටී. ඉටිපන්දම් දෙකක් සක්මන් මාර්ග යේ දෙකොණේ දල්වා ඇත. එබැවින් හොඳින් උන්වහන්සේව පෙනේ. සක්මන මාර්ගය දෙස බලාගෙන නිශ්චලව හිඳියි. උන්වහන්සේ සක්මන් කරන හැටි බලා සිටී. ආචාර්ය සිතාට යම් සතෙක් ඉන්නා බව දැනුණි. උන්වහන්සේ විපිලිසර වී හැරී බැලූ විට කොටියා උන්වහන්සේ දෙස බලා සිටිනු දුටුවේය. කෙතරම් වේලා බලා සිටියේදැයි නොදනී. උන්වහන්සේ කිසි බියක් සැකක් නැතිව මේ විශාල මෘගයා දෙස බැලූහ. ඔහු ගෙවල් වල අරුමෝසමට තබා ඇති පුරවපු කොටියෙක් මෙනි. උන්වහන්සේ කීප විටක් කොටියා පසු කරමින් සක්මන් කළහ. කිසිම බියක් චකිතයක් නැත. එහෙත් ඌ බොහෝ වේලා මෙසේ හිඳියි. ඔහුට අනුකම්පාවෙන් ආචාර්ය සිතා තම සිතිවිලි ඔහු වෙත යැවූහ. ''ඇයි කොහේ හරි ගොස් ආහාර සොයන්නේ නැත්තේ ? ඇයි මේ මා දෙස බලා ඉන්නේ'' ක්ෂණයකින් කොටියා කන් බිරිවෙන මහා ශබ්දයකින් ගෙරෙව්වේය. එය කැලය තුළ නිංනාද දුනි. මේ ගෙරවීම ඔහුට යන්ට බැහැ කීමක් යැයි ආචාර්යය සිතාට

වැටහේ. ඉන්පසු උන්වහන්සේ වෙනත් විදියකට සිතූහ. ''මම එසේ සිතුවේ නුඹ ගැන අනුකම්පාවෙන් මෙතරම් වෙලා සිටින විට බඩගිනි ඇති උඹට කටකුත්, බඩකුත් ඇත. ඒවා පිරවිය යුතුය. අන් සියලු සතුන් මෙන්. නමුත් නුඹට බඩගිනි නැත්නම් මා දෙස බලමින් සිටියට කමක් නැහැ. ඒකට කම් නැත.

කොටියා උන්වහන්සේගේ වෙනස් වූ සිතිවිලි ගැන කිසි ප්‍රතික්‍රියාවක් නැත. ඔහු ඒ අයුරින්ම සක්මන් මළුව අසල හිඳිමින් බලා සිටී. උන්වහන්සේ තම භාවනාව කරමින් ඌ ගැන නොතකා සක්මන් කළහ. මෙසේ යම් කාලයක් සක්මන් කර උන්වහන්සේ නුදුරින් ඇති උණබම්බු වලින් සෑදූ මැස්සට ගොස් විවේක ගත්හ. සූත්‍ර සජ්ඣායනා කොට හිඳිමින් භාවනා කළහ. මේ සියලු කාලය තුළ කොටියා ඒ සිටි තැනම සිටී. උන්වහන්සේ නින්දට වැටී අළුයම 3ට පමණ අවදි වී බැලූ විට කොටියා පේන්නට නැත. ඔහු කොහේ ගියාදැයි නොදනී. උන්වහන්සේ සක්මනෙහි යෙදුනාහ. මේ සිද්ධිය වූයේ එකම වතාවකි. කොටියා නැවත පේන්ට ආවේ නැත.

මේ සිද්ධිය ආචාර්ය සිතාට ප්‍රහේලිකාවක් විය. එබැවින් සියලු විස්තර ආචාර්ය මන් සමඟ පැවසුවේය. තවද උන්වහන්සේ භය නොවුවාට ඇගේ මවිල් කෙලින් සිටියේය. හිස් කබල ගල් වී තිබුණේ යැයි පාපොච්ඡාරණය කළහ. ඔළුවේ තද කැප් එකක් දමා තිබුණාක් මෙනි. එහෙත් ඉක්මණින් ඒ ගතිය පහ විය. ඉන්පසු ප්‍රකෘති අන්දමට සක්මන් කළහ. උන්වහන්සේගේ සිතේ සැඟ වී සියුම් කෙලෙස් ඇති නිසා මේ තත්ත්වය උදාවිය. එය උන්වහන්සේටවත් නොදැනේ. කොටියා ඒ පළාතට නැවතත් ආවේ නැත. එහෙත් ළඟ පහත ගොරවන ශබ්දය ඇසුණි. උන්වහන්සේ ඒ කිසිවකින් නොපැකිල තම භාවනාව පුරුදු අයුරින් කරමින් එහිම වාසය කළ සේක.

# 2


# මධ්‍යම යුගය


මුල් කාලයේදී ආචාර්ය මන් ධූතාංග භික්ෂුවක් වශයෙන් සැරි සැරුවේ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ නබොන් ෆනොම් ගමේය. ඉන්පසු සකොන් නබොන් සහ උදොන් තාහි ප්‍රදේශයන් පසු කරමින් බුරුමයට පිවිසීය. එහි යම් කාලයක් ගත කර උතුරේ චියාං - මායි ප්‍රදේශය හරහා තායිලන්තයට පැමිණියහ. එහි ටික කලක් වාසය කර ලාඕස් රටට ගොස් තම තාපස දිවිය ගත කළහ. එහි ලුඅං ප්‍රබං ගමෙහි සහ පසුව වියෙන්ටියානෙ ගම්වල සැරිසරා ලොඉ ප්‍රදේශයට පැමිණියහ. මේ උතුරු නැගෙනහිර පළාත් ඔස්සේ ක්‍රමයෙන් බැංකොක් නගරයට පැමිණියේය. එහි වට් පැතුම්වන් ආරාමයේ වස් විසූහ. ඉන්පසු සරිකා ගල් ගුහාවේ ලැගුම් ගති. එහි වසර ගණනාවක් විසූහ. ඉන්පසු උතුරු නැගෙනහිර පළාතට ආපසු පැමිණියේය.


මෙසේ බොහෝ කාලයක් හුදකලාව සැරිසැරුවේය. කලාතුරකින් තව භික්ෂුවක් සමඟ ගියේය. එහෙත් එය ස්වල්ප කාලයකට සීමාවිය. එබැවින් භික්ෂූන් වහන්සේලාගේ ඇසුරක් නොවීය. හුදකලා ගමන් කිරීම වඩා පහසු විය. තනිවම තම රූක්ෂ ප්‍රතිපත්ති අනුගමනය කළහ. කාලයකට පසු භාවනා දියුණුවත් සමඟ හදවතේ නැගුණු දයාව, අනුකම්පාව නිසා භික්ෂූන් වහන්සේලාට උපදෙස් දීමට උනන්දු විය. එම කරුණා, මෛත්‍රීය පෙරදැරි වී සාරිකා ගල්ලෙන හැර උතුරු නැගෙනහිර ප්‍රදේශයට ගමන් ගත්හ.


මුල් කාලයේදී සංචාරණය කරණ විට මෙම ප්‍රදේශයේ සිටි යම් භික්ෂූන් වහන්සේලා උන්වහන්සේගෙන් ධූතාංග කර්මස්ථාන ලදහ. එම ප්‍රදේශයේ බොහෝ ආරණ්‍යවාසී භික්ෂූහු සිටියහ. මේ අය සොයා ගොස් උන්වහන්සේගේ ධර්ම මාර්ග ප්‍රතිපදාව ඉගැන්වීමට මහත් ධෛර්යයක් ගත්හ. ඒ අනුව බොහෝ ගිහි පැවිදි පිරිස උන්වහන්සේගෙන් උපදෙස් ලදහ. බොහෝ ගිහි පිරිස මහණ











වී පිළිවෙත් පුරන්නට වූහ. සමහර උගත් ආචාර්‍ය්‍යයවැ පවා තම මානය දුරලා උන්වහන්සේගේ උපදෙස් ලදහ. ඒ අයගේ භාවනා වැඩී ගිය බැවින් වඩාත් සාර්ථක ලෙස අන් අයට ඉගැන්වූහ.

මේ මුල් අවධියේ ශිෂ්‍යයින් අතරෙන් ආචාර්ය සුවන් භික්ෂුව තාබො ප්‍රදේශයේ වට් අරණ්‍යකවට් නම් අරමේ ප්‍රධාන භික්ෂුව විය. ආචාර්ය සිං ඛන්තයාඛමො, නබොන් රචසිමා ප්‍රදේශයේ වට් පා සලවන් අරමේ ප්‍රධාන භි-ක්ෂුව විය. ආචාර්ය මහා පිං පඤ්ඤාඑලො, නබොන් රචසිමාහි වට් සඳධරම් අරමේ ප්‍රධානියා විය. මේ ප්‍රසිද්ධ ආචාර්යවරු මුල් කාලයේදී උබොන් රචතානි ප්‍රදේශයේ විසූහ. එම භික්ෂූහු ආචාර්ය මන්ගේ ධූතාංග ප්‍රතිපදා අන්‍යයන්ට ඉගැන්වූහ. ආචාර්‍ය්‍යය සිං සහ ආචාර්ය මහා සිං සහෝදරයන්ය. මහණ වීමට ප්‍රථම උන්වහන්සේලා ත්‍රිපිටක ධර්මය ගැඹුරින් හැදෑරූහ. උන්වහන්සේලා ඉතාම බහුශ්‍රැත ආචාර්යවරු වශයෙන් සිට ආචාර්ය මන්ගේ ශිෂ්‍යයන් වූහ. උන්වහන්සේලා විසින් බොහෝ දෙනාට ධර්මය දේශනා කරමින් මාර්ගයේ හැසිරවූහ. උන්වහන්සේලා දැනට ජීවතුන් අතර නැත.

ඊළඟ පරම්පරාවේ ශිෂ්‍යයන් වූයේ ආචාර්ය තෙට් ටෙසරංසි. උන්වහන්සේ දැනට නොන් ඛයි ප්‍රදේශයේ ශ්‍රී චියාංමයි රටේ වට් හින් මක් පෙං ආරණ්‍යයේ වාසය කරති. උන්වහන්සේ ආචාර්ය මන්ගේ වැඩිහිටි ශිෂ්‍යයෙකි. උන්වහන්සේ මුළු රටෙහිම අද ඉතාමත් කීර්තිමත් භාවනා යෝගී භික්ෂුවකි. ඉතාම සුවච නිහතමානී රහත් ගුණයෙන් හෙබි දක්ෂ දේශකයෙකි. එම ආචාර්යවරුන්ගේ ගති ලක්ෂණ හැසිරීම් රටාව වෙනස් වේ. සමහර ආචාර්යවරු ඉතාම සුවිනීත ශික්ෂාකාමී මහතෙරවරුන්ය. උන්වහන්සේලාගේ ඇසුර ලැබූ අන් අයද එසේමය. එහෙත් සමහර ආචාර්යවරුන්ගේ බාහිර ආකලප උන්වහන්සේලාට ආවේණික වූ නිසා අන් අයට එම චරිතය අනුකරණය කළ නොහැකිය. නොයෙක් විට එම චරිත ලක්ෂණ අවබෝධ කිරීමට දුෂ්කරය. සමහරුන් උරණ වෙන අවස්ථා ද ඇත.

ආචාර්ය වෙට් ඉතාම සුවිනීත ගති පැවතුම් ඇති බැවින් සියලු දෙනාම ආදර සැලකිලි දක්වති. බෞද්ධ භික්ෂුවකි. ගැලපෙන ගති ගුණයෙන් යුතුවේ. මගේ විශ්වාසයට අනුව උන්වහන්සේ ආචාර්ය මන්ගේ ශ්‍රේෂ්ඨතම ශිෂ්‍යයා වේ. මම බොහෝ කල් උන්වහන්සේ ඇසුරෙහි සිටියෙමි.

ආචාර්ය ෆෑන් අජාරො වට් උදොම් සොම්ෆොන් හි වාසය කරයි. උන්වහන්සේ ඉතා උසස් ආචාර්යවරයෙකි. මෙත්තා භාවනාවෙන් අග්‍රවෙති. බොහෝ අයට උදව් උපකාර කරති. උන්වහන්සේ මුළු රටේ සම්මානයට පත් වී සිටිති.

ඊළඟ උසස් ආචාර්යවරයා වන්නේ ආචාර්ය ඛඕ අනාලයෝ භික්ෂුවයි.

උන්වහන්සේ උදොන් ථානි ප්‍රදේශයේ නො බුආ ලම් ෆු රටේ වට් ටම් ක්ලොං ෆෙන් ආරණ්‍යයේ වාසය කරති. ප්‍රේක්ෂක ඔබ මෙම අති උතුම් ආචාර්යවරයා ගැන අසා ඇත. උන්වහන්සේගේ අවබෝධය හා පිළිවෙත් ඉතාම උසස් වේ. ඈත කැලෑබද ප්‍රදේශයේ ධූතාංග කර්මස්ථාන වරයෙකි. අවු. 82 වයසේ පසුවන නමුත් තවමත් එම උග්‍ර ප්‍රතිපත්තිවල යෙදේ. උන්වහන්සේට පසක් කිරීමට තව කිසිවක් නැත. එහෙත් මේ උග්‍ර ප්‍රතිපත්තියේ යෙදෙන්නේ මක් නිසාදැයි බොහෝ අය විචාරති. යමෙකුගේ සියලු කෙළෙස් දුරු වූ විට කිසිම මෝහයක්, මැලිකමක් නැත. කෙළෙස් සහිත පුද්ගලයා එවැනි අකර්මණ්‍ය ස්වභාවයෙන් සිටියි. එවැනි අය ඵල ලබා ගැනීම තෙක් වීර්‍යය නොකරති. ''ඔවැනි දේ දුෂ්කරයැ''යි කලින්ම ප්‍රතික්ෂේප කරණ බැවිණි.

ඔවුන් ලබා ගත් දෙයක් නැත. හදවත කනස්සල්ලෙන් පසුවෙයි. ඉතා වීර්‍යයෙන් එකතු කළ කුසල් කර්ම නැත. එබැවින් ඒ මේ අත අයාලේ හැසිරති. තම හිස් මනසේ ඇත්තේ අනුන්ගේ දොස් පරොස් පමණි. මෙසේ හෙයින් මැලිකම යනු තමාගේ සියලු දියුණුව වනසාලන හදවත තද කරණ අකුසලයකි. මේ මැලිකම ආර්ය පුද්ගලයන් තුළ නැත. උන්වහන්සේලාගේ උත්සාහයෙන් නෙලාගත් ඵල අසීමිතය. එවැනි අයගේ හදවත ධර්මයෙන් පිරී ඇත. ලෝක පූජිත වීමට කැමැත්තක් නැතත් ලෝක පූජිත වීම ස්වභාවයකි. උන්වහන්සේලා ලෝකයාට කදිම ආදර්ශයකි.

ඉහත සඳහන් කළ මෙම සියලුම ආචාර්යවරුන් තුළ අසීමිත ගුණ සම-ුදායක් හදවතේ තැන්පත් වී ඇත. එය අනර්ඝ මැණික් මෙන් බබළයි. එවැනි ආචාර්යවරු මුණ ගැසීමට තරම් වාසනාවන්ත අය පුදුමාකාර ධර්ම අවබෝධයක් තුළින් අසීමිත තෘප්තියකට පත්වෙති. එම සතුට සදාකල් පවතී.

ආචාර්ය මන්ගේ ගෝල ශිෂ්‍යයින් පරම්පරා වශයෙන් ඇත. සමහරු ඉතා දක්ෂ ගුරුවරුවෙති. භාවනා බලයෙන් ශක්තිමත් වූ උන්වහන්සේගේ ඉගැන්වීමේ දක්ෂතාවය ඉතා පුදුම ඵලවන්නකි. ගුණ, නුවණ, සිල්වත්කම් වලින් අනූන වූ උන්වහන්සේ මාර්ගඵල ලබා ගැනීමේ පිළිවෙත් කර්මස්ථාන උපදෙස් දුන්හ. රටින් රටට යමින් බොහෝ දෙනෙකුට ධර්මය බෙදා දුන්හ. ගිහි පැවිදි බොහෝ දෙනා තමන් ලැබූ ලෝකොත්තර සැප නිසා ශ්‍රද්ධා භක්තියෙන් උන්වහන්සේට උපහාර දක්වති. උන්වහන්සේගේ වචන ප්‍රත්‍යක්ෂ ඥානයෙන් වදාළ බැවින් පොත පතින් උකහා ගත්තේ නොවේ. අනුමාන ඥානයෙන් නොවේ එබැවින් තමාගේ හදවතේ පිබිදී ඇති නිවන අනුන්ටත් ප්‍රත්‍යක්ෂ කිරීමට හැකිවිය. උන්වහන්සේ සාරිකා ගල් ගුහාව අත්හැරියේ හැකි තරම් අනගි දහම ලෝකයාට දීමටය.

## ධූතාංග පිළිවෙත්

තවුස් ජීවිතය ඔප මට්ටම් වන්නේ ධූතාංග පිරීමෙන් බව ආචාර්ය මන් නිසැකව පිළිගනියි. එබැවින් මුළු ජීවිත කාලය තුළ උග්‍ර තපස් රැක්කේය. එපමණක් නොව තම ශ්‍රාවකයින්ට එම පිළිවෙත් පිරීමට උපදෙස් දුනි.

පිණ්ඩපාත දානය පිණිස දිනපතා ගෙන් ගෙට වැඩිසේක. යම් දිනක නොවැඩියේ එදින නිරාහාරව සිටීමටය. උන්වහන්සේ පිණ්ඩපාත චර්යාව රැකීමට ශිෂ්‍යයින්ට පුහුණු කළ සේක. ගමන් කරන අඩියක් පාසා සතිය පැවැත්වීමට, තම සිත, කය, වචනය සංවර කිරීම අවශ්‍ය විය. භික්ෂුව පිඬු සිඟා යන විට යම් අරමුණු නිසා ඇස, කණ, නාසය, දිව, ශරීරය, සිත සංවර විය යුතුය. අහම්බෙන් වුවද හමු වූ අරමුණු ගැන නැවත සිතීමෙන් වැළකිය යුතුය. සතියෙන් තම ඉරියව්, වචන ක්‍රියා සිතිවිලි පිළිබඳ නිරන්තරයෙන් අවධානය ඇත. එය තමාගේ පාරිශුද්ධිය පිණිස කෙරෙන යුතුකමකි. පිඬු සිඟා යාමට පෙර සතිය පැවැත්වීම ගැන අධිෂ්ඨාන ගත යුතුවේ.

## තම පාත්‍රයට බහා ලූ ආහාර පමණක් වැළඳීම

යම් භික්ෂුවක් තමාට සෑහෙන ප්‍රමාණයට පිණ්ඩපාතය කළ යුතුය. එය ද අප්පිච්ඡතාවෙනි. එවැවින් පහසුවෙන් තෘප්තිමත් වේ. තමා වැඩිපුර ආහාර ආරාමයේදී වැළඳීම නිසා මෙම අපපිච්ඡතා ගුණයෙන් පිරිහේ. එවැනි පුරුදු නිසා තමාගේ තණ්හා, ආසා පැන නගී. එහෙයින් එම කෙළෙස් ශක්තිමත් වී තමාගේ භාවනා අරමුණු අබිභවා සිටී. තමාට ලැබුණු ආහාරයෙන් සතුටුවීම නිසා වැඩිපුර රස ගුණ සෙවීමෙන් වන වෙහෙස නැත. එවැනි රස තෘෂ්ණාවෙන් පෙළෙන්නේ ප්‍රේත නිකායික සත්ත්වයෝය. එසේ වීමට හේතුව තමාගේ අධික තෘෂ්ණාව නිසා කළ පාප කර්මවල විපාක වේ. ඔවුන්ට තම කට බඩ පිරීමට සෑහෙන ආහාර නොලැබේ. එබැවින් දුව පැන ඇවිදමින් නිරන්තරයෙන් ආහාර සොයති. එහෙයින් භික්ෂුව තම පිළිවෙත් වලට වඩා ආහාරයට අවධානය නොදිය යුතුය. තම පිණ්ඩපාත දානයට අමතරව වෙනත් ආහාර ප්‍රතික්ෂේප කිරීම නිසා සිදුවන්නේ ආහාර පිළිබඳ තෘෂ්ණාව සිඳී යාමයි. ඉන් ආහාර අපේක්ෂාව සහ නොලැබීම නිසා ඇතිවිය හැකි කනස්සල්ල දුරුවේ.

## දිනකට එක් වේලක් පමණක් ආහාර ගැනීම

මේ ධූතාංගය නිසා භාවනා කිරීමට වැඩි කාලයක් ඉතිරි වේ. දවසේ කීප

විටක් ආහාර ගැනීම පිළිබඳ සිතිවිලි ඇති නොවේ. මේ අපේක්ෂාව ඇතොත් භාවනාවට වඩා ආහාර පිළිබඳ සිත් පහළවේ. එවිට ''දුක්ඛ'' ක්‍ෂය කිරීමට නොහැකිය. එක් වේලක් වැළඳුවත් ආහාර ප්‍රමාණය සීමිත විය යුතුය. පමණට වඩා අඩුවෙන් වැළඳිය යුතුය. එවිට භාවනා කිරීමට පහසුය. වැඩිපුර ආහාර ගැනීම නිසා නිදිමත ඇති වී ශාරීරික මානසික මැලි බවක් හට ගනී. මෙසේ ආහාර අඩුවෙන් ගැනීම නිසා තම ශරීරය පිළිබඳ සත්‍යය වටහා ගැනීමට ඉවහල් වේ. ආහාර ගැන තණ්හාව දුරුවේ.

මේ ධර්මතාව ලෝකයේ පවතින ධර්මතාවය මෙනි. සමාජ දූෂණය කරන පුද්ගලයින් ඇති විට මිනිසාට තම ධනය, අයිතිය, ජීවිතය අත් පා හෝ අවයව නැති වී යා හැකිය. එබැවින් සමාජයට අහිතකර පුද්ගලයන් දුටු තැන එම අයට දඬුවම් පමුණුවා මෙල්ල කරණු ලැබේ. එමෙන්ම ධර්මයට පටහැනි සිරිත් කපා හැර මෙල්ල කරණු ලැබේ. සමාජයට අහිතකර වන සතුන් වල් සතුන් යම් ආකාරයෙන් තුරන් කරනු ඇත. සැර පරුෂ සතුන් වල් ඌරා, නයි, පොළොං, වල් අලි, කොටි ආදියද රෝග බෝ කරණ විෂබීජ ආදිය ද මිනිසා විනාශ කරයි. සමාජයට අහිතකර හැසිරීම් ඇති පුද්ගලයින් යම් ක්‍රමයකින් සමාජනේ බැහැර කරයි. නොයෙක් බෙහෙත් වලින් රෝග මර්දනය කරයි. ධූතාංග භික්‍ෂුව තුළ ආහාර රුචිය හෝ අන් යම් යම් වැරදි පුදුරු නිසා තම ගමන් මාර්ගය අවහිර වේ. එබැවින් උන්වහන්සේ ඉතාම සුදුසු ලෙස ජීවත් වීමට පුරුදු විය යුතුය. එය බලා සිටින අයට ද තමාට ද විශාල ආශිර්වාදයකි. දිනකට එක් වේලක් වැළඳීම ඉතාම උචිත ධූතාංගයකි. ඉන් මනස ඉක්මණින් සමාධිගත වේ. උද්ධච්චය හෙවත් විසිරී ගිය සිත් එකඟ වේ.

## තම පාත්‍රයෙන් පමණක් ආහාර වැළඳීම

එනම් තව යම්කිසි උපකරණ පාවිච්චි නොකිරීම. මෙම ධූතාංගය ඉතා පහසුවන්නේ වනවාසී භික්‍ෂුව නිතර චාරිකාවේ යෙදෙන විටය. තම පාත්‍රය පමණක් රැගෙන යයි. අනවශ්‍ය බඩු භාණ්ඩ කිසිවක් නැත. ඒවා ප්‍රවේසම් කිරීමක් නැත. තවද එය තම මනසේ ඇති අනවශ්‍ය සිතිවිලි බැහැර කිරීමක් වැනිය. කිසිම බරක් නැතිව ගමන් කරති. ආහාර සියල්ල කලවම් වී එකම පාත්‍රයේ ඇති බැවින් තම ආහාර කුමක්දැයි විමසිලිමත් විය යුතුය. එවිට සති පඤ්ඤාවේ පිහිටයි. ආහාර පිළිබඳ යථා තත්ත්වය දකී.

ආචාර්ය මන් මෙම ධූතාංගය මුළු ජීවිත කාලයේම අනුගමනය කළහ. එය තුළින් විශේෂ විදසුන් නුවණ පහළ විය. දිනපතා ආහාරය දෙස නුවණැසින් බලයි. එහි පිළිකුල ආදිය මෙනෙහි කරයි. මෙම තවුස් දම් උන්වහන්සේ නො-ාකඩවා රැක්කෝය.

තම පාත්‍රයේ ඇති ආහාර මිශ්‍ර වී එහි පැහැය, ලක්‍ෂණ වෙනස් වී එකම ආකාරයෙක් ගනී. ආහාර වළඳන විට ඒ හේතුවෙන් ආසාව තුනී කරයි. ආහාරය ගන්නේ තම ශරීරය යැපීමට සෑහෙන ප්‍රමාණයෙනි. හෙට දින වන තෙක් එය ප්‍රමාණවත් වේ. එහි සුවඳ හෝ දුගඳ නිසා තම නිස නොවෙනස් වේ. එහි රසගුණ නොතකයි. මෙසේ යෝනිසෝ මනසිකාරයෙන් ආහාර වළඳන විට කිනම් ආහාරයක් වුවද තෘප්තිමත් කරයි. සිත මධ්‍යස්ථ වේදනාවනට පත්වේ. දුක් වේදනා, සැප වේදනා දුරුවේ. මෙම පුහුණුව නිසා දෛනික ජීවිතයේ ඕනෑම අරමුණක් නිසා කම්පා නොවී සිටීමට හැකිවේ. එකම පාත්‍රයෙන් වැළඳීම නිසා ආහාර පිළිබඳ ඇති නොමනා රුචිය පහවේ.

## ඉවත දමා තිබූ රෙදි කැබළිවලින් චීවර මසා ගැනීම

ආචාර්ය මන් මුළු ජීවිත කාලයක්ම මෙසේ රෙදි කැබළිවලින් සාදා ගත් චීවර දැරුවේය. මෙහි අදහස වූයේ ලක්‍ෂණ ඇඳුම් ඇඳීමේ කැමැත්ත දුරු කිරීමය. මේ නිසා ඉවත දැමූ රෙදි කැබළි සෙවීමට සුසාන භූමි ආදියට යාමට සිදුවිය. සමහර විට මෘත දේහය එතූ රෙදි ඒ නෑදැයින්ගෙන් ලැබුණි. මෙම රෙදි සෝදා එකතු කර කැබළිවලට කපා මසා තනිපට සිවුර, දෙපට සිවුර, අඳනය, නාන කඩය ආදිය මසා ගනිති. සමහර විට පිණ්ඩපාතයේ වඩින විට බිම දමා ඉවත දැමූ රෙදි කැබලි එකතු කර ගති. ඒවා කාගේදැයි හැඟීමක් නැත. සමහර විට ඒවා ඉරුණු සිවුරු වලට අණ්ඩ දැමීමට පාවිච්චි කළේය. උන්වහන්සේගෙ ' ප්‍රතිපත්ති අවබෝධ කරගත් සමහර දායකයෝ රෙදි කැබළි සොහොනේ හෝ මඟ දෙපස දමති. එබැවින් මුලින් සඳහන් කළ පරිදි පරණ වීසි කළ රෙදි කැබළි භාවිතය වෙනස් වුණි. ඒ කෙසේ වුවත් අවසාන මොහොත දක්වා මෙසේ රෙදි කැබලි මසා සාදාගත් සිවුරු දැරූහ.

උන්වහන්සේගේ දැඩි ආකල්පය වූයේ භික්‍ෂුවක් තම ජීවිතය සකස් කරගත යුත්තේ ඉවත දමන රෙදි කඩමාළු මෙන් නිහතමානීවය. තම සම්භාවනීභාවය නිසා උද්දාමය වුවහොත් එය භික්‍ෂුවකගේ සැබෑ ගුණයට පටහැනිය. සැබෑ ගුණය පිහිටන්නේ ''මමත්වය'' ඉවත දමා අස්මි මානය දුරු කිරීමෙනි. තම මානය සඟවාගෙන සිටින විට තමාටත් අනුන්ටත් සාමය සතුට නැත. මෙවැනි කඩමාළු රෙදි කැබළිවලින් ශරීරය වසා ගන්නේ තම මානය දුරු කිරීමටය.

තමා පුරුදු පුහුණු කරන ගුණ, නුවණ නිසා මානයට පත් වූ විට එය හානිකරය. තම ගුණ නුවණ අතරින් භයානක කඩු, කිරිච්චි පැන නැගිය හැකිය. එබැවින් තමා වීසිකර දැමූ කඩමාල්ලක් මෙන් සළකා එය තමාගේ පුරුද්දක් බවට පත් කළ යුතුය. එවිට එය තම චරිතය බවට පත්වේ. යමෙකුගේ නින්දා,

ප්‍රශංසාවෙන් නොසෙල්වේ. අනුන්ගේ විවේචනයෙන් නොසෙල්වේ. එවැනි ස්ථාවර භාවයක් නිසා සෑම මොහොතේම සතුටින් කල්යවයි. ආචාර්‍ය්‍ය මන්ගේ ස්ථිර පිළිගැනීම වූයේ එවැනි රෙදි කැබළි වලින් මැසූ සිවුර තම මානය දුරුකරණ බවකි. තම සිත තුළ ගැඹුරේ සැඟවී සිටින අසම් මානය දුරු කිරීමට එය ඉවහල් වේ.

## වනවාසී ජීවිතය

වනයේ හුදකලා ජීවිතයේ වැදගත්කම අවබෝධකර ගත් උන්වහන්සේ ධූතාංග රැකීමට මුලින්ම උනන්දු විය. වනයේ ජීවත්වන විට නිතරම සෝදිසියෙන් සිටිය යුතුය. එය නිරන්තරයෙන් සති සමාධි පූරණයට ඉවහල් වේ. හදවත් පුදුම නිදහසක් ඇත. කිසිම ලෝකයට අයත් වගකීමක් නැත. නිතරම මනසිකාරය වන්නේ ''දුක'' ඉක්මවීමය. තම සිතේ නිදහස සහ අවට පරිසරයේ භය නිසා වෙන අරමුණු කරා සිත නොයයි. කාම, කෝප හට ගැනීමට පරිසරයක් නැත. තමා කැමැත්තෙන්ම මෙම පරිසරය තෝරාගෙන ඇත. තම කෙළෙස් මෙවැනි පරිසරයෙන් නැගී නොඑන බැවින් තමා දිනෙන් දිනම දියුණුවෙන බවක් එම භික්ෂූන් වහන්සේලාට දැනේ. ලාභ, අලාභ ආදී අෂ්ට ලෝක ධර්ම නැත. ඊර්ෂ්‍යයා, මානාදිය හට ගැනීමට පරිසරයක් නැත. එබැවින් භාවනා කිරීමට ඉතා සුදුසු පරිසරයකි.

එම කැලෑ පරිසරයට පුරුදු වූ විට විෂකුරු සතුන් වල් සතුන් කෙරෙහිත් අහිංසක සතුන් කෙරෙහිත් මනා කරුණාවක් හටගනී. මේ සියලුම සත්ත්වයන්ගේ දුක හඳුනා ගනියි. උප්පත්තිය, ලෙඩ රෝග, දිරාපත්වීම, මරණය, සර්ව සාධාරණ බව හොඳාකාර තම අත්දැකීමෙන් වැටහේ. මනුෂ්‍යයා මේ සතුන්ගෙන් වෙනස් වන්නේ කුසල් අකුසල් තෝරා ගත හැකි බැවිණි. මෙසේ හොඳ නරක නොදත් මිනිසා තිරිසන් සතුන් මෙනි. අපි ඔවුන්ට තිරිසන් සතුන් යැයි නාමය යෙදුවත් මිනිස් වර්ගයාත් යම්කිසි සත්ව වර්ගයකි. මිනිසා සතුන්ට අවඥා කළත් සතුන් කෙසේ මිනිසාට අවාඥා කරත්දැයි අපි නොදනිමු. ඔවුන් අපට ''භයානක යක්ෂයන්'' යැයි නම් යොදා ඇද්ද ? එතරම් සාහසික අන්දමින් සතුන් ඝාතනය කරති. මස් පිණිස, විනෝදය පිණිස සතුන් ජීවිතක්ෂයට පත් කරති. ඔවුන්ගේ වන පරිසරය විනාශ කරති. අපි ඔවුන්ට සළකන්නේ ඉතාම කෲර ලෙසය. මිනිස්සු තම තමන් අතරද ඇන කොට ගනිති. මරා ගනිති. සතුන් ද මරති. සත්තු නිතරම මිනිසාට බිය වෙත්. සැක බිය පහළ කරත්. තමාගේ සිතිවිලි පිළිබඳ හොඳාකාර අවබෝධයක් ඇති වන්නේ වනවාසී ජීවිතයෙන් බව ආචාර්ය මන්ගේ නිගමනයයි. බාහිර ලෝකයේ ඇති සැබෑ තත්ත්වය දකින්නේ වනගත ස්වාභාවික

පරිසරයේදීය. දුක් නැති කිරීමට භාවනා කිරීමට වීර්‍යය වැඩීමට මෙම පරිසරය බොහෝ උපකාර වේ.

ආචාර්ය මන් සක්මන් භාවනා කරණ විට වල් ඌරෝ රංචු පිටින් එති. එහෙත් කිසිම බිය සැක නැතිව උන්ගේ ආහාර සොයමින් ඒ මේ අත යත්. උන්වහන්සේ සහ අනිත් බිහිසුණු මිනිසුන් අතර ඇති වෙනස ඔවුන් දනිති යැයි උන්වහන්සේ දිනක් ප්‍රකාශ කළහ. එබැවින් බියපත් වී දුවන්නේ නැත.

මම දැන් මෙම කථාවෙන් ටිකක් නවත්වා මගේ අත්දැකීම් පිළිබඳ කියමි. වල් ඌරෝ උන්වහන්සේට බිය නැත්තේ උන්වහන්සේ තනිව හැසිරෙන බැවින් යැයි සමහර විට ඔබට සිතිය හැකිය. එහෙත් එය එසේ නොවේ. මගේ ආරාමය වූ වට් පා බාන් ටාඩ් හි මුල් කාලයේ බොහෝ භික්ෂූන් වහන්සේලා වැඩ විසූහ. වල් ඌරෝ ගාලක් මෙම අරමට පැමිණ වාසය කළහ. උන්වහන්සේලාගේ කුටි අසලට පැමිණෙති. සක්මන් කරණ විට ඒ මේ අත යති. ඔවුන්ගේ නාසයෙන් ශබ්ද නගා ගොරවති. එක එකාට සංඥා කරති. භික්ෂූන් වහන්සේලා වල් ඌරන් බලන්ට එන්න යැයි ශබ්ද නගා කීවත් ඔවුන් කිසි බයක් සැකක් නැතිව නිදැල්ලේ යති. පසුව භික්ෂූන් වහන්සේලාට හීලෑ විය. එහෙත් අද එම සතුන් නැත. ආචාර්ය මන් කියන පරිදි මිනිසුන් නැමති භයානක යක්ෂයින් ඔවුන් මරා මස් භක්ෂණය කර ඇත.

ආචාර්ය මන්ගේ අත්දැකීම් අනුව සෑම වර්ගයේම සතුන් වන සෙනසුනට පැමිණ නිදැල්ලේ හැසිරුණාහ. ඔවුන්ට එය නිර්භය ස්ථානයකි. භික්ෂූන් වහන්සේලා සිටින සෙනසුනේ බොහෝ සත්තු සිටිති. නගරබද සෙනසුන් වල බල්ලෝ සිටිති. ඔවුන් සිය ගණන් සිටියත් උන්වහන්සේලාගෙන් කිසිම තර්ජනයක් නැත. මේ උදාහරණය ධර්මයේ ඇති අවිහිංසාව, සාමය විදහා දක්වයි. ධර්මය ලෝකයේ කිසිවෙකුට හානිකර නොවේ. එහෙත් දුෂ්ට හිංසාවාදයට නොගැලපේ.

වනයේ වාසය කිරීම තම ධර්මතාවය දියුණු කිරීමට ඉතාමත් සුදුසු බව ආචාර්ය මන්ගේ පිළිගැනීමයි. එය දුක ඉක්මයාමේ ප්‍රතිපත්තියට ඉවහල් වේ. එහෙයින් බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට වදාළහ. ''යන්න, කැලෑවල, ගස් මුල් වල නිහඬ පරිසරයකට'' - ආචාර්ය මන්ගේ මුළු ජීවිතයම ආරණ්‍යවාසී විය. කැලෑවේ හුදකලාව සිටින විට තමා කෙතරම් ආරක්ෂා විරහිත ද යන්න දැනේ. එක මොහොතක් සති සම්පජඤ්ඤයෙන් තොරව සිටිය නොහැක. නිතරම තමා ගැන, පරිසරය ගැන දැඩි අවධානයක් ඇත. මේනිසා ධර්මය අවබෝධ වේ.

රුක් මුල්වල වාසය කිරීම. යනු ධූතාංගයකි. එය වනවාසී වීම මෙනි. එක් දිනක් ගස් මුලක භාවනා කරන විට තම සිත ලෝකයෙන් ඉක්ම වී ගියේ යැයි ආචාර්ය මන් පැවසීය. මේ පිළිබඳව පසුව සාකච්ඡා වේ. ගස් සෙවනෙහි වාසය

කිරීම නිසා තමාගේ ජීවිතය පිළිබඳ සැබෑ තත්ත්වය වැටහේ. තම සිතේ ඇතිවන කෙළෙස් යථා තත්ත්වයෙන් පෙනේ. සතර සතිපට්ඨානය වැඩේ. රූප, වේදනා, චිත්ත, ධර්ම යන ධර්මයන්ද, දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්‍ය්‍ය සත්‍යයද මනාව ප්‍රත්‍යක්ෂ වේ. මේ ධර්මයන් සිතේ පවතින විට සිතේ ඇති කෙළෙස් වලට වසඟ නොවේ. සිත ආරක්ෂා වේ. වනයේ ඇති නිහඬ, භයානක පරිසරය නිසා සිත ඒ මේ අත විසිරී නොයයි. එහෙයින් සතර සතිපට්ඨානයේ සහ චතුරාර්‍ය්‍ය සත්‍යයේ සිත එල්බ ගනී. මෙසේ වූ විට කෙළෙස් යටපත් වේ. යමෙකුට මේ ධර්මය අවබෝධ කිරීමට අවශ්‍ය නම් තමාට සුදුසු කර්මස්ථානයක් ගෙන වීර්‍ය්‍ය වැඩීමට සුදුසු පරිසරයක් ලබා ගත යුතුයි. බුද්ධ කාලයේ සිට රුක්මුල් වල වාසය කිරීම ඉතාම සුදුසු පරිසරයකි.

සුසානයේ විසීම - මෙම ධුතාංගය රැකීම නිසා ගිහි පැවිදි කාටත් තමන් නොමැරෙන පුද්ගලයෙක් මෙන් තම වැඩ කටයුතු පැහැර හැරීමට හෝ අතපසු කිරීමට නොහැකිවේ. සත්‍යය නම් අපි හැම මොහොතේම මැරෙමින් සිටින බවයි. මීට ඉහත සිටි අයද ක්‍රමයෙන් මැරී මැරී ගොස් අවසානයේ ශරීරයේ සියලුම සෛල නැවත නූපදින ලෙස ප්‍රකෘති මරණයට ගොදුරු විය. ඒ අය මැරී නැවත අන් තැනක ඉපදී නැවත මැරේ. එකම සුසානයක ඒ අය නැවත භූමිදානය නොවෙත්. එසේ වුවහොත් සුසානය ඉඩ මදිය. මෙලොව කිසිවෙකුට මෙම මරණයෙන් නිදහස් විය නොහැකිය.

අපි සුසානයට ගොස් මෙම පාඩම ඉගෙන ගත යුත්තෙමු. මෙහි අපගෙ ' අනන්ත මුතුන් මිත්තෝ භූම දානය කළහ. අප සමානව ඒ අයත් උපත, දිරීම, ලෙඩ රෝග, මරණයට පැමිණ ඇත. අප නිතර සිතිය යුත්තේ නැවත නැවතත් අප උපත, දිරීම, ලෙඩ රෝග, මරණයට පැමිණෙන බවය. භික්ෂූන් වහන්සේලා මෙම සංසාරික පැවැත්මෙන් ඉක්මවා යන බැවින් සුසානය මෙම ස්වභාවය මෙනෙහි කිරීමට ඉතා වැදගත් පරිසරයකි. අප නොයෙක් සත්ත්ව මාංශ භක්ෂණය කරන විට අපගේ ශරීරය සත්වයින්ගේ සුසානය වේ. සත්ත්ව මාංශ උයන මුළුතැන්ගෙය සුසාන භූමියකි. නමුත් අපි එය එසේ දකින්නේ නැත. එසේ ගත් සත්ත්ව ශරීර අප ශරීරයට ජීරණය වී යති. දිරා යති. එය ගණනින් ගණන් කිරීමට නොහැකිය. මෙසේ සත්‍ය දෙස ගැඹුරෙන් දකින විට ස්වභාව ධර්මයේ දරුණු ශෝකාකුල භාවය දකිනු ඇත.

මෙසේ බාහි සුසානය හෝ තම ශරීරයේ අභ්‍යන්තර සුසානය දෙස නිතර බලන විට තමාගේ යෞවන මදය දුරුවේ. ජීවත් වීම නිසා ධන, ධාන්‍ය නිසා නොයෙක් දේ නිසා ඇතිවන මානය දුරුවේ. මෙම සත්‍යය දකින විට ''මම'' මගේ යන අසවි මානය අඩුවේ. තමන්ගේ අගුණ දුර්වලකම් දකිමින් එයින් ඉවත්වේ. අනුන්ගේ අගුණ දුර්වලකම් ගැන කලකිරෙන්නේ නැත. අනුන්ට අපහාස නෙ-

ාකරයි.

මේ පිළිබඳ භාවනා මනසිකාරය නිසා ජීවිතය මරණය ගැන හොඳ අවබෝධයක් ලැබේ. එවිට අනුන් විවේචන නොකරයි. අනුන්ගේ වරද දකින ගතිය මිනිසා තුළ ඇති මානසික රෝගයකි. එම රෝග කාරක විෂ බීජ මර්දනය කරනවාට වඩා වගා කරති.

සුසානය යනු සියලු දෙනාම යන තැනයි. මුළු ලෝකයේ සියලු දෙනා හමුවෙන තැනකි. මරණය ඉක්මවීම යනු සුළු පටු දෙයක් නොවේ. බුද්ධාදි රහතන් වහන්සේලා පමණක් මරණය ඉක්මවූහ. මෙම මහා ක්‍රියාව සිදු කිරීමට උන්වහන්සේලා විශාලතම විශ්ව විද්‍යාලයේ ඉගෙන ගත්හ. විෂය නිර්දේශය වූයේ උපත, දිරීම, ලෙඩ රෝග හා මරණයයි. මෙම පාඩම් මාලාව සාර්ථක ඉගෙනීමෙන් පසු මරණය ඉක්මවීය. මාරයාගේ මළපුඩුවට හසුනොවීය. එහෙත් බොහෝ අය මාරයා තම අබියස සිටියදීත් මරණය ගැන නොතකා අමතක කරති.

මරණය ගැන බිය නැති කිරීමට සුසානය කදිම තැනකි. මේ ලෝකයේ ඇති ඉතාම භයානක දෙය මරණයයි. මේ මරණ භයින් තැති නොගන්නේ බුද්ධාදී රහතන් වහන්සේලායි. මේ මහා වික්‍රමය උන්වහන්සේලා ලොව සියලු දෙනා මවිත කරමින් පෑහ. තමන්ම එය කරමින් අනුන්ටත් මරණය ඉක්මවන සැටිත් නොබියව සිටින සැටිත් පෙන්වා දුන්හ. එම ක්‍රියාවලිය සියලු දෙනාටම අනුගමනය කළ හැකිය. එහෙත් අන්තිම හුස්ම හෙළන තෙක් නොසිට කලින්ම එම විශ්ව විද්‍යාලයට පිවිස එම පාඨමාලාව හැදෑරිය යුතුයි. සිල් රැකීම, කුසල කිරීම, භාවනා කිරීම ආදී දෑ ඇතුළත් මෙම පාඨමාලාව අවසාන මොහොතේදී කළ නොහැක.

ආචාර්ය මන් සුසාන භූමියට යාමට අමතක නොකළහ. තමා දෙස බැලීමට මේ පරිසරය ඉතා වැදගත් වේ. උන්වහන්සේ මෙසේ බාහිර සුසානය සහ අභ්‍යන්තර සුසානය නිතර බැලීමට ගියහ. එම අධ්‍යයනය පූර්ණ කළහ. එහෙත් එක් භික්ෂුවක් සුසානයේදී අමනුෂ්‍ය අවතාර දැක බලවත් ලෙස බිය පත් විය. මෙම දර්ශනයෙන් සාමාන්‍යයෙන් භික්ෂූන් වහන්සෙලා බිය පත් නොවෙති.

## අවතාර පිළිබඳ භික්ෂුවකගේ භීතිය

එක් භික්ෂුවක් වනයේ සැරි සරමින් තමාට විසීමට සුදුසු භූමියක් සොයා ගති. එය සුසාන භූමියට යාබද බව උන්වහන්සේ නොදැන සිටියහ. මෙම කථ ා පුවත ආචාර්ය මන්ගෙන් අසා දැන ගතිමු. තමාට නුහුරු ප්‍රදේශයක් බැවින් ගමේ මිනිසුන්ගෙන් අසා මෙහි නැවතුනි. එදින රාත්‍රිය කිසි බියක් නැතිව පසුවුණි. පසු දින ගමේ මිනිස්සු මළ සිරුරක් ඔසවාගෙන යනු දුටුවේය. උන්වහන්සේගේ

කුටිය අසල එම මෘත ශරීරය ආදාහන කොට ගියහ. උන්වහන්සේට රෑ මුළුල්ලේ දවෙමින් තිබුණ මළ සිරුර දිස්විය. මෘත දේහය දැකීමෙනුත් චකිතයකට පත් වූ නිසා රෑ ගත කිරීමට බිය විය. දැන් යාමට තැනක් නැත. මළ සිරුර දැවෙන දෙස බලා සිටියේය. ඉන් මහා බියක් හට ගති. රෑ වෙන විට හුස්ම ගන්ටවත් නොහැකිය.

භික්ෂුවක් අවතාර වලින් බිය ගැනීම යනු අනුකම්පා කළ යුතු දෙයකි. මෙම පුවත් ගැන ලියන්නේ ප්‍රේක්ෂක ඔබට මෙවැනි අවස්ථාවකට මුහුණ දෙන විට ඇතිවන මානසික විකෘතිය දැන ඉන් පාඩමක් ඉගෙනීම පිණිසය.

හුදකලාව සිටි උන්වහන්සේට මේ බිය නිසා භාවනා කළ නොහැක. ඇස් පියාගත් විගස අවතාර ගණනාවක් තමන් දෙස එනු පෙනේ. දැන් උන්වහන්සේ වටකර ගෙන මේ පිරිස සිටී. උන්වහන්සේ භයින් ත්‍රස්ත වූහ.

උන්වහන්සේ මහණ වී මෙපමණ කලක් මෙවැනි දේ දැක නැත. මේ නම් මායාකාරී සිතේ ස්වභාවයක්ද? මගේ මනසින් මවාගත් රූපද ?

ධූතාංග රකින භික්ෂුව මරණ භයින් හෝ අවතාර වලින් තැති ගන්නේ නැත. එබැවින් මෙසේ සිතන්නට විය. ''නිර්භය ධූතාංග භික්ෂුව සියලු දෙනාම අගය කරති. එහෙත් මම දැන් අවතාර නිසා බියට පත්වෙමි. මම සම්පූර්ණ භයින් වැටුණු අසමාර්ථයෙකි. මම මහණ වුයේ හොල්මන් අවතාර වලට භයින් සිටීමටද ? මම ධූතාංග භික්ෂුන්ට නින්දාවකි. අප නිර්භය යැයි මිනිස්සු රවට-න්නේද ? මිනිසුන් සිතන්නේ අප කෙළෙස් මාරයන් ජය ගන්නා වීර පුරුෂයන් කියාය. බිය දුරුකල අය ලෙසය. මෙයට ඉඩ දෙන්නේ ඇයි ?

මෙසේ තමන්ට අවවාද කරමින් තමන්ගේ දුර්වලකම දකිමින් බිය ඉක්වීමට අධිෂ්ඨාන කොට එයට මුහුණ දීමට සිතුවේය. මෘත දේහය දැවෙමින් ඇත. එහි යා යුතු යැයි උන්වහන්සේ සිතුහ. සිවුරු හැඳ පොරවා ඒ දෙසට ගමන් ගති. අඩි කීපයකට පසු කකුල් ගල් ගැසුණි. එතනම සිටියේය. සෙලවීමටවත් බැරිය. හදවතේ ගැස්ම අධිකය. දාඩිය ගලා යයි. මේ අවස්ථාවේදී කරන්ට දෙයක් නැත. මුළු වීර්‍යය යොදා එක කකුලක් ඔසවා ඉදිරියෙහි තැබීය. අනිත් කකුලත් ඔසවා ඉතා සිහි බුද්ධිය ඇතිව අඩිය තබා තම ශරීරය එදෙසට ගමන් කරවීය. මරණ බියෙන් මුළු ගත වෙව්ලා යයි. එය නවත්වා ගත නොහැක. එහෙත් ඉදිරියට ගමන් කළේය.

ඉතාම දුකසේ, දැවෙන මාතෘ දේහය ළඟට පැමිණුනි. නමුත් ඉන් කිසිම සැනසුමක් නැත. කලාන්ත ගතියක් ඇත. භයින් ඔල්මාද වී කර කියාගන්ට කිසිවක් නැතුව එම දැවෙන මාතෘ දේහය දෙස බැලුවේය. හිස් කබල දැවී සුදු පැහැයක් වී තිබුනි. එය දැක තවත් කලාන්ත විය. මෙපමණ බිය ඇතත් එතැන වාඩි වී භාවනා කරන්ට පටන් ගති. මළ මිණිය උන්වහන්සේගේ අරමුණ විය. භයින් ත්‍රස්ත වූ සිතින් මෙසේ කීවේය. ''මම මැරෙන්න යනවා. මේ මළ මිනිය වගේ මැරෙනවා. භය වෙන්ට දෙයක් නැහැ. මම මැරෙනවා. කවදා හරි මැ-රෙනවා. භය වී වැඩක් නැහැ.''

මෙසේ භයංකාර වූ සිත මැඩ පවත්වා ගැනීමට මෙම භාවනාව මෙනෙහි කළහ. මළ යකුන් අවතාර සිහිපත් වේ. ඒ මොහොතේදීම යම් ශබ්දයක් පසු පසින් ඇසුණි. යමෙක් එන අඩි ශබ්දයකි. ශබ්දය නැවතුණි. නැවත පටන් ගති. හෙම්හිට එන ශබ්දයකි. කුරුමානම් කර පසු පසින් අවුත් එකවරම තමන් වෙත පනිති. භීතිය හා මනඃ කල්පිතය. කෙතරම්ද යනු කිය නොහැකිය. වේගයෙන් උඩ පැන දුව යන්ට වේ. කෑ ගසා විලාප කියා ''අවතාර යක්කු'' /// එහෙත් කථා කරන්ට බැරිවිය. දුවන්ට බැරිවිය. තම සිත දෙස බලමින් නිශ්චලව සිටියහ. මහත් ස්නායු කම්පනයකින් ශබ්දය අසා සිටියහ. අඩි ශබ්දය ළඟ ළඟ ඇසේ. යාර දෙක තුනකට දුරින් නැවතුණි. දුවන සිත බලවත් වේ. එවිට වෙනත් ශබ්දයක් ඇසුණි. හපා හපා කන ශබ්දයකි. ''කුරස්, කුරස්'' විකන ශබ්දයකි. ඒ වන විට මනස විකෘති විය. මොනවද මේ කන්නේ ? ඊළඟට මගේ ඔලුව හප හපා කාවි. මහා භයානක රෞද්‍ර යකා පැන මා කා දමාවි. මම ඉවරයි.

මෙසේ සිතමින්, සිටීමට කොහෙත්ම නොහැකි විය. ඇස් ඇර බලන්ට සිතුණි. භයානක දෙයක් නම් දුවන්ට ඕනේ. මේ යකා කනකම් ඉන්නේ මොකටද? මරණයෙන් බේරෙමි. මගේ භාවනාව කර ගැනීමට පෙර ජීවිතය බේරා ගත යුතුයි. මේ යකාට මගේ ජීවිතය පිදීමෙන් අති වැඩේ කුමක්ද ? මෙසේ සිතා ඇස් ඇර පිටුපස ශබ්දය දෙස බැලුවේය. වේගයෙන් පැන ගැනීමට දැන් සූදානම්ය. අන්ධකාරයේ බලා සිටියේය. එහි ගමේ සුනඛයෙකි. මිනිස්සු කා තැබූ ආහාර කන බව දුටුවේය. යක්කුන්ට දුන් පිදේනි වෙති. බඩ ගින්නේ සිටි සුනඛයා ආහාර සොයමින් ඇවිත් මෙය කන්ට වුණි. තමන් එහි හිඳීම ගැන කිසි වගක් නැත. ඌ කෑම කන ශබ්දය ඇසුණි.

මේ ශබ්දය සුනඛයාගේ බව දැනුන සැනෙකින් එම භික්ෂුන්වහන්සේ සින-ාසුනි. සුනඛයා දෙස බලමින් මෙසේ කීවේය. සුනඛයා මේ කිසිවක් නොදැන ආහාර බුදී. ''හා ! උඹද මේ මා බිය ගැන්වූ මහා යකා ? උඹ මා උමතු කෙළෙහි. මම ජීවිතයට වැදගත් පාඩමක් ඉගෙන ගතිමි.'' මේ ආදිය කියමින් තමා කෙතරම් බිය සුල්ලෙක්ද ? මෝඩයෙක්ද යන්න ගැන මහත් පුදුමයකට පත්වුණි. මම මහත්

උත්සාහයක් දරමින් යුද වදින සෙබළෙක් මෙනි. මගේ බිය දුරු කරන්ට සිතුවෙමි. එහෙත් මා බියෙන් මූර්ඡා වීමට පත් වූයේ මේ සුනඛයා ආහාර බුදින ශබ්දයෙනි. පිස්සු ධූතාංග භික්‍ෂුවක් පණ එපා කියමින් දිව්වමට වෙරදැරූහ මා ඒ අවසාන මොහොත, තත්පරය ඉවසා සති, පඤ්ඤාවෙන් මේ භය කුමක්දැයි හඳුනා ගතිමි. නැත්නම් මා දුවමින් පිස්සු වැටෙන්ට තිබුණි. හැබෑටම මා මෙතරම් බොළඳද ? තව ඉදිරියට මේ චීවරය දැරීමට සුදුස්සෙක්ද? මේ කහපාට චීවරය නිර්භය වීමේ සංකේතයයි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වූ මගේ නිර්භීත භාවය අසීමිත විය යුතු නොවේද ? මෙතරම් දුබල සිතක් ඇති මා පිඬු සිඟා වැළඳීම සුදුසුද ? අහිංසක දායකයෝ ශ්‍රද්ධාවෙන් හා ගරු බුහුමනින් දෙන මේ දානය මා වැළඳිය යුතුද ? මෙතරම් විලි ලැජ්ජා නැති විධියේ බිය සුල්ලෙක් වූ මම කෙසේ මේ වරදින් මිදෙම්ද ? ඇත්තෙන්ම බුදුරජාණන් වහන්සේගේ වෙන කිසිම ශ්‍රාවකයෙක් මේ තරම් බිය සුළු නොවේ. මා වැනි දුර්වල නිහීන පුද්ගලයෙක් නිසා මුළු සංඝ සාසනය අශෝභන වී ඇත. මේ වැනි තවත් අය ඇත්නම් සංඝ ශාසනය විනාශ වන්නේය. අවතාර ගැන මා තුළ ඇති බිය දුරු කරන්නේ කෙසේද ? මගේ ලැජ්ජාවේ නිමක් නැත. එක්කෝ අවතාර ගැන ඇති බිය මේ මොහොතේ නැති කරනු ! නැත්නම් මැරෙනු! මින් මතු මගේ හදවත පාගා දැමීමට අවතාර වලට ඉඩ නැත. තමන්ට මෙතරම් ලැජ්ජා කර ගන්නා භික්‍ෂුවක් මේ ලෝකයේ සිටීම යුතු නැත. තම ධර්මයට, ආගමට මා මහත් ලැජ්ජාවකි.

මෙසේ තමන්ට දැඩි ලෙස දෝෂාරෝපණය කරමින් ගරු ගාම්භීර ලෙස භාර වුණි. පොරොන්දු වුණි. ''මම මේ අවතාර වලට ඇති භය දුරු කර ගන්නා තුරු මේ ආරණ්‍යයේ වාසය කරමි. මැරුණත් කමක් නැහැ. මේ බිය නැති කර ගන්ට නොහැකි නම් මේ ලැජ්ජාව විඳිමින් සිටීමෙන් කම් නැත. අන් අයද මගේ නරක ආදර්ශය අනුගමනය කරති. එවැන්නෝද කිසි වැඩක් නැති නිකමුන් වෙති. එවැන්නෝ ශාසනයට බරකි.

අන්තිමේදී උන්වහන්සේ මේ සුසාන භූමියේ රෑ දවල් දෙකේ වාසය කරමින් තම බිය නැති කර ගැනීමට තීරණය කළහ. තමා ඉදිරියේ ඇති මළ මිණිය දෙස තීක්‍ෂණව බලමින් තමාගේ ශරීරයත් එබඳු බව වටහා ගත්හ. සතර මහා භූතයන්ගෙන් සැදුම් ලත් සිරුරකි. විඤ්ඤාණය අති තාක් කල් මේ සිරුර නොමැරී, කුණු නොවී පවතී. එය පහ වූ විට සතෙකු හෝ වේවා මිනිසෙකු හෝ වේවා කුණුවෙති. කැඩී බිඳී වෙන් වී යති. මළකුණක් බවට පත්වෙති.

තමා සුනඛයෙක් නිසා මෙතරම් බියකට පත් වූ බව නිසැකය. එය සිතා ගැනීමට වත් දුෂ්කරය. මින් මතු අවතාර ගැන නොසිතමි. හොල්මන් වලින් බිය නොවෙමි. තමාගේ සිත තමා රැවටූ බව පැහැදිලිය. මෙවැනි මුලාවක් නිසා විඳි දුක අප්‍රමාණය. ගම් සුනඛයෙක් ආහාර බුදින විට මෙතරම් බියක් ඇතිවන්නේ

කෙසේද ? ජීවිතයත් මරණයත් අතර සටනක් වූයේ නොවේද ?

උන්වහන්සේ මෙසේ සිතූහ.

"සංඥාව සැමදා ක්‍රියාත්මක වූ නමුත් මේ අවධියේ දී සංඥාව මහත් කැළඹීමකට විනාශයකට මා පත් කළේය. ධර්මයට අනුව සංඥාව යනු ප්‍රබල මුලාවකි. මායාවකි. එහෙත් මේතාක් එය වැටහුණේ නැත. දැන් මගේ මරණයේ දුර්ගන්ධය මට ම දැනේ. මේ කාරණය තේරුම් යයිද ? මා හොල්මන් වලට තිබූ භය ද සංඥාවේ රැවටිල්ලකි. මින් මතුවට සංඥාව මා රවටන්නේ නැත. මම මේ සුසානයේ සිටිමින් සංඥාව නැමති විජ්ජාකාරයා මරා මෙහිම වළලමි. මින් මතුවට හොල්මන් සංඥාව මට දුක් නොදේ. එතෙක් මෙහි රැඳී සිටිමි. දැන් මගේ වාරය පැමිණ ඇත. සංඥාව නැමැති මායාකාරී රැවටිලිකාරයා මරා පුළුස්සා දැමීමට මට හැකිවේ. මෙහි පැවති කුණු වූ මිණිය පුළුස්සා දමන්නා සේ එය පුළුස්සමි. සංඥාවේ යටි කූට්ටු මායාව මම ජය ගනිමි. මගේ ජීවිතයේ දැන් ඇති එකම අරමුණ එයයි.

මේ භික්ෂුව සංඥාව සමඟ සටන් වදී. අවතාරයෙක් ඇතැයි සංඥාව ලැබූ විගස ඒ දිශාවට ගොස් පරීක්ෂා කරයි. රාත්‍රි කාලයේ නොනිදා මේ මායාකාරයා පසු පස එලවීය. අන්තිමේදී සංඥාව දුර්වල වී තමන් යටත් කිරීමට නොහැකි විය. සවස් යාමයේදී මේ අවතාර සංඥාව තමන්ට වද දුනි. එය ගමේ බල්ලෙකුගේ වේශයෙන් ආවේය මේ බාහිර සංඥාව මෙසේ මර්දනය කර අභ්‍යන්තර සංඥාව අරමුණු කළේය. එනම් භය, සැක, දුක ආදී කෙළෙස්ය. රාත්‍රි පුරා මෙම සංඥාවන් අඳුනා ගෙන මෙනෙහි කළහ. යම්කිසි බියක් සැකක්, දුකක් ආ විගස එම සංඥාව හඳුනා ගෙන පළා හරිති. අවසානයේදී උන්වහන්සේ ඉතාමත් නිර්භීත භික්ෂුවක් බවට පරිවර්තනය වූහ. එය විශ්මිත දෙයකි. මෙම සිද්ධිය උන්වහන්සේගේ මුළු ධර්ම මාර්ගය දියුණු කිරීමට විශාල ලෙස බලපෑවේය. හොල්මන් වලට තිබූ බිය ධර්ම පාඩමකි. එය නිවන් පිණිසම විය.

මා මේ කථාව ඇතුළත් කළේ පාඨක ඔබ යම් වටිනා ප්‍රඥාවක් ලබා ගනිති යන අදහසිනි. අචාර්‍යය මන්ගේ ජීවිත ප්‍රවෘත්තිය ද ඔබට බොහෝ උපකාර වේ යැයි මම සිතමි. මෙම කථාවේ සඳහන් වූ පරිදි ධූතාංග භික්ෂුවකගේ එක් චර්යාවක් නම් මෙසේ සුසානයේ විසීමයි.

ත්‍රිචීවරයෙන් සිටීම තවත් ධූතාංගයකි. එනම් තුන් සිවුර පරිහරණය කිරීමයි. ආචාර්‍යය මන් මේ අංගය මහණ උපසම්පදාවේ සිට වයස්ගත වී මරණය දක්වා පිළිපැද්දේය. ඒ කාලයේදී ධූතාංග භික්ෂූන් එකම ස්ථානයක නොසිටියහ. වස් කාලයේ පමණක් තුන් මසක් එක් තැනක සිටී. අනිත් කාලවලදී කඳු, හෙල්, කැලෑ, වනරොද පසු කරමින් චාරිකාවේ වඩිති. පා ගමනින් වඩිති. තම බඩු

බාහිරාදිය තමන් ගෙන යා යුතුය. අන් අයගෙන් අධාර නොලබති. එබැවින් අවම ප්‍රමාණයේ බඩු ගෙන යති. ඉතා අවශ්‍ය දේ පමණකි. කාලයක් ගත වන විට ඊට හුරු පුරුදු වී ඉතා සරල දිවියක් ගත කිරීම තම චරිතය බවට පත්වේ. යම් දෙයක් ලැබුණොත් එය අනවශ්‍ය නම් ඉක්මණින් එය තව භික්ෂුවකට දෙයි. බහු භාණ්ඩ පරිහරණයක් නැත.

ධූතාංග භික්ෂුවකගේ අලංකාරය මෙම අල්පේච්ඡ ජීවිත රටාවයි. උන්වහන්සේ අපවත් වන විට අෂ්ට පරිෂ්කාර පමණක් ඉතිරි වේ. එය උන්වහන්සේගේ විශිෂ්ට ජීවිතයේ ලක්ෂණයකි. ජීවිත කාලයේදී දිළිඳු ස්වභාවයෙන් විශිෂ්ට වේ. මරණයේදී කිසිම අයිතිවාසිකමක් නැතිව යයි. දෙවියන් සහ මිනිසුන් මෙම ධූතාංග භික්ෂුවගේ උතුම් ගුණයන්ට පූජා උපහාර කරති. ගෞරව කරති. තුන් සිවුරෙන් යැපීම යනු තවුස් දිවියකි. එය උන්වහනසේ සංකේතවත් වන නිල ලාංඡනය වේ.

ඉහත සඳහන් සියලුම ධූතාංග ආචාර්ය මන් ඉතා දක්ෂ ලෙස ආරක්ෂා කළේය. උන්වහන්සේ කෙතරම් දක්ෂ වූයේද යනු, එවැනි කිසිවෙක් අද ලෝකයේ විද්‍යමාන නොවෙතියි සිතිය හැකිය. තම අනුගාමිකයින්ට ද මෙසේ අති දුෂ්කර කැලෑවල වාසය කිරීමට පුරුදු කළේය. විශේෂයෙන් හුදකලාව බිය ඉපදවීමට ඉවහල් වන පරිසරයක ජීවත් වුණි. උදාහරණ මහා කඳු මුදුන්වල, ගස් යට, ගල් ගුහාවල, සුසානයේ, කඳු බෑවුම් ආදිය වාසස්ථාන විය. දිනපතා පිඬු සිඟා වැඩීම වැදගත් ධර්මතාවයකි. පිඬු සිඟා මිස වෙන අන් කිසි ආහාර ගැනීමෙන් වැළකී සිටියහ. මේ ප්‍රතිපත්තිය ගමේ මිනිස්සු තේරුම් ගත් විට සියලුම ආහාර පාත්‍රයට බෙදති. අතිරේක ආහාර අසපුවට ගෙන යාමක් නැත. උන්වහන්සේ එම ආහාර එකට කලවම් කර අනුභව කිරීමට උපදෙස් දුනි. තම පාත්‍රය හැර අන් භාජනයකින් ආහාර වැළඳීමක් නැත. තවද ජීවිතාන්තය දක්වා දවසට එකම ආහාර වේලක් ගැනීමට තම අනුගාමිකයන් හා උන්වහන්සේ පුරුදු කළහ. මෙය ජීවිතාන්තය දක්වා රැක්ක ධූතාංග වේ. ක්‍රම ක්‍රමයෙන් තම සංචාරණ ක්ෂේත්‍රය පුළුල් විය. ආචාර්ය මන් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ බෙහෙවින් ගමන් කළහ. සෑම තැනකදීම අනුගාමිකයෝ එක් රොක් වෙති. භික්ෂූන් වහන්සේලා අධික සංඛ්‍යාවක් උන්වහන්සේ වැඩ සිටින තැනට පැමිණ උපදෙස් ලබමින් භාවනා යෝගී වූහ. තාවකාලික කුටිවල සංඝයා 60-70 නමක් වෙසෙති. තව බොහෝ අය අවට ප්‍රදේශයේ ලැගුම් ගති. ආචාර්යය මන් තම ශිෂ්‍යය භික්ෂූන් එකිනෙකාට ඈතින් වාසය කිරීමට උනන්දු කළේය. එහෙත් අවශ්‍ය වූ විට උන්වහන්සේ කරා ඒමට දුර නොවේ. නිතරම භාවනා උපදෙස් පිණිස උන්වහන්සේලා පැමිණෙති. මේ සංවිධානය සියල්ලන්ටම සැනසුම් දායක විය. බොහෝ භික්ෂූන් එකම ස්ථ ානයේ විසීම භාවනාවට පළිරෝධයකි.

උපොසථ දිනයන්හි පොහොය කිරීමට අවට සිටින සියලුම භික්ෂූන් වහන්සේලා උන්වහන්සේ ගේ අසපුවට පැමිණෙති. පොහොය කිරීමෙන් පසු උන්වහන්සේ ධර්මය දේශනා කරති. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රශ්න, ගැටළු, නිරාකරණය කරති. සැමගේ සියලු සැක බිය දුරු කරති. සැවොම මහත් සේ සතුටට පත්වෙති. ඉන්පසු තම තමනගේ කුටිවලට නික්ම යති. ධර්මානුශාසනාවෙන් පසු භාවනා කර්මස්ථාන තව තවත් සාර්ථක විය. භාවනාව ප්‍රබෝධමත් විය.

බොහෝ භික්ෂුන් වහනසේලා සිටියත් උන්වහන්සේගේ ප්‍රතිපත්ති අනුග මනය කරණ බැවින් කිසි ගැටුමක් නොවීය. තම තමන්ගේ විමුක්තිය පිණිස සැවොම දිරි වැඩූහ. උන්වහන්සේගේ අනුශාසනා පරිදි සාමූහික සමගි, සංඝයා තෘප්තිමත් විය. කිසිවෙක් මෙම ආරණ්‍යයේ වෙසෙත් දැයි නොදැනේ. තම තමන්ගේ කාර්‍යය භාරයේ සැවොම හුදකලාව වාසය කරත්. පරිසරය නිහඬය, හිස්ය. දානය පිණිස පිණ්ඩපාත කාලයේදී හෝ යම් දේශනයක් නිසා පමණක් භික්ෂූන් දකින්නට ලැබේ. සෑම භික්ෂුවක්ම දවස පුරා මහා වනාන්තරයට පිවිස සක්මන් භාවනාවේ හෝ බද්ධ පර්‍යංකයේ හෝ භාවනාවේ නිරත වේ. මෙය රෑ දවල් නොකඩවා සිදුවේ. සවස රෑ බෝ වන විට ආචාර්ය මන් සියලුම භික්ෂූන් වහන්සේලා කැඳවා ධර්මය දේශනා කරති. එහි නිහඬතාවය පුදුමයකි. ආචාර්ය මන් ගේ කථා ශබ්දය පමණි අන් කිසි ශබ්දයක් නැත. ඒ දේශනා ශෛලීය ආකර්ශනීය වේ. සමහරවිට කවි, ගාථා ස්වරූපයකි. අසා සිටි අය සමාධි ගත වේ. තමා ඉන්නේ කොහේදැයි නොදනිති. දුක්, වේදනා ශාරීරික ආබාධ කිසිවක් නැත. ධර්ම දේශනා එතරම් පැහැදිලිය. සිත අලවා ගති. ධර්මය අසනවා මිස වෙන කිසි සිතක් පහළ නොවේ. කෙතරම් ඇසුවත් තෘප්තිමත් නොවේ. එය එතරම් සැප වින්දනයකි. මෙම දේශනා පැය ගණන් දිගට පැවැත්වේ.

මේ ධූතාංග භික්ෂූන් වහන්සේලාට ධර්ම ශ්‍රවණ භාවනකි. තම ආචාර්ය වරයාට අසීමිත භක්තියක් ඇත. උන්වහන්සේගේ පරතොඝෝස ප්‍රත්‍යය ඉතා අගය කරති. උන්වහන්සේගේ තදබල විවේචන නීති. අවවාද, දොස්, පරොස් සියල්ලම එම භික්ෂූන් වහන්සේලාට භාවනා කමටහනකි. එය ජීව රුධිරයකි. තම ගෞරව භක්තිය අසීම්තය. ජීවිත පූජාවෙන් පිළිගනිති. බුද්ධ කාලයේදී ආනන්ද හිමියන්ගේ චරිතය මෙනි. උන්වහන්සේ මත් වී එන හස්තිරාජයා ඉදිරියට පැන බුදුරජාණන් වහන්සේ ආරක්ෂා කළේ තම ජීවිත පූජාවෙනි. තම ගුරු ගෞරවය නිසා දිවි පිදීමට සමත් වෙති

ධූතාංග භික්ෂුවක් ආචාර්ය මන්ගේ දේශනා ඉතා සාවධානව අසා සිටියේ දරාගෙන, ක්‍රියාත්මක කරති. එක් භික්ෂුවකට යම්කිසි ගල් ගුහාවකට යන්ට උන්වහන්සේ නියෝග කළ විට එය හිස් මුදුණින් පිළිගන්නේ තම දියුණුව ඒකාන්තයෙන් සැලසෙන බව දන්නා බැවිනි. කිසිවෙක් උන්වහන්සේගේ වචනයට

අකීකරු වන්නේ නැත. එය ඒ ආකාරයෙන් කිරීමට බිය නැත. තමාගේ ආරක්ෂාව ගැන නොසිතති. එය ආශිර්වාදයක් ලෙස පිළි ගනිති. සියලු අවවාද සතුටින් පිළිගනිත්. යම් ස්ථානයකට යාම තමාගේ ජයග්‍රහණය ලෙස සළකති. ආචාර්ය මන් කියන ස්ථානයට යාම නිසා තමාට නිවන් සාක්ෂාත් කළ හැකි වේයැයි දනිති. බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන්ට තව තුන් මසකින් ඔබ සියලු කෙළෙස් දුරු කර උතුම් අර්හත්වයට පැමිණෙන බවට අනාගත වැකියක් ප්‍රකාශ කර ඇත. ගුරු භක්තිය නිසා තම භාවනා මනසිකාරය පිළිබඳ කිසි සැකයක් නැති වේ. භාවනාව උනන්දු කරයි. ස්ථිර ලෙස රඳවා තැන්පත් කරයි. ගුරුවරයා සමඟ සමීප සම්බන්ධයක් ඇති කරයි. එකම දෙය දෙතුන් විටක් කීමෙන් වෙහෙස නොවේ. එක් විටක් කීම සෑහේ.

උතුරු නැගෙනහිර බලා ආචාර්ය මන් දෙවෙනි වතාවට යාම ඒ පළාතේ සියලු දෙනාට මහත් භාග්‍යයක් විය. උන්වහන්සේ බොහෝ සෙයින් පා ගමනින් ගමන් කරමින් දේශනා පැවැත් වූහ. නකොන්, රච්ජසිමා, සී සකෙත්, උබොන රච්ජතානි. නකෝන් ෆැනොම්, සකොන් නබොන්, උදොන් තාහි, නොං බයි, ලොඉ ලොම් සක්, ෆෙචබුන් ආදී ප්‍රදේශවල නිතර සංචාරය කළහ. මිකොං ගඟ තරණය කර ලාඕස් රටට පිවිස වියෙන්ටියානෙ සහ ථා බෙක් නගරවලට වැඩියහ. එහි ඝන වනාන්තර වල වස් විසූහ. මෙම කඳුකරය ධූතාංග භික්‍ෂූන්ට ඉතා යෝග්‍යය වේ. අද දක්වාත් එහි ධූතාංග භික්‍ෂූහු වැඩ වෙසෙති.

වියළි කාලගුණය ඇති විට භික්‍ෂූන් වහන්සේලා නිදා ගත්තේ කුඩා බම්බු වලින් සෑදු මැස්සක එළි මහනේය. බම්බුව දෙකට පලා දික් අතට රාමුවක් මත සවි කළහ. කකුල් අඩි එකහ මාරක පමණක් උසය. දිග අඩි හයක් පමණි. පළල අඩි හතරක් පමණි. මෙම මැස්ස අන් භික්‍ෂූන්ගේ මැස්සෙහි සිටි හැකිතාක් දුර වේ. විශාල ඝන වනාන්තරයෙන් අතර ප්‍රදේශය වැසී ඇති බැවින් හුදකලා ජීවත් වීමට සුදුසු වේ. කැලෑව ස්වාභාවික ආවරණයකි. භික්‍ෂූන්ගේ සංඛ්‍යාව වැඩි නම් අතර ප්‍රමාණය අඩි සීයක් පමණ විය යුතුය. කිඹුහුම් ශබ්දයක් හෝ කහින ශබ්දයක් යන්තම් ඇසීමට හැකි තරම් දුරවේ. මේ නිදන මැස්ස අසල අඩි හැටක් පමණ සක්මන් මළුව ඇත. මෙහි රෑ දවල් දෙකේ සක්මන් භාවනාවේ යෙදෙති.

කොටින්ට හෝ හොල්මන් වලට භය ඇති භික්‍ෂූන් පැමිණි විට ආචාර්ය මන් උන්වහන්සේලාට හුදකලාව විසීමට නියම කරති. කිසිවෙක් අසලක නැති බැවින් භය ත්‍රස්ත වීමට ඉඩ ඇත. එවිට ඒ භය භාවනා අරමුණකි. එම අරමුණ ගැන බොහෝ වේලා භාවනා කරමින් අරමුණ පැහැදිලි වූ විට භය පහ වේ. භය සංඥාව හඳුනා ගනී. එහි ලෝභ, ද්වේශ, මෝහ අකුසල් දකී. එහි අනිත්‍ය දුකත්, අනාත්ම ස්වභාවයක් අවබෝධ වූ විට භය පහ වේ. මෙසේ මේ කැලෑ

පරිසරයට පුරුදු වන තාක් එහිම රැඳී සිටිය යුතුයි. එවිට තමා කොටි හෝ හොල්මන් සංඥාවට රැවටී සිටින බව පැහැදිලි වේ. මෙම පුහුණුවෙන් පසු අන් භික්ෂූන් මෙන් සාර්ථක ප්‍රතිඵල ලැබේ. එවිට ''භය'' සඳහටම තුරන් වේ. යම් භික්ෂුවක් මෙවැනි පුහුණුවක් ලැබීමෙන් දියුණුවට පත්වේ. එම භය ඉක්මවා ගැනීමට කිසි පිළියමක් නැත්නම් භය ඉක්මවිය නොහැකිය.

ධූතාංග භික්ෂුවක් පළමුවෙන්ම කැලෑවට පැමිණිවිට බිම නිදාගත යුතුය. වියළි රොඩු, කොළ, පිදුරු එකතු කර ගුදිරියක් සාදා ගනිති. දෙසැම්බර, ජනවාරි මාස ඉතා දුෂ්කරය. සීතල සහ වර්ෂාව නිසා මේ කාලයේ වැස්සෙන් භික්ෂූන් වහන්සේලාගේ තෙත් වූ සිවුරු පිරිකර ඇත. සමහර විට එළිවන තුරුත් වැස්ස නොකඩවා හැලේ. ලොකු කුඩයකින් සාදාගත් කූඩාරම තද කුණාටු සහිත වැසි සුළං වලින් කැඩී බිඳී යයි. ශීතලේ ගැහි ගැහී සිටීමට සිදුවේ. වෙන කිසි ආවරණයක් නැත. තද ගනඳුරේ කිසිවක් නොපෙනේ. දවල් කාලයේ වර්ෂාව තරමක් ඉවසිය හැකිය. වැස්සෙන් තෙමුන නමුත් අවට පරිසරය පෙනේ. යම්කිසි ආවරණයක් ගස් අතු ආදියක් හෝ සොයා ගත හැකි බැවිනි. අත්‍යවශ්‍ය තම චීවරය සහ ගිනිපෙට්ටිය පාත්‍රය තුළ බහා ඇත. එය පියනින් තදකර වසා ඇත. උත්තරා සංඝාටිය දෙකට නවා ශරීරය වටා ඔතා ගනිමින් තෙතමනය ශීතල දුරු කිරීමට දිරි දරයි. කපු වලින් සෑදු මදුරු දැල සාමාන්‍යයෙන් කූඩයෙන් සෑදු කූඩාරමේ එල්ලා ඇත. මෙය තරමක් දුරට වර්ෂාව බැහැර කරයි. එනමුත් මුළු ගතම තෙත් වේ. පාන්දර පිඬු පිණිස වැඩීමට වියලි සිවුරක් නැත.

පෙබරවාරි, මාර්තු, අප්‍රේල් කාලගුණය තරමක් හොඳ අතට හැරේ. මේ කාල සීමාවේදී ධූතාංග භික්ෂූන් කඳුකරය කරා යති. එහි ඇති ගල් ගුහා, කඳුවැටි වල ආවරණය තුළ ලැගුම් ගනිති. මේ කඳු මුදුන් දෙසැම්බර් ජනවාරියේදී තෙතමනය නිසා මැලේරියා මදුරුවන්ගෙන් ගහණ වේ. මැලේරියා රෝගය සුව කිරීම දුෂ්කරය. මාස ගණනාවක් රෝග ලක්ෂණ පවතී. එය අසාධ්‍ය තත්ත්වයට පත් වී වරින් වර තද උණ ගනී. ගමේ මිනිස්සු මේ අසාධ්‍ය තත්ත්වයට ''නැදි මයිලන්ගේ අපහාස උණ'' යයි කියති. මක්නිසාද යත් රෝගියා ආහාර අධික ලෙස ගනී නමුත් උණ නිසා කිසි වැඩක් කළ නොහැකිය. එහෙයින් නැදි මයිලන් - නෑදෑයින්ගේ අපහාසයට ලක්වෙති. නැදි මයිලන් පමණක් නොව සියලු දෙනාගෙ ්ම අපහාසයට ලක්වෙති. මේ ලියන මම ද කීප වතාවක් මෙම රෝගයට පත්විය. ඒ කාලයේ මැලේරියාවට බෙහෙත් සොයාගෙන නැති බැවින් ප්‍රතිකාර නොමැතිව රෝග කාලය ඉක්මවන තෙක් විඳ දරාගත යුතුයි. ආචාර්ය මන් ඇතුළු සියලු ධූතාංග භික්ෂූන්ට මෙය වැළඳුන බව උන්වහන්සේ පවසා ඇත. සමහරු එම රෝගයෙන් ජීවිතක්ෂයට පත්විය. මෙම කථා පුවත් ඇසීමෙන් උන්වහන්සේ සහ අනිකුත් භික්ෂූන් වහන්සේලා කෙරෙහි අසාමාන්‍ය මෛත්‍රිය, කරුණාවක් හට ගනී. ආචාර්යය මන් තම ජීවිත අරමුණ වූ උතුම් අර්හත්වය සාක්ශාත් කිරීමට

පළමු මෙම රෝගය වැළඳී මරණාසන්න විය. එසේ අපවත් වූයේ නම් අද මේ සද්ධර්මය අපට අහිමි වේ. උන්වහන්සේගේ අති උතුම් ප්‍රතිපත්ති ගෙන යාමට නොහැකි වේ.

## ගම්බද සිරිත් සහ ඇඳහිලි

ආචාර්ය මන් සහ ආචාර්ය සාඕ මෙම පළාතේ සැරි සැරීමට පෙර ගම් වාසීන් කර්ම විපාක හෝ කුසල් අකුසල් පිළිබඳ දැන නොසිටියහ. උතුරු නැගෙනහිර ප්‍රදේශයෙහි භූත වන්දනාව හා අමනුෂ්‍ය වන්දනාව පැතිරී පැවතුණි. යම් දෙයක් පටන් ගැනීමට පෙර නැකැත් බැලිය යුතුය. වී වගා කිරීම, ගෙයක අත්තිවාරම හෝ මැටි මැස්සක් හෝ යම් දෙයක් ආරම්භ කිරීමට ප්‍රථම නැකත, දිනය, වර්ෂය ආදිය සුදුසු විය යුතුය. නොයෙක් පුද පූජා පවත්වා දෙවියන්ට අමනුෂ්‍යයන්ට යාඥා කළ යුතුය. එය නොකළහොත් රෝග වැළඳීම හෝ නොයෙක් ව්‍යසනයන්ට පත්වෙත්. සෙම්ප්‍රතිෂ්‍යා උණ වුවද අමනුෂ්‍යය දෝෂ නිසා හටගත් බව ඔව්හු විශ්වාස කරති. එවිට ගමේ කට්ටඩි මහතා අවුත් නොයෙක් පූජා කර සමාව අයදී. එවිට රෝගය සුව වී ඇති බව කියති. එහෙත් රෝග ලක්ෂණ තිබියදී වුවද ලෙඩාට මානසික සුවයක් ඇත. තමා නිරෝගි යැයි පිළිගනී. කට්ටඩි මහතාගේ අවසාන තීරණය ඔව්හු පිළිගනිති. වෛද්‍යවරු අනවශ්‍ය වේ. ලෙඩ සුව වන්නේ පුද පූජා වලිනි. මේ මිනිස්සු, මෙවැනි විශ්මිත මත දරති. එය විශ්වාස කරති. පසු කාලයකදී ආචාර්ය මන් සහ ආචාර්ය සාඕ ගමේ මිනිසුන්ට සත්‍ය කියා දුන් විට ක්‍රමයෙන් භූත බලවේග, අමනුෂ්‍ය දෝෂ ගැන විශ්වාසය තුරන් විය. අද එවැනි අදහස් දරන්නන් කිසිවෙක් නැත. එම කට්ටඩි මහත්වරු පවා බුද්ධ, ධම්ම, සංඝ සරණ යති. එවැනි ගුප්ත විද්‍යා නොඅදහති. එම ගම්මාන තුළින් කැලෑවේ යන එන විට එකල මෙන් දොළ පිදේනි තටු දක්නට නැත. ඉතාම කළාතුරකින් එවැන්නක් දක්නට ලැබේ. උතුරු නැගෙනහිර වාසීහු දැන් බොහෝ සෙයින් බුද්ධ, ධම්ම, සංඝ සරණ යති. මෙය ආචාර්ය මන් සහ ආචාර්ය සාඕ මේ ප්‍රදේශයේ සංචාරය කරමින් බණ භාවනා කියා දීම නිසා වූ බව නිසැකය.

උන්වහන්සේලා නිතර නිතර ශිෂ්ට ගුණ ගරුක මිනිසත් භාවය පිළිබඳ ධර්ම දේශනා කළහ. ඔවුන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු දුන්හ. බොහෝ බිය සැක පැවතුණේ අමනුෂ්‍යය, හොල්මන්, යක්ෂ ආවේශ ආදී ගුප්ත දේ පිළිබඳවය. ස්ත්‍රී, පුරුෂ අතර ලිංගික ආකර්ෂණය ඇති වන්නේ කෙසේද ? සතුන් අතරත් මෙවැනි සිද්ධීන් ඇත. මිනිසා මේ දේ දැන ගන්නේ කෙසේද ? ඒ ඇසූ අනන්ත ප්‍රශ්න මට සිහි කිරීමට නොහැකිය. ඒ පිළිබඳ සමාව අයදිමි. ආචාර්ය මන් පැවසූ මෙවැනි

කරුණු බොහෝ වෙති. ඒ සියල්ල ලිවීමට මම අපොහොසත් වෙමි.

අමනුෂ්‍ය අවතාර සිටිත්දැයි ඇසූ ප්‍රශ්නයට ආචාර්ය මන් මෙසේ උත්තර දුනි. ''අමනුෂ්‍යය, හොල්මන් අවතාර හෝ වෙන යම්කිසි දේ මේ ලෝකයේ පැවතීම අපේ විශ්වාස මත සිදු නොවේ. අපි විශ්වාස කළත් නොකළත් ඒ දේ ඒ ආකාරයෙන් පවතී. අපේ සිතිවිලි අනුව එය වෙනස් නොවේ. ඒ අමනුෂ්‍යයන් ගැන බිය සැක ඇතිවන්නේ අපේම මනස තුළය. එය අපිම මවා ගන්නා දෙයකි. අපිම ඒ බිය සැක උපදවමු. මේ නිසා අමනුෂ්‍යයෝද බිය සැක වෙති. එවිට එවැනි උපද්‍රව ඇතිවිය හැකිය. යමෙක් හොල්මන් ගැන නොසිතීම නිසා ඔහු තුළ එවැනි සැක බිය නැත. වැඩිපුරම වන්නේ තමන් සිතින් මවාගත් අදහස් නිසා තමාම පීඩනයට පත්වීමයි. අමනුෂ්‍යයෝ සිටිතියි මා කීවත් එය ඔප්පු කිරීමට නොහැකිය. මිනිසාට සත්‍යය දැකීමට නොහැකි වෙයි. සොරෙක් බඩු සමඟම අල්ලා ගත්විට වුවද එය නොපිළිගනියි. ඊට නොයෙක් හේතු, නිදහසට කරුණු ඉදිරිපත් කරයි. තමා නිවැරදි යයි පවසයි. ඔහුට බලෙන්ම දඬුවම් පමුණුවන්නේ ලෝක නීති නිසා වේ. ඔහු නැවත නැවතත් තමාගේ නිදොස් බව කියයි. බන්ධනාගාර ගත සොරෙකුගෙන් ඇසුවහොත් තමන් සොරකමට අසුවූ බවත් තමන් එය නොකළ බවත් පවසයි. එය තමා කළ බව පිළිගන්නේ ඉතා කලාතුරකිනි. මෙය ලෝකයේ මිනිසුන්ගේ සාමාන්‍ය සිරිතයි. මිනිසුන් මේ ලෝකයට එන්නේ කොහේ සිට දැයි ඇසූ ප්‍රශ්නයට ආචාර්ය මන් මෙසේ පිළිතුරු සපයයි.

''හැම මිනිසාටම මවක් හා පියෙක් ඇත. ඔබ ඉබේම ගස් බෙනයක් තුළින් හට ගන්නේ නැත. මිනිසා උපදින්නේ අවිද්‍යා, තණ්හාව නිසා යැයි කීවත් එය මනස විකෘති කරනවා මිස ඔව්හු සත්‍යයක් නොදකිත්. මෙය අවබෝධ වන්නේ රහතුන් වහන්සේලාට පමණි. මිනිසා මේ සත්‍යය සෙවීමට අවශ්‍ය වීර්‍යය යෙදීමට අසමත් වේ. එබැවින් ''දෙමාපියන් නිසා අප ඉපදී ඇතැ''යි විශ්වාස කරති. මෙහි සත්‍යය වටහා ගැනීමට මිනිසා තුළ අවශ්‍යතාවයක් නැත. සත්‍යය දැන ගැනීමට කැමැත්තක්ද නැත. අවිද්‍යා පච්චයා සංඛාරා.... ආදී වශයෙන් පටිච්ච සමුප්පන්න කරුණු බුදු දහමේ විස්තර කර ඇත. ඉපදීම නිසා මේ සියලු දුකට පත්වේ. ඉපදීම නැතිවීම දුක නැතිවීම වේ. අවිද්‍යාව නිසා ඉපදීම හටගනී. කෙළෙස් ඇති හැම දෙනා තුළම මේ අවිද්‍යාව අනිවාර්යයෙන්ම ඇත. සත්‍යය අවබෝධ වූ විට මේ අවිද්‍යාව නැතිවේ. මේ සත්‍යය අවබෝධය සියලු දුක් නැසීමට හේතු වන බව පිළිගත යුතුවේ. මේ අවිද්‍යාව නිසා සියලු සත්ත්වයන් උපදී. ලෝකය සත්ත්වයින්ගෙන් ගහණය. සතුන් නැති තැනක් නැති තරම්ය. ජීවත් වීමට ඉඩකඩ නැති තරම්ය. මූලික හේතුව මේ තණ්හා අවිද්‍යාවයි. අපි දැන් නොමැරී සිටින නමුත් නැවත ඉපදීමට නිතරම තව ස්ථානයක් සොයමින් ජීවිතය ගෙනි යන්ට සිතමු. මේ නිසා සතුන් සහ මිනිසුන් නිතර දුකට පත්වෙති. සත්‍යය දැකීමට කැමති අය තම කෙළෙස් සහිත සිත දැකිය යුතුයි. සිත නිතරම භවයක් අල්ලා ගැසීමට

තණ්හාව උපාදානය ඇති කරයි. ඒ නිසාම භවයක් ලැබේ. තමා අසා කරණ දේ ලැබේ. සිත වනාහි ලෝකයේ විද්‍යාමාන වන ඉතාම චපල, මානාධික තත්ත්වයකි. මේ සිත දඩබ්බරය. හික්මවීමට අපහසුය. අපි කෙතරම් හොඳ දේවලට යොමු වීමට උත්සාහ කළත් මේ මොහොතින් මොහොත වෙනස්වන සිත හා එහි හට ගන්නා මානය හැම ප්‍රයත්නයක්ම වලක්වයි. නැවත ඉපදීමට බල පාන්නේ මේ කෙලෙස්වලට පත් වූ අසංවර සිතයි. අවිද්‍යා තණ්හා දුරු කිරීමට අකමැති වන්නේ එසේ දුරු කළ පසු නැවත නූපදින බැවිනි. ජීවිතය පවත්වා ගැනීම යනු සංසාරය යැයි කියනු ලැබේ. ආචාර්ය මන් ගෙන් ඇසූ ඊළඟ ප්‍රශ්නය නම් ලිංගික ආශාවන් ඇති වන්නේ මක් නිසාද යන්නයි. ඊට පිළිතුරු මෙසේ පවසා ඇත. ''රාග තණ්හාව ගැන පොත පතින් ඉගෙනීමක් නැත. රාග තණ්හා යනු තම සිතේ පවතින විලි ලැජ්ජා නැති දඩබ්බර ස්වභාවයකි. මේ අශික්ෂිත, ග්‍රාම්‍ය ගතිය ඇති සිත නිසා ස්ත්‍රී, පුරුෂයන්ගේ වචනය හා ක්‍රියාවද එවැනි අශික්ෂිත බවට පෙරළේ. ස්ත්‍රී, පුරුෂ, තිරිසන්, සත්ත්ව ආදීන්ට මෙය ස්වාභාවිකය. සමාජ, ජාති, වයස ආදී සීමා නැත. සිත කාමරාගයෙන් අසංවර වූ විට එය සීමා ඉක්මවා යයි. ගඟ පිටාරේ ගලන්නාක් මෙන් සීමා ඉක්මවා යයි. ගම් නියම් ගම් නගර නිම්න යට කරගෙන ගංවතුර ගලා යන්නාක් මෙනි. රාගික සිතිවිලි මිනිසාගේත් තිරිසනුන්ගේත් සිතේ පදිංචි වීමට හේතුව ඊට අවශ්‍ය ප්‍රබල ආධාර, උනන්දුව, ආස්වාද, පෝෂණය අවට පරිසරයෙන් ලැබෙන බැවිනි. එබැවින් නිරන්තරයෙන්ම ආස්වාද රතියට ගොදුරු වේ. මේ ස්වභාවය නිසා මුළු ලෝකයම දැඩි දුක් වලට භාජනය වේ. මින් මිදීමට කිසිවෙක් උනන්දු නොවේ. ගංගා පිටාරය ගලා යන ගංවතුර නිසා මිනිසාට හානි වන්නේ කලාතුරකිනි. එහෙත් රාග, තණ්හාව නිතරම පිටාර ගලමින් දුකට පත්වෙනවා දැක දැක මිනිසා තම සිත් සතන් සහ අනිකුත් සියලු දේ විනාශ වීම ගැන නොසිතති. මෙය අවුරුද්ද පුරාම ගලන ගංගාවකි. ලෝකය මෙතරම් දුෂ්ට, අවිනීත වීමට හේතුව මිනිසා විසින්ම පහළ කරණ මේ රාග තණ්හාව බව කිසිවෙක් නොදනිති. මේ රාග තණ්හාව නිසා මෙවැනි අපරාධ දිගටම සිදුවන බවත්, ඊට හේතුව මේ රාග සිතිවිලි බවත් මිනිසා පිළිගන්නේ නැත. එය පිළිගන්නා තුරු මිනිසාගේ අසහනය දුක පහ නොවේ.

උන්වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නය වූයේ මෙසේ ලිංගික ආස්වාද ලැබීමට හේතුව කුමක්ද යන්නයි. එහෙත් පිළිතුරු ලැබුණේ ඉන් සිදුවන භයානක තත්ත්වය පිළිබඳවය. බොහෝ අය මේ පිළිබඳ අසන්නේ නැත. මේ රාග තත්ත්වය සිතේ ඇතිවන විට ස්ත්‍රී, පුරුෂ, තිරිසන් ගත සතුන් පවා එකිනෙකාගෙන් ආස්වාද ලබති. මේ රාග තණ්හාව තරම් අන්‍යෝන්‍ය ආස්වාදය මෙන්ම අනෝන්‍යය කෙ-ප්පාවිෂ්ඨ වන වෙන දෙයක් නැත. රාග තණ්හාව වංචනික ස්වභාවය නිසා ස්ත්‍රී පුරුෂයෝ ආලයෙන් බැඳ තබති. බොහෝ විට තරහ, වෛරයෙන් බැඳ තබති. එකිනෙකා ගහ බැන ගනිති. මරා ගනිති. රාග සිතිවිලි නිසා මෙසේ ආලය බඳිති.

වෛරය බඳිති. රාග සිතිවිල මිනිසා පොළඹවති.

ආචාර්ය මන් මෙසේ ප්‍රකාශ කළහ. ඔබ අතර එකිනෙකා තරහා වී ගහ බැන ගන්නේ නැද්ද ? විවාහ වීමට පෙර සිට ආදර බැඳීමෙන් සිටි නමුත් දැන් ස්වාමි භාර්‍යා වශයෙන් කෙතරම් අසහනයට පත් වන්නේද ? අපි වැනි භික්ෂූන් වහන්සේලාට වඩා ඔබ මේ කරුණු දන්නවා ඇත. එහෙත් ඔබ අපෙන් අසති. එවිට ''එසේය, අපි රණ්ඩු දඹර කර සීමාවක් නැතිව දුක් විඳ දුක ඉවසන්නට බැරි නිසා තමයි රණ්ඩුව නවත්වන්නේ. නැවත රණ්ඩු නොකරන්නට තීරණය කරමින්, නමුත් නැවතත් එවැනිම රණ්ඩු දබර වලට පත්වෙනවා.''

ආචාර්ය මන් මෙසේ පැවසීය ''මේ තමයි ලෝක ස්වභාවය. එක මොහොතක් ආදරය ඊළඟට තරහව, වෛරය, ඔබ මෙය වැරදි බව දැන ගත්තත් ඉන් මිදීමක් නැත. ඇත්තෙන්ම මේ ගැටළුව විසඳන්නට ඔබ උත්සාහ ගත්තේද? එසේ නම් මේ තත්ත්වය ටිකක් සහනදායී වෙනවා. එසේ නැත්නම් තුන්වේල නොවරදවා කෑම කන්නාක් මෙන් උදේත් රණ්ඩු කරනවා, දවාලෙත් රණ්ඩුව, රාත්‍රියෙත් රණ්ඩුව මුළු දවසම රණ්ඩු කරනවා. බැරිම තැන දික්කසාද වෙනවා. තම ලා බාල දූ දරුවන්ට අපමණ දුක් සළසනවා. මේ නරක කර්මවල ප්‍රති විපාක අහිංසක දරුවනුත් විඳිනවා. එහි ලැජ්ජාව නිසා නෑ මිතුරන් අත් හරිනවා. දෙගොල්ලොම රණ්ඩු කිරීමේ ආදීනව දුටුවිට වාද භේද හටගත් සැණින් එය නවත්වා ගත යුතුයි. ඒ වේලෙහි ම විශාල රණ්ඩුවකට තුඩු දෙන වාද විවාද දොස් පරොස් කථා බහ නැවතීමට පුරුදු විය යුතුයි. දිගින් දිගට යාම වළක්වා ප්‍රශ්නය ඉවසීමෙන් සැනසීමෙන් කාලයාගේ ඇවෑමෙන් නිරාකරණය කළ යුතුයි. කෝපය, පරුෂ වචන, නොරුස්නාගති ඇති වූ වහාම එය භයානක උවදුරක් ලෙස දැක තමන් අතීතයේ සුහදව සිටි බවත් අනාගතයේ සුහදව සිටිය යුතු බවත් සළකන්න. මේ ක්ෂණික උපන් කෝපය නිසා මුළු ජීවිතයට හානිකර ගන්නේ ඇයි ?

පවුල් ප්‍රශ්න ගැටළු බොහෝ විට ඇති වන්නේ තමාගේ තනි කැමැත්ත අනුව තීරණ ගැනීම නිසාය. මෙය හරිද වැරදිද යන්න ගැන නොසළකා හිතු මතයේ අනුන්ට දුක් පීඩා ගෙන දෙන තීරණ තමාගේ ආත්මාර්ථකාමීත්වය නිසා ගනිති. මමත්වය බලපුළුවන්කාර කම නිසා අනුන් පෙළෙති. මානය, තද ගතිය නිසා අවශේෂ පවුලේ සාමාජිකයෝ දුකට පත්වෙති. මුළු ලෝකයම තම අත් අඩංගුවට පත් කිරීමට ලෝක නායකයෝ මාන බලති. මහා සාගරය අතින් තල්ලු කර නවත්වන්ට ගන්නා වෑයමක් මෙන් මෙය නිශ්ඵලය. එවැනි බලකාමී අදහස් තුරන් කළ යුතුය. එවැනි අදහස් ඇති පුද්ගලයා තමාම වැනසේ. පවුලේ සාමාජිකයින් අතර කිට්ටු සම්බන්ධතා ඇති බැවින් සාධාරණය, සමගිය, එකඟත්වය ඇතිවිය යුතුය. පවුලේ ස්වාමි, භාර්‍යයා, දූ දරු, සේවක පිරිස මෙ-

සේ අන්‍යෝන්‍ය ආදරය, ගෞරවය තහවුරු නොකළහොත් එහි දුර්විපාක තමන් කෙරේ පැමිණේ.

ගිහි අනුගාමිකයින් හා භික්ෂූන් වහන්සේලා විශාල සංඛ්‍යාවකට උන්වහන්සේ දේශනා පවත්වන විට වෙනත් කාල සීමා ඇත. ගිහි අයට 4-5 දක්වාද භික්ෂූන්ට 7 සිට රාත්‍රී කාලයේද දේශනා කරති. භික්ෂූන් වහන්සේලාට සහ සාමණේරයන්ට හා යම් භාවනා දියුණුවක් ඇති අයට උන්වහන්සේ විශේෂ සැලකිලි කළහ. පුද්ගලිකව උපදෙස් දුනි. එකිනෙකාගේ චරිත බෙහෙවින් වෙනස් බැවින් භාවනා අත්දැකීම් වෙනස් වේ. සමහරු තම සිත පිළිබඳ අසති. සමහරු දෙවිවරු ආදී නොයෙක් සංඥා පිළිබඳ අසත්. චිත්තජ රූප, නිමිති භාවනා යෝගීන් දකිති. මිනිසුන්, සතුන් තම ඉදිරියේ මැරී සිටිනවා ආදී නොයෙක් දර්ශන ගැන කථා කරති. තම ශරීරය පවා මැරී කුණු වී, විනාශ වීම දකිති. මේ නිමිති ස්වාභාවිකද ? නැතහොත් එහි විශේෂ අර්ථ ඇත්දැයි මුලදී හඳුනා ගත නො-හැකිය. මේවා ගැන මුලාවට පත්වීමට හැකිවේ. එබැවින් භාවනා කර්මස්ථාන ආචාර්යවරයාගේ උපදෙස් අවශ්‍ය වේ.

මේ අත්දැකීම් විස්තර කිරීම හා එහි අර්ථ නිරූපණය කරමින් උපදෙස් දීම ඉතාම සිත් ප්‍රබෝධකරන දෙයකි. භික්ෂූන් වහන්සේලා මෙම කාලය බොහෝ අගනා බව දනිති. ශ්‍රද්ධාව, බුද්ධිය, වීර්යය වැඩීමට අවශ්‍ය උපදෙස් ලබන බැවිනි. හදවත සමාධියෙන් ''නාභිගත'' වේ. මේ අත්දැකීම් අසා සිටින අනිකුත් අයට මෙය විශාල උද්‍යෝගයකි. අත්දැකීම් ඇති අය සතුටට පත්වේ. සිත මෙසේ සමාධිගත වූ විට සමහරු දේව ලෝක වලට යති. එළිවන තුරු දේව ලෝක වල දිව්‍ය මාලිගා දකිමින් සංචාරය කරති. බොහෝ වේලා ගත වූ පසු එම සිත තම ශරීර ගත වේ. එවිට සාමාන්‍ය සිතක් වේ. සමහරු අපාය ලෝකවල සං-චාරය කරත්. කර්ම විපාක ගැන බෙහෙවින් සංවේගයට පත්වේ. සමහරු දේව ලෝකවල හා අපායවල සැරිසරමින් කර්ම විපාක සිද්ධිය නිරීක්ෂණය කරති. සමහරු ධ්‍යාන සමාපත්තිවලට පැමිණේ. සමහරු නාම රූප වෙන්කර විදර්ශනා කරති. ශරීරයේ කොටස් විශ්ලේෂණය කර සතර මහා භූතයන්ට වෙන් කරති. සමහරුන්ට සමාධිය නොලැබී පොඩි දරුවන් වැටි වැටී ඇවිදින්නාක් මෙන් දුක් වී අඬති. සමහරු කිසිම භාවනා දියුණුවක් නොකරති. හොඳ දේ නොදන්නා හැන්ද මෙනි. බොහෝ දෙනා වෙහෙසන මෙම පරිසරයේ මෙවැනි දේ සිදුවීම ස්වාභාවිකය. සති, පඤ්ඤා දියුණු කරන අය එම දේශනා අනුව දියුණු වෙති. මේ පොත ලියන මම ද මෙම පුහුණුවේදී දක්ෂ නොවූ බව පිළිගනිමි. එය ඇත්තෙන්ම අප කාටත් දුෂ්කර කාර්‍යයක් විය.

ආචාර්ය මන් දෙවෙනි වතාවටත් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ අවුරුදු ගණනාවක් වැඩ විසූහ. එකම තැනක වස් තුන් මාසයක් වැඩ වෙසෙති. ඉන්පසු

අන් තැනකට යාම සිරිතයි. නිදහසේ කඳු මුදුන් ඝන වනාන්තරවල කුරුල්ලෙකු මෙන් සංචාරය කරති. ''සත්ත භරොව ඩේති'' තම පිහාටු බර පමණක් ඔසවා ගෙන යන කුරුල්ලෙක් මෙනි. කුරල්ලා කැමති තැනක ලඟියි. කැමති තැනක පියාසර කරයි. උන්වහන්සේද ගසක්, ජලාසයක්, වගුරු බිමක්.... ආදී තැන රිසි සේ ජීවත් වී පසුව හැර යති. එම ගස් ජලාස ගැන කිසිම තැකීමක් නැත. මෙසේ ධර්මයේ හැසිරෙන භික්ෂුවට මුළු වනාන්තරයම තම නිවෙසකි. හුදකලා ජීවිතය යනු සාමාන්‍ය සමාජ ජීවිතයක් ගත කරණ අයට අසීරු දෙයකි. තම ගෙවල් දොරවල් නෑ හිත මිතුරන් අත් හැරීම මුලින් දුෂ්කර වුවද ධර්මය තම හදවත ශක්තිමත්ව ග්‍රහණය කළ විට මෙය හාත්පසින් වෙනස් වේ. ඔවුහු ඝන වනාන්තර ප්‍රිය කරති. සමාජය, කම් සැප අප්‍රිය කරත්. ඔහු හැම මොතකම හුදකලාව තමා යන එන ඉරියව්වේ සිත බැඳ තබයි. කිසිම දෙයකින් සිත වික්ෂිප්ත නොවේ. ධර්මය සිතේ තැන්පත් වූ විට ලද දෙයින් සතුටු වේ. තෘප්තියට පත්වේ. තම හදවත ධර්මයෙන් ප්‍රීතියට පත් වූ විට පුදුම තෘප්තියක් දැනේ. සිතේ කෙළෙස් පහ වී මැලිකම, බිය, සැක ආදී කිසිම අවුලක් නැත. සිත තැන්පත්ය. නිශ්චලය, සාමය, සතුට රජ කෙරේ. මෙය නම් අකාලික ගුණයයි. එය කාලය, අවකාශය ඉක්මවා යයි. සම්මුති සත්‍යය ඉක්මවා යයි. මුලාව සම්පූර්ණයෙන්ම පහවේ. ආචාර්ය මන් ''සුගත'' හෙවත් හොඳ ගමනක් යන්නෙකි. තමන්ගේ හැම කාර්යයක්ම සතුටකි. සතර ඉරියව්වෙහිම සැනසීම යන, එන, හිඳින, නිදන හැම මොහොතකම සැනසීමකි. තම ශ්‍රාවකයින් මෙම මාර්ගයට යොමු කළ නමුත් මෙවැනි උසස් තත්ත්වයකට පත්වීමට නොහැකිය. එහෙත් බොහෝ අය විශාල වශයෙන් ධර්මයේ හැසිරෙන බව නිසැකය.

අචාර්ය මන් පිණ්ඩපාතය පිණිස යන විට භික්ෂූන් වහන්සේලා සමඟ බලු, කපුටු ආදී තිරිසන් සතුන් ද යති. එය භාවනා අරමුණකි. භික්ෂූන් වහන්සේලාට ධර්ම කරුණු ඒ මගින් පහදා දෙති. කර්ම විපාක ගැන පාඩමකි. සතුන්ට පවා තම කර්ම විපාක පටිසන් දෙයි. යම්කිසි සතෙක් යොමුකර ඒ පිළිබඳ විග්‍රහ කෙරෙති. ''තිරිසනුන් පහත් කොට සැළකිය යුතු නැත. ඔවුහු තම අකුසල විපාක ගෙවති. මිනිසා ද තම අකුසල විපාක ගෙවති. මනුෂ්‍යය, තිරිසන් ආදී සැවොම කුසල් - අකුසල් විපාක ගෙවති. ඒ අයට විටින් විට සැප වේදනා දුක් වේදනා විඳීමට සිදුවේ. කුකුල්, බලු, හරක් සතුන් තම විපාක ගෙවන ආකාරය කියා දෙති. ඔවුන්ගේ දුක ගැන කරුණාව උපදවති. ඒ සමඟම කර්ම විපාක වල විවිධ ස්වභාවය පෙන්වති. මේ ආත්මයේ අපි මනුෂ්‍යයන් වුවද අනන්ත ආත්ම වල තිරිසනුන් ලෙස ජීවත් වුනෙමු. මේ කර්ම න්‍යාය ඉතා ගුප්ත වේ. එය සෑම සත්ත්වයාගෙන්ම විද්‍යාමාන වුවද තේරුම් ගැනීම උගහටය. මෙය තෙරුම් ගත නොහැකි නම් අපට නිවනක් නැත. මේ ආදී වශයෙන් මග තොටේදී මුණ ගැහෙන මිනිසුන් තිරිසනුන් ගැන කර්ම විපාක සති, පඤ්ඤාවෙන් ගවේෂණය කරයි.

එය අසා සිටි සමහර භික්ෂූන්ට තීක්ෂණ ප්‍රඥාව පහල වෙයි. සමහර භික්ෂූන්ට එහි වැදගත්කම නොවැටහේ. ඒ සතුන් පසුකර ගමන් කළ බැවින් එම කාරණය අවබෝධ නොවේ. උතුරු නැගෙනහිර ප්‍රදේශයේ වාසය කරණ විට ආචාර්ය මන් මධ්‍යම රාත්‍රියේ භික්ෂූන් වහන්සේලාට ධර්මය දේශනා කරණ විට භූමාටු, ආකාශ දෙවිවරු ඈතින් සිට ධර්මය ශ්‍රවණය කරති. ඒ අය පැමිණ ඇති බව දැනුන විට උන්වහන්සේ දේශනාව විගස නවත්වා සමාධිගත වේ. එවිට පුද්ගලිකව දෙවියන් සමඟ කථා කරයි. භික්ෂූන් වහන්සේලාට ඇති අසීමිත ගෞරවය නිසා දෙවිවරු සමීප නොවෙත්. දෙවිවරු භික්ෂූන් වහන්සේලාගේ කුටි ප්‍රදේශය පසුකර ගමන් නොකරත්. මේ දෙවිවරු විශාල සංඛ්‍යාවක් උන්වහන්සේ දැකීමට අවුත් ප්‍රථමයෙන් තුන්වටක් ප්‍රදක්ෂිණාකර ඉතාම ගෞරවයෙන් පිළිවෙලට සන්සුන්ව වාඩිවෙති. එම දේව සමූහයේ නායකයෙක් සිටියි. ඔහු ඉදිරියට අවුත් තමන් අයත් වන්නේ අසවල් දේව කොට්ඨාසයටය. ඔවුන් අසවල් ධර්මය ගැන විමසති'' ආදී වශයෙන් නිවේදනය කරයි. ආචාර්ය මන් එවිට ඔවුන්ගේ ආරාධනාව පිළිගෙන සතුට ප්‍රකාශය කර තම සමාධි සිත එම ධර්මය ගැන යොමු කරයි. ඉන්පසු ඒ පිළිබඳ දේශනා කරති. අවසානයේදී තුන් වරක් සාධු නාද පවත්වති. මෙම නාදය විශ්වයේ ඉතා ඉහළ දෝංකාර දෙයි. දිව, කණ ඇති සියලු දෙනාට මෙම නාදය ඇසේ. එහෙත් මිනිසගේ කන්වලට නොඇසේ. හොද්දේ රස නොදන්නා හැන්ද මෙනි. අන්තිමේදී නැවතත් මේ දෙව් කැළ තුන් වටක් දකුණින් ප්‍රදක්ෂිණා කර පුළුන් රොදක් මෙන් අහසේ නොපෙනී යති. මේ අයගේ අති ප්‍රසන්න හැසිරීම ආචාර්ය මන් හා භික්ෂූන්ටවත් අනුකරණය කළ නොහැකිය. එය එතරම් රමණීය සන්සුන් විලාසයකි. මනුෂ්‍යයාගේ ගොරෝසු, හැඩි දැඩි ගතිය දෙවිවරන්ගේ සියුම් ශාරීරික ක්‍රියා සමඟ සන්සන්දනය කළ නොහැකිය. දෙවියන්ගේ මන පිනවන සුන්දර අලංකාරයක් ඇත. ඔවුන්ගේ ශාරීරක චලන ඉතාම ලක්ෂණය. මිනිසුන් මෙන් ආචාර්යවරයා හමුවීමට අවුත් කලබල නොකරති. නිශ්ශබ්ද වෙති. හැසිරීම ඉතා ගෞරවාන්විතය. මිනිස්සු ශබ්ද නගා කතා කරති. දෙවිවරු ධර්මය අස-න්නේ ඉතා තැන්පත් සමාධිගත සිතකින් මෙනි. සන්සුන් නිශ්චල ඉරියව් පවත්වා ගනිමින් සාවදානව අසා සිටිති. ආචාර්ය මන් දෙවියන් වඩින වේලාව දනිති. මධ්‍යම රාත්‍රියේ පැමිණෙන බව සවස් යාමයේ දනිති. එවිට භික්ෂූන් වහන්සේලාගෙ ' දේශන නවතා දමයි. වේලාව පැමිණි විට සක්මන් භාවනාව නවතා සමාධියට පත්වෙති. ඉන්පසු ඉන් නැගිට උපචාර සමාධියට පත්වෙති. සිතේ වේගය මුදවා හැර දෙවියන් පැමිණ ඇද්දැයි බලති. පැමිණ නැත්නම් නැවත සිත සමාධිගත කරයි. දෙවියන්ගේ පැමිණීම රාත්‍රී 2 - 3 - 4 ට නම් කලින්ම කෙටි නින්දක් සැතපී ඉන්පසු සිත සමාධිගත කරයි.

උතුරු නැගෙනහිර ප්‍රදේශයේ එතරම් දිව්‍ය සේනාවල් පැමිණියේ නැත. සමහර විට අවුත් ධර්ම දේශනාවලට සවන් දෙති. දෙවියන්ගේ පැමිණීම ආචාර්ය මන්ට විශේෂ අවස්ථාවක් විය. දෙවියන්ට දුන් පොරොන්දු ඒ ආකායෙන්ම ඉෂ්ට කරති. වේලාව නොවරදවා බලා සිටිති. තම දුන් පොරොන්දු - කාලය වෙනස් කිරීම පිළිබඳ දෙවියන්ගේ අප්‍රසාදය ඇත.

දෙවියන් සමඟ කථා කරන්නේ අපේ සම්මුති කතාව මෙන් නොව එය සිදුවන්නේ සමාධි සිතින් - සිතින් සිත හඳුනා ගැනීමකි. මේ කථාව ඉතා හොඳින් ඒ අයට තේරී යයි. මේ සිතේ ඇතිවන කථා ස්වරූපය ඉතා නිවැරදිය. සරලය. වහා වැටහෙන්නේය. නැවත නැවත අවධාරණය කළ යුතු නැත. මෙවැනි විධියට සිතින් කථා කිරීමට නොහැකි බැවින් මිනිසා තම සිතේ අධ්‍යාශය වචන වලින් පිට කරති. එවිට බොහෝ සේ වැදි සිදුවේ. සිතේ පවතින නියම සත්‍යය ස්වරූපය වචනයෙන් කිය නොහැකිය. මිනිසාට තම සිතැඟි සමාධි සිතින් ප්‍රකාශ කළ නොහැකි බැවින් මහා ගුප්ත රහසක් වී ඇත.

ආචාර්ය මන් හට මෙය ඉතා පහසු දෙයකි. උන්වහන්සේට වහා වැටහෙන නුවණ ඇත. අපට එසේ නොමැති බැවින් ආචාර්යයවරු හමු වී සාකච්ඡා කිරීමට සිදුවේ. අනුන්ගෙන් අසා දැන ගන්නා දේ අමතක වේ. නියම විධියට තේරුම් ගත නොහැකිය. අපගේ පුරුදු එසේ නොව අපට ඇබ්බැහි වී ඇත. එබැවින් ඒවා අමතක නොවේ. අත්හැරගත නොහේ. සති, සමාධි, පඤ්ඤා නොමැති බැවින් අපේ බොහෝ කාර්යයන් නිසි ආකාර සිදු නොවේ. නිතර අතපසු වීම්, වැරදීම් ඇත.

එහෙත් ආචාර්ය මන්ගේ සියලු කටයුතු නිසි ආකාර කිසිම අඩුමක් නැතිව සිදුවේ. සිතේ සමාධි ගුණය නිසා නිශ්චලය. නිතර සතුට, සාමය රජ කරයි. යන එන හැම තැනම අනුන්ගේ ආදර ගෞරවයට පත්වේ. උන්වහන්සේ පැමිණි බව ඇසූ සැනකින් බොහෝ ජනයා රැස් වී සියලු කටයුතු සම්පාදනය කරත්. බන්ථම් ගමට පැමිණි විට වූ සිද්ධිය කදිම නිදර්ශනයකි.

එම ගමට පැමිණීමට ප්‍රථම මුළු ගමටම වසූරිය රෝගය වැළඳී තිබුණි. ගමේ මිනිස්සු දේව පුජා හා නොයෙක් අමනුෂ්‍යයින්ට පූජා කළහ. ආචාර්යය මන්ගේ පැමිණීමෙන් පසු බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවනට පුද පූජා පැවැත් වූහ. ගාථා සජ්ඣායනා, පිරිත් පිංකම් උදේ හවස පැවැත් වූහ. තම සිතේ පවතින කෙලෙස් යටපත් කරමින් ශක්තිය උපදවූහ. ටික දිනකින් විශාල පරිවර්තනයක් සිදුවිය. මිනිසුන් රෝගාතුරව දිනපතා මැරුණ නමුත් උන්වහන්සේගේ පැමිණීමෙන් පසු කිසිවෙක් නොමළහ. වසංගත රෝගයෙන් පෙළුන අය සුවපත් වූහ. රෝගය පැතිරීම නතර විය. ගමේ මිනිසුන්ට එය අදහා ගැනීමට නොහැකිය. එය පුදුම ආශ්චර්යයකි. මේ නිසා සියලු දෙනාම උන්වහන්සේට ශ්‍රද්ධාවෙන් ගෞරව කළහ.

අද වන තුරු මෙම ගමේ මිනිසුන්ගෙන් පැවත එන පාරම්පරාව උන්වහන්සේට වැඳුම් පිදුම් කරති. ගමේ පන්සලේ නායක හිමි ප්‍රධාන සියලු දෙනාම ආචාර්‍යය මන් අදහති. දෑත් මුදුනේ තබා නමස්කාර කරති.

මෙවැනි ආශ්චර්‍යයමත් සිදුවීම් බොහෝය. උන්වහන්සේ දිනකට තුන් වරක් ගමේ මිනිසුන්ට මෙත් වඩා ආශිර්වාද කරති. උදේ පිබිදුන විගස දවල් සහ නින්දට යන විට මෙය කරති. සමහර අයට නිතර දෙවේලේ මෙත් සිත පතුරුවති. උන්වහන්සේ තම සිත මෛත්‍රී සමාධියට පත්කර මුළු ලෝකයට එය ගලා යන මෙන් පතුරුවති. ආලෝකයක් ඉන් නැගී යයි. එය අනන්තය. සීමාවක් නැත. හිරු දාහකට වඩා දීප්තිමත්ය. හදවතේ පිරිසිදු භාවයට වඩා දීප්තියක් මුළු ලෝකයේ කිසිවක් නැත. මෙවැනි මෛත්‍රී ගුණයෙහි ආනුභාවයක් ඇත. මේ අති පිරිසිදු චිත්ත ශක්තිය තමන් ආරක්ෂා කරයි අනුන්ට ආශිර්වාද දෙයි. මිනිසාගේ වන්දනීය, පූජනීය ආදර ගෞරවයට පත් වේ. සත්තු පවා සතුටින් බිය සැක නැතිව ජීවත් වෙති. උන්වහන්සේගේ මෛත්‍රී සිත නොවෙනස්ව සියලු සත්ත්වයන් කෙරේ වැසි වර්ෂාවක් මෙන් පතිත විය.

## දුෂ්කරතා සහ අසරණ වීම

උබොන් රචතානි ප්‍රදේශයේ සිට උන්වහන්සේ සකොන් නබෙන් ප්‍රදේශයට ගමන් කළහ. උන්වහන්සේලා සමඟ විශාල පැවිදි ශිෂ්‍ය සංඛ්‍යාවක් ගමන් කළහ. ගමේ මිනිස්සු උන්වහන්සේලා පැමිණීම මහ උද්ඝෝෂණයකින් පිළිගත්හ. සියලු දෙනාම පවින් වැළකී කුසල් කිරීමට පටන් ගත්හ. නොයෙක් අමනුෂ්‍ය පුද පූජා අත්හැර බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය ඇදහූහ. මේ ප්‍රදේශය ඝන වනාන්තරයකි. රුක්ෂ, ගස් වැල් වලින් ගහනය. වන සතුන්ගේ නිජ භූමියකි. රාත්‍රී කාලයේ ලක්ෂ සංඛ්‍යාත සතුන්ගේ ශබ්ද දෝංකාරය දෙයි. ඒ ශබ්ද වලට හුරු වූ විට ඔවුන් සමඟ මිත්‍රතත්වයක් ඇති කෙරේ. භාවනා කිරීමට මෙම සතුන්ගේ ස්වාභාවික ශබ්ද පළිරොධයක් නොවේ. එම ශබ්ද යම්කිසි අදහසක් නැති බැවිනි. එහෙත් මනුෂ්‍යය ශබ්දවල අදහස තේරුම් යන බැවින් පළිරොධයකි. සිනහසීම, කථා කිරීම, සිංදු, කෑ ගැසීම් ආදිය භාවනාවට බාධා කෙරේ. විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේලාට ස්ත්‍රීන්ගේ ශබ්ද පළිරොධකි. සමාධිය බලවත් නොවේ නම් භාවනාව කඩ වේ. මෙය ස්ත්‍රීන්ට කරන විවේචනයක් නොවේ. ඒ නිසා භාවනාව අසාර්ථක වන බවත් සති, පඤ්ඤා දුර්වල වන බවත් මෙයින් අවධාරණය කෙරේ. වනාන්තර වල වාසය කිරීමට එක් හේතුවක් මෙය වේ. ආචාර්ය මන් පිරිනිවන් පාන තුරු මෙවැනි ඝන වනාන්තර වල වාසය කිරීමට ප්‍රිය කළහ. උන්වහන්සේගේ අති දක්ෂ ධර්මාවබෝධය ඒ නිසා සැළසුනි. එය අප සමඟ උන්වහන්සේ බෙදා ගෙන භුක්ති විඳිති.

ආචාර්ය මන් දිනක් මෙසේ පැවසීය. උන්වහන්සේගේ භාවනා ප්‍රතිපත්තිය, ශාරීරික මානසික දුක් පීඩා දෙන අසාධ්‍ය රෝගයක් වැනිය. නිදැල්ලේ සතුටින් සිටීමට දවසක්වත් නොවීය. උඩ බිම බලමින් සතුටු සාමීචියෙන් කථා බහ කිරීමක් නැත. එක මොහොතක්වත් නිකරුණේ සිටින විට කෙළෙස් තම සිත ඩැහැ ගනී. කෙළෙස් වලින් සිත බැඳුනු විට ඉන් මිදීම ඉතාම දුෂ්කරය. එබැවින් කෙළෙස් වලින් නිරන්තරයෙන් ආරක්ෂාවීමට සිදුවිය. කෙලෙස් දුටු විගස ඒවා එම මොහොතේදීම මර්දනය කරයි. ඉන්පසු තම ශිෂ්‍යයින්ට උපදෙස් දෙයි. බොහෝ ගිහි පැවිදි අය සමහරවිට මෙහෙණින් වහන්සේලා දුර්ග මාර්ග ගෙවා උන්වහන්සේ හමුවීමට පැමිණියහ. ඔවුන්ට නැවතී සිටීමට තැනක් නැත. කොටි ආදී වල් සතුන්ගෙන්ද ආරක්ෂා කළ යුතුය.

එක් වරෙක උන්වහන්සේ බන් නම් ගමෙහි ගල් ගුහාවක වාසය කළේය. විශාල කොටි එහි වාසය කළහ. රාත්‍රී කාලයේ ආගන්තුකයන්ට විසීම අන්තරාදායක විය. එබැවින් ගමේ මිනිස්සු උස උණ බම්බු වලින් මැස්සක් සෑදූහ. එය කොටින්ට පනින්නට බැරි තරම් උසය. රෑ බෝ වූ විට එම මැස්සෙන් බිමට බහින්නට තහනම් කළහ. එබැවින් තමන්ට අවශ්‍ය ආහාර ගැනීම වැසිකිළි කෘත්‍යය එම මැස්ස උඩ කළ යුතුය. ඊට අවශ්‍ය භාජන එහි තබා ගනිති. මිනසුන්ගේ පැමිණීම එබැවින් අවහිරයකි. මේ කොටි මිනිසුන්ට බිය නැත. විශේෂයෙන් ස්ත්‍රීන්ට බිය නැත. එක් දිනක් විශාල කොටියෙක් මී හරක් ගාලක් පසු කර කුරුමානම් අල්ලමින් යනු උන්වහන්සේ දුටහ. මී හරක් වේගයෙන් ගමට දුවති. ආචාර්ය මන් නිදැල්ලේ සක්මන් කරමින් සිටියහ. කොටියා උන්වහන්සේ ගැන කිසි තැකීමක් නොකර මී හරක් පසුපස යයි.

උන්වහන්සේගේ ශිෂ්‍ය පිරිස ඕනෑම අවස්ථාවකට මුහුණ දීමට පුරුදු විය යුතුය. මරණය වුවද බලාපොරොත්තු වෙති. හතර වටේ වනාන්තරයෙන් කොයි මොහොතක අන්තරායක් වේදැයි නොදනිති. එමෙන්ම මානය, මම ය මාගේය යන උඩඟුකම් නැත. සියලු දෙනාම සහයෝගයෙන් ආක්ෂා වෙති. එකිනෙකා එකම කෙනෙකුගේ ශාරීරික අවයවයන් ලෙස ප්‍රවේශම් කරති. හදවත ඊර්ෂ්‍යා ආදී දුර්ගුණයන්ගෙන් තොර වී යයි. පුදුම සැනසීමකින් සිත ඉක්මණින් සමාධි ගත වෙයි. ආහාර ආදිය නැති, පහසුකම් නැති බිය ඉපදවන පරිසරයක ජීවත් වන විට නිතරම සති පඤ්ඤාවෙන් වෙසෙති. සිත පීඩා විඳිමින් එකඟ වේ. බන්ධනාගාරගත වූ වෙක් කැමැත්තෙන්ම තම ඉරණමට යටත් වෙන්නාක් මෙනි. අවට පරිසරය බිය ජනකය. මරණය ආසන්නය. බාහිර ලෝකයෙන් සැනසීමක් නැත. එකම සරණ තම සතිපඤ්ඤා පමණි. එපමණක් නොව ආචාර්යවරයා තම ඇද වංක සිත සෘජු කෙරේ. මෙසේ හැම අතින්ම සිත හික්මවයි. මේ නිසා නොසිතූ අන්දමින් සිත සමාධි පූර්ණය කරයි.

රාත්‍රී කාලය අති භයංකර බැවින් භික්ෂූන් සක්මන් කරමින් බිය නැති කිරීමට උත්සාහ කරති. කවුරු දිනත්ද ? කවුරු පරදිත්ද ? භය පරාජය වූ විට සිත ජය ගනී. සිත පරාජය වූ විට අතිශය බියට පත්වෙති. ශරීරය තදින් උණුසුම්ය. ශීතලය, දාඩිය වැගිරේ. මළමුත්‍රා පහවෙ. හුසම හිර වී මරණයට ආසන්න වේ. මේ අතර කොටියාගේ ගෙරවීම දෝංකාර වේ. එය ඈත ශබ්දයක් වුවද දැන් දැන් කොටියා මා ඩැගැ ගනිතියි බියෙන් මුසපත් වේ. සක්මනේ තනිව, මුළු ගතම වෙවුලායයි. කොටියා අහිංසකව ගොදුරු සොයතියි නොසිතේ. උං කෙළින්ම සක්මන් මළුවට එතියි ගැහි හැඟී භයින් ත්‍රස්ත වූ මේ භික්ෂුව ඩැගැ ගැනීමට කොටියා එයි. කොටියා එති යන්න එකම සිතිවිල්ලයි. බිය දැන් දරා ගත නො-හැකිය. හදවතේ ධර්ම සංඥාව පහවේ. සැබවින්ම කොටියා පැමිණුහොත් මේ අවාසනාවන්ත පුද්ගලයා ඔහුට ගොදුරු විය හැකිය. සිත මෙසේ භයට ගැතිවීම නුසුදුසුය. එය බොහෝ පිරිහීමකට තුඩුදෙන බැවිනි. මෙහිදී කළ යුත්තේ යම් ධර්මයකට නැඹුරු වී සිත තදින් ඒ ධර්මය අල්ලා ගැනීමයි. මරණානුස්සතිය, හෝ යම් ධර්ම කරුණක් මෙනෙහි කළ යුතුය. සිත බාහිර අරමුණුවල එල් බී මනස් කල්පිත සිතිවිලි වලින් පුරවා ගත යුතු නැත. ඒවායින් තමා මුලාවට පත් විය යුතු නැත. මැරුණත් නැතත් තම අරමුණ වූ භාවනා මනසිකාරයෙන් බැහැර විය යුතු නෙවේ. සිතේ ධර්මය තදින් ග්‍රහණය කළ විට තම සමබරතාවය රැකේ. මෙහි අති විශ්මිත දෙය නම් මේ අතිභයංකාර වූ ධර්මතාවය නිසා කිය නොහැකි අන්දමින් ශක්තිමත් වීමයි. එය පුදුම නිර්භය වීමකි.

ධර්මයේ සිත පිහිටුවා ප්‍රතිපත්ති රැකීම යනු සිත කය නිසි අන්දමින් හැසිරවීමයි. මේ ලෝකයේ සියලු දේ අත්හැර තම භාවනා අරමුණු පමණක් සිතේ පිහිටුවීමයි. කුමක් හෝ වේවා එය ස්වභාව ධර්මයේ ලක්ෂණයයි. එය ඉක්මවා ගිය නොහැකිය. සත්‍යය ගවේෂණය කිරීම යනු ස්වභාව ධර්මතාවය ප්‍රතික්ෂේප කිමක් නොවේ. ආචාර්ය මන් තම ශිෂ්‍යයින්ට අවවාද දුන්නේ නොබියව මරණයට මුහුණ දීමටය. උන්වහන්සේ එබැවින් මහා භයානක කැලයෙහි තනිව වසය කරන්නට උනන්දු කළහ. තම සිතේ ශක්තිය, භාවනා බලය, ධර්මයේ සත්‍යතාවය එවිට තමාට අත්දැකීමෙන් වැටහේ අප සිතේ ධර්මය හැසිරවීමට කොටි සමර්ත වෙති බුදුගුණ මෙනෙහි කරමින් බුදු දහම සිතේ දරමින් සිටින විට බිය සැක පහවේ. මේ ශ්‍රද්ධාව නැතිවිට කොටියාට භය ඇතිවේ. කැලෑවේ වාසය කිරීමේ ඇති වාසිය නම් බිය උපදවා සිතේ ධර්මය පදිංචි කරවීමයි. කැලෑව වැනි ස්ථාන සමාධි, පඤ්ඤා වැඩීමට ඉවහල් වේ. තම සිත එවැනි උද්‍යෝගයකින් කුල්මත් නොවූ විට ථිනමිද්ධ ආදී මැලිකමට ගොදුරු වෙති. එවිට කිසිවක් කළ නොහැකි තත්ත්වයට වැටි කෙළෙස්වලට යට වේ. කොටියාට ඇති භය නිසා ලෙහෙසි පහසුවෙන් මැලිකමින් දවස ගත කළ නොහැකිය. එම සැඟ වී ඇති කෙළෙස් යටපත් කිරීමට කොටියාට භය හොඳ දෙයකි. මේ යට හිතේ

ඇති කෙළෙස් ජයග්‍රහණය කළ විට පුදුම ආශ්වාදයක් ඇති කෙරේ.

ආචාර්ය මන් භාවනා පිණිස එවැනි බිය ජනක ස්ථානවලට යාමට උනන්දු කරයි. සෑම සැප පහසුවම ඇති විට එවැනි පුදුම සහගත ප්‍රතිඵල නොලැබේ. සැප වින්දනයට වැටී ධර්ම මාර්ගයෙන් බැහැර වීමට ඉඩ ඇත. මෙය ඉතා අවාසනාවන්ත තත්ත්වයකි. උන්වහන්සේගේ අවවාදය වූයේ එවැනි සුදුසු පරිසරයක මිස මෙම ධර්මතාවය පිහිටන්නේ නැති බවයි. පරිසරය බිය ජනක බැවින් නිරන්තරයෙන් සතිය පවත්වයි. තම අරමුණ නිතරම තම සිත කය පමණි. ධර්මය රැඳී ඇත්තේ මේ සිත කය ප්‍රධාන කරගෙනය. අවසාන වශයෙන් අපි මරණයට බිය විය යුතු නැත. මක්නිසාද තම කර්ම විපාක අනුව මැරෙන වේලාවට අපි මැරෙන බවත් බිය වූ නිසා නොමැරෙන බවත් අපි අවධාරණය කළ යුතු බැවින් තමා කුමක් සිතුවත් අන්තිමේදී කර්මය අනුව මරණයට පත්වේ.

මහා භයානක පරිසරය නිසා ආචාර්ය මන් මෙවන් භාවනා දියුණුවක් ලබා ගත් බව කියයි. මෙසේ තම ශ්‍රාවකයින්ට තම සිත තුළ ඇති ශක්තිය මතු කර ගැනීමට උන්වහන්සේ උපදෙස් දුන්හ. බියපත් වූ විට ඉබේම සිල් රැකේ. සිල් රැකීම යනු බොහෝ දෙනා කියන ප්‍රලාපයක් මිස මෙවැනි පරිසරයක් නැතිව කළ හැකි දෙයක් නොවේ. මෙවැනි පරිසරයකදී ඉතා කෙටි කාලයකින් සීලය, සමාධිය පූර්ණ කර ගත හැකිවේ. සීලය යනු සසර පුරුද්දක් නොවේ. එය ආයාසයෙන් රැක ගත යුතු ගුණයකි. සති, පඤ්ඤා තුළින් සිල් රැකිය යුතුවේ.

යම් කෙනෙක් ධර්මය පිළිබඳ ශ්‍රද්ධාව උපදවා ජීවිත පරිත්‍යාගයෙන් හෝ ධර්මය රකින බවට අධිෂ්ඨාන කළ විට මොනම දෙයකින්වත් කලබල නොවේ. මරණයට මුහුණ දීමට හෝ කම් නැත. ඒ තමන් භාවනා අරමුණක සිත තැන්පත් කර ගත මරණයට මුහුණදිය හැකි බැවිනි. ජීවිත හානිවන තරම් භයක් උපන්නත් සති සමාධියෙන් සිත තැන්පත්වේ. වල් මානයන් ඉදිරියේ වුවද තමා ජීවිත පූජාවෙන් ධර්මයේ හැසිරෙන විට එම බාහිර කරදර තමා ළඟට නොපැමිණේ. එය ධර්මයේ අද්භූත ආශ්චර්යයකි.

මිනිසුන් වශයෙන් අපගේ සිත් තුළ ධර්මය පවතින නමුත් සතුන් තුළ එවැනි ධර්මයක් නැති බැවින් සත්තු අවනත වෙති. අපේ ධර්මය සතුන් කෙරේ බලපායි. ඔවුන් බිය නොවී අප ඇසුරු කරත්. එවිට කිසි හානියක් නැත. මෙම ගුප්ත අභිරහස ධර්මයේ හැසිරෙන්නාගේ සිත තුළ ඇත. අන් අයට එය නොපෙනේ. භාවනාව දියුණු එවැනි සමාධිගත සිතකට එය දැකිය හැකිය. තමා ධර්මය ලොව පුරා දේශනා කළත් තම සිතේ ධර්මය ක්‍රියාත්මක නොවේ නම් එම ශක්තිය නැත. සිත හා ධර්මය එකම ශක්තියක් බවට පත් වූ විට ධර්මය යනු සිතය. සිත යනු ධර්මය වේ. එනම් සිතේ වංචනික ධර්ම නැත. කෙළෙස්

දුරු වී, සිත පාරිශුද්ධ වේ.

සාමාන්‍යයෙන් සිත කෙළෙස් වලින් ගහණය. එබැවින් සිතේ මේ ස්වභාවය වටහාගත නොහැක. එවැනි ''සිත'' යනු ''කෙළෙස්ය''. ''කෙළෙස්'' යනු ''සිත'' ය. මේ ආකාරයෙන් බොහෝ කල් ගත කළ විට ධර්මයෙන් හෝ සිතෙන් කිසිම සැනසීමක් නොලැබේ. නැවත නැවත ඉපිදමින් සියවාරයක් ගත වූවත් කිලිටු ඇඳුම් ඉවත ලා නැවතත් කිලිටි ඇඳුම් ඇඳීමක් වැනි දෙයක් සිදුවේ. අපි සදාකල්ම කිලිටි ලෙසට සිටිමු. යමෙක් කිලිටි ඇඳුම් ඉවත් කර පිරිසිදු ඇඳුම් අඳින විට මේ තත්ත්වය වෙනස් වේ. මෙසේ තම සිතේ ඇති කෙළෙස් තුරන් කිරීමට සෑම දෙනාම වගකිව යුතුය. තම සිතේ සාමය සතුට පවතින්නේ ඒ තමාම සිත පිරිසිදු කිරීමෙනි. අන් අයට අපගේ සිත පිරිසිදු කළ නොහැකිය. එය පිරිසිදු ඇඳුම් ඇඳීමක් වැනිය. බුද්ධාදී මහරහතන් වහන්සේලා මෙසේ අති පිරිසිදු සිත් පරිහරණය කළහ. එවැනි ක්ලේශ හදවත අපි සරණ යමු අද දක්වාත් වැරදි කරණ අය පවා බුද්ධ, ධම්ම, සංඝ සරණ යති.

ආචාර්ය මන් මෙසේ නොයෙක් විදියේ පිළිවෙත් පුරමින් තම ශිෂ්‍යයන් ධර්ම මාර්ගයේ ගෙන ගියහ. ඒ අනුගාමිකයෝ පසුව ශ්‍රේෂ්ට ගුරුවරු බවට පත්වූහ. ඒ අයත් මේ මාර්ගය පුහුණු කරමින් තම අනුගාමිකයන් ඒ මාර්ගයේ මෙහෙය වූහ. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් මාර්ගය අදත් ඒ ආකාරයෙන්ම නිරවුල්ව ඇත. ආචාර්ය මන් එම මාර්ගයේ ගමන් ගත්හ. එය ආත්ම පරිත්‍යාගයක් විය. උන්වහන්සේ සහ ශ්‍රාවක පිරිස ඉතා දිළිඳු, දුප්පත් ජීවිත ගත කළහ. ජීවත් වීමට අවශ්‍ය අවම දේ හෝ නොතිබුණි. අද ලෝකයේ පවතින සුඛෝපභෝගී ජීවන චර්යා දෙස බලන විට උන්වහන්සේලාගේ ජීවිත විස්මය ජනකය. මේ අයට එහි එක් දිනයක්වත් ගත කළ නොහැකිය. නමුත් භික්ෂූන් වහන්සේලා සිරගෙ යි සිරකරුවන් මෙන් ධර්මය වෙනුවෙන් ජීවිත කැප කළහ. සියලුම දුෂ්කරතා සතුටින් ඉවසූහ. සාමාන්‍ය ජනයා මෙම ජීවිත මහා හිංසා වධ පීඩා සහිත යැයි සිතුවත් භික්ෂූන් වහන්සේලා මහත් ධෛර්යයෙන් මේ මාර්ගයේ ගොස් ධර්මය අවබෝධ කළහ. ආත්ම දමනය, ආත්ම පරිත්‍යාගය, ආත්ම ශක්තිය තුළින්ද මම මාගේ ආකල්ප යටපත් කළහ.

සමහර විට දින ගණන් නිරාහාරව සිට භාවනා කළහ. බලවත් කුසගිනි ඉවසා නොකඩවා භාවනා කළහ. කුසගිනි ඉවසමින් සතිය පැවැත් වූහ. සමහරු එයට කැමති විය. මක්නිසාද හොඳ ආහාර වැළඳූ විට ශරීරය ශක්තිමත් වී වැඩ කිරීමට හැකි වුවද මනස දුර්වල වේ. භාවනාව පිරිහේ. ආහාර ප්‍රමාණය අඩු කිරීම හෝ නිරාහාරව සිටීම තුළින් සිත ශක්තිමත් වී භාවනා වැඩේ. තමාට රුචි පිළිවෙත අනුගමනය කරමින් භාවනා කළ යුතුය. යම් භික්ෂුවක් දින ගණනක් නිරාහාරව සිට භාවනාව දියුණු කරත් නම් එය ඔහුට සුදුසු පිළිවෙතය. දුක්

තරණය කිරීමට මෙවැනි රූක්ෂ ප්‍රතිපත්ති සුදුසු වේ.

යමෙක් නිරාහාර වී භාවනා කරන විට ඔහුගේ සිත බලවත් වී ශක්තිමත් වී ඉන්ද්‍රියන්ට ගොදුරු වූ බාහිර අරමුණු ප්‍රතික්ෂේප කළ හැකිය. සිත සමාධිගත වී දවස, කාලය, වේලාව ඉක්මවා යයි. කුසගින්න ආදී ශාරීරික වේදනා දුරු වී යයි. තම සිතෙන් ඇති වන ප්‍රීති සුඛය වින්දනය කරයි. මැලිකම දුරුවේ. සිතේ විසිරී ගිය ගතිය නැත. සිත තැන්පත්ය. අපි සුදුසු කල් යල් බලා භාවනා කිරීමට සළසුම් කළ විට ඊට කලින් කෙළෙස් පැන නැගී එයි. එවිට කෙළෙස මර්දනය කරමින් ඇත්ගොව්වා ඇතෙකු දක්කාගෙන යන්නාක් සේ අවනත කරයි. ඇත්තෙන්ම අනාදිමත් සසර තුළ අපේ සිත ඇතකු වශයෙන්ද, කෙළෙස් ඇත්ගෙ ාව්වෙකු වශයෙන්ද ක්‍රියාකර ඇත. මේ ඇත්ගොව්වා ගැන අප යට හිතේ ඇති භය නිසා නිතරම යටත් වේ. කෙළෙස් වලට වසඟ වන්නේ මේ අකාරයෙන්ය. කෙළෙස් සමඟ සටනට යාමට නොහැකි වන්නේ මේ පුරුදුතාවය නිසාය. බුදු දහමට අනුව කෙළෙස් යනු ධර්මයේ හතුරන්ය. ලෝකයේ වාසය කන්නන්හට කෙළෙස් යනු සිතේ පදිංචි වූ අයින් කල නොහැකි සගයන්ය, සහායකයන්ය. බුදුදහම පිළිපදින අප මේ කෙළෙස් සමඟ සටනට වැදිය යුතුයි. එවිට කෙළෙස්වල ඇති ශක්තිය බිඳ වැටේ. එහෙත් ලෝක වාසීන්ට කෙළෙස් වලට අවනත වී වසඟ වී සුරතල් කරමින් වගා වර්ධනය කිරීම මිස අන් කිසි මාර්ගයක් නැත. මේ ප්‍රතිපත්තිය නිසා ලෝකයේ විවිධ මාදිලියේ උග්‍ර ප්‍රශ්න පැන නැගී ඇත. මිනිසා අන්ත පීඩාවට පත් වී ඇත. එවැනි තත්ත්වයන් මඟ හැර ගැනීමට මේ කෙළෙස් සටන හැකි ආකාරයෙන් මෙහෙය විය යුතුවේ. නිරාහාරව සිටීම හෝ වෙනයම් ක්‍රමයකින් හෝ මේ කෙළෙස් මර්දනය කළ යුතුවේ. ජීවිත පූජාවෙන් හෝ මේ කෙළෙස් මර්දනය කළ යුතුවේ. ජීවිත පූජාවෙන් හෝ මේ සටන ගෙන යන්නා බුදුරජාණන් වහන්සේගේ ධර්මය අනුගමනය කරන්නෙක්.

ආචාර්ය මන් හොඳාකාර කෙළෙස් ගවේෂණය කර ඇත. ධර්මයද ගවේෂණය කළහ. ඉන් ලැබූ අත්දැකීම් වශයෙන් තම සිත කෙළෙස් වලින් දුරු විය. මෙසේ තමා ලැබූ අත්දැකීම් ඒ ලෝකයාට කියා දීමට උන්වහන්සේ උතුරු නැගෙනහිර ප්‍රදේශයට සම්ප්‍රාප්ත විය.

උන්වහන්සේ නිතරම අවධාරණය කළ ධර්ම කොට්ඨාසයක් ඇත. එනම්, පංච බල දියුණු කිරීමයි. ශ්‍රද්ධා, වීරිය, සති, සමාධි, පඤ්ඤා. මෙම බල පහ ඇති අයෙකුට කුමක් කළද, කොහේ ගියද, සාර්ථක ජීවිත ගත කිරීමට හැකිවේ. උන්වහන්සේගේ අත්දැකීම් අනුව මේ ධර්ම පහ විස්තර කරති.

ශ්‍රද්ධා මෙය නම් බුදු දහම පිළිබඳ අචල ශ්‍රද්ධාවයි. සියලු මනුෂ්‍යයන්ට මේ දහම අවබෝධ කළ හැකිය. එහෙත් ප්‍රතිපත්ති ඒ ආකාරයෙන් අනුගමනය

කළ යුතුයි. යම් දිනක අපි මරණයට පත්වන බව අපි දනිමු. අපි මරණයට පත් වන්නේ කෙළෙස් වලින් පරාජය වීද ? කර්ම විපාක වලින් පරාජයවීද ? නැතහොත් අපි මරණයට පත් වන්නේ කෙළෙස් ජයග්‍රහණය කරද ? කර්ම විපාක ජයග්‍රහණය කරද ? කුඩා දරුවන් වුවද ජයග්‍රහණයට කැමති වෙති පරාජයට නොකැමැති වේ. පරාජය වූ අය බොහෝ දුකට පත්වෙති. තම දුකින් මිදීමක් නැත. තම දුක ඉක්මවා මරුණාත් කමක් නැතැයි පවසති. මෙසේ කෙලෙස් නැමැති සතුරන්ට වසඟ වේ. පරාජය සමඟ සාර්ථක ප්‍රතිඵල බලාපොරොත්තු විය නොහැක.

ජයග්‍රහණය ලබා මරණය පත් වී අත්තේ බුදුන් රහතුන් වැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ය. අපි ද උන්වහන්සේලා අනුකරණය කළ යුතුයි. උන්වහන්සේලාගෙ ් ශ්‍රද්ධාව, වීර්‍යය, ඉවසීම, සති, පඤ්ඤා, අපි පූර්ණය කළ යුතුයි. උනන්දුවක් නැතිව සතියෙන් තොරව මෙම බල ලබා ගත නොහැකිය. බුදු දහම අති උත්තම බුදුවරුන්ගේ දේශනාවකි. එය අනුමනය කළ විට අපට ප්‍රඥාව පහළ වේ. අපි මෝහයෙන් මුලා වූ විට කිසි වටිනාකමක් නැත. මෝහය අගය කරන්නේ කව-රෙක්ද ? මෝහයෙන් මුලා වී දුක් තරණය කළ හැකිද ? ධූතාංග භික්‍ෂුව නිතරම ප්‍රඥාවෙන් සිටිති.

ආචාර්ය මන් මෙවැනි දේශනා නිතර තම ශිෂ්‍යයන්ට කරති. තම අත්දැකීමෙන් මේ සියලු විස්තර පහදා දෙති. මෙවැනි දේශන අසා ධූතාංග භික්‍ෂූන් කෙළෙස් ජයග්‍රහණය කොට මේ අත්බව්හිදී අති උතුම් අර්හත්වය ශාක්ෂාත් කරති.

## ක්‍රමානුකූල ඉගැන්වීම

එක් අවස්ථාවක ආචාර්‍යය මන්ගේ ජ්‍යේෂ්ඨ ශිෂ්‍යයෙක් පැවසූ පරිදි උන්වහන්සේගේ ශිෂ්‍යයන් ධූතාංග පූරණයේ යෙදෙන විට කෙළෙස් නැති අය මෙන් හැසිරෙති. විශාල සංඛ්‍යාවක් එකම ප්‍රදේශයේ වාසය කළ නමුත් කිසිවෙකුගෙ ් නොමනා හැසිරීමක් නැත. හුදකලා විසීමේදී හෝ අනුන් සමඟ සාමූහිකව තම කටයුතු කිරීමේදී, රැස්වීමකදී, හෝ සෑම අවස්ථාවකදීම ඉතාම සන්සුන් ලීලාවෙන් හැසිරෙති. ආචාර්‍යය මන් සමඟ සාකච්ඡා කරණ කාරණා නොදන්නා කෙනෙක් උනවහන්සේලා සියලු දෙනාම රහතන්වහන්සේලා යැයි සිතති. සත්‍යය පෙනෙන්නේ උන්වහන්සේ භාවනා ගැටළු නිරාකරණය කිරීම පිණිස අවවාද අනුශාසනා දෙන විටය. සෑම භික්‍ෂුවකට තම ආධ්‍යාත්මික දියුණුවට අනුව උපදෙස් ලබති. සාමාන්‍යය සමාධි තත්ත්වයේ සිට විපස්සනාවෙන් පඤ්ඤාව හා මග්ගඵල පිණිස අවවාද ලබති. පුද්ගලිකව අවවාද දීමේදී හෝ සමූහයකට උපදෙස් දීමේදී උන්වහන්සේ එකහෙලාම සැක බිය නැතිව කථා කරති. එය

ස්ථිරය. නොසෙල්වන සුළුය. තමා අත්දැකීමෙන් කථා කරණ බව ප්‍රේක්ෂකයින්ට අවබෝධ වේ. උන්වහන්සේ අනුමානයෙන් හෝ මුහුණ ඉච්ඡාවට හෝ කථා නොකරති. ''මෙය මෙසේ විය හැකිය'' ආදී වශයෙන් සැක විචිකිච්ඡා නැත. අසා සිටින සියලු දෙනාට හොඳාකාර වැටහේ. ධර්මය කවදා නමුත් අවබෝධ කරන බවට සැක නැතිවේ.

තම අනුගාමිකයන්ට සුදුසු දේශනා උන්වහන්සේ දේශනා කරති. සියලු දෙනාටම යම් මට්ටමක අවබෝධයක් ඉන ලැබේ. භාවනා පිළවෙත් විස්තර කරණ විට සියලුම දෙනාට එය අනුගමනය කිරීමට හැකිවේ. ගිහි අයට සුදුසු භාවනා ඒ අයට දේශනා කරති. දානය, සීලය, භාවනා ගැන විස්තර කරති. මේ කරුණු මිනිසත් බවක් ලැබීමට සුදුසු වෙත්. එමෙන්ම මෙය ශාසනයේ අත්තිවාරම වේ. යමෙක් මිනිසත් බවක් ලබන්නේ දාන, සීල, භාවනා ගිය ආත්මවල පුරුදු පුහුණු කළ බැවිනි.

දානය යනු අනුන්ට තමාගේ මෛත්‍රිය විදහා පෙන්වීමයි. ගුණ ගරුක අය තමන්ට අයත් දේ අනුන් සමග බෙදා ගනිති. එය ද්‍රව්‍යමය හෝ ධර්මය හෝ විය හැකිය. කිසිම බලාපොරොත්තුවක් නැතිව එය දෙයි. ඉන්වන කර්ම විපාක පමණක් අදහස දෙති. යමෙක් වැරදි ලෙස හැසිරුණු විට ඔහුට සමාව දීම මේ දානමය ක්‍රියාවකි. දන් දෙන තැනැත්තා හට කැපී පෙනෙන ආරෝහ පරිනාහ ලක්ෂණ ඇත. පෞරුෂයක් ඇත. දෙවියන්, මිනිසුන් හා සතුන් පවා මේ අයට කැමති වෙති. ගිය ගිය තැන උදව් උපකාර ලැබේ දුක්, පීඩා, දිළිඳු බවක් නොලැබේ. සමාජය දානපතියාට උසස් ලෙස ගෞරව දක්වති. පොහොසත් වුවත් මසුරු අය දානපතියාගෙන් අධාර ලබත්. දුගී, දුප්පත් අය ද ලබත්. දාන-යේ විපාක වශයෙන් නැවත උප්පත්තිය ලබන්නේ යස ඉසුරු සම්පත් ඇතිවය. ලෝකයේ සමබර ආර්ථිකයක් ඇති වන්නේ දානය දෙන බැවිනි. අනුන්ට උදව් උපකාර කරමින් තමාගේ සැප සම්පත් බෙදා ගත් විට, ත්‍යාගශීලීගති ඇතිවිට, ජීවත් වීමේ තේරුමක් ඇත. දානපතියා අප සියලු දෙනාටම අවශ්‍ය පුද්ගලයෙකි. දානපතියන් නැති ලෝකය පාලු හිස්, වඳ ලෝකයකි.

සීලය මිනිසාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරයි. සියලුම මනුෂ්‍යයන්ට අවශ්‍ය ගුණ ධර්මයකි. සීලය නැති මිනිසාගේ ගුණයක් නැත. එය මිනිස් වර්ගයා දවාලන ගින්නකි. දුශ්සීලයන් නිසා ලෝකය හා සමාජය විනාශ වේ. කිසිවෙකුට නිදැල්ලේ සතුටින් වාසය කළ නොහැක. මිල මුදල් ආදී ද්‍රව්‍යමය දේ ශීලයට වඩා උසස් කිරීම නිසා ලෝකයේ ආරක්ෂිත තැනක් නැත. ද්‍රව්‍යමය සැප සම්පත් අහස උසට ඇතත් ශීලය නැතිවිට ඇතිවන ගින්න සූර්‍ය්‍යය රශ්මියට නිගා කරයි.

බුදුරජාණන් වහන්සේ සීලය මිනිසාට අත්‍යාවශය බව වදාළහ. මිනිසා

බිය සැක නිසා දුක් ගිනි වලින් දැවෙමින් සිටිති. විශ්වාසය, සත්‍යය නම් සීතල වතුරෙන් සියලු දුක් ගිනි නිවාලයි. කෙලෙස් බරිත පුද්ගලයන් ලෝකයේ නොයෙක් ආකාර ගිනි වලින් දවාලත්. මේ කෙලෙස් බරිත සිත් සිල් ගුණයකින් තොර වූ විට විෂකුරු සර්පයන් මෙන් ලොව සියලු ගුණ ධර්ම නසාලයි අති ශ්‍රේෂ්ඨ බුදුරජාණන් වහන්සේගේ නිකෙලෙස් සිත සහ දසඅත පැතිරී පවතින සීල සුගන්ධය නිසා ලෝකයට සාදර සංග්‍රහයක් ලෙස සාමය හා ප්‍රීතිය ගෙන දී ඇත. මේ නිසා අප යම්කිසි මාර්ගයක් අනුගමනය කොට ලෝකයේ පවතින අති භයංකර කෙලෙස් ගිනි හා දුශ්සීලකම් මැඩලිය යුතුයි. සීලය යනු කෙලෙස් රෝගයට ඔසුවකි. සීලය නිසා කෙලෙස් රෝගය සුව කළ හැකිය.

ආචාර්ය මන් ඉතා කරුණාවෙන් සිල්වත් කමේ කුසලතාවය හා දුශ්සීලකමේ අකුසලතාවය පැහැදිලි කර දුනි. එය ගිහි අයට කෙතරම් අවශ්‍යද යත් මම ද පන්සිල් රැකීමට සිතුවෙමි. එහෙත් මම 27 උපසම්පදා ශීලය රකින බව පසුව මතක් විය. එම දේශනය අසන විට මොහොතක අමතකවීමකි. එතරම් බර සාර දේශනාවකි. මේ බව මම අන් භික්ෂූන්ට නොකීවේ මම පිස්සෙක් යැයි සිතන බැවිනි. මගේ මුඩු කළ හිස මතක් වුයේ පසුවය. පන්සිල් රැකීමේ ආනිශංස එතරම් සිත් ආකර්ෂණය කළේය. තම සිතේ සතිය නැති වූ විට නොයෙක් වැරදි වලට පෙළඹේ. මෙය සිතේ ස්වභාවයයි. නිරන්තයෙන් සති පඤ්ඤා සිතේ තැන්පත් විය යුතුයි.

භාවනාව යනු සිත කුසලතාවයෙහි පුරුදු කිරීමයි. මේ පුරුද්ද නිසා අනවශ්‍ය ලෙස අති ධාවනය හා අවලීවනය වළක්වාලයි. මධ්‍යස්ථව සිහිබුද්ධිෙයන් සාධාරණ විසඳුම් සළස්වයි. එය සතුට, සාමය, තෘප්තිය ගෙන දේ. භාවනා පුරුදු නැති සිත කුලුමීමා මෙන් කිසි වැඩක නිසි ආකාර නොයෙදේ. එබැවින් කාර්‍යක්‍ෂමතාවයක් නැත. කළ වැඩවලින් නිසි ප්‍රතිඵල නැත. දෛනික ජීවිතයේ සියලු වැඩකටයුතු කුසලතාවයකින් කිරීමට භාවනාව වැදගත් වේ.

භාවනා පුරුදු තැනැත්තා හට ස්ථිරව රැඳීමට නැංගුරම් ඇත. අනවශ්‍ය දේ අත්හැරීම, නිවැරදි තීරණ, සාධාරණ විසඳුම් දෙයි. ඉන් සියලු දෙනාටම ඵලදායී වේ. වර්තමානය නිරවුල් වේ. එවිට අතීත අනාගත සියල්ල නිරවුල් වේ. භාවනා යෝගී අය යම් දෙයක් කරන විට සාර්ථක ප්‍රතිඵල ලැබේ. තම කාර්ය සාර්ථක කිරීම ගැන මිස ඉන් ලැබෙන ලාභ ප්‍රයෝජන නොතකයි. එබැවින් තමා කළ වැඩ ගැන ආපසු බලා සතුටු වෙති. සාධාරණ, යුක්ති ගරුක බැවින් සිතුවිලි - වචන - ක්‍රියාවල පාලනයක් අත. ඔවුන් සත්‍යයේ පිහිටා කටයුතු කරත්. කෙලෙස් වලට වසඟ වී අවට පරිසරයෙන් එන නොයෙක් පෙළඹීම් වලට ගැති නොවේ. තැන් තැන් වලට යෑම් ඊම් නොයෙක් ඕනෑ එපා කම්, හරි වැරදි නොබලා හිතුමතේ ක්‍රියා කිරීමක් නැත. තණ්හාව නිසා නිතරම අපි ගැතිකම් කරමු. ඇත්තෙන්ම වගකිව යුත්තා අපිමය. අනුන්ට වැරදි ආරෝපණය කළ යුතු

නැත. සති, පඤ්ඤා නැතිවිට මේ කිසිවක් සිහි බුද්ධියෙන් නොකරත්. කරණ හැම දේම දුක් විපාක ගෙන දේ. කෙළෙස්වල තත්ත්වය මෙසේ බැවින් ඔහු පසුපස අවාසනාව ලුහු බඳී.

භාවනාව දුෂ්කර වන්නේ සිත පාලනය කළ යුතු බැවිනි. නිදැල්ලේ දුව පැන ඇවිදින වඳුරෙක් හීලෑ කිරීමට දුෂ්කර වන්නාක් මෙනි. භාවනාව තුළින් තම සිත හඳුනා ගනිති. සිතේ තත්ත්වය නම් නිශ්චල ඒකාකාරීව සිටීමට නොව උතුරන වතුරෙන් පිළිස්සෙන විට කෑ කෝ ගසමින් දුවන්නාක් මෙන් ඒ මේ අරමුණේ දුව පැන ඇවිදීමයි. මේ සිත හඳුනා ගත් පසු එය හීලෑ කිරීමට යම්කිසි අරමුණක රැඳවා ගත යුතුයි. සිත තම ආශ්වාස ප්‍රාශ්වාසයේ රැඳවා ගැනීම ඉතා හොඳ භාවනාවකි. යම්කිසි සුදුසු වචනයක් නැවත නැවත සිහි කිරිම හොඳ ක්‍රමයකි. ''බුද්ධො බුද්ධෝ // - ධම්මෝ // - සංඝෝ // - ලෝමා // - නඛා // දන්තා - // තචො // ආදී වචන මෙනෙහි කිරීමට ඉදිරියට පසුපසට මෙනෙහි කිරිම හෝ සජ්ඣායනා කිරීමෙන් සුදුසු කර්මස්ථාන වෙත්. මරණානුස්සතිය හෝ අන්කිසි බෞද්ධ භාවනා අරමුණු ඉතා යෝග්‍ය වේ. සතුට හ සැනසීම සිතේ නිසල සන්සුන් බව, ශාන්ත බව, මෙම භාවනාවලින් ඇති කෙරේ.

මෙම නිසල සන්සුන් භාවයට සමාධි යැයි කියනු ලැබේ. සමාධියට පත් වූ විට මුලින් පුරුදු කළ කර්මස්ථාන අවශ්‍ය නැත. සමාධි සිතේ ගම්‍යතාවය, ශක්තිය තුළින් එම සන්සුන් නිසල බව පවත්වති. එවිට මුල් අරමුණු තාවකාලික අත්හැර මේ සමාධි සුවය භුක්ති විඳියි. සිත සමාධියෙන් ඉවත් වූ පසු නැවත කර්මස්ථානයෙහි පිහිටා සමාධිගත විය හැකිය. මෙසේ සිත බොහෝ වේලා සමාධි සුවයෙන් පසුවන විට සිතේ දුක, භය, සැක අදී නොයෙකුත් කෙළෙස් සංසිඳී යයි. වීර්‍යය වඩමින් නැවත නැවත සමාධියෙහි පිහිටීම නිසා සිත පාලනය වේ. සතිය පිහිටුවයි. වර්තමානයෙහි සිත රඳා ගත හැකිවේ. තම කාර්‍යය කෙරෙහි සම්පූර්ණ අවධානය ඇති බැවින් සිත ශක්තිමත්ය. වැඩ කාර්‍යක්ෂමය. නිවැරදිය, නිරවුල්ය තමන්ටත් අනුන්ටත් ප්‍රීතිය, තෘප්තිය ගෙන දේ. මුලින් සිත පාලනය කර ගැනීමට නොහැකි වුවද දැන් භාවනාවට මහත් උනන්දුවක් ඇතිවේ. එබැවින් ඉක්මණින් සිත කර්මස්ථානයක යෙදී සමාධිගත වේ.

සමාධියට පත් වූ විට සිත කිසි කලෙක අමතක නොවන පරිදි සන්සුන් වේ. ප්‍රිති, සුඛ ඇතිවේ. මෙය ප්‍රත්‍යක්ෂ කළේ එක් වතාවක් වුවද එය අමතක නොවන සිද්ධියකි. නැවත නැවත සිත සමාධි ගත කර ගැනීමට නොහැකි නම් විශාල දුකක්, පාඩුවක, ආසාවක් දැනේ. නැවත නැවත උත්සාහ ගෙන සමාධි සිත දියුණු කළ යුතුය.

භාවනාව ගැන කථා කරන විට ඔබට මහත් අසහනයක් බැරි කමක් දැනේ. එබැවින් එය පුරුදු කිරීමට නොකැමැතිවේ. ඔබ මෙසේ සිතයි ''මගෙ

" ඉරණම මෙයයි. මට කවදාවත් භාවනා කළ නොහැකිය. මගේ ගෙදර දොරේ සහ වැඩ පළේ කාර්‍යය බහුලය. සමාජ වගකීම් ඇත. දරු මුණුබුරන් රැක බලා ගත යුතුය. භාවනාවක රැඳී ඇස් පියාගෙන කාලය ගත කරන විට මේ වැඩ කරන්නේ කවුද? අපට හාමතේ මැරෙන්න වෙයි.'' මෙසේ සිත වටිනා අවස්ථාවක් පැහැර හරී. මෙවැනි අදහස් යටි සිතේ තැන්පත් වී ඇත. ඒ නිසා මෙතෙක් කල් දුකින් මිදීමට නොහැකි විය. අනාගතයේදීත් මෙසේම සිතනවා ඇත. ඊට ප්‍රතිකර්ම දැන්ම කළ යුතුයි.

භාවනාව යනු අප සිතේ අනන්ත සසර පටන් තිබූ අසහන දුක්, පීඩා අප මැඬගෙන සිටි කෙළෙස් යටපත් කර ජයග්‍රහණය කිරීමයි. දෛනික ජීවිතයේ කරණ අනිකුත් ක්‍රියා මෙන් භාවනාව ගැන සිතිය යුතුයි. උණුසුම් වැඩි වූ විට ස්නානය කරමු. ශීත වැඩි වූ විට උණුසුම් ඇඳුම් අඳිමු. කුසගිනි ඇති වූ විට ආහාර ගනිමු. අසනීපයකදී බෙහෙත් ගනිමු. මේ හැම දෙයකින්ම මිනිසා දුක මඟ හරවා ගනී. ''එය අවශ්‍ය නොවේ, කරදර වැඩියි.'' ආදී වශයෙන් සිතමින් අත් නොහරිත්. සෑම කෙකේම මේ පිණිස උනන්දු වෙති. සතුන් පවා ආහාර සොයමින් මහත් වීර්‍යයක් දරති. දිනපතා මෙය සිදුවේ. භාවනාව මෙවැනිම කාර්‍යයකි. මෙය තම සිත සන්සුන් කර ගන්නා ක්‍රමයකි. සිත යනු සියලුම අතින් ක්‍රියාකාරිත්වයන් පාලනය කරණ ඉන්ද්‍රිය බැවිනි.

සිත හැම දෙයට මූලික වේ. සෑම අවස්ථාවකදීම වගකීම ගන්නේ, ප්‍රතිචාර දක්වන්නේ සිතයි. කුමන දෙයක් වුවද සිත උනන්දු වී එය ග්‍රහණය කරයි. හොඳ හෝ නරක, හරි හෝ වැරදි හැම දෙයක්ම සිතට එල්ල වේ. සමහර විට ඉවසන්ට බැරි දුක් පීඩා වුවද සිතට උසුලන්ට වේ. මේ සිතට කර කියා ගන්ට ක්‍රමයක් නැති වුවද ඉසිලිය යුතුය. එම පීඩාව නැවත නැවතත් මතකයෙන් ආරෝපණය වේ. කෑම කන්ට හෝ නිදන්ට වුවද නොහැකිවන තරමට සිත මේ බර උසුලයි. එහෙත් සිත අත හැරීමක් බැරි කමක් නොපායි. ශාරීරික ව්‍යායාමයේදී දුර්වල වූ විට විවේක ගත හැකිය. එහෙත් සිතේ ක්‍රියාකාරිත්වයට කිසි නිදහසක් නැත. නින්ද යන තුරු එම පීඩාව විඳිති. එවිටත් සිත ක්‍රියාත්මක වේ. යටි හිතේ නොයෙක් දේ කරකැවේ. එහි සීමාව ඉක්මවා ක්‍රියා කරමින් සිහින මවයි. මෙසේ හැම මොහොතේම සිත ඉසිලිය නොහැකි අවිවේකයකින්, අතෘප්තියකින් කල් ගෙවයි. එහි අසීමිත ක්‍රියාකාරිත්වය නිසා ඉසිලිය නොහැකි දරුණු තත්ත්වයකට පත්වේ. මේ බව සිත නොදනී.

නිතරම මෙසේ පීඩා විඳිමින් යුද වදින නිසා සිතට ''යුද භටයා'' යැයි කීම වටී. එන එන හැමදේම ග්‍රහනය කරමින් ප්‍රතිචාර දක්වයි. පොර බදියි, මොනයම් සිතුවිලි කන්දරාවක් වුවද ඒ සියලු සිතිවිලිවලට මුහුණ දෙයි. අත් නොහරියි. කිසිවක් අත්නොහරියි. අභියෝග දක්වයි. සිතේ කෙළෙස් සහ මමත්වය විශේෂෙ-

යන් උනන්දුවෙයි. පුදුම යුධ භටයෙකි. ජීවිතය ඇති තාක් කල් මේ යුද්ධය ගෙන යයි. ඉන් මිදීමක් නැත. සිත තුළ ඇති අසීමිත ආසාවන් මෙසේ ජයග්‍රහණය කරන්නේ ධර්මයට ප්‍රතිවිරුද්ධවය. ඉන් ලැබෙන සතුට ධර්මය පරාජය කිරීමෙනි. අධර්මය රජ කිරීමෙනි. ලෞකික සැප සම්පත් කෙතරම් ඇතත් ධර්මය නැති බැවින් ඉන් ලබන සතුට කිසිම සෑහීමකට පත් නොකරයි. තව තවත් ආසාවල් පැන නගින බැවිනි.

බුද්ධාදී මහා ප්‍රඥයන් වහන්සේලා මේ තත්ත්වය හඳුනාගෙන ධර්මය වදාරා ඇත. ධර්මය නැති විට තම ආසාවන් මුදුන් පත් කර ගැනීමට කොපමණ දේ ලැබුණත් තෘප්තියක් නැත. ධර්මය නැති තැන හොඳා පාලු නාස්තියක් දැක්ක හැකිය. බොහෝ දේ රැස් කළත් ඉන් කිසි සැනසීමක් නැත.

ඒ අතරම සිත සන්සුන් වූ විට ඕනෑම ප්‍රශ්නයක් ඉදිරියේ නොසෙල් වී සිටීමට ශක්තිය ඇති කෙරේ. සිත පුදුම විදියට තෘප්තිමත් වේ. උපන් මොහොතේ සිට මේ දක්වා අප සිතට අසීමිත දුක් වේදනා කම්පන නොකඩවා දී ඇත. අපේ වාහනයට මෙබඳු වධ හිංසා දුන් විට එය අත්වැඩියා කිරීමට නොහැකි බැවින් වීසි කර කුණු ගොඩකට දැමීමට සිදුවේ. අපි පාවිච්චි කරණ සියලුම භාණ්ඩ නිතරම නඩත්තු කරමින් රැක ගත යුතුය. සිත ද එසේමය. අපට අයත් ඉතාම අගනා ''භාණ්ඩය'' මේ සිතයි. එය නිසි සේ නඩත්තු කරමින් රැක බලා ගත යුතුය.

භාවනාව යනු මේ සිත ආරක්ෂා කර නඩත්තු කිරීමකි. මේ සිත අප සතු අමිල වස්තුවකි. එය නිසි අකාර පරිහරණය කළ යුතුය. සුදුසු භාවනා මනසිකාර තුළින් සිත රැක ගත යුතුය. තම වාහනය වරින් විට සෝදිසි කරමින් අළුත්වැඩියා කිරීමට සිදු වන්නාක් මෙන් සිතේ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය අංග, පිළියම්, ආධාර, උපකාර සැපයිය යුතුය. එනම් භාවනාව තුළින් සිත පරික්සා බලා එහි හට ගන්නා සංඛාර ගැන විමසා දැන ගැනීමයි. සිතේ හට ගන්නා සිතුවිලි වැඩ දායකද ? අවැඩදායකද ? තම ජීවිතය විනාශ කිරීමක්ද ? කුමන සිතුවිලි හොඳද ? නරකද ? ඉන්පසු ශරීරය දෙස පිරික්සා බැලිය යුතුය. ශරීරය දුර්වල වේගෙන යත්ද ? ශක්තිමත් වේද ? ශරීරය කැඩී බිඳී යන වේගය වැඩිද ? අඩුද? මේ පිළිබඳ පිරික්සීමට යන වේගය වැඩිද ? අඩුද ? මේ පිළිබඳ පිරික්සීමට කාලය එළඹ ඇත්ද ? නැත්නම් අමතක කර ගත යුතුද ? ශරීරය මරණයෙන් අවසාන වීමට පෙර එහි ක්‍රියාකාරිත්වය දැන ගත යුතය. භාවනාව යනු මෙයයි. අපේ අඩු ලුහුඬු නැවත නැවතත් දකිමින් ප්‍රතිකර්ම යෙදීමයි. මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරණ විට හිඳිමින් එහා සක්මන් කරමින් හෝ වෙනත් දෛනික කටයුතුවලදී හෝ තම සිතට නිතරම සතුට සැනසීම ලැබේ. ජීවිතය ගැන ආඩම්බරවීමක් නැත. එවිට අතෘප්තියට පත්වීමක් නැත. මධ්‍යස්ථව සිතීමට පුරුදු වේ. අනවශ්‍ය දේවල

වෙලී පැටලී නැත.

භාවනාව තුළින් ලැබෙන හොඳ විපාක ගැන කථා කිරීමට නොහැකි තරම්ය. ගිහි අයට අවශ්‍ය ප්‍රමාණයෙන් ආචාර්ය මන් උපදෙස් දුනි. නමුත් භික්ෂූන් වහන්සේලාට අර්හත්වය දක්වා උපදෙස් දුණි. මා මෙතරමින් මෙහි සඳහන් කරන්නේ උන්වහන්සේගේ උගැන්වීමේ ක්‍රම පිළිබඳ යම් තරමක අවබෝධයක් දීමටය. සමහර විට මේ කරුණු අනවශ්‍ය ලෙස හැඟේ. එහෙත් සියලු ලොකු කුඩා දේ සියල්ල මෙහි අන්තර්ගත නොකළ විට යම් ඌනතාවයක් ඇතිවිය හැකිය. පාඨකයාගේ විවේචනය මම සාදරයෙන් පිළිගනිමි. එය මගේ දුර්වලකමක් මිස අචාර්ය මන්ගේ දුර්වලකමක් ලෙස නොසලකන මෙන් ඉල්ලමි. උන්වහන්සේ මේ පොත ලිවීමෙහි කිසියම් බලපෑමක් කර නැත.

ආචාර්ය මන් ගැඹුරු දේශනා කරන්නේ තම පැවිදි ශ්‍රාවක පිරිසටයි. මම නොයෙක් විධියේ කටයුතුවල යෙදුන බැවින් මගේ අත්දැකීම් වලට අමරතව උන්වහන්සේගේ අනිකුත් ශ්‍රාවක පිරිස වෙත ගොස් කරුණු ගොනු කළෙමි. උන්වහන්සේගේ පිළිවෙත් ඉතා දුෂ්කරය. උග්‍ර තපස්ය. දැඩි අධිෂ්ඨානයෙන් යුතු බැවින් නොවෙනස්වන සුළුය. උන්වහන්සේගේ එම දක්ෂතාවයට සමාන කිරීමට එකම ශිෂ්‍යයෙකුට වත් නොහැකි බව කිව යුතුය.

උදොන් තානි සහ නෙං කයි ප්‍රදේශයේ වාසය කරණ කාලයේ බොහෝ දෙවිවරු පැමිණ උන්වහන්සේ සමඟ ධර්ම සාකච්ඡාවේ යෙදුනහ. සමහර දෙවි පිරිස් සති දෙකකට වරක් නොකඩවාම පැමිණුනි. සමහරු මසකට වරක් පැමිණුනි.

ආචාර්ය මන් නාග ලෝකය ගැන බොහෝ විස්තර කියා ඇත. ලාඕස් රටේ លු අං ප්‍රභං හි විශාල කඳු පිහිටි ප්‍රදේශයට විශාල නාග රාජධානියක් පිහිටා ඇත. එහි වසන අධිපති නාගයා ධර්මය ශ්‍රවණය කිරීමට නාග සේනාව සමඟ එති. දෙවිවරු තරම් නාගයෝ ප්‍රශ්න නොඅසති. එහෙත් ඉතා ගෞරවාන්විතව උන්වහන්සේගේ දේශනාවලට සවන් දෙති. එම කඳු මුදුනේ වාසය කරණ කාලයේ උන්වහන්සේ හමුවීමට නාග ප්‍රධානියා දිනපතාම පැමිණියේය. ඒ අයගේ පැමිණීම උන්වහන්සේ කලින් දන්නා බැවින් නියමිත වේලාවට බලාපොරොත්තුවෙන් සිටිති. මෙය ඉතා දුෂ්කර මනුෂ්‍යයන්ගෙන් තොර ඈත ප්‍රදේශයකි. නාගයෝ මධ්‍යම රාත්‍රියේ නොව රාත්‍රී 10-11 වන විට පැමිණෙති. ඔව්හු පැමිණ තමන්ට අනුකම්පාවෙන් එහි වැඩ වාසය කිරීමට ආරාධනා කළහ. රෑ දවල් නොකඩවා රැකවල් යොදා උන්වහන්සේ ආරක්ෂා කරන බව සැළකූහ. උන්වහන්සේ සමීපයට නොපැමිණ ඈතින් සිට බලාගෙන සිටිති. දෙවිවරු මධ්‍යම රාත්‍රියේ සහ එළිවෙන යාමයේ වඩිති. මිනිස් ආවාසයෙන් බොහෝ ඈත නම් 10-11 වන

විට වුවද පැමිණෙති.

ආචාර්ය මන්ගේ මධ්‍යම වයස් සීමාවේදී දෛනික වැඩ පිළිවෙල මෙසේය. අළුයම දහයෙන් පසු දවල් වන තුරු සක්මනේ පසුවෙති. ඉන්පසු සුළු විවේකයකි. ඉන්පසු පැය එකහමාරක් පමණ හිඳිමින් භාවනා කරති. ඉන්පසු සවස හතර වන තුරු සක්මනේ යෙදෙති. රාත්‍රි 7-8 වන තුරු සක්මන් කර වැසි නැත්නම් නැවත සක්මනේ යෙදෙයි. සාමාන්‍යයෙන් රාත්‍රී 11 සිට අළුයම 3 දක්වා නින්දට යයි.

දෙවිවරු කණ්ඩායම් දෙකක් පැමිණි විට දෙවෙනි කණ්ඩායම එන්ට සූදානම් බව කී විට පළමු කණ්ඩායම සමුගනිති. සමහරවිට දෙවිවරු සූත්‍ර දේශනා ගැන අසති. දේශනාවල නම් දැනට භාවිතයේ නොමැති ඉතා පැරණි නම කියති. එවිට ඒ අයට අවශ්‍ය සූත්‍ර දේශනා කරණ විට එය නොව අන් සූත්‍රයක් බව දැනුම් දෙති. එවිට එය මතක් කිරීමට එම සූත්‍රයේ ගාථාවක් සජ්ඣායනා කරති. එවැනි ගාථා එකක් දෙකක් කී විට සූත්‍රය මතක් වේ.

සමහර විට, දෙවිවරු සහ නාගයෝ එක වෙලාවේ පැමිණ ධර්මය අසති. මෙය නිතරම සිදුවෙන විට ඒ අයට විශේෂ කාලය නියම කරති. උන්වහන්සේ මහ ඝන කැලෑවේ හුදකලාව වාසය කළත් මේ නිසා නිදහසක් නැත. නොයෙක් දේව කායිකයන් පැමිණෙන බැවිනි. මනුෂ්‍යයෝ එම ප්‍රදේශවලට නොපැමිණෙන බැවින් දිවා කාලය තරමක නිදහස ඇත. ගම් වලට ආසන්නව සිටින විට සවස් යාමයේ මිනිසුන්ට ධර්මය දේශනා කරති. ඉන්පසු භික්ෂූන්ටත්, රෑ බෝ වූ විට අමනුෂ්‍යයන්ටත් දේශනා කරති.

## වෙනස ඇත්තේ සිතුවිලිවල

ආචාර්‍යය මන් දැකීමට පැමිණි දෙවියන් ගැන ලියා ඇති බැවින් දැන් මිනිසුන් ගැන ලියමි. මමද මිනිස් වර්ගයාට අයත් බැවින් මීට ඇතුළත් වේ. මේ පිළිබඳ ලියන විට යමක් නුසුදුසු දැයි වැටහේ නම් ඊට මම සමාව අයදිමි. මගේ චරිතය මැර වැර එකකි. ඒ බව මේ පොත කියවන විට සනාථ විය හැකිය. ආචාර්‍යය මන් තම අනුගාමිකයින්ට පුද්ගලිකව කියා ඇති දේ මෙහි අඩංගු කරමි. ඊට මට සමාවේවා. මෙය මා ලියන්නේ ඔබට දෙවිවරු සහ මිනිසා අතර වෙනස දැන ගැනීම පිණිසය.

දෙවිවරු උන්වහන්සේ සමඟ කථා කරණ විධියට වඩා මිනිසුන් කථා කරණ විධිය හාත්පසින් වෙනස් වේ. ධර්ම දේශනාව සාවධානව අසා සියල්ල තේරුම් ගැනීමේ ශක්තියක් දෙවියන්ට ඇත. දේශනය අවසානයේදී සාධු, සාධු, සාධු යැයි තුන් වරක් සාධුකාර දෙති. ඒ නාදය මුළු සක්වලවල් වල නින්නාද වේ. එහෙත්

මිනිසුන්ට නොඇසේ. සියලුම දෙවිවරු භික්ෂූන්වහන්සේලාට අප්‍රමාණ භක්ති, ගෞරව කරති. එක් කෙනෙක්වත් ධර්මය ලිහිල් කර හිතුමනාපේ නොහැසිරෙති. ධර්මය අසන්ට එන විලාසය ඉතාම ලක්ෂණ පිළිවෙලට සිහි කල්පනාවෙන් හෙමිහිට පැමිණෙති. මිනිසුන් එසේ නොව කියාදෙන ධර්මය නොතේරේ. නැවත නැවත කීවත් සිතට නොගනිති. කියන දේ අසා දැන එය ක්‍රියාත්මක නොකරති. ඒ නමුත් ධර්ම දේශනය විවේචනය කරති. කිසි ගෞරවයක් නැතිව ''ඔහු මොනවාද ඒ කියන්නේ ? කිසි තේරුමක් නැතැයි කියති.'' අසවල් භික්ෂුව තරම් හොඳ නැහැ'' කියති. කලින් මහණ වී ඇති අය ''මම මහණ වී සිටින කාලයේ ඔයිට වඩා හොඳට බණ කියනවා. මම බණ කියන විට මිනිස්සු සිනාසෙනවා. මම විහිළුකරනවා නැත්නම් බාගයක් නිදි'' කියති. සමහරු මෙසේද කියත්. ''මේ භික්ෂුව අනුන්ගේ සිත් දන්නවා නම් මම මේ හිතන දේ ඇයි නොදන්නේ දන්නවා නම් අඩු තරමින් යම් දෙයක් කියාවි. මේ වේලාවේ අසවල් අය මෙහෙම හිතනවා'' එවිට අපට ඔප්පු වෙනවානෙ. ඇත්තෙන්ම අපේ සිත් දන්න බව මෙසේ සමච්චල කරති. සමහරු වැරදි බලන්න එති. තමාගේ දැනුම ඊට වඩා වැඩි බව කියති. මේ අය ධර්මය ගැන කිසි උනන්දුවක් නැත. බණ කියාදීමේ වැඩක් නැත. තාරාවගේ පිටේ වතුර වක් කරනවා මෙනි. එක බිනිඳුවක්වත් එහි නොරැඳේ.

ආචාර්‍ය්‍ය මන් මෙවැනි දේ කියමින් සිනාසෙති. මෙවැනි ''දක්ෂ'' අය උන්වහන්සේට විටින් විට මුණ ගැහේ. සමහරු තම දෘෂ්ටියේ සිට තම මතය කියා පායි. එය ඔප්පු කරන්නට කරුණු ඉදිරිපත් කරත්. සමහරු තම මානය කෙතරම්ද කිවහොත් කිසිවක් කථා නොකරති. සමහරුන්ගේ මානය කෙතරම්ද යත් උන්වහන්සේ ඔවුන්ට ධර්මය දේශනා නොකරති. එහෙත් සමාජයේ සිටින විට යමක් කියන්නට සිදුවේ. එහෙත් උන්වහන්සේ කථා කරන්ට පටන් ගත් විට කිසිවක් කිය නොහැකිය. ධර්මය අමතක වී යයි. මානය ඉදිරියේ ධර්මය පරාජය වී පලාගියේය. උන්වහන්සේගේ ශරීරය පමණක් නිශ්චලව ඇත. අප්‍රාණික බෝනික්කෙක් මෙන් සිටී. සිත අක්‍රියකාරී වූ විට ධර්මය ගලා එන්නේ කෙසේද?

මෙවැනි දේ කියමින් ආචාර්ය මන් තම ශ්‍රාවකයින් සමග සිනාසෙති. අසා සිටි අය අතර සමහරුන්ට උණ ගනී. සමහරු ශීතලේ වෙව්ලති. ශීතල දේශගුණයක් නැතිව ඇඟ වෙව්ලයි. සමහර තද මාන්නක්කාර අයට උන්වහන්සේ දේශනා කරන්නේ නැත. එය විෂ වී ඔවුන් රෝගාතුර වන බැවිනි. ධර්මයට භක්ති, ආදර ගෞරවයෙන් නොඅසන අයට මෙසේ දුක් විපාක විඳින්නට සිදුවේ. උන්වහන්සේගේ ධර්මය ගෝචර වන්නේ ඉතා හොඳ නිහතමානී අයටය. ධර්මය අසන විට එම පිරිස අතර සමහරුන්ට උෂ්ණය ඉවසිය නොහැකිය. සමහරුන්ට ශීතල ඉවසිය නොහැකිවේ. සමහරු සිත සමාධිගත වී අහසේ පාවෙන්නාක් මෙන් සැහැල්ලු වේ. මේ සියලලටම හේතුව තම හදවතේ ඇති සිතිවිලි වේ. ධර්මය දරා ගැනිමට බැරි කෙනෙකුට කිසි උපකාරයක් කළ නොහැකිය. එවැනි අයට

ධර්මය දේශනා කළ විට එය ඔවුන්ගේ පරිහානිය වේ. එබැවින් මිනිසුන්ට ධර්මය දේශනා කිරීම අසීරු කරුණකි. ටික දෙනෙක් අතර වුවද, මෙවැනි හානියට පත්වෙන අය ඇත. ආචාර්ය මන් එවැනි අවස්ථාවලදී ඔවුන් අත් හරිති. අකුසල කර්ම විපාක බලවත් බැවින් ඔවුන්ට ධර්මය ගෝචර නොවේ.

සමහරු ඉතා ගුණ ගරුක ජීවිත ගත කරමින් ධර්මය සොයා එති. එවැනි අය ඉතා විරලය. ඒ අයට උන්වහන්සේ ධර්මය වදාරති. ධර්මයට පටහැනි ජීවිත ගත කරන අය බොහෝය. එබැවින් උන්වහන්සේ වනාන්තර ගත වී සිටිති. එහි උන්වහන්සේට කැමති අන්දමින් භාවනා පිළිවෙත් රැකීමට හැකිය. කිසිවෙකුගෙන් බලපෑමක් නැත. උන්වහන්සේ දකින හැමදේම, අසන හැමදේම, සිතන හැමදේම, ධර්මය වේ. ඉන් අසීමිත තෘප්තියට පත්වේ. කැලෑ වන සතුන් වඳුරු, ගිබන්, ලැගුන් ගුවර් දවස පුරා අතුවල එල්ලී ක්‍රීඩා කරති. එකිනෙකාට කථා කරණ ශබ්ද වනය දෝංකාර කරමින් උන්වහන්සේගේ සිතේ පුදුම අස්වැසිල්ලක් ඇති කෙරේ. ඔවුන් උන්වහන්සේට කිසියම් බලපෑමක් නැත. දුව පැන ඇවිදිමින් ආහාර සොයති. මෙම සුන්දර භූදකලාව සෑම අතින්ම චමත්කාරජනකය. ඒ මොහොතේ අවසාන හුස්ම හෙලුවත් ප්‍රශ්නයක් නැත. තමන් මේ ලෝකයට තනිව පැමිණ තනිව යන්නේය. එය ස්වාභාවිකය. රහතන්වහන්සේ මෙසේ නිරවුල්ව පිරිනිවන් පාති. සිතේ කිසිම දුකක්, බයක්, සැකක්, ආසාවක් නැත. එක කයක් සහ සිතක් ඇත. එක අරමුණකි. එනම් නිවනයි. කිසි වගකීමක් නැත. ඒ ආර්ය පුද්ගලයෝ උතුම් ජීවිත ගත කර උතුම් ලෙස ලෝකයෙන් සමුගනිති. අති පාරිශුද්ධ සිත තුළ කිසියම් ඇලීම් ගැටීම් නැත. මෙය සාමාන්‍ය මිනිසාගේ ජිවිතයට වඩා හාත්පසින් වෙනස් වේ. මිනිසා තම අතෘප්තිකර හදවත තව තවත් ආසාවලින් පුරවා මහා බරක් උසුලයි. මේ ආර්යවතුන් වහනසේලා සියල්ල අත්හැර හිස් කරති. බරක් ඉසිලීමක් නැත. සිත නිදහස්ය, හිස්ය, සුහදතාවයකි. කිසිවක් ඇතුල් කිරීමක් හෝ පිට කිරීමක් නැත. ඕනෑ එපා කමක් නැත. ගණුදෙණුවක් නැත. ලාභ අලාභ නැත. වැඩ නිමවා අවසානය. කළයුතු තව කිසිවක් නැත. මෙසේ වැඩ අත්හැරීම යනු ඉහළම සතුටකි. නමුත් මිනිසා නිරන්තරයෙන්ම වැඩෙහි යෙදෙමින් ජීවිතය දුකින් පුරවා ගනියි. ඔහුට ඉන් මිදීමක් නැත. මරණ මොහොතේ දී වත් නිදහස නැත. වැඩ ඉවර නැත.

ආචාර්ය මන් සහ දෙවියන් අතර ඉතා කිට්ටු සම්බන්ධතාවයක් තිබුණි. එහෙත් මා ඉන් සමහරක් පමණක් මතකයෙන් ලියා ඇත. උන්වහන්ස් නොයෙක් පළාත්වල සැරිසරණ විට ලැබූ අත්දැකීම් විවිධය. දෙවියන් ගැන නිතරම පවසති. එය ගොනු කිරීමට නොහැකිය. උන්වහන්සේගේ ජීවිත ප්‍රවෘත්තිය ගැන ලියන බැවින් දෙවියන් ගැන තොරතුරු විටින් විට සඳහන් වේ. ඊට පාඨකයාගෙ ් සමාව මම අයදිමි.

මීට අවුරුදු 20කට ප්‍රථම ආචාර්ය මන් පිරිනිවන් පෑහ. එබැවින් මේ දක්වන්නේ එවැනි කාලසීමක තොරතුරු වෙත්. එකල සිටි දෙව්වරු සහ මිනිසුන් දැන් වෙනස් වී ඇතැයි සිතමි. වර්තමානයේ ජීවත් වන නවීන ලෝකයේ සිටින අය ඉතා සීමිත ආධ්‍යාත්මික ගුණ වගාවක් ඇති පිරිස වේ. ආචාර්ය මන් සමඟ විවාද කළ අය වැනි අය දැන් දක්නට නැත. අධ්‍යාපනය අතින් බොහෝ විශාල වෙනසක් ඇත. උගත් ලෝකයා අතර එතරම් මිලේච්ඡ අදහස් නැත. එබැවින් අද ලෝකය තරමක් සාධාරණය.

ආචාර්ය මන් උදෙන් තානි ප්‍රදේශයේ භික්ෂූන්ට හා මිනිසුන්ට ධර්ම දේශනා කරමින් බොහෝ කාලයක් ගත කළහ. ඉන්පසු නැගෙනහිර ප්‍රදේශයේ සකොන් නබොන් පලාතට ගමන් කළහ. කඳු හෙල් අතර කුඩා ගම්මාන පසු කරමින් නබොන් ෆනොම් හරහා ශ්‍රී සොංක්‍රම් ප්‍රදේශයේ ගම්මාවන වල සැරි සැරූහ. මේ පලාත් ඉතා දුෂ්කර කැලෑබද මැලේරියා රෝගය පැතිරී අති පළාත් විය. මැලේරියාව සුව කළ නොහැක. බොහෝ කල් දුක් විඳිමින් ජීවත් වන්නට සිදුවේ. මා කලින් පැවසුවාක් මෙන් ''නැදිමයිලන්ගේ නින්දාව'' යනුවෙන් මෙම රෝගය නම් කරති. මක්නිසාද මේ රෝගීන්ට ඇවිදින්ට සහ ආහාර ගැනීමට හැකි නමුත් කිසියම් වැඩක් කිරීමට නොහැකි වීමයි. එබැවින් අනුන්ගේ අපහාසවලට පත්වේ. සමහරු මරණයට පත්වෙති. වස් තුනක් එනම් අවුරුදු 3ක් ආචාර්ය මන් මෙහි රැඳී සිටියහ. මේ කාලය තුළදී භික්ෂූන් වහන්සේලා කීප නමක් මේ රෝගයෙන් අපවත් වූහ. මේ භික්ෂූන් ඈත සරු ගම්මාන වලින් පැමිණි බැවින් මැලේරියා රෝගය මර්දනය කළ නොහැකිවිය. ආචාර්ය මන් සමඟ මහා කැලයේ ජීවත් වීමට නුපුරුදු බැවින් අවට ගම්මානයේ කුඹුරු ආසන්න ප්‍රදේශයට ගියහ.

ආචාර්ය මන් මේ ප්‍රදේශයේ සවස් යාමයේ භික්ෂුන් හා සාමණේරයින්ට බණ කියති. සොංක්‍රත් ගඟේ වාසය කරණ එක්තරා නාගයෙක් බණ ඇසීමට නිතරම එයි. නියමිත වෙලාවට එන්ට නොහැකි වූ විට රාත්‍රියේ ආචාර්ය මන් සමාධි වූ විට පැමිණෙයි. දෙව්වරු ඉහළ දේව ලෝක වලින් හා පහළ දේව ලෝක වලින් පැමිණෙති. ඒ අය විශේෂයෙන්ම වස් සමාදන් වන දිනය, මධ්‍යම දිනය, අවසාන දිනය නොවරදවාම පැමිණෙති. ආචාර්ය මන්ගේ දේශන වලට සවන් දීමට නිතරම දෙව්වරු වඩිති.

## ලිඳ සෑරීමේ සිද්ධිය

බං සං ෆොං ගමේ වාසය කරණ කාලයේ අමුතු සිද්ධියකට ආචාර්ය මන් මුහුණ දුනි. එය පායන කාලය බැවින් ජල පහසුකම් නොවීය. භික්ෂූන් වහන්සේලා 60-70 ක් පමණ එහි විසූහ. ගමේ මිනිසුන් සමඟ කතිකා කර ලිඳ තව ගැඹුරට

සෑරීමට පටන් ගති. එහෙත් ආචාර්ය මන්ගේ අවසර ලැබුණේ නැත. උන්වහන්සේ ස්ථිර ස්වරයකින් එය ඉතාම අන්තරාදායක බව පැවසූහ භික්ෂූන්වහන්සේලාට එහි අර්ථය අදහාගත නොහී ළිං කැනීමට ගියහ.

ළිඳ පිහිටියේ ආශ්‍රමයෙන් සෑහෙන දුරය. දවල් කාලයේ ආචාර්ය මන් සැතපෙන බව සිතා රහසින් පිට වී ගොස් ළිං කැපීම කළහ. වැඩි කාලයක් ගතවීමට පෙර ළිං ඉවුර කඩා වැටී ළිඳට වැටුණි. දැන් අවට ප්‍රදේශයේ ඇත්තේ විශාල පාතාලයකි. සියලු දෙනාම භයින් ත්‍රස්ත වූහ. ආචාර්ය මන්ගේ අවවාදය නොපිළිගත් බැවින් පොළොව කඩා වැටුණු නමුත් මිනිස් ජීවිත යන්තමින් බේරුණි. ආචාර්ය මන් තමන් කළ ක්‍රියාව දැන ගනිතියැයි වඩාත් බිය විය. ඔව්හු විශාල දැව රැගෙන විත් ආචාර්ය මන්ගේ ආශිර්වාද ලැබේවායයි සිතමින් ළිං කට ප්‍රතිසංස්කරණය කළහ. දැන් ළිඳේ වතුර ටිකක්වත් නොමැත. පුදුමයකට මෙන් ආචාර්ය මන් සිහිපත් කරමින් ඒ සියල්ල කිරීමට හැකිවිය.

වැඩ නිමා වූ විගස සියලු දෙනාම පිට වී ගියහ. ආචාර්ය මන් එහි පැමිණෙතියි සැක ඇති බැවිනි. සවස ධර්ම සාකච්ඡා කාලය ළං වූ විට එම භික්ෂුන් වහන්සේලා සැකෙන් බියෙන් සිටියහ. මෙවැනි දේ සිදු වූ විට ආචාර්ය මන්ගේ දැඩි විරෝධය පළකර ඇති බැවිනි. සමහරවිට යම් භික්ෂුවක් වරදක් කොට එය අමතක කළ විට සවස ආචාර්ය මන් එම සිද්ධිය අළලා දේශනයක් පවත්වති. ළිඳ කැනීම සියලුම භික්ෂූන්වහන්සේලා කළ වරදකි. එය ඒකාන්තයෙන්ම ආචාර්ය මන් දකිති. එදා සවස හෝ පසුදා උදේ එම දේශනාවට සවන් දිය යුතු බව ඔවුන් දැන සිටියහ. දවස පුරාම මෙම සිද්ධිය නිසා වික්ෂිප්ත සිතිවිලි වලින් දුක් වින්දහ.

පුදුමයකට මෙන් එදින මේ සිද්ධිය පිළිබඳ එක වචනයක්වත් ආචාර්ය මන් පැවසුවේ නැත. වෙනදා මෙන් ගැඹුරු ධර්ම දේශනයක් පැවැත්විය. උන්වහන්සේ මේ සිද්ධිය පමණක් නොව සාමණේර භික්ෂූන්ගේ නොයෙක් වරද දුටුවේය. ඔවුන් මේ පිළිබඳ වික්ෂිප්ත සිතින් සිටින බවද දනිති. තම වරද පිළිගත් බැවින් තව දුරටත් දඬුවම් කිරීමට අවශ්‍ය නොවීය.

පසුදා උදෑසන පුරුදු පරිදි සමාධි සුවයෙන් නැගී සිට සක්මන් කරමින් පිඩුසිඟා වැඩීමට කාලය එනතුරු සිටිති. එදින උදේ උන්වහන්සේ ධර්ම ශාලාවට පැමිණෙන විට සියල්ලෝම දැඩි වික්ෂිප්ත භාවයෙන් සිටියහ. නමුත් ආචාර්ය මන් කරුණාවෙන් සුවච මුදු වදනින් දේශනය කළහ.

''අප මෙහි පැමිණියේ ධර්මය හැදෑරීමටය. අප අනවශ්‍ය ලෙස උදාරම් නොවිය යුතුය. එසේම අනවශ්‍ය ලෙස බියගුළු නොවිය යුතුය. සියලු දෙනාම වැරදි කරති. වරද පිළිගැනීම අවශ්‍ය වේ. අප බුදුරජාණන් වහන්සේද ඇත

අතීතයේ අප මෙන් වරදෙහි බැඳී සිටියහ. එහෙත් තම වැරැද්ද හඳුනාගත් පසු එවැනි දේ නැවත නොකිරීමට අධිෂ්ඨාන කළහ. මෙවැනි චේතනා උතුම් වුවද අවිද්‍යා මෝහය නිසා වැරදි සිදුවේ. මින් මතු ඔබ සැවොම තම සිත් පාලනය කළ යුතුය. නිතරම සතියෙන් තම ක්‍රියාවන් කළ යුතුයි.''

මෙපමණක් පවසා සියලු දෙනා දෙස බලා සිනාසී වෙන දා මෙන් පිඬු පිණිස වැඩියහ. එදින සවස දේශනා නොතිබුණි. තමන්ගේ භාවනා ප්‍රතිපත්ති හොඳාකාර සිදුකරණ මෙන් අවවාද කළහ. මෙසේ රාත්‍රී 3ක් ගතවිය. සියලුම භික්ෂූන් වනහන්සේලා තමන් වික්ෂිප්තව සිටිති. ළිං කැපීම ගැන කථාවක් නැත. 4 වෙනිදා රැස්වූ විට ළිඳ පිළිබඳ කිසි සඳහනක් නොවීය.

ඊට බොහෝ කාලයකට පසු සියළු දෙනාටම ළිඳ ගැන අමතක වී ඇත. ඉබේම එම සිද්ධිය ගැන කථා කළහ. ළිං ගැට්ට කඩා වැටුණු බව කිසිවෙක් නොකියා රහසිගතව සැඟවූහ. ආචාර්යය මන් ළිඳ ප්‍රදේශයට ගියේද නැත. වෙනදා මෙන් ධර්ම සාකච්ඡාව ඇරඹුණි. භික්ෂූන් වහන්සේලාගේ විනය පිළිබඳ වද ගුරුන්ට සහ ධර්මයට ගරු කළ යුතු බවද පැවසූහ. යමෙක් ගුරුවරයෙකුගෙ ් අවවාද අනුශාසනා පිළිගත යුතුය. කර්ම විපාක හේතු ඵල න්‍යාය නිසි ලෙස වටහා ගත යුතුයි.

ඔබ නිතරම තම ආසාවන් නිසා කනස්සල්ලෙන් පසුවෙති. එසේ වූ විට ඔබ තුළ ඇති ධර්මය වැනසේ. එවිට දුක ඉක්මවීමට නොහැකිය. ඔබගේ අරමුණ ක්‍රමයෙන් වෙනස් වේ. ධර්මයට විරුද්ධව කිසිවක් කළ යුතු නැත. විනය විරෝධී නොවිය යුතුය තමන් ගෞරව කරන ගුරුවරයා ඉක්මවා නොගිය යුතුය. ඉන් ඔබම විනාශ වන බැවිනි. අකීකරු භාවය නිසා වැරදි පුරුදු වලට ඇබ්බැහි වේ. එවිට තමන් සහ අනුන් වැනසේ. අර ළිඳ වටේ මැටි පමණක් නොව යට වැලි තට්ටුවක් තිබුණි. ළිඳ ගැඹුරට හාරණ විට එම වැල්ල කඩා ළිඳ තුළට වැටේ. යම් කෙනෙක් එහි යට වී මරණයට පත්විය හැකිය. එබැවින් ළිඳ කැනීමට අවසර නොදුන්නෙමි. සියල්ල හොඳාකාර පරීක්ෂා කර මම තීරණයකට එළඹෙමි. ඔබ පුහුණුවෙමින් පසුවෙන බැවින් මේ කරුණ හොඳාකාර සිත තබා ගන්න.

මම එය ප්‍රතික්ෂේප කළ බව දැන දැනත් එය නොකළාක් මෙන් සැඟ වූයේ ඇයි ? මම එපා කියන දේ ඔබ කරති. යමක් කරන්නට කී විට ඊට විරුද්ධ දේ කරති. මෙවැනි හැසිරීම ඔබේ දඩබ්බර චරිතය විදහා පායි. ඔබේ දෙමව්පියන්ටත් එවැනි දේ කළ නමුත් ඒ අය නිතරම සමාව දුනි. ඒ පුරුදු දැන් තම චරිතය බවට පත් වී ඇත. එපමනක් නොව තම ගුරුවරයාටත් තම ධර්මයටත් විරුද්ධ වෙති. එවැනි නොහික්මුණු තද ගති භික්ෂුවකට නොහොබී. පොඩි දරුවන් මෙන් නරක හැසිරීමකි. මේ පුරුදු ඉදිරියට ගෙන ගිය විට ''දඩබ්බර ධූතාංග භික්ෂූන්'' යැයි

ප්‍රසිද්ධ වේ. ඔබ පරිහරණය කරණ දේ අසවල් දඩබ්බර ධූතාංග භික්ෂුන්ගෙ ් යැයි හඳුන්වනු ලැබේ. මේ භික්ෂුව දඩබ්බරය, අර භික්ෂුව අලප්පීය. අනිත් භික්ෂුව සිහි මුලාවෙනි. මුළු ආශ්‍රමයම ඒ අයගෙන් පිරී ඇත මට ඉතිරිවන්නේ මානයෙන් උදුම්මවාගත් ගෝල පිරිසකි. සෑවොම හිතුවක්කාර කමින් කල් යවති. ශාසනයේ පරිහානිය එයම වේ. හිතුවක්කාර වීමට කැමති ඔබ කිසිවෙක් ඇද්ද ? එම හිතුවක්කාර භික්ෂූන්ගේ ගුරුවරයා කීමට ඔබ කිසිවෙක් කැමතිද ? එසේ නම් ඔබ නැවතත් එහි ගොස් ළිඳ සෑරීම කරන්න. එවි පස් කන්ද කඩා වැටී ඔබ යට වෙනවා ඇත. එවිට ඔබ හිතුවක්කාර දෙවියන්ගේ ලෝකයෙහි ඉපිද සියලු දෙවිවරු ඔබට ආ වඩනවා ඇත. ඇත්තෙන්ම එවැනි දේව ලෝක හෝ බ්‍රහ්ම ලෝක නැත.

ඉන්පසු උන්වහන්සේගේ කතා ශෛලීය වෙනස් විය. අසා සිටි අය එම දේශනයේ අර්ථය හොඳින් නිරාකරණය කළහ. ඔවුන්ගේ දඩබ්බර නොමනා හැසිරීම පිළිගත්හ. උන්වහන්සේ කථා කරන විට කිසිවෙකුට හුස්ම ගන්ට හෝ අමතක විය. එතරම් තදින් සිත ආවර්ජනය විය. දේශනාවසනායේදී එක් එක් භික්ෂුව මෙම පුවත ආචාර්ය මන්ට දැන්වූයේ කවුදැයි කතිකා කළහ. එහෙත් කිසිවෙක් මෙය නොදැන්වූහ. එය ඒකාන්තයෙන් තමන්ටම දොස් පැවරීමක් වන බැවිනි. එය කීවේ කවරෙක්දැයි තවමත් නොදනිති.

සාරිකා ගල් ගුහාවේදී ආචාර්ය මන් නොයෙක් ත්‍රිවිද්‍යා අෂ්ට විද්‍යා ඥාණ පහළ කළහ. යල් යාමේදී උන්වහන්සේගේ දක්ෂතාවය අසීමිත විය. උන්වහන්සේ සමඟ වාසය කරණ භික්ෂූන් මේ පිළිබඳ හොඳාකාර දනිති. එබැවින් තම ආකල්ප සමාකල්ප ඉතා සූක්ෂම අන්දමින් සංවර විය. තම සිතුවිලි සතිවිරහනයෙන් පැවති විට සවස් යාමයේ දේශනයේදී එය සාකච්ඡාවට භාජනය විය. එවිට තමන් ඉතාම සුපරීක්ෂාකාරීව එම දේශනයට සවන් දිය යුතුය. එම මොහොතේ තමන්ගෙ ් සිතුවිලි උන්වහන්සේ දන්නා බැවිනි. එහෙයින් එම මොහොතේම එය ඉලක්ක විය හැකිය. උන්වහන්සේ මොහොතකට කථාව නැවැත් වුවහොත් භික්ෂූන්ගේ සිතිවිලි පරීක්ෂා කරණ බව දනිති. මොහොතකින් එම අදහස් විදහා දක්වමින් රංගනය කරති. නමක් සඳහන් නොවුවද එම සිතිවිලි දරන්නා එවැන්නක් මින් මතු නොකිරීමට හික්මෙති. නැවත කිසි දිනෙක එවැනි සිතිවිල්ලක් සිතීමෙන් වැළකෙති.

උන්වහන්සේ සමඟ පිණ්ඩපාත චාරිකාවේ යන විටද ඉතාම සුපරීක්ෂාකාරී විය යුතුය. අනවශ්‍ය දේ සිතමින් පිඬු පිණිස වඩින භික්ෂුවට ඒ පිළිබඳ විවේචනය සවස ධර්ම සාකච්ඡාවේදී අසන්නට ලැබේ. තමන්ගේ නොමනා සිතුවිලි ගැන ඇසීමට ලැජ්ජා ඇත. අන් භික්ෂූන් තමා දෙස බලතියි සිතේ. අසවල් පුද්ගලයා යැයි හඳුනා ගත්විට සියලුම භික්ෂූන් අනුකම්පා කෙරෙත්. දේශනාවසානයේ

කිසිවෙකුගේ සිත් අමනාප නොවේ. සමහරු එය සිනහ මුහුණින් පිළිගනිති. ''අද අඩුවුයේ කවුද ?''යි අසති. තම වරද පිළිගන්නේ ඉතාම අවංක ලෙසය. තම වරද සඟවා සිටීමට නොපෙළඹේ. යමෙක් ඇසුවොත් වරදකරුවා තමන් බව නොසඟවා කියයි. ''මම ඉතාම මුරණ්ඩු කෙනෙක් ඔවැනි අදහස් සිතීමට, මට බැණුම් අසන්නට සිදුවන බව දැනුණි. එවැනි දේ සිතන විට ආචාර්ය මන් දනිතියි මට අමතක විය. මම හොඳ පාඩමක් ඉගෙන ගතිමි. මින් මතු එසේ නොමනා දේ නොසිතමි

මෙය කියවන ඔබගෙන් මම සමාව අයදිමි. මෙවැනි දේ ලිවීමට මා නොකැමති වෙමි. එහෙත් මෙවා සත්‍ය කරුණු වේ. සත්‍ය සිද්ධීන්ය. මෙය පොතට ඇතුළත් කළ යුතුදැයි මම හොඳාකාර විවේචනය කළෙමි. මම ඉදිරිපත් කරන්නේ සත්‍ය ප්‍රවෘත්තියක් නම් එහි වරදක් නැතැයි සිතමි. යම් භික්ෂුවක් පෝය කිරීමේදී තම වරද පාපොච්ඡාරණය කර සමාව ගැනීමක් විනයේ සඳහන් වේ. ඉන්පසු තමා වරදින් නිදහස් වේ. මෙවැනි අවස්ථාවලදී ඔබට මෙම කරුණු අනුව සිතා තම වරද පිළිගෙන සිත නිදහස් කරගත හැකිවේ යැයි මම සිතමි.

භාවනා පිළිවෙත් රකින භික්ෂූන් බොහෝ විට ආචාර්ය මන්ගෙන් තරවටු ලබන්නේ බාහිර අරමුණු ගැන සිතන ආකාරයට. ඇසට පෙනෙන රූප, කණට ඇහෙන ශබ්ද ගැන බෙහෝ විට සිත වික්ෂිප්ත වේ. උදෑසන පිණ්ඩපාතය පිණිස යන විට මෙවැනි අරමුණු ස්පර්ශ වේ. පිණ්ඩපාතය පිණිස ඇවිදීම භික්ෂුවට අයත් කාර්යයකි. සමහරවිට එම අරමුණු ගැන නැවත නැවත සිතීම නිසා නොදැනුවත්වම සිත විසිරී යයි. තමන්ට එවැනි දේ ගැන සිතීමට අවශ්‍ය නොවූවත්, එම සිතිවිලි ගලා ඒ. සවස් වන විට එම සිතිවිලි පිළිබඳ භාවනා ශාලාවේදී ආචාර්ය මන්ගෙන් චෝදනා ලැබේ. ටික දිනකට පසු නැවත පිඬු පිණිස යන විට එම අරමුණ ස්පර්ෂ වේ. එවිට තුවාලය පෑරේ. එවිට සැර බෙහෙත් අචාර්ය මන්ගෙන් ලැබේ. ආචාර්යය මන් සමඟ වාසය කරන බොහෝ භික්ෂූන්ට එවැනි පැසවන තුවාල තිබුණි. එක්කෙනෙක් නැත්නම් තව කෙනෙකුට බෙහෙත් ලැබේ. ගමට යන හැම අවස්ථාවේදීම මෙවැනි අරමුණු වලින් මිදීමක් නැත. කෙළෙස් සහිත පුද්ගලයින්ට මෙවැනි හොඳ හෝ නරක සිතිවිලි ඇතිවීම ස්වාභාවිකය. එහෙත් ඒවා භාවනා මනසිකාරයට පීඩා වන්නේ නම් පමණක් ආචාර්ය මන්ගේ විරෝධය ඇත. ධර්මයට අනුව සිතීම සති, පඤ්ඤා දියුණු කිරීම නිසා සියලු දුක් නසන්නට හැකිවේ. ගුරුවරයාගේ කාර්ය භාරය තව තවත් වැඩි වන්නේ මෙසේ නොමනා හැසිරීම් නිසාය. බොහෝ ගණනක් භික්ෂූන් වාසය කරණ බැවින් දිනපතාම එවැනි දෝෂාරෝපණ අසන්නට වේ.

ගුරුවරයෙක් වශයෙන් උන්වහන්සේට තිබූ පරචිත්ත විඤ්ඤාණය නිසා තම ශිෂ්‍යයන් ගැන මනා අවබෝධයකින් උන්වහන්සේ සිටිත්. වරදකරුවා

නිරන්තරයෙන්ම ආචාර්ය මන් විසින් දකිනු ලබයි. එබැවින් සුදුසු අවවාද දී සති සංවරයෙහි පිහිටති. එබැවින් එවැනි සිත්වල එල්බ ගැනීම පුරුද්දක් වශයෙන් නොකරති.

උන්වහන්සේ සෑම සුළු දෙයක් වුවද අවධානයට ලක් කරති. විනය කරුණු, හැසිරීම ගැන නිතර අවවාද දෙන අතර සමාධි, පඤ්ඤා වැඩීමට උපදෙස් දෙති. සාරිකා ගල් ගුහාවේදී උන්වහන්සේ සති, සමාධි, පඤ්ඤා පිළිබඳ නිපුණතවයක් ලද බැවින් එම දක්ෂතාවය තම ශිෂ්‍යයින්ගේ ප්‍රඥාවට ඉතා අදාළ විය. එම භික්ෂූහු එබැවින් නිරන්තරයෙන් සමාධි පඤ්ඤාවේ නියැලී සිටියහ.

ආචාර්ය මන්ගේ සමාධි ඉතා විශිෂ්ටය. ඛණික සමාධි, උපචාර සමාධි, අර්පනා සමාධි එක සේ දියුණුව පැවතුනි. එක් සමාධියකින් තවත් සමාධියකට යත්. ඉන්පසු නැවතත් එම සමාධියට යත්. ඛණික සමාධියෙන් උපචාරයට පත් වූ විට ලක්ෂ ගණන් අරමුණු දිස්වේ. ප්‍රේත, දේව, නාග ආදීන්ගේ අනන්ත භාවයන් දකී. උපචාර සමාධියෙන් දෙවියන් ආදී අතීන්ද්‍රිය දේ දකී. ඇසේ. එය මනුෂ්‍ය ඇස්, කන් වලට විෂය නොවේ. සමහර අවස්ථාවන්හිදී උන්වහන්සේගේ සිත සිරුරෙන් ගිලිහී පාවී ඉහළ දේව ලෝක බ්‍රහ්ම ලෝක වලට ගොස් එහි ආකාරය දකී. සමහර විට අපාය ලෝකවලට යයි. භයානක දුක් විඳින සත්ත්වයන් දකී.

මෙසේ උඩ, යට ආදී වචන භාවිතා කළ නමුත් සිතිවිලි වලට එය අදාළ නොවේ. එය ඉතා සියුම් බැවින් විස්තර කළ නොහැකිය. ශරීරය වැනි ඝන දේ උඩ යට යාමට යම් ශක්තියක් අවශ්‍ය වුවද සිත් ගමන් කිරීමට එවැනි ශක්ති අවශ්‍ය නොවේ. දේව ලෝක, බ්‍රහ්ම ලෝක, නිවන, අපාය ආදිය අප විස්තර කරණ විට අප ඉහළ, පහළ ආදී මිනුම් දණ්ඩක් යෙදුවත් මානසික ක්‍රියාකාරිත්වයට එවැනි මැනීමක් කළ නොහැකිය. ඉහළ බ්‍රහ්ම ලෝක සහ පහළ දේව ලේක ගැන සිතන විට අපේ බන්ධනාගාරවල සිටින අයි. ආර්. සී දැඩි සිරකරුවන්, සුළු දඬුවම් විඳින සිරකරුවන් සමඟ එක බන්ධනාගාරයේ සිටින්නාක් මෙනි. මේ බන්ධනාග ාරය පිහිටා ඇත්තේ සාමාන්‍ය මිනිසුන් සිටින පරිසරයකය. මේ සියලු දෙනාම මිනිස් වර්ගයට අයත් වෙති. එකම රටක එකම පළාතක වාය කරති. වෙනසක් ඇත්තේ ඒ අය යම් ආකාරයකින් කොටු වී සිටීමයි.

මෙම සිරගත අය සමඟ සාමානය වැසියන්ට තම ඇස්, කන් ආදී ඉන්ද්‍රිහු තුළින් අදහස් හුවමාරු කරගත හැකිවේ. එහෙත් තමන් කොටු වී සිටින බැවින් සමබරතාවයක් නොමැත. එසේම අපායේ සිටින ජීවීන්ට දේව ලෝක ගැන හැඟීමක් නැත. ඒ දෙගොල්ලන්ටම බ්‍රහ්ම ලෝක විෂය නොවේ. මනුෂ්‍යයින්ට මේ කිසිවක් ගැන හැඟීමක් නැත. එහෙත් මිනිස් ලොව තුළ සැරිසරණ සත්ත්ව කොට්ඨාස අනන්ත වෙති. අන් අය ගැන නොදන්නා බැවින් මිනිසා තම භවය

පමනක් ඇතැයි සිතති.

සාමාන්‍යයෙන් අපට අන් අයගේ සිතිවිලි ගැන නොදැනේ. එබැවින් සිතිවිලි නැතැයි සිතිය හැකිය. අප කෙසේ සිතුවත් සියලු දෙනාටම මනසක් ඇත. සිතිවිලි ඇත. ඒවා නැතැයි සිතීම වරදකි. එය අප මෝහයෙන් ගන්නා වැරදි ආකල්පයකි.

දේව ලෝක බ්‍රහ්ම ලෝක ඉහළ පහළ වශයෙන් කතා කරණ විට එය යම් උඩ තට්ටු හා පහළ තට්ටු ගෙයක් ආකාර සිතීම වැරදි වේ. මේවායේ ඒ ආකාර පඨවි ධාතුයෙන් සැදී නැති බැවිනි. ඒවා මනින්ද්‍රියෙන් පමණක් අරමුණු කළ හැකි බැවිනි. අති පිරිසිදු සීලයෙන් හා සමාධි ගුණයෙන් සිත තියුණු වූ විට මෙම ''අසරීර'' ජීවීන් දැකීමට හැකිවේ. අපාය පොළොව යට යැයි කී විට එය පාතාල ලෝකයක් ලෙස වැටහේ. එය එසේ නොව මනසේ ගමන් කරණ ස්වභාවයකි. අපාය දැකීමට යම් අතීන්ද්‍රිය දක්‍ෂතාවයක් සමාධි භාවනාවෙන් ලැබිය යුතුවේ. තමන්ගේ අකුසල කර්ම පථ නිසා එම සත්ත්වයෝ අපායේ උපදිති. එහි මහා දුක් විඳිමින් කර්ම විපාක ඉවර වෙන තුරු එම දඬුවම් විඳිති. සිරකරුවන් තම දඬුවම් විඳ අවසන් වූ විට සිරෙන් මිදෙන්නාක් මෙන් අපාගත සත්ත්වයෝ ඒ කාල සීමාව ඉකුත් වූ විට ඉන් මිදේ.

මුල් කාලයේ සිට ආචාර්ය මන්ගේ උපචාර හා ඛණික සමාධි දියුණු වූයේ උන්වහනසේගේ ක්‍රියාශීලී නිර්භය අවදානම් සහිත උද්‍යෝගමත් සිතිවිලි නිසාය. ඛණික සමාධියට පත් වූ විගස සිත උපචාර සමාධියේ නොයෙක් ආශ්චර්‍යයමත් අත්දැකීම් සොයමින් යන්නේය. එය භාවිත වූ විට අවශ්‍ය කාලයක් එහි රැඳී සිටියි. ඉන්පසු තමා කැමති සමාධියකට පත්වේ. කැමති නම් අර්පනා සමාධියට පත් වී ධ්‍යාන කෙරේ. එවිට බොහෝ වේලා ධ්‍යාන සුවයෙන් ගත කරයි. එය ඉතාමත් සුවදායක බැවින් එහි රැඳී සිටීමට සතුටු වේ. ටික කාලයක් උන්වහන්සේ ඊට පුරුදු වී සිටි නමුත් උන්වහන්සේගේ අධික ප්‍රඥාව නිසා ඉන් බැහැර වීමට හැකි විය.

යමෙක් අර්පනා සමාධියට පුරුදු වූ විට එහි අනිත්‍යය, දුක්ඛ, අනාත්ම දැකීමට දක්‍ෂ නොවූවහොත් එහි ප්‍රගතිය දුර්වල වේ. බොහෝ අය මෙසේ තෘප්තියට පත් වී සතුටු වෙති. එවිට තදබල ලෙස ඒ පිළිබඳ ආකර්ෂණය වන සියුම් ආසාවන් හට ගනී. එබැවින් එය ප්‍රඥාවෙන් දැකීමට අකමැති වේ. මේ අවස්ථාවේ සුදුසු ගුරු උපදේශ නැති වුවහොත් ඔවුහු ප්‍රඥාව කරා නොයත්. තවද මෙසේ ධ්‍යාන ගත වූ සිත නොයෙකුත් අධිමානයෙන් යුක්ත වීමට හැකිවේ. මෙම ඉතා සියුම් සැපය ''නිවන් සැපය''යැයි වරදවා තේරුම් ගනිති. තමා දුක් කෙළවර කළ බවක් සිතේ. නමුත් සත්‍යයෙන්ම සිදු වී ඇත්තේ භවගාමී කෙළෙස් සහ සමාධි සිත එකම අරමුණක පවත්වා සිටීමයි. ප්‍රඥාවෙන් මේ කෙළෙස්

නොසන්සිඳුනේ නම් නැවත උප්පත්තියක් හට ගනී. එබැවින් සමාධි සිත තුළට ප්‍රඥාව පිහිට විය යුතු වේ. නැතහොත් අර්පනා සමාධි සුවය විඳිමින් සිතේ විචාර බුද්ධිය හා ශක්තිය හීන කරයි.

උතුරු, නැගෙනහිර ප්‍රදේශයට දෙවන වර සංචාරය කරණ විට ආචාර්‍යය මන් මධ්‍යම ප්‍රමාණයේ ප්‍රඥාවක් තිබුණි. අනාගාමීත්වය ලබා ගැනීමට සෑහෙන ප්‍රඥාවක් තිබිය යුතුය. මෙම තත්ත්වයට පැමිණීමට පෙර කායගතාසතිය දියුණු වී සිටිය යුතුය. ඉන් අදහස් වන්නේ ශරීරයේ ආස්වාදය ආදීනය හොඳාකාර වැටහී ඇති බැවින් කිසිවකින් ඇලීම් ගැටීම් ස්වභාවයකට පත් නොවීමයි. ප්‍රඥා බලයෙන් ඇලීම් ගැටීම් අතර මැද පසු කිරීමයි. ශරීරය පිළිබඳ කිසිම සැකයක් නැත. මෙය අතර මැදි අස්ථිර සංක්‍රමික අවස්ථාවකි. එය යම් විභාග යකින් අවම ලකුණෙන් සමාර්ථ වීමක් වැනිය. උපරිම තත්ත්වයකට යාමට තව ඉගෙන ගත යුතු දේ ඇත. අනාගාමී පුද්ගලයා තම ප්‍රඥාව තව තවත් දියුණු තියුණු කරමින් තීක්ෂණ භාවයක් ඇතිකළ විට සම්පූර්ණ අනාගාමී තත්ත්වයකට පත්වේ. එවැන්නෙකුගේ මරණින් පසු පස්වන බ්‍රහ්ම තලයෙහි හෝ අගනිට්ඨා තලයෙහි ඉපදී. එවැන්නෝ පහළ බ්‍රහ්ම තලවල නූපදිත්.

ආචාර්ය මන් මේ තත්ත්වයේ බොහෝ කල් රැඳී සිටි බව ප්‍රකාශ කළහ. ඊට හේතුව උපදෙස් ලබා ගැනීමට නොහැකිවීමයි. අනාගාමී තත්ත්වය හඳුනා ගැනීමට ඉතා සියුම් ලෙස ප්‍රත්‍යවේක්ෂා කර වරදින් මිදී සිටිය යුතුය. උන්වහන්සේ අත්දැකීමෙන් තම වීර්‍යය අභිබවා කෙළෙස් මතුවන ආකාරය දැන සිටියහ. එම කෙළෙස් ඉතා සියුම්ය. තම සති පඤ්ඤා තරම් සියුම් වේ. එබැවින් එම කෙළෙස් යටපත් කිරීම ඉතා දුස්කර විය. උන් වහන්සේ ගත් වීර්‍යය සිතන්ට බැරි තරම් බලවත් දෙයකි. එය ඝනව පැතිරී සිටි කටු සහිත ගුටුම්භයක් තරණය කිරීම වැනිය. මෙය තරණය කර තම ශිෂ්‍යයන්ට මේ ගැන කිය දීමට උන්වහන්සේ විශාල පරිශ්‍රමයක් කර ඇත. එය හුදකලාව ගත් පරිශ්‍රමයකි. උන්වහන්සේගෙ " මේ අත්දැකීම් ගැන විශේෂ අවස්ථාවන්හි ප්‍රකාශ කළහ. දෙවරක් මගේ ඇස් කඳුලින් වැසී ගියේය. එතරම් දැඩි සංවරයකින් උන්වහන්සේ මේ අති දුෂ්කර කාර්‍යය ඉටු කර ඇත. උන්වහන්සේ අවබෝධ කරගත් අති උතුම් ඉතා සියුම් ධර්ම ඥානය ආශ්චර්‍යයකි. උන්වහන්සේගේ අඩි පාර දිගේ බඩ ගා යාමට වත් මට හැකිවේදැයි මම සිතුවෙමි. නැතහොත් මට අන් මිනිසුන් මෙන් ලෝකයේ රැඳී සිටීමට වේදැයි සිතුවෙමි. නමුත් උන්වහන්සේ අප ධෛර්‍යයමත් කරමින් උනන්දු කළහ. උන්වහන්සේ නැවත නැවත වීර්‍යය වඩන විට අන් කිසිවෙකුගේ ආශ්‍රය නොකැමැති විය. භාවනාවේ දවස ගත කිරීමට කැමති විය. තමාට තව ප්‍රමාණයක පුහුණුවක් අවශ්‍ය වූ නමුත් තම ශිෂ්‍යයන් සමඟ ජීවත් වීමට හා ඔවුන්ට උපදෙස් දීමට සිදුවිය.

ආචාර්ය මන් අවුරුදු 4ක් පමණ බන් සම් ෆොං ගමේ සහ අවුරුද්දක් පමණ බන් හුළු සායි ගමේ වාසය කළහ. මේ පළාත් කඳුකරය බැවින් උන්වහන්සේ එහි සිටීමට ප්‍රිය කළහ. නුදුරින් පිහිටි පක්කුට් කඳුකරයේ බොහෝ දෙවියන්ගේ වාස භූමිය විය. කොටින්ගේ ද වාස භූමිය විය. රාත්‍රී කාලයේ උන්වහන්සේගේ කුටි අසල කොටි නිදැල්ලේ හැසිරෙති. දෙවිවරු ධර්ම ශ්‍රවනය පිණිස වඩිති.

මධ්‍යම රාත්‍රියේ ගෙරවිලි නාදය කැලය දෝංකාර කරති. සමහර විට කොටි රැළක් ගොරවති. මිනිසුන් එකිනෙකාට උස් හඬින් කෑ ගසන්නාක් මෙනි. කොටි ගොරවන නාදය ඇත්තෙන්ම බියංකරය. ඊළඟ මොහොතේදී අවුත් තමන් කා දමන බව සිතේ. බොහෝ විට භික්ෂූන් වහන්සේලා සහ සාමණේර භික්ෂූහු එළිවෙන තුරු නොනිදා බියෙන් ත්‍රස්ත වී සිටිති. ආචාර්ය මන් ඔවුන් බිය ගැන්වීමට මෙසේ කියති. ''බලා ගන්න මේ වනාන්තරේ කොටි කම්මැලි අලස භික්ෂූන්ට බොහෝ කැමති වෙති. එය ඔවුන්ගේ විශේෂ රසවත් ආහාරයකි. කොටින්ගේ රසවත් ආහාරය් වීමට නොකැමති අය සති පඤ්ඤා වඩනු මැනවි! කොටි එසේ සති පඤ්ඤා වඩන අයට බිය වෙති. එබැවින් එවැනි අය කන්නේ නැත.'' මෙය ඇසූ විගස එම භික්ෂූන් වහන්සේලා යුහුසුළුව තම භාවනා කර්මස්ථානයේ රැඳෙමින් සිටියේ තම ජීවිතය රඳා පවතින්නේ ඒ නිසා යැයි හැඟීමෙනි. කොටින්ගේ ගෙරවිලි නාදය සතර දෙසින් දෝංකාර දෙන නමුත් නොබියව සක්මන් භාවනා කරත්. කෙතරම් බිය වුවත් ආචාර්ය මන් කී දේ පිළි ගත්හ. ''කම්මැලි භික්ෂුව කොටින්ගේ රසවත් ආහාරයක්ය.''

එම වනාන්තරයේ ජීවත් වීම ඉතාම බියංකර වූයේ උන්වහන්සේලාට ලැගුම් ගැනීමට කුටි නැති බැවිනි. එහි තිබුණේ ඉතා කුඩා මැස්සකි. එය පොළොව මට්ටමට කිට්ටු, නිදා ගැනීමට තරම් වූ මැස්සකි. බඩගිනි කොටියෙකුට එය කිසි ප්‍රශ්නයක් නොවේ. මේ භික්ෂූන් නිදන මැසි වටේ සමහර විට කොටි එහා මෙහා යති. එහෙත් මේ විශාල සතුන්ගෙන් කිසි හානියක් නොවීය. දෙවිවරු සතර වටින් ආරක්ෂා කරණ බැවින් කොටින්ගෙන් කිසි බියක් නොවන බව ආචාර්ය මන් දනිති. දෙවිවරු ධර්මය ඇසීමට එන බැවින් රැකවරණයේ සිටිති. ඒ දෙවිවරු බොහෝ කාලයක් එහි වෙසෙන ලෙස ආචාර්ය මන් හට ආරාධනා කළහ.

ඇත්තෙන්ම ආචාර්ය මන් භික්ෂූන් වහන්සේලා බිය ගැන්වීමට එසේ පැවසුවේ උන්වහන්සේලා උද්‍යෝගිමත් කිරීම පිණිසය. කොටින්ට නිදැල්ලේ සිටීමට එම ප්‍රදේශය නිජ භූමියක් විය. අනිකුත් වල් සතුන්ට ද ක්ෂේම භූමියක් විය. ඒ දඩයම් පිණිස මේ ප්‍රදේශයට මිනිසුන් නොඑන බැවිනි. ගම්මු ආචාර්ය මන් සිටින ප්‍රදේශයේ දඩයම් කිරීමට බිය වෙති. භයානක කර්ම සිදුවිය හැකි බව ඔවුන් දනිති. යමෙක් තුවක්කුවකින් වෙඩි තැබීමට මේ ප්‍රදේශයේ බිය වෙති. එය අතේ පත්තු වී ඔහුගේ මරණය සිදු වේ යයි හැඟීමක් ඇත. කොටි කිසි විටෙක

ගම්මානයට ගොස් එහි ගව ආදී සතුන් නොමරති. මේ කොටි ගොදුරු සොයා ගන්නේ කෙසේදැයි කිසිවෙක් නොදනිති. මේ විස්මය ජනක කථා ආචාර්ය මන් අප සමඟ කියා ඇත. මෙය සත්‍යය බව ගම්මු නිතර කියත්. ආචාර්ය මන් සහ ධූතාංග භික්ෂූන් මෙවැනි ප්‍රාතිහාර්යය පෑහ.

## උත්තම මනුෂ්‍යයෙක්

මහා අද්භූත දේ ආචාර්ය මන් පවසති. එක් විටෙක දේව පිරිස උන්වහන්සේ දැකීමට පැමිණ එහි ප්‍රධානියා මෙසේ කීය.

''ඔබ වහන්සේ මෙහි වාසය කිරීම අපේ දේව සමූහයාට බලවත් සතුටකි. ඔබගේ කරුණා මෛත්‍රී ගුණය පෘථිවිය පමණක් නොව මුළු දේව මණ්ඩලය හරහා පැතිරී ඇත. ඔබ වහන්සේගෙන් නිකුත්වන කුශල ශක්තිය තේජෝ, ගුණය, රශ්මි වළල්ල විස්තර කිරීමට නොහැකිය. වෙන ශක්තීන් සමඟ සංසන්දනය කළ නොහැකිය. මේ නිසා ඔබ වහන්සේ කොතැනක සිටියත් අපට සොයා ගත හැකිය. මේ ධර්ම රශ්මි වළල්ල ඔබ ශරීරයෙන් නිකුත් වී දස අත විහිදී යයි. ඔබ වහන්සේ භික්ෂූන්ට ධර්මය දේශනා කරන ශබ්දය, මුළු විශ්වය තුළ නින්නාද වේ. ඕනෑම තැනක සිටින දෙවියන්ට ඒ ශබ්දය ඇසේ මළ මිනියකට පමණක් නෑසේ.''

ආචාර්ය මන් සහ දෙවියන් අතර සාකච්ඡාව තව විස්තර කිරීමට මම උත්සාහ කරමි. එහි සෑම දෙයක්ම සතයයෙන් සත්‍ය බව සිතිය හැක්කේ මේ ප්‍රවෘත්තිය අප සමඟ විස්තර කළ අය ඉතාම සත්‍යවාදී ගුණ ගරුක අය බැවිනි.

''මගේ කටහඬ එසේ සක්වල නින්නාද වන්නේ නම් මනුෂ්‍යයන්ට නෑසෙන්නේ ඇයි ?'' එවිට දෙවියෝ මෙසේ කියත්.

''හොඳ නරක, සිල්වත් බව, සදාචාරය, කුසල් අකුසල් ගැන මනුෂ්‍යයෝ දන්නේ කුමක්ද ? ඔවුහු තම භය ද්වාරයන් නිතරම අකුසල් කරීමට යොදා ගනිති. තමා හැම මොහොතේම අපායගාමී අකුසල් කරති. උපන් දා සිට මරණය දක්වා ඔවුහු මෙසේ හැසිරෙති. මනුෂ්‍යයන් යන නාමය ලබා ඇති නමුත් ඔවුන් මේ පිළිබඳ කිසි තැකීමක් නැත. ස්වල්ප දෙනෙක් තම සය දොර කුසල් කිරීමට යොදා ගනිති. ඔවුන්ගේ කුසල ශක්තිය වුවද ඉතාම සීමා සහිතය. දෙවියන්ගේ එක ජිවිත කාලයක් තුළ මිනිසා දස වතාවක් හෝ සිය වතාවක් මැරී මැරී උපදී. බ්‍රහ්ම ලෝකයේ ආයුෂ කාලය ඊටත් වඩා බෙහෙවින් වැඩිවේ. මිනිසුන්ගේ සංඛ්‍යාව ඉතා විශාලය. ඒ සමඟ ඒ අය විසින් කරන අකුසල කර්ම අති විශාලය. කුසල් කරන අය ටික දෙනෙකි. මිනිසා බුද්ධ ශාසනය ආරක්ෂා කරතියි කියත් නමුත් බුද්ධ

ශාසනය පිළිබඳ කිසිවක් නොදනිත්. කුසල් කර්ම ගැන කිසිවක් නොදනිත්.

දුෂ්ට මිනිස්සු දන්නේ පව් කිරීම පමණි. ඒ අය මිනිසුන් වශයෙන් සැළකිය හැක්කේ හුස්ම ගන්නා බැවිනි. හුස්ම නැවතුණු විගස තම බලවත් කර්ම විපාක වලින් වැළලී යයි. දෙවිවරු මෙය ඉතා හොඳින් දනිත්. නොදැනීමට හේතුවක් ඇත්ද ? එය රහසක් නොවේ. මිනිසෙක් මළ පසු භික්‍ෂූන් වහන්සේලා අවුත් ගාථා සජ්ඣායනා කරති. ඒ දුෂ්ට මිනිසා එය අසත්ද ? ඔහු මරණයට පත්වූ මොහොතේ සිට අකුසල විපාක ඔහු වෙලා ගනිති. එබැවින් ඔහුගේ චිත්තයට මේ ගාථා ඇසීමට හැකිද ? ජීවත්ව සිටින විට වුවද ඔහු තුළ මේ ධර්මය ගැන කිසි හැඟීමක් නැත. ජීවත් වන අයට පමණක් ධර්මයට සවන් දිය හැකි වන්නේ කැමැත්තක් ඇතොත් පමණි. එහෙත් කිසිවෙක් ධර්මය ඇසීමට උනන්දුවක් නැත. එය ඔබ නොදන්නේද ? භික්‍ෂූන් වහන්සේලා ගාථා සජ්ඣායනා කරණ විට ඔවුන් අසා සිටිත්ද ? ඒ අයට කිසි උනන්දුවක් නැති බැවින් ඒ අයගේ හදවතේ බුද්ධ ''ශාසනය'' හෙවත් ''පණිවිඩය'' තැන්පත් වී නැත. ඔවුන් ඉතා කැමත්තෙන් පිනවන දේ තිරිසන් සතුන් පවා ප්‍රතික්ෂේප කරති. දුස්සීල මිනිස්සු මෙවැනි අශික්ෂිත දේ කිරීමට ප්‍රිය මනාප වේ. ඔවුන් කෙතරම් එවැනි දේ කළත් සෑහීමකට පත් නොවේ. මරණාසන්න කාලයේදී වුවත් එවැනි අශික්ෂිත දේ ප්‍රාර්ථනා කරති. දෙවියන් වූ අපි මිනිසුන් ගැන ඔවුන් දන්නවාට වඩා දනිමු. එහෙත් ඔවුන් අප ගැන කිසිවක් නොදනිති. ඔබ වහන්සේ සුවිශේෂ කෙනෙකි. ඔබ වහන්සේ දෙවියන්, මිනිසුන්, තිරිසනුන් ආදී බොහෝ සත්ත්ව කොට්ඨාස ගැන දනිති. ඒ නිසා සෑම දෙවි කෙනෙක්ම ඔබ වහන්සේට නමස්කාර පූජා පවත්වති. මේ දෙවියා කථාව අවසන් කළ පසු ආචාර්ය මන් යම් යම් නොතේරෙන දේ පිළිබඳ ප්‍රකාශ කළහ.

''දෙවියන්ට දිවැස් ඇත. දිව, කණ ඇත. එබැවින් බොහෝ ඈත දේ දකිති. අසති. දෙවිවරු මිනිසුන්ගේ හොඳ නරක දනිති. ඔබට නොහැකිද මේ මිනිසුන්ට හොඳ නරක තෝරා දෙන්ට ? අපට වඩා හොඳින් ඔබට මෙය කළ හැකි නොවේද ?

''දෙවියන් වූ අපි බොහෝ මිනිසුන් දකිමු. එහෙත් ඔබ වහන්සේ වැනි උත්තම පුරුෂයෙක් දැක නැත. ඔබ වහන්සේ දෙවියන්ට හා මිනිසුන්ට එක හා සමාන මෛත්‍රී, කරුණාව පතුරුවති. ලෝක සත්ත්වයන් ගැන ඔබ වහන්සේ දනිති. ගොරෝසු ශරීර හා ඉතා සියම් ශරීර ඇති අනන්ත සත්ත්ව කොට්ඨාස ඔබ දනිති. දෙවියන් වැනි අනන්ත සත්ත්ව ලෝක ඇති බව ඔබ කියා දෙති. එහෙත් පරම්පරාවෙන් පරම්පරාවට කිසිවෙක් මේ අමනුෂ්‍යයන් දැක නැත. එබැවින් දෙවියන් ගැන කිසි සැළකිල්ලක් නැත. වැඩිම වුනොත් කලාතුරකින් යම් අද්භූත ආලෝක හෝ ආකර්ෂණ සංඥාවක් දැනුණත් එය නොහඳුනති.

''ප්‍රේතයන්'' යයි කියත්. ඔවුන් අපි කියන හොඳ නරක තේරුම් ගන්නේ කෙසේද? දෙවිවරු නිරන්තරයෙන් මිනිසුන් ගැන අවධාරණය කරත්. එහෙත් මනුෂ්‍යයෝ දෙවියන් ගැන කිසිවක් දැන ගැනීමට කැමැත්තක් නැත. අප මිනිසුන්ට උගන්වන්නේ කෙසේද ? ඇත්තෙන්ම මෙය ඉතා අවාසනාවන්ත තත්ත්වයකි. අපි ඔවුන්ගේ කර්ම අනුව සැප දුක් විඳිතියි කියා සැනසෙමු. දෙවිවරුන්ට පවා නිරන්තරයෙන් කර්ම විපාක ඵල දේ. එසේ නොවන්නේ නම් අපි නිවන් දකිමු. එවිට මේ අපහසුතාවයක් නැත.''

''ඔබ කියන විධියට තම කර්ම ක්ෂය වූ විට නිවන් දකිති. දෙවිවරු නිවන් පිළිබඳ දනිත්ද ? අන් සත්ත්ව කොට්ඨාසය මෙන් දෙවිවරන්ට දුක් දොම්නස් ඇද්ද ?

''ඇයි අප නොදන්නේ ? සියලුම බුදුවරු දේශනා කරන්නේ මේ දුක් ක්ෂය කිරීම ගැන. මේ දුක් විඳිමින් සසර සැරිසරන්ට නොකියති. නමුත් කාමභෝගී මිනිස්සු තම විනෝදාත්මක සැප සන්තෝෂය විඳීමට මිස නිවන් දැකීමට කැමැත්තක් නැත. ඒ නිසා කිසිවෙක් නිවන් දැකීමට උත්සාහ නොකරති. නිවන ගැන සියලුම දෙවිවරු ඉතා උනන්දු වෙති. සියලුම බුදුවරු නිවන ගැන දේශනා කරති. නමුත් දෙවිවරුන්ට විශාල කර්ම පොදියක් ගෙවන්නට සිදු වී ඇත. මේ දෙව් සැප විඳ අවසන් වීමට බොහෝ කල් ගත වේ. එබැවින් නිවන ඉතා දුරය. නිවන් දුටු පසු පමණක් සියළු ගැටලු නිරාකරණය වේ. එවිට පුනරුප්පත්තිය හා සංසාර චක්‍රය නිමාවේ. උප්පත්ති මරණ අහෝසි වේ. යම් කර්ම විපාක ඇති තෙක් සැප දුක් විඳීම නියම වේ. මොන ආත්මයේ සිටියත් කර්ම විපාක විඳිති.''

''දෙවිවරු සමඟ සම්බන්ධ වන බොහෝ භික්ෂූන් ඇද්ද ?''

''ටික දෙනෙක් සිටිති. ඒ සියලු දෙනා වනාන්තරවල හා කඳු මුදුන් ආශ්‍රිතව වාසය කරති.''

''මේ ශක්තිය ඇති ගිහි අය සිටිත්ද ?''

''ටික දෙනෙක්, ඉතා ටික දෙනෙකි.'' ඒ අය ධර්මයට අනුව බණ භාවනා කර තම සිත් බොහෝ පිරිසිදු කර ඇත. එවිට පමණක් දෙවිවරු දැක්ක හැකිය. දෙවියන්ගේ ශරීර අනිත් දෙවිවරුන්ට ඝන ලෙස දැනුන නමුත් මිනිසුන්ට ඉතා සියුම් ලෙස දැනේ. එබැවින් සිත් කුසලතාවයෙන් ඉතාමත් පැහැදිලි වූ විට පමණක් මිනිසුන්ට දෙවියන් පෙනේ.

''ධර්ම පුස්තකවල සඳහන් වී තිබෙන ලෙස දෙවියන්ට මිනිසුන්ගෙ දුර්ගන්ධය ඉවසිය නොහැකි නිසා කිට්ටුවට නොඑති.'' එවැනි දුර්ගන්ධයක් ඇත්නම් ඔබ මා ළඟට එන්නේ මන්ද ?''

''ඉතා උසස් ශීල සුගන්ධයක් ඇති මිනිසා අපට දුර්ගන්ධ නොවේ. ඒ අයගෙ ' සීල සුගන්ධය නිසා අපි ඒ අයට වැඳුම් පිදුම් කරමු. ඔබ වහන්සේ සමීපයට පැමිණ ධර්ම ශ්‍රවණය කිරීම එබැවින් අපට ප්‍රිය ජනකය. දුර්ගන්ධය හමන්නේ දුශ්ශීල, දුරාචාර, දුර්ගුණ ඇති අයගෙන්ය. මෙවැනි දේ තුන් ලෝකයෙහි සියලු දේ අප්‍රිය කළ නුමත් ඒ අය මේ වැරදි කරත්. අපි එවැන්නන් හමුවීමට නොයමු. ඒ අය ඉතා දුෂ්ටය. ගඳය. ඒ දුර්ගන්දය දස දිසාවේ පැතිර ඇත. දෙවිවරු මිනිසුන්ට අකැමැති නැත. මේ හේතුව නිසා අකැමැති වෙති.''

මේ ආදී නොයෙක් කථා ප්‍රවෘත්ති ආචාර්ය මන් කියන විට භික්ෂූන් වහන්සේලා විස්මිතව සවන් දෙති. ''මම මාගේ''යන මමත්වය තාවකාලිකව දුරුවෙති. කාලය, වෙහෙස අමතක වේ. කවදා නමුත් මෙසේ දෙවියන් සමඟ කථා කිරීමට අවශ්‍ය ශක්තිය නිපදවා ගැනීමට උත්සාහ දරති. ආචාර්ය මන් සිය ආත්ම වල විස්තර කියන විට ද භික්ෂූන් වහන්සේලා විස්මිතව කම්පනයට පත්වෙති. තමාගේ ඉහත ජාති ගැන දැන ගැනීමට කැමති වී තමා භාවනා අරමුණ බැහැර කරති. තමා මේ ලෙස භාවනා නොකරන විට තමන්ම තරවටු කරමින් හිත හික්මවති. ''අහෝ දුක් නැති කිරීම වෙනුවට මා කරන්නේ මොකක්ද? අතීත සෙවනැලි පසුපස දුවමි.'' මෙසේ නැවත ප්‍රකෘති සිහිය ලබා ගනිත්. එබැවින් බොහෝ භික්ෂූහු මේ ආදී ඍද්ධි ප්‍රාතිහාර්යය බැහැර රකත්.

ආචාර්ය මන් කියන මෙවැනි අද්භූත කථා පුදුම එළවන සුළුය. ප්‍රේත ලෝක, යක්‍ෂ ලෝක ගැන කථා කරණ විට මිනිස් ලෝකයේ මෙන් ඒ ලෝකවලත් මැර වැර අය බන්ධන ගත කෙරෙන බව කියති. වැරදි කරණ අය සොයා ඔවුන් හිරකර තබති. නොයෙක් විධියේ වැරදි කරණ අය වෙන වෙනම බැඳ තබති. සියලුම හිර ගෙවල් පිරී වරදකරුවන් සිටිති. මේ වරදකරුවන් අතර ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂයම ඇත. ඉතාමත් දරුණු අයද වෙති. ඔවුන්ගේ ඇස් දෙස බලන විට ඔවුන් කරුණා, මෛත්‍රියෙන් මෙල්ල කළ නොහැකි බව පෙනේ.

අපි මනුෂ්‍යය වර්ගයා නගරයේ වාසය කරන්නාක් මෙන් අමනුෂ්‍යයෝද වාසය කරති. අමනුෂ්‍ය වාස විශාල නගර ඇත. එහි නායකයෝ ඒ අය පාලනය කරති. ඉතා සුළු ප්‍රමාණයක් හොඳ අමනුෂ්‍යයන් සිටිති. ඔවුන් අනිකුත් අමනුෂ්‍යයන්ගේ ගෞරවයට පත්වේ. මේ සියලු දෙනා තම පාලකයින්ට බෙහෙවින් භය වෙති. මෙය මුනිච්ඡාවට නොව ඇත්තෙන්ම බිය වෙති. කුසල විපාක අකුසල විපාක වලට වඩා බලවත් බව ආචාර්ය මන් විශ්වාස කළේය. අමනුෂ්‍යය ලෝකවල මේ බව ඉතා පැහැදිලිව පෙනේ. යම් අකුසල හේතුවක් නිසා බොහෝ පිං ඇති අයද අමනුෂ්‍ය ලෝකයේ උපදිත්. නමුත් තමාගේ කුසලතාවය නිසා එහි පාලකයන් බවට පත්වෙති. එවැනි එක පාලකයෙකුට විශාල සංඛ්‍යාවක් අමනුෂ්‍යයින් පාලනය කිරීමට අයත් වේ. මේ අමනුෂ්‍යයෝ ජාති කුල වශයෙන් නොබෙදේ.

නමුත් පාලකයන්ට සම්පූර්ණයෙන්ම අවනත වේ. එය ධර්මයට අනුව සිදුවේ. එම අකුසල විපාක බලවත් බැවින් මිනිසුන් මෙන් ස්වාධීන මත නොදරත්. ඔවුන්ගෙ " දඬුවම් තම කර්මයට අනුව සිදුවේ. මෙය නොවෙනස් වන ස්වභාවයකි. මේ ලෝකයේ මිනිසා බලපුළුවන්කාරකම් කළ නමුත් අමනුෂ්‍ය ලෝකයේ එසේ කළ නොහැකිය. ආචාර්ය මන් මේ පිළිබඳ බොහෝ විස්තර කළ නමුත් අවාසනාවකට මෙන් මට මතක ඇත්තේ මෙපමණකි. ඒ ගැන සමාව අයදිමි.

ආචාර්ය මන් මේ අමනුෂ්‍යය ලෝක වලට සමාධි සිතෙන් ගමන් කරත්. උන් වහන්සේ දුටු විගස ඒ සියලු දෙනාම උන්වහන්සේට වැඳුම් කරන මෙන් කියති. අප මනුෂ්‍යයන් මෙනි. පාලක අමනුෂ්‍ය නායකයා උන්වහන්සේට ඇති ගෞරව දක්වා එම ලෝකය නිරීක්ෂණය කිරීමට ගෙන ගියහ. අමනුෂ්‍යයන් ජීවත්වන ගම්, නගර හා ඔවුන්ගේ බන්ධනාගාර පෙන්වූහ. ඔවුන් සාහසික අපරාධ කරමින් අනුන්ට දුක් දී ඇත. එබැවින් තම කර්මයේ ශක්තිය අනුව දුක් විඳිති. මේ අයට භූත, ප්‍රේත වශයෙන් අප නම් කළ නමුත් ඒ අය අප මෙන් එම ලෝකයේ ජීවත් වෙති. අප මෙන් ජීවීන් කොට්ඨාශයකි.

ආචාර්යය මන් සහ වනාන්තරවල හා කඳු මුදුන් වල වාසය කිරීමට බෙහෙවින් ප්‍රිය කළහ. බොහෝ කාලයක් නබොන් ෆනොම් හි වාසය කරමින් භික්ෂූන් වහන්සේලා පුහුණු කළහ. එහෙත් තමන් වහන්සේට තව දුර යා යුතු බව වැටහුණි. අන්තිම අවබෝධය ලබා නැති බැවින් වීර්‍යය යොදා පිළිවෙත් පිරිය යුතුය. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ඉගෙනීම් කිරීමට තම කාලය වැය වුනි. එමනිසා සිතේ ශක්තිය හීන වුනි. එබැවින් හුදකලා සිටිමින් වීර්‍යය වැඩිය යුතුය. මේ කාලයේ ආචාර්ය මන්ගේ මව්තුමිය උපාසිකාවක් වශයෙන් අවුරුදු 6ක් පමණ කාලයක් උන්වහන්සේ සමඟ ගත කළහ. එතුමිය නිසා හුදකලා ගමන් කිරීමට නොහැකි විය. එබැවින් එතුමියගේ අවසර ඇතිව එතුමිය උබොන් රචජ්තානි ප්‍රදේශයට කැටුව ගොස් එම වස්සාන කාලය බන් නො බොං පලාතේ ගත කළහ. බොහෝ භික්ෂූහු සහ සාමණේර භික්ෂූහු එහි විසූහ.

එක් රාත්‍රියක උන්වහන්සේ සමාධි සුවයෙන් සිටින විට එක් දර්ශනයක් දුටහ. බොහෝ සංඝයා වහන්සේලා උන්වහන්සේ පසු පස ඉතා සංවරව ගමන් කරති. එහෙත් සමහර භික්ෂූන් උන්වහන්සේලා උන්වහන්සේ පසුකර ඉදිරියෙන් යති. ඒ අය තුළ ගෞරවයක් හෝ සංවරයක් නැත. සමහරු උණ බම්බු පලා ඉන් උන්වහන්සේගේ පපුව කොනිත්තති. උන්වහන්සේට හුස්ම ගැනීමට පවා දුෂ්කර විය. මෙසේ එක් එක් භික්ෂූන් වහන්සේට වධ හිංසා කරති. මේ අවස්ථාවේදී උන්වහන්සේ එම සමාධි චිත්තය අනාගතයට යොමු කළහ. එවිට තම පිටුපස සංවරව එන භික්ෂු පරම්පරාව උන්වහන්සේගේ ප්‍රතිපත්ති අනුගමනය කරණ බව වැටහුණි. මේ අය නිසා සාසනය ආරක්ෂාවේ බෞද්ධ ප්‍රතිපත්ති

රකිමින් නොයෙක් රට රාජ්‍යයවල අනාගතයේ සසුන බබළවති. මනුෂ්‍යයන්ගේ හා දෙවියන්ගේ ගෞරවයට පත්වෙති. උන්වහන්සේ පසු කරමින් ගිය අගෞරව අසංවර පිරිස තද මානයෙන් ගුරුවරයාට වඩා උසස් යැයි සම්මත කරති. මුලදී ලබාගත් දැනුම සහ පුහුණුව අමතක කරති. ගුරුවරයාට කිසි සැළකිල්ලක් හෝ කළගුණ තැකීමක් නැත. තමන් අති දක්ෂයන් ලෙස පෙන්නුම් කරති. ඒ අය තමාත් වැනසී සාසනයත් වනසති. තම ශිෂ්‍යය පරම්පරාවද විනාශ කරති. එම ශිෂ්‍ය පරම්පරාව අනිකුත් ශිෂ්‍ය පරම්පරා ද විනාශ කරති. මෙසේ පරම්පරා ගණනක් මේ වැරදි ප්‍රතිපත්ති ගෙන යති. තමන් වැරදි මාර්ගයක ගමන් කරන බවක් නොදනිති. මේ අයගේ වැරදි දෘෂ්ටි නිසා බුද්ධ ශාසනය විනාශ කරත්. උන්වහන්සේගේ පපුව බම්බු පතුරුවලින් කොනිත්තපු භික්ෂූහු තමා බොහෝ දේ දත් ප්‍රඥයන් යැයි සිතති. ඒ අයගේ හැසිරීම නරක වුවත් හොඳ වුවත් හොඳ ලෙස සිතත්. ඒ අය බෞද්ධයන්ට හා ගුරුවරුන්ට නොසළකති. මේ සියලු දෙනා උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස අතර ඇත. උන්වහන්සේ ඒ අය හඳුනති. මේ අය උන්වහන්සේගේ ආශිර්වාද ලැබ නුදුරු ප්‍රදේශයේ වස් වසති. උන්වහන්සේට ගෞරව කිරීම වෙනුවට වධ හිංසා පමුණුවති.

ටික දිනකට පසු ප්‍රාදේශීය ආණ්ඩුකාර තුමා සහ නිලධාරී පිරිසක් ආශ්‍රමය දැකිමට පැමිණියහ. මුලින් සඳහන් කළ උන්වහන්සේට වධ හිංසා කළ භික්ෂූන් සමඟ මේ පිරිස පැමිණ ඇත. තමන් වහන්සේගේ සමාධි දර්ශනය පිළිබඳ කිසිවක් නොකියා ඒ අයගේ හැසිරීම පරීක්ෂා කළහ. මේ අය ආණ්ඩුවෙන් මුදල් ලබා ගෙන පාසැල් සෑදීමට ඒ අවට ප්‍රදේශය යෝග්‍ය බව දැන්වූහ. ගමේ මිනිස්සු මේ ව්‍යාපෘතියට සම්බන්ධ වෙති. මෙය ආණ්ඩුවට කරන ආධාරයකි. එබැවින් සියලු දෙනාම ආචාර්ය මන් දැකීමට පැමිණ ඇත. ආචාර්ය මන් මිනිසුන්ගේ ආදර ගෞරවයට පත් වී ඇති බැවින් එම කාර්යය සිදු කිරීමට උන්වහන්සේගෙ ’ සහභාගිත්වය පැතූහ. මේ අදහස දැක්වූ විගස මෙම භික්ෂූන් වහන්සේලා දෙනම මෙවැනි කරදරයකට යොමු කළ බව දැනුණි. භාවනාවේදී තමන්ට දුක් පීඩා දුන්නේ මේ දෙනම වෙති. පසුව උන්වහන්සේ මේ භික්ෂූන් දෙනම කැඳවා තමන් චීවර දරා ගත්තේ බෞද්ධ භික්ෂුවක් වශයෙන් සති සංවරයෙහි පිහිටා සමාධි ගුණය වැඩීමට බව පහදා දුනි.

මෙම කථා පුවත මෙහි සඳහන් කළේ සිතේ ගුප්ත ශක්තිය විදහා පෙන්වීමටය. සිතට අතීත අනාගත අරමුණු විෂය වේ. වැසී ඇති දේ විවෘත වී පෙනේ. නොයෙක් අවස්ථාවන්හිදී ආචාර්ය මන් මේ සත්‍යතාවය තහවුරු කළහ. උන්වහන්සේගේ කාර්යය කිසි ලාභ ලෝභ ප්‍රාර්ථනාවකින් නොව තමන් වහන්සේගේ අතීන්ද්‍රිය ප්‍රඥාවෙනි. එම වචන කථා කරන්නේ මිනිසුන් මුලාකර දුක් කරදර කිරීමට නොව ඒ අයගේ නුවණ වර්ධනය කිරීමටය. මෙම පුවත් උන්වහන්සේ

දැනුම් දෙන්නේ ඉතාමත් ළඟින් ආශ්‍රය කළ ගෝල පිරිසට පමණි. මෙය ලියන මා උන්වහන්සේගේ පුද්ගලික ජීවිතය විදහා පාන්නක් සේ දැකිය හැකිය. එනමුත් මෙය ඔබට යම්කිසි අවබෝධයක් ගෙන දේ යැයි සිතමි.

වර්තමානයේ සිටින කර්මස්ථානාචාර්‍ය වරයන් දෙස බලන විට ආචාර්ය මන් මහා ප්‍රාතිහාර්‍යයක් පා ඇති බව දැනේ. තමන් වහන්සේගේ සමාධි බලය සහ විදර්ශනාව තුළින් විස්මිත දේ සිදු කළහ. සමහරවිට උන්වහන්සේගේ මේ ශක්තිය පිළිබඳ ප්‍රකාශ කළ නමුත් බොහෝ විට එය දැන ගත හැක්කේ වක්‍රාකාරයෙනි. බොහෝ විට උන්වහන්සේගේ දැනුම නොකියාම සිටිති. ඒ පරචිත්ත විජානනය ඇති බැවින් බොහෝ භික්ෂූන් තම සිතුවිලි දනිතියි මහත් අසහනයට පත්වන බැවිනි. නොකියාම බැරි වන්නේ ඒ අයගේ වැරදි දෘෂ්ටි, නිගමන වෙනස් කිරීමට අවශ්‍ය බැවිනි.

ඉතාම විවෘතව අසවල් භික්ෂුවගේ සිතිවිලි නිර්දෝෂ බවත් අසවලාගෙ ' සිතිවිලි දොස් සහිත බවත් උන්වහන්සේ පවසති. බොහෝ විට මෙම විවෘතව කියා දෙන දෙය සමහරු වරදවා පිළිගනිති. ඉන් උරණ වී මහත් පාපයක් කර ගනිති. මේ නිසා බොහෝ විට වක්‍රව පවසති. නම් සඳහන් නොකර කියන නමුත් අදාළ පුද්ගලයා එය තමන්ට එල්ල වූ බව දනිත්. මේ සියල්ල දත් බැවින් ආචාර්ය මන් ඉතාම යෝග්‍ය නුවණට හුරු දේ පමණක් කියති.

මෙම පුවත් කියවන ඔබ යම් සැකයකට පත්විය හැකිය. ඒ ගැන මම සමාව අයදිමි. මෙවැනි ප්‍රවෘත්ති බොහෝ ඇත. ජ්‍යෙෂ්ට ශිෂ්‍යයන්ගෙන් මේ ආදී බොහෝ කරුණු මෙම පුස්තකයට අඩංගු කළේ උන්වහන්සේගේ චරිතය නොවලහා ඉදිරිපත් කිරීමටය.

සාමාන්‍ය වශයෙන් බලන විට බාහිර අරමුණු නිසා භික්ෂුවකගේ භාවනා මනසිකාරය වික්ෂිප්ත වේ. තමන් දුටු ඇසූ රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ ගැන නැවත නැවත සිහියට නැංවීම නිසා බොහෝ වික්ෂිප්ත වේ. විශේෂයෙන්ම බලපාන්නේ ස්ත්‍රීන් පිළිබඳවය. මෙය සිතා මතා නොකරණ නමුත් නොදැනුවත්වම සිත අල්ලා ගනී. ආචාර්ය මන් මේ පිළිබඳ තරවටු කරන්නේ උන්වහන්සේලා මෙයින් මිදීමට අසීරු බැවිනි. නොයෙක් සිතුවිලි නිසා භාවනා අරමුණ විසිරී යයි. එවිට ආචාර්ය මන් එය දැන අවවාද දෙති.

සවස සාකච්ඡා වාරය ඉතාම වැදගත් වේ. සියලුම භික්ෂූන් වහන්සේලා කායික මානසික සංවරයෙන් සිටිය යුතුය. තමන් වහන්සේගේ දේශනා කාලයේදී කිසියම් බාධාවක් නැතිව සමාධි සිතින් දේශනා කරන බැවිනි. මේ වේලාවේදී යම් යම් අය විකාර නොමනා සිත් පහළ කළ විට උන්වහන්සේට අකුණු සැරයක්

වැදුනාක් මෙන් දැනේ. එවිට ඒ භික්ෂුව රත් වී හෝ සීතල වී යයි එතනම ක්ලාන්ත වේ. කිසි නම් සඳහනක් හෝ නිවේදනයක් හෝ නැතිව හෝ මෙය සිදුවේ. අනිත් භික්ෂූන් එවිට තැති ගනිති. තමන් නොමනා සිත් පහළ කිරීමේ ආදීනවය දනී. මෙවැනි ''අකුණු සැර'' කීපයක් වැදුණු විට ශ්‍රාවක පිරිස තම සිත් නිතරම සති පඤ්ඤාවෙන් ආරක්ෂා කරති. සමහර භික්ෂූන් ධර්මයට සවන් දීමේදී සිත ඒකග්‍රතාවයට වැටී සමාධි ගත වේ. එසේ නොවූ අය ඉතාමත් සාවධානව අසා සිටිති. වැරදි සිතක් පහළ කළහොත් අහසින් අවුත් උකුස්සා තම හිස ගලවා ගන්නාක් මෙනි.

මෙවැනි අත්දැකීමේ තුළින් පුහුණු වූ ආචාර්‍ය්‍ය මන්ගේ ගෝල පිරිස තම හැසිරීම පිළිබඳ ස්ථාවර පදනමක පිහිටා සිටියහ. බොහෝ කල් උන්වහන්සේගෙ ඇසුරෙහි සිටි භික්ෂූන්ගේ චිත්ත සංවරය හා කාය සංවරය ස්ථාවර විය. එය තම පෞරුෂය විය. උන්වහන්සේලා කැමැත්තෙන්ම මෙම ප්‍රතිපදාවට අනුව පුහුණු විය. ඒවා උන්වහන්සේ යෙදූ පුහුණු කිරීමේ ක්‍රම සහ විධි ඉතාම දක්ෂ විය. උන්වහන්සේ නිරන්තරයෙන්ම අනුගමනය කළහ. දෛනික වත් පිළිවෙත් ගරු ගාම්භීර විය. එවිට තම සිත ඒ අනුව පිරිසිදු විය. ඉන්පසු ස්වාධීන වූහ.

යමෙකුට සාර්ථක ප්‍රතිඵල නොලැබුණේ උන්වහන්සේගේ බාහිර ආකල්ප පමණක් අනුගමනය කිරීමෙනි. උන්වහන්සේ දොස් කියතියි. භය නිසා සංවර වීම හා ස්වාධීන චිත්ත ශක්තිය නොමැති වීම නිසා භාවනා කිරීමට අසමත් විය. එතරම් උතුම් ගුරුවරයෙකුගෙන් ලැබිය හැකි පුහුණුව ඒ අයට නොලැබුණි. තමාට පුරුදු පරිදි ජීවත් විය. ඉන්පසු එහි විසීමට නොහැකි විය. තම ගති පැවතුම් වෙනස් කිරීමට නොහැකි විය. හොද්දේ රස නොදන්නා හැන්ද මෙනි. මේ හැන්ද එක හොදි භාජනයෙන් තවත් හොදි භාජනයකට ගියත් රස නොදනී.

එසේම කෙලෙස් නිසා අපි එක දුකකින් තවත් දුකකට සංක්‍රමණය කරමු. මේ ලියන මමත් මෙසේ කෙළෙස් නිසා දුකට පත්වෙමි. මහත් වීර්‍ය්‍යය යොදා භාවනා කිරීමට සිත සාදාගත් නමුත් කම්මැලි කම අවුත් එය වළක්වයි. ආචාර්ය මන් කියන ධර්මයට අනුව ජීවත් වීමට ඉතා කැමති නමුත් මගේ පරණ පුරුදු අනුව සිතමි. ඉන් වෙනස් වීමට කැමති නැත. අවසානයේදී කෙළෙස් වලට ගොදුරු වෙමි. පරණ පුරුදු අත්හැරීම ඉතාම අසීරු කරුණක්. එහි මුල් යටට කිඳා බැස ඇත. ඒවා ජාති ජාති පුරුදු බැවිනි. ඒ හැම පුරුද්දක්ම ප්‍රකාශ කර එහි ඇති තණ්හාව දැනගෙන උදුරා ගැනීම ඉතා අමාරු දෙයකි.

වියලි දේශගුණය ඇති වූ විට ආචාර්ය මන් බන් නොං බොන් ප්‍රදේශයෙන් ගොස් තම ගමට පැමිණියහ. එවිට උන්වහන්සේගේ මවද කැටුව ගියහ. ඉන්-පසු මව හා අනිත් ඥාතීන්ගෙන් සමුගෙන හුදකලාව මධ්‍යම තැනිතලාව බලා

පිටත් විය.

නිදැල්ලේ මේ ප්‍රදේශයේ ධූතාංග භික්ෂුවක් වශයෙන් ගමන් කරමින් ගම් නියම් ගම් පසුකර සංචාරය කළහ. යම් තැනක කුඩා ගම්මානයක් හා ජල පහසුකම් ඇතොත් එහි ලැගුම් ගනිති. තම කුඩ - කූඩාරම දිගහැර එහි නැවතී භාවනා කරති. අවශ්‍ය ආහාර පාන ගෙන ශාරීරික ශක්තිය ලැබූ විට අන් තැනකට ගමන් ගනිති. සියලු දෙනාම පා ගමනින් විශාල දුර්ග මාර්ගයේ යා යුතුය. වාහන පහසුකම් නැත. එහෙත් කාලය ගැන ප්‍රශ්නයක් නැති බැවින් කැමති තාක් කල් සංචාරය කළහ. තම ගෝලයන්ගෙන් වෙන් වී ''තනි අලියා'' මෙන් මෙසේ බැංකොක් බලා පා ගමනින් වැඩියහ. මෙය ශාරීරික මානසික සුවයක් විය. තමන්ගේ පපුවේ ඇනී තිබූ විෂ කටුවක් ගැලවුනාක් මෙන් විය. සිතේ කයේ සැහැල්ලුවෙන් සතුටින් වෙල් යායවල් හාරහා, ගම්මාන හරහා මෙසේ සක්මන් භාවනාවෙන් ගමන් ගත්හ. උෂ්ණ කාලය බැවින් ඉතා සැර හිරු රැස් තිබුණි. එහෙත් අවට පරිසරය නිස්කලංකය. තම පාත්‍රා සිවුරු හා කුඩය කරේ එල්ලාගෙන ඇත. එය විශාල බරක් සේ පෙනුණත් උන්වහන්සේට එය බරක් නොවේ. තමන් අහසේ පාවෙන්නාක් මෙන් දැනේ. භික්ෂූන් වහන්සේලා නැති බව ලොකු පහසුවකි. මව්තුමිය ධර්මය හොඳාකාර පුරුදු කළහ. මින් මතු හුදකලා දිවියට කැමති විය. එහෙත් ප්‍රමාද විය නොහැකිය. සති පඤ්ඤාවෙන් සිටිය යුතුය.

මිනිසුන්ගේ සුන්වූ මේ ප්‍රදේශයේ ගමන් කරණ විට තද අව් රශ්මිය දැනුන විට ගසක් යට සෙවණේ ගිමන් හරිති. සවස් යාමයේ තරමක් සිසිල් වූ විට නැවත ගමන ආරම්භ කරත්. එවිට ධර්මයට අනුව හේතු ප්‍රත්‍යයයන්ගෙන් සැදුම් ලත් පරිසරය අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් දකිමින් විදර්ශනා කරත්. උන්වහන්සේට අවශ්‍ය වූයේ කුඩා ගම්මානයකි. පසුදා උදෑසන හීල් දානය පිණිස පිඩු සිඟා යාමට එවැනි තැනක් ලැබුණු විට දින කීපයක් නැවත ගිමන් හැර නැවත ගමන් ගනිත්.

ඩොං ෆයයෙන් වනාන්තරයට පැමිණි විට එහි කඳු මුදුන්වල ගමන් කරමින් විශාල සතුටක් වින්ද බව උන්වහන්සේ පැවසූහ. බොහෝ කාලයකට පසු විශාල ඝන වනාන්තරයකට පැමිණ ඇත. එහි නවාතැන් ගැනීමට සිත් විය. ඒ වනාන්තරයේ තම සිත් ගන්නා සතුන් හා පරිසරය සිත සනසති. බුරණ මුවෝ, වල් ඌරෝ, තිත් මුවෝ, පියාඹන වල්බාවෝ, ගිබන්, කොටි, අලි, වඳුරු, වලි කුකුළු, සිවට් කොටි, ෆෙසන්ට්, වලස්සු, ඉත්තෑවෝ, ඌරු මීයෝ, ලේන්නු ආදී සතුන්ගෙන් මේ වනය ගහනය. එම සතුන් උන්වහන්සේ කෙරෙහි බිය සැක නැත. ඉතා ළඟින් එහා මෙහා යති. එකල එම වනාන්තරයේ මිනිස් ආවාස නොතිබුණි. බොහෝ ඈතින් ගෙවල් 3 - 4 එක ළඟ පිහිටියහ. ඔවුහු සතුන් මරා ජීවත් වෙති. කඳු පාමුල වී සහ අනිකුත් බෝග වගා කරති. මේ ගම්වල

මිනිස්සු ධූතාංග භික්ෂූන්ට බොහෝ ගරු කරති. එබැවින් ආහාර ප්‍රශ්නයක් නොතිබුණි. මෙහි වාසය කරමින් භාවනා දියුණු කළහ. කිසිවෙක් කථා කිරීමට හෝ නොපැමිණෙති. මෙසේ ඉතා සැනසිලිදායකව උන්වහන්සේ අවසානයේ බැංකොක් නුවරට සම්ප්‍රාප්ත වූහ.

අති උතුම් ආචාර්ය මන් නිතරම පාහේ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ සිට බැංකොක් බලා දුම්රියෙන් ඒ මේ අත ගිය බව උන්වහන්සේ පැවසීය. එකල දුම්රිය මෙතරම් දුර නොයයි. අනිත් හැම විටම පා ගමනින් ගියේය. බැංකොක් හිදී වට් පැතුම් වට් ආරණ්‍යයේ ජාඕ ඛුන් උපාලි හමුවිය. එහි වස් විසූහ. දිනක් එම භික්ෂුව උන්වහන්සේට චියාං මයි යාමට ආරාධනා කළේය. වස් අවසානයේ වියලි දේශගුණය තිබුණි. දෙදෙනා වහන්සේලා දුම්රියෙන් මියංමයි බලා පිටත් විය. මුළු ගමනේම ආචාර්‍යය මන් සමාධියෙන් විසුහ. බැංකොක් සහ ලොබ් පූරි අතර නිදා ගැනීමට සිතුණි. එහෙත් උත්තරාදිත් කඳු පාමුල දී නැවතත් සමාධි ගත විය. චියාං මයි සමාධියෙන් සිටියහ. මුලින්ම උන්වහන්සේ චියාංමයි තෙක් සමාධි වී සිටීමට අධිෂ්ඨාන ගති. දුම්රිය ගමන් කරණ වගක් නොදනී. තම සිත් ඒකාග්‍රතාවය නිශ්චලය. බාහිර ලෝකය හා තම ශරීරය නොදැනී ගියේය. කිසිම අරමුණක් නොගන්නා බැවින් ලෝකයක් නැත. අනිත් මගීන් ගැනවත් දුම්රියේ ශබ්ද ගැනවත් නොදැනේ. චියාංමායි වලට එන තාක් උන්වහන්සේගේ සිත මේ ආකාරයෙන් පැවතුණි.

උන්වහන්සේ එවිට ඇස් ඇර බුලූ විට විශාල ගොඩනැගිලි ගෙවල් ආදිය නගරයේ දිස්විය. උන්වහන්සේගේ බඩු බාහිරාදිය එකතු කර බහින්නට සූදානම් වන විට බොහෝ මගීන් සහ දුම්රිය නිලධාරීන් විස්මිතව උන්වහන්සේ දෙස බලා සිටියහ. ඒ අය සිනහ මුසු මුහුණින් ඒ බඩු ඔසවා දුන්හ. උන්වහන්සේ වාසය කරන ආරාමය කුමක්ද කොහේ සිට එන්නේද කොහි යන්නේදැයි ප්‍රශ්න කළහ. උන්වහන්සේ වනවාසී බවත් එකම නිවසක් නැති බවත් පැවසීය. උතුරු පළාතේ කඳු මුදුන් වල සංචාරනයේ යන බවත් පැවසීය. ශ්‍රද්ධාවෙන් ඉහළ ගිය ඔව්හු උන්වහන්සේ සමඟ යන අය ඇද්දැයි විචාලහ. ජිඕ ඛුන් උපාලි මහ තෙරුන් සමඟ යන බවත් උන්වහන්සේ හමුවීමට බොහෝ අය එන බවත් උන්වහන්සේව ආණ්ඩුකාරතුමා ඇතුළු මහා ව්‍යාපාරිකයෝ හඳුනන බවත් පැවසීය. එසේ හෙයින් විශාල සෙනඟක් රැස් වී සිටියහ. භික්ෂූන් වහන්සේලා සාමණේර භික්ෂූන්, ගිහි පිරිස පැමිණ සිටියහ. ආණ්ඩුවේ නිල වාහන, කාර් උන්වහන්සේ වඩමවා යන්ට ඇවිත් තිබුණි. ඒ කාලයේ කාර් දකින්නටත් දුර්ලභය. උන්වහන්සේලා සුවසේ

වට් චෙඩි ලුඅං අරමට වැඩියහ.

ජ්ම් බුන් උපාලි තෙරුන් පැමිණ ආරංචියට බොහෝ ජනයා උන්වහන්සේට පුද පූජා ආචාර පැවැත්වීමටත් බණ ඇසීමටත් පැමිණයහ. උන්වහන්සේ මේ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගැනීමට ආචාර්ය මන් ට ධර්මය දේශනා කිරීමට ආරාධනා කළහ. ආචාර්ය මන් ධර්මය දේශනා ප්‍රාතිහාර්යයෙන් දෙසූහ. මහත් සේ සතුටු වූ පිරිස විස්මයෙන් අසා සිටියහ. ඉතාම සරල ධර්ම කරුණු වලින් පටන් ගෙන ගැඹුරු ධර්මය කියාදුණි. ඉන්පසු ජිම් බුන් උපාලි තෙරුන්ට ආචාර පවත්වා නැගී ගියේය. අසා සිටි පිරිස තවමත් ධර්මය ඇසීමට ආසාවෙන් සිටියහ. උන්වහන්සේට නිහඬ පරිසරයක සිටීමට අවශ්‍ය විය.

පසුව ආචාර්ය ජ්ම් බුන් උපාලි තෙරුන් මෙම දේශනය ගැන මහත් සේ අගය කළහ.

''ආචාර්ය මන්ගේ ධර්ම දේශනා ශෛලියට සමාන අන් දේශනා මා අසා නැත. උන්වහන්සේ හදවතේ විමුක්තිය පිළිබඳ දේශනා කරයි. එය ඉතා සරලය. අසා සිටින අයට වහා වැටහේ. කිසිම සැකයක් නැත. මටවත් එවැනි මිනිසාගේ සිත තදින් ආකර්ෂණය වන ගැඹුරු ධර්ම දේශනා කළ නොහැකිය. වචන හැසිරවීමේ දක්ෂතා ඇති උපමා උපමේය සහිත, ලිහිල් භාෂාවෙන් මෙම ධූතාංග භික්ෂූන් වහන්සේ විස්මයජනක ධර්ම දේශනා කළහ. අසා සිටින්නාගේ සිත් ප්‍රබෝධ විය. බොහෝ දේ මමද උගතිමි. එම දේශනා රසවත්ය, අර්ථවත්ය. අසා සිටීමට මැලි නැත. එදිනෙදා ජීවිතයේ හමුවන දේ ගැන කියති. අපි ඒවා ගතානුගතිකව පිළිගත් නමුත් එහි වැදගත්කම නොදනිමු. උන්වහන්සේ නියම බුද්ධ ශ්‍රාවකයෙකි. සති පඤ්ඤාවෙන් මහත් ශ්‍රද්ධා භක්තියෙන් ධර්මය අනුගමනය කරත්. පුහුදුන් ලෝකය ඉක්මවා යත්. උන්වහන්සේගේ වචන විලාසය චමත්කාරය. සමහරවිට ගැමිවහර ද සමහරවිට ගැඹුරු ද අරුත් ඇත. සමහර විට බැරෑරුම්, ගාම්භීර අදහස් අවධාරණය කොට ප්‍රකාශ කරයි. එක් එක් දේ විශාරද ලෙස විස්තර කරයි. ධර්මයට කිඳා බැස ගැටළු නිරාකරණය කරයි. සමහරවිට විච්ඡේදනය කොට දේශනා කරයි. එය අපේ හදවතට කිඳා බසී. මට ඇතිවන ගැටළු උන්වහන්සේගේ ප්‍රඥා මහිමයෙන් වහාම විසඳයි. උන්වහන්සේ සමඟ විසීමෙන් මම බොහෝ දේ ඉගෙන ගතිමි.

මා සමඟ මෙහි එන්ට ආරාධනා කළ විට සතුටින් බාර ගත්හ. මේ පළාතේ කඳු වනාන්තර ගහණ නිසා විය හැකිය. ආචාර්ය මන් සමාන භික්ෂූන් වහන්සේලා බොහෝ විරලය. මා වැඩිහිටි නමුත් උන්වහන්සේ මා කෙරෙහි යටත් පහත් ගති පැවතම් කරයි. සමහර විට එය මට ලැජ්ජාවකි. උන්වහන්සේ තම අධ්‍යයනයට අනුව මෙහි වැඩි දිනක් වසන්නේ නැත. වනවාසී ජීවිතය ප්‍රිය කරති. එය වැළැක්වීමට සුදුසු නැත. මෙවැනි භික්ෂූන් වහන්සේලා ඉතා දුර්ලභය.

උන්වහන්සේගේ චේතනාව ධර්මය තුළ කිඳා බැස තමන් වහන්සේගේ ප්‍රඥා මහිමය දියුණු කිරීමටය. එය අප සියලු දෙනාටම විශාල ලාභයක් වන්නේය.

ඔබට භාවනාව පිළිබඳ යම් ගැටළු ඇත්නම් උන්වහන්සේගෙන් අසා ඒවා නිරාකරණය කර ගන්න. ඔබට එය විශාල ලාභයකි. නමුත් කරුණාකර බලවත් යන්ත්‍ර, මන්ත්‍ර විස්මය ජනක තෙල්, බෙහෙත් නොයෙක් කරදර වලින් මිදීම පිණිස භාවිතා කරන කිසිවක් ඉල්ලන්ට එපා. එවැනි දේ ධර්ම මාර්ගයට අයත් නැත. එබැවින් එසේ ඇසීම උන්වහන්සේට හිරිහැරයකි. ඔබට බැනුම් අහන්ටත් වේවි. මා නොකීවා කියන්ට එපා. ආචාර්ය මන් එවැනි භික්ෂුවක් නොවේ. උන්වහන්සේ නියම භික්ෂුවකි. උන්වහන්සේ සත්‍ය ධර්මය දේශනා කරයි. හොඳ, නරක, කුසල්, අකුසල්, හරි, වැරදි, ගුණ, අගුණ ආදී දේ මිනිසාගේ හිත සුව පිණිස දේශනා කරති. උන්වහන්සේ ධර්ම මාර්ගයට පිට වෙනත් දේ නොකියති. උන්වහන්සේ බුදු බණ පමණක් දේශනා කරති. මම උන්වහන්සේට අසීමිත ලෙස ගෞරව කරමි. උන්වහන්සේට මා ඒ බව කීවේ නැත. එහෙත් පර චිත්ත විජානනයෙන් දනී.

ආචාර්ය මන් අප සැමගේ වැඳුම් පිදුම් ලැබීමට අතිශයින් සුදුසු වෙති. උන්වහන්සේ සැබවින්ම ලෝකයාගේ පිං කෙතකි. තමන් වහන්සේගේ අධිමා-නුෂික ගුන ගැන උන්වහන්සේ ප්‍රකාශ නොකරති. නමුත් අපි සාකච්ඡා කරන විට එය පැහැදිලිය. උන්වහන්සේ අනාගාමි තත්ත්වයෙන් සිටින බව මට වැට-හේ. උන්වහන්සේගේ දැනුම හා අවබෝධය බෞද්ධ පොත පතින් එන අනාග ාමී පුද්ගලයාගේ විස්තරයට ගැලපේ. උන්වහන්සේ නිතරම මට එක විදියටම හිතවත් කම් දක්වයි. කිසි දිනක මුරණ්ඩු උදාරම් ගති පෙන්ට නැත. ඉතාමත්

# 3

# හදවතක් විමුක්තියට පත්වුණි

යටත් පහත් විදියට හැසිරෙති. මගේ හද පත්ලෙන්ම උන්වහන්සේට ගෞරව ආදර කරමි.

මේ ආදී වශයෙන් ජම් බුන් උපාලි තෙරණුවෝ එහි රැස් වී සිටි ගිහි පැවදි පිරිසට කීහ. ආචාර්ය මන් උන්වහන්සේගේ කුටියට ගියාට පසු මේ දේශනය කළහ. එහි සිටි ආචාර්ය මන්ගේ ශිෂ්‍ය පිරිස පසුව මෙය මේ ආකාරයෙන් උන්වහන්සේට කියන ලදී. උන්වහන්සේ විසින් පසු කාලයක තමන්ගේ අනිකුත් ශිෂ්‍යයන්ට මෙය සුදුසු අවස්ථාවක කියන ලදී. ''මුත්තෝදය'' යනු හදවතේ ''විමුක්තිය'' හෙවත් නිදහසයි. ආචාර්ය මන්ගේ පිරිනිවීමෙන් පසු අදාහන උත්සවයේදී මෙම පුවත මුද්‍රණය කර සංවේග පත්‍ර බෙදා හරින ලදී. ආචාර්ය මන්ගේ නාමය එතැන් පටන් මුඛ පරම්පරාවෙන් පැවත ඒ. උදොන් තාහි ගමේ වට බොදි සොම්ෆොන් පන්සලේ වාසය කරණ ජම් බන් ධම්මපේදී ස්වාමීන් වහන්සේගේ විස්තරයට අනුව ආචාර්ය මන් 1929 සිට 1940 දක්වා චියං මයි ප්‍රදේශයේ විසූහ.

අවුරුදු ගණනකින් පසු උන්වහන්සේ ජම් බුං උපාලි තෙරුන්ගෙන් සමුගෙන උතුරු ප්‍රදේශයට ගියහ. එය ඉතා ඈත කඳුකරයකි. ඝන වනාන්තරයකි. මෙපමණ කලක් ධර්ම දේශනා කර විඩාවට පත් උන්වහන්සේ හුදකලාව තම පුරුදු භාවනාවෙන් කල් ගෙවීමට බෙහෙවින් කැමති විය. අවුරුදු ගණනාවකට පසු තම සිත් වූ පරිදි කැලෑ පරිසරයට ගියේය. චියං ඩාඕ හි මයි රිම් ප්‍රදේශයේ අවුරුද්දක් පමණ සැරි සැරූහ.

තමා හැකි තරම් වීර්‍ය්‍යය වඩමින් අවසාන මග්ගඵල ලබා ගැනීමට ජීවිත පූජාවෙන් ඉටා ගති. භික්ෂූන් වහන්සේලාට හැකි පමණින් අවවාද අනුශාසනා දුනි. එය ඉතාම සාර්ථක විය. සමහර ශිෂ්‍යයෝ මග්ගඵල නෙලා ගත්හ. මින් මතු තමන් වහන්සේ එකම අධිෂ්ඨානයකින් භාවනා කළහ. තවමත් සැඟ වී ඇති

කෙළෙස් උල්ලංඝනය කළයුතුය.

සමාජය ඇසුරු කරමින් වගකීම් භාර ගැනීම නිසා භාවනා මනසිකාරය කඩ වේ. තමාට රිසි සේ හුදකලාව සිටිය නොහැකිය. මේ වැනි සමාජය ඇසුරු කිරීමේදී බොහෝ සති, පඤ්ඤා තිබිය යුතුය. භාවනාව දියුණු නොවේ. භාවනාව දුෂ්කර වේ. කඩා කප්පල් වේ.

ඉතාම පෞරාණික වනාන්තරය මිනිස් වාසයකින් තොරවිය. තමන් වහන්සේගේ ශේෂ වූ කෙළෙස් උදුරා දැමීමට මෙය සුදුසු පරිසරයකි. හදවතේ රැඳී ඇති ආසා - කැමැත්ත - ඡන්දය මුලින් උපුටා දැමිය යුතුය. තම හිත රැවටෙන අසම් මානය දුරු කළ යුතුය. අනුන් සමඟ අසුර නිසා ඒ ගමන යා නොහැකිය. වතුර පිරුණ පාරුව ගිලෙන්නාක් මෙනි. තමාගේ විමුක්තිය සෙවීමේදී අනුන්ට අනුකම්පා කිරීමෙන් වැළකිය යුතුය. අනුන්ගේ දුක දැකීමෙන් වැළකිය යුතුය.

''දැන් මට ඇත්තේ මගේ ගැන සෙවීමය. මට අනුකම්පා කිරීමය. එවිට නියම බුද්ධ පුත්‍රයෙක් මෙන් වීර්‍ය්‍යය වැඩිය හැකිවේ. මම මෙහි ආවේ සංසාර සාගරය තරණය කිරීමටය. සියලු දුක් නැසීමටය. බුදුරජාණන් වහන්සේ පාර පෙන්වා ඇත. ධර්මය දේශනා කර ඇත. තමාගේ කාර්‍ය්‍යය පසෙක තබා අනුන් වෙහෙසීමට අවවාද දුන්නේද ? ධර්මය යම් ප්‍රමාණයක් අවබෝධ වූ අපි වෙනත් දේ කිරීමට පෙළඹෙමු.

මුල් කාලයේදී බුදු රජාණන් වහන්සේ සුළු ශ්‍රාවක පිරිසකින් ශාසනය ආරම්භ කළහ. ඉන්පසු රහතන් වහන්සේලා තුළින් එම පණිවිඩය ලොව පතල විය. එහෙත් මට එම අති උත්තම තත්ත්වය නැත. මගේ දියුණුව ප්‍රධාන විය යුතුයි. මම දියුණු වු විට එහි වාසිය ඉබේම අනුන්ට ලැබේ. කාලය මිඩංගු නො-කරමි. දැන් මට විශාල සටනක් කළ යුතුව ඇත. ''කෙළෙස් සහ මග්ග අතර සටනකි. සිතේ විමුකතියට මෙම යුද භටයින් දෙදෙනාටම මම මෙතෙක් හිතවත් කම් දැක්වුයෙමි. එහෙත් මින් මතු ''මග්ග'' මගේ එකම යුද භටයා විය යුතුයි. මගේ විර්‍ය්‍යය අඩු වුවහොත් ''කෙළෙස්'' දිනනවා ඇත. මේ ''දෙදෙනා'' අතර වෙනස හොඳාකාර දැනගත යුතුයි. කෙළෙස් දිනුවොත් මම අනන්ත සසර යා යුතුයි. මගේ සිත ම පාලනය කළ යුතුයි. දැන් භයානක ලෙස යුද වැදිය යුතුයි. මේ යුද්ධය කරමින් මැරුණත් කමක් නැහැ. කෙළෙස් වලට පරාජය වුවනොත් කෙළෙස් සමච්චලයට මට සිනා සෙනවා ඇත. එකම මාර්ගයයි ඇත්තේ.

මේ ආදී වශයෙන් උන්වහන්සේ තමා සමඟ කථා කළේය. රෑ දවල් තිස්සේ යුද බිමේ සංග්‍රාමයේ වැදිය යුතුයි. සිටිමින්, හිඳිමින්, ඇවිදිමින් නිදි වැතිරෙමින්

නින්ද යන තුරුත් බාහිර ලෝකයෙන් එන සියලු වේදනා සහ තම ශරීරයෙන් එන වේදනා සහ සිතිවිලි සියල්ලම අවධානයෙන් පරීක්ෂා කරති. සති පඤ්ඤා ධම්ම චක්‍රය මෙන් කරකැවේ. ශරීරය ගැන තැකීමක් නැත.

පසු කාලයකදී තමන් වහන්සේ ගත් වීර්‍යය ගැන කථා කරන විට උන්වහන්සේගේ ශිෂ්‍යයෝ ගල් ගැසී සිටියහ. ආචාර්ය මන් නිවනට දොර විවෘත කර ඇත. ඇතුළ බිඳක් පෙනේ. උන්වහන්සේ නොපසුබට වීර්‍යයෙන් සති පඤ්ඤා වැඩූහ.

තම සිත මීට බොහෝ කාලයකට පෙර අනාගාමී තත්ත්වයකට පැමිණුන වග උන්වහන්සේ තම ශිෂ්‍යයින්ට කීහ. එහෙත් ධර්මය ඉගැන්වීමේ නිරත වූ හෙයින් ඉන් ඉදිරියට යා නොහැකි විය. වියං මායි හිදී මේ රූක්ෂ ප්‍රතිපත්තියෙහි යෙදී එම අරමුණ සාර්ථක විය. කායික වශයෙන් උන්වහන්සේ නිරෝගී බැවින් එම උත්සාහය සඵල විය. ඉතා ඉක්මණින් සාර්ථක විය. උන්වහන්සේගේ අභ්‍යන්තර අරගලය දඩයම් බල්ලෙක් තම ගොදුර හැම පැත්තෙන්ම රකින්නාක් මෙනි. වැඩි කලක් යන්ට ප්‍රථම ගොදුර කෑලි වලට ඉරා දමයි. එමෙන් මහා සති, මහා පඤ්ඤා තුළින් කෙළෙස් සුනු විසුණු විය. මහා සති, මහා පඤ්ඤා එක මොහොතක්වත් පසු බැසීමක් නැත. තමන් ආයාසයෙන් රකින්නටත් සමහර විට අවශ්‍ය නොවේ. එය ඉබේම පිහිටයි. සියලු අරමුණු සති පඤ්ඤාවෙන් දකියි. ඒවායේ සත්‍ය ස්වභාවය දුටු පමණින් අත්හරී. එබැවින් අත්හරින්නට යැයි අමුතු අතදීමක් අවශ්‍ය නොවේ. එසේ අවශ්‍ය වූයේ මුල් අවස්ථාවේදීය. සති පඤ්ඤා පුරුද්දක් වශයෙන් පිහිටා ඇති විට අරමුණ පරීක්ෂා කිරීම, විචාරීම, ප්‍රවේසම් වීම අනවශ්‍යය හේතුඵල එකට සංඝටනය වී ඇත. වීර්‍යය, කුසලතාවය එහිම පිහිටා ඇත. සියල්ල එකට සිද්ධ වී ඇත. නිදා ගන්නා සුළු කාලය හැරුණ විට සියලුම දෛනික කටයුතු මහා සති, මහා පඤ්ඤාවෙන් සිදුවේ. එය උල්පතකින් නොනවත්වාම වතුර කාන්දු වන්නාක් මෙනි.

සෑම සිතක්ම සති පඤ්ඤාවට ලක්වේ. සතර නාම ස්කන්ධ මෙහිදී අරමුණු කරයි. රූප ස්කන්ධ කලින්ම බැහැර කරණ ලදී. එය ප්‍රශ්නයක් නොවේ. එය අනාගාමී වීමේදී අත්හැරුණි. කායානුපස්සනාව අවශ්‍ය වූයේ එතෙක් පමණි. කයේ සියලුම කොටස් විචාරා එහි අනිච්ච, දුක්ඛ, අනාත්ම ස්වභාවය සති පඤ්ඤාවෙන් බැහැර විය. එය සදාකාලිකවම බැහැර විය.

අරහත් මාර්ගයට පැමිණි විට නාම ස්කන්ධ පමනක් විපස්සනා කරයි. සුළු වේලාවක් නාම ස්කන්ධ විචාරන විට එකින් එක අතුරුදහන් වේ. අනාත්ම ස්වභාවය ඉලක්ක වේ. මේ සියලුම අපූර්ව සංසිද්ධිය ''මම මගේ'' යන අයිතිවාසිකම් වලින් තොරය. ස්ත්‍රී, පුරුෂ භාවයක් නැත. නාමස්කන්ධය තුළ

පුද්ගලික භාවයක් නැත. එය පඤ්ඤාවෙන් අත්දැකීමකි. බොහෝ අය මේ පිළිබඳ දැනුම පොත පතකින් හෝ අනුමානයෙන් ලබත්. එය ප්‍රමාණවත් නොවේ. අවබෝධ සහ අනුමානය අහස පොළොව මෙන් වෙනස් වේ.

පොත පතින් හෝ කට පාඩමින් දැනුම ඇති අය තම අදහස් බොහෝ ඥානවන්ත යැයි සිතති. ඇත්තෙන්ම එම මෝහයකි. එබැවින් තම මානය දිට්ඨිය ග්‍රහණය කර අනුන්ගෙන් උපදෙස් නොලබයි. මේ මානාධික භාවය උගත්තුන් සහ සාකච්ඡා කිරීමේදී පෙනේ. ප්‍රඥාවෙන් මෙම සැඟ වී ඇති කෙළෙස් දැක්ක යුතුය. ඉස්මතු කළ යුතුය. එවිට එම තණ්හා, දිට්ඨි වලින් සැදුම් ලත් අත්තිවාරම දෙදරා බිඳී යයි. මෙය භාවනාමය ප්‍රඥාවකි. උගතුන් තම දැනුම, දෘෂ්ටිය, මානය නිසා තර්ක විතර්ක කරත්. තමාගේ මතය ස්ඵුට කරත්. වචන වලට සීමා වේ. අන්තිමේදී ශිෂ්ට ගති පැවතුම් පවා අහෝසි වේ. පරාජිත වේ යැයි අවදානමක් ඇතිව සාකච්ඡා කරන බැවිනි.

භාවනාවේදී මෙම කෙළෙස් හඳුනා ගනිති. සති පඤ්ඤාවෙන් ඉලක්ක වූ විට කෙළෙස් නැගී සිටීමට නොහැකියි. ධර්මයේ ඇති ප්‍රබල ආයුධය සති - පඤ්ඤා වේ. කෙළෙස් වලින් සති පඤ්ඤා පරාජය කළ නොහැකිය. සති පඤ්ඤා ඉදිරියේ කෙලෙස් නිර්භීත නොවේ. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබුවේ සති පඤ්ඤා තුළිනි. ශ්‍රාවක සංඝයා අර්හත්වය ලැබුවේ සති පඤ්ඤා තුළිනි. සති පඤ්ඤා තුළින් විපස්සනා ඥාන පහළ වේ. ඉගෙනීම, අනුමානය, හැඟීම, කල්පනාව, මතය ආදිය තුළින් තම කෙළෙස් මුලිනුපුටා ගැනීමට නෙ-ාහැකිය. මුල් කාලයේදී මෙම අදහස් මතකයෙන් ගෙන මඟ සළකුණු වශයෙන් ඉවහල් වේ. එය සඤ්ඤා ස්කන්ධයයි. මෙවැනි ආකල්ප වලින් ප්‍රවේසම් විය යුතුයි. ඒවා සත්‍යය ලෙස ආරූඪ වේ. බුද්ධා දී රහතන් වහන්සේලා කෙළෙස් දුරු කලේ උගත්කම් හෝ මතය හෝ අනුමානය තුළින් නොවේ.

උන්වහන්සේලා ලෝකයට සත්‍ය ප්‍රකාශ කළේ ප්‍රඥාව තුළිනි. ප්‍රඥාව වෙනුවට භාවනායෝගීන්ට තම බුද්ධිය හෝ අනුමානය ආදිය වංචා, ප්‍රයෝග වශයෙන් අවුත් මුලා කෙරේ. කෙළෙස් කිසිවක් දුරු කර නැතිව මේ ප්‍රයෝග වලට අසුවිය හැකිය. දැනුම් සම්භාරය ඉතාම විශිෂ්ට වුවද තමාගේ විමුක්තිය නැත. කාලාමයන්ට බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මෙසේ තමා රැවටීමට යොමුවිය හැකි නිසාය. එබැවින් අනුමානය විශ්වාසය කරන්ට එපා. අතීතයේ සිට පැවත එන තොරතුරු විශ්වාස කරන්ට එපා. ගුරුවරු කී පමණින් විශ්වාස කරන්ට එපා. එය තමාට පැහැදිලි වන්නේ තමාගේම සති, සමාධි, පඤ්ඤා වෙනි. මෙය ඒකාන්තයෙන්ම නියත නිසැක සහතිකයයි. බුද්ධාදි රහතන් වහන්සේලාට තවකෙකුගෙන් තමාගේ රහත් භාවය ගැන අසා දැන ගන්නට වූයේ නැත. සන්දිට්ඨික ගුණය ඇස් ඉදිරිපිට දක්නට ලැබේ. එය බුදු දහම ඒ ආකාරයෙන්

පිළිපදින විට ලැබෙන ඵලයකි.

තමන් වහන්සේ මේ උසස් ප්‍රතිපත්ති පුරණ විට එය සම්පූර්ණයෙන්ම සිත් ඇද ගත්තේය. කාලය ගැන අවධාරණයක් නැතැයි පැවසීය. දවසේ මොන යම් යාමදැයි අමතක විය. නිදාගන්ට අමතක විය. තමන් කෙතරම් වෙහෙසී ඇද්දැයි අමතකය. සිත නිර්භය විය. නොසෙල් වුණි. සිත නිරන්තරයෙන්ම සියලු කෙළෙස් සමඟ පොර බදති. ඒවා මුලිනුපුටා දැමීමට සූදානමින් සිටියි. චියාං මායි හි වට් ජේඩී ලුඅං සිට පැමිණි දා සිට එක් දිනකවත් නිකරුනේ පසු නොවීය. වැඩි කලක් යන්ට ප්‍රථම අවසාන අති උත්තම අවබෝධය පහළ විය.

හුදකලාව මෙම ගමන ආරම්භ කළ මොහොතේ සිට තම සිත වේගවත්ව ක්‍රියා කළේ අජානීය අශ්වයෙකු මෙන් යැයි පැවසීය. උඩ අහසට ගොස් නැවත පොළොවේ කිඳා බැස නැවතත් අහසට පැන නැංගේය. අනන්ත විශ්වයේ අපූර්ව විශ්මිත දේ සෙවීමට කැමති විය. තම සන්තානයේ සියලුම කෙළෙස් එක විට උදුරා දැමීමට හැකියැයි සිතුණි. අවුරුදු ගණනක් සිත සමාජ අවශ්‍යතා නිසා ආවරණය වී තිබුණි. කැමති විදියට සැරිසරන්ට නොහැකි විය. විශ්වයේ ඇති ගුප්ත රහස් අවධාරණය කිරීමට බොහෝ කාලයක් සිට සිතමින් සිටියේය. දැන් ඒ නිදහස ලැබිණ. එය භාග්‍ය සම්පන්න නිදහසකි. සිත තුන් ලෝකය තුළ හැසිරවීමට හැකිවිය. මහා ගවේෂණයකි.

උන්වහන්සේ සිත අභ්‍යන්තරයද බාහිර ලෝකයද පරීක්ෂා කළහ. උන්වහන්සේගේ සතිපඤ්ඤා භාත්පස විනිවිද යයි. නිරන්තරයෙන් ඇතුළ සිට, උඩ, යට සංක්‍රමණය කරයි. සෑම විවාද ගත ප්‍රශ්නයක්ම නිරාකරණය කරයි. තමා වෙන් කර විසන්ධි කරයි. තමා තුළ පැවති බොරුව කඩා සුනු විසුණු කරයි. මහා සයුරේ පිහිනන යෝධ මත්ස්‍යයෙක් මෙන් තමන් ඉදිරියේ ඇති සියලු ආවරණ කැඩී විසිරී ගියේය. උන්වහන්සේගේ අතීතය දෙස බැලූ විට නොයෙක් බාධා දුර්වර්ණ ජීවිත ප්‍රවෘත්ති හානිකර ප්‍රතිඵල පෙනෙන්නට විය. මේ සියල්ලෙන් මිදීමට මාර්ග යක් දුටහ. හදවත වේගයෙන් ස්පන්දනය විය. අනාගතය දෙස බැලූ විට රාජකීය සුන්‍යතාවයකි. එහි කාන්තිමත් ආලෝකය දස අත විහිදී ඇත. එය විස්තර කළ නොහැකිය. ඇසට එවැනි ආලෝකයක් ස්පර්ෂ වී නැත. ප්‍රේක්ෂයාට යම් හැඟ මක් දීමට එය වචනාතික්‍රාන්තිය. උන්වහන්සේගේ මෙම අත්දැකීම් ඒ ආකාරයෙන් ඔබ වෙත ගෙන ඒමට මට නොහැකි නිසා මුළු හදවතින්ම දුක්වෙමි.

ආචාර්ය මන් භාවනා කරමින් රෑ බෝ වන තුරු එහිම සිටියහ. තමන් වහන්සේගේ එම අසිරිමත් මහා සති, මහා පඤ්ඤා උපරිම අවස්ථාවේ සිටී. සිත වටේ ධම්ම චක්‍රය මෙන් වේගයෙන් කරකැවේ. උන්වහන්සේ විශාල කඳු පාමුලක වැඩ හුන්නේය. පේන තෙක් මානයේ පැතලි ගල් තලාවකි. පරිසරය

අහස පමණි. එහි තිබූ එකම ගස යට උන්වහන්සේ භාවනා කළහ. දවල් කාලයේ මේ ගසේ සෙවන තිබුණි.

එම ගසේ නම නොදනිමි. ඒ ගැන මට සමා වුව මැනව. උන්වහන්සේගේ අද්විතීය ආකර්ෂණීය විස්තරයට ඇහුම් කන් දීම හැර එවැනි පරිසර ගැන ඇසීමට නොහැකි විය. එම කඳු ගැටයේ නම, පළාත, නගරය ගැන නොදනිමි. මම මා ගැන කම්පා වුනිමි. මගේ මිනිස් ජීවිතය මේ ආකාරයෙන් නාස්ති කරම්ද එවැනි අවබෝධයක් මේ අත්බැව්හි ලැබීමට පාරමී සම්පූර්ණද ? ආදී වශයෙන්, යම් දිනක උන්වහන්සේගේ ජීවන චරිතය මෙසේ ලියන්ට වේ දැයි අදහසක් නොතිබුණි. එබැවින් කිසි ප්‍රශ්නයක් නෑසුවෙමි.

එදින සන්ධ්‍යාවේ ආචාර්ය මන් පටිච්ච සමුප්පාදය මෙනෙහි කරමින් සක්මන් භාවනා කළහ. එය උන්වහන්සේගේ සම්පූර්ණ අවධානය වුණි. එම බලවත් ප්‍රඥාව හේතු කොටගෙන රාත්‍රී 9ට පමණ හිඳිමින් භාවනා කරන විට සමාධි ගත විය. අවිද්‍යා යන්නෙහි අර්ථය පැහැදිලිය. එක් එක් පාදයේ අර්ථ විග්‍රහ කළේය. දොලොස් ආකාර පටිච්ච සමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළහ. හේතු සාධක එකිනෙකට සාපේක්ෂ වී ඇත. මෙසේ මෙනෙහි කරණ විට උප්පත්තිය, මරණය, කෙළෙස් මූලික අවිද්‍යාවෙන් හට ගන්නා ආකාරය පැහැදිලි විය.

එහි හිඳිමින් භාවනාවේ යෙදුන විට තීරණාත්මක ඉතාම වැදගත් මොහොත උදාවිය. එනම් දැලි පිහියක් මෙන් මුවහත් වූ මහා සති, මහා පඤ්ඤා විසින් අවිද්‍යාව නම් සතුරා පරාජය කිරීමයි. අවිද්‍යාව දක්ෂ ලෙස අසම් මානය ආරක්ෂා කරයි. පහරවල් වළක්වති. තම විරුද්ධවාදියා විපිලිසර කරති. අනන්ත සසර පටන් අවිද්‍යාවට අභියෝගයක් නොලැබුණි. එහෙයින් අවිද්‍යාව අධිරාජ්‍යය කළේය. උප්පත්ති මරණ නම් ඔහුගේ රාජධානිය පරාජය කළ නොහැකිය. මෙය සියලු ප්‍රාණීන් අභිභවා ඇති මහා බලය වේ. නමුත් අළුයම 3 වන විට ආචාර්යය මන් අවසාන වරට යුද වැදුණි. එහි ඵලය වූයේ අධිරාජ්‍යයාගේ සිංහාසනය සුණු විසුණු වීමය. රජ රාජ්‍යයෙන් පහවිය. උප්පත්ති, මරණ රාජධානිය විනාශ විය. රජ බොහෝ සේ දුර්වල විය. නැවත නැගී ඒමට ශක්තිය නැත. ඒ මොහොතේ අවිද්‍යාව නිරුද්ධ විය.

මේ මොහොතේ මුළු විශ්වය චලනය වීමක් වැනි කම්පාවක් ඇතිවිය. ඒ සමගම ක්ෂණයකින් දේව සමූහයා රැස් වූහ. මෙම ශ්‍රේෂ්ඨතම ජයග්‍රහනය පිළිබඳ තම බලවත් සතුට ප්‍රකාශ කරමින් එකනින් නාද කලහ. එය විශ්වය පුරා රැව් පිළිරැව් දුණි. තථාගතයන් වහන්සේගේ තවත් ශ්‍රාවකයෙක් ලෝකයේ උපත ලබා ඇත. සතුට නිම් හිම් නැත. ඔවුහු ප්‍රීති ඝෝෂා පැවැත්වූහ. මනුෂ්‍ය ලෝකයේ අය එම මොහොත ගැන නොදනිත් තම දෛනික කාම ලෝකයේ

කම් සැප විඳිමින් සිටින බැවින් මිනිස් ලොව මෙවැනි ආශ්චර්යයක් සිදු වූ බව නොදනිති. මේ මහා ආශ්චර්යයමත් ධර්මය මිනිසෙකුගේ සිත තුළ හටගත් බවට ඔව්හු නොදනිති.

මෙම අපූර්ව සිද්ධියෙන් පසු සිතේ ඉතුරු වූයේ ''විශුද්ධි ධර්මයයි'' ඉතාම පිරිසිදු, සත්‍ය, ස්වාභාවික සිතකි. එම සිත මුළු සර්වාංගය තුළ ඉතිරී පැතිරී පවතී. එම ප්‍රත්‍යක්ෂ අත්දැකීම නිසා වචනාතික්‍රාන්ත සියුම් වේදනාවක් විස්මයක් සහ පුදුම සැනසීමක් ඇත. ලෝකයා කෙරෙහි මෙතෙක් පැවත තිබූ කරුණාව අමතක විය. ඒ සමඟම අන් අයට ධර්මය කියා දීමේ උනන්දුව නැතිවිය. මේ පරම ශ්‍රේෂ්ඨ දහම යමෙකුට ඉතාම ගැඹුරුය. කෙනෙකුට පහදා දිය නොහැකිය. එබැවින් මෙම දහම කෙසේ දේශනා කරන්නේද ? මේ සම්මුති ලෝකයේ හිඳිමින් එම අති පිරිසිදුතාවය වින්දනය කළ හැකිවේ.

මෙසේ බොහෝ වේලා මෙනෙහි කරන විට බුදුරජානන් වහන්සේ අසීමිත කරුණා ගුණය දුටහ. උන්වහන්සේ මෙවැනි අසිරිමත් ධර්මය අවබෝධ කොට අන් අයටත් කියා දීමට උනන්දු විය. මේ බුදු දහම තුළ අබමල් රේණුවක්වත් බොරුවක් නැත. ආචාර්ය මන් මුළු රාත්‍රී කාලය බුදු ගුණ මෙනෙහි කරමින් ගත කළහ.

ආචාර්ය මන් ස්වභාවයෙන්ම ඉතා කරුණාවන්තයි. මිනිසාගේ ආධ්‍යාත්මික ගුණ වගාව දියුණු කිරීමට අනුකම්පා තිබුණි. නමුත් උන්වහන්සේගේ දැන් පවතින සිත තීක්ෂණය බලවත්ය. ආලෝකමත්ය. මේ ධර්මතාවය කිසි කෙනෙකුට පැහැදිලි කළ නොහැකිය. කෙතරම් විස්තර කළත් කෙළෙස් සහිත පුද්ගලයින්ට මෙය විෂය නොවේ. මේ විස්තරය කීවොත් උන්වහන්සේ උමතු වූවෙකැයි සිතත්. ප්‍රකෘති මිනිසාට මෙහි අගයක් නැත. මෙම ධර්මය අවබෝධ කළ හැකි අය ඉතා විරලය. තමන්ගේ ඉතිරි කාලය හුදකලා වීමට සිදුවේ. මුළු ජීවිත කාලයක් ගත් සියලුම වෙර වීර්යය නිසා තම සිතැඟි ඉෂ්ට විය. එය ප්‍රමාණවත් වේ. ධර්මය ඉගැන්වීමට ගන්නා වීර්යය නිෂ්ඵල විය හැකිය. තමන් වහන්සේගේ අසීමිත කරුණාව නිසා නින්දා අපහාස විඳීමට සිදුවේ. මිනිසා එතරම් අනුන්ට ගැරහීමට කැමති වේ.

මෙවැනි අදහස් උන්වහන්සේගේ සිත තුළ පැන නැගුණි. බුදුරජාණන් වහන්සේගේ ආදර්ශය ගැන සිතන විට තමන් වහන්සේත් සාමාන්‍ය මනුෂ්‍යයෙක් ව ගත කළ අවදිය මතක් වුණි. අන් අයගෙන් වෙනසක් නැත. එහෙත් ධර්මය අවබෝධ විය. මෙම ප්‍රතිපදාව අනුගමනය කළ හැකි තවත් මනුෂ්‍යයෝ ඇත. එය අවතක්සේරු කිරීම සුදුසු නැත.

බුදුරජාණන් වහන්සේ මාර්ගඵල නිවන එක් පුද්ගලයෙකුට සීමා කර නැත. එය ලෝකයේ ඉමහත් මිනිස් සංහතියට දුන් දායාදයකි. වර්තමාන අනාගත

පරම්පරාවට ද සාධාරණය. බුදු දහම අනුගමනය කර නිවන් ප්‍රත්‍යක්ෂ කළ පුද්ගලයන්ගේ සංඛ්‍යාවේ සීමාවක් නැත. එහෙයින් තමන් වහන්සේගේ අවබෝධය විශේෂ දෙයක් නොවේ. එය මුලින් පැහැදිලි වූයේ නැත.

මෙසේ සිතන විට ධර්මය දේශනා කිරීමට කැමැත්තක් ඇති විය. තමන් වහන්සේ පෙන්වා දෙන මාර්ගයේ ගමන් කිරීමට හැකි අයට දහම් දෙසන බව සිතුණි. ධර්මය උගන්වන ගුරුවරයා හට වගකීමකි ඇත. එනම් අවශ්‍ය භක්තිය ගෞරවය නැති අයට ධර්මය නොකියා හැරීමය.

ධර්මය අසා සිටින සමහර අය කථා කරති. ශබ්ද කරති. එවැන්නෝ ධර්මයට අගෞරව කරති. ධර්මය යනු සාමාන්‍ය දෙයක් යැයි සිතති. ලෝකයේ ඇලී ගැලී සිටින අය ධර්මයට නැඹුරු නොවේ. එවිට ධර්මය දේශනා කළ නොහැකිය. එසේ කරන විට ගුරුවරයා වැරැද්දක් කරන අතර අසා සිටින්නා නිෂ්ඵල වේ.

ආචාර්ය මන් මේ ධර්මය අවබෝධ කිරීමට බොහෝ වෙහෙස දැරූහ. රූක්ෂ කැලෑවල, කඳු සිඛර වල තම ජීවිතය පරදුවට තබා උන්වහන්සේ වැර දැරූහ. මෙවැනි වීර උදාර ගති ගුණ පුරුදු පුහුණු කරමින් ඉතා දුකසේ අවබෝධ කරගත් ධර්මය නිකරුනේ වතුරේ පා කර හැරිය නොහැකිය. භික්ෂුව යම් ක්‍රියාවක් කිරීමට කලින් ඉතා සුපරික්ෂාකාරීව තම ප්‍රයත්නයේ ඵලය ගැන සිතයි. ධර්මය දේශනා කරණ විට එය කළ යුත්තේ ඉතාම සුපරීක්ෂාකාරීවය. එය වැරදි ආකාරයට ලෝකයා හට දුන් විට ඉන් නරක ඵල විපාක ලැබේ.

ධර්මය උගන්වන්නේ අසා සිටින අයගේ දුක් පීඩා නැති කිරීමටය. වෛද්‍යවරයෙක් බෙහෙත් නියම කරන්නාක් මෙනි. එහෙත් යමෙක් දුක් නිවා ගැනීමට උපකාරයක් පිළිගැනීමට නොකැමති නම් භික්ෂුවක් එවැනි අයට ධර්මය දේශනා කරන්නේ ඇයි ? තමන් වහන්සේගේ සත්‍ය ධර්මය හදවත තුළ ඇත. එබැවින් වනයේ වාසය කිරීම සතුට එළවන්නකි. ගෝලයන් සෙවීමේ අවශ්‍යතාවයක් නැත. එය අවශ්‍ය වන්නේ ඉවසිය නොහැකි තරම් ඉගැන්වීමට කැමැත්ත ඇති බැවිනි. ඉන් තමාගේ සතුට නැතිවේ. ධර්මය පිළිබඳ අධික වශයෙන් ශ්‍රද්ධාව නැති කෙනෙක් තමා ගුරුවරයෙක් යැයි කීවත් එය නාම මාත්‍රයක් පමණි.

ආචාර්ය මන් කැලෑවේ ජීවත් වීමට ඉතාමත් සුදුසු ලෙස ශාරීරික මානසික සකස් වීමක් ඇති බව කීහ. තම ධර්මය තුළින් සිතේ ඇති සතුට අසීමිතය. ධර්මය යනු සමාධියකි. ධර්මය ඇති සිත නිතරම තෘප්තිමත්ය. සමාහිතය, නිරවුල්ය. එහි සාමය රජ කරයි. කඳු මුදුන්, ඝන වනාන්තර උන්වහන්සේ කැමති පරිසරයන්ය. එහි ධර්මය සිත අරක් ගෙන වාසය කරයි. අන් අයට ඉගැන්වීම යුතුකමක් වශයෙන් බැඳීමක් විනා උන්වහන්සේට කිසිසේත් අනවශ්‍යය. ධර්මයේ

හැසිරීම යනු උන්වහන්සේගේ පරම යුතුකමකි. සැප සම්පත් විඳිමින් නිදහසේ සිටීමට කැමැත්තක් නැත.

අපි ධර්මයේ සිටින විට, ධර්මය අවබෝධ වූ විට, ධර්මයට අනුව ස්ථිර පැවැත්මක් ඇති විට ලෝක ව්‍යවහාරය ගැන කලබල නොවේ. වික්ෂිප්ත නොවේ. දුක් ගෙන දෙන පස්කම් සුව පසුපස නොයයි. සතුට සන්තෝෂය ඇත්තේ ධර්මය අනුව ජීවත් වන අයගේ හදවත තුළය. එය අන් අයගේ හදවතේ විද්‍යමාන නොවේ.

ධර්මය ඉගැන්වීම ගැන ආචාර්ය මන් ඉතා පරීක්ෂාකාරී වෙයි. ධර්මය ගතානුගතිකව උගන්වන්නේ නැත. ධර්මයේ එවැනි ගතානුගතිකත්වය නැත. ධර්මය ඕනෑවට එපාවට පුහුණු කළ නොහැකිය. ඉතාමත් සුදුසු ආකල්ප මත ගොඩ නගා ඇත. උත්තරීතර ගුණ සම්ප්‍රදායක් බුදු දහමේ ඇත. අවබෝධය නිකමට ලැබෙන්නේ නැත. එය යම් ගුණාත්මක ශ්‍රේණියකින් ක්‍රමයෙන් වැඩී යන ස්වභාවයකි. තනිකර සත්‍යය මත ගොඩ නැගී ඇත. ආචාර්ය මන් පිළිවෙත් පුරණ භික්ෂූන්ට නිතර දුන් අවවාදය නම් ධර්මය බොරු ආරූඪයක් නොවන බවයි. එබැවින් බොරුව ධර්මයට හාත්පසින් විරුද්ධය. බොරු රැවටිලි නැත. ධර්මය ඉතාම බරපතල බුරුලක් නැති නියම පිළිපැදීමකි. එය ලිහිල් කළ නොහැකිය. සිතේ හික්මීම, විනය පාලනය යනු ධර්මය වේ. නිහතමානී මමත්වයෙන් තොර තම සිත, කය, වචනය ඉබාගාතේ නොයන අයට පමණක් තනිව සිටිය හැකිය. ස්වෛරී භාවයක් ඇත.

ධර්මය උගන්වන විට උන්වහන්සේ තමාගේ සිත තුළ පවතින ධර්මය ගැන කථා කළේය. අවබෝධය යනු විශ්මිත ස්වභාවයකි. නොහිතූ අන්දමින් ධර්මය අවබෝධ වේ. එය මෙසේ වේ යැයි කලින් නිගමනය කළ නොහැකිය. තමා මැරී යලි ඉපදුනායැයි සිතේ. එකවරම අළුත් ජීවිතයක ඉපදේ. එය මොහොතක විපර්‍යාසයකි. පරිනාමයකි. තමා මෙතෙක් නොදත් දෙයක් එකවර විද්‍යමාන වේ. එය සදාකල් තිබුණත් මින් පෙර නොදිටු අත්දැකීමකි. එකවරම එන දැනුම අපූර්ව දර්ශනයකි. මෙම අති පාරිශුද්ධ අත්දැකීම කෙතරම් වෙනසක් වූවාද යන්න තේරුම් ගැනීමට කාලයක් යයි. එබැවින් ලෝක ව්‍යවහාරයට විරුද්ධ වන මෙම අත්දැකීම පුහුදුන් මිනිසාට තේරුම් කරන්නේ කෙසේද ?

මුල් කාලයේ සිටම ආචාර්ය මන්ගේ චරිතය වේගවත්ය. ක්‍රියාශීලීය. අවසාන අවබෝධයේදී මෙම චරිතය උද්දීපනය විය. එය කෙතරම් චිත්තාකර්ෂණීය දැයි කියත හොත් එය අමතක කළ නොහැකිය. පසු කාලයකදී තම ශ්‍රාවකයින්ගෙ ' ප්‍රබෝධය පිණිස මේ පිළිබඳ කථා කළහ. නැවත නුපදින ලෙස මගඵල ලැබූ මොහොතේදී තුන් ආකාර පරිභ්‍රමණයක් සිදුවිය. මෙය නවතම ''විවට්ට'' චිත්තය

වටා භ්‍රමණය විය. සියලු සම්මුතිය, සාපේක්‍ෂතාවය බිඳ වැටුණි. මෙය පළමුවෙනි භ්‍රමණය ද සිදුවිය. දෙවෙනි භ්‍රමණය සිදු වූ විට ''විමුක්තිය'' පහළ විය. එහි අදහස පැහැදිලි විය. පරම විමුක්තිය ලැබුණි. තුන්වන භ්‍රමණය අවසන් වීමත් සමඟ ''අනාලයෝ'' හෙවත් සම්පූර්ණ තණහකබය හෙවත් තණ්හාව ක්‍ෂය විය. එහි ඉතිරියක් නැත. මේ වන විට චිත්තය ධර්මය අතර වෙනසක් නැත. ''එක චිත්ත - එකධම්ම'' සිතේ ප්‍රකෘතිත්වය ධර්මතාවයයි. සම්මුතියේ ඇති දෙබිඩි ද්විත්ව ''මම - ඔබ'' සාපේක්ෂතාවය එහි නැත. මේ වනාහි ''විමුක්ති ධර්මය'' වේ. එය සරලය. පිරිසිදුය. පරමාර්ථය වේ. තනිකර ධර්මය මිස වෙනත් කිසි ආරූඪයක් සාපේක්ෂතාවයක්, සම්මුතියක් සමඟ සම්මිශ්‍රණය වී නැත. මෙය අවබෝධ වන්නේ එක් වරක් පමණි. එහි තව පරිපූර්ණ කිරීමක් නැත. මේ වනාහි ''විමුක්ති ධර්මය'' වේ. එය සරලය. පිරිසිදුය. පරමාර්ථය වේ.

බුදුරජාණන් වහන්සේ සහ අනිකුත් රහතන් වහන්සේලා අර්හත්වය ලැබුවේ එක් වාරයක් පමණි. ධර්මය හා චිත්තය එකම ස්වභාවයකි. ඒ පිළිබඳ තවදුරට කළ යුත්තක් නැත. ජීවිතය ගෙන යන ස්කන්ධයෝ - ස්කන්ධයෝ වෙති. ඒ පිළිබඳ තණ්හා උපදාන නැති බැවින් ඒවා නිසා සංඛාර නූපදී. ඒ හැර වෙන කිසි වෙනසක් නැත. චිත්තය සහ ස්කන්ධ වෙන් වෙන් වශයෙන් පවතී ඒවාට ආවේණික වූ ගති ලක්‍ෂණ පවතී. ඒවා ග්‍රහණය කිරීමක් හෝ මුලාවට පත්වීමක් හෝ නැත. එබැවින් එකිනෙකාට සම්බන්ධ නැත. එකක් නිසා අනිකට බලපෑමක් නැත. ඉතාමත් සාමකාමීව ස්කන්ධයන් හා චිත්තයන් ස්වාභාවික ලෙස මරණය දක්වා මෙසේ පවතී.

ශරීරය මරණයට පත් වූ විට මේ අති පරිශුද්ධ සිත ''යම් දීපො ච නිබ්බුතො'' යම් සේ පහනේ තෙල් ඉවර වූ විට දැල්ල නිවීයත් ද එසේම ආයුෂය ගෙවීමේදී සිත නැමැති දැල්ල නිවී යයි. ඉන්පසු මේ සිත නැවත ස්කන්ධයන් පරිහරණය නොකරති. සම්මුති ලෝකයේ කිසිවක් මේ සිතට අදාළ නොවේ. ආචාර්ය මන්ගේ මෙවැනි සංකල්පනා ඇති වූයේ එම තුන් ආකාර පරිභ්‍රමණයන් සිදු වූ විටය. ඒ මොහොතේදී සම්මුතිය ස්කන්ධයන් සහ විමුක්ති සිත ස්වාධීන වී සදාකාලියටම වෙන්විය.

ආචාර්ය මන් මෙම අවබෝධය ලබා විස්මයට පත් වී එළිවන තුරුම තමන් කෙතරම් මෝහයකින් මෙතෙක් කල් ගත කලාද යන්න ප්‍රත්‍යවේක්‍ෂා කළහ. ඉමක් කොනක් නැති සසර තමා ඇදගන ගිය ආකාරය ඉතාම සංවේග ජනකය. රූකඩයක් මෙන් ඇදී ගියේය. තමන් වහන්සේ ඉතාම පැහැදිලි ක්‍රිස්ටල් පළිඟුවක් වැනි මිහිරි රසැති ජලාසයකට පැමින ඇත. එවිට කඳුළු කඩා සැලුණි. සියල්ල ඉතා පැහැදිලිය. අහෝ ! මේ වනාහි බුදුරජාණන් වහන්සේ වදාළ චකබුං උදපාදි... අර්හත් ශ්‍රාවක ශ්‍රාවිකාවන් ලැබ ගත් අවබෝධය මෙවැනි ප්‍රසන්න විස්මිත

අවබෝධයකි. අවුරුදු 2500 ප්‍රථම මෙම අවබෝධය ලබා උන්වහන්සේලා ලෝකයා හට කියා පෑහ. බොහෝ දුක් මහන්සි වී තමන් වහන්සේ මේ අවබෝධය ලදහ. උන්වහන්සේ අනේක වාරයක් පොළොවේ දිගාවෙමින් බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රයට වැඳ වැටුනහ. යමෙක් මේ දර්ශනය දුටුවා නම් මේ භික්ෂුව මහත් දුකකින් කඳුළු සල සලා පොළොවේ වැතිරෙතියි සිතනු ඇත ! ලෝක පාලක දෙවියන්ට වැඳ වැටෙතියි ඔව්හු සිතනවා ඇත. දස දිසාවට නමස්කාර කරමින් උමතුවෙන් මෙන් උන්වහනසේ වැඳ වැටුනහ. උන්වහන්සේගේ එම හැසිරීම ඉතාමත් අස්වාභාවික විය. බුද්ධ, ධම්ම, සංඝ යනු කුමක්දැයි මේ මොහොතේදී තේරුම් ගියේය. ''යො ධම්මං පස්සති සො මං පස්සති'' එය සැබෑ විය. ''ය-මෙක් ධර්මය දකීද හේ බුදුන් දකී'' එබැවින් ඔහු ජීවමාන බුදුරජාණන් වහන්සේ ඉදිරියේ සිටිති. ආචාර්ය මන් තුළ ඇති වූ කෘතඥතාවය මේ ආකාරයෙන් බුද්ධ, ධම්ම, සංඝ රත්නයට දැක්වූහ.

මේ අසිරිමත් රාත්‍රිය පුරා දෙව් දේවතාවුන් වහන්සේලා නොයෙක් දේව ලෝක, බ්‍රහ්ම ලෝක වලින්ද, භූම්මට්ඨ, රුක්ෂ, ආකාසට්ඨ නොයෙක් තලවල දෙවිවරුන්ද උන්වහන්සේ ඉදිරියේ පෙනී සිටිමින් තම සතුට ප්‍රකාශ කළහ. එම නින්නාදය විශ්වයේ දෝංකාර දුනි. ධර්මය දේශනා කිරීමට ඔවුන් ආරාධනා කළහ. එහෙත් උන්වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ. මක්නිසාද ? තවමත් තමන් වහන්සේගේ ප්‍රීතිය සුවය විඳිමින් සිටින බැවින් තම මනස වෙනත් අරමුණකට යොමු කරන්නට නොහැකි වීමය. වෙනත් වෙලාවක ධර්මය දේශනා කරණ බවට ප්‍රතිඥා දුන් විට දේව සමූහයා අතුරුදහන් විය. ''විශුද්ධි දෙවියන්'' එම දින දුටු බව ප්‍රකාශ කර දෙවියෝ අතිශය සතුටු වූහ. එනම් රහතන් වහන්සේ නමක් දුටු බවයි.

පහන් වූ විට උන්වහන්සේ එම අසුනෙන් නැගී සිටියහ. එහෙත් ධර්මය අවබෝධ කිරීමේ විස්මය උන්වහන්සේගේ ගත සිත පිනා යයි. තුන් වරක් සිදු වූ භ්‍රමණය ඉතා සියුම් ලෙස විග්‍රහ කළහ. උන්වහන්සේ පිටදී සිටි වෘක්ෂ රාජයාද සිහිපත් විය. ගමේ දායක පිරිස උන්වහන්සේට බතින් බුලතින් සංග්‍රහ කළ බව සිහිපත් විය.

එවිට හීල් දානය සඳහා ගමට යාමට මැලිවිය. තමන් වහන්සේ අතිශය ප්‍රීතිය භුක්ති විඳිති. එහෙත් ගමේ අහිංසක ජනයාට විශාල පිනක් අත්පත් වන බව සිතූ විට පිඬු සිඟා යාමට සිත්විය. එදින උන්වහන්සේගේ ඇස් ඇර ඔවුන් දෙස බැලූහ. වෙනදා බිම බලාගෙන වඩිති. තමන් වහන්සේගේ පාත්‍රයට ආහාර බෙදන ඔවුන් දෙසද, ගමේ එක් රොක් වී ගෙවල් අවට සිටි මිනිසුන්ද, කුණු ගොඩේ සෙල්ලම් කරන දරු දැරියන් ද දැක, ඔවුන් කෙරෙහි අසීමිත කරුණාවක් පහළ විය. මුළු ගමම ආලෝකමත් වී ඇත. මිනිස්සු සතුටින් සන්තෝෂයෙන් සිනහ

මුහුනින් උන්වහන්සේ දෙස බලති.

උන්වහන්සේගේ කඳු මුදුනේ පිහිටි කුටියට ආපසු පැමිණි විට හදවත ප්‍රීතියෙන් ඉපිල ගියහ. තවමත් ආහාර නොගත් නමුත් කුස ගින්නක් නැත. හිතට වත් ගතටවත් කිසිම ක්ලාන්ත බවක් නැත. එහෙත් ආයාසයෙන් ආහාර වැළඳූහ. ආහාරවල කිසිම රසයක් නොදැනේ. ධර්ම රසය පමණක් මුළු සර්වාංගයේ විහිදී ඇත. මෙය නම් ''සබ්බ රසං ධම්ම රසං ජිනාති'' නොවේද?

පසුදින රාත්‍රී නැවතත් දේව සමූහයා ධර්ම ශ්‍රවනය පිණිස වැඩියහ. අහසේ හැම දිශාවෙන්ම ආකසට්ඨ, භූමට්ඨ දෙවිවරු කණ්ඩායම් වශයෙන් පැමිණෙති. හැම දෙනාම ඊයේ රාත්‍රී සිදු වූ ධර්ම ශක්තිය ගැන ප්‍රශංසා කළහ. එයින් විශ්වය ඒකාලෝක වූ බව පැවසූහ. එම කම්පනය මුළු විශ්වය තුළ දෙදරා ගිය බව සැලකළහ. ඒ සමඟ ආලෝකය ඇතිවය. ඔව්හු මෙසේ පැවසූහ.

''ඔබ වහන්සේගේ සිතින් ධර්මය ගලා යන ආශ්චර්ය අපි දුටුවෙමු. අප දිවැස් තුළින් එහි ආලෝකය විහිදී යන සැටිත් විස්මිතය. ඉරු සියයක් හෝ දහ-සක් වුවද එවැනි ආලෝකයක් විහිදීමට සමත් නැත. මෙවැනි මහා ආශ්චර්යයක් දැක ගැනීමට නොහැකි අය ඇද්දැයි අපට සිතාගත නොහැකිය. සතුන් සහ මිනිසුන් මෙතරම් අන්ධ බාල අය බව විශ්වාස කිරීමට නොහැකිය. ඊයේ රාත්‍රියේ සිදු වූ මේ බලවත් සිද්ධිය නිසා දෙවිවරු පුදුමයෙන් පුදුමයට පත් විය. ඒ මනහර දර්ශනය දැක සිත් වික්ෂිප්ත විය. ඒ දෙවිවරු මහා ශබ්දයෙන් සාධුකාර පැවැත් වූහ. එය එතරම් පුදුමාකාරය. දේව ලෝක කම්පනය විය.

ඔබ වහන්සේ මහා බල ඇති කෙනෙකි. මහා පුරුෂයෙකි. උත්තම පුරුෂ-යෙකි. තේජාන්විත ශක්තියකි. නොයෙක් ලෝක වල සිටින සත්ත්වයින්ට සරණකි. ඔබ වහන්සේගේ සෙවනැල්ලේ පසුපස ගමන් කර බොහෝ අය ආශිර්වාද ලබති. මිනිසුන්ට දෙවියන්ට, බ්‍රහ්මයින්ට අහසේ, පොළොවේ ජලයේ වාසය කරන සියලු සතුන්ට ආශිර්වාදයකි. විශේෂයෙන්ම අප වැනි දෙවිවරුන්ට මහත් ලාභයකි. අපට ඔබ වහන්සේ දැකීම මහත් භාග්‍යයකි. ඔබ වහන්සේගේ ධර්මය ඇසීම විශාල පුණ්‍ය මහිමයකි. අපි ඉතාමත් කෘතඥ වෙමු. අපට ධර්මය තේරුම් කර දී දහම් මාර්ගයේ පිහිටුවීම නිසා අපි ක්‍රමයෙන් අපගේ ජීවිත අලෝකමත් කර ගනිමු.''

මෙවැනි අනේකවිධ ප්‍රශංසා කර දෙවිවරු අතුරුදහන් වූහ. එවිට උන්වහන්සේ බොහෝ වේලා තමන් වහන්සේ නොයෙක් ආකාරයෙන් විඳි දුක් මෙනෙහි කළහ. ධර්මය අවබෝධ කර ගැනීමට ගත් වීර්‍යය, අසීමිතය. උන්වහන්සේ කෙතරම් ජීවිතය පරදුවට තබා වීර්‍යය වැඩූ වාද යනු ''ධර්මය මරණාසන්න ප්‍රයත්නයක්'' බව ප්‍රත්‍යක්ෂ කළහ. එවැනි මරණයට මුහුණ දීමට

වුවද අපොහොසත් නම් මේ ධර්මය අවබෝධ නොවන්නේය. දුක් නැති කිරීමට එතරම් දුක් වින්ද යුතුවේ. එසේ නැතිව මේ අති උත්තම විමුක්තිය නොලැබේ.

## ආධ්‍යාත්මික සහකාරිය

තමන් වහන්සේගේ අවබෝධයට පසු සමාධි සුවයෙන් ගත කරන විට අතීතයේ සැඟවී තිබූ පෙර භවයක සහකාරිය මතකට පැමිණියේය. මෙතෙක් කල් මෙම සිද්ධිය අමතක වී තිබුණි. ආචාර්ය මන්ගේ මෙම කථාව රසවත් බැවින් ද අපි සැමදෙනාටම මෙවැනි අවස්ථා ඇති බව අවබෝධ කිරීමටද මෙවැනි භව පුරුදු අපි පසු පස සෙවනැල්ලක් මෙන් ගමන් කරන බව විදහා දැක්වීමටද මෙම කථ ාව පුස්තකයට අඩංගු කරමි. මෙම පුවත යම් විධියකින් නොමනා හෙළි දරව්වක් නම් ඊට මම සමාව අයදිමි. ඔබට දැනටත් තේරුම් යනවා ඇති මෙම පුවත ආචාර්ය මන්ගේ ඉතාමත් විශ්වාසනීය ශිෂ්‍යයින්ට පමණක් හෙළිකළ පුද්ගලික කරුණක් බව. මම ලිවීමට බොහෝ මැලි වුනෙමි. එහෙත් නැවත නැවතත් එය ලිවීමට ඇති අවශ්‍යතාවය ඉදිරිපත් වී මා මැඩ ගති. එබැවින් අන්තිමේදී මෙය ලිවීමට තීරණය ගතිමි. මම වරදක් කළ බව පිළිගනිමි. එහෙත් පාඨක ඔබ මට සමාවුව මැනවි. සංසාර බන්ධනයට හසු වී සිටින අපට උප්පත්ති මරණ අතරෙහි රැඳී සිටීමට ඇති හේතු මේ පුවත තුළින් දැක ගත හැකිවේ.

මෙම පුවත අතීත භවයකදී තම සහකාරිය සමඟ ඇති කර ගත් සුහද ප්‍රතිඥාවකි. දෙදෙනාගේ සහය ඇතිව බුදුබව ලබා ගැනීමට තමන් කළ අධිෂ්ඨ-ානයකි. මේ ආත්මයේදී ද කීප විටක් තමන් වහන්සේ සමාධි සුවයෙන් සිටින විට වෙනත් ආත්ම භවයක සිටින ඈ එතුමා ඉදිරියේ පෙනී සිටියහ. එවිට උන්වහන්-සේ විසින් කෙටියෙන් ධර්මය දේශනා කර ඈ යවන ලදී. ඇගේ ආත්මය විකෘති තත්ත්වයකි. සිත පමණක් ඇත. කය දැක්ක නොහැකිය. කයක් නොලබන්නේ මක්නිසාදැයි උන්වහන්සේ ප්‍රශ්න කළවිට එතුමිය මහත් සේ කණස්සල්ලෙන් පසුවන බවත් උන්වහන්සේ ලැබීමට ප්‍රාර්ථනා කරන බැවින් ශරීරයක් ඇති ආත්මයක් නොලබන බවත් දැන්වූවාය. උන්වහන්සේ එතුමියට දුන් ප්‍රතිඥාව අමතක කරද්දැයි දුකින් පසුවෙති. එනම් දෙදෙනා බුදු බව ලබා ගැනීමට ගත් තීරණය පිළිබඳවය. ආචාර්ය මන් එවිට තමා ගත් එම තීරණය අත්හළ බව ප්‍රකාශ කළහ. උන්වහන්සේ මේ ආත්ම භවයේදීම නිවන් අවබෝධ කරන බවත් නැවත නූපදින බවත් ප්‍රකාශ කළහ. ඈ මෙම තීරණය ගැන මහත්සේ දුකට පත්විය. උන්වහන්සේ පිළිබඳ බලවත් ආශාවක් ඇත. එබැවින් උන්වහන්සේ දැකීමට පැමිණෙති. එහෙත් මේ මොහොතේදී ඈ පිළිබඳ මතක් කලේ උන්වහන්සේය. ඈ ගැන අනුකම්පාවක් ඇත. තමන් වහන්සේ ආත්ම ගණනාවක් ඈ සමඟ

බොහෝ දුක් විඳිමින් මෙම අධිෂ්ඨානයේ රැඳී සිටියහ. දැන් එය අහෝසි වී ඇත. ඒ පිළිබඳ වටහා දීමට ඈ හමුවිය යුතුය. මෙසේ සිතමින් ටික වේලාවක් ගත වූ විට ඈ උන්වහන්සේ ඉදිරිපිට සිටියාය. එහෙත් අසරීරය.

ආචාර්ය මන් එතුමිය ගත කරන මෙම ආත්ම භාවය ගැන ප්‍රශ්න කළහ. එතුමියට අන් භවයන්හි සත්ත්වයන් මෙන් ශරීරයක් නැත්තේ ඇයි ? තමා ජීවත් වන්නේ එක්තරා සියුම් දේව ලෝකයකය. උන්වහන්සේට ඇති ආශාව නිසා ඉන් මිදීමට නොකැමැති වෙති. තමා මුණ ගැසීමට උන්වහන්සේ කැමති බව දැන එහි ආවාය.

සාමාන්‍යයෙන් ඈ උන්වහන්සේ දැකීමට එන්නේ කලාතුරකිනි. ඉතා බලවත් කැමැත්තක් ඇති වුවද උන්වහන්සේ දැකීමට ඒමට බිය සැක ඇත. ඇත්තෙන්ම එසේ බිය සැක ඉපදීමට කරුණක් නැත. එසේ පැමිණීම නිසා ඇති හානියක් නැති බැවිනි. එහෙත් ඇගේ සිතේ ඇති ආශාව නිසා ඈ දුර්වලය. ආචාර්ය මන් විසින් නිතර ඒම පිළිබඳ අප්‍රසාදය පලකර ඇත. ඒ තම ධර්මය සෙවීමේ මග අවුරා සිටිය හැකි බැවිනි. හදවත ඉතා තීක්ෂණ සියුම් ඉන්ද්‍රියකි. බලවත් සංවේදනයක් ඇත. ඉතා සියුම් ආසාවන් වුවද සිතට බලපායි. එවිට භාවනා දියුණුව ඇන හිටී. මේ බව දත් ඈ නිතර පැමිණීමෙන් වැළකුණි.

උන්වහන්සේ නැවත නූපදින බවත් සංසාරික ඥාති මිත්‍ර සම්බන්ධතා කිසි-වක් නැති බවත් ඈ හොඳාකාර දැන සිටියාය. තමාගේ ආධ්‍යාත්මික සහකරුවා ඇයට අහිමි වී ඇත. ඒ නිවන පසක් කළ මොහොත මුළු විශ්වයම කම්පා වූ බව දෑ දනී. උන්වහන්සේගේ මේ අද්විතීය ජයග්‍රහණය පිළිබඳ සාමාන්‍යයෙන් සතුටු විය යුතු වුවද ඇයට ඇති වූයේ මදි කමකි. මෙපමණ කාලයක් සසර පුරා උන්වහන්සේගේ ජයග්‍රහණ පිළිබඳ මුදිතාව ඇතිවුවද මේ අවස්ථාව ඉසිලීමට නොහැකිවිය. එබැවින් අස්වාභාවික ප්‍රතික්‍රියාවක් ඇතිවිය. ''උන්වහනසේ වගකීම අත්හලන, තමා ගැන තැකීමක් නැත. අප්‍රමාණ කාලක් එකසේ දුක් සැප විඳිමින් සසර පැමිණ ඇත. අද ඈ තනිවිය. මහත් අභාග්‍යයකට පත්විය. දුක අත්හැර ගත නොහැක. උන්වහන්සේ දුක ඉක්මවා ගොස් ඇත. ඈ තනිව දුක් සාගරයේ ගිලී ඇත. මෙසේ සිතමින් තමා ප්‍රඥාව නැති මුලා වූ බවක් සිහිපත් විය. ඉර සඳ ස්පර්ෂ කිරීමට ඇති ආසාව වැනි මුලාවකි. මෙම සිතිවිලි නිසා ඈ පෘථිවියට පතිත විය.

ඈ විලාප කියමින් තම අසරණ භාවය කියා සිටියි. උදව් උපකාර ඉල්ලා සිටී. මට සතුටුවිය හැක්ක් කෙසේද ? ඉර හඳ ඉල්ලා හඬනවාක් මෙන් මහත් දුකකට පත්විය. ඔබ වහන්සේ ඉර සඳ මෙනි ! සතර දිග් භාගයේ ආලෝක පතුරුවමින් වැජඹේ. ඔබ වහන්සේගේ ජීවිතය ප්‍රීතිමත්ය. කිසි පැකිලීමක් නැත. ස්වාධීනය. නිදහස්ය. මගේ කිසියම් ගුණයක් ඇත්නම් මට මග පෙන්වා දෙන

සේක්වා. දීප්තිමත් ප්‍රඥාව පහළ කර ගන්නේ කෙසේද ? ඉක්මණින් භයානක සසරින් ගොඩ එන්නේ කෙසේද ? ඔබ වහන්සේ මෙම නිවන් පසක් කරන්නේ කෙසේද ? මගේ මේ අධිෂ්ඨාන ශක්තිමත් වේවා ! ඉක්මණින් නිවන් දකිත්වා.

ඈ ඉකිබිඳිමින් හඬයි. මේ අසරීර පුද්ගලයාගේ අදෝනාව ආචාර්ය මන්ට ඇසේ. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුනි.

''ඔබ හමුවීමට මා කැමති වූයේ අතීතය ගැන සිතා කනස්සලු වීමට නොවේ. අනුන්ට සැප ප්‍රාර්ථනා කරන අය ඔය ආකාරයෙන් නොසිතති. කෝ ඔබගේ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂාව !'' ''මම එසේ සිතමි. එහෙත් තමා බේරී අනිත් අය ගැන නොසිතන විට දුක හට ගැනීම ස්වාභාවිකයි. මගේ ශුභ සිද්ධිය ගැන නොතකා ඔබ වහන්සේ මා අත්හැරියා ! මේ දුකින් මිදීමට මගක් නොපෙනේ.'' ''තමන් තනිව හෝ අනුන් සමඟ හෝ පිළිපැදීම නිසා තමාගෙ ් දුක පහ විය යුතුයි. දුක වර්ධනය විය යුතු නැත. තමාගේ ප්‍රතිපත්තිය වැරදි නිසා ඔබ දුක් විඳියි.''

කෙළෙස් සහිත පුද්ගලයෝ දුකින් නිදහස් වන න්දම නොදනිති. තමා කරන දේ හරිද වැරදිදැයි නොදනිති. මේ කරන දේ නිසා සැප විපාක හෝ දුක් විපාක ලැබේදැයි නොදනිති. අප දන්නේ අපේ හද තුළ ඇති දුක පමණි. එබැවින් අප දුක් විඳීමට භාජනය කර අත්හැරීම සුදුසුද ?

මෙම අසරීර පුද්ගලයා උන්වහන්සේට චෝදනා කරමින් තමන් වහන්සේ පමණක් දුකින් නිදහස් විය යන මතය අත් නොහරියි. දුකින් එතෙර වීම පිණිස අප දෙදෙනා මහත් සේ දුක් වින්ද බව කියයි. දැන් තමන් මේ දුකින් මුදවා ගැනීමට කිසිම පිළිසරණක් නොකරති ආදී වශයෙනි.

උන්වහන්සේ ඈ අස් වැසීමට උත්සාහ ගත්හ. දෙදෙනෙක් එක මේසය මත ඇති ආහාර බුදින විට එක් කෙනෙක් කලින් ඉවර කරයි. දෙදෙනාටම එකම මොහොතකදී බඩ පුරවා ගත නොහැකිය. බුදුරජාණන් වහන්සේ සමඟ සසර සැරි සැරූ යසෝදරා ගැන සිතනු මැන. දෙදෙනා එකසේ බොහෝ සසර කුසල් කරමින් ආ නමුත් සිද්ධාර්ථ තවුසා පළමුව නිවන් දුටහ. බුදු බවට පත්විය. පසුව තම බිරිඳ නිවන් දුටහ. ඔබ ඒ ගැන සිතා ඒ පාඩම ඉගෙන ගන්න. ඔබට යම් විදියකින් උපකාර කිරීමට උත්සහා ගන්නා මට චෝදනා කරන්නේ ඇයි ? එසේ සිතීම වැරදි සහගත වේ. ඔබගේ ද මගේ ද අසතුට පිණිස පවතී. යසෝදරාගෙ ් ගුණ නුවණ ගැන සිතන්න. එය කාටත් කදිම ආදර්ශයකි.

ඔබව මම කැඳවූයේ ඔබට උපකාර කිරීමට. ඔබේ ධර්ම අභිවෘද්ධියට මා හැමදාම අනුග්‍රහය දක්වා ඇත. මා ඔබ හැරදා කිසිවක් නොකර සිටි යන්න

මුසාවකි. මා ඔබට අනුශාසනා කරන්නේ මෛත්‍රී, කරුණා පිරි හදවතකිනි. ඔබ මගේ උපදෙස් අනුව පිළිපැදීම නිසා මා සතුටට පත්වෙමි. ඔබට සාර්ථක ප්‍රතිඵල ලැබේ නම් මම උපේක්ෂාවෙන් ඉවසමි.

අපි බුද්ධත්වය ප්‍රාර්ථනා කළේ සංසාර චක්‍රයෙන් මිදීමටය. මම ශ්‍රාවක යානය තෝරා ගතතේ ද එම කාර්‍ය්‍යය ඉෂ්ට කර ගැනීමටය. කෙළෙස් ආසා වලින් තුරන් වීමටය. දුක් නිවාරණය කිරීමටය. උතුම් නිවන් සැප ලැබීමටය. මම නිවැරදි මාර්ගයක භික්ෂුවක් වශයෙන් ගමන් ගත්තෙමි. බොහෝ ආත්ම ගණන් මෙසේ පෙරුම් පෙරුවෙමි. එහෙත් ඔබ සමඟ සම්බන්ධ වීමට උත්සාහ දැරුවෙමි. මම ඔබට ඉමහත් කරුණාවෙන් ධර්මය උගන්වමි. ඔබ අත්හැර දමා මගේ විමුක්තිය ලබනවා යැයි කිසිවිටක මට සිතුණේ නැත. කවදාත් ඔබ වෙත දයාව අනුකම්පාව පහළ කරමි. ඔබව සසර දුකින් මුදවා ගැනීමට, නිවන් අවබෝධ කිරීමට නිතර වෙහෙස දැරුවෙමි.

ඔබේ විකෘති මනස එසේ මට චෝදනා කරයි. ඔබ අත්හැර දමා මම පමණක් නිවන් දකිමි. යන අදහස ඔබට සහ මට විනාශකාරී වේ. අද පටන් ඔවැනි අදහස් බැහැර කරන්න ඔබේ හදවත වේදනා කරන මෙවැනි වැරදි හැඟීම් වලින් වෙන් වෙන්න. එම වැරදි සිතිවිලි හා මගේ අරමුණ හාත්පසින් විරුද්ධ වේ. මම උපකාර කිරීමට කැමති වෙමි.

ඔබ අතර මං කර මා බේරුනා ? මා කොතැනට ද ගියේ ? කා ගැනද මා නොසැළකිලිමත් වුණේ ? මේ මොහොතේදී පවා මම ඔබට කරුණාවෙන් කථා කරමි. මා ඔබට ඉගැන්වූයේ කවදත් මෙවැනි කරුණාවකිනි. ඔබට නිරන්තරයෙන් දිරි ගන්වන්නේ මහා සාගරය වැනි කරුණා බර හදවතකිනි. එම කරුණාව නොනවත්වාම ගලා යයි. එබැවින් මා දේශනා කරන ධර්මය අනුගමනය කරන්න. ඔබ මාව විශ්වාස කර මේ ධර්මය පිළිගත්තොත් ඔබට මට මෙන්ම අධ්‍යාත්මික සැනසීම ළඟා වනු ඇත.

මම භික්ෂුවක් ලෙස මහණ වූ දිනය පටන් මුළු හදවතින්ම ධර්මය පිළිපැද්දෙමි. කිසිවෙක් ගැන දොස් මම නොදකිමි. මම ඔබව හමුවීමට උත්සාහ ගන්නේ ඔබ රැවටීමට හෝ ඔබට දුකක් දීමට නොවේ. මට හැකි තරම් මුළු හදවතින්ම උපකාර කිරීමටය. ඔබ මාව අවිශ්වාස කළොත් මා හා සමාන තව කෙනෙක් සොයා ගැනීම උගහටය. එදින මුළු විශ්වයම කම්පා වූ හැටි ඔබ දන්නා බව ඔබ කීවේය. ඒ කම්පා වීම ධර්මයේ රැවටිල්ලක්ද ? එසේ සිතා ඔබ මා අවිශ්වාස කරන්නෙහිද ? ධර්මය යනු සම්පූර්ණ සත්‍ය බව ඔබට වැටහේ නම් එදින වූ කම්පාව ඔබගේ ශ්‍රද්ධාව නිසා දුටු දෙයකි. එබැවින් ඔබට මහත් වූ පුණ්‍ය ස්කන්ධයක් ඇති බව වටහා ගන්න. ඔබට අවශ්‍ය වූ ධර්ම කොටස් අසා

ගැනීමට පිං ඇත. අසරීර ඔබගේ ජීවිතය පිං මඳ වුවද පෙර පිං ඇත. මගේ වාසනාවකට ඔබට ධර්මය දේශනා කිරීමට අවස්ථාව ලැබී ඇත. ඔබට සහය වී දැන් තිබෙන දුකින් මුදවා ගැනීමට කෙනෙක් ඇති බව සළකා සතුටු වන්න. මේ ආකාරයෙන් සත්‍යය දකින්නට හැකි නම් මම සතුටුවෙමි. එවිට ඔබගේ දුක් නැති වී යයි. ධර්මය යනු ලෞකික දෙයක් නොවේ. කරුණාව යනු අන්‍යයන් කෙරෙහි ක්‍රෝධ උපදන්නක් නොවේ.''

මේ ආදී වශයෙන් ආචාර්ය මන් ඇගේ වැරදි දෘෂ්ටිය අත්හරින ලෙස ආයාචනා කළහ. එම අදහස් වල ඇති සත්‍යතාවය එම කාරුණික භාවය ඈ මත පතිත වූයේ දිව්‍යමය අමෘත වැස්සක් මෙනි. ටිකින් ටික ඈ ප්‍රකෘති විය. එම ධර්මය සිත තුළට කා වැදී ඇගේ සිත සමාධි ගත විය. ඈ ගෞරවාන්විත විය.

අවසානයේදී තමාගෙ වරද පිළිගත්තාය. ''මගේ ආදරය, ඉවසන්නට බැරි ආසාව නිසා මෙවැනි භයානක තත්ත්වයක් උදා වී ඇත. මම සිතුවේ ඔබ මා අත්හැරියා කියා, මා ගැන නොතකා තනිව ඔබ යන්ට ගියා කියා මගේ තනිකම මිස වෙන දෙයක් මට නොසිතුණි. මට කාත් කවුරුත් නැති අසරණ භාවයක් දැනුණි. දැන් මට ධර්මයේ ආලෝකය ලැබී මගේ හදවත සිසිල් වී ඇත. සතුටු වී ඇත. දැන් මට ඒ දුක් ගොඩ බිම හෙළන්නට හැකිය. ඔබ දෙසූ කාරුණික වදන් මගේ කෙළෙස් ගිනි සෝදා ගියේය. මගේ මෝහය නිසා කළ වැරදි වලට සමා වුව මැනවි. අනාගතයේදී මම සිහි බුද්ධියෙන් වාසය කරමි. මෙවැනි වැරදි නැවත නොකරමි.'' ඇගේ කථාව අසා සිටි ආචාර්ය මන් ඈට වෙනත් ආත්ම භාවයක් ලබා ගැනීමට උපදෙස් දුණි. අතීතය අමතක කළ යුතුය. ඈ ඉතා ගෞරවයෙන් එය පිළිගත්තාය. ''මගේ අන්තිම ආයාචනය මෙයයි. මා වෙන සුදුසු ආත්ම භාවයක් ලැබූ විට ඔබ වහන්සේ සමීපයට අවුත් මෙවැනි ධර්මය ශ්‍රවනය කිරීමට හැකිද? කරුණාකර මට ඒ වරය දෙන්න. ආචාර්‍ය්‍යය මන් එම වරය දුනි. ඒ සමඟම ඈ අතුරුදහන් විය.

අසරීර පුද්ගලයා නික්මීමත් සමඟ ආචාර්ය මන් සමාධියෙන් නැඟී සිටියහ. පාන්දර පහ පමණ විය. එළිවෙන්ට කිට්ටුය. මුළු රාත්‍රියම නොනිදා සිටියහ. අසරීර පුද්ගලයා සමඟ පැය ගණනක් කථා කළ බව දැනුණි.

වැඩි කලක් යන්ට ප්‍රථම මෙම අසරීර පුද්ගලයා නැවත පෙනී සිටියාය. දැන් ඈට ශරීරයක් ඇත. ඈ ඉතාමත් ලක්ෂණ දෙවඟනකි. එහෙත් ආචාර්ය මන් කෙරෙහි ඇති ගෞරවය නිසා අන් දෙවඟනන් මෙන් ස්වර්ණාභරණයෙන් සැරසී නැත.

''ඔබ වහන්සේගේ ධම්මානුසාසනාව අසා සිටි මගේ සිතේ පැවති දුක, බිය, සැක පහ වී ගියේය. මගේ සිත සන්සුන් විය. මම එම ආත්මයෙන් චුත වී

තාවතිංශ දෙව්ලොව ඉපදුනෙමි. මෙම දේව ලෝකය සිත කය පිනා යන ඉතාමත් සුන්දර තැනකි. ඒ සියලු සැප මම විඳිමි. මේ සැප ලැබුණේ ඔබ වහන්සේ සමඟ මනුෂ්‍යයන් වශයෙන් සසර කළ අනන්ත පිං බෙලෙනි. මේ සැප විඳින නමුත් ඒ සියල්ල ලැබුණේ ඔබ වහන්සේ මා මනුෂ්‍ය ආත්මයේදී පිං කිරීමට උනන්දු කළ බැවිනි. මා හුදකලාව සිටියේ නම් මේ වැනි ආශ්චර්‍යයමත් පිං කිරීමට නොදනිමි.

මේ පිං ඵල විපාක වශයෙන් බොහෝ සැප ඇති දෙව් ලොව උපත ලදිමි. මගේ සිත සතුටට පත් වී ඇත. පෙර තිබූ වෛර ක්‍රෝධ කිසිවක් නැත. මට තේරුම් ගියේ අප සංසාරික ජීවිතය ගත කරණ විට තමාගේ කිට්ටු ඤාතීන්, තමන්ගෙ ” රැකියා, තමන්ගේ ආහාරාදිය පවා කෙතරම් සුපරික්ෂාකාරීව පරිහරණය කළ යුතු බවය. ස්ත්‍රී, පුරුෂයන් තම ජීවිතය කෙතරම් සුහදව කුසලතාවයෙන් ගත කළ යුතුද විශේෂයෙන්ම ස්වාමි, භාර්‍යයා සම්බන්ධය ඉතාම සුහද නොවුවොත් මහත් දුකකට පැමිණෙයි. මක්නිසාද තම සැප දුක් නිරන්තරයෙන්ම බෙදා හදා ගෙන ජීවත් විය යුතුය. තම හුස්ම වුවද මිශ්‍ර වේ.

යමෙකුට හොඳ බිරිඳක් හෝ සැමියෙක් ලැබුණොත් තම ජීවිත ප්‍රශ්න හොඳාකාර විසඳාගත හැකිවේ. පවුල් ජීවිතය පමණක් නොව ආධ්‍යාත්මික ගුණ වගාව ද දියුණු කළ හැකිය. එවිට ජීවිතය අන්ධකාර නොවේ. උගත්කම්, හැසිරීම්, මිල මුදල් ආදියට වඩා ගුණවත්කම, සිල්වත්කම, ඉතාම වටනේය. එකිනෙකාගේ ගුණවත්කම නිසා මිනිස් ලෝකය දේව ලෝකයක් මෙන් සතුට ගෙන දේ. සෑම දෙනාම සතුටින් සන්තෝෂයෙන් එකිනෙකා සමඟ සහයෝගයෙන් ජීවිත ගත කරති. සිතේ ඇති ප්‍රබෝධය නිසා බාහිර කරදර බලපාන්නේ නැත. පවුලේ සෑම සාමාජිකයෙක්ම එම ආදර්ශය මත පවතී. තමාට කැමති විදියේ අත්තනෝමතික ආත්මාර්ථකාමී ජීවිත ගත නොකරති. සමගි සම්පන්නව සියළු ගැටළුවලට විසඳුම් සොයති. එකම විධියේ කර්ම කරති. සාමයෙන් ලද දෙයින් සතුටට පත්වෙති. යහලු මිත්‍රයින් මෙන් වෙසෙති. එබැවින් යමෙකුගේ බිරිඳ හෝ පුරුෂයා නිසා තමා දේව ලෝකයක් හෝ අපායක් මවති. මේ ඥාතීත්වය ජීවිත කාලයක් පවතින බැවින් ඉතාම වැදගත් වේ.

ජීවිත ගණනාවක් ඔබ සමඟ සංසාරයේ සැරි සැරීම හේතුවෙන් ඔබ වහන්සේගේ මඟ පෙන්වීම ලබා මා ගුණවත් වීමි. ඔබ නිතරම මාව හරි පාරට යොමු කළේය. මා සතර අපායෙන් මුදවා ගත්තේ ඔබ වහන්සේය. වැරදි දේ නොකළෙමි. නින්දා, අප්‍රසංසාවට නොපැමුණෙමි. ඔබ වහන්සේගේ ගුණ මහිමය මෙතෙකැයි ප්‍රකාශ කළ නොහැකිය. මේ අවස්ථාවේදී සිදු වූ වරදට සමා වුව මැනවි. අප දෙදෙනා අතර තවමත් එම සුහදතාවය ඇත.

ආචාර්ය මන් මෙම දේවතාවියන්ගේ ආයාචනය පිළිගෙන සමාව දුනි. ඉන්පසු ධර්ම කථාවක් කරමින් තම ජීවිතය සාර්ථක කරගෙන අධ්‍යාත්මික වර්ධනය සිදු කිරීම පිණිස උපදෙස් දුනි. අවසානයේදී මේ දෙවි දුව උන්වහන්සේට නමස්කාර කර තම ගෞරව භක්තිය පුදකර ටික දුරක් පසු පස ගමන් කර අහසේ පා වී ගොස් අතුරුදහන් වූවාය. ඈ අසරීරව සිටිමින් කළ චෝදනා පුදුම සහගතය. ඒවා මෙහි ඇතුළත් නොකළෙමි. එම සාකච්ඡාවේ අඩංගු සියලු කරුණු ඒ ආකාරයෙන් මෙහි සඳහන් කිරීමට නොහැකි වීම ගැන කණගාටුවෙමි. සමාව අයදිමි. මේ විස්තර ගැන මම සෑහීමකට පත් නොවෙමි. එහෙත් මෙම චමත්කාර සිද්ධිය ඔබගේ තියුණු අවධානයට යොමු කිරිමට ඇතුළත් කළෙමි.

## අගය කළ නොහැකි උතුම් සැළකීමක්

ආචාර්ය මන් විමුක්තිය ලබා ටික දිනකට පසු ඉතාමත් විස්මිත දේ සිදුවිය. රාත්‍රී කාලයේ සමාධි සුවයෙන් ගත කරන විට සම්මා සම්බුදුවරු තම ශ්‍රාවක වරු තම ශ්‍රාවක සංඝයා සමඟ වැඩියහ. තමන් වහන්සේ විමුක්ති ඥාන දර්ශනය ලබා නිවන් පසක් කිරීම ගැන සුභාසිංසනය පැවැත් වූ සේක. එක් රැයක් එක් බුදුවරයන් වහන්සේ නමක් දස දහසක් රහත් ශ්‍රාවක පිරිස සමඟ පෙනේ. ඊළඟ රාත්‍රිය වෙනත් බුදුවරයෙකි. සියක් දහසක් ශ්‍රාවක සංඝයා පිරිවරා සිටිති. සෑම රාත්‍රියකම වෙනත් බුදුවරු පැමිණියහ. විශාල ශ්‍රාවක සංඝයා සමඟ හැම විටම මේ බුදුන් වහන්සේලා ආචාර්ය මන්ට ප්‍රසාදය පළ කළහ. සැළකිලි දැක්වූහ. ශ්‍රාවක පිරිස ඒ ඒ බුදුවරුන්ගේ පාරමිතා අනුව අඩු වැඩි විය. ඒ සියලුම ශ්‍රාවක පිරිස නොවෙති. සාමාන්‍ය සංඛ්‍යාවක් පමණි. සමහර ශ්‍රාවකයින් ඉතා ලාබාල සාමණේරයන් වෙති. ආචාර්ය මන් මේ පිළිබඳ විමසුම් කළහ. ඒ සැවොම රහතුන් වහන්සේලා වෙති. එබැවින් ගුණ නුවණින් සමාන වෙති.

මේ බුදුරජාණන් වහන්සේලා ආචාර්ය මන්ට මෙසේ වදාළහ. ''මම තථාගතයන් වෙමි. ඔබ සසරින් මිදුන බව මම දනිමි. සංසාරය නමැති භයානක බන්ධනාගාරයෙන් මිදුනෙහි. මම මෙහි පැමිණියේ මගේ ප්‍රසාදය පළ කිරීමටය. මේ බන්ධනාගාරය අති විශාලය. කිසි ප්‍රහාරයකින් කඩා දැමීමට නොහැකි බලකොටුවකි. එහි තුළ තමා වසඟයට පත් කරවන ආශා ඇති කරවන පෙළඹවීම් වලින් ගහණය. එහි සිර වූ අය එහිම දාසකම් කරති. ඉන් මිදීමක් නැත. අනන්ත සත්ව ප්‍රජාව ඉන් ගැලවීමට සිතෙන්නේවත් නැත. තම හිතට කයට ඇති අප්‍රමාණ දුකට පිළියම් සොයති. එහෙත් ගැලවීමක් නොසොයති. බෙහෙත් ඖෂධ නොගන්නා රෝගීන් මෙනි. කෙතරම් බෙහෙත් ඖෂධ ඇතත් එය නොගන්නේ නම් රෝගය සුව නොවේ.

බුදු දහම බෙහෙත් ඖෂධ මෙනි. සසර වසන සත්ත්වයා කෙළෙස් නමැති භයානක, දුක්ඛිත, පිඩා සහිත රෝගයකින් නිතර පෙළේ. මෙම රෝග සුව කළ

හැක්කේ ධර්මය නැමැති ඖෂධයෙන් පමණි. මේ රෝගය සුව නොවුවහොත් අනන්ත සසර මැරි මැරී උපදිමින් අනන්ත දුක් පීඩා විඳිති. ධර්මය නැමති ඖෂධ හැම තැනම මුළු විශ්වයේ පැතිරී ඇත. එහෙත් එය නිසි ආකාර පානය කර රෝගය සුව කිරීමට හැකි බව නොදත් අය සුවය නොලබති.

ධර්මය ස්වභාවයෙන්ම පවතී. සසර සත්ත්වයෝ එහි කරකැවෙති. රෝදය කරකැවෙන්නාක් මෙන් උප්පත්ති, මරණ දුක් විඳිති. මෙම අනන්ත සසරින් ගොඩ වීමක් නැත. උදව් උපකාර කිරීමට නොහැකිය. ඒ තමන්ම එය කළ යුතු බැවිනි. ධර්මයේ ස්ථිරව එල්බගෙන මහත් ආයාසයෙන් ඒ අනුව පිළිපැදිය යුතුය. කෙතරම් බුදුවරු ලොව පහළ වුවත් කෙතරම් ධර්මය ලොව පහළ වුවත්, ඒ නියම කළ ඖෂධය පානය කරන්නේ නම් පමණක් රෝගය සංසිඳේ.

සියලුම බුදුවරු දේශනා කරන්නේ මේ එකම ධර්මයයි. සියලු පව් දුරු කිරීමත් කුසල් රැස් කිරීමත්ය. මීට වඩා වැඩිපුර ධර්මයක් නැත. තම සිතේ ඇති ඉතා දරුණු කෙළෙස් වුවත් මේ ධර්මයේ බලයෙන් දුරු කෙරේ. බුදු දහමේ දුරු කළ නොහැකි කෙළෙස් නැත. එහෙත් ධර්මය පිළිපැදීම නිසි ආකාර නොවේ නම් කෙළෙස් වලින් පරාජය වේ. එවිට ධර්මයේ බලයක් නැතැයි සිතති. ධර්මයේ බලයක් ඇත්තේ නිසි ආකාර පිළිපැදීමෙහිය.

ධර්මයේ ශක්තිය යටපත් කර කෙළෙස් සාමාන්‍යයෙන් පැන නගී. කෙළෙස් බහුල පුද්ගලයන් තුළ එබැවින් ධර්මයක් නැත. ධර්මය පිළිපැදීමට එවැනි අය මැලිවෙති. එය ඉතා දුෂ්කර යැයි සිතති. කාලය නාස්ති කිරීමක් යැයි සිතති. ඒ කාලය තුළ පස්කම් සුව විඳීමට කැමති වෙති. ඉන් තමා කෙතරම් වෙහෙසට පත් වුවත් කම් නැත. නුවණ ඇති මිනිසා එසේ කෙළෙස් වලට වසඟ විය යුතු නැත. එය ඉබ්බා අතපය හකුලා කටුව තුළ සැඟ වී වතුර රත්වනතුරු සිටින්නාක් මෙනි. කටුව තුළ සිට ඒකාන්තයෙන්ම මරණයට පත්වේ. ලෝකය යනු උතුරා පැසෙන කෙළෙස් පිරි කල්දේරමකි. කෙළෙස් ගින්නෙන් රත් වී පවතී. සියලු සත්ත්වයෝ හැම තැනම හැමදාම නිමක් නැති දුක් පීඩා වලින් දුක් විඳිති. සැඟවී සිටීමට ආරක්ෂිත තැනක් නැත. තම සන්තානයේ දැවෙන කෙළෙස් ගින්න තමාම දුකට පත් කරයි.

ඔබ සත්‍යයෙන්ම තථාගතයන් වහන්සේ දුටුවේය. සත්‍ය තථාගතයන් වහන්සේ යනු කවරෙක්ද ? සත්‍ය තථාගතයන් වහන්සේ යනු ඔබ අවබෝධ කරගත් චිත්ත පාරිශුද්ධියයි. ශරීරයක් මවා දන් පෙනී යන්නේ සම්මුති සත්‍යයකි. සාපේක්ෂ සත්‍යයකි. මෙය සත්‍ය තථාගතයන් නොවි. සත්‍ය රහතන් වහන්සේ නොවේ. එය අපගේ සම්මුති දර්ශනයකි.

''මට සත්‍ය බුදුරජාණන් වහන්සේ ගැන කිසිම සැකයක් නැත. මට

නොතෙරෙන්නේ අනුපාධිශේෂ පිරිනිවීමෙන් කිසිම ශේෂයක් නැතිව නිවනට පැමිණි බුදුරජාණන් වහන්සේලා මෙසේ සම්මුති වශයෙන් පෙනී සිටින්නේ කෙසේද යන්න පිළිබඳවයි.'' බුදුරජාණන් වහන්සේ මේ සිදුවීම පැහැදිලි කර දුන් සේක.

''යම් බුදුන් වහන්සේ කෙනෙක් හෝ රහතුන් වහන්සේ කෙනෙක් අනුපාදිශේෂ පරිනිර්වාණයෙන් නිවන් දුටු විට එම රහතුන්වහන්සේට සම්මුති පුද්ගලයෙක් හමුවීමට අවශ්‍ය වූ විට සම්මුති ශරීරයක් නිර්මාණය කර පෙනී සිටිති. එහෙත් අනුපාදිශේෂයෙන් පිරිනිවන් පෑ සියලු ආර්‍යයන් වහන්සේලාට එවැනි ශරීරයක් නොමැතිව සම්බන්ධතා පැවැත්විය හැකිය. උන්වහන්සේලාට සම්මුති ශරීරයක් අවශ්‍ය නැත. සම්මුති රූපය අවශ්‍ය වන්නේ සම්මුති සත්‍යයෙන් සිටීමට අවශ්‍ය වූ විටය.

සියලු බුදුවරු අතීත, අනාගත සිද්ධීන් දකින්නේ ''නිමිති'' තුළිනි. මේ නිමිති යම් සිද්ධියක් නිරාවරණය කරයි. උදා: යම් බුදු කෙනෙකුට තමන් වහන්සේට ප්‍රථම විසූ බුදුවරයින් පිළිබඳ දැන ගැනිමට එම බුදුන් වහන්සේගේ නිමිත්ත ආවර්ජනය කරති. එවිට ඒ බුදුරජාණන් වහන්සේ පිළිබඳ පුවත් ජීවත් වූ අවධිය, ආදී විස්තර දකී. තමන් වහන්සේට අවශ්‍ය මේ සම්මුති නොවන ලෝකෝත්තර තත්ත්වයක් දැකිමට නම් නිමිත්ත අවශ්‍ය නොවේ. විමුක්තිය හෙවත් නිවන ඉබේ අරමුණු වේ. මේ නිසා අතීත බුදුවරුන්ගේ සම්මුති සත්‍ය අනුව කරුණු දැන ගැනීමට සම්මුති කයක් නිර්මාණය කළ යුතුයි. මා සහ සියලු රහතුන් වහන්සේලා තම සම්මුති කයින් පැමිණ දර්ශනය වීමට අවශ්‍ය වන්නේ ඔබ වහන්සේ වැනි අයට බුද්ධා දී උතුමන්ගේ ස්වරූපය කෙසේද යන්න දැන ගැනිමටයි. එසේ දැක නොසිටියොත් ඔබට එම සංඥාව ලබා ගත නොහැකිය.

පාරිශුද්ධ විමුක්තිය එනම් යම් විමුක්තිය ලත් සිත් දෙකක් සම්බන්ධ වන විට එහි ඇත්තේ ''දැනීම'' පමණි එය කිසි ආකාරයකින් විස්තර කළ නොහැකිය. එබැවින් විමුක්තියේ ස්වභාවය විස්තර කිරීමට යම් සම්මුති සත්‍යයක් ගෙන හැර පාන්නෙමු. ''විමුක්ති යනු කිසිම නිමිත්තක් නැති ආලෝකයකි. එය පරම සතුටකි'' නමුත් මේ ආකාර විස්තර බොහෝ සුලභය. ඒවා සම්මුති නිදර්ශන වේ. එහි සත්‍ය ස්වභාවය නිසි ආකාරයකින් වාචෝද් ගත කළ නොහැක. විමුක්තිය යනු සම්මුතියෙහි පිහිටා ගත හැකි සංඥාවක් නොවේ. එහෙත් රහතන් වහන්සේ විමුක්තිය සම්මුතියෙන් හා පරමාර්ථයෙන් දනී. විමුක්තිය අසංඛත ධර්මයක් හැටියත් විමුක්තිය සම්මුති උදාහරණයක් හැටියටත් පැහැදිලි වේ. ඔබ වහන්සේ මේ ප්‍රශ්නය ඇසුවේ ඔබේ සැක දුරු කිරීමටද නැතහොත් සාකච්ඡා කිරීමටද ?

''සම්මුති බුදුරජාණන් වහන්සේලා ගැන මට කිසිම සැකයක් නැත. අහේතු අප්‍රත්‍යක ද මට තේරේ. මට අවශ්‍ය වන්නේ සම්මුති වශයෙන් ගෞරව දැක්විය යුතු ආකාරයයි. ඔබ වහන්සේ සහ ශ්‍රාවක සංඝයා වහන්සේලා නොවැඩියත් සත්‍ය බුද්ධ, ධම්ම, සංඝ යන ලෝකෝත්තර සත්‍යය ගැන මට වැටහේ. යමෙක් ධර්මය දකීද හේ බුදුන් දකී. එහි අර්ථය නම් බුද්ධ, ධම්ම, සංඝ යනු අතිපාරිශුද්ධ පරමාර්ථ ධර්මයකි. එය සම්මුති සත්‍යයක් නොවේ. මේ රතනත්‍රයයි. ''තථාගත වූ මම ඔබගෙන් මේ ප්‍රකාශනය ඇසුවේ ඔබ තුළ සැක ඇති නිසා නොව, ඔබ සමඟ සතුටු සාමීචි කථාවටය.

බුදුරජාණන් වහන්සේ සමඟ ශ්‍රාවක සංඝයා පෙනී සිටි අවස්ථාවල කථා කළේ බුදුපියාණන් වහන්සේ පමණී ශ්‍රාවක සංඝයා කිසිවක් කථා නොකළහ. ඉතාමත් සන්සුන්ව හිඳිමින් මහත් ගෞරවාන්විතව සියල්ල අසා සිටියහ. ඉතා කුඩා සාමණේරවරුන්ට පවා එම ප්‍රබුද්ධ ගති පැවතුම් ඇත. උන්වහන්සේලාට නමස්කාර කිරීමට වඩා ආදර භක්තිය පිදීමට සිතේ. උන්වහන්සේලා ඉතා ලා බාල වියේ සිටියහ. සමහරවිට අවුරුදු 10-12 අතර වෙති. එම ලක්ෂණ ස්වරූපය මනස්කාන්තය.

සාමාන්‍ය කෙනෙක් දුටහොත් ඉතාමත් ලක්ෂණ සියුමැලි කාන්තිමත් ඇස් ඇති දරුවන් සේ පෙනේ. උන්වහන්සේලා රහතන් වහන්සේලා බව නොදැන සෙල්ලම් කිරීමට පෙළඹෙති. එහි ඇති නොහික්මුන භාවය නොතේරේ. ආචාර්ය මන් මේ විස්තරය කරණ විට මට සිතුණේ ඇත්තෙන්ම ඒ පොඩි සාමණේර-වරයන් වහන්සේ සමඟ සෙල්ලම් කිරීමටය. එහි ඇති භයානක ප්‍රතිඵල ගැන නොසිතුවෙමි. එහෙත් පසුව සමාව අයදිමි යැයි සිතුවෙමි.

උන්වහන්සේලා ඉතා බාලවියේ සිටි සාමණේරවරු වුවද, හැසිරීම ගරු ගාම්භීරය. හැට වයස් තෙරවරු මෙනි. ඉතා සන්සුන් ඉරියව් පවත්වන්නේ අභිකුත් මහ රහතන් වහන්සේලා මෙනි. කොටින් කියතොත් බුදුරජාණන් වහන්සේ සමඟ පැමිණ සියලුම ශ්‍රාවක පිරිස ඉරියව් පැවත් වූයේ අසීමිත ගෞරවාන්විත නමස-්කාර ලැබීමට සුදුසු ලෙසය. ඒ දර්ශනය ඇසට රසඳුනකි. ඉතාමත් ලක්ෂණට නමා පිළිවෙලට තැන්පත් කළ සිවුරු වැනිය.

බුද්ධ කාලයේදී සක්මන් භාවනාව සහ පර්‍යඞ්ක භාවනාව සිදුකළ අන්දම දැන ගැනීමට ආචාර්ය මන් තුළ කවදත් කුතුහලයක් විය. තවද මහතෙරවරු සහ නවකයන් ආචාර පැවැත් වූ ආකාරයද ගැටළුවකි. භාවනා කරන විට තම තුන් සිවුර දැරිය යුතුද ? මෙවැනි ප්‍රශ්න මතක් වූ විට ඒ මොහොතේදී බුදු කෙනෙක් හෝ රහත් ශ්‍රාවකයෙක් සමාධියේදී පෙනී සිටී. ඒ ඉරියව් පැවැත් වූ ආකාර අනුකරණය කරති. ධර්මයට නිසි ගෞරවයෙන් සක්මන් භාවනා කරන්නේ

කෙසේදැයි සිතුණි. එවිට බුදු කෙනෙක් හෝ ශ්‍රාවක රහතුන් වහන්සේ නමක් පෙනී සිට සක්මන් කරති. අත පය ඉතාමත් තැන්පත් ලෙස හසුරුවන අන්දම සියුම් ලෙස විස්තර කරති. සමහර විට උපදෙස් දෙති. සමහරවිට ආදර්ශය දෙයි. සමාධි භාවනාවට සුදුසු පර්‍ය්‍යංකය පෙන්නුම් කරති. ඉතාම හොඳ දිශාව බලා හිදීම සහ ඉරියව් පැවැත්වීම විස්තර කරති.

වැඩිමහල් භික්ෂූන් සහ නවක භික්ෂූන් එකිනෙකාට ආචාර කරන අන්දම ගැන තොරතුරු විස්මය ජනකය. බුද්ධ කාලීන භික්ෂූන් ආචාර පැවැත් වූ අන්දම කෙසේදැයි සිතූහ. ආචාර්ය මන් මෙසේ සිතූ සැනෙකින් බුදුරජාණන් වහන්සේ සහ ශ්‍රාවක භික්ෂු පිරිස පෙනුණි. සමහර භික්ෂූන් ඉතා ලාබාලය. සමහරු වයස්ගතය. හිසකේ සුදුය. සියලු දෙනාම එකවර නොපැමිණියහ. ඉස්සර වෙලා වැඩි භික්ෂූන් ඉදිරියෙන් අසුන් ගනිති. පසුව පැමිණි අය පිටුපසින් සිටිති. අන්තිමට පැමිණි ඉතා වයස්ගත භික්ෂුව අන්තිම අසුන ගති. සාමණේර භික්ෂූන් පවා කලින් වැඩියේ නම් ඉදිරි අසුන් ගති. කිසිවෙක් තුළ මෙම පිළිවෙල ගැන කුතුහලයක් නැත.

ආචාර්ය මන් මේ පිළිබඳ සැක පහළ කළේය. බුද්ධ කාලීන භික්ෂූන් වැඩිහිටි භික්ෂූන්ට ආචාර පැවැත් වූයේ නැද්ද ? මෙසේ අන් අයට සැළකිලි නොකළ විට ශාසන විනය රකින්නේ කෙසේද ? මේ ප්‍රකාශනයට පිළිතුර තම සිතේම ඇතිවිය. මේ දර්ශනය වූයේ සම්මුති සංඝයා නොව පරමාර්ථ සංඝයා වෙති. ඒ සියලුම දෙනා අර්හත්වයෙන් සමාන වෙති. උස් පහත් වැඩි මහළු පිළිවෙලක් නැත. ඒ සියලුම භික්ෂූන් පිරිසිදු කමින් සමානය

එවිට තවත් ප්‍රශ්නයක් පැන නැගුණි. සම්මුති වශයෙන් සංඝයා හැසි- රෙන්නේ කෙසේද ? මේ සිත ඇති වූ කෙනෙහි තම ඉදිරියේ පෙනි සිටි දර්ශනය වෙනස් විය. දැන් බුදුරජාණන් වහන්සේ මුල් අසුනේ වැඩ සිටියහ. ථේර භි- ක්ෂූන් ඉදිරිපසය. සාමණේර භික්ෂූන් පසුපසය. එය ඉතා චමත්කාර දර්ශනයකි. අභිමානවත් වන්දනීය පූජනීය තත්ත්වයකි. මෙහි අදහස ආචාර්ය මන්ට පැහැදිලි විය. සම්මුති ලෝකයේ මේ සම්ප්‍රදායානුකූලව සිටිති. රහතුන් වුවද පැවිද්දෙන් අඩු නම් කෙළෙස් සහිත වුවද පැවිද්දෙන් වැඩිහිටි භික්ෂූන්ට ආචාර දක්වති. මෙය සම්මුති පැවැත්මයි. බුදුරජාණන් වහන්සේ මේ පිළිබඳ විස්තර කළහ.

''තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක පිරිස එකිනෙකාට ආදර ගෞරව දැක්විය යුතුය. මෙත් සිත පහළ කළ යුතුය. සැවොම එකා මෙන් වාසය කරති. ලෝකය යහළු මිත්‍රකම් මෙහිදී නැත. ධර්මයට අනුව ගරු සරු කරති. ඇප උපස්ථාන කරති. විශාල සංඛ්‍යාවක් මගේ ශ්‍රාවක පිරිස සිටියත් කිසිවෙක් රණ්ඩු දබර නොකරති. තමාගේ මාන, උඩඟු බව නොපාති. මේ අනුව ජීවත් නොවන භික්ෂූහු තථාගත ශ්‍රාවකයෝ නොවෙති. එවැනි අය තථාගත ශ්‍රාවක වේශධාරීන්

පමණි. බොරුවෙන් ලෝකයා රවටති. ධර්ම විනයට අනුව හැසිරෙන භික්ෂූන් පමණක් බුදුරජාණන් වහන්සේට ගරු බුහුමන් කරති. එම නීති කිසිවිටෙක උල්ලංඝනය නොකරති. ඒ අය කොතැන සිටියත්, මහණ උපසම්පදා වූ විට ජාති, කුල, මල, තත්ව, නැත. තථාගත ශ්‍රාවකයන් වෙති. එවැනි අව්‍යාජ ශ්‍රාවකයෝ ඒකාන්තයෙන් යම්කිසි දිනක දුක තරණය කරති.''

මෙම දේශනය අවසන් වූ සැණෙකින් එම බුදු පිරිස නොපෙනී ගියෝය. ආචාර්ය මන්ගේ සියලු සැක දුරුවිය.

භාවනා කරන විට තමන් තිචීවරයෙන් සැරසී සිටිය යුතුද ? යන ප්‍රශ්නයද ආචාර්ය මන් සිතුවේය. සැනකින් රහතන් වහන්සේ නමක් පැමිණ හැම අවස්ථාවේදීම තිචීවරය අවශ්‍ය නොවන බව සැළ කළේය. උන්වහන්සේ ආදර්ශයක් දෙමින් තිචීවරය හැඳ පොරවා සක්මන් කිරීම, පලලංකයෙන් හිඳ භාවනා කිරීම පෙන්නුම් කළහ. එසේම තිචීවරය අනවශ්‍ය වන විදියද පෙන්නුම් කළහ. භික්ෂුවගේ චීවර පිළිබඳ අවබෝධයක් දුණි. නිසි පාට පෙන්නුම් කළහ. සිවුර දුඹුරු කහ පැහැයකි. ඉදීගෙන යන කොලයක් මෙනි. කොස් පඬු වලින් සකස් කෙරේ. ලා දුඹුරු, තද දුඹුරු හෝ ඒ අතර දුඹුරු පැහැ ගනී.

සුපරීක්ෂාකාරීව මෙම සිද්ධිය දෙස බලන විට අපට හැඟී යන්නේ ආචාර්ය මන්ගේ වත් පිළිවෙත් ක්‍රමානුකූලව සකස් වී ඇති බවකි. ඒ බුද්ධ කාලීන භික්ෂූන් වහන්සේලා අනුගමනය කළ පරිදිය. උන්වහන්සේ සියලු සැක දුරු කර ගත්හ. ගතානුගතිකව හෝ අත්තනෝමතිකව කිසිවක් නොකළහ. එබැවින් ඒ ප්‍රතිපත්ති කිසිදු අවහිර, කරදර නොමැතිව අනුගමනය කෙරෙති. මුල සිට අග දක්වා කිසිම වරදක් නොමැත. ''අනුමත්තෙසු වජ්ජේසු භයදස්සාවී'' යනුවෙන් නියමාකාරයෙන් පිළිවෙත් සකස් කර ඇත. වර්තමාන කාලයේ එවැනි අති ශ්‍රේෂ්ඨ ආචාර්යවරයෙක් සෙවීම අති දුෂ්කර බව කිව යුතුය. උන්වහන්සේගේ අනුගාමිකයින් පුහුණු වී ඇත්තේ ඒ සුවිශේෂ ප්‍රතිපත්ති අනුව බැවින් ඇසූ දුටු අය මවිතයට පත් කරති. තවද එම ශ්‍රාවකයින්ගේ දියුණුව ඉතාම සාර්ථක විය. යමෙක් එම ප්‍රතිපත්තියෙන් බැහැර වූ විට අසරණ වේ. සුසාන භූමියක් නැති හොල්මනකි. පවුලක් නැති අනාථයින්ය. ඒ අය ආචාර්යවරයා අත්හැර තම කැමැත්ත අනුව ජීවත් වී ප්‍රතිපත්තිය කඩ කරන අය වෙති. අභ්‍යන්තරයේ උන්වහන්සේ පැවති මාලිමා යන්ත්‍රයක් වැනි අද්භූත චිත්ත ශක්තිය නිතරම මාර්ගය, දිසාව දක්වයි. එවැනි තත්ත්වයක් කිසිම ගෝලයෙකුට ලබා ගන්නට නොහැකි විය.

ආචාර්ය මන් ධූතාංග රකිමින් චියාං මායි හි උතුරු ප්‍රදේශයේ බොහෝ

කල් චාරිකාවේ යෙදුනාහ. සෑම වාර්ෂික වස්සාන කාලයන්හි වෙනත් වෙනත් තැන්වල විසූහ. වස් විසූ ප්‍රදේශ වූයේ බන් වොම් ටළුං, බං පොං, බං ක්ලොයි, බං පු ෆරයා, මයි තොං තිප, වට් පේඩි ලුඅං, උත්තරදිත් ආදී පළාත්ය. වස් අවසානයේ චියං මායි ප්‍රදේශයේ අවට බොහෝ තැන්වල සැරිසැරූහ. අවුරුදු 12ක් පමණ කාලය තුළ විසූ තැන් ඒ ආකාරයෙන් පිළිවෙලට සඳහන් කළ නොහැක. මෙම පුස්තකයේ සඳහන් වන්නේ අප කථාවට අදාළ ගමන් ගත් ප්‍රදේශ පමණි. වට් ජඩි ලුඅං ආරාමයේ සිටින කාලය හැර අන් සියලු කල්හි උන්වහන්සේ හුදකලාව සැරිසැරූහ. මහා භයානක කඳු මුදුන්, කැලෑවන්හි බෙහෙවින් පා ගමනින් ඇවිද්දේය. මේ ගමන් මාර්ගයේ යන විට සුවිශේෂ ධර්ම අවබෝධ විය. එහෙයින්ම උන්වහන්සේගේ ජීවන ප්‍රවෘත්තිය ඉතා චමත්කාර වේ. අන් ධුතාංග භික්ෂූන් මෙසේ හුදකලාව සැරිසැරූ නමුත් එයින් හාත්පසින් වෙනස් වූ ගමනක් උන්වහන්සේ ගියහ. සාමාන්‍යයෙන් වනයේ හුදකලා සැරි සැරීම ඉතා දුෂ්කර, බිය උපදවන, දුක්ඛිත තත්ත්වයකි. පරිසරය රක්ෂිතය. කෑම, නිදා ගැනීම අසාභාවිකය. භයින් ත්‍රස්ත වී දවස ගතවේ. නමුත් ආචාර්යය මන් හට මේ සියල්ල ස්වාභාවිකය. එය සතුටකි. නිහඬතාවයකි. විමුක්තියකි. නිදහසකි. තම කෙළෙස් දුරු කිරීමට අවශ්‍ය පරිසරයකි.

මුල් කාලයේ මෙසේ සැරි සැරූ නමුත් පසුව බොහෝ අනුගාමිකයන් එකතු වූහ. ආචාර්ය ටේට්, ආචාර්යය සාන්. ආචාර්ය ඛඕ උන්වහන්සේ සමඟ විටින් විට විසූවෝය. යම් කාලයක් පුහුණු වූ පසු තනිව විසීමට වන පෙත්, මිනිස් ආවාස නැති ප්‍රදේශ එකිනෙක ඉතා ඈතින් පිහිටි ගම් ප්‍රදෙශාදී තැන්වලට යැවූහ. කඳු බෑවුමක හෝ කඳු මුදුනක විසූහ. ගම් ඉතා කුඩාය. මුළු ගමේම ගෙවල් 4 හෝ 5ක් පමණි. සමහර ගම්වල ගෙවල් 9 - 10 ඇත. පිණ්ඩපාත ලැබීමට අවම වශයෙන් ප්‍රමාණවත් වේ.

මෙම වකවානුවේ එකතු වූ කර්මස්ථාන භික්ෂූන් වහන්සේලා ඉතා ගරු ගාම්භීරය. නොපසුබට වීර්‍යය ඇත්තෝය. නිර්භය විය. ජීවිත පරදුවට තබා ධර්මය සොයා ගියහ. එබැවින් කොටි ආදී වන සතුන් ගහන ප්‍රදේශවලට ගියහ. එහිදී සැප පහසුකවක් නැත. නිතරම අවදියෙනි. නිතරම සිහි බුද්ධියෙනි. කම්සැප සෙවීමක් නැති බැවින් සිත සන්සුන්ය. ඉක්මණින් සමාධියෙහි පිහිටයි.

මිනිස් ආවාස නොමැති මෙම ඝන කැලෑවල හුදකලාව විසීමට ආචාර්ය මන් බෙහෙවින් ප්‍රිය කළහ. මිනිසුන් නැති වුවද දෙවි, බඹුන්, නාග ආදී අමනුෂ්‍යයින් සමඟ උන්වහන්සේ නිතර ආශ්‍රය කරති. එහි කිසි අමුත්තක් නැත. විදේශ භාෂා දන්නා අය විදේශිකයන් සමඟ එක් වී ඇසුරු කරන්නාක් මෙනි. උන්වහනසේ මේ අය සමඟ කථා බස් කිරීමට දක්ෂ නිසා, උන්වහන්සේගේ මේ කඳු මුදුන් වල වාසය දෙවිය බඹුන්ට ඉතා වැඩදායී විය.

ගම්බද ගෝත්‍රිකයින්ට ද වැඩදායී විය. ඔවුන් ද නිර්භීතය. අවංකය, ඉවසිලිමත්ය. භක්තිමත්ය. ඔවුහු ධර්මය අසා සතුටු වූහ. කෙතරම් ආදර සැලකිලි කළත් ඔවුන්ට නොසෑහේ. ජීවිත පූජා කිරීමට තරම් කැමති වේ. වනවාසී මේ ග්‍රෝතිකයන් පුරාණ වැදි ග්‍රෝතිකයන් මෙනි. අප්‍රසන්න කිලිටු, පිළිවෙලක් නැති මෙල්ච්ඡයන් වුවද ආචාර්ය මන් ඔවුන් ප්‍රිය කළහ. ඔවුන්ගේ පෞරුෂය, පිරිසිදු බව, හැසිරීම, තම මුලාදෑනියාට දක්වන ප්‍රේමය, වැඩිහිටි ගෞරවය ඉතා අගය කළහ. ඔවුහු තමන්ග් ඔවුන්ගේ සාමූහික වගකීම් සහ ජීවනය ගති සිරිත් හොඳාකාර පවත්වති. කිසිවෙක් කලබල කරදර නොකරති. ත්‍රස්තවාදී නොවෙති. වැඩිහිටියන් කථාකරන විට සාවධානව අසා සිටිති. කීකරු වෙති. ස්වයං මතධාරී නොවෙති. එබැවින් ධර්මය කියා දීමට පහසුවේ. මේ අය එකොර්, බමු, මුසියර්, හ්මොං ආදී ග්‍රෝතිකයන්ය.

මේ පිරිස ම්ලේච්ඡ ලෙස හැඳින් වුවද හොඳ සිල්වත්, විනය ගරුක අය වෙති. නගරබද දියුණු ශිෂ්ටාචාරයේ දක්නට ලැබෙන හොර මැර කම් වංචා, කපටිකම්, බොරු කිසිවක් නැත. ගස් කොළන් වන සතුන්ගෙන් ගහණ වූ මේ ප්‍රදේශය නගරබද ශිෂ්ටාචාරය තරම් බිහිසුණු නොවේ. නගරයේ මිනිස් සමාජය කෙළෙස් වලින් පිරී ඇත. ලෝභ, දෝෂ, මෝහ රජ කරයි. මේ මිනිස්සු සිත විනිවිද යන හදවත කම්පාවෙන බිහිසුණු වේදනා, තුවාල සිදු කරයි. එවිට මිනිසාගේ ශාරීරික මානසික නිරෝගිතාවය විනාශ වේ. ඒවා සුව කිරීම ඉතා දුෂ්කරය. මේ කෙළෙස් නිසා හටගත් තුවාල ඇඳුම් දෙමින් පැසවයි. ඒවා සුව කිරීමට නොහැකි නිසා අමතක කරති. එහෙත් යට තුවාලයකි.

මෙවැනි කෙළෙස් සහිත ''වනයක'' සියළු ස්ත්‍රී සාමණේර - භික්ෂූන් ජීවත් වෙති. ආචාර්ය මන් ඝන වනාන්තර ගත වූයේ මේ කෙළෙස් වනය නැති කිරීමටය. තම සිතේ පවතින කෙළෙස් ම්ලේච්ඡ, දරුණු, නොදියුණු, නොහික්මුණු ගති ඇත. මේ අභ්‍යන්තර කැලෑව ශුද්ධ කිරීමට හුදකලාව, වනචාරී විය යුතුය. එවිට අභ්‍යන්තර කැලෑව අභිබවා බාහිර කැලෑව පවතී. එවිට තම මනුෂ්‍ය මොළය ක්‍රියාත්මක වේ. තමා සිටින්න් මොනතරම් භයංකර සංසාරයකද? එවිට යථා තත්ත්වය සමාධිගත සිතට ගෝචර වේ.

උන්වහන්සේ සමඟ විසූ භික්ෂූන් වහන්සේලා අතිශයින් නිර්භීතය. ජීවිතය පරදුවට තබා ශික්ෂා රකිති. බාහිර පරිසරය ජය ගැනීමට හැකි වන්න් එවැනි අයටය. එබැවින් පිළිවෙත් රැකීම, ජීවිත ආශාව අත්හැර කළ යුතුවේ. මරණය වුවද බලාපොරොත්තුවෙන් තම අරමුණ වූ කෙළෙස් සටන ගෙන යති.

උන්වහන්සේගේ භාවනා පුරුදු කිරීමේ ක්‍රම වියංමායි හිදී තරමක් වෙනස් විය. දැන් ඊට වඩා දැඩි, කටුක බවක් ඇත. එම ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා ඊට අවනත විය. නිතරම තම සන්තානයේ කෙළෙස් සති සම්පජඤ්ඤයෙන් උදුරා

දමති. මර්දනය කරති. උන්වහන්සේගේ ප්‍රබල අවවාද අසා සතුටින් පිළිගත්හ. උන්වහන්සේගේ කථා ශෛලිය රළු වූ විට ධර්මය ඉතා ගැඹුරු ස්වභාවයක් ගනී. එවිට සමාධි පුරුදු කරන්නන්ගේ සමාධි තව බලවත් විය. විපස්සනා කරන, ධර්ම විචය, සම්බොජ්ඣංග වඩන්නන්ගේ ප්‍රඥාව තව දියුණු විය.

මේ වන විට උන්වහන්සේගේ දැනුම බෙහෙවින් උසස් විය. තීක්ෂණ අවබෝධයක් තිබුණි. එමෙන්ම එම භික්ෂූන් වහන්සේලා ඉතාමත් බුද්ධිමත් වහා වැටහෙන සුළු අය විය. උන්වහන්සේලා අර්හත්වය පිණිස වීර්‍ය්‍ය වැඩූහ. යම් භික්ෂුවක් තම සිතිවිලි වැරදි මගක මෙහෙය වුවහොත් ආචාර්ය මන් එය දනී. එවෙලේම හොරු අල්ලති. මේ හොරු ළඟින්නේ භාවනා යෝගී භික්ෂූන්ගෙ ් චිත්ත සන්තානයේය. සති විරහයක් වූ විට, අන් කෙළෙස් සහිත පුද්ගලයන් මෙන් උන්වහන්සේලාගේ සිතිවිලි ද කෙළෙස් වලින් ග්‍රහණය කෙරේ. කෙළෙස් වලට අනුව නොයෙක් මනඃ කල්පිත මති මතාන්තර වලට ගොදුරු වේ. මෙය කෙළෙස් වල ස්වභාවයයි.


ආචාර්ය මන් විඑන් මායි කඳුකරයේ වාසය කරණ කාලයේ අමුතු සිද්ධියක් වුනි. එවැන්නක් කර්මස්ථාන භික්ෂූන් අතර සිදු වී නැත. පාඨක ඔබ මට සමාව දෙනු මැනව. මෙවැනි සිද්ධීන් අපට වැදගත් වන්නේ මිනිස් ගති ස්වභාවය හඳුනා ගැනිමටය. මෙම කථාව කර්මස්ථාන භික්ෂූන් අතර පමණක් පැවතුනකි. ආචාර්ය මන්ගේ ප්‍රතික්‍රියාව තීරණාත්මක විය. එහි විසූ එක්තරා වැඩි මහළු ස්ථවිර නමක් මෙම පුවත විස්තර කළහ.

''එක් සන්ධ්‍යාවක උන්වහන්සේ සහ තවත් භික්ෂුවක් ස්නානය පිණිස ළඟ පහත ගල් පර වලින් සෑදුන තටාකයකට ගියහ. එය ගමේ කුඹුරු වලට යන මාර්ගයේ ගමෙන් බොහෝ ඈතින් පිහිටියේය. උන්වහන්සේලා නාන විට තරුණ ස්ත්‍රීන් ගණනාවක් එහි අසල නියර දිගේ කුඹුරට ගියහ. එවැනි දේ සාමාන්‍යයෙන් නොසිදුවේ. අනිත් භික්ෂුව මෙම ස්ත්‍රීන් දුටු විට රාග ගින්නක් මහත් ආයාසයකට පත්වුණි. තමන් වහන්සේ බොහෝ වැර වීර්‍ය්‍ය දැරූ නමුත් එම රාගය මැඩ ගැනීමට නොහැකි විය. ආචාර්ය මන් තම සිතේ පැවති අසහනය දකී යන බිය බලවත්ය. තමා නින්දා අපහාසයකට පත්වේදැයි තව තවත් සිත වික්ෂිප්ත විය. එම මොහොතේ පටන් වරින් වර සිත රාගයෙන් හා බියෙන් මුසපත් විය. මෙ-වැන්නක් කිසි කළෙක සිදු වී නැත. උන්වහන්සේ අධික පීඩාවකට පත් විය.










สุขสมปอง



# 4

# වියං මායි හි ගත කළ කාලය

එදින රාත්‍රී පුරුදු පරිදි ආචාර්ය මන් භික්ෂූන් වහන්සේලා ගැන මෙනෙහි කරණ විට මෙම සිද්ධිය දුටහ. වශී කෘත වූ ආදරයකින් මුලා වී සිටින බවත් බියෙන් සැකෙන් තම සිතැගි දනී යැයි අතිශය කනස්සල්ලකට පත් වී ඇති බවත් දුටුවේය. භික්ෂුව රෑ එළිවන තුරුත් නොනිදා මෙම සිතිවිලි වල නිමග්නව සිටී. පසුදා උදේ ආචාර්ය මන් මේ භික්ෂුවට කිසිවක් නොකීවේය. ඔහුගේ සැක බිය තව තවත් උත්සන්න වන බැවිනි. උන්වහන්සේ දුටු පමණින් භික්ෂුව අධික කම්පනයෙන් වෙව්ලා ගියේය. ආචාර්ය මන් ඉතා සන්සුන්ව සිනහ පහළ කළහ. කිසිවක් නොදන්නාක් මෙනි. පිණ්ඩපාත යන වේලාවේ කථා කිරීමට අවස්ථාවක් ලබා මෙසේ කීහ.

''ඔබ වහන්සේ බලවත් ආයාසයකින් භාවනා කරණ බැවින් අද දින පිණ්ඩපාත නොවැඩිය මැනවි. අපි සැවොම ගොස් ගෙනෙන පිණ්ඩපාත දානය ඔබ සමඟ බෙදාගෙන ඔබ වහන්සේගේ භාවනා පිං අනුමෝදන් වෙමු. අපට ලැබෙන ආහාර ඔබ වහන්සේටත් ප්‍රමාණවත් වේ.''

මෙය කීවේ උන්වහන්සේ දෙස නොබලාය. ආචාර්ය මන් උන්වහන්සේ ගැන තමන් වහන්සේටත් වඩා දනී. එසේ කියා පිඬු පිණිස වැඩියහ. එම භික්ෂුව ආයාසයෙන් සක්මන් කරයි. මෙය නොහිතූ විධියට සිදු වූ බැවින්, හිතා මතා කළ දෙයක් මෙන් නොවේ. අත්හරින්නට බෙහෙවින් අමාරු සිතිවිලි විය. මේ බවත් දත් ආචාර්ය මන් යම් ප්‍රයෝගයකින් උපකාර කිරීමට උනන්දු විය. භික්ෂුව දැඩි ලෙස තම සිත මුදවා ගන්නට දිරි වඩයි. එබැවින් ඔහුගේ සිතට පීඩා නොදුන්හ.

පිණ්ඩපාත දානය රැගෙන ආ සියලුම භික්ෂූන් වහන්සේලා පිඬුවක් බැගින් උන්වහන්සේගේ පාත්‍රයට හෙලූහ. තවද, එම භික්ෂුවට කැමති නම් තනිව හිඳ වැළඳිය හැකිය. නැතහොත් අනිත් භික්ෂූන් සමඟ හිඳ වැළඳිය හැකි යැයි පණිවිඩයක් යැවීය. මෙය අසා එම භික්ෂුව ඉක්මනට අවුත් අවශේෂ භික්ෂූන් සමඟ

වාඩි වී වැළඳුවේය. ආචාර්ය මන් නොදන්නාක් සේ සිට පසුව ආදර කරුණා-වෙන් වචන කීපයක් කථා කර උන්වහන්සේගේ බලවත් පසුතැවිල්ල අස්වැසීය. උන්වහන්ස් අන් භික්ෂූන් සමඟ වැළඳූ නමුත් එය ව්‍යාජ පෙනුමක් පමණි. ඉතා ස්වල්පයක් වැළඳුවේ අනිත් භික්ෂූන්ට ආචාරශීලීවය. කෑම රුචියක් නැත. එතරම් මානසික පීඩනයක පත් වී ඇත. එදින සවස් යාමයේ උන්වහන්සේ සමඟ ස්නා-ානය පිණිස ගිය අනිත් භික්ෂුව එනම් මෙම කථා පුවත පසුව අප සමඟ විස්තර කළ භික්ෂුව, සැකයට පත් වී මෙම සිද්ධිය ගැන විමසීය. ආචාර්ය මන් ඇයි මේ ලෙස එම භික්ෂුවට විශේෂයක් දක්වන්නේ ? මෙවැන්නක් මීට පෙර සිදු වී නැත. උන්වහන්සේ එම භික්ෂුවගේ භාවනා දියුණුව දැක සුදුසු ලෙස උනන්දු කරත් යැයි සිතීය. එසේ සිතා එම භික්ෂුවගෙන් භාවනා දියුණුව පිළිබඳ විමසීය. ''ආචාර්ය මන් ඔබ පිණ්ඩපාතය පිණිස නොයන්ට කීවේ ඔබ උග්‍ර ලෙස භාවනාවේ යෙදෙන නිසාද ? කරුණාකර මෙය මට කියන්න.''

එම භික්ෂුව මුහුණ ඇඹුල් කර නැත සිනාවකින් සිනාසුනි. ''මගේ භාවනාව දියුණු වන්නේ කෙසේද ? ආචාර්ය මන් මහා දුර්වල මෙන්ම මෝඩ පුද්ගලයෙකුට උපකාර කරන්ට උන්වහන්සේගේ ප්‍රයෝගයෙන් අනුකම්පා කළා.''

යහළු භික්ෂුව නැවත නැවතත් සිදු වූ දේ කුමක්දැයි ඇසූ නමුත් පිළිතුර නොදුනි. ''ආචාර්ය මන් මහා දුර්වල මෝඩ පුද්ගලයෙකු ලෙස ඔබව දැක්කේ ඇයිදැ''යි ඇසීය. බැරිම තැන මෙසේ කීහ. ''මේ පිළිබඳ ආචාර්ය මන්ට කියන්ට උවමනා නැත. උන්වහන්සේ එය දනී. මට වඩා මා ගැන උන්වහන්සේ දනී. මට ලැජ්ජා භය ඇත. උන්වහන්සේට මූන දීමට නොහැකිය. ඊයේ අපි ගල් පර්වත අසල තටාකයේ නාන විට අමුතු දෙයක් දුටුවා මතකද ?

''මට මතක නැත. ගැහැණු කීප දෙනෙක් යනවා නම් මතකයි.'' ''ඒ තමයි සිද්ධිය. මම මේ මහා අසහනයකට පත් වී ඒ මොහොතේ පටන් කිසිවක් කර කියා ගන්ට බැරි වී අසරණ වුනෙමි''යි පාපොච්ඡාරණය කළහ. ''එමනිසා මට පිඩු පිණිස යාම වැළැක්විය. මා ඒ කාන්තාව නැවත ගමේදී දුටහොත් මැරී වැටෙතියි සිතූහ. මගේ භාවනාව හොඳ වන්නේ කෙසේද ? ඒ මෝඩ දුර්වල පුද්ගලයා ගැන දැන් තේරෙනවාද ?''

යහළු භික්ෂුව පුදුමයෙන් ගල් ගැසුණි. ''ඇයි දෙවියනේ ඔබ සහ එම ගැහැණු අතර සම්බන්ධය කුමක්ද ?''

''මොකවත් නැහැ, මා ඒ එක් ගැහැණියක් දුටු සැණින් ඈ පිළිබඳ සිත් පහළ විය. රාග ගින්නෙන් දැවී ගියේය. මගේ භාවනා මනසිකාරය සුන් විය. ඒ වෙනුවට මගේ මනසේ ඇගේ ලක්ෂණ රූපය ඇඳී ඇත. මේ දර්ශනය නිසා

මගේ සිහි මුලාවිය. රෑ එළිවන තුරුත් නින්දක් නැත. තවමත් මෙම විකාර සිත කෙරෙහි මා තදින් බැඳී ඇත. මොනවා කරන්ටදැයි නොදනිමි. ඔබ වහන්සට හැකි නම් මට උපකාර කරන්න.''

''තවමත් එසේමද ? වෙනස් වුනේ නැද්ද ?''

''නැත'' භික්ෂුවගේ කටහඬ ඉතා බැගෑපත්ය. ''එසේ නම් මම කියන්නම්, ඔබට ඔය සිත මර්දනය කළ නොහැකි නම් මෙහි රැඳී නොසිටින්න. තව තවත් උත්සනන වේවි. මෙහෙන් පිට වී ගොස් සුදුසු පරිසරයක් සොයා ගන්න. ආචාර්ය මන් සමඟ ඔබට කථා කළ නොහැකි නම් මම කියන්නම්. උන්වහන්සේ ඔබට වහාම අවසර දේවි. උන්වහන්සේ ඔබේ තත්ත්වය හොඳාකාර තේරුම් අරගෙන ඇත. ඔබට ලැජ්ජා වේ යැයි සිතා තවම කිසිවක් නොකීවේය.

භික්ෂුව ඊට කැමති විය. සවස් යාමයේ තම යහළු භික්ෂුව ආචාර්ය මන්ට දැනුම් දී අවසර ලබා ගති. එහෙත් උන්වහන්සේ බරපතල ප්‍රකාශයක් කළහ. ''කර්මානුරූපව හටගත් ආකර්ෂණයක් වැළැක්විය නාහැක. හමුවීම නිසා එය ඉක්මණින් ක්‍රියාත්මක වීමට හේතු ඇති බැවිනි.'' ඒ පිළිබඳ කීවේ එපමණකි. අසා සිටි භික්ෂුව පවා එහි අර්ථය වටහා නොගත්හ.

සියල්ලෝම මෙම සිද්ධිය පිළිබඳ නිහඬ වූහ. එම භික්ෂුව ආචාර්ය මන් සමඟ කිසිවක් නොකීවේය. යහළු භික්ෂුව කිසිවක් නොකීවේය. ආචාර්ය මන් දැන සිටියා පමණි. කිසිවෙක් විවෘතව මේ පිළිබඳ කථා නොකළහ.

පසුදින ආචාර්ය මන්ගෙන් සමුගැනීමට ගිය විට කිසිවක් නොකියා අවසර දුණි. එවිට එම භික්ෂුව ඈත පළාතකට ගොස් තම භාවනාව ආරම්භ කළහ. එහි යම් කර්ම දෝෂයක් නොවී නම් එහි උන්වහන්සේට තම භාවනාව කිරීමට බාධාවක් නැත. එහෙත් අහෝ කර්මයාගේ විපාකවල හැටි ! ආචාර්ය මන් කළ ඇඟවීම අනුවම සිදුවිය. එම තරුණ ස්ත්‍රිය අහම්බෙන් එම ගමටම ඇවිත් ඇත. නැවතත් එම භික්ෂුවට ඈ හමුවිය. මෙය ඉතා අස්වාභාවිකය. කඳුකරයේ ගෝත්‍රික ස්ත්‍රිය මෙසේ ඈත ගමකට යන්නේ නැති බැවිනි.

ආචාර්ය මන් සහ අනිකුත් ධූතාංග භික්ෂූන් යම් කාලයක් එහි ගතකර වෙනත් අඩවියකට සංචාරය කළහ. එවිට අසන්නට ලැබුණේ එම භික්ෂුව තම සිත මර්දනය කර ගැනීමට නොහැකි වී සිවුරු හැර එම ලක්ෂණ මියුසියර් ග්‍රෝතික ස්ත්‍රිය සරණ පාවා ගෙන එහිම පදිංචි වූ බවත්ය.

මෙය නම් කර්මය නිසා සිදු වූවක් බව නිසැකය. නැත්නම් මෙය සිදුවන්නේ කෙසේද ? එම භික්ෂුවගේ යහළු භික්ෂුව මේ පුවත අප සමඟ කීවේ මෙසේය.

එම භික්ෂුව එම ස්ත්‍රියව කිසිදාක දැක නැත. කථා කර නැත. එහෙත් දුටු පමණින් ක්ෂණිකව මෙම සම්බන්ධය සිදුවිය. අන් භික්ෂූන් තම අසපුවේ වාසය කරන විට ගමේ මිනිසුන් සමඟ කිසිම සම්බන්ධයක් නැත. ආචාර්ය මන් සමඟ සිටින විට එවැනි යහලු මිත්‍රතාවයක් ඇති නොවේ. එම භික්ෂුව ඇසින් දුටු පමණින් වශී වූ බව කීවේය. එවිට සිහි විකල් විය. එම ආකර්ෂණය කෙතරම්ද යත් හදවත විනිවිද ගියේය. හුස්ම ගැනීමට නොහැකි විය. මෙවැනි බලවත් කාය චිත්ත පීඩාවකට ඔහු ගොදුරු විය. මින් මිදීමට නොහැකිව වෙන පළාතකට යාමට තීරණය කළහ. එහෙත් කර්ම ශක්තිය ඔහු ලුහු බඳිමින් පසුපස ආවේය. ඔහු ඊට යටත් විය.

මෙවැනි අත්දැකීමක් නැති ඔබ සිනහ වෙනවා ඇත. නමුත් අප වැනි අය එවැනි අවස්ථාවකින් මිදෙන්නේ කෙසේද ? බුද්ධ කාලීන අර්හත් සුන්දර සමුද්‍ද භික්ෂුවකට මෙවැනි සිද්ධියක් වූ බව ථේරගාථාවේ සඳහන් වේ. එහෙත් එම ගණිකාවකගෙන් බේරුණේ උන්වහන්සේ ඍද්ධි බලයෙන් කවුළුවෙන් පිට වී ගොස්ය. සාමාන්‍යයෙන් කඳුකරයේ ශ්‍රෝත්‍රිකයන් භික්ෂූන් සමඟ කුළුපග නොවේ. එහෙත් බලවත් කර්මයෙන් මිදෙන්න් කෙසේද ? මෙහි සත්‍යතාවය ආචාර්ය මන් දැන සිටියහ. යම් උපක්‍රමයකින් භික්ෂුව ආරක්ෂා කිරීමට තැත් කළත් කර්ම ශක්තිය බලවත්ය. එබැවින් මෙය වැළැක්වීමට නොසිතූහ. කර්මය දායාද කොට සිටින මිනිසා තම දෛවය ස්වභාවික විධියට විසඳා ගනිති. මම මේ කථා පුවත ඇතුළත් කළේ මෙවැනි අවස්ථාවන්ට අප මුහුණ පාන බව මතක් කිරීමටය. වෙනදා මෙන් ඔබ මගෙන් වූ වරදක් ඇතත් සමාවෙනු මැනවි.

මින් ඉහත මම ආචාර්ය මන් හොරු අල්ලන්නෙකැයි කීවෙමි. උන්වහන්සේ පරචිත්ත විජානනයෙන් අන් අයගේ සිතිවිලි දනිති. මේ නිසා උන්වහන්සේගේ ශිෂ්‍යයෝ සුපරීක්ෂාකාරීව තම සිතුවිලි පාලනය කළහ. යම්කිසි ප්‍රබල චරිතයක් ඇති භික්ෂුවක් පුහුණුවට පැමිණි විට උන්වහන්සේ ඔහුගේ සිතුවිලි දැක ඔහු අවනත කරයි. වෙනත් නිහතමානී යටත් පහත් අය මෙන් නොව මෙවැනි චරිත ප්‍රතික්‍රියා කරන්නේ විරුද්ධ ලෙසය. නමුත් උන්වහන්සේ මෙවැනි අධිමානුෂික බලයෙන් යමක් කී විට එහි වැරැද්ද පිළිගෙන ඉන් මිදීමට උත්සාහ කරති. කෙතරම් තදින් වැරැද්දට අවවාද කළත් තම වැරැද්ද ගැන ලැජ්ජා නොවේ. තරහ නොවෙති. උරණ නොවෙති.

ආචාර්යය මන් ඉතා දක්ෂ වෙති අදහස් සම්පූර්ණයෙන් පළ කරණ කෙනෙකි. එබැවින් අසා සිටින්නාගේ හදවත තුළට කා වැදී යයි. තමන් වහන්-සේගේ දැනුම් සම්භාරය කියා දෙන විටත් අනුන්ගේ දොස් දකින විටත් නිර්භයව එකහෙළා පවසති. විවේචනය, සාධාරණය, නිවැරදිය, අනුන්ගේ හිත සුව පිණිස පවතී. තම ශිෂ්‍යයන්ගේ ගෞරවය දිනා ගනිති. ඔව්හු එහි සත්‍යතාවය පිළිග

නිති. තම තමන් ලබා ගත් අධිමානුෂික ගුණ ගැන උද්දාම නොවෙති.

ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවයන් අනුව උන්වහන්සේ උපදෙස් දෙති. යමෙකුගෙ දියුණුව දුටුවිට ධෛර්‍යයමත් කරති. භාවනාව වැරදි නම් එය නියම මාර්ග යට යොමු කිරීමට උපදෙස් දෙති. නොයෙක් ගැටළු, ප්‍රශ්න ඇති අයට ලැබෙන අවවාද තුළින් සියලු ප්‍රශ්න නිරාකරණය වේ. මම දන්නා තරමින් උන්වහන්සේගේ ශිෂ්‍යයන් කිසි විටෙක දුර්මුඛ වූයේ නැත. නිතරම ලැබෙන්නේ දක්ෂ, විශේෂඥ විසඳීමකි. භාවනා පිළිබඳ උන්වහන්සේ නිපුනත්වයක් දරයි. කිසිවෙකුට එවැනි තීරණාත්මක විසඳුමක් දිය නොහැක. භාවමය හැඟීම් පළකරන ගී නිබන්ධනයක් මෙන් අසා සිටින්නාගේ සිත කුල්මත් කරයි. වශී කරයි. එවැනි ව්‍යක්ත කථා ශෛලියක් අද ලෝකයේ අසන්නට නැත. ශීලානිශංස දේශනාව මනහරය. සමාධි පඤ්ඤා පිළිබඳ දේශනා සුවිශේෂය. අසා සිටින්නන්ගේ තෘප්තිමත් භාවය නිසා ඇතිවන සංසිඳීම දින ගණනාවක් පවතී.

තමන් වහන්සේගේ අවබෝධය පිණිස වීර්‍යය වඩන විට උන්වහන්සේ හුදකලාව කඳු මුදුන්, ඝන වනාන්තරවල වාසය කරයි. තම ආධ්‍යාත්මයේ කෙළෙස් ජය ගැනීමට උග්‍ර සටහනක යෙදෙති. නිතරම සති පඤ්ඤාවෙන් සිටිති. නිදන කාලය හැර අන් හැම වෙලේම ප්‍රත්‍යවේක්ෂා කරති. ධම්ම විචය සම්බොජ්ඣංග ය වඩමින් තම සිතිවිලි විචාරති. තම කෙළෙස් සමඟ ඇත්ත් කථාවකි. දෙබසකි. කෙළෙස් වලට ප්‍රති ප්‍රහාර එල්ල කරති. දුක නැති කිරීමේ එකම චේතනාව උත්ප්‍රේරකයක් විය. සම්මා සංකල්පනා විය. ඒවා හිස් ප්‍රලාප නොවෙති. කෙළෙස් හට ගන්නේ නොයෙක් රැවටිලි සහිතවය. තමාගේ උදව් උපකාරකයන් ලෙසත්, තමාගේ දිට්ටි, මාන අනුභස ලෙසත් ස්වාභාවික ලෙසත් පෙනී සිටිති. කෙළෙස්වල ගමන් මාර්ගය පසුපස යමින් උන්වහන්සේ ග්‍රහණය කරති. මෙසේ කෙළෙස් හට ගැනීමට ඉඩ නැත. වහා හඳුනා ගනිමින් මැඩ පවත්වති. ජයග්‍රහණය තෙක් සටන ගෙන යයි. සති, පඤ්ඤා, ශ්‍රද්ධා, වීරිය, උපරිම වශයෙන් වැඩී ඇත. හැම ජයග්‍රහණයෙන්ම මෙම කුසලතා වර්ධනය විය. අන්තිමේදී අභ්‍යන්තර ලෝකය දෙදරා ගියේය. මාර්ග ප්‍රඥාවෙන් අවිද්‍යාව නම් රජු විනාශ විය.

මේ ආකාරයෙන් අවසාන ජයග්‍රහණය අත්පත් විය. සක්මන් භාවනාවේ සහ පර්යංක භාවනාවේ නිමක් නැත. රෑ දවල් තිස්සේ සති පඤ්ඤාවෙන් භාවනාවේ යෙදෙති. ඉන් අනතුරුව තම ''යුද්ධොපකරණ'' වලට අවශ්‍යතාවයක් නොමැත. සති, පඤ්ඤා සාමාන්‍ය ජීවිතය ගෙන යාමට පමණක් පවතී. සමහර විට ධර්මයේ ගැඹුර දැකීමට උපයෝගී කරයි. අවශ්‍ය නොවු විට නැති වී යයි. කලින් සති, පඤ්ඤා හැම මොහොතේදීම කෙළෙස් යටපත් කිරීමට අවශ්‍ය විය. දැන් ඒ සියල්ල නිරායාසව ක්‍රියාකාරී වේ. මැල වී, මැකී යයි. අනවශ්‍ය බැවිනි. උන්වහන්සේගේ ජීවිතය සරලය, පහසුය, අව්‍යාජය, ලාමක, පහසුවෙන් රැවටිය

හැකි අඥානයෙක් මෙන් ලෝකයාට දිස්වේ. සති, පඤ්ඤාවල ක්‍රියාකාරිත්වය නැත. ඉතිරි වී ඇත්තේ අකාලික සමාධියකි. කිසි විධියකින් වෙන් නොවෙන බැවින් සිතේ ස්වභාවය යටපත් කල නිශ්චල ස්වභාවයකි. බාහිර බලපෑම් කිසිවකින් චංචල නොවේ. අතීතය, අනාගතය ගැන කිසිම තැකීමක් නැත. කෙලෙස් නැතිවීමත් සමඟ සියලු ස්වභාවයන් අහෝසි වේ. සූන්‍යතාවය රජ කෙරේ.

## මල්ලව පොර ශූරයා

නවක භික්ෂූන් වහන්සේලා කණ්ඩායමක් පුහුණු වීමට භාරගත් විට ආචාර්ය මන් නිතරම ඔවුන් සමඟ සාකච්ඡා පවත්වති. එවිට භාවනා උපදෙස් දෙති. යම් භික්ෂුවකගේ ගති ලක්ෂණ නුසුදුසු නම් එතැනදීම ඒ පිළිබඳ තරවටු කරති. ඒ අයගේ ගති තමන් වහන්සේ සමාධියෙන් සිටින විට දක්නට ලැබේ. නැතහොත් පරචිත්ත විජානනයෙන් ඔවුන්ගේ සිත් දකිති. එවිට ප්‍රයෝගකාරී ක්‍රමයකින් එය එළිදරව් කරති. එවැන්නක් නොවීමට වග බලා ගත යුතු බව අඟවති.

භාවනා සමාධි නිමිති වශයෙන් තම ශ්‍රාවකයන්ගේ චරිත උන්වහන්සේට දිස්වේ. උදාහරණයක් වශයෙන් පහත දැක්වෙන කථා පුවත ඉදිරිපත් කරමි. එක් භික්ෂුවක් ගිහි කාලයේ ප්‍රසිද්ධ මල්ලව පොර ශූරයකි. ආචාර්ය මන්ගේ භාවනා පුහුනුව ගැන අසා ඉතා ශ්‍රද්ධාවෙන් සසුන්ගත වී ආචාර්ය මන්ගේ ශිෂ්‍යයෙක් විය. ඔහුගේ බඩු මල්ලේ බොක්සින් සූරයන්ගේ ඡායාරූප 10ක් එක් එක් ඉරියව් වලින් තිබුණි. බැංකොක් සිට චියාංමයි ප්‍රදේශයට පැමිණ කඳුකරයේ සිටි ආචාර්ය මන් සොයා ගති. ආචාර්ය මන් ඔහුට අවසර දී මහණ කරවිය.

එදින රාත්‍රියේ ආචාර්ය මන් තම ශ්‍රාවකයන් පිළිබඳ විමසීමක් කළහ. පසුදා උදේ හීල් දානයට වැඩි අවස්ථාවේදී නවක භික්ෂුව ගැන කථා කළහ.

''මේ භික්ෂුව මෙහි පැමිණියේ භාවනා කිරීමේ අභිලාෂයෙනි. එය හොඳයි. ඔහුගේ හැසිරීමේ කිසි වරදක් නැත. එහෙත් ඊයේ රාත්‍රියේ මහ විකාර ලෙස හැසිරුණේ ඇයි ? මම භාවනා කරණ විට ඔහු ඇවිත් මා ඉදිරියේ පෙනී සිටියේය. අඩි කීපයක් ඈතින් සිටියේය. ඉන්පසු බොක්සින් ශූරයන්ගේ නොයෙක් විධියේ ඉරියව් පාමින් රඟ දැක්වූයේය. මට නොපෙනී ගිය විට සෙවනැල්ල සමඟ හරඹ කරයි. තායි බොක්සින් ශූරයෝ කකුල්, දණහිස්, වැලමිට, මිටි මොලවා තම විරුද්ධකාරයා බිම හෙළයි. ඒ අනුව ඔහු දකුණු කකුළෙන් හා වම් කකුළෙන් විටින් විට පහර දුනි. මේ භික්ෂුවගේ අතීතය කුමක්ද ? ඔහු මල්ලව පොර ශූරයෙක්ද ? ඒ නිසා ඔහු මට මල්ලව පොර ප්‍රදර්ශනයක් දුන්නෙහිද ?

උන්වහන්සේ මෙසේ කියන විට එම භික්ෂුව හා අනිකුත් භික්ෂූන් ගල්

ගැසී බලා හුන්හ. ආචාර්ය මන් නවක භික්ෂුව දෙසට හැරී ''ඇයි ඔබ එසේ රඟ දැක්වුයේ ? මක්නිසා එසේ හැසුරුණේද ? ඇති යන්තම් මට පහර නොදුන් එක.'' යයි පැවසූහ.

දාන වේලාවට ආසන්න බැවින් ආචාර්ය මන් වෙන මොකවත් නොකියා ගියහ. සවස් වරුවේ භික්ෂූන්ට කමටහන් දෙන විටත් ඒ පිළිබඳ කිසිවක් නෙ-ාකීහ. නමුත් රාත්‍රී කාලයේ නැවතත් මේ රඟපෑම සිදුවිය. පසුදා අළුයම මේ පිළිබඳ කථා කළහ.

ඔබ ඊයේ රෑ මා හමුවීමට පැමිණියේ ඇයි ? ඊයේ රාත්‍රියේ ඔබ බොක්සිං රඟපෑවේ ඇයි ? පැන පැන පා පහරවල් දෙමින් මුළු රාත්‍රියම ගත කළේය. මෙවැනි හැසිරීම් භාවනා යෝගීන්ට සුදුසු නැත. ඔබ මෙහි එන්ට පළමු තිබූ අරමුණු මොනවාද ? දැන් අදහස කුමක්ද ? කරුණාකර ඇත්ත කියන්න. නැත්නම් මෙහෙන් පිට වී යන්න. පසුගිය රාත්‍රී දෙක තුළ වූ සිද්ධිය වැනි දෙයක් මා දැක නැත.

එම භික්ෂුව භයින් වෙව්ලමින් සුදුමැලි විය. ක්ලාන්ත වේයැයි සිතුණි. අන් භික්ෂුවක් තමන් ඔහු සමඟ පුද්ගලිකව කථා කිරීමට අවසර ඉල්විය.

''කරුණාකර ආචාර්ය මන්ට කියන්න ඔබගේ මේ සිද්ධියට හේතුව උන්වහන්සේට අවශ්‍යයයි. ඇත්ත දැන ගැනීමට ඔබට යම්කිසි දඬුවමක් දීමට නොවේ. අපි මෙහි වෙසෙන කිසිවෙක් රහත්වෙලා නැහැ. කෙළෙස් දුරු කර නැහැ. අපි වැරදි කරනවා. නමුත් උන්වහන්සේගේ අවවාද පිළිගෙන වරදින් මිදෙනවා. අපගේ ගුරුදේවයන් වහන්සේ අපට පියකු හා සමානය මවෙකු හා සමානය. ගුරුවරයෙක් වශයෙන් වරද කරණ අයට දොස් කීමට සුදුසුයි. ගුරුවරයා තම ශිෂ්‍යයා කෙරෙහි අවධානය කළ යුතුයි. ඒ අයගේ සුභ සිද්ධිය පිණිස ප්‍රශ්න අසමින් විවේචනය කරමින් ඒ අවස්ථාවට සුදුසු ලෙස අවවාද දෙනවා. මටත් කීප විටක් උන්වහනසේ දොස් කීවා. ඔබට කීවාට වඩා තදින් විවේචනය කළා. සමහරුන් එළවා දමනවා. එහෙත් ඒ අය කීකරු වී තම වැරැද්ද හදා ගත්විට ඉන්ට අවසර දෙනවා. ඔබට කී දේ ගැන හොඳින් සිතන්න. මට පේන විධියට ඔබ භය විය යුතු නැහැ. ඔබ සිතේ යම් ගැටළුවක් ඇත්නම් එය කියන්න. ඔබ කිසි වැරැද්දක් නොකළේ නම් හෝ අත්වැරැද්දක් සිදු වුණේ නම් කෙළින්ම කියා සිටින්න. ඔබට අමතක නම් එසේ කියන්න. ඔබගේ සුදුසුකම් අනුව තීන්දුව ලැබේ. කුමක් හෝ වේවා, ඊට අවනත වූ විට ප්‍රශ්නය නිරාකරණය වේ.''

එම භික්ෂුව කතා කර අවසානයේදී ආචාර්ය මන් කථා කළහ. දැන් ඔබට කියන්ට ඇත්තේ කුමක්ද ? කිසි හේතුවක් නැතිව මා ඔබට වරද පවරන්නේ නැත. නමුත් මා ඇස් පියාගත් මොහොතේ සිට ඔබගේ විකාර දැඟලිල්ල මට දිස්වේ.

භික්ෂුවක් මෙසේ හැසිරෙන්නේ ඇයි ? මම පුදුමයට පත්වෙමි. මේ දර්ශනය කුමක්ද? ඔබ කොයි ආකාර දුෂ්ටයෙක්දැයි නොදනිමි. මගේ අධිමානසික බුද්ධිය තුළින් මෙතරම් කාලයක් ගත් තීරණ වැරදුණේ නැත. එහෙත් මේ අවස්ථාවේ වැරදුණේ ඇයි ? ඔබ මට ඇත්ත කියන්න. ඔබ නිර්දෝෂි නම්, මගේ අධිමානුෂික බල වැරදි නම්, මම වනාහි නාකි පිස්සු භික්ෂුවක් වෙමි. මෙවැනි භික්ෂූන්ගෙ ' ගුරුවරයා වීමට නුසුදුසු වෙමි. මම වැරදි පාර ඔවුන්ට දක්වන්නෙක් වෙමි. එසේනම් මා පිස්සුවෙන් කොහේ නමුත් ගොස් සැඟ වී සිටිය යුතුයි. මේවැනි පිස්සු දේ උගන්වන්නේ නම් එය සාපයකි.

අනිත් භික්ෂුව තම යහළුවාට කථාකරන මෙන් ආයාචනා කළහ. අන්තිමේදී එම මලල ක්‍රීඩා කළ භික්ෂුව ගැහි හැහී විකෘතිව යන්නම් කීවේය. ''මම මලල ක්‍රීඩකයෙක් වෙමි.'' එපමණක් කියා නිෂ්ශබ්ද විය.

ආචාර්ය මන් ඔබ මලල ක්‍රීඩකයෙක්ව සිටියද ? එසේය. නමුත් දැන්, ඔබ භික්ෂුවක් දැන් ඔබ මලල ක්‍රීඩා කරන්නේ කෙසේද ? ඔබ මෙහි ආවේ මලල ක්‍රීඩා කරමින් මුදල් උපයමින්ද ? මේ වන විට එම භික්ෂුව සිහි විකල් වී ගියේය. කිසි උත්තරයක් කියා ගත නොහැකි විය. එවිට යහළු භික්ෂුව කථා කරමින් ගිහි කාලයේ ඔබ මලල ක්‍රීඩකයෙක් වුවද දැනුත් ඔබ එම ක්‍රීඩාව කරන්නෙහිද ?

''මා ගිහි කාලයේ එසේ කළ නමුත් දැන් කරන්නේ නැත.'' මා මහණ වූ පසු මලල ක්‍රීඩා නැවැත්වූවා.'' යි කීහ.

ආචාර්ය මන් ඔහුගේ මනස විකෘති බව දැන වෙන යමක් කථා කරන්නට විය. දැන් පිණ්ඩපාත යාමට කාලය හරි. පසුව අනිත් භික්ෂුවට මේ පිළිබඳ ඔහුගෙන් දැන ගන්නා ලෙස අණ කළහ. ඔහුගේ භය නිසා තමන් වහන්සේ සමඟ කථා නොකරති.

දානයෙන් පසු නැවතත් එම භික්ෂුවගෙන් අනිත් භික්ෂුව කරුණු විචාලේය. මේ නවක භික්ෂුව ''සුඅන් කුලප්'' බොක්සින් ආයතනයේ ඉතා දක්ෂ ක්‍රීඩකයෙකි. ගිහි ජීවිතය ගැන කළකිරී මහණ විය. ඉන්පසු ආචාර්ය මන් සොයා ඇවිද්දේය. ඉන්පසු එම යහළු භික්ෂුව මෙම ප්‍රවෘත්තිය ආචාර්ය මන්ට සැළකළහ. මෙම කථා ංගය මින් සමාප්තයැයි සිතුවෙමි. නමුත් එය එසේ නොවීය. එදින රාත්‍රී ආචාර්ය මන් සමාධියෙන් මේ භික්ෂුව පරීක්ෂා කළේය. පසුදින ඔහුට මෙසේ කීහ.

''ඔබ ගිහි කාලයේ බොක්සිං සූරයකු පමණක් නොව, යම් දෙයක් ඔබ වසන් කර තිබේ. ඔබ මේ පිළිබඳ හොඳාකාර කල්පනා කර බලන්න. ඔබ ගිහි කාලයේ චර්යාව පමණක් නම් මෙවැනි දේ නැවත නැවත පෙනෙන්නේ ඇයි?

මේ අසා යහළු භික්ෂුව එම භික්ෂුවගේ අසපුවට ගියේය. බොහෝ වේලා

සාකච්ඡා කර ඔහුගේ බෑගයේ බොක්සිං සූරයන්ගේ ඡායාරූප 10ක් ඇති බව දැන ගති. ඒවා දෙස බැලූවිට මේ සියළුම කරදරය මේ ඡායාරූප නිසා යැයි සිතුවේය. මේවා බැහැර කරන්න. නැත්නම් පුළුස්සා දමන්න යැයි කීහ. එම භික්ෂුව ඊට එකඟ විය. පසුව දෙදෙනා එක් වී එම ඡායාරූප පුළුස්සා දැමූහ. ඉන්පසු මේ සියලු ප්‍රශ්න නිරාකරණය විය.

එම ගිහිකල බොක්සිං සූරයා දැන් ඉතාම ශාන්ත දාන්ත භික්ෂුවකි. හැසිරීම, ප්‍රතිපත්ති ගරු ගාම්භීරය. බොහෝ සතුටින් සැනසීමෙන් ආචාර්ය මන් සමඟ විසූහ. ආචාර්ය මන් ඔහුට විශේෂ ආදරයකින් සැළකිලි දැක්වීය. අතීතය අමතක වී ගියේය. කාලයකට පසු තම යහළු භික්ෂූන් උන්වහන්සේට සරදම් කරති. එම සිද්ධිය නිසා ආචාර්ය මන්ගෙන් බැනුම් ඇසූ සැටි මතක් කර සිනාසුනි. ''මම බාගෙට මැරිලා, මගේ සිහි විකල් වෙලා මෝඩයෙක් මෙන් හැසිරුණා'' තමා බේරාගත් මිත්‍ර භික්ෂුවට ස්තූති කරමින් ''ඔබ වහන්සේ නො-ාහිටින්ට මම පිස්සු වැටෙනවා. ඔබ මට දයාව අනුකම්පාව දැක්වූවා. ආචාර්ය මන් ඉතාමත් දක්ෂයි. මම සිහිවිකල් වෙන වේලාවේදී ඉක්මනට වෙන දෙයකට යොමු කර කිසිවක් නොසිඳු විදියට අමතක කළා.'' ආචාර්ය මන් මෙවැනි අද්භූත දේ තම භාවනා සමාධියෙන් දකී. එවිට එම නිමිත්ත ඔස්සේ තම ශිෂ්‍යයින්ට අවවාද අනුශාසනා කරති. උන්වහන්සේට පරචිත්ත විජානනය පමණක් නොව මෙවැනි විශිෂ්ට ඥාන ද තිබුණි.

උන්වහන්සේගේ මුළු ජීවිත කාලයේ ම නොලත් අත්දැකීම් මෙම චියැංමයි වකවානුවේදී දුටහ. සමහරක් උන්වහන්සේගේ සිත තුළ හට ගති. අනිත දේ බාහිර ලෝකයේ සිදුවිය. ඉතාමත් විශ්මය ජනක උත්තේජන සහිත ප්‍රතිවේධ නුවණ වේ. හුදකලා වාසය කරන විට ලැබූ අත්දැකීම අනන්තය. ඒවා මෙහි සඳහන් කළ නොහැකිය. දැනුම හා අවබෝධය නිරන්තරයෙන් උන්වහන්සේට ලැබුණි. භාවනා කාලය තුළත් අවශේෂ දෛනික කාලය තුළත් මේ නුවණ පහළ විය. එය පුදුමාකාරය. අද්භූතය. මෙතෙක් කල් මේ සිත කෙතරම් මෝහයෙන් සිටියේද ? මෙවැනි මහා ප්‍රඥා පහළ වීමට සුදුසු වුවද මෙතෙක් සිටියේ පුදුම මෝහයකිනි. මෙම ශක්ති අනන්ත සසර පැවති අසීමිත බලවේග වේ. මොහා-න්ධකාරයෙන් වැසී තිබුණි.

සිත නිරුද්ධ වූ විට සියලු ක්‍රියාකාරකම් නිරුද්ධ වේ. මෙම සමාධියෙන් සියලු සංසිද්ධි අහෝසි වේ. එබැවින් සිත පවතින්නේ ධර්මතාවය මත පමණි. ධර්මය සහ චිත්තය එකම වේ. චිත්ත යනු ධර්මයයි. ධර්මය යනු චිත්තයයි. ද්විත්ත්වයක් නොවේ. ශරීරයේ හෝ මනසේ පැවැත්මක් නොදැනේ. මෙම ස්වභා-වය දින, මාස, අවුරුදු, කල්ප ගණන් පැවැත්විය හැකිය අනිච්ච දුක්ඛ අනාත්ම වැනි සම්මුති සත්‍යයන් අදාළ නැත. මෙසේ සිත නිරෝධයට ගිය අවස්ථාවේදී

ශරීරය සුණු විසුණු වී ගියත් - එනම් සම්මුතිය අහෝසි වුවත් සිත ඒ පිළිබඳ නොදනී. මෙය ඉතාම බලවත් සමාධි තත්ත්වයකි. මෙය මෙසේ වුවද නිරෝධ සමාපත්තිය තාවකාලික තත්ත්වයකි. එය තද නින්දක් බඳුය. සිහින නැති තද නින්දේ පසුවෙන විට යමෙක් කිසිවක් නොදනී. අවදි වූ විට ශාරීරික මානසික ක්‍රියාකාරිත්වය දැනේ.

එනමුත් සියලු සමාධි තත්ත්ව, නිරෝධ සමාපත්ති වුවද සම්මුති සත්‍යයට අයත් වේ. විමුක්ති සිත හෙවත් අර්හත් මග්ග ඵල, සිත් සම්මුතිය ඉක්මවා යත්. විමුක්ති සිත සමාධි ගත වූ විට සම්මුතියට අදාළ නැත. අති පාරිශුද්ධ එම සිත විශුද්ධි චිත්තය නම්. එමසිත සම්මුති කාල අවකාශයන්ගෙන් විනිර්මුක්තය. එහෙයින් ''අකාලිකො'' වෙති. මෙම විශුද්ධි චිත්තයේ ස්වභාවය සංඥා ස්කන්ධයට හසු නොවේ. එහෙයින් එය විස්තර කිරීමට නොහැකිය. එය නිවන වේ. හේතු ප්‍රත්‍යය නොමැති බැවින් ලෞකික නොවෙති. අනිච්ච, දුක්ඛ, අනාත්ම නොවෙති. එම සමාධියෙන් නැගී සිටි විට සම්මුති ලෝකය අදාළ වේ. (අනිදස්සන විඤ්ඤාණය - නිදර්ශනයක් නැත - සිංහල පරිවර්තක)

ආචාර්ය මන් උපචාර සමාධියෙන් හෝ කාමාවචර සිතකින් හෝ සිටින විට වුවද බොහෝ අද්භූත දේ ග්‍රහණය කරයි. වෙනසක් වන්නේ එහි ගාම්භීරතාවය, විෂය පථය සහ ගුණය පමණි. යම් දෙයක් තීක්ෂණව බලන්ට අවශ්‍ය වූ විට උන්වහන්සේ උපචාර සමාධි ගත වේ. දිබ්බ චක්ඛු දිබ්බ සොත ලබා ගැනීමට උපචාර සමාධි අවශ්‍ය වේ. මේ සමාධියෙන් අන්‍යයන්ගේ සිතුම් පැතුම් ක්‍රියාකාරකම් දැන ගත හැකිය. ප්‍රකෘති ඇසින් දකින්නාක් මෙනි. ප්‍රකෘති කනින් අසන්නාක් මෙනි.

## වෙස් වලාගත් කොටි

කඳුකරයේ ග්‍රෝතික මිනිස්සු ටික දෙනෙක් හැරෙන්න කිසිවෙක් නගරබදට ගොස් නැත. ඔව්හු භික්ෂූන් වහන්සේලා දැක නැත. මෙම කඳුකරයේ ගමෙන් හැතැක්ම 1-2 දුරින් පිහිටි වනාන්තරයේ ආචාර්ය මන් සහ භික්ෂු පිරිස වාසය කරති. ගස් යට කුඩා මැසිවල ලැගුම් ගනිති. අළුයම පිඬු පිණිස ගමට ගිය විට ''ඇයි ආවේ ?'' යැයි අසති. දානය පිණිස පැමිණි බව ආචාර්ය මන් සැළකළහ. ඔවුන් පුදුමයෙන් බලා සිටියහ. එවිට පිණ්ඩපාතය යනු කුමක්දැයි ආචාර්ය මන් කියා දුන්හ. ''ඔබට ඕනෑ උයපු ආහාරයද වියලි ආහාරයදැයි ඇසූහ. ''උයාපු ආහාර යැ''යි කී විට ඉතා ස්වල්ප ප්‍රමාණයක් පාත්‍රවලට දැමූහ. එම භික්ෂූන් දෙනම කුටියට පැමිණ එම බත් වැළඳූහ. ව්‍යංජන කිසිවක් නැත.

මුල සිටම මෙම ග්‍රෝතික මිනිස්සු ශ්‍රද්ධා බුද්ධියක් නැති බැවින් දාන මා-

නාදිය නොදනිති. භික්ෂූන් පිළිබඳ සැක පහළ කරති. එදින සවස ගම්මුලාදෑනියා බම්බු ටකය නාද කර මුළු ගම එක් රැස් කළහ. ආචාර්ය මන් සහ අනිත් භික්ෂුව ගැන කථා කරමින් ''යම්කිසි කොටි වර්ගයක් වෙස් වලාගෙන ඇවිත් කැලෑවේ සිටිති. කුමන ගෝත්‍රය දැයි නොදනිති. එහෙත් විශ්වාස කළ නොහැකියැ'යි කීහ. ''එම කැලයට දර පිණිස හෝ ගැහැණු සහ ළමයි නො යා යුතුයි. පිරිමි ගියොත් නිසි සේ ආයුධ රැගෙන ගිය යුතුයි. එම කොටි දැඩි ප්‍රහාරයක් එල්ල කළ හැකිය.'' යනාදි වශයෙනි.

මෙම කථාව කරන වෙලාවේ ආචාර්ය මන් සමාධියට පත් වී සිටියහ. එබැවින් සියල්ල දනිති. ඇසෙති. දකිති. නමුත් ඒ පිළිබඳ කෝපයට පත් නොවුණි. අසීමිත මෛත්‍රියක්, කරුණාවක්, අනුකම්පාවක් මේ මිනිසුන් කෙරේ හට ගති. උන්වහන්සේ දුක් වූයේ මේ පිරිස මෙවැනි බොරු බයක්, සැකක් නිසා බොහෝ අකුසල් රැස් කර සසර දුක් විඳීම ගැනය. මැරී ගොස් කොටි යෝනියේ උපදී. පසුදා උදෑසන තම ශිෂ්‍යයාට මේ සියල්ල දැන්වූහ.

''ඊයේ සවස ගම්මුලාදෑනියා මුළු ගමම කැඳවා අපි කොටි වර්ගයක්, භික්ෂුන් මෙන් වෙස් වලාගෙන සිටිති. ඒ අය අපගේ අඩවිය අයත් කර ගනිති. අප විනාශ කරති.'' ආදී වශයෙන් කීවා අප මේ ගම හැර ගියොත් මේ මිනිස්සු ඇත්තෙන්ම භයානක පව් සිදු කර ගනිත්. ශ්‍රද්ධාව නැති බැවින් අප කෙරෙහි පව්කාර අදහස් ඇති කරගෙන අකුසල කර්ම සිදු කරති. මේ අයට අනුකම්පා-වෙන් අපි මෙහේම රැඳී සිටිමු. මේ ප්‍රශ්නවලට මුහුණ දෙමු. මේ අයගේ වැරදි දෘෂ්ටිය බිඳෙන තුරු අප මෙහි සිටිය යුතුයි.

ගම්මු උන්වහන්සේලා සැක කළා පමණක් නොව දෙතුන් දෙනා කණ්ඩායම් වශයෙන් නොයෙක් අවි ආයුධ රැගෙන මුර කරති. සමහරවිට උන්වහන්සේලා සක්මන් කරනවා. ඈතින් බලා සිටිති. ආචාර්ය මන් සමීපයට සමහර විට පැමිණෙති. සක්මන් කොන් ළඟ හෝ මැද්දේ බලා සිටිති. ඇසිපිය නොහෙළා පුදුමයෙන් බලා සිටිති. විනාඩි 10-15 සක්මන් මැද සිට වට පිට බලමින් පරීක්ෂා කරති. මෙම මුර කිරීම, දැඩි පරීක්ෂාව දිනපතා සති ගණනක් කරති.

මෙම භික්ෂූන් වහන්සේලාගේ සැපදුක් ගැන ගම්මු කිසි හැඟීමක් නැත. කෑම බීම ලැබෙනවාදැයි කිසි සළකිල්ලක් නැත. ජීවත් වන්නේ කෙසේදැයි නොසිතති. මෙසේ ජීවත්වීම ඉතාම දුෂ්කර විය. තම්බපු බත් පමණක් ලැබේ. ඒ වුවද සමහර විට නොලැබේ. ලැබුණ ප්‍රමාණය නොසෑහේ. වැඩිපුර ජලය බී සැනසේ.

ගල්ගුහා හෝ ගිරි හෙල් ආදි කිසි ආවරනයක් නැති බැවින් ගස් යට රෑ දවල් ගත කිරීමට සිදුවිය. වැසි කාලය ඉතා දුෂ්කරය. මුළු දවස ධාරානිපාත

වැසි කඩා හැලේ. වැස්ස නැවතී ටිකක් වියලී ගිය විට වහලකට සුදුසු තණකොළ වියලි කොළ සොයමින් ගොස් යන්තම් නොතෙමී සිටින්නට පියස්සක් තනා ගත්හ. අවම වශයෙන් දවස ගත කිරීමට පමණක් එය සෑහේ. තද වර්ෂාව මැඩ පැවැත්වීමට රෙදි වලින් මැසූ වට ආවරණයක් ඇත. එහි තුළ එක් කෙනෙකුට පමණක් හිඳිය හැකිය. එය කූඩාරමක් වැනි කූඩයට සවිකර තිබේ. මෙයින් යම්කිසි ආවරණයක් ලැබේ. නිතරම කඳු මුදුන්වලින් එන සුළඟ චණ්ඩ මාරුතයකි. කූඩාරම කැඩී ඉගිලී යයි. සිවුරු පිරිකර තෙත් බරි වේ. දවල් කාලයේ නම් යම් පිළියමක් සෙවීමට හැකිය. එහෙත් රාත්‍රී කාලය නම් කිය නොහැකි තරම් විනාශයකි. පුදුම අසහනයකි.

ශීත සැඩ සුළං ගස් අතු ගති ගෙන යති. බියංකර ශබ්දය සිත කම්පා කරයි. කොයි මොහොතේ මරණයට පත්වේදැයි නොදනී. වැස්ස, සුළඟ, ශීතල, රාත්‍රිය ඝන අඳුර ඇත. කැඩී බිඳී යන සුන්බුන් කැඹලි ඒ මේ අත හමා යයි. කුසගින්න, පිපාසයද බලවත්ය. උෂ්ණ කාලයද එතරම් දුෂ්කරය. මේ සියල්ල ඉවසුවේ ගමේ මිනිසුන්ගේ සැක බිය දුරු කිරීමටය. බොන වතුර කේතලය පුරවා ගැනීම බොහෝ ඈත කඳු පාමුලට යා යුතුය. මේ සියලු දුක් මධ්‍යයේ ගමේ මිනිස්සු කිසිම සැළකිල්ලක් නොදක්වති.

ආචාර්ය මන්ගේ භාවනා බලය හා අවබෝධය නිසා කිසිම සැලීමක් හෝ කළකිරීමක් නැත. වන මෘගයන්ගේ කෑ ගැසීම උන්වහන්ස් සතුට එළවයි. කුල්මත් කරයි. රෑ කාලයේ ගස් යට භාවනා කරන විට ළඟ පාත කොටි ගොරවන ශබ්දය ඇසේ. මේ විශාල සත්තු පුදුමයකට මෙන් ආචාර්ය මන් සමීපයට නොපැමිණෙත්. කලාතුරකින් කොටියෙක් අවුත් කූඩාරම තුළට හොම්බ දමා ඉව කර ගොදුරු සොයති. උන්වහන්සේ යන්තම් සෙලවුන විගස ඔහු කඩාගෙන පැන දුවයි. නැවත පැමිණෙන්නේ නැත.

සෑමදාම සවස මිනිස්සු තුන් දෙනෙක් අවුත් විපරම් කරති. උන්වහන්සේ දෙස බලා පහත් හඬින් යම් යම් දේ කියති. ආචාර්යය මන් කිසි වගක් නැත. ඔවුන්ගේ සිත් දකී. ඒ බව ඔවුන් නොදනිත්. ඔවුන් කථා කරන දේ ඇසේ. දිබ්බ චක්ඛු, දිබ්බ සොතයෙනි. යමෙක් ඒ අයගේ කථා බහ දනී යන්න නොදන්නා හෙයින් කිසි අවහිරයක් නැතිව කථා කරත්. ඒ අය යම්කිසි වැරැද්දක් සොයති. ආචාර්ය මන් ප්‍රතික්‍රියා කරන්නේ ඔවුන්ට අසීමිත කරුණාවකිනි. ගමේ වැඩි සංඛ්‍යාවක් ටික දෙනෙකුගේ දූෂිත පාලනයට ලක් වී ඇති බව උන්වහන්සේ දැන ගත්හ. මෙම අඩවියේ ආචාර්ය මන් මාස කීපයක් විසූහ. තවමත් මෙම මිනිස්සු උන්වහන්සේගේ සුළු ප්‍රමාද දෝෂයක් හෝ සොයමින් සිටිති. ඔවුන්ට අවශ්‍ය වූයේ තමන් ගත් වැරදි නිගමනය කසේ හෝ හරි නිගයමනක් ලෙස ඔප්පු කිරීමටය. එහෙත් උන්වහන්සේ පළවා හැරීමට තැත් නොකළහ. වරින්

වර ඔත්තු සෙවීමේ යෙදෙති. මාස ගණනාවක් ඔවුන් වෙහෙසට පත් වුවද එකම වැරැද්දක් නොදකිති.

එක් සන්ධ්‍යාවක උන්වහන්සේ සමාධි සුවයෙන් සිටින විට ගම්මු එක්රැස් වී තමන් වහන්සේ ගැන සාකච්ඡා පවත්වන බව දැනුණි. ගම්මුලාදෑනියා අනිකුත් අයගෙන් තමන්ගේ ඔත්තු පරීක්ෂණවල ප්‍රතිඵල ඇසූහ. මේ භික්ෂූන් වහන්සේලා දෙනම ගැන කිසිම දෝෂයක් සොයා ගැනීමට බැරි බව ඔවුන් එක හෙළා දැන්වූහ. ඔවුන්ගේ සැකය නිසා බොහෝ නරක විපාක ඇතැයි කීවාහ.

''ඔබ එසේ කියන්නේ ඇයි ?''

''ඇයි යන හැමවිටම දකින්නට ලැබෙන්නේ උන්වහන්සේලා ඇස් පියාගෙන ඉඳගෙන ඉන්නවා නොසෙල් වීගස් ගල් වගේ නැත්නම් ඇවිදිනවා ඉදිරියට - ආපසු උඩ බිම වට පිට බලන්නේ නැහැ. මේ අය කොටි වර්ගයක් නම් වටපිට බලමින් කුරුමානම් අල්ලති. එවැන්නක් නැත. මෙතෙක් කල් ඒ අයගේ හැසිරීම්, වරදට හසු කළ නොහැකිය. එසේ වරදක් වූයේ නම් අපට හසුවෙති. අපි මෙවැනි අපරාධ හොඳ අයට කිරීමෙන් මහා විපත්තියකට පත්විය හැක. දැන් කරන්නට ඇත්තේ මේ අය සමඟ කථාකර අරමුණ පැහැදිලි කර ගැනීමයි.

හොඳ භික්ෂූන්ට වහන්සේලා සොයා ගන්ට බැහැ. හොඳ නරක දෙගොල්ලෝම ඉන්නවා. මේ භික්ෂූන් වහන්සේලාට අපි ගෞරව දැක්විය යුතුයි. මේ භික්ෂූන් ව්‍යාජ, වංක, ද්‍රෝහී පුද්ගලයන් ලෙස චෝදනා කළ යුතු නැත. මෙය විසඳීමට අපි ගිහින් ප්‍රශ්න කරමු. ඇයි ඔබ ඇස් පියාගෙන ඉන්නේ ? ඇයි ඔබ ඉස්සරහට ඇවිදින්නේ ආපසු හැරී ඇවිදිනේනේ ? මොනවද සොයන්නේ?

මේ රැස්වීමේදී ඔව්හු යම් නියෝජිතයෙක් යවා ප්‍රශ්න කිරීමට තීරණය ගති. පසුදා උදෑසන ආචාර්ය මන් අනිත් භික්ෂුව අමතා ''ගමේ මිනිස්සුන්ගේ ලොකු පරිවර්තනයක් වී ඇත. ඊයේ රාත්‍රියේ රැස්වීමක් පැවැත්වූවා අප දෙදෙනා පිළිබඳ. අද උදේ යම් නියෝජිතයන් එනවා අපගෙන් විමසීමට ඒ අයගේ සැක බිය දුරු කිරීම පිණිස''

ඒ අනුවම එදින සවස ගමේ නියෝජිතයා පැමිණියේය. ''ඔබ මොනවාද සොයන්නේ ඇස් පියාගෙන ? ඒ මේ අත ඇවිදිමින් ?''

ආචාර්ය මන් පිළිතුරු දෙමින් ''මගේ බුදෙධා නැතිවෙලා මම බුදෙධා සොයමින් රෑ දවල් ඇස් පියාගෙන ඒ මේ අත ඇවිදිමින් සොයනවා.''

''බුද්ධා යනු කුමක්ද ? එය සොයා ගැනීමට අපට හැකිවේද ?''

බුද්ධා යනු තුන් ලෝකයේ ඉතාම වටිනා මැණික. ඒ මැණික තුළින් මුළු තුන් ලෝකයම දකිනවා. ඔබට පුළුවන් නම් එය සොයා දෙන්ට බොහොම හොඳයි. එවිට අපි සියලු දෙනාටම ඉක්මණින් පහසුවෙන් බුද්ධා සොයා ගත හැකි.

''ඔබේ බුද්ධා නැතිවෙලා බොහෝ කල්ද ?''

නෑ එතරම් කාලයක් නැහැ. ඔබ උදව් කරනවා නම් අපට ඉක්මණින් සොයා ගත හැකි.

බුද්ධා ලොකු දෙයක්ද ?

ලොකුත් නැහැ පොඩිත් නැහැ. නියම ප්‍රමාණය අපට සෑහෙන. බු-ද්ධා සොයාගත් කෙනෙක් උතුම් පුද්ගලයෙක් වෙනවා. ඔහුට ඕනෑම දෙයක් පේනවා.

දේව ලෝකයයි අපායයි දකින්ට පුළුවන්ද ?

ඇත්තෙන්ම ඔව් පුළුවනි නැත්නම් උතුම් පුද්ගලයෙක් වෙනවාද ? අපේ මළගිය දරුවන් දකින්ට පුළුවන්ද ? අපේ මළගිය බිරිඳ දකින්ට පුළුවනිද ?

ඔබට ඕනැ දෙයක් දකින්ට පුළුවන් බුද්ධා ලබා ගත්තොත්. එය බොහෝ ආලෝකමත්ද ?

ඉරු සියක් දාහකටත් වඩා ආලෝකමත්. ඉරට බැහැ දේව ලෝක අපාය ලෝකවලට ආලෝකය දෙන්ට. නමුත් බුද්ධාට පුළුවනි හැම තැනම ආලෝකය යවන්ට.

අපේ ගැහැණු අයට හා දරුවන්ට පුළුවන්ද මෙය සොයන්ට ?

හැමෝටම පුළුවනි. ගැහුණු මිනිස්සු බාල මහලු සැමට පුළුවනි මෙය සොයන්ට උදව් දෙන්ට.

මේ උතුම් බුද්ධාට පුළුවන්ද අප අවතාර හොල්මන් වලින් ආරක්ෂා කරන්ට ?

බුද්ධාට පුළුවන් දේ අනන්තයි. තුන් ලෝකයටම අග්‍රයි, ශ්‍රේෂ්ටයි. කාම ලෝක, රූප ලෝක, අරූප ලෝක මේ තුන් ලෝකයේ සත්ත්වයෝ බුද්ධා වඳිනවා. පුදනවා. ගෞරව කරනවා. වෙන කිසිම කෙනෙක් බුද්ධා තරම් උසස් නැහැ. හොල්මන් අවතාර බොහෝම භයයි. බුද්ධාට නැමිල දිගාවෙලා වඳිනවා.

හොල්මන් අවතාර බයයි බුදෙධාව සොයන අයට පවා. සොයා ගන්ට බැරි වුණත්, සොයන අයට පවා බයයි. මේ බුද්ධ රත්නය මොන පාටද ?

එය නොයෙක් පාටින් දිස්නෙ ගහනවා. බුදෙධා යනු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශක්තියක්. දිලිසෙන ප්‍රඥා ස්කන්ධයක් එය ද්‍රව්‍යමය දෙයක් නොවේ. සම්මා සම්බුදුරජාණන් වහන්සේ අපට පරිත්‍යාග කළ වටිනා මැණිකක් දැන් බොහෝ කාලයක් ගතවුනා දැන් නැති වෙලා ඉතින් අපි සොයනවා. කොහේ සිට වුණත් සොයන්ට පුළුවනි. අවශ්‍ය වන්නේ හිඳිමින හෝ ඇවිදිමින් සිතන්න. ''බුදෙධා, බුදෙධා, බුදෙධා'' තම සිතෙන් සිතන්න. තම ශරීරය දෙස සිතින් බලමින් වෙන මොන දෙයක්වත් සිතන්නේ නැතිව බුදෙධා බුදෙධා බුදෙධා සිතන්න. මේ වචන ගැන පමණක් සිතන්න. ඔබට මෙය කරන්ට පුළුවනි නම් මට වඩා ඉස්සෙල්ලා වුවත් සොයන්ට හැකිවේවි.

කෙතරම් කාලයක් හිඳිමින් ඇවිදිමින සොයන්ට ඕනෑද ? පටන් ගන්න විට විනාඩි 10-15 පමණ වරකට ඇති. බුදෙධා බොහෝ වේලා සොයන්ට කියන්නේ නැහැ. මුලින් පටන් ගන්න විට, ඔබ වෙහෙසට පත් වී සෙවීම අත හරින නිසා. උද්‍යෝගය නිතවුනොත් සෙවීම අතපසු කරනවා. එවිට කවරදාවත් සොයන්නට බැහැ. මේ කාලය ඇති, මුල් අවස්ථාවේදී තව කීවොත් ඔබට තේරුම් ගන්ට බැහැ. එවිට ''බුදෙධා'' හමුවෙන්නෙ නැහැ.

මේ සියල්ල අසා සිතේ දරාගෙන ගැමියා යන්ට ගියේය. ආචාර්ය මන් කෙරෙහි කිසි ගෞරවයක් දැක්වූයේ නැත. ඒ ශ්‍රෝතිකයන්ගේ පුරුද්දයි. දැන් යන්ට හොඳ කාලයයි සිතුන විට නැගිට යයි. අවසර ගැනීමක් නැත. සමුග ැනීමක් නැත. ඔහු ගමට ගිය විගස බොහෝ ගැමි ජනයා දුව ඇවිත් විස්තර ඇසූහ. ''ආචාර්ය මන් නිශ්චලව සිටිමින් ඇස් පියාගෙන ඉන්නේ, එහේ මෙහේ සක්මන් කරන්නේ බුදෙධා නම් වටිනා මැණික සොයා ගැනීමට. උන්වහන්සේ අපි සිතූ අන්දමට වෙස් වලාගත් කොටියෙක් නොවේ.'' ඔහු උන්වහන්සේ කළ සියලු විස්තර කියා දුන්හ. ගැමියෝ මුලාදෑනියාගේ සිට කුඩා දරුවන් පවා ''බුදෙධා'' සොයන්ට පටන් ගත්හ. එනම් ඇසි පියා ගෙන ''බුදෙධා, බුදෙධා'' යන වචනය භාවනා කිරීමයි.

කීප දිනකට පසු මහත් ආශ්චර්යමත් සිද්ධියක් සිදුවිය. එක් ගැමියෙකුගේ මනසේ ධර්මය අවබෝධ විය. ආචාර්ය මන් කී පරිදි ඔහු රෑ දවල් නිරන්තරයෙන් ''බුදෙධා'' භාවනා කළහ. එවිට ඔහුගේ සිත සමාධිගත විය. ඔහුගේ සතුට, ප්‍රීතිය, සුඛ එකඟතාවය නිම්හිම් නැත. ඉන් ටික දිනකට ප්‍රථම ඔහු සිහිනයක් දුටුවේය. ආචාර්ය මන් ඔහුගේ හිස් මුදුනේ දැල්වෙන විශාල ඉටි පන්දමක් තැබුවේය. එය නිසා තම ගත, සිත ආලෝකමත් විය. අවට පරිසරය ආලෝකමත් විය.

ඔහු ආචාර්ය මන් වෙත ගොස් තමා දුටු අද්භූත සිහිනය ගැන තම සිතේ ඇති ප්‍රීති සුඛ එකඟතාව පිළිබඳ කීහ. ආචාර්ය මන් ඔහුට ධ්‍යාන කිරීමට තව තවත් උපදෙස් දුනි. ඔහුගේ දියුණුව ඉතා ඉක්මණින් වැඩී ගියේය. ඔහුට පරචිත්ත විජානනය පහළ විය. ඔහු එය තම ගැමි භාෂාවෙන් කියා සිටියහ. තමා ලැබූ තත්ත්වය ගැන පැහැදිලි නැත.

ටික දිනකට පසු ඔහු ආචාර්ය මන්ගේ සිත දුටුවේය. විහිළුවට මෙන් ආචාර්ය මන් ''ඔබ එහි අකුසල් දක්කාදැ''යි ඇසීය. ''ඔබ වහන්සේගේ සිත කිසි අරමුණක් නොගනී. එහි ඇත්තේ දීප්තිමත් ආලෝකයක් පමණි. ඔබ වහන්සේ වැනි කෙනෙක් මෙලොව ඇත්තේ නැත. ඔබ වහන්සේ මෙහි අවුරුද්දක් පමණ රැඳී සිටියහ. ඇයි මට මේ ස්වභාවය මුලින් නොකීවේ ?'' මම කෙසේ කියම්ද ? ඔබ මගෙන් කිසිම ප්‍රශ්නයක් ඇසුවේ නැත. උන්වහන්සේ පිළිතුරු දුණි.

ඔබ වහන්සේ අග්‍රගණ්‍යයේ ආචාර්යවරයෙක් බව මම දැන නොසිටියෙමි. දැන් අප සියලු දෙනාම දන්නවා ඔබ වහන්සේ ඉතාම දක්ෂ බව. අප ඔබ වහන්-සේගෙන් ඇසූ විට ඇයි මෙසේ ඇස් පියාගෙන ඉන්නේ ? ඇයි මෙසේ සක්මන් කරන්නේ ?'' ඔබ වහන්සේ කීවා වටිනා මැණිකක් නැතිවෙලා එය සොයනවා. ඒ ''බුදෙධා'' නම් මැණික සොයා ගන්න උදව් කරන්න කියා. එය ඉතාම දීප්තිමත් විහිදී යන ආලෝකයක් කීවා. ඇත්තෙන්ම එය තමයි ඔබ වහන්සේගේ සිතේ ඇත්තේ, ''බුදෙධා'' නැති වුනා කිවේ අපව ප්‍රයෝගයෙන් භාවනා කරවීමට යොමු කිරීමට එවිට අපේ සිතත් එසේ ආලෝක විහිදුවන්න. ඔබ වහන්සේ මහා වීරයෙක්. නුවණැත්තෙක්. ඔබ වහන්සේගේ එකම අරමුණ අපට ධර්මය බෙදා දීම. අපේ සිතේ ''බුදෙධා'' පහළ කිරීම.

මෙම මිනිසාගේ සිත තුළ ධර්මය පහළවීම පිළිබඳ පුවත ඉක්මණින් මුළු ගම පුරාම පැතිරී ගියේය. සියලු දෙනාම ''බුදෙධා'' භාවනාව කළහ. කුඩා දැරු දැරියන් පවා කළහ. ආචාර්ය මන් කෙරෙහි ශ්‍රද්ධාව ඉමහත් විය. උන්වහන්සේගෙ ඉගැන්වීම් ගැන ගෞරව කළහ. කිසිවෙක් වෙස්වළා ගත් කොටි ගැන නැවත කථා නොකළහ. මින් පසු එම මිනිසා ආචාර්ය මන්ගේ පාත්‍රය පිණ්ඩ පාතයෙන් පසු දිනපතා එම ආරණ්‍ය සේනාසනයට රැගෙන ගියේය. දානයෙන් පසු ඔහු භාවනා කමටහන් ගත්තේය. යම් දිනෙක ඔහුට වැඩ ඇත්නම් තමන්ට එන්ට බැරි බව කියා පණිවිඩයක් වයි. එම ග්‍රෝතික මිනිසුන් අතරෙන් සෑහෙන දෙනෙක් භාවනාවට පුරුදු වුණි. එහෙත් ඒ ප්‍රථම පුද්ගලයා මෙන් සාර්ථක නොවීය.

මිනිසා තෘප්තිමත් වූ විට සියලු දෙයක්ම නිසි ආකාරයෙන් සිදුවේ. විශාල පර්වතයක් වේ. උදාහරණ මුල් කාලයේදී මේ මිනිස්සු ආචාර්ය මන් හට කිසි සැළකිල්ලක් නොදැක්වූහ. උන්වහනසේ කෑවද ? නිදා ගත්තාද ? හුන්නාද ? මළා දැයි වගක් නැත. දන් ශ්‍රද්දාව ඇති වී මුලදී ඉතා දුර්ලභ සියලු දේ දැන් වැඩි

වැඩියෙන් ගලා එයි. කිසිවක් නොඅසාම උදව් උපකාර කරත්. ගමේ මිනිස්සු එකතු වී සක්මන් මළුවක් තැනූහ. පැලක් ඉදි කළහ. ආහාර වැළඳීමට මැස්සක් සෑදූහ. උදව් කිරීමට ආ අය වාද කළහ. අවමන් කළහ. ප්‍රශ්න කළහ. කථා බහ කළහ.

''අර සක්මන් මළුව බලන්න. තණකොළ වල් පැළෑටි වලින් වැසී ඇත. එම කැලෑවේ ඇවිදින්නේ වල් ඌරෙක් විය යුතුයි ඔබ එනමුත් එහිම ඇවිදියි. ඔය මළුව කුමකටදැයි ඇසූවිට නැති වූ ''බුදොධා'' සෙවීමට යැයි පවසති. ඔබ ඇස් පියාගෙන ඉන්නේ ඇයිදැයි ඇසූවිට - නැති වූ බුදෙධා සොයමි''යි කියයි. ඔබ වහන්සේ ශ්‍රේෂ්ට ආචාර්යවරයෙකි. එහෙත් ඒ බව නොකියන්නේ ඇයි ? ඔබ අමුතු පුද්ගලයෙක්. ඒ වුණත් ඒ ගතිගුණ අපි අගේ කරනවා. ඔබ වහන්සේ නිදා ගන්නේ පුස්කාපු වියළි කොළ රොඩු වලින් සෑදු මැස්සක ඔබ වහන්සේ මෙහි මාස දහයක් පමණ මෙසේ දුක් විඳින්නේ ඇයි ? මෙය ඌරු කොටුවක් වගේ. මෙය දකින විට අපට ඉතා දුක් ඇති වී අඬන්න හිතෙනවා. අපි මහා මෝඩයෝ රැලක්. අපි සියලු දෙනාම මෝඩ වුණා. ඔබ වහන්සේ මේ තරම් වටිනා පුද්ගලයෙක් බව අපි දන්නේ නැහැ. සමහරු චෝදනා කළා නොයෙක් වැරදි මත අනුව. සියලු දෙනාම ඒ නිසා පොළඹවා ගත්තා. අපි සැක කළා. අප්‍රිය කළා. නමුත් දැන් අපිට හොඳට විශ්වාසයි. අපි ගරු කරනවා. මේ කඳුකර ග්‍රෝත්‍රික මිනිස්සු යමෙක් විශ්වාස කරන විට එය උපරිම වශයෙන් කරයි. හදවතින්ම භක්තිය පුද කරයි. ඒ අයගේ හිතවත්කම් අසීමිතය. තම ජීවිතය පරදුවට තබා පරිත්‍යාග කරත්. තමන් හදවතේ දරාගත් දේ වෙනස් නොකරත්. ටිකින් ටික ආචාර්ය මන් ඔවුන්ගේ භාවනාව දියුණු කිරීමට උපදෙස් දුණි.

උන්වහන්සේ මෙහි වර්ෂයකට අධික කාලයක් විසූහ. පෙබරවාරියේ සිට ඊළඟ අවුරුද්දේ අප්‍රේල් දක්වා. ඉනපසු වෙනත් තැනකට වැඩියහ. ඔවුන්හට තිබූ බලවත් කරුණාව නිසා ඔවුන් හැර යාම දුෂ්කර විය. ඔව්හු උන්වහන්සේගේ යාම පිළිබඳ විරෝධය පළ කළහ. උන්වහන්සේ මරණය තෙක් සිටිනවා නම් මුළු ගමම එකතු වී අවමංගල උත්සවය කරන බව කීහ. ඒ අය තුළ අවබෝධයෙන් මම ප්‍රතිඵල ගැන විශ්වාස ඇත. ඊනිසා හටගත් ශ්‍රද්ධාව, භක්තිය වැරදි ලෙස දුටහ. උන්වහන්සේගේ ගුණ හඳුනා ගත් පසු ඇත්තෙන්ම පසුතැවිලි වී සමාව අයැද සිටියහ. උන්වහන්සේ ඔවුන්ට සමාව දුනි. මේ බව පසු කාලයකදී තම ශිෂ්‍යයන්ට උන්වහන්සේ සැළකළහ. ඊනිසා ඔවුන් ණයගැති නොවේ. තමන් වහන්සේලා දෙනමට දැන් නිකම් යා හැකිය.

නමුත් ඔවුන්ගෙන් වෙන් වී යාම ලෙහෙසි වූයේ නැත. ඔවුන්ගේ කන්නලව්, ලතෝනි දෙමින් හඬා වැලපීම බලා සිටින්ට බැරි තරම් විය. උන්වහන්සේගේ ගමන වැළැක්වීමට මුළු ගමම අවුත් මහ හඬින් විලාප දුනි. එය කැළෑව දෙදරා

ගියේය. මැරුණා හා සමානව හැඬූහ. තමන් වහන්සේගේ අරමුණ පැහැදිළි කරමින් ඔවුන් අස්වැසූ නමුත් ඉන් ඵලක් වූයේ නැත. තම හැඟීම් හෙළි කිරීම වැරදි බව ධර්මයට අනුව පෙන්වා දුනි. මඟ අවුරා සිටියහ.

තරමක් සන්සුන් වූ විට උන්වහන්සේ පිටත් වීමට සූදානම් විය. එවිට පුදුම එළවන දෙයක් සිදුවුණි. මුළු ගමේ මිනිස්සු ගෑනු දරු දැරියෝ උන්වහන්සේ පසුපස දුව ආහ. වටකරගෙන එකෙක් උන්වහන්සේගේ පිරිකර උදුරා ගති. එකෙක් පාත්‍රය ගති. එකෙක් කුඩය, වතුර කේතලය ආදී වශයෙනි. අනිත් අය සිවුරේ එල්ලී ඇඳගෙන සිටියහ. අතින්ද ඇද්දහ. කකුළෙන් ද අල්ලා ගති. හඬමින් වැලපෙමින් කුඩා දරුවන් මෙන් හැසිරුණාහ. යන්ට දෙන්නේ නැතැයි කීහ.

කීප විටක් ආචාර්ය මන් ඉවසීමෙන් කරුණු පැහැදිලි කළහ. එවිට ඔව්හු මඳක් සන්සුන් වූහ. උන්වහන්සේ යන්ට නික්මුණ විට නැවතත් ඒ ආකාරයෙන්ම දුව ඇවිත් අල්ලා ගත්හ. මෙසේ පැය ගණනක් ගත විය. මුළු කැලයම ශබ්දය දෝංකාර දුනි. මානසික ආබාධිතයන් මෙන්ද කෝල සන්නියක් මෙන්ද ඔවුන්ගේ වැළපීම බලා සිටින්නට මහත් දුකකි. වෙස් වලාගත් කොටි ගැන මතකයක්වත් නැත. ඇත්තේ හද පත්ලෙන් පැන නගින ආදර භක්තියකි. අති උත්තම පුරුෂයෙකුට කරණ පූජා උපහාරයකි. මහ මිනිස්සු හඬා වැළපුනහ. ක්‍රමයෙන් හඬ වැඩී ගොස් මහා ශබ්දයකින් සියල්ල එකවිට කෑ ගසා ''යන්ට එපා'' යයි කීහ. ''අපේ පපුව පැළී මැරේවී'' ''ඉවසන්ට බැහැ'' අන්තිමේදී එහෙනම් ඉක්මණින් ගිහින් එන්ට යැයි කීහ.

මෙසේ ආචාර්ය මන් නැවතත් කරුණු පැහැදිලි කර දුන්හ. බොහෝ සැක බිය ඇතිව සිටි අය දැන් ආදර භක්තියෙන් හඬා වැලපෙති. උන්වහන්සේ මහත් විපර්‍යාසයක් සිදු කර ඇත. එය බුද්ධ ශ්‍රාවකයන්ග් සුවච ගුණය වේ. සාමීචි ගුණය වේ. බුද්ධ ශ්‍රාවකයෝ පළිගැනීම් නොකරති. අනුන්ට නො ගරහති. යමෙක් තමන් කෙරෙහි අප්‍රසන්නතාවය ඇතොත් ඔහුට කරුණාව, මෛත්‍රිය උපදවති. අනුන්ගේ වැරදි, නොමනා හැසිරීම් නිසා උරණ නොවෙති. එකට එක කිරීමක් නැත. තම හදවතේ ඇති කරුණා, මෛත්‍රි ගුණය නිසා අනුන්ගේ කෙළෙස් ගිනි නිවී ශ්‍රද්ධාව හට ගනී. ආර්ය සංඝ රත්නය මිනිසාගේ සරණ වෙති. මෙවැනි උසස් චින්තනයක් මෙලොව කොහේවත් නැත.

පසු කාලයකදී ආචාර්ය මන් මෙම කථා පුවත අප සමඟ කී විට එම කඳුකයේ ග්‍රෝතික මිනිසුන් ගැන අනුකම්පා ඇතිවිය. මහා කැළෑවේ සිදු වූ මෙම සිද්ධීන් අප මනසෙහි දර්ශනය වූයේ සිනමාවක් මෙනි. ගැමියන්ගේ ශ්‍රද්ධාව නිසා තම ජීවිත පරිත්‍යාග කිරීමට සැරසුණි. මෙම මහානුභාව ඇති පුද්ගලයා කෙරෙහි අසීමිත භක්තියක් ඇත. ඒ අයට උවමනා වූයේ උන්වහන්සේගේ කරුණා, මෛත්‍රී

සෙවනෙහි ජීවත් වීමටය. එවිට ඔවුන්ගේ ජීවිතය සතුට සන්තෝෂයෙන් තෘප්තිමත් වේ. එබැවින් අතින් හෝ කකුළෙන් හෝ අල්ලා නවත්වා ගන්ට සිතූහ. උන්වහන්සේ ළඟ කිසිවක් නැත. ඇත්තේ තණ කොළවලින් සෙවන කළ කුඩා පැල්පතකි. එය උන්වහන්සේට අසීමිත තෘප්තියක් ගෙන දුනි. සිතන්ට පවා නොහැකි තත්ත්වයක් උදා විය. අනිත්‍යතාවයේ ලක්‍ෂණ අනුව සුදුසු කාලය එළඹුන විට උන්වහන්සේ නික්ම ගියේය. උන්වහනසේ තුළ ඔවුන් කෙරෙහි අසීමිත දයාවක් තිබුණි.

උන්වහන්සේ වෙස් වළාගත් කොටියෙක් නොව, ලෝකයාගේ පිං කෙතකි. තව බොහෝ අය උන්වහන්සේගේ ආභාෂය ලබා ගැනීමට ඇත. එබැවින් පිට වී ගියහ.

බුදු දහම යනු අමිල, අගනා මැණකකි. එය ලබා ගැනීමට අප බොහෝ පිං කර ඇත. කෙතරම් උසස් මෙවැනි කෙනෙකුට වුවද ''වෙස් වලාගත් කොටි'' යන අද්භූත චෝදනා ලැබිය හැකිය. බෞද්ධ සංකල්ප ගැන ගුණ නුවණ නැති අය මෙවැනි අගනා මැණිකක් වුවද කෙළෙසති. මෙවැනි අවාසනාවන්ත අය ලෝකයේ සිටිති. එබැවින් ඒ අයට පිළිසරණක් විය යුතුය. නැතහොත් බුදු දහම ඔවුන් විසින් විනාශ කර දමති. එවිට මිනසා පසුතැවිල්ලට පත්වේ.

ආචාර්ය මන් සුගත ගුණය අනුගමනය කළහ. උන්වහන්සේ ඝන කැළෑවල වාසය කරමින් කඳුකරයේ ග්‍රෝත්‍රිකයන්ට සේවය කළහ. රාත්‍රී කාලයේ බොහෝ දෙවි බඹුන්, අමනුෂ්‍ය, ප්‍රේත, නාග, ගරුඬාදී පිරිස් වලට කරුණාවෙන් ධර්මය පහදා දුනි. නිතරම කරුණාවෙන් ලෝකාර්ථ සේවයේ යෙදුනහ. මිනිසුන්ට, භික්‍ෂු-න්ට, සාමණේර සාමණේරී මෙහෙනින් වහන්සේලාට කිසි අවශේෂයක් නොමැතිව පිහිට වූහ. දස දිගින් පිරිස පැමිණ උන්වහන්සේගෙන් ධර්මය ඉගෙන ගත්හ. එම ධර්ම දේශනා ඉතා සරළය. ගැඹුරුය. පහසුවෙන් අවබෝධ වන අයුරු පුදුම එළවයි. චියාං මායි හි වනගත වූ කාලයේදී කඳුකරයේ ග්‍රෝත්‍රිකයන් බෙහෙවින් සතුටට පත්වුනහ. සවස් යාමයේ රෑ මැදියම් රෑ වන තුරුත් අමනුෂ්‍ය කොටස් වලට දෙවියන්ට ධර්මය දේශනා කරති. බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු දෙති. දෙවියන්ට ඉගැන්වීම අපහසු වන්නේ එවැනි අධිමානුෂික ශක්තීන් නොමැති අයට එසේ කල නොහැකි බැවිනි. උන්වහන්සේ හැර අන් කිසිවෙකුට එම කාර්යය සිදු කළ නොහැකි විය. මනුෂ්‍යයන්ට දම් දෙසීමට අනිකුත් භික්‍ෂූන්ට පැවරිය හැකිය. යම් තරමකින් හෝ ඒ අසා සිටි අය ධර්මයට නැඹුරු වෙති. ආචාර්‍ය්‍ය මන් දෙවියන් සමඟ මේ සාකච්ඡා පිළිබඳ වෙසෙසින් උනන්දු විය. එබැවින් උන්වහන්සේගේ ජීවන චරිතය වරින් විට දෙවියන්, අමනුෂ්‍යයන් සමඟ සිදු වූ අපූර්ව ප්‍රාතිහාර්‍ය්‍ය දැක්වේ.

මෑතකදී මම තායිලන්තයේ සුප්‍රසිද්ධ විපස්සනා කර්මස්ථාන ආචාර්ය

වරයෙක් හමු වීමට ගියෙමි. උන්වහන්සේ ඉතාම සුහද ඉවසිලිවන්ත කෙනෙකි. ඒ වෙලාවේ තම ශිෂ්‍යයන්ට ධර්ම කරුණු විස්තර කරමින් සිටියහ. මම ද ඒ හා එක්වීමි. අපි ධර්මයේ ප්‍රායෝගික පුහුණුව පිළිබඳ සාකච්ඡා කළෙමු. පසුව උන්වහන්සේ ද ආචාර්යන් වූ ආචාර්ය මන් පිළිබඳ කථා කළෙමු. උන්වහන්සේ ආචාර්ය මන් සමඟ චියාං මායි හි කැලෑවේ බොහෝ කල් විසූහ. ළඟම නගරයට යාමට දින 2 1/2 පමණ ගතවේ. උන්වහන්සේ එදින මා සමඟ පැවසූ විස්මිත කතා පුවත් අපමණය. ඉන් සමහරක් මෙම පොතට අඩංගු කිරීමට සුදුසුයැයි සිතමි. මා ඉහත සඳහන් කළ පරිදි සමහර පුවත් උන්වහන්සේට අවමන් කිරීමක් විය හැකි බැවින් නුසුදුසු වේ යයි සිතමි.

මෙම ආචාර්යවරයා පැවසූ පරිදි ආචාර්ය මන් ඉතාම පිරිසිදු මනසක් ඇති කෙනෙකි. තවද අධිමානුෂික බලයන් නිසා තම ශිෂ්‍යයන් නිතරම සති පඤ්ඤාවෙන් දවස ගත කරන බව ද උන්වහන්සේ දනිති. මම උන්වහන්සේට එම තොරතුරු කියන ලෙස ඇවිටිලි කළෙමි. එය පශ්චිම ජනයාගේ ශ්‍රද්ධා බුද්ධිය පිණිස ඉවහල් වන බැවිනි. ''මගේ සියලු සිතිවිලි ආචාර්ය මන් දනිති. මම වෙන කුමක් කියම්ද ? රෑ දවල් තිස්සේ මා රැහැණින් බැඳ තිබුණාක් මෙනි. එවැනි අවධාරණයකින් මම මගේ සිත පාලනය කළෙමි. මා හැකි තරම් වීර්‍යයෙන් මගේ සිත හික්ම වූ නමුත්, මොහොතක පමාවෙන් යම් අනිසි සිතුවිල්ලක් හිතුවිට, සියලු දෙනාගේ ඉදිරිපිට උන්වහන්සේ එය හෙළිදරව් කරති. මගෙ භාවනා මනසිකාරය ඒ කාලයේදී ඉතාම හොඳින් පැවතුනි. කලාතුරකින් වැරදි සිතිවිල්ලක් හට ගති. මේ හිත නොනවත්වාම රෑ දවල් තිස්සේ සිතිවිලි පහළ කරණ බව අප සිතිය යුතුයි. මේ හැම සිතුවිල්ලක්ම සතියෙන් දැනීමට හැක්කේ කාටද ? මගේ සිතිවිලි මට වඩා තීක්ෂණව උන්වහන්සේ දනිති. සමහර විට මට අමතක වූ සිතිවිලි උන්වහන්ස්ගේ මතකයේ ඇත. එවිට මම පුදුමයට පත්වෙමි.''

''ඔබට ආචාර්ය මන් කසි විටෙක බැණ ඇද්දැ''යි මම ඇසීමි. කලාතුරකින් බැණ ඇත. එහෙත් නිතරම මගේ සිතුවිලි දකිති. ඉන්පසු එම සිතුවිලි තුළින් මට ධර්මය පහදා දෙයි. බොහෝ විට අන් භික්ෂූන් වහන්සේලා අසා සිටී. එවිට මා ලැජ්ජාවට පත්වෙමි. වාසනාවකට මෙන් අන් භික්ෂූන් වහන්සේලා ඉදිරියෙහි මගේ නම නොකියති. එම සිතිවිලි විවේචනය කරති.

''ඔබට ආචාර්ය මන් බැන්නේ මක්නිසාද ?''

''පුථුජ්ජන'' යන වචනයේ තේරුම ඔබ දන්නවාද ? එහි තේරුම මහ ගල් කන්දක් මෙන් ඝන මුලාවකි. කිසිම පාලනයක් නැත. මේ සිතුවිලි හරිද ? වැරදිද, ඇත්තද බොරුද කිසිවක් තමා නොදනී. එවිට උන්වහන්සේ බනියි.

''ඔබ එම බැනීමට බිය වූවාද ?''

ඇයි නැත්තේ ? මගේ ශරීරය ගැහෙන්නේ නැහැ. නමුත් මගේ සිත හයින් ගැහෙනවා. හුස්ම ගන්ටත් බැරි වෙනවා ! උන්වහන්සේට ඇත්තෙන්ම පරචිත්ත විජානනය ඇත. එය මට ඔප්පු වී ඇත. උදාහරණ විටින් විට මම හුදකලාව යාමට සිතුවෙමි. පසුදා උදේ උන්වහන්සේ මා දුට විගස හොඳ බැනුමක් බනියි. ''ඉකිච් ඔබ යන්නේ කවදාද ?'' ඔය කොහේ ගියත් මේ තරම් හොඳ නැහැ. ඔබට මා සමඟ විසීම වඩාත් යෝග්‍ය වේ මෙසේ මගේ සිතුවිලි දනිති. ''මෙහේ හිඳිමින් ධර්මය ඇසීම වඩා හොඳයි - ඔය තනිව යනවාට වඩා'' මෙසේ මා යනවාට කිසිසේත් කැමති නොවූහ. මා එසේ ගියොත් මගේ භාවනා මනසිකාරය පහත බසී යැයි සිතූහ. එබැවින් නිතරම මා රඳවා ගැනීමට උත්සාහ කළහ.

මම වඩාත් බිය වූයේ උන්වහන්සේ ගැන මම සිතුවොත් උන්වහන්සේ මා ගන බලමින් සිටින බව මට හැඟේ. උන්වහන්සේට වෙන වැඩක් නැද්ද ? සමහර දිනයන්හි මම නිදා නොගනිමි. හේතුව ඒ මොහොතේම උන්වහන්සේ එරමිණියා ගොතාගෙන මා ඉදිරිපිට සිටිති. මම වෙන අරමුණක් ගැන සිතූ විගස උන්වහන්සේ මා දෙස බලා සිටින බව මට හැඟේ. මේනිසා මගේ සතිය ඉතාම දියුණු විය.

ශිෂ්‍යයන් වශයෙන් අපි නිරන්තරයෙන්ම සතිය පැවැත් වූයෙමු. උන්වහන්-සේ පසුපස පිණ්ඩපාතෙ යන විට අපේ සිත් සුපරීක්ෂාකාමී විය යුතුයි. තම කය වෙත යොමු කරණාවා මිස බාහිර ලෝකය දෙස නොබලමු. නොසිතමු. මේ ගැන නොසැළකිලිමත් වුවහොත් එවේලේම විවේචනය කරණු ඇත. එබැවින් සිත ගැන අපි අවධාරණයෙන් සිටියෙමු. එසේ වුවද සුළු ප්‍රමාද දෝෂයකින් සිහිය අන් අරමුණක් ගත් විගස එය විවේචනයට භාජනය වේ. එය සාධාරණ බව අපට වැටහේ. අපි කිහප දෙනා අතුරෙන් එක් අයෙක් හෝ මෙසේ සතිවිහරනයෙන් ඇත. එදින සවස දේශනාවේදී ආචාර්ය මන් යම්කිසි සිද්ධියක් මත දොස් පවරති. එය අපට නොතෙරේ. මක්නිසා මෙසේ කියද්ද ? දේශනයෙන් පසු අපි එක් රැස්ව මීට හේතු යුක්ති සෙව්වෙමු. එවිට එක් භික්ෂුවක් පාපොච්ඡාරණය කරයි. ''ඇත්තෙන්ම මම මෙවැනි විකාර දේ සිතුවෙමි !'' ආචාර්ය මන් සමඟ විසීම බිය දෙන්නකි. එබැවින් නිරන්තරයෙන්ම සතිය පැවැත්වූයෙමු. මෙම කථ ා පුවත කියන උන්වහන්සේ මුලින්ම චියං මායි ප්‍රදේශයට පැමිණිවිට එක්තරා පන්සලක නැවතී සිටියහ. එහි පැමිණ පැයක් ගත වීමට පෙර වාහනයක් අවුත් කුටිය ඉදිරිපිට නැවැත්විය.

මම විගස බැලුවෙමි. එහි ආචාර් මන් සිටිති. එහි දුවගොස් වැඳ ගෞරව පවත්වා එහි ආ කාරණය විචාළෙමි. උන්වහන්සේ පැමිණියේ මා එක්කර ගෙන යන්ට යැයි පැවසීය. ඊට පෙර දින එහි වඩින බව උනවහන්සේ දනිති. ''කවුරු

හරි ඔබ වහන්සේට ඒ බව දැන්නුවාද ?'' ''ඒ ගැන කමක් නැහැ, මම දැනගත් නිසා මෙහි ආවෙමි.'' මෙය අසා මම විස්මයට පත්වුනෙමි. පසුව උන්වහන්සේ සමඟ වාසය කරන විට මට මේ සත්‍යය වඩාත් තහවුරු විය.

අපේ සිත් නොයෙක් අරමුණු කරා යමින් නොයෙක් දෘෂ්ටි ගත වී නම් උන්වහන්සේගේ ධර්මය අවබෝධ නොවේ. එසේ නොවී සතියෙන් ඒ අරමුණ හොඳින් ග්‍රහණය කළවිට ධර්මය ඉතා පැහැදලිය, සරලය. ආකර්ෂණයකින් සිත ඇදී එහිම පවතී. ලෝකාස්වාද රතියෙන් පසුවුවහොත් එම ධර්මය සිත දවයි. ඒ භික්ෂුව මහා දුක් ගින්නකට පත්වේ. ධර්මය දේශනා කරන විට කාගෙ ' කෙලෙස් ඇවිස්සේදැයි උන්වහන්සේ නොසිතයි. ධර්මය කෙළින්ම කෙළෙස් වලට ඉලක්ක වී ඇත.

කලාතුරකින් යම් භික්ෂුවක් නමින් අමතයි. ''ඇයි ඔබ වහන්සේ ඊයේ රාත්‍රියේ ඒ විධියට භාවනා කළේ ? එය වැරදියි මේ විධියටයි භාවනා කළ යුත්තේ'' නැත්නම් ''ඇයි ඔබ අද උදේ මෙසේ සිත සිතා සිටියේ ? ඔය සිතිවිලි නිසා ඔබ විනාශ වෙන බව දන්නේ නැද්ද ?'' විනාශ වෙන්ට අකමැති නම් එසේ සිතන්නට එපා. ඇයි ඔබ බුදුරජාණන් වහන්සේ උගන්වපු අන්දමට නොසිතන්නේ? ඔබට කුමක් වෙලාද ? අප මෙහි ඉන්නේ වැරදි ලෙස සිතීමෙන් ක්‍රියා කිරීමෙන් වැළකීමට පුහුණුවීමට අප මෙහේ ඉන්නේ තමන්ගේ සිතිවිලිවල නිමග්න වී කෙළෙස් ගින්නෙන් දැවී යාමට නොවේ.'' මේ සත්‍යය තේරුම් ගත් පිරිස උන්වහන්සේ සමඟ ඉතා සතුටින් කාලය ගත කළහ. ඒ අය උන්වහන්සේගේ විරෝධයට ලක් වූයේ නැත. එහෙත් යම් රහසිගත වැරදි දේ දී නම් උන්වහන්සේට ගින්නෙන් දැවෙන්නාක් මෙන් දුක් දෙයි. එවිට එකවරම බැන වදී. එම භික්ෂුව තම වැරදි පිළිගෙන මිදේ නම් ඒ පිළිබඳ නැවත කථාවක් නැත.''

## ප්‍රබල විජ්ජා

කඳුකරයේ ග්‍රෝතික මිනිස්සු ආචාර්ය මන් පිළිබඳ නොයෙක් ලෙස සිතූහ. වරෙක උන්වහන්සේ ළඟ අවතාර හොල්මන් දුරු කරණ ප්‍රබල විජ්ජා ඇතැයි සිතූහ. ඉන්පසු උන්වහන්සේ හමු වී එවැනි විජ්ජාවක් ඇතොත් තමන්ට එය ලබා ගන්ට කතිකා කළහ.

පසුදා උදෑසන ආචාර්ය මන් මේ කතිකාව ගැන භික්ෂූන්ට සැලකළහ. ඊයේ රාත්‍රියේ මා භාවනාවේ යෙදී සිටින විට මට ඇසුණා ග්‍රෝතික මිනිස්සු කතිකා කරනවා අප ළඟ හොල්මන් අවතාර පලවා හැරීමට විජ්ජා ඇත. එය ඉල්ලන්ට අද එනවා කියා කියනවා. ඒ අය ආවොත් ''බුද්ධො, ධම්මො, සංඝො

මන්ත්‍රය දෙන්න. එය භාවනා කරන්න කියන්න. මෙය ඉතා බලවත්. හොල්මන් අවතාර මේ බුද්ධ, ධම්ම, සංඝ කෙරෙහි මහා භයක් ඇත. එකම හොල්මනක් වත් ඉන්නේ නැහැ. භය වී දුවති.

උන්වහන්සේ පැවසූ පරිදි පසුදා එම ග්‍රෝතික මිනිස්සු අවුත් හොල්මන් පලවා හරින මන්ත්‍රය ඉල්ලූහ. ආචාර්ය මන් මෙම මන්ත්‍රය කියා දුනි. එය භාවනා කරණ අන්දම ද කීහ. තමන් නිතරම හිතින් බුද්ධො, ධම්මො, සංඝො මෙනෙහි කළ යුතුයි. බුද්ධො බුද්ධො... කීවත් කමක් නැහැ.

මෙය අසා ඔවුන් මේ ඉතා වටිනා මන්ත්‍ර සූත්‍රයක් යැයි නිතර භාවනා කළහ. ඇත්තෙන්ම එය භාවනා කමටහනක් විය. වැඩි කල් ගත වීමට පෙර ඔවුහු සමාධි ගත වූහ. ඔවුන් ඉක්මණින් දුව ඇවිත් මේ පිළිබඳ දැන්වූහ. ආචාර්ය මන් එම සූත්‍රය හොඳින් භාවනා කරණ නිසා ඒ පළාතේ එකම හොල්මනක් වත් නැතැයි ප්‍රකාශ කළහ. මේ ධර්මයේ ආනුභාවයෙන් ඔවුන් තුළ හොල්මන්වලට තිබූ බිය පහ විය. ඇත්තෙන්ම හොල්මන් දුරුවිය. භාවනා නොකරණ අය කෙරෙහි පවා අමනුෂ්‍යයන් බියපත් වුනි.

ස්වාභාවිකව ඉතා අවංක බැවින් ද ගුණවත් බැවින්ද ග්‍රෝත්‍රික මිනිසුන්ට ධර්මය ඉගැන්වීම පහසු විය. ආචාර්ය මන් කියා දෙන පරිදි ඒ අය පැය ගණන් භාවනා කළහ. එබැවින් ඉතා හොඳ ප්‍රතිඵල ලදහ. ඔවුන්ගේ හදවත අලෝකමත් විය. පරචිත්ත විජානනය පහළ විය. අසපුවේ සිටින භික්ෂූන්ගෙ ' පවා සිත් දනිති.

තමාගේ අත්දැකීම් ගැන ඔවුහු විස්තර කළහ. භික්ෂූන් වහන්සේලා පුදුම වූහ. තමන් වහන්සේලාගේ සිත් දකිතියි බියපත් වූහ. මෙය සැබෑවක්දැයි ප්‍රශ්න කළහ. ග්‍රෝත්‍රිකයෝ සත්‍යය ප්‍රකාශ කළහ. නැවත නැවතත් හරස් ප්‍රශ්න අසමින් විස්තර ඇසූහ. හැමවිටම එකම උත්තර දෙති. ඔවුන්ගේ ස්වාභාවික අවංක ස්වරයෙන් කියති. භික්ෂූන් වහන්සේලා තමන්ගේ මෝහය දුරු කිරීමට මෙසේ ප්‍රශ්න ඇසූහ. අන්තිමේදී මේ අය කියන්නේ සැබෑවක්මය. ඔවුන් අපේ සිත් දනිතියි තව තවත් බිය පත් වූහ.

මේ ග්‍රෝත්‍රිකයෝ ආචාර්ය සිත් දන්නා බව පැවසූහ. ''මගේ සිත් කෙසේද? අවතාර හොල්මන් වලට භයද ?'' ''ඔබ වහන්සේගේ සිත් මේ ලෞකික සිත් නොවේ. මිනිස් සිරුරක නිවනකි. ඔබ වහන්සේගේ සිත් අති උත්තමයි. කිසි දෙයකට භය නැත. ඉන්පසු ඔවුන් තුළ හොල්මන් වලට තිබූ භය පහ වී ගියේය. භාවනා දියුණු අය අන් අයටත් තමන්ගේ වැටහීම ගැන කීහ. සියලු දෙනා තුළම ආචාර්ය මන් ගැන ශ්‍රද්ධාව ඇත. සැමදාම උදෑසන ගමේ මධ්‍යස්ථ ානයට රැස් වී දන් පිළිගන්වති. සියලුම භික්ෂූන් වහන්සේලාගේ පාත්‍රවල ආහාර

දමා ආචාර්ය මන්ගෙන් ආශිර්වාද ලබති. සියළු දෙනාම එකවිට සාධුකාර දීමට උන්වහන්සේ පුරුදු කළහ. ශබ්ද නගා දෙන සාධුකාර නාදය දේව ලෝකවල රැව් පිළිරැව් දුනි. දෙවිවරු අනුමෝදන් වෙති. සැමදාම ශ්‍රෝත්‍රිකයෝ මෙසේ මහ හඬින් සාධුකාර දුන්හ. රාත්‍රි කාලයේ දෙවියන් සමඟ කථාකරණ විට එම ශබ්දය ඈත දේව ලෝකවලට ඇසුන බව දෙවියෝ ආචාර්ය මන් හට කීහ. මේ ශබ්දය අසා දෙවිවරු ආචාර්ය මන් මේ පළාතේ වසන බවට දනී.

දෙවිවරු සමූහ වශයෙන් අවුත් ආචාර්ය මන් සමඟ කථා කරත්. මෙම කණ්ඩායමේ නායකයෙක් ඇත. එක් එක් තරාතිරමේ දෙවිවරු ඇත. සමහරු භූම්මට්ඨ හෙවත් භූමිය ආශ්‍රිතය ඉතා දුර බැහැර හෝ ළඟ පාත අය වෙති. බෞද්ධ පොත් පත්වල සඳහන් පරිදි බොහෝ දිව්‍ය ලෝක ආකාහයේ ඇත. ඒ ආකසට්ඨ දෙවිවරු වෙති. දෙවිවරු තමන් වහන්සේ දැකීමට එන බව උන්වහන්සේ කළින්ම දනිති. රාත්‍රී 2 ට හෝ 3 ට එන බව දත්විට කලින් නින්දට ගොස් විවේක ගනිති. නින්දෙන් පිබිද නියම වේලාවට සමාධියට පත්වෙති. මධ්‍යම රාත්‍රියේ එන්නේ නම් දිගටම සමාධිගත වේ. මෙය දෙආකාරයකින් සිදුවේ. ප්‍රථමයෙන් තද සමාධියකට සමවැදි සුව විඳිමින් ශරීර පීඩා සංසිඳුවති. නියම වේලාව පැමිණිවිට සුදුසු සමාධියකින් අමුත්තන් පිළිගනිති. දෙවිවරු දැන් පැමිණ ඇතැයි දනිති. තාම ඈත දේවලෝකවලින් ගමන් කරණ බව හෝ දනිති. ඒ අය පිළිගෙන උන්වහන්සේ උචිත තේමාවකින් ධර්මය දේශනා කරති. ඉහළ ධ්‍යාන වලට සම වැදුන විට දෙවියන්ට හමුවීමට නොහැකිය. සාමාන්‍ය මිනිස් මනසට ඉතා කළාතුරකින් දෙවියන්ට හමුවේ. එහෙත් සමාධි ගත වූ විට අමනුෂ්‍යයන් ලෙහෙසියෙන් අරමුණු වේ. බොහෝ විට උපචාර සමාධියෙන් මෙය සිදුවේ.

අවුරුදු ගණනාවකට පෙර සාරිකා ගල් ගුහාවේ ගත කරන කාලයේදී මෙසේ අමනුෂ්‍යයින් සමඟ ඇසුරු කිරීමට පුරුදු විය. දැන් එය ඉතා ලෙහෙසි දෙයකි. ඒ කාලයේ මහණ උපසම්පදාවෙන් වස් 22කි. පිරිනිවන් පාන විට වස් 60ක් පමණි. ඒ වන විට මේ පිළිබඳ අතිදක්ෂ විශේෂඥතා ඇතිවිය. අපි කා හට වුවද මේ දක්ෂතා ඇති කර ගත හැකිවේ. ඒ මෙතරම් අති දක්ෂ නොවූවත් සාමාන්‍යයෙන් මේ හැකියාවන් ලබා ගත හැකිය. ඊට අවශ්‍ය පිළිවෙත් සාධනය කිරීමෙනි. මෙහි වැදගත්කම වනුයේ බොහෝ අය මෙය විශ්වාස නොකරන බැවින් එවැන්නන්ගේ සැක දුරු කිරීමයි. මෙවැනි දේ නැතැයි කියන මේ ප්‍රතිපත්ති අනුගමනය කර තමන්ටම අත්දැකීම් ලබා ගත යුතුවේ. ධර්මය පිළිබඳ දැනුම නැති අයට මේ කරුණු ඒත්තු ගැනීමට දුෂ්කරය. හදවතේ ඇති ගුණ යනු කුසලතාවයකි. සමාධි ගුණයකි. මේ කුසලතා දියුණු වු විට තමන්ට අත්දැකීම් ලැබේ. ලෝකයේ සියලු දෙනාම මෙය ප්‍රතික්ෂේප කළත් තමාගේ විශ්වාසය නැති

නොවේ. එක් එක් අයගේ මතිමතාන්තර මත සත්‍යය නොපවතී. සත්‍යය යනු නොසෙල් විය හැකි ස්වාභාවික ස්ථාවරයකි.

ආචාර්ය මන් වැඩිම කාලයක් ගත කළේ චියාං මායි ප්‍රදේශයේය. එය ඉතා දුෂ්කර දුර බැහැර කඳු කරයකි. එය භාවනාවට සුදුසු පරිසරයකි. තවද කඳුකරයේ ග්‍රෝත්‍රික මිනිසුන් අතර බොහෝ දියුණු මනස් ඇති පුද්ගලයෝ බිහි විය. ඒ අය කෙරෙහි උන්වහන්සේගේ අනුකම්පාව ඇතිවිය. ඒ අයට උපදෙස් දීම අවශ්‍ය විය. නැතහොත් තම කුසලතා නැති වී නැවතත් පුරුදු පරිදි වනගත ග්‍රෝත්‍රිකයෝ වෙති. තවද, බොහෝ දෙවිවරු සමඟ සම්බන්ධතා මෙහිදී ඇතිවුණි.

මසකට දෙතුන් විටක් දේව හා නාග කණ්ඩායම් උන්වහන්සේ දැකීමට පැමිණ ප්‍රශ්න අසති. ධර්මය අසති. කණ්ඩායම් ප්‍රධානියා මුලින් අවුත් දේව ගණයාගේ විස්තර හා සංඛ්‍යාව, දැනුම් දෙයි. උදාහරණ, අද දස දහසක්, සීයක් දහසක් දේව ගණයා පැමිණ ඇත. නාග ගණයා පන්සියයකි. දහසකි.... ආදී වශයෙනි. උන්වහන්සේ සක්මන් භාවනා කරන විටදී සවස් යාමයේ ද අවුත් නොයෙක් නිකායික කායික දේව කණ්ඩායම් එන බව හා වේලාව, මතක් කරති. සමහර විට හිඳිමින් සමාධිගත වූ විටද පැමිණ යම් යම් දේ නිවේදනය කරති. එවිට උන්වහන්සේ මුණ ගැසීමට දිනයක් වේලාවක් පවරති. වෙනත් වෙනත් නිකායිකයින් එකට හමු නොවෙති. ඒ ඒ අය වෙන් වෙන්ව පැමිණෙති. ඒ අයගේ මානසික මට්ටම අනුව ධර්මය දේශනා කරණු ලැබේ. සමහරු විශේෂ මාතෘකා විෂය කරුණු විචාරති. මේ කරුණු උන්වහන්සේගේ විමසීමට බෙහෙවින් හේතු විය. මිනිස්, නාග, ගරුඬ ආදී නිකායන් සියල්ලටම වඩා දේව නිකායික සංඛ්‍යාව වැඩිවිය. දෙවියන්ගේ සිත් හඳුනා ගනීමේ ශක්තිය ඇත්තේ ස්වල්ප දෙනෙකුටය. පරචිත්ත විජානනය සහිත වූ අධිමානුෂික බලයකි.

දෙවියන් නිතරම කියන දෙයක් නම් මිනිසා දෙවියන් සිටින බවත් දෙවියන් ගැන කිසිවක් නොදන්නා බවත්ය. කර්මානුකූලව දේව නිකායවල ඉපදෙති. මිනිසාගේ ඉන්ද්‍රියන්ට ගෝචර නොවන නිසා නොඅදහති. එහෙත් මිනිසා මෙන්ම දෙවියන්ට සිතුම් පැතුම් ඇත. ආචාර්ය මන් වැනි අධිමානුෂික බල ඇත්තන් සිටින්නේ කලාතුරකිනි. උන්වහන්සේ මිනිසා මෙන්ම දෙවියන්, සතුන් සහ වෙනත් බොහෝ ජීවිහු සිටිති. ඒ අය සිටින බව සත්‍යයක් ලෙස බොහෝ දෙනා නොදනිත්. ආචාර්ය මන් සමඟ දෙවිවරු ඉතාමත් සුහදව ඇසුරු කරත්. උන්වහන්සේට පූජා සත්කාර කරත්. ධර්මය ශ්‍රවණය කරත්. තම සිත් තුළ ධර්මය රඳවා ගැනීමට කැමති වෙත්. එවිට ඒ අයගේ සතුට, ප්‍රීතිය වර්ධනය වේ. දේව ආත්මය වඩා සුවදායක වේ. මේ නිසා අතීන්ද්‍රිය ගුණ නුවණ ඇති අය දෙවියන්ට ප්‍රිය වෙති. පිං කිරීමේ කැමැත්ත ඇත.

අන් ජීවීන් මෙන් දෙවිවරු තම ජීවිතය සකස් කර ගැනීමට නිතර ආචාර්ය මන් හමුවෙති. ධර්මය අසති. ඒ අය ගැන මිනිසුන් කිසිවක් නොදනිත්. මේ අතීන්ද්‍රිය හැකියාව මිනිසාට ලබා ගත හැකිය. දෙවියන් සමඟ අදහස් හුවමාරුව සාමාන්‍ය දෙයකි. එය මිනිසුන් සමඟ කරණ කථා බහ හා සමානය. ආචාර්ය මන් දෙවියන් සමඟ කථා කළේ සාමාන්‍ය දෙයක් ලෙසිනි. උන්වහන්සේ කොහේ සිටියත් දෙවියන් සමඟ කථා බහ කරති. කැලෑබද අෑත කඳුකරය දෙවියන්ට ප්‍රිය වේ. මිනිසා ගැවසෙන ප්‍රදේශවලට දෙවියන් පැමිණෙන්නේ නැත. එවැනි ප්‍රදේශවල සමාජ වගකීම් නැති නිසා වැඩි කාලයක් දෙවියන් ඇසුරු කරත්.

ඉකව් ගම්මානයේ කඳු මුදුන්වල ජීවත් වන මියුසියර් ග්‍රෝතිකයන් සමඟ ආචාර්ය මන් සිටින කාලයේ අපූර්ව සිද්ධියක් සිදුවුනි. ජර්මනියේ සිට දේව කොට්ඨාසයක් එහි පැමිණ ''ජයග්‍රහණය'' යනු කුමක්දැයි ඇසූහ. උන්වහන්සේ දෙවියන්ගේ සිත් දැන සුදුසු ධර්මයක් දේශනා කළහ. එනම් ''අංකකාධෙන ජිනෙ කොධං'' එනම් මෛත්‍රියෙන් තරහව නැසීමයි.

''යමෙකුට ජයග්‍රහණය අවශ්‍ය නම් මේ ධර්මතාවය අනුගමනය කළ යුතුයි. මෙය නිතර දෙවේලේ තම සිත, වචන, ක්‍රියා තුළින් පුරුදු කළ යුතුවේ. හිතා බලන්න, සමගිය සමාදානය යනු මෙසේ සමාව දීමයි. තරහව ජයගැනීමට මෛත්‍රී කරුණාව ඇතිවිය යුතුයි. ලෝකයේ මෙම ජයග්‍රහණ රීතිය නැති කල අසතුට, කලබල, කරදර වැඩිවේ. මුළු ලෝකයම එකිනෙකා ඇණ කොටා ගනිති. තරහ වෛරයෙන් අපේ පස මිතුරන් ජයගත නොහැකිය. ඒවා අකුසල් බැවින් තමනුත් අනුනුත් නැසේ. තරහ වැඩි තරමට ලෝකය ගිනි ජාලාවක් වේ. සත්ත්වයා වැනසේ.

මෙම ලෝකයේ විද්‍යමාන වන ස්වාභාවික දෙයක් වන තරහව බොහෝ දුක් දොම්නස් ඇති කරයි. අන්‍යෝන්‍ය සබඳතාවය මෛත්‍රිය ඇතිවිට ලෝකයේ සමබරතාවයක් ආරක්ෂා වේ. සීමාන්තික ද්වේශය වෘත්තාකාරව කරකැවේ. තමනුත් අනුනුත් මේ චක්‍රයට හසුවේ.

අපමණ ප්‍රඥා මහිමයකින් බුදුරජාණන් වහන්සේ තරහවේ ආදීනව දේශනා කර ඇත. මෛත්‍රී කරුණාව එකිනෙකා සුහදව ළඟා කරණු ඇත. සියලු දෙනා දුක් විඳීමට නොකැමති වේ. මෛත්‍රිය තුළින් ආදරය, ආරක්ෂාව තහවුරුවේ. මෛත්‍රිය ඇති තාක් කල් සතුට සන්තෝෂය ඇත. එය නැති විට කෙතරම් භෞතික සැප සම්පත් ඇතත් සිතේ සතුට සන්තෝෂය නැත. තරහ වෛරී පුද්ගලයෝ එවැනි අයම ළඟා කර ගනිත්. යන යන තැන වෛරකාරයෝ ඇත.

මේ ධර්මතාවය වටහා ගත් පසු වෛර කිරීම තිරිසන් ම්ලේච්ඡ හැසිරීමක් බව අවබෝධ වේ. එබැවින් වෛරය මැඩ පැවැත්වීමට මහන්සි ගත යුතුයි. ඔබට

මෙවැනි අවස්ථාවක් නැවත නොලැබෙනවා විය හැකිය. එබැවින් පසුතැවිලි වන වෛර ක්‍රියා නොකරන්න. ලෝකය සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. අපේ සිතද කයද ඒ ආකාරයෙන් වෙනස් වෙමින් පවතී.

මේ ආදී වශයෙන් ආචාර්ය මන් ජයග්‍රහණය පිළිබඳ ජර්මනියෙන් ආ දෙවිවරුන්ට පැහැදිලි කර දුන්හ. උන්වහන්සේගේ දේශනාවසානයේදී සියලුම දෙවිවරු සාධුකාර පැවැත් වූහ. එය ලෝක ධාතුවල රැව් පිළිරැව් දුනි. උන්වහන්සේ මේ අඩවියේ වාසය කරන බව දැන ගත්තේ කෙසේදැයි ඇසූ විට ඒ අය නිශ්චිතව උන්වහන්සේ වාසය කරණ තැන දන්නා බව කීහ. එපමණක් නොව තායිලන්තයේ වාසය කරන දෙවිවරු නිතරම ජර්මනියේ දෙවිවරු දකින්ට යති. එම දේශ සීමා ඒ තරම් දුර නැත. එය ඔවුන්ගේ සාමාන්‍ය මාර්ගයකි. මිනිසුන් ඒ මේ අත යන්නේ වාහන වලිනි. දෙවිවරු යම් තැනක සිත යොමු කළ විට කයද එහි ගමන් කරයි. ගතවන කාලය මොහොතකි. ඉතා ඉක්මණින් දෙවිවරු ගමන් කරත්.

තායිලන්තයේ බුමාටු දෙවිවරු නිතර බණ ඇසීම ආචාර්ය මන් කරා පැමිණෙති. එමෙන්ම ජර්මනියේ දෙවිවරු ද පැමිණෙති. ආකාසට්ඨ හා භූමට්ඨ දෙවිවරු එකසේ උන්වහන්සේට පූජා උපහාර පවත්වති. භික්ෂූන් වහන්සේලා ලැගුම් ගන්නා ප්‍රදේශය හරහා දෙවිවරු ගමන් නොකරත්. තවද මධ්‍යම රාත්‍රිය ඉක්ම වූ විට පැමිණෙත්. එවිට අනිත් භික්ෂූන් නින්දට ගිය වේලාවයි. ආචාර්ය මන් ඉදිරියේ තුන්වරක් දකුණු උරහිස පැත්තෙන් ප්‍රදක්ෂිණා කරත්. ඉතාම සන්සුන් ඉරියව්වෙනි. යන්ට ප්‍රථම ද එසේ ප්‍රදක්ෂිණා කරත්. ඊටපසු තරමක් ඈතට ගමන් කරත්. එම අඩවියේ සීමාවට මෙසේ ගමන් කර පුළුන් රොදක් මෙන් අහසේ පාවී යත්. සියලුම දෙවිවරු මේ ආකායෙන් හැසිරෙත්.

චියාං මායි කඳුකරය ආචාර්ය මන්ගේ කාය චිත්ත විවේකයට සුදුසු විය. එබැවින් නිතරම භාවනාවේ යෙදුනහ. ධර්මය සිත තුළට ගලා ඒම නිසා නිතර සැප පහසුවෙන් සිටියහ. කැමති තාක් කල් භාවනා කළ හැකිය. උන්වහන්සේ නිරෝගීව, නිදහසේ එහි වාසය කළහ. රාත්‍රි කාලයේ එන දෙවිවරු ඉතාම පිරිසිදු ශිෂ්ට ගති පැවතුම් ඇති අය නිසා කිසිම කරදරයක් නැත. සවස් යාමයේ ගමේ මිනිසුන්ට ධර්මය කියා දුන්හ. රාත්‍රී 7ට පමණ භික්ෂූන් වහන්සේලා පැමිණෙති. සියලුම ශිෂ්‍ය භික්ෂූන් සිත් සමාධි කරගෙන ඇත. පඤ්ඤාව යම් යම් තරමින් දියුණු වී ඇත. මගඵල සඳහා වීර්‍යය කරමින් ප්‍රතිපත්තියේ බැඳී ඇති බැවින් උන්වහන්සේට වෙහෙසක් නැත.

එක් එක් මට්ටමේ භාවනා දියුණු වූ භික්ෂූන්ට උපදෙස් දෙන විට උන්වහන්සේ මුල සිට විස්තර කරයි. මූලික සමාධිය ලැබීමේ සිට පඤ්ඤාව වර්ධනය කිරීමට උපදෙස් දෙයි. සියුම් දුරවබෝධ අප්‍රකට නිවන දක්වා උපදෙස් දෙයි.

භික්ෂූන් වහන්සේලා සමාධියෙන්ම ධර්මය ශ්‍රවණය කරන බැවින් කාලය ගැන හැඟීමක් නැත. පැය දෙකක කාලයක් තුළ දේශනා පවත්වති. උන්වහන්සේලා සිත එකඟ කර අසන බැවින් හොඳාකාර ධර්මය අවබෝධ වේ. එයම භාවනා මනසිකාරයකි. වෙනත් ප්‍රතිපත්ති මෙන්ම ඉතා අගනේය. උන්වහන්සේ ශිෂ්‍යයින්ට තේරෙන පරිදි දේශනා කරත්. අකුසල් සිත බැහැර කිරීම, කුසල් සිත් දියුණු කිරීම සාකච්ඡා කරති. වැඩිපුරම චිත්තානුපස්සනාව අලලා දේශනා කරති. එය ධර්මයේ ඉලක්කය වේ. පඤ්ඤාවෙන් සිත කය පිළිබඳ ප්‍රත්‍යවෙක්ෂාව, විචාරීම, බොජ්ඣංග භාවනාව කියා දෙති. මෙසේ සතිය වැඩේ. ආචාර්යවරයා අවබෝධයෙන් දේශනා කරන බැවින් ශිෂ්‍යයන් තුළ කිසියම් සැකයක් නූපදී. ධර්මය සවිස්තරාත්මකව දේශනා කරන බැවින් ශිෂ්‍යයන් තුළ සමාධි පඤ්ඤා වැඩී යයි. එය නිවන කරා දියුණු කරත්.

ධර්මයට සවන් දීම ධූතාංග භික්ෂූහු ඉතා අගය කරති. ඒ සඳහා දක්ෂ ගුරුවරයෙක් අවශ්‍ය වේ. එබැවින් ධූතාංග භික්ෂූහු දක්ෂ ගුරුවරයෙක් සොයා යති. යම් එවැනි ගුරුවරයෙකුට අසීමිත භක්තියක් අවනත භාවයක් දක්වති. සියලු උපදෙස් හිස් මුදුනෙන් පිළිගනිත්. ධර්මය, ගම්භීරය, සත්‍යය එබැවින් අවංකව පිළිපදිති. නිතර දෙවේලේ ගුරුවරයා මුණගැසී ගැටළු නිරාකරණය කර ගනිත්. ඒ අනුව තම පිළිවෙත් පුරති. ධූතාංග භික්ෂූහු මේ නිසා දක්ෂ ආචාර්යවරයෙක් වූ ආචාර්ය මන් ආචාර්ය සාඕ සොයා එති. මේ ආචාර්යවරු දෙදෙනාට බොහෝ ශිෂ්‍යයෝ සිටියහ.

නමුත් ආචාර්ය මන් චියාංමයි ප්‍රදේශයට සංචාරනය කළ පසු භික්ෂූන් වහන්සේලා අත්හැර හුදකලාව වාසය කළහ. මුලදී අර්හත්වය සඳහා පිළිවෙත් පිරීමට අවශ්‍ය විය. පසුව හුදකලා ජීවිතය ප්‍රිය කළහ. එනමුත් බොහෝ ශිෂ්‍ය පිරිසක් ඇතිවිය. මුලදී තමන් වහන්සේගේ භාවනා දියුණුව මදි බව ප්‍රකාශ කළහ. එබැවින් හුදකලාව වනගත විය. පසුව බොහෝ වීර්‍යය දරා තමන් වහන්සේගේ අරමුණ සාර්ථක වූ විට තමන් වහන්සේගේ බැරි කමක් කීවේ නැත.

## වැඩිමහල් සහෝදරයා වූ හස්ති රාජයා

චියාමයි ප්‍රදේශයේ ආචාර්ය මන් සහ තව ආචාර්යවරු දෙදෙනෙක් වාසය කළහ. එනම් ආචාර්ය ඛඕ සහ ආචාර්ය මහා ථොංසක් විය. උන්වහන්සේලා උදෙන් තාහි ප්‍රදේශයේ සහ සකොන් නඛොන් ප්‍රදේශයෙන් පැමිණියහ. මහ කැලෑවේ ගමන් කරන විට විශාල ඇත් රාජයෙක් මුන ගැසුනහ. ඔහු හීලෑ ඇතෙක් බව වයස් ගත වූ නිසා අයිතිකාරයා මුදවා හැරිය බවත් පසුව දැන ගත්හ. ඇත් රාජයාහට අඩියක් පමණ දිග දළ ඇත. බැලූ බැල්මට භයංකර

වේ. ඔහු හරහා යන්නෙ කෙසේදැයි උන්වහන්සේලා කථා කළහ. කඳුකරයට යාමට ඇත්තේ මේ පාර පමණි. කැලෑරොද නිසා ඇතා ළඟින් යාමට නොහැකිය. ආචාර්ය මන් ඇතා සමග කථා කරන්නටයැයි ආචාර්යය බඹ් හට කීහ. ඌ උණ බම්බු කොළ කමින් සිටියි. අඩි 20ක් පමණ ඈතින් පස්සා පැත්තට හැරී ඇත. තවම උන්වහන්සේලා දැක නැත. ආචාර්ය බඹ් ඇතාට කථා කළේය.

''ඇත් අයියේ ඔබට අපි කථා කරනවා''

මුලදී ඔහුට එය ඇසුනේ නැත. එහෙත් කොළ කෑම නැවැත්විය.

''ඇත් අයියේ ඔබට අපි කථා කරනවා''

දෙවෙනි වර ඇසී ක්ෂණයකින් ආපසු හැරී බැලුවේය. එහි නිශ්චලව සිටී කන් දෙක ඈත් කර ඇත.

''ලොකු අයියේ අපි ඔබට කථා කරනවා ඔබ ඉතා විශාලයි, ශක්තිමත්. අපි සාමාන්‍ය භික්ෂූන් වහන්සේලා. ඔබ කෙරෙහි භයයි, අපි දුර්වලයි. ඔබ සිටින තැන පසුකර යාමට ඕනේ. ලොකු අයියා පොඩ්ඩක් අයින් වෙනවාද ? අපට යන්ට ඉඩ දෙන්න. ඔබ හිටගෙන ඉන්න විට අපි ඉතාම භයයි. ළඟට එන්න බැහැ.''

මෙසේ කී විගස ඇතා පැත්තකට හැරී දළ එම ගුම්භයට ඇතුල් කර පාර දුන්නා. ආචාර්ය මන් දැන් අපිට යා හැකියි කීහ. භික්ෂූන් වහන්සේලා දෙනම ආචාර්ය මන් ඉදිරියෙන් හා පසු පසින් ගමන් ගත්හ. තනි පේළියට ගමන් කළහ. ඇතා අඩි 6ක් පමණ ඈතින් සිටී. උන්වහන්සේලා මෙසේ ගමන් කරණ විට පසුපසින් වැඩි ආචාර්ය මහා ඨෛං සක්ගේ කුඩ මිටේ කවය කැලෑ රොදේ පැටලැවුනි. මක්කරලාවත් එය ගලවා ගන්ට නොහැකිය. ටික වෙලාවක් උන්වහන්සේ එහි සිටිමින් කුඩය ගලවා ගන්ට යත්න දරයි. ඇතා උන්වහන්සේ දෙස බලා සිටී. උන්වහන්සේ භයින් වෙව්ලමින් මුළු ශරීරයෙන් දාඩිය ගලා හැලුනහ. උන්වහන්සේ ඇත් රාජාගේ ඇස් දෙක දෙස බැලූහ. ඇත් රාජා අති විශාලය. ඇස් දෙක දීප්තිමත්ව බැබළුණි. බැලූ බැල්මට අහිංසකය. ආදරය ඇතිවේ. එහෙත් ඒ මොහොතේම භයින් ත්‍රස්ත වී ගියේය. අන්තිමේදී කුඩය ගලවා ගත්හ. බිය පහවිය මේ අත් රජා කෙරෙහි ආදරය ඇතිවුණි. දැන් තුන් නම ඇතා පසුකර නිර්භයව සිටී. ආචාර්ය බඹ් ඇතා ඇමතුවේය. ''ලොකු අයියා අපි දැන් යනවා දැන් නිදැල්ලේ කොළ කන්ට'' උන්වහන්සේ මෙය කී විට මහා ශබ්ද නගමින් ඇතා කොළ අතු කඩා කන්ට විය.

පසුව මෙම ඇත්රජා ඉතාමත් සුහද බවත් තමන් වහන්සේලාගේ මිත්‍රත්වය දිනු බවත් වැටහුනි. එකම දේ නම් කථා කිරීමට බැරි කමයි. මෙසේ කියමින්

සිටිද්දී ආචාර්ය මන්ගේ මතය කුමක්දැයි විමසීය.

ඇතාගේ සිත් ඔබ වහන්සේ දුටුවෙහිද ? මම ඉතාමත් කැමතියි. උගේ සිතිවිලි මොනවාදැයි දැන ගැනීමට. ''මුලදී අපි කථා කළ විට ඔහු හැරී අපි තිදෙනාම එකවර පාගා දැමීමට හිතුව. නමුත් ඔහු ඒ අවස්ථාව දැන ගත්තා. ඊට පසු හිත වෙනස් වුනා. ඇත් ශරීරයක හිටි මිනිසෙක් මෙනි. තම දළ ගස් ගුම්භයට ඇතුල් කර පාර දුන්නා.'' ඔය පොඩි මල්ලිලාට දැන් යන්ට පුළුවනි, අයියාගෙන් හානියක් නැහැ. අයියාගේ ආයුධ පාවිච්චි කරන්නේ නැහැ. භය වෙන්ට එපා. මෙහෙන් යන්න''

ආචාර්ය මහා ථොං සක් එවිට ආචාර්ය බඕට සරදම් කළහ. ඔබ වහන්සේගේ වචන අසා ඇතා මෙල්ල වුනා හරියට මනුෂ්‍යයෙක් වගේ. ''ලොකු අයියා අපි භයයි. අපිට යන්ට පාර දෙන්න.'' ඌ ඒ වචනයට අවනත වුනා. සතුටු වුනා. රැවටුනා. නමුත් මේ මල්ලි හරිම අදක්ෂයි. කුඩේ මිට ගස්ගුම්භයේ හිරකර ගත්තා මොන විධියටවත් ගලවා ගන්ට බැහැ. ලොකු අයියා ළඟම ඉන්ට වුනා. එහෙත් මගේ හදවත ස්පන්දනය නවතී. මහත් වෙහෙසකට පත්වුනා. කොයි මොහොතේ ඔසවා පොළොවේ ගසයිදැයි සිතුනා.'' මේ අසා සිටි ආචාර්ය මන් මෙසේ කීහ. මුලදී ඇතා භය වුනා. ඒ නිසා එකවරම හැරුණා. මරන්ටයි සිතුවේ. එහෙත් කහ සිවුරු දැක පැහැදුනා. ඔහු භික්ෂූන් වහන්සේලා දැක පුරුදුයි. මගේ අයිතිකරු භික්ෂූන් වහන්සේලාට අවනත වීමට පුරුදු කර ඇත. ඉතින් ආචාර්ය බඕ ලොකු අයියා කියා කථා කළාම සතුටු වී පාර දුන්නා.

''උන්වහන්සේගේ වචන තේරුණාද ?''

ඇත්තෙන්ම ඔව්. නැත්නම් ලී කොටන් අදින්ට පුරුදු කරන්නේ කෙසේද? එය නොතේරුනි නම් ඔහු අප මරා දමනවා. මේ සත්තු මිනිසුන්ගේ භාෂාව දන්නවා. මේ ඇතා අවුරුදු සියයකට වඩා වයස වැඩියි. උගේ දළ බලන්න. අඩි හයක් පමණ දිගයි. බොහෝ කාලයක් මිනිසුන් සමඟ වාසය කර ඇත. අයිතිකරු ඊට වඩා බාලයි. එහෙත් ඔහුගෙන් වැඩ ගන්නවා.

''ඌ හැරී දළ ගුම්භයට දා ගන්නා විට සිතුණේ කුමක්ද ?''

''මම කලින් කී පරිදි අපට යන්ට ඉඩ දීමට සිතුවා''

''අපි ඔහු ළඟින් යන විට ඔබ වහන්සේ ඔහුගේ සිත දැක්කාද ?'' ඔව්, අපිට ඉඩ දෙන එක ගැන පමණයි සිතුවේ.

''මම එසේ ඇසුවේ විනෝදයටවත් අපට පහර දෙන්ට සිතුවාද ?'' ''ඔබ වහන්සේට අස්වාභාවික මනඃකල්පිතයක් ඇත. මහා ථොං සෙක් ඔබ වහන්සේ

කැමතියි මෙසේ ප්‍රශ්න කරන්ට. සිතන්ට, එහෙත් මෙවැනි බොළඳ දේ ගැන නොසිතා ධර්මය පිළිබඳ ප්‍රශ්න කරන්න එවිට ඔබ සියලු දුක් තරණය කරාවි. නමුත් ඔබ වහන්සේ සාමාන්‍ය මිනිස්සු වගේ කාලය නාස්ති කරනවා කිසි වැදගත් දෙයක් ගැන නොවේ මේ ප්‍රකාශ කරන්නේ. ඔබ එළිවන තුරුත් මේ සතා ගැනද සිතන්නේ ? ධර්මය ගැන කිසි තැකීමක් නැහැ''

ඉන්පසු ආචාර්‍යය මහා ටොං සක් ඇතා ගැන ඇසුවේ නැත. නැවත ඇසුවොත් මීටත් වඩා තරවටු කරයි යන බියෙනි.

මෙසේ නොමනා අන්දමට ප්‍රකාශ කරන විට ආචාර්ය මන් තරවටු කරති. සමහරු ඉන්පසු සිහිවිකල් වෙති. මෙසේ අනවසරයෙන් බාධා කරන එක් භික්ෂුවක් උන්වහන්සේ සමඟ වාසය කළේය. ආචාර්ය මන් යමක් කී විට උන්වහන්සේගෙ ' මතය කියාපායි. ආචාර්ය මන් කීප විටක් එසේ නොකිරීමට අවවාද කළහ. තම ''සිත ගැන සෝදිසියෙන් සිටිනු මැනවි. කථා කිරීම නැවැත්වුව මැනවි'' මෙසේ කථා කරන්නේ දුර්වල කමක් නිසාය. එහෙත් මේ භික්ෂුව එම අවවාදය නොපිළිගත්හ.

ආචාර්ය මන්ගේ එක් පුරුද්දක් ඇත. එනම් සතුන්, මිනිසුන් මගදී හමු වූ විට උන්වහන්සේ පසුපස ගෙන යාමය. ඒ නිසා භික්ෂූන් වහන්සේලා පිඬු සිග ා යන විට වඩා සිහි නුවණින් යති. එක් දිනක් උස් හඬින් උන්වහන්සේ කතා කළහ. එක් කුඩා වසු පැටියෙක් උගේ මව වටා දුවමින් සෙල්ලම් කරයි. භික්ෂූන් වහන්සේලා වඩින බව ඔහු දුටුවේ නැත. ඉතාම කිට්ටු වූ විට දැක විගස මව් ළඟට දුව ගියේය. භයින් සැඟ වී උන්වහන්සේලා දෙස බැලුවේය. එළදෙන ද භික්ෂූන් වහන්සේලා දුටහ. නමුත් කිසි බියක් සැකක් නොවීය. නමුත් පැටවා මවට තුරුල් වී බියපත් වී සිටී. ආචාර්ය මන් මේ මව සහ පැටියා ගැන කථ ා කළේය.

''මව නොබියව සිටී. එහෙත් පැටියා බිය වී හඬ නගා දුවති. මිනිස්සු මෙසේමයි. තමා ආවරණය කර ගැනීමට කවුරු හෝ සොයති. මව් ළඟ නම් ඈ වෙත දුවති. පියා ළඟට දුවති. පවුලේ අය හෝ නෑදෑයින් ළඟට යති. කලාතුරකින් තමන්ම ප්‍රශ්න විසඳා ගනිත්. අපි කුඩා කළ අනුන්ගේ උදව් බලාපොරොත්තු වෙමු. වැඩිහිටි අය වෙන අන්දමේ උපකාර සොයති. මහලු වූ විට වෙනත් විධියේ උපකාර සොයති. ටික දෙනෙක් තමාගේම ශක්තියෙන් ස්වාධීන වෙති. අනුන්ගෙ න් උපකාර සොයන්නේ දුර්වල බැගෑපත් අය. ස්වාධීන නොවූ අය.

භික්ෂූන් වහන්සේලා වූ අපත් එසේමයි. මහණ වූ පසු ඉගෙනීම් කටයුතු කිරීමට මැලිවෙති. භාවනා පිළිවෙත් පුරන්ට දුස්කර බැවින් මැලිවෙති. පටන් ගත් දෙය නිමාවකට ගෙනි යන්නේ නැත. කම්මැලිකම් අවුරා සිටිත්. තමාට

නොහැකියැයි අනුන්ගේ පිහිට පතති. තමන්ට තනිව ජීවත් විය නොහැකිය. ''අත්තාහි අත්තනො නාථො'' යන්න අපට අර්ථවත් නැත. තමා තමාගේ ගැලවුම් කාරයා වෙති. තමාම හුස්ම ගත යුතුය. ධූතාංග භික්ෂූන් අනුන්ගේ උපකාර සෙවිය යුතු නැත.

ගුරුවරයාගේ උපදෙස් ලබා ඒ අනුව තමන් නැගී සිටිය යුතුයි. ගුරු උපදෙස් ලිහිල් කොට අමතක නොකරන්න. උන්වහන්සේ කියන දේ අසා දැන ඒ ආදර්ශය අනුව යන්න. තමාම ප්‍රතිඵල ලබා ගන්න. එවිට ගුරුවරයාගේ උපකාර අවශ්‍ය නොවේ. ඔබ ඔබගේම නාසයෙන් හුස්ම ගන්න. ක්‍රමයෙන් ඔබේ ශ්‍රද්ධාව වැඩී යයි. ඔබ ස්වාධීන වේ. අන්තිමේදී ඔබ තනිව සිටී. ගුරු උපදේශ අනවශ්‍ය වේ.

මේ කථාව පිණ්ඩපාතය පිණිස යන ගමන් කීහ. ඒ අතර සිටි ඒ කලබලකාරී භික්ෂුව යම් යම් දේ කථා කළේය. ඒ ඇසූ ආචාර්ය මන් ආපසු හැරී ඔහුට දොස් කීහ. අනිත් භික්ෂූන්ද තිගැස්සී සිටියහ.

''ඔබට පිස්සුද ? ඔබ පිස්සු බල්ලෙක් වගේ, අසුචුන ලී කෑල්ලක් හෝ හපා කති. ඔබේ සිත තුළ බලන්න. මොකක්ද මේ පිස්සුවට හේතුව. ඔබට පිස්සු වැටෙයි මෙසේ දොඩවන විට''.

ආචාර්ය මන් වෙන කිසිවක් නොකියා ආපසු හැරී අසපුවට ගියහ. එම භික්ෂුවගේ විකාරයක් අනිත් භික්ෂූහු දුටුහ. ඔහු භය වී සිහි නැතිවාක් මෙනි. ආහාර නොගනී. ඔහු තවත් භය වේ යැයි අනිත් භික්ෂූන් කිසිවක් නොකියති. එදා රාත්‍රි කාලයේ මහ හඬින් යමක් කෑ ගැසීය. එම භික්ෂුව තම කුටියේ දඟලමින් සිහි විකල්ව දොඩවයි. තමා ආචාර්ය මන්ට අවමන් කළේ යැයි පැවසීය. ගමේ මිනිස්සු මේ බව අසා පැමිණියහ. ඔහුට කශාය බෙහෙත් පොවා අත් පා සම්භාහනය කළහ. ඉන්පසු නිදා ගත්හ. පසුදා උදේ උන්වහන්සේව වෛද්‍යවරයෙකු වෙත ගෙන ගියහ. ඔහු තරමක සුවයක් ලදහ. එහෙත් වරින් වර එම රෝගය මතුවුණි. තරමක් සුව වූ විට ඔහු ගෙදර යැවීය. ඉන්පසු ඔහු ගැන තොරතුරු නැත.

ආචාර්ය මන් දොස් දකින්නේ එක එක පිළිවෙලකටය. යන්තම් අවවාදයක් වුවද බොහෝ විට සෑහේ. එවිට සති සම්පජඤ්ඤයෙන් පිහිටා සිටිති. එහෙත් තද බල ලෙස කථා කරන්නේ කලාතුරකිනි. එවිට එය සැමෝටම සිහි කැඳවීමකි. එබැවින් භික්ෂූන් වහන්සේලා ඉතාම සිහි කල්පනාවෙන් සිටිති. උන්වහන්සේ සමඟ බොහෝ කල් ඇසුරු කළද කිට්ටු සම්බන්ධකම් පැවැත්විය නොහැකිය. කිසිවෙක් සමඟ උන්වහන්සේ හුරු පුරුදු නොවෙති. ''පරීක්ෂාකාරී නොවූ මුවා වැද්දාට හසුවෙයි.''

## යෞවන මදය

කලාතුරකින් තමන් වහන්සේගේ ශිෂ්‍යයන් දක්ෂ ලෙස භාවනා කරමින් උසස් ප්‍රතිඵල ලබාගත් අය වේ නම්, උන්වහන්සේ සුහද ලීලාවෙන් සතුටු සාමීචි වෙත්. එවිට එතරම් තද දැඩි ගති නොපායි. එහෙත් මොහොතකින් ඒ ගතිය වෙනස් විය හැකිය. උන්වහන්සේගේ හැසිරීම මොහොතින් වෙනස් වේ. සෑම පුද්ගලයාට විශේෂත්වයක් දකී. ශිෂ්‍යයෝ උන්වහන්සේගේ ක්ෂණික ප්‍රතික්‍රියා ගැන විස්මයට පත්වෙති. යම් සිද්ධියක් ඒ මොහොතේම අවධාරණය කරමින් ඉක්මන් උත්තර සපයති.

තමන් වහන්සේ තරුණ කාලයේදී කළ දේ උන්වහන්සේ අප සමඟ කීහ. එය සිනහ උපදවන අතර උන්වහන්සේ සූර වීර ගති විදහා දක්වයි මම මෙහි පළකරන්නේ එම පුවතයි. යමෙකුගේ ජීවිතය පරිවර්තනය වන අන්දම ගැන සිතීමට මෙය කදිම නිදර්ශනයකි.

අතීතයේ උන්වහන්සේ ගිහි යෞවන කාලයේ ගමේ කවි, සිංදු, තරංග, විවාද වලට දිනක් සහභාගි විය. මේ තරංග වලට ''මව්ලම්'' යයි කියති. අල්ලපු ගමේ තිබූ විශාල පොලකට උන්වහන්සේ ගියේය. එහි දහස් ගණන් ජනයා එක් රැස් වී සිටියහ. වේදිකාව මත ගොඩ නැගී කවි, සිංදු, තරංගයට සහභාග වීමට එකවරම තීරණය ගති. ඒ එක්තරා දක්ෂ නිලියක් සමඟය. ඇය කවි සිංදු තරංග වලින් ජයගත් ප්‍රසිද්ධ කෙනෙකි. කිසි බියක් සැකක් නැති වූයේ ආලයෙන් කුල්මත් වූවාද ? නොදනිමු. වේදිකාවට පැන නැග එම කාන්තාව සමඟ තරංග යට පැමිණුනි. කවි සිංදු කීපයක් ගායනා කළ පසු තරුණ මන් පැරදෙන බව කාටත් තේරුම් ගියේය. වාසනවාකට මෙන් උන්වහන්සේගේ ගිහි කළ මිත්‍ර තරුණ චාඔ බුන් උපාලි එම සන්දර්ශනය නැරඹීමට පැමිණ ප්‍රේක්ෂක පිරිස අතර සිටියේය. ඔහු වයසින් අවුරුදු කීපයක් වැඩිමහලු වේ. තම මිත්‍රයා පරාජය වෙනවා දකින්ට දුක්විය. ගායනා කීපයක්ම අසමත් විය. තව ටිකකින් ඈ ඔහුව අපහාසයට ලක්කර වේදිකාවෙන් පලවා හරී. ඒ ඈ අති දක්ෂ බැවිනි. ආචාර්ය මන් නොදැනුවත්ව හමු වූයේ කොටි දෙනකටය. ඇගේ කොටි නිය, දත් වලින් සපා කෑම සුළු දෙයකි. උන්වහන්සේ කිරි බොන කුඩා පැටවෙකි. ජෑන් හෙවත් චාඕ බුන් උපාලි මෙසේ දුක්වෙමින් ඈ ඔහුට පණ පිටින් හම ගසා හමත් විකුණනවා යැයි සිතූහ. මන් කොටි දෙනෙක් නොහඳුනති. ඔහු දැක්කේ රූමත් කතක්. ඔහු මරණ බව නොදනිති. ඔහුගේ හම බේරා ගැනීමට කුමක් කරම්ද මෙසේ සිතා ජෑන් වේදිකාවට පැන්නේය. පැන,

''ඒයි මන් උඹේ අම්මා ගෙයි වහලින් වැටී මම දන්නේ නෑ ඈ තවමත් පණ තියෙනවාද ? මා උඹ හැමතැනම සෙව්වායි'' කෑ ගැසූහ. ඈ බිම වැටී සිටිනු මා දුටුවා ඈ ඔබව ගේන්ට කියා අඬනවා මුළු දවසම මම හෙව්වා මට කන්ටත් නැහැ'' මන් සහ තරුණ ස්ත්‍රිය මේ දෙයින් තැති ගැණුනි.

මගේ අම්මාට කොහොමද ?

ජෑන්ට කථා කරන්ට බැරි තරම් වෙහෙස ඇත. මෙලහකට මැරිලා ඇති. මාත් තව ටිකකින් මැරී වැටෙනවා. මෙසේ කියා මන්ගේ අතින් ඇදගෙන වේදිකා-වෙන් බැස ගති. දහසක් දෙනා විස්මිතව බලා සිටියහ. ඔහු මන් ඇදගෙන දුවන්ට වුනි. ගමේ මායිමට ආපසු මන්ට සිහිසන් නැත. අම්මාට කෙසේද ? වහලේ නැග ගෙන අම්මා මොකක්ද කළේ ? මම දන්නේ නැහැ. කොහොම වැටුණාද කියා ඈ කෑ ගසමින් බිම සිටියේ. මම දුවගෙන ආව ඔබ සොයන්ට.

අම්මා මැරෙන්ට ඇද්ද ?

අපි ඉක්මණින් ගොස් බලමු.

ඒ වන විට රෑ බෝ වී ඇත. ගමේ මිනිස්සු පසුපස ආ නමුත් එතරම් දුර යන්ට නොකැමති වූහ. කොටින්ට සහ හොල්මන් වලට භය බැවිනි. එබැවින් සියලු දෙනා එහි නතර වූහ. ජැන්ගේ මුළු ගත සිත එකවිටම වෙනස් විය. ඔහු නොසඟවා සියලු ප්‍රවෘත්ති කීවේය. මට බලා සිටින්ට බැහැ. අර ගෑනි උඹව බිම දමා පාගනවා. උඹේ හම ගලවා හෙට මාර්කට් එකේ විකුණාවි. මටයි මුළු ගමටයි මහා නින්දාවක්. ගෑනියෙක් විසින් උඹේ පිරිමිකම විනාශ කරනවා මහා සම්මචලයෙන්. මම පොඩි උපායක් රැගපෑවා. පිරිසට ජීත්තු යන්ට උඹ ඉක්මණින් යා යුතු බව මහා බැරෑරුම් ප්‍රශ්නයක් නිසා. උඹ පරාජය වන නිසා නොවේ. මගේ උපායෙන් ඒ ගෑනිත් කම්පා වුනා. ඉක්මණින් පිට වී යන්ට ඕනෑ. කවුරුවත් ප්‍රශ්න කරන්ට ප්‍රථම. ඈ බලා සිටිය හැටි මතකද ? උඹටයි අම්මටයි හරිම අනුකම්පා කළා. මම උඹ අපායෙන් මුදා ගත්තා. එය සූක්ෂ්ම උපායක් නොවේද ?

''අපරාදේ උඹ මාව නැති කලා. උඹ මොකක්ද මේ කළේ ? මම හොඳට ඈව කපලා සතුටක් ලැබුවා. උඹ මගේ සතුට නැති කළා. උඹ මට මෙහෙම දෙයක් කරයි කියලා කවදාවත් සිතුවේ නැහැ. මට හිතෙනවා ආපහු යන්ට. මමයි ඈව අරින්නේ මාර්කට්ටුවට ඇගේ හම විකුණන්ට.''

''අනේ බොරු එපා උඹ කෑලි වලට කැපුව ඒ ගෑනි. මම යන්තම් පණ බේරුවා. මෙතන එනවා බොරු කයිවාරු කියන්න. මම උඹව ආපසු එක්කර ගෙන යන්නම්. ඒ ගෑනි උඹව මස් කොටේ තියලා පෙති ගහයි.''

''එහෙම නොවේ. ඈ ගෑනියෙක් නිසා මම ටිකක් බුරුලක් පෙන්නුවා. මුලදී, එවිට ඈ හිතට අරන් මට දෙයි. ඊටපසු මම ඈව ගෝනියක දාගෙන ගිහින් වැඩිම මිලට අලෙවි කරන්ට හිතා හිටියා. උඹට මාව තේරුම් ගන්ට බැරි වුනා. මම ඈට ඇමක් දුන්නා. කොටියා වඳුරට ඇම දෙනවා වගේ.''

උඹ එතරම් දක්ෂ නම් මගේ පොඩි ප්‍රයෝගයට අසුවුණේ ඇයි ? උඹ කෙතරම් භය වුනාද යත් තව පොඩ්ඩෙන් අඬනවා ලැජ්ජා නැතිව අර ගෑනි ඉදිරිපිට. උඹ කොහේ ඒ ගෑනිව අල්ලයිද ? තව පොඩ්ඩෙන් උඹව අල්ලා ඔක්කෝටම පේන්න වේදිකාවෙන් බිම විසි කරනවා. ඔච්චර බොරු කයිවාරු එපා මන්. මම සහෝදරයෙක් වගේ උඹව බේරා ගත්තා ඒ ගෑනිගෙන්.''

එදා මන් සහ ජැන් දෙදෙනාම රාත්‍රී පොල ගැන සිතමින් දුක් වුහ.

ගිහි කාලයේ වුවද මේ මහා පුරුෂයන් දෙදෙනාගේ ජීවිත ප්‍රවෘත්ති ඉතාම චමත්කාරජනකය. ලෝකාස්වාද රතියෙන් කළ කථා වුවද යම්කිසි දක්‍ෂතාවයක් ඇත. ඒකට එක කීම පවා මනස්කල්පිත හැඟීම් පෙන්වයි. ආචාර්ය මන් මේ කථා පුවත් කියන විට එම සිද්ධිය රංගපෑමක් වැනිය. ආස්වාදයක් ඇති කෙරේ. මෙවැනි කථා පුවත් එමටය. නමුත් මේ පොඩි උදාහරණයෙන් පාඨක ඔබට යම්කිසි අවබෝධයක් ලැබේ යැයි සිතමි. උන්වහන්සේලාගේ ගිහි කාලයේ කළ කථා සල්ලාප වුවද දක්ෂ තර්ක හා වාද ඇත. ඒවා අහිංසකය. විනෝදාත්මකය. බොළඳය. අව්‍යාජය. අන්තිමේදී මේ දෙදෙනා ගිහිගෙයින් නික්ම ඝන වනාන්තරවල ධූතාංග ආචාර්යවරු වුහ. චාඕ බුන් උපාලි ගුණුපමාචාර්ය සහ ආචාර්ය මන් භූරිදත්ත යනු මුළු තායිලන්තය නමස්කාර පූජාවෙන් උපහාර දක්වන මහා රහත් ඉසිවරයන් වේ.

මන් සහ ජැන් නම් සඳහන් කළේ ඒ ආචාර්ය මන් පැවසු භාෂාව අනුග මනය කිරීමටය. කලාතුරකින් මෙවැනි සතුටු සාමීචි කථා සල්ලාප අසන්නට ලැබේ. භික්ෂුන් වහන්සේලා නිතර දෙවේලේ භාවනා යෝගී වෙමින් සති පඤ්ඤාවෙන් ගත කරන්නේ තද, අපහසු ජීවිතයන්ය. එහි විරාමයක්, ලිහිල් බවක් නැත. ඒ මහා ථේරවරුන්ගෙන් සහ ඔබ සැමගෙන් (යම් දෝෂයක් මෙම පුවත්වල ඇතොත්) සමාව අයදිමි. එම පුවත් ශිෂ්ට භාෂාවෙන් ලියූ විට එහි හාස්‍ය රසය නැති වී යන බැවිනි. මෙසේ ලීවෙමි. ඒ අය අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාවය මින් හොඳාකාර පිළිඹිබු වේ. මට මේ කථාව ඇසූ ආකාරයෙන්ම ලිවීම පහසු විය. අද සිටිනා මේ දෙනම හා එකල සිටි ආකාරය අනුව සිතන විට විස්මිත කම්පාවක් ඇති කරයි.

ආචාර්ය මන් නිතරම වර්තමානයේ ජීවත් වන බැවින් අතීතය ගෙන හැර දක්වන්නේ කලාතුරකිනි. එහෙත් වරින් වර ආචාර්ය චාඕ බුන් උපාලි

තෙරුන්ගේ දක්ෂතාවය ගැන සඳහන් කරයි. එක් දිනක් වෙස්සන්තර ජාතකය පිළිබඳ සාකච්ඡා කළහ. ආචාර්ය මන් මද්‍රී දෙවියන්ගේ මව්ගේ නම කුමක්දැයි ආචාර්ය මාඕ බාන් උපාලිගෙන් විමසීය. ''මම ඒ නම සඳහන් තැනක් ත්‍රිපිටකයේ දැක්කේ නැත. මට වැරදුණා විය හැකියි.'' චාඕ බුන් උපාලි තෙරුන්ගේ ප්‍රති වචනය සැණින් ලැබුණි.

''ඔබ මද්‍රීගේ මව දැකලාවත් අහලවාත් නැහැ ? නරගයේ සියළු දෙනාම එය දනී. තාමත් සොයා ගන්ට බැරි වුනේ ඇයි ? ඔබ කොහේද සෙව්වේ ?

ත්‍රිපිටකයේ ඒ නම නැති බව ආචාර්ය මන් නැවතත් කීය. ත්‍රිපිටකයේ ? මොන ත්‍රිපිටකයේද ? අර ලොකු ගෙදර හතරමං හන්දියේ පන්සලට යන පාරේ කටකාර ඔප් නෝනා ?

ආචාර්ය මන් අන්දුන් කුන්දුන් විය. වෙස්සන්තර කථාවේ යම්කිසි පන්සලක් ගැන සඳහන් වේදැයි මතක් කළහ. මොන හන්දියද ? මොන පන්සලද?

''මද්‍රිගේ අම්මාගේ ගෙදර ඔබේ පන්සල ළඟ ? මද්‍රිගේ අම්මා දන්නේ නැත්තේ මොකද ? අනේ ! අපොයි ! මද්‍රි සහ ඇගේ අම්මා ඉන්නේ ඒ ගමේමයි ඔබ දැකලාවත් නැහැ ! ගිහින් ත්‍රිපිටකයේ සොයනවා. මටත් ලැජ්ජයි ඔබ ගැන.''

ආචාර්ය බුන් උපාලි මද්‍රි සහ ඇගේ අම්මා ඉන්නේ ඔබේ ගමේමයි කී විට ආචාර්ය මන් හට මතක් විය. මීට ප්‍රථම වෙස්සන්තර ජාතික කථාව ගැන සිතූ බැවින් අන්දුන් කුන්දුන් විය. ''ආචාර්ය බුන් උපාලිගේ හාස්‍ය රසය, ක්ෂණිකයි, මුබරි වුවද කථාවෙහි දක්ෂ බුහුටි කමක් ඇත. යමක් රසවත් ලෙස කියාපායි එය බුද්ධිමත්ව සිනහ පහළ කරන විමතිය ඇති කරන අයුරු කීමට සමත් වෙතියි'' ආචාර්ය මන් පැවසුවේය. මේ කථාව කියා ආචාර්ය මන් සිනාසුනහ.

කලක් චියාං මයි හි මඒ පාං දිස්ත්‍රික්කයේ බන් නම් මඕ ගමේ ආචාර්ය මන් වස් විසූහ. නිතරම පාහේ ශක්‍ර දේවේන්ද්‍රයා බොහෝ දේව පිරිස කැටුව උන්වහන්සේ බැහැ දැකීමට එහි පැමිණේ. ගිම්හානයේ දී කඳු මුදුනේ පිහිටි ''ඩොක් බම්'' ගල් ගුහාවට යති. ශක්‍ර දේවේන්ද්‍රයා තම පිරිස සමඟ එහි එති. ගණනින් සියක් දාහක් පමණ ඇත. අන් දෙව්වරු මෙන් නොව ශක්‍ර දෙවිඳු විශාල පිරිස සමඟ එති. නිතර මේ පිරිස එහි පැමිණෙති. කලින් පැමිණ නැති අයට ශක්‍ර දෙවිඳු වැඳුම් පිදුම් කරන ආකාරය, ධර්මය ශ්‍රවණය කරන ආකාරය කියා දෙයි. ආචාර්ය මන් බොහෝ විට මෙත්තා ආදී අප්‍රමාණ ධර්ම ගැන කියති. දෙව්වරු බ්‍රහ්ම විහාර ධර්ම කොටස් ඇසීමට වඩාත් ප්‍රිය බැවිනි.

මනුෂ්‍ය ආවාසයෙන් තොර වූ බන් නම් මඕ සහ ඩොක් බාන් ප්‍රදේශයට දෙවිවරු වඩිති. නොයෙක් තරාතිරමේ දෙවිවරු එහි වඩිති. මේ අය ආචාර්ය මන්ට සහ මෙම පාළු ප්‍රදේශයට බෙහෙවින් ප්‍රිය කරති. ඉතා ප්‍රවේසමෙන් සක්මන් මළුව අයිනෙන් එති. එය අති පූජනීය වේ. කෙළෙසිය යුතු තැනක් නොවේ. ගමේ මිනිස්සු වැලි අතුරා එය පිරිසිදු කර ඇත. නාග දේව කොට්ඨාසද එසේමයි. සමහර විට එහි නායකයා තුන්වරක් සක්මන් මළුව ප්‍රදක්ෂිණා කරයි. සමහර විට දේව නාගයෝ උන්වහන්සේට යම්කිසි උත්සවයකට ආරාධනා කරති. මිනිසුන් මෙනි. වැලි මළුව ඉහිරී ඇත්නම් දන නමා අත්වලින් වැලි පිස දමති. මේ අයගෙ ් හැසිරීම පුදුමාකාර සංයමකි.

මිනිසා මේ ධර්මය ආරක්ෂා කරන්නේ නම් මේ දෙවියන් නාගයින් මෙන් භක්ති ඇති කර යුතුයැයි ආචාර්ය මන් පවසයි. මිනිසාට මේ අමනුෂ්‍යයින්ගෙ ් හැසිරීම දැක්ක නොහැකිය. එය අවාසනාවකි. මිනිසාට දෙවියන්ගෙන් ලබා ගත හැකි දේ අපමණය. මිනිසා තම මිනිස් දිවිය පවා නිකරුණේ අයාලේ ගත කරති. එහෙයින් සතුට තෘප්තිය නොලැබේ. ඇත්තෙන්ම ශාසනය යනු සිල් ගුණය, ශීලාචාරය වඩන ආකාරයකි. මේ උතුම් ප්‍රතිපත්ති බුදු සසුනේ දක්වා ඇත. එය අනුගමනය නොකිරීම අපරාධයකි

හදවත යනු ලෝකයේ ඇති ඉතාම වටිනා වස්තුව බව ආචාර්ය මන් නිතර කියයි. හදවත අශිෂ්ට, අසභ්‍ය වූ විට අවට පරිසරය දූෂණය වේ. කුණු වූ දෙයක් නිසා අවට ප්‍රදේශය අපිරිසිදු වන්නාක් මෙනි. මෙවැනි දූෂිත මනස් නිසා ධර්මය වුවද කෙළෙසේ ධර්මය අති පරිශුද්ධ වුවද එවැනි දූෂිත මනස නිසා අපිරිසිදු වේ. සුදු පිරිසිදු වස්ත්‍රයක් මඩ ගාන්නාක් මෙනි. දුස්ශීල පුද්ගලයෙක් ධර්මය දේශනා කරන විට එහි කිසි ප්‍රතිඵලයක් නැත. අශික්ෂිත දරදඬු නීච මිනිස්ස ධර්මය කෙතරම් උතුම් වුවද, අදහන්නේ ඒ නීච නොසරුප් අන්දමටය. ඒ අයට ධර්මයේ කිසි ඵලක් නැත. බෞද්ධයන් වශයෙන් ලෝකයාට ප්‍රදර්ශනය කරති. තමන් ඒ ධර්මය අනුගමනය නොකරති.

ශාසන යන්නෙහි තේරුම මෙසේය. ශාසනය යනු අපිමයි. අපේ ක්‍රියා පටිපාටිය හොඳ හෝ නරක නම්, අපේ සතුට, දුක් යම් තරමක්ද එය ශාසනයට බලපායි. එක් එක් කෙනාගේ හැසිරීම ශාසනය වේ. ශාසනය යනු පරිබාහිර දෙයක් ලෙස සිතීම විශාල වරදකි. එබැවින් තමාගේ හැසිරීමද වැරදි වේ. වැරදි දේ කෙතරම් වුවද වැඩක් නැත. යමක් වැඩදායක වන්නේ එය හරි නම් පමණි. යමෙකුගේ ගුණය, සත්‍යය මත ශාසනය රැදේ. ඉතා සංක්ෂිප්තව කීවොත් අපේ හදවත වැරදි නම් අපි කරණ සියල්ලම වැරදි වේ. උදා. ''වරද ඇතොත්'' ගණන් මිනුම් වැරදේ. ඇඳුම් නොගැලපේ. වාහන තදබදය විෂම වේ. විවාහ වූ අය එම නීති කැඩීම නිසා මහත් ව්‍යවසනයට පත්වේ. තමන් ගත් පොරොන්දු කඩ

කිරීම නිසා දරුවන් හා දෙමාපියන් විරුද්ධ වේ. ධනය අයුතු ලෙස නීති විරෝධීව සපයති. නීති පතියෝ නීති කඩ කරති. ආණ්ඩුවේ නිලධාරීහු තම රට වැසියාට සුභ සෙත පිණිස ක්‍රියා නොකරති. ඒ අය වංචනිකය. මිනිසාගේ සතුරන් මෙනි. ''වරද ඇතොත්'' එහි කිසිම වටිනාකමක් නැත. මිනිසා ප්‍රපාතයට පත්වේ.

අපේ වැරදි නිසා අපේ වින්දනය කෙසේ වෙතත් එහි අනිෂ්ඨ විපාක නැති කළ නොහැකිය. මේ වැරද්ද සිදුවන්නේ හදවතේය. එය තම මනස් හට ගන්නා වරදකි. එහි විපාක දුක් ගෙන දේ. අපි වරදක් කළ විට එහි ඇතිවන දුක් විපාක අපටමය. වරදක් කර එහි විපාක වලින් ගැලවී යාමට බොහෝ දෙනා සිතති. එය කළ නොහැක. කවදා නමුත් එම විපාක තමන්ට විඳින්නට වේ. මෙය විශ්ව ධර්මතාවයකි. එබැවින් වරද කෙරෙහි මධ්‍යස්ථ වීම, උදාසීන වීම, නොසැළකීම, අමතක කිරීම නිසා පුද්ගලික අලාභ හානිවලට පත්වේ. එය මේ ආත්මයේදීම ඵල විපාක දේ. මේ සත්‍යතාවය නොසළකා දියුණු වීමේ මඟ සෙවීම සෙවනැල්ලක් අල්ලන්ට යාමක් වැනිය. මිනිසා තුළ අවිද්‍යාවෙන් හා මෝහයෙන් මුලාවීමක් සිදුවේ. ශාසනය යනු එවැනි මුලාවක් නොවේ. ශාසනය රකින කෙනෙක් එම මාර්ගයෙන් බැහැර වූ විට තමාට ලැබෙන දුර්විපාක ශාසනයේ වරදක් නොවේ. එය තමන්ගේම වල කපා ගැනීමකි. ඉන් මිදීමක් නැත. ශාසනය කවදත් පිරිසිදුය. නොවෙනස්ය. නිවැරදිය. ශාසනය, හස්න, සස්න හෙවත් පණිවිඩය යන අර්ථය ඇත. සියලු බුදුවරුන්ගේ පණිවිඩය එයම වේ. ''එතං බුද්ධානං සාසනං''

ශාසනයේ සත්‍යතාවය ගරු කරණ අයට ධර්මයේ ආශිර්වාදය ලැබේ යන්න නිතරම ආචාර්ය මන් ප්‍රකාශ කරති. එවිට තමන් ඉවසිල්ලෙන් සැනසිල්ලෙන් ජීවත් වේ. අන් අයද පරිසරයද සුවදායක වේ. නෑ මිත්‍ර සබඳතා සැර පරුෂ නොවේ. වාද, භේද, රණ්ඩු, ඇණ කොටා ගැනීම් නැත. මිනිසා සැප ප්‍රාර්ථනා කරති. නමුත් සැප නොලැබේ. ඊට හේතුව සිත දූෂිතය. සිතුවිලි වරදෙහි බැඳේ. මෙවැනි ගිනිගත් සිතකින් ව්‍යාපාර කටයුතු, වැඩ රාජකාරී කරත්. කොතැනට ගියත් කුමක් කළත් ඒ ගිනිගත් හිත නිසා සාමකාමී සමබර ජීවන රටාවක් ගෙන යා නොහැකිය. එවැනි පුද්ගලයින් තම හදවතේ ගිනි නිවගෙන සිසිල් කරගන්ට නොසිතති. දූෂිතයන්ට පමණක් සතුට සන්තෝෂයක් ළඟා කර ගැනීමට සිතති. එහෙත් සිත නිවෙන තුරු සතුටක් නොලැබේ.

තමන් වහන්සේගේ මුළු ජීවිත කාලය භික්ෂුවක් වශයෙන් ගත කළේ ධර්මය විචාරීමෙන්ය. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මයේ ගැඹුර, දිග, පළල මහා සාගරයට වඩා අතිශයින්ම වැඩිය. ඇත්තෙන්ම ශාසනය ගැන හිතා නිම කරන්නට බැරි තරම් ගරු ගාම්භීරය. එහි සියුම් ලක්ෂණ දැක ගැනීමේදී ඇතිවන ප්‍රතිඵල විස්මිතය. විස්තර කිරීමට නොහැකිය. උන්වහන්සේ උදේ සිට රෑ වන තුරුත් බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවනට වැඳ වැටී නමස්කාර නොකරන්නේ

බලා සිටින අය පිස්සෙක් කියා සිතන බැවිනි. නැතහොත් කිසිම විවේකයක්, කනස්සල්ලක්, මහන්සියක් නැතිව සතුටින් සන්තෝෂයෙන් තෙරුවන් නැමදීම සදාකාලයේම කළ හැකිය. උන්වහන්සේ පරමාර්ථ වශයෙන්ම දන්නා එක් දෙයක් ඇත. එනම් බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවනින් උන්වහන්සේ කිසි දිනක වෙන් නොවන බවයි. මෙය නම් අකාලික ගුණයයි. එය විශ්ව ලක්ෂණයක් වූ අනිත්‍යය, දුක්ඛ, අනාත්ම ස්වභාවයෙන් හාත්පසින්ම විරුද්ධ වේ. මේ විශ්ව ස්වභාවයන් සත්ත්වයාගේ සිත නිරන්තරයෙන් පීඩාවට පත්කරවයි.

## කර්මයේ ගුප්ත විපාක

ආචාර්ය මන් චියාං මයි කඳුකරයේ වාසය කරන කල්හි මධ්‍යම රාත්‍රිය පසුවන විට දිනපතා එක්තරා සංඥාවක් දකී එනම් කාන්තාවක් සහ කුඩා සාමනේර නමක්. මේ ගැන විපරම් කිරීමට සිතා කුමක් නිසා මෙසේ දිනපතා එහෙ මෙහෙ යන්නේදැයි විමසුවේය. ඒ අය කනස්සල්ලෙන් ජීවත් වෙති. ඊට හේතුව ගිය ආත්මයේදී එක්තරා ස්ථූපයක් ගොඩනැංවීමට දෙදෙනා වෙර වැඩූහ. එහෙත් එය නිම කිරීමට ප්‍රථම මරණයට පත්වුණි. කුඩා සාමණේර නම එම ස්ත්‍රියගේ බාල සහෝදරයා විය. මේ සිද්ධිය ගැන බලවත් කම්පාවීමක් හා පසු තැවිල්ලක් නිසා මෙසේ උපතක් ලදහ. එහෙත් ඒ දෙදෙනා දුක් විඳින්නේ නැත. නමුත් සැප ඇති භවයක් ඉපදීමට කැමැත්තක්ද නැත.

ආචාර්ය මන් ඔවුන්ට ධර්මය දේශනා කළහ. පසුගිය දේ ගැන තැවෙන්ට එපා. ඒ ගැන කිසිදෙයක් කරන්ට බැහැ. හිතුවාට වැඩක් නැත. ඔරලෝසුව ආපසු කැරකීමක් වැනිය. එසේ සිතීම නිසා මහත් වූ දුක, භය, සැක හට ගනී. අසහනය ඇතිවේ. කෙතරම් ප්‍රාර්ථනා කළත් නොලැබේ. අනාගතය ගැන සිතීමද වැරදියි. අනාගතය තාම ඇවිත් නැත. එබැවින් අතීතය හා අනාගතය අත් හරින්න. වර්තමානයේ පමණක් යමක් කළ හැකිවේ.

ඔබට ස්ථූපය නිම කරන්නට නොහැකිවීමට හේතු ඇත. ඒ හේතු තිබුණා නම් ඔබ මරණයට පත් වන්නේ නැත. මරණය සාමාන්‍ය දෙයකි. එය ඉක්මවීමට නොහැකිය. දැන් එය සෑදීමට කෙතරම් සිතුවත් එය කළ නොහැකිය. තව තව සිතීමෙන් තව තව වැරදි සිදුවේ. මේ නිසා ඔබට හොඳ උප්පත්තියක් නොලැබේ.

ස්ථූපය ගොඩ නැංවීමෙන් බලාපොරොත්තු වන්නේ පිං ලබා ගැනීමටයි. එහි ඇති වැලි, සිමෙන්ති වලින් වැඩක් නැත. ඔබ ගත් මහන්සිය නිසා කුසල් චේතනා ඇති වී පිං රැස්වේ. මේ පින පමණයි ඔබට අත් වන්නේ. ගල් වැලි

වලින් වැඩක් නැත. හොඳ දේ කරන, සියලු දෙනාම ගෙනි යන්නේ පිං පමණයි. තමන් දුන් භෞතික දේ ගෙනි යන්නේ නැත. පන්සලක්, භික්ෂු ආවාසයක්, භාවනා ශාලාවක්, වතුර ටැංකියක්, පොදු ගොඩනැගිල්ලක් හෝ යම්කිසි ද්‍රව්‍යමය දෙයක් ආදිය බාහිර වස්තූන්ය. ඒවා දීමට ඇති චේතනාව නිසා තම මනසේ පිං සිත් ඇතිවේ. එහි විපාක ඔබ ගෙන යති. ද්‍රව්‍යමය දේ කලක් යන විට විනාශ වී යයි. මේවා ද්‍රව්‍ය පමණි. එහි දේව ලෝකයක් හෝ අපායක් නැත. ඒවා දුන් චේතනාවේ කුසල කර්ම හට ගනී. එහි විපාක ගෙන යති.

දන් දීමට ඇති කැමැත්ත, මහන්සිය නිසා තම සිතේ කුසල් ඇතිවේ. එහි චේතනාව හොඳ බැවිනි. හදවත ගුණවත්ය, හදවතේ පිං රැස්වේ. හදවතත් දේව ලෝකය වේ. නිවන වේ. මග්ගඵල වේ. මේ සියල්ල ඇති වන්නේ හදවතේ හෙවත් සිතේ.

ඔබ ස්ථූපය සෑදීමේදී ඔබේ සිතේ තණ්හාවක් ඇති වී තිබේ. හොඳ දෙයක් ගැන වුනත් තණ්හාව පහළ වේ. එබැවින් එහි ඇල්ම බැල්ම ඇතිවේ. ඒ නිසා ඔබ තවමත් එහි ඇලී ගැලී සිටියි. තමා කරගත පින නිසා සතුටු වූවානම් ඔබ හොඳ භවයක උපදිනවා. පිං කවදාවත් පව් වන්නේ නැහැ. පිං යනු අකාලික ගුණයකි.

අතීතය ගැන තැවෙන්න එපා. එසේ සිතමින් තම කාලය නාස්ති කරන්න එපා. හරි විදියට හිතන්න. භය සැක දුරු කරන්න. වර්තමානයේ වාසය කරන්න. එවිට මග්ගඵල නිවන ලැබේ. අතීතය හා අනාගතය ඔබේ දියුණුව වළක්වයි.

ඔබ දෙදෙනා ගැන මට හරි සංවේගයි. ඔබ හොඳ කර්මයක් කර ඇත. එහෙත් ගල් වැලිවලට තණ්හාව උපදවාගෙන ආසා කර ඇත. ඒ ආසාව නැති කර ගන්න. ඔබේ කුසල් විපාක එවිට ඵල දෙයි. ඉන්පසු ආචාර්ය මන් පන්සිල් විස්තර කළහ.

1. සෑම ජීවියෙක්ම තම ජීවිතයට ප්‍රිය කරති. එබැවින් පරපන නැසීමෙන් වළකින්න.

2. සෑම දෙනාම තම අයිති දේවලට ප්‍රිය කති. ඒවා එතරම් වටිනා නොවූවත් අයිතිකාරයාට එය වටින්නේය. හොර සිතින් අනුන්ගේ දේ ගැනීම නිසා තමාගෙ ් සිත දූෂිත වේ.

3. ස්වාමි භාර්‍යයා දූ දරු මාපිය ආදීන් එකිනෙකාට ආදර කරති. තමාගේ ආදරවන්තයින් අන් අය පැහැර ගන්නවාට අකමැති වෙති. ඒ ඒ අයගේ පුද්ගලික අයිතිය ගරු කළ යුතුය. ස්වාමි භාර්‍යාවන් අන් අය සමඟ අනාචාරයේ හැසිරීම මහත් දුක් දෙන්නකි. එය මහත් පාප කර්මයකි.

4. බොරුව නිසා විශ්වාසය බිඳ හැලේ. පෞරුෂත්වය නැති වේ. සතුන්වත් බොරු රැවටිල්ල නොකරති. බොරුවෙන් වංචාවෙන් වළකින්න. මත්පැන්, මත්ද්‍රව්‍ය සිහි විකල් කෙරේ. හොඳ සිහිය ඇති පුද්ගලයා වුවද බීමත් කම නිසා ශාරීරික මානසික රෝගීන් වෙති. තමන් සහ තම ආදරවන්තයින් අසල්වාසීන් විනාශ වේ.

මේ පන්සිල් රැකීම නිසා මහත් ඵල ප්‍රයෝජන ලබාගත හැකිය. පළවෙනි ශික්ෂාවෙන් දීර්ඝායුෂ ලැබේ. දෙවෙනි ශික්ෂාවෙන් තම අයිතිවාසිකම් රැකේ. තුන - තම පවුලේ ආදර භක්තිය තහවුරු වේ. හතර - තම වචන සත්‍යය වූ විට මිනිසුන් සහ දෙවිවරු ගරු කරත්. ආදර කරත්. අවංක අයගෙන් කාටවත් හිරිහැරයක් නැත. පහ - මත්පැන් නොබොන අය දක්ෂ වේ. නුවණ ඇතිවේ. නොරැවටේ. මොලය අවුල් නොවේ.

මේ පස් පවින් වැළකෙන අය මිනිසාගේ ජීවිතය, සමගි සම්පන්න කරත්. විශ්වාසවන්ත කරත්. පස්පව් කරන්නා සතුන්ට මිනිසාට සීමාන්ති දුක් පීඩා දෙයි. තමන්ගේ ජීවිතයට ආදර මෙන්ම අනුනුත් තම ජීවිතවලට ආදර කරත්. එබැවින් කිසිවෙකුට දුක් කරදර දෙන්ට එපා. සිල්වත් හොඳ ගතිගුණ නිසා ස්වර්ගයේ උපදී. මේ ධර්ම දේශනාව මතක තබා ගන්න. ඒ අනුව පිළිවෙත් පුරන්න. ඔබගෙ" අනාගතය ඒකාන්තයෙන් සඵල වේ.

එම කාන්තාව සහ කුඩා සාමනේරයන් මේ ධර්මය ඉතා සතුටින් අසා සිටියහ. උන්වහන්සේගෙන් පන්සිල් ඉල්ලූහ. උන්වහන්සේ පන්සිලි දුනි. ඉන්පසු ඉතා ගෞරවයෙන් අවසර ගෙන අතුරුදහන් විය. මේ දෙදෙනාගේ ඉහත කුසල ක්‍ර්ම බලයෙන් ද බණ අසා පන්සිල් රැකීම නිසාද මිය ගොස් තව්තිසා දෙව්ලොව උපත ලැබූහ.

ඉන්පසු මේ දෙවිවරු දෙදෙනා නොඩකවාම ආචාර්ය මන් හමුවීමට අවුත්, තම ප්‍රීතිය ගැන කියා ස්තුති කරති. මෙපමණ කාලයක් දෙව්ලොව සැප සම්පත් විඳීමට තිබූ ආසාව දැන් මුදුන් පත් විය. තණ්හාව, ආසාව ඉතා භයංකර බව ඔවුන්ට වැටහෙන බව කීහ. ඒ නිසා හොඳ ආත්මයක් නොලැබේ. උන්වහන්සේගෙ" ධර්මාන්විත උපදෙස් ලබා ගෙන දෙව්ලොව උපත ලදහ.

ආචාර්ය මන් ධර්ම දේශනා කරමින් බලවත් හැඟීම්, උද්වේග ආවේග අති කර ගැනීම නුසුදුසු බවත් එය මරණාසන්න මොහොතේදී බලපාන බවත් පහදා දුන්හ. යමෙක් සමඟ ඇති කරගත් ප්‍රේම සම්බන්ධතා හෝ වෛර, ක්‍රෝධ, පළිග ැනීම් වැනි බලවත් ආවේග සිත අල්ලා ගනිත් චුති සිත තම කය අත් හරින විට මෙවැනි උද්වේගයන් සිහිපත් වුවහොත් ඊළඟ ආත්මය අපාය, ලෝක, යක්ෂ, ප්‍රේත හෝ තිරිසන් ආදී දුක්ඛිත තත්ත්වයට පත්වේ.

එබැවින් අපි සිහි කල්පනා ඇති මනුෂ්‍ය ලෝකයේ වාසය කරන විට නිතරම තමාගේ සිත් ගැන විමසිලිමත් විය යුතුයි. මනුෂ්‍යයන් වශයෙන් අපේ වැරදි අවබෝධ කර ගෙන ඒවායින් මිදීමට මහන්සි දැරිය යුතුයි. එවිට අවසාන මොහොතේදී මරණාසන්නවූ විට හොඳාකාර සිතිවිලි පවත්වන්ට හැකිවේවි. එබැවින් නිතරම හොඳ සිතිවිලි ඇති කරන්න. ඇලීම් ගැටීම් වලින් ඈත් වෙන්න. සියලු බන්ධනයන්ගෙන් මිදුණු තරමට අවසාන මොහොත සතුටින් තම කය දමා ගිය හැකිය.

නුවණැත්තෝ හදවත යනු ඉතාම වටිනා අවයව බව දනිති. හදවත පිරිසිදු නම් මානසික ශාරීරික සුවය ගෙන දේ. එබැවින් නුවණ ඇති බුදුන් රහතුන් වැනි උත්තමයෝ තමාගේ හදවත පිරිසිදු කර අනුන්ටත් තම හදවත පිරිසිදු කිරීමට උපදෙස් දෙති. අපේ ජීවිතය රඳා පවතින්නේ හදවතේය. අපේ සතුට, සැනසීම, දුක, තරහ, වෛර ඇතිවන්නේ හදවතේය. ඉන් කුසල්, අකුසල් කර්ම සිදුවේ. එම කර්ම අනුව නැවත උප්පත්තිය සිදුවේ. මෙසේ හදවත ඉතා ප්‍රබල ඉන්ද්‍රියකි. අප අපායට දමන්නේත් සවර්ගයට දමන්නේත් හදවතයි. එබැවින් හදවත, නිතරම හොඳ දේ සිතන්නට පුහුණු කළ යුතුයි.

ආචාර්ය මන් බණ කියා අවසන් වූ විට අළුත උපන් දෙවිවරු දෙදෙනා අධික ප්‍රීතියට පත් වූහ. ප්‍රශංසා කරමින් නොයෙක් විධියේ වර්ණනා කරමින් ඉන්පසු තුන්වරක් ප්‍රදක්ෂිණා කොට පසු පසට ගමන් කර පුළුන් රොදක් මෙන් අහසේ පාවී ගියහ.

වරෙක ආචාර්ය මන් චියාංමානි ඝන වනාන්තර කඳු ගැටයක වාසය කළහ. ළඟ පාත ගම්මානයක් නොමැත. උන්වහන්සේ භාවනා කරමින් සිටියදී අද්භූත නිමිත්තක් පහළ විය. පාන්දර 3ට පමණ ඇත. ශරීරයේ සතර මහා භූත කෙටස් ඉතා සියුම්වන වේලාවකි. උන්වහන්සේ නින්දෙන් පිබිදී භාවනා කරමින් සිටියහ. එවිට තද සමාධියකට නැගීමට සිත්විය. ඒ අනුව සිත සමාධිගත විය. පැය දෙකක් පමණ ඒ සමාධියේ සිටියහ. ඉන්පසු සිත ඉන් මිදී සාමාන්‍ය ස්වභා-වයට ටිකින් ටික පත්වෙමින් සිටියේය. එහෙත් සාමාන්‍ය ස්වභාවයට පත් නොවී උපචාර සමාධියේ නතර විය. එවිට පුදුම දර්ශනයක් ඇතිවිය.

අති විශාල ඇතෙක් ඉදිරියේ පෙනී සිටියේය. උන්වහන්සේ ළඟට පැමිණ දණ ගසා තමාගේ පිට උඩ නගින ලෙස සිටී. ආචාර්ය මන් ඔහුගේ පිට උඩට නැග බෙල්ලේ දෙපැත්තේ පා දමා සිටි විට තවත් තරුණ භික්ෂූන් දෙනමක් ඇතුන් පිට නැගී පිටුපසින් එනවා දුටුවේය. ඒ ඇතුන් ඉතා විශාල වුවත් උන්වහන්සේ ඇතා තරම් ලොකු නැත. ඇතුන් තුන්දෙනාම ඉතාම ලක්ෂණ රාජකීය තේජස් ඇත. රජුගේ මංගල හස්තීන් මෙනි. උන්වහන්සේගේ සිත අඳුනති. මේ ඇතා

උන්වහන්සේ සහ අනිත් භික්ෂූන් සමඟ ඉදිරියේ ඇති විශාල කඳු ගැටයක් කරා ගෙන යති. සැතපුම් භාගයක පමණ ඈත.

මේ දර්ශනය තුළ අසාමාන්‍ය තේජස් ඇත. උන්වහන්සේ සම්මත ලෝකයෙන් පිටතට ගෙන යති. එම කඳු මුදුනට ගිය විට විශාල ගල් ගුහාවකි. ගල් ගුහාවේ ඇතුළට ගෙන ගියහ. ඉන්පසු ඇතා ආපසු හැරී එළියට මුහුන ලා සිටියහ. ආචාර්ය මන් ඇතු පිටය. ඔහු පස්සෙන් පස්සට ගියේය. දැන් පස්සා ගාත් ගල් ගුහාවේ ඇතුල් බිත්තියේ ගෑවේ. අනිත් ඇතුන් දෙදෙනා දෙපත්තේ සිටිති. ඔවුන් ඇතුලට මුහුණ ලා ඇති අතර ආචාර්ය මන් පිටතට මුහුණ ලා සිටිති. එවිට ආචාර්ය මන් අනිත් භික්ෂූන්ට කථා කරමින් සමු ගනිති.

''මගේ අවසාන පැය මෙයයි. මේ ශරීරය හැර යමි. සම්මුති ලෝකය මට අදාළ නැත. නැවත කිසි කලෙක ලෝකයට නොපැමිණෙමි. උපත, මරණ මම ඉක්මවා ඇත. ඔබ දෙපල නැවත ලෝකයට ගොස් ප්‍රතිපත්ති පුරන්න. එවිට ඔබට මගේ අඩි පාරේ එන්ට හැකිවේ. මා මෙන් මේ ලෝකයෙන් නික්ම ගිය හැකිය. ලෝකයෙන් බේරී පලා ගිය හැකිය. මේ ලෝකයේ ඇලීම් වලින් ගහනය. දුක් පීඩා අනන්තය. මෙයින් නිදහස්වීම ඉතාම දුෂ්කරය. නොනවත්වාම ප්‍රතිපත්ති පිරිය යුතුය. මේ අති උත්තම සත් ක්‍රියාවට තමන් වහන්සේලාගේ අන්තිම වීර්‍යයේ හැම බිංදුවක්ම අවශ්‍ය වේ. මරණය ඉක්මවීමට භයානක සංසාරයෙන් මිදීමට මෙසේ වීර්‍යය වඩන්න. මේ නිදහස, විමුක්තිය ලැබූ පසු ඔබට මරණය ගැන කම්පා වීමක් නැත. උප්පත්තියක් අල්ලා ගැනීමක් නැති බැවිනි.

ශේෂ වූ කෙළෙස් සියල්ල ඉක්මවා යනු ඇත. කිසියම් තණ්හාවක් නැත. මේ ලෝකයෙන් කිසි චකිතයක් නතිව තුරන් වෙමි. හිර කාරයෙක් හිරෙන් මිදුනාක් මෙනි. මේ සිරුර හැර යාමට කිසි පසු තැවිල්ලක් නැත. වෙනත් අයට මරණ මෙහොතේදී කය අත හැරීමට මහත් ආයාසයක් ඇත. මගේ පිරිනිවීමට ඔබ දුක් විය යුතු නැත. එසේ දුක් වීමෙන් කිසි ඵලක් නැත. ඒ දුක් තව තවත් කෙළෙස් වැඩීමට ඉවහල් වේ. නුවණැත්තෝ එය ප්‍රතික්ෂේප කරති.

මේ දේශනයෙන් පසු ආචාර්ය මන් අනිත් භික්ෂූන් දෙදෙනාට ගල් ගුහා-වෙන් පිටවීමට කීහ. ඒ ඇතුන් දෙදෙනා මෙතෙක් නිශ්චලව දෙපැත්තේ සිටිති. ඒ සතුන් ආචාර්ය මන්ගේ පිරිනිවීම ගැන අසා දුක් මුසු වී සිටින්නාක් මෙනි. මේ අවස්ථාවේදී ඔවුන් සැබෑ ඇතුන් මෙනි. මනසේ ඇති සංඥාවක් යැයි සිතීමට නොහැකිය. එවිට ඒ ඇතුන් දෙදෙනා ගල් ගුහාවෙන් පිටවුණි. තරුණ භික්ෂූන් වහන්සේලා පිට උඩ සිටිති. ඒ සතුන් ඉතාමත් සුවචය, කීකරුය. ඉතා සෙමින් පිටවෙති. එවිට ආචාර්ය මන්ගේ ඇතා තව තවත් පිටුපසට ගියේය. ගල් ගුහාව කඩාගෙන ඇතුල් වන්නාක් මෙනි. මේ මොහොතේදී ආචාර්ය මන්ගේ සිත මේ

ලෝකයට පැමිණ ස්වාභාවික විය. නිමිත්ත නොපෙනී ගියේය.

මෙවැනි නිමිත්තක් මින් පෙර නොදිටු විරූ බැවින් ආචාර්ය මන් මේ පිළිබඳ විචාරීමක් කළහ. මෙහි අර්ථ දෙකකි. එක උන්වහන්සේගේ පිරිනිවීමෙන් පසු තරුණ භික්ෂූන් දෙනමක් නිවන් අවබෝධ කරති. දෙක සමථ විපස්සනා භාවනාව රහතුන් වහන්සේලා පරිනිවීම දක්වා භාවනා කරති. සමථ-විපස්සනාව මෙම අවසාන කාලය තෙක් උන්වහන්සේලාගේ ප්‍රතිපත්තියකි. මක්නිසාද යත් සිත සහ පංචස්කන්ධයන්ගේ පැවැත්ම හා එකිනෙක සම්බන්ධීකරණය අවශ්‍ය වේ. මරණය හෙවත් පරිනිර්වාණයේදී මේ යැපීම අවසන් වේ. ලෞකික පංචස්කන්ධය, ලෝකෝත්තර සිත හා ඇති සම්බන්ධය, යැපීම නවතී. එවිට සමාධි විපස්සනා නවතී. වෙනත් ලෞකික දේ මෙන් අහෝසි වේ. මින්පසු කිව යුත්තක් නැත. යමෙක් තමා නැගී සිටි ඇතා පස්සට ගොස් ගල් ගුහාවට කඩා ගෙන යන විට බොහෝ සෙයින් භීතියකට පත්වනවා ඇත. එහෙත් ආචාර්ය මන් ඒ දෙස බලා නොසැලී සිටියහ. එම තරුණ භික්ෂූන් නිවන් අවබෝධ කරණ නිසා උන්වහන්සේට ප්‍රීතියක් විය. එය සිදුවන්නේ උන්වහන්සේගේ පිරිනිවන් කාලයේදීය. තමන් වහන්සේ පිරිනිවීම ගැන කථා කළේ එය වර්තමානයේ සිදු වෙමින් පවතින්නාක් මෙනි. මෙය විස්මය ජනක බව ආචාර්ය මන් පැවසුවේය.

අවාසනාවකට මෙන් ආචාර්ය මන් මේ තරුණ භික්ෂූන් දෙදෙනාගේ නම් සඳහන් නොකළහ. මේ පුවත අසා මම මේ දෙදෙන වහන්සේලා කවුරුදැයි සෙවීම මහන්සි ගතිමි. මගේ දියුණුවද අතපසු කළෙමි. උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුද මේ පිළිබඳ සොයා බැලුවෙමි. තව වන තුරු ඒ පිළිබඳ හෝඩුවාවක් නොලැබුණි. මේ ජීවිත චරිතය ලියමින් සිටියදී වුවද මම ඒ පිළිබඳ නොදනිමි.

කිසිවෙක් මෙම භික්ෂූන් වහන්සේලාගෙන් එක් කෙනෙක් තමන් වහන්සේ බව නොකියති. මෙය ස්වාභාවිකය. එවැනි අති උත්තම අවබෝධයක් ගැන කථා කරන්නේ කවරෙක්ද ? එවැනි අති ශ්‍රේෂ්ඨ දෙයක් කුණු මාළු මෙන් වෙළෙඳ සැලේ අලෙවි කරත්ද ? එවැන්නකට ඇදී එන්නේ මැස්සන් නොවේද ? මෙම අවස්ථාවට පැමිණෙන යමෙක් අතිශ්‍රේෂ්ඨ ප්‍රඥාවක් සහ ගති ලක්ෂණ තිබිය යුතුවේ. එවැන්නෙක් තමා ගැන ප්‍රචාරයක් කරත්ද ? ඒ පිළිබඳ කීම නිසා මෝඩයෝ සිනා සෙති. නුවණැත්තෝ නින්දා කෙරෙති. එවැනි ප්‍රවෘත්තියකින් කලබල වන්නෝ අහස කඩා වැටෙතියි කලබල වූ හාවා වැනි අය වෙති.

මගේ සිතේ තිබූ සැකය දැන් තුනී වී ඇත. එහෙයින් ඔබගේ අවධාරණය පිණිස මේ සිද්ධිය ලීවෙමි. යම් වරදක් ඇතොත් සමාවුව මැනව. මෙවැනි කරුණු කථා කරන්නේ ඉතා කිට්ටු සම්බන්ධයක් ඇති ගුරු ගෝල පිරිස අතර පමණි. එවිට හානියක් නොවේ. මා මේ පිළිබඳ ලිවීම ගැන විවේචනයට ලක්වන බව

දනිමි. ඔබගේ කාරුණික සමාව අයදිමි.

## සාගින්නෙන් පෙළෙන ප්‍රේතයෝ

උන්වහන්සේගේ පරිනිර්වාණය තෙක් අමනුෂ්‍යයන්ට ධර්මය දේශනා කිරීම විශාල වගකීමක් විය. උන්වහන්සේ වාසය කරණ හැම ප්‍රදේශයේම අමනුෂ්‍යයන් සමඟ සම්බන්ධීකරණය තිබුණි. ප්‍රේත කොට්ඨාස තම නෑයින්ගෙ ් පිං බලාපොරොත්තු වෙමින් උන්වහන්සේගෙන් උපකාර ඉල්ලති. ඔවුන් මැරී කොපමණ කාලයක් ගත වූයේ දැයි කිව නොහැකිය. ඔවුන්ගේ ජීවත්ව සිටින ඥාතීන් කවුරුදැයි නොදනිති. ඔවුන් ආචාර්ය මන් වෙත පැමිණ ජීවත්ව ඉන්න ඥාතීන් සොයා දෙන්ට යැයි ඉල්ලති. ඔවුන් දාන දී පිං පමුණුවන්ට යැයි ඉල්ලති. තම ජීවිතය ඉතාමත් දුඃඛිත බැවින් ඉන් මිදීමට පිං ඉල්ලති. බොහොමයක් අපාය දුක් විඳ මහත් ලෙස පීඩා විඳ ඇත. මිනිස් වර්ෂ අනුව ඒ අය අපායේ සිටි කාලය කොපමණදැයි ගණන් කළ නොහැකිය. ඔවුන් අපායෙන් මිදී නැවතත් දුඃඛිත ප්‍රේත ආත්මයක කිව නොහැකි තරම් දුක් විඳිති. එම අකුසල විපාක නොනවත්වාම දුක් පමුණුවයි. ඉන් මිදීමක් නැත. සිරගෙයි සිටින තාක් කල් සිර දඬුවම් විඳීමට සිදුවනවාක් මෙනි.

ප්‍රේත නිකායේ අය අවුත් තව කෙතරම් කාලයක් මේ දුක් විඳිය යුතුදැයි අසති. ඔවුන් බැගෑපත්ව ආයාචනා කරන්නේ තමන්ගේ ඥාතීන්ට දන්වා තමන් වෙත පිං පමුණුවන ලෙසිනි. උන්වහන්සේ ඒ ඥාතීන් ගැන විමසූ විට වෙන නාඳුනන ලෝකයක් ගැන කියති. අපායේ බොහෝ කල් අනන්ත දුක් විඳි කාලය අවුරුදු දස දහසක් හෝ සියක් දහසක් විය හැකිය. ඉන් මිදී මේ ප්‍රේත ආත්මයේ ඉපදී ඇත. මේ ආත්මයේ අවුරුදු 500 දාහක් පමණ කල් ගත වී ඇත. මේ අයගෙ ් ඥාතීන් සෙවීමට නොහැකිය. ඒ අයගේ එම බලවත් කර්ම විඳ දැන් සිටින්නේ යම් පිනක් ලබාගත හැකි තැනක නමුත් ඥාතීන් සෙවීමට නොහැකිය. එබැවින් තම දුක විඳීම හැර වෙන කිසිවක් කළ නොහැකිය. බලු, බළල් ආදී කිසිවෙකුට අයිති නැති සතුන් මෙනි. ඉතා අසරණ වී ඇත.

සමහර ප්‍රේතයින්ට තරමක් උපකාර කළ හැකිය. ඔවුන් මිය ගොස් වැඩි කාලයක් ගත වී නැත. ඔවුන්ගේ පාප කර්ම එතරම් බලවත් නොවේ. ඥාතීන් පවරන පිං ඒ අයට ලැබිය හැකිය. තමත් ජීවතුන් අතර සිටින ඥාතීන්ගේ නම්, ගම්, ලිපිනය මතක් කරති. ආචාර්ය මන් එවැනි අය ළඟ පාත සිටී නම් මේ විස්තර කියා පිං ලබා ගැනීමට සළස්වති. ඒ ඥාතීන් නොයෙක් පිංකම් කිරීමටද භික්ෂූන් වහන්සේලාට දන් දීමට ද යොමු කර ඒ පින් පමුණුවති. සමහර ප්‍රේතයින්ට ඕනෑම කෙනෙකුගේ පිං අනුමෝදන් විය හැකිය. ඒ පින ඒ අයටම පවරා නැති

වුවද පිං ලබා ගනිති. ඒ අයගේ කර්ම විපාක අනුව සමහර ප්‍රේතයින්ට කාගෙන් වුවද පිං ලබා ගත හැකිය. එහෙත් සමහරු තම ඥාතීන්ගෙන් ඒ අයට පැවරූ පිං පමණක් ලබා ගත හැකිවේ.

ආචාර්ය මන් හට මේ ප්‍රේත ආත්ම ගැන බොහෝ අත්දැකීම් ඇත. ඔවුහු නිතරම කරදර කරති. අමනුෂ්‍යයින් අතරින් ප්‍රේතයෝ වඩාත්ම කරදර කරති. තමා විසින් කළ කිසිම කුසල කර්මයක් නැති බැවින් නිතරම අනුන්ගෙන් ඉල්ලති. අනුන්ගෙන් නොලැබුණොත් එ අයට ජීවත් විය නොහැකිය. ඉතාම බැගෑපත් අසරණ පිරිසකි.

පරිත්‍යාගය සහ කුසල් කිරීමේ විපාක වශයෙන් තමාගේ ස්වාධීනත්වය හිමිවේ. ජාති, ජාති මෙසේ තමන්ට අවශ්‍ය සියලු දේ ලැබෙන බැවින් තෘප්තිමත් ජීවිත ගත කරති. සියලු සත්වයෝ කර්මය දායාද කොට සිටිති. ඒ විපාක විඳීමට හේතුව තමන්ගේම කර්ම බව සිතිය යුතුය. අන් කිසිවෙකුට තමාගේ කර්ම විපාක නොලැබේ. එසේම අන් කිසිවෙකුගේ කර්ම විපාක තමා වෙත නොපැමිණේ. තමාට ලැබෙන සැප, දුක් තමාගේ කුසල් අකුසල් කර්මවල විපාක වේ.

ආචාර්ය මන් මේ නොයෙක් ආත්ම ගැන සුවිශේෂ දැනුමක් ඇති නමුත් ඒ බව හැඟවන්නේ කලාතුරකිනි. ප්‍රේත, දේව, බ්‍රහ්ම, යක්ෂ, නාග, ගරුඬ ආදී ආත්මවල අය සමඟ නිතර කථා බහ කරති. මිනිසාගේ ඉන්ද්‍රියන්ට අගෝචර බොහෝ දේ උන්වහන්සේට අවබෝධ වේ. අමනුෂ්‍යයන් පිළිබඳ කථා ඇසීමට පවා බිය උදවයි. ''මිනිසාට වතුර, ගින්න වැනි ප්‍රකෘති ඇසට පෙනෙන අන්දමට කර්ම විපාක දකින්ට හැකිනම් කිසිවෙක් පාප කර්ම නොකරති. එය මහා ගිනි ගොඩකට පනින්නාක් මෙනි. ඒ වෙනුවට හැකි තරම් හොඳ දේ කිරීමට පෙළෙඹෙති. එහි ඉතා සිසිල් ගුණයක් ඇත. ලෝකයේ තිබෙන සියලුම කරදර අතුරුදහන් වනවා නියතයි.'' වරෙක ආචාර්ය මන්ගේ වැඩිහිටි ශිෂ්‍යයෙක් මෙසේ පැවසීය. ''මින-සාට ප්‍රේත, දේව, ගරුඬ නාග ආදීන් ගැන නොදන්නා බැවින් තමන්ගේ කර්ම විපාක ගැන සිතිය නොහැකිය. එබැවින් ඔබ වහන්සේ මේ දන්නා දේ මිනිසුන්ට කියාදීම වැදගත් වේ. ''බුදුන් රහතුන් වැනි උතුම් අය තමා දන්නා දේ අනුන්ට කියා දුන්නා. ඔබ වහන්සේගේ ශ්‍රාවකයන් වූ අපි ඔබ වහන්සේගේ ඒ විස්මයජනක ශක්තිය අගය කරන්නාක් මෙන් ලෝකයා අගය කරති.

ආචාර්ය මන් ඔහු නිශ්ප්‍රභා කළහ. ඔබ කියන දේ කළ විට අපි දෙගෙ ාල්ලොම අනාථ වෙති. මෙවැනි දේ ප්‍රසිද්ධව කථා කිරීම සුදුසු නැත. එසේ කී කළ මම සහ අනිකුත් භික්ෂූහු පිස්සන් වෙති. එවිට මෙය පිස්සු ආශ්‍රමයක් වෙයි. බුද්ධ ශාසනය ප්‍රඥාව පෙරදැරි කොට ඇත. එය තමා විසින් අවබෝධ කළ යුත්තකි. ඔබ වහන්සේ කියන දේ ප්‍රඥා ගෝචරද නැතහොත් මෝහය ඇසුරු

කරත්ද ? මෙවැනි දේ සිතීම පවා පිස්සුවකි. කීම ගැන කියනු කිම ? මිනිස්සු මෙවැනි දේ ඇසුවත් අපගේ කීම නිසා අපි විනාශ වෙමු.

අප අවට ඇති පරිසරය ඉන්ද්‍රිය ගෝචර බැවින් මිනිසාට සම්මුති සත්‍යයෙන් වටහා ගත හැකිය. එහෙත් ධර්මය ප්‍රඥා ගෝචරය. පරමාර්ථ සත්‍යය ඇසුරු කරයි. එබැවින් සමාජයට මේ ධර්මය දෙන විට එයින් සතුට, සමාදානය, සහජීවනය ඇතිවිය යුතුයි. අර්ථවත් විය යුතුයි. පරමාර්ථ සත්‍යය බුදුරජාණන් වහන්සේ දේශනා කළේ නුවණ මෙහෙයවා ක්‍රමානුකූලවය. අසා සිටින අයට ගෝචර වන ආකාරයටය. සත්‍යය වුවත් එය කීමේ අවස්ථාවක් ඇත. එය පොදුවේ කීම වරදකි. ඒ මිනිසුන් වරදවා ග්‍රහණය කරණ බැවිනි.

පංච ඉන්ද්‍රියන්ට ගෝචර නොවනදේ ගැන කථා කිරීමට හැක්කේ යම් අවබෝධයක් තුළිනි. එවැනි දේ ගැන අවබෝධයක් නැතිව පොත පතේ දැනු-මෙන් හෝ අන් කිසි කෙනෙකුගේ දැනුමෙන් කථා කිරීම අස්වාභාවිකය. එබැවින් මිනිසාට නොතේරේ. මේ යමෙක් විවේචනය කිරීමක් නොව එවැනි අතීන්ද්‍රිය දැනුම ඇති අය වුවද ඉතා පරීක්ෂාකාරීව එම දැනුම ඉදිරිපත් කළ යුතු බවකි. අපේ විස්මිත දැනුම සත්‍යයක් වුවද ඒ අසා සිටින අය සිහි විකල් විය හැකිය. ඒ අය ධර්මය කියා ග්‍රහණය කරන්නේ මෙවැනි ආශ්චර්ය අද්භූත දේවල්ය. ඒ අය තරමක මානසික විකෘති ඇති අය වෙති. එබැවින් එවැනි දේ තුළින් මින-සාගේ සිත කුල්මත් කිරීම නුසුදුසුය. බුදුරජාණන් වහන්සේ එවැනි විස්මිත දේ ලෝකයා හමුවේ තැබුවේ යම් යම් අයට බුද්ධි ගෝචර විධියටය. එබැවින් අපි ඉතා සුපරීක්ෂාකාරීව ධර්මය දේශනා කළ යුතුයි.

මම මෙසේ ප්‍රශ්න කරමි. ඔබ සතු මුදල් සම්භාරයක් ඇත. එය ඔබ නුවණ ඇත්තෙක් නම් ප්‍රයෝජනයට ගත හැකිය. නුවණ නැත්නම් මේ ධනය ඔබගේ පරිහානිය වේ. මහා සේනාවක් මැද්දට යන විට ඔබ මේ මුදල ආරක්ෂා කරන්නේ කෙසේද ?

එම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයා මෙසේ කීය. ''මම හැකිතාක් එය ප්‍රවේසම් කරමි.''

ඔබ ආරක්ෂා කරන්නේ කෙසේද ?

එම මුදල් වියදම් කරන විට අවශ්‍ය ප්‍රමාණය පමණක් එළියට ගෙන මුළු මුදල නොපෙන්වා සඟවමි.

එසේ නම් ඔබට යම් අතීන්ද්‍රිය දැනුමක් ඇත. දෙවියන්, භූතයන්, ප්‍රේතයන් පිළිබඳ අත්දැකීම් ඇත. එය අනුන්ට කින්නේ කෙසේද ? ඉන් ඇති ඵලයක් නිසා නින්දා, අප්‍රශංසා, හිංසා, පීඩා තමන්ටත්, අනුන්ටත් පැනවීමටද ?

මම එම මිල මුදල් පරිහරණය කරන පිළිවෙත අනුගමනය කරමි. දැන් මොහොතකට පෙර ඔබ කීවා මෙවැනි ආශ්චර්ය අද්භූත දේ ලෝකයට දැනුම් දිය යුතු බව. ඇයි ඒ ? මගේ පිළිගැනීම අනුව ඔබ කී දේ සාමාන්‍ය කෙනෙක් වත් නොකියන විධියේ බහුභූත කථාවකි. ඔබට සාමාන්‍ය දැනුමක් වත් නැති බැවින් ඔබ මිනිසුන්ගේ ඇගයීමක් ලබන්නේ කෙසේද ? ඔබගේ සිතුවිලි විකෘතිය. ඔබට යමෙක් දොස් පැවරුවොත් ඔබ නිදහසට ඉදිරිපත් කරන්නේ කුමක්ද ? මේ ගැන සිතා බලනු මැනවි. ලොකයේ වැඩිපුර ඉන්නේ ප්‍රඥාව ඇති අයද ? මෝහයෙන් මුලා වූ අයද ? එවැනි අයට ඔබ කී විධියට කළ විට මේ ශාසනය පවතීද ?

මේ ගැන දැන් මට වැටහෙන පරිදි මා කී දේ සම්පූර්ණයෙන්ම වැරදි බව මම පිළිගනිමි. මම එසේ කීවේ ඔබ වහන්සේ කියන දේ අසා මම අධිකතර සතුටට පැමිණ අන් අයටත් එම ප්‍රීතිය භුක්ති විඳීමට සැලසීම පිළිබඳ සිතීමෙනි. එවිට ඒ අය බොහෝ සෙයින් ඉන් ප්‍රයෝජන ගනිති. මා ඉන් සිදුවන අනිෂ්ට ඵල විපාක ගැන සිතුවේ නැත. ඔබ වහන්සේ මට කරුණාව උපදවා සමාව දෙන්න. මෙවනි මෝහයකින් මා මුදාගනු කැමැත්තෙමි. මම ඉතා සුපරීක්ෂාකාරිව මින් මතුවට හැසිරෙමි.

මගේ වරද පෙන්වා දී මට දෝෂාරෝපණය කිරීම ගැන මගේ සතුට ප්‍රකාශ කරමි. ඒ දෝශාරෝපණයට මම සුදුස්සෙක් වෙමි. ඔබ වහන්සේ දැන් කියා දුන් පරිදි ලෝකයේ වැඩිපුර ඇත්තේ ප්‍රඥාවන්තයිනද අනන්ත මෝහයෙන් මුලා වූ අයද ? යන්න මෙතෙක් කල් මට වැටහුනේ නැත. අපේ ගමේ ඉන්න ගම් වාසීන් අතුරෙන් ඉතා සුළු ප්‍රමාණයකට සීලාදී ගුණ නුවණ ගැන තේරුම් ඇත. බො-හෝ අය තමන් උපන්නේ මක් නිසාද, කරන්නේ කුමක්ද යන්න ගැන තැකීමක් නැත. තමන් හොඳ කරන්නේ ඇයි ? නරක කරන්නේ ඇයි ? දැයි නොදනිති. ඒ මොහොතේ ආස්වාදය පිණිස යමක් කරති. තමන්ගේ අනාගතය දෛවයට බාර කර ඇත. ශාසනය රැක ගැනීමට හැකි, එය අනුන්ට ක්‍රමානුකූලව පහදා දීමට හැකි ආදර්ශවත් පුද්ගලයන්, ගුරුවරුන් විසින් පමණක් මේ ශාසනය රකිනු ලැබේ. ඕනෑම සාර්ථකත්වයක් සඳහා දක්ෂ නායකයෙක් අවශ්‍ය වේ.

ඊට පිළිතුරු වශයෙන් ආචාර්ය මන් මෙසේ පැවසීය. ඔබ දැන් පිළි ගන්නවා නුවණැති ආදර්ශමත් පුද්ගලයෙකුගේ මඟ පෙන්වීම අවශ්‍ය බව. එසේ නම් ඔබ පිළිවෙත් රකින භික්ෂුවක් වශයෙන් වීර්යය වැඩිය යුත්තේ කුමක් පිණිසද ? ආධ්‍යාත්මික ගුණ නුවණ තක්සේරු කිරීමට නොහැකිය. එබැවින් ඉතා දක්ෂ අයට පමණක් මේ ශාසන ප්‍රතිපදාව ගෙන ගිය හැකිය. දක්ෂකම යනු ලෝකය විනාශ මුඛයට පත් කරවන ලෝකය මුලා කරන දක්ෂකම නොවේ. දක්ෂකම යනු සූක්ෂම බුද්ධියකින් තමා ගන්නා තීරණ භෞතික අධ්‍යාත්මික සුවය පිණිස යොමු කිරීමයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සඳහන් මුල් අංග දෙක සම්මා

දිට්ටි, සම්මා සංකප්ප ගැන දක්ෂ වීමයි. මෙවැනි අංග සපුරා ලන්නේ සම්‍යක් ඥානයක් ඇති අය විසිනි.

සම්මා සමාධි වුවද සම්මා දිට්ඨි මෙහෙයවන බෙදා දැක්වීම විශ්ලේෂණය කළ හැකි සම්‍යක් ප්‍රඥාවෙන් යුක්ත විය යුතුය. නැතහොත් සමාධිය වුවද ක්‍රියා විරහිත වූ නින්දක් බවට පත්වේ. සමාධිය ඇති වූ විට එහි ප්‍රඥාව තිබිය යුතුය. නැතහොත් සියලු සංස්කාරයන්ගේ යථා භූතය දැන ගන්නේ කෙසේද ? සිත හා ගැටෙන බාහිර ලෝකය පිරික්සා බලන්නේ කෙසේද ? ප්‍රඥාව නැතිවිට තමාගෙ ් තීරණ වැරදි සහිත වේ.

සමාධි සිතට අරමණු වන අභ්‍යන්තර හා බාහිර අරමුණු අනන්තය. මේ අරමුණු හඳුනා ගන්නේ එක් එක් කෙනාගේ ස්වාභාවික දැනුම මතය. මේ අවස්ථාවේදී ගන්නා තීරණ තමා මිස අන් කිසිවෙක් නොදනී. ප්‍රඥාව මෙහිදී සත්‍යය මත පිහිටා නිවැරදි තීරණ ගනී. එවිට අන් අරමුණු අහෝසි වී තමන්ට කරදරයක් නොවේ. ප්‍රඥාව නැතිවිට සමාධි සිතක් ලැබීමත් දුෂ්කරය. තමා දකින සුභ අරමුණු කෙරෙහි ඇලීමත් අසුභ අරමුණු කෙරෙහි ගැටීමත් සිදුවේ. මේ ප්‍රතික්‍රියා තම සිතේ බලපෑමක් කරයි. එවිට ඇලීම හෝ ගැටීම සිදුවේ. මේ වන විට ප්‍රඥාව ඇත්තේ නම් ඒ අරමුණුවල ස්වභාවය හඳුනා ගනී. එවිට ඒවා නිසා මුලාවට පත් නොවේ. ප්‍රඥාව නැතිවිට බලවත් හැඟීම, උද්වේග, ආවේග නිසා සිත විකෘති වේ. ප්‍රඥාව තුළින් මෙය තෝරා බේරා අනවශ්‍ය හැඟීම් නොසළකා, නොතකා, අත්හැරිය හැකිවේ. මේ ආකාරයෙන් තමාගේ භාවනා ප්‍රගතිය නියම මාර්ගයේ යයි.

අප භික්ෂුවක් වශයෙන් චීවර දරා සිටින්නේ දැනුම හා ප්‍රඥාව ලබා යහපත් ගතිගුණ පුරුදු පුහුණු කරමින් ලෝකයේ සෑම මනුෂ්‍යයෙක්ම අගයන තත්ත්වයට පත්වීමටය. කෙළෙස් වලට වසඟ වී කෙළෙස් වලින් මවන කපටි, වංචාකාරී සිතුවිලි වලට ගොදුරු වීමට නොවේ. තම ප්‍රඥාවෙන් මේ වංචාව හඳුනා ගැනීමටය. ධර්මය හා ප්‍රඥාව නැතිවිට විනය නීති ගරු නොකරන විට තමා අවදානම් තත්ත්වයක සිටී. සිතේ වංචනික ස්වභාවය සමඟ සටන් කිරීමට ආයුධ නැත. සති, පඤ්ඤා යනු මේ යුද්ධයට අවශ්‍ය අවි ආයුධ වේ. අපේ ප්‍රතිපදාව නොකැඩී දිගටම කරගෙන යාමට නම් දෛනික ජීවිතයේදී කරන සියලු කටයුතු සති, පඤ්ඤාවෙන් කළ යුතුය. අප සිතන, කථා කරන, ක්‍රියා කරන හැම විටම සතිපඤ්ඤාවෙන් සිටිය යුතුය. මගේ ශිෂ්‍යයන් සියලු දෙනාම දුක නැති කිරීමට මහත් වීර්‍යයක් දරනවා දැකීමට මම කැමති වෙමි. මෙය කළ යුත්තෙ සති පඤ්ඤාවෙනි. එවිට ඔබ බුදුරජාණන් වහන්සේගේ අති උත්තම ධර්මය ලැබීමට සුදුස්සෝ වෙති. හැම දෙයක්ම කුසලතාවයෙන් කළ යුතුය.

මගේ ශිෂ්‍යයන් මෝහයෙන් මුලා වී නොයෙක් දේ ගැන ඇලී ගැටී වාසය කරනු දැකීමට කැමති නොවෙමි. ආත්ම තෘප්තියෙන් මැලි කමින් තම වැඩ කටයුතු පැහැර හරමින් සිටිනවා දැකීමට අකමැති වෙමි. එබැවින් තම වැඩ කටයුතු සියල්ලම සතුටින් සති, පඤ්ඤාවෙන් කළ යුතුයි.

සසර දුක් තරණය කිරීමට ගන්නා වෑයම උතුම් ම වෑයමකි. සසර දුක් ඉක්මවීම තරම් අමාරු වෙන කිසි දෙයක් නැත. තම ජීවිත පූජාවෙන් පිළිවෙත් රැකිය යුතුයි. කෙළෙස් නිසා ඔබ නැවත නැවතත් පරාජය වේ. වෙනත් වැඩක් මෙන් මෙය ආවාට ගියාට, යලට මහට කළ හැකි දෙයක් නොවේ. සැකෙන්, බයෙන් කළ හැකි නොවේ. ඔබට ඒකාන්ත සැපත වූ නිවන ලබා ගැනීමට නම් ජීවිත පරිත්‍යාගයෙන් ධර්මයට අනුව විසිය යුතුයි. වෙන අන් ක්‍රමයක් නැත. ජීවිතය පූජා කර නිවන ලැබිය යුතුය. එවිට ඔබ නැවත උප්පත්තියෙන් මිදේ.

මම පිළිවෙත් රකින කාලයේදී ජීවත් වී ආචාර්යවරයෙකු වේ යැයි නොසිතුවෙමි. ජීවිත ආශාවට වඩා සසර දුක් ඉක්ම වීමට තිබූ ආශාව වැඩිය. මගේ සෑම ව්‍යායාමක්ම ජීවත්වීම පිණිස නොව ජීවිතය ඉක්මවූ නිවන් පිණිස විය. ජීවිත හානි වුවත් මට පසුතැවිල්ලක් නැත. නිවන් ලැබීම යනු ඒකාන්ත වාසියකි. නිවන් මාර්ගයේ යෑම පිණිස දැඩි උනන්දුවක් තිබුණි. බුදුරජාණන් වහන්සේ ලැබූ උතුම් නිවන මා ලබා ගන්නේ කෙසේද ? ඒ සඳහා නොකළ හැකි පරිත්‍යාග යක් නැත. මරණය ප්‍රශ්නයක් නොවේ. ගණන් කිරීමට නොහැකි පරිදි සසරදී මරණයට පත් වූ වාර ඇත. මට කිසිවක් අවශ්‍ය නොවීය. අවශ්‍ය සියලු දේ ඇත. නැවත නූපදීවා යන අදහස මුදුන් පත් කර ගැනීම මගේ එකම අධිෂ්ඨානය විය. රෑ දවල් නොකඩවා මා දැරූ වීර්‍යය නිරන්තරයෙන් කරකැවෙන දැති රෝදයක් මෙනි. ධර්ම චක්‍රය කරකැවීමකි. කෙළෙස් කපමින් රෑ දවල් ගත කළෙමි. නිදා ගන්නා සුළු වේලාවේදී පමණක් මේ ක්‍රියාව නැවැත් වුණි. පිබිදුන වහාම සති පඤ්ඤාවෙන් කෙළෙස් කැපීම සිදු කළෙමි. ශ්‍රද්ධාව, විරිය නොනවත්වාම වැඩී ගියේය. අවසානයේදී සියලු කෙළෙස් දුරු විය. සියලු කෙළෙස් නැවත නූපදිනා ලෙස දුරු වී ගිය බව මට වැටහුණි. ඉන්පසු මම පිළිවෙත් ලිහිල් කොට විවේක ගතිමි. කෙළෙස් සංසිඳී ගිය නමුත් ශරීරය ජීවත් වේ.

මේ පිළිබඳ ඔබ සිතිය යුතුයි. ජීවිතය පරදුවට තබා කෙළෙස් සමඟ සටන් කරනවාද ? අනන්ත දුක් බරින් නිදහස් වෙනවාද ? නැතහොත් පසුතැවිල්ලෙන් මරණයට පත් වී නැවත භවයක් අල්ලනවාද ? මොන තරම් දුක් පීඩාවලට නැවත පැමිණෙනවාද ? ඉක්මන් කරන්න. මේ ගැන සිතන්න. ඔබ නැවත දුක් ගොඩක පටලැවී හිරවෙනවාද ? තමාට ලැබුණු අවස්ථාව පැහැර හරිනවාද ?

කෙළෙස් සටන ගෙන ගිය යුද බිම ඇත්තේ තම සිතේය. ශ්‍රද්ධා, විරිය, පඤ්ඤා එම සටනට අවශ්‍ය අවි ආයුධ වේ. මේ සටන ජයග්‍රහණය කිරීම යනු

නිදහස ලැබීමයි. ''තමන් තවම තරුණයි තබ බොහෝ කල් ඇත.'' ආදී වශයෙන් සිතමින් වැරදි සහිත ප්‍රතිපත්ති රකින භික්ෂුව මෙවැනි වැරදි මත අත් හැරිය යුතුය. තම සිත හා කය පමණක් අරමුණු කරමින් අනුන් හෝ බාහිර දේ ගැන සිතීම අත්හැරිය යුතුයි. සිතේ නිතරම ධර්මය රජ කළ යුතුය. එවිට කෙළෙස් නිසා ඇතිවන විෂ සමනය වේ. නිතරම සිතේ අධර්මය රජ කරන විට කෙළෙස් පැතිරී ඉතිරී ගොස් මුළු ගත සිත රෝගාතුර කෙරේ. මෝහය රජ කරමින් දුක් හට ගනී. සසර දීර්ඝ වේ. අකුසල විපාක පසුපස ගමන් කරයි. එවිට ලෝකය පුරා හොල්මන් කරණ දුක් ගිනි වලින් මිදීමක් නැත.

ආචාර්ය මන් එම භික්ෂුවකට තදින් දෝශාරෝපණය කළහ. තමන් වහන්සේගේ සෘඩි ප්‍රාතිහාර්ය ලෝකයාට ප්‍රසිද්ධ කළ යුතුයැයි එම භික්ෂුව ප්‍රකාශ කළහ. ආචාර්ය මන්ගේ පිළිතුර වටිනා ධර්ම කොට්ඨාසයකි. කලාතුරකින් ඇසිය හැකි දේ වෙත්. උන්වහන්සේ මෙවැනි ධර්මයක් ප්‍රකාශ කිරීමට එම භික්ෂුවගේ කීම ඉවහල් විය. එය දෝශාරෝපණයක් මෙන් පෙනී ගියත් එය දෝශාරෝපණයක් නොවේ. ඉන් ඒ භික්ෂුව හා අනිකුත් අයට විශාල ලාභයකි. සාමාන්‍යයෙන් උන්වහන්සේ ගැඹුරු ධර්ම පමණක් ප්‍රකාශ කරත්. එවිට සන්සුන්ව, පහසුවෙන්, සතුටින්, සැනසීමෙන් ඒ ධර්මය දේශනා කරති. අසා සිටින අයට එය යම්කිසි අඩුවක් ලෙස දැනේ. නමුත යමෙක් අනවශ්‍ය ප්‍රශ්න ඇසුවොත් හෝ ධර්මය ලිහිල් කර කථා කළහොත් හෝ සාකච්ඡාව තියුණු වුවහොත් උන්වහන්සේගේ හද තුළින් ධර්මය පිබිදී ගලා ගෙන යයි. අසා සිටින අය කුල්මත් කරමින් හැගීම් අවුස්සමින් උත්තේජනය කරයි.

මෙවැනි දේශන අසා සිටින අය බෙහෙවින් කම්පා වේ. එය විස්තර කළ නොහැකිය. මම ද දැඩි චරිතයක් බැවින් එවැනි දේශන වඩා ප්‍රිය කළෙමි. එබැවින් උන්වහන්සේගෙන් එවැනි ප්‍රශ්න ඇසූ භික්ෂූන්ට ස්තූති වන්ත වෙමි. ඔවුන් එම ප්‍රශ්න ඇසුවේ අවංක සිතකින් නිසා එහි වරදක් නැත. මගේ හදවත බෙහෙවින් තෘප්තියට පත් වුනේ උන්වහන්සේගෙන් අභියෝගාත්මකව විචාර බුද්ධියෙන් ඇසූ ප්‍රශ්නවලට ලැබුණු පිළිතුරු වලිනි. එම දේශන මට යොමු වූ නමුත් සියලු භික්ෂූන්ට අදාළ විය. මම බොහෝ කාලයක් උන්වහන්සේ ළඟින් ඇසුරු කළ පසු, උන්වහන්සේගෙන් දේශන බලාපොරොත්තු නොවී මෙවැනි ප්‍රශ්න ඇසුවෙමි. එවිට නොසිතූ විරූ දේශන උන්වහන්සේගෙන් අසන්ට ලැබුණි. ඒ ප්‍රශ්න නොඇසුවේ නම් ගතානුගතිකව සවස හමුවීමට සිදුවේ.

වරෙක ආචාර්ය මන් සහ භික්ෂූන් තුන් හතර නමක් ඈත පළාතක ගල් ගුහාවක වාසය පිණිස පැමිණ දෙතුන් දිනක් ගත වූ විට උන්වහන්සේගේ සමාධි සිතට උස් කඳු මුදනක පිහිටි විශාල ලක්ෂණ ගල් ගුහාවක් දිස්විය. අතීතයේ

බොහෝ පසේ බුදු වරුන් වහන්සේලා එහි වාසය කළ බව කීහ. එහෙත් එහි යාම අසීරුය. මහා කඳු නිසා පිණ්ඩපාත කිරීමට නොහැකිය. එහෙත් එම භික්ෂූන්ට එහි ගොස් බලන්ට යැයි කියා ආහාර ප්‍රමාණයක් රැගෙන ගිය යුතු බවද කීහ. එම භික්ෂූන් ගමේ මිනිසුන් කීප දෙනෙක් සමඟ එම කන්දට නැංගහ. කඳු මුඳුන ඉතාම ලක්‍ෂණ පරිසරයකි. ගල් ගුහාව උන්වහන්සේ කී පරිදි රමණීය පරිසිදු තැනකි. ඒ භික්ෂූන් එහිම රැඳී භාවනා කිරීමට කැමති වූහ. එහෙත් ආහාර නැති බැවින් ආචාර්ය මන් හමුවීමට පැමිණියහ.

''ගල් ගුහාව කෙසේද එය ඉතා පිරිසිදු ලක්ෂණ තැනක් බව මම සමාධි සිතින් දුටුවෙමි. මෙහි බොහෝ අද්භූත දේ සිදුවේ. එම ගල් ගුහාව භූමාටු දෙවියන් විසින් ආරක්ෂිත ස්ථානයකි. යමෙක් වැරදි ලෙස හැසුරුණොත් දේව කෝපයට පත්වේ. මේ බව ඔබට කලින් කීමට අමතක වුනෙමි. ශබ්ද නගා කෑ ගැසීම, අවිචාර හැසිරීම විශේෂයෙන් භික්ෂූන්ට නුසුදුසුය. යම්කිසි වරදක් නිසා දෙවියන්ගේ අප්‍රසාදය ඇති වී අනතුරකට පත්වේදැයි මම සිතුවෙමි.''

එම භික්ෂූන් සියලු තොරතුරු දැන්වූහ. එහි වාසය කිරීම ඉතාමත් ප්‍රිය ජනක වුවද ආහාර ලබා ගැනීමට නොහැකි බැවින් නුසුදුසු වේ. ගල්ගුහා පිළිබඳ ආචාර්ය මන් සියළු තොරතුරු දැනගෙන සිටියහ. එහෙත් එහි කවදාවත් ගිහින් නැත. උන්වහන්සේගේ භාවනා බලය එතරම් ප්‍රාතිහාර්‍ය්‍යයකි.

දෙවිවරු එම ප්‍රදේශයේ වාසය කරන බැවින් භික්ෂූන් වහන්සේලා ඉතා හොඳ සිරිත් විරිත් අනුගමනය කළ යුතුවේ. සෑමදේම පිරිසිදුවට ලක්ෂණට, පිළිවෙලට තැන්පත් කිරීම අවශ්‍ය වේ. භික්ෂුවක් උඩබැලියෙන් නිදනවා දැකීමට දෙවිවරු අකමැති වෙති. මළ මිනියක් මෙන් අප්‍රසන්නය. මෝහයෙන් සිහින දක-මින් හීනෙන් කථා කරමින් සිහි මුලාවෙන් නිදන භික්ෂූන් දෙවියන්ට අප්‍රසන්නය. නින්දෙන් හැසිරෙන අන්දම තමන් නොදැනුවත්ව සිදුවන දෙයක් වුවද දෙවියන් පිළිකුල් කරති. දෙවිවරු සමූහයක් පැමිණ මෙසේ ආචාර්ය මන්ට පවසති.

''භික්ෂූන් වහන්සේලාට දෙවියෝ සහ මිනිස්සු වැඳ නමස්කාර කරමින් ගෞරව දක්වති. එබැවින් ඒ අයගේ ආචාර සමාචාර ධර්ම නිතරම සංවර විය යුතුයි. නිදන වේලාවට වුවද ඒ අයගේ ඉරියව් ප්‍රසන්න විය යුතුයි. බලන්ට බැරි තරම් පිළිකුල් විය යුතු නැත. ගිහියන් මෙන් කථා බහ කරන අසංවරව හැසිරෙන භික්ෂූන් දැකීමට අපි නොකැමති වෙමු. ලක්ෂණට ඉරියව් පැවැත්වීමට නොහැකි ඇයි ? සුපරීක්ෂාකාරීව සියලු දේ සංවරව කළ යුතුයි. අප භික්ෂූන් විවේචනය කිරීමක් නොවේ. දෙවිවරු සෑම දෙනාම භික්ෂූන්ට ගෞරව නමස්කාර කරන්නේ උන්වහන්සේලාගේ ගතිගුණ නිසා ශාසනය රකින බැවිනි. අපි ශාසනය රැකීමට මහත් උනන්දුවෙමු. අප මේ දැනුම් දෙන්නේ ඔබ වහන්සේගේ ශ්‍රාවකියන්ට අවවාද

කරන්නට, හැම ඉරියව්වක්ම පැවැත්වීම සංවර ලෙස සතියෙන් කරණ ලෙසටයි. එවිට මිනිසුන් හා දෙවියන් සතුටට පත්වේ. වැඳුම්, පිදුම් කළ හැකි භික්ෂූන් වහන්සේලා නිසා දෙවිවරු ශාසනය රැකීමට තව තවත් උනන්දුවෙති.''

දෙවියන්ගේ මේ පණිවිඩය ලැබී ආචාර්ය මන් භික්ෂූන් වහන්සේලාට තම බඩු බාහිර ලක්ෂණට තැන්පත් කිරීම හා හැසිරීම ගැන අවවාද කළහ. පය පිසදාන රෙදි කැබැල්ල වුවද සෝදා වේලා නමා තැන්පත් කළ යුතුය. කොනකට වීසි කළ යුතු නැත. වැසිකිලි නියම ස්ථානවල සුපරීක්ෂාකාරීව ඉදිකරණු ලැබේ. යම් යම් ගස් යට වැසිකිලි තැනීම ආචාර්යය මන් තහනම් කළේය. ඊට හේතුව භූ මාතු දෙවිවරු එම ප්‍රදේශයේ ගමන් කරන බැවිනි. ඒ ගස් අරක් ගෙන විමාන ඇති බැවිනි.

දෙවියන් ගැන අවබෝධ ඇති භික්ෂූන්ට මේ අවවාද අවශ්‍ය නොවීය. උන්වහන්සේගේ බොහෝ ශිෂ්‍යයන්ට දෙවියන් හා සම්බන්ධතා ඇති බැවිනි. එහෙත් ඒ පිළිබඳ කථා කිරීමට මැලි වන්නේ අසා සිටින අයට කුතුහලයක් වන බැවිනි. එහෙත් කර්මස්ථාන භික්ෂූන් අතර මේ පිළිබඳ විවෘතව සාකච්ඡා පවත්වති. බොහෝ දෙවිකැල මේ භික්ෂූන් දැකිමට පැමිණ සාකච්ඡා පවත්වති. ඒ කථා අසා සිටින විට ඒ භික්ෂූන් වහන්සේලාගේ භාවනා දියුණුව වටහා ගත හැකිය.

## උග්‍ර ලෙස විවේචනය කළ දේව නාගයා

එක් අවස්ථාවක ආචාර්ය මන් වියාං ඩම් ගල් ගුහාවේ වාසය කළහ. එය වර්තමානයේ ප්‍රසිද්ධ කඳු පාමුල සංචාරකයන්ගේ ගල් ගුහාව නොවේ. මෙය පිහිටියේ කඳු මුදුනේය. මේ ගල් ගුහාව අයිතිකරගෙන සිටියේ දේව නාගයෙකි. බොහෝ කාලයක් කිසිවෙකුට එන්ට නොදී ඔහු එය ආරක්ෂා කළේය. ඔහු භික්ෂූන් වහන්සේලාට විරුද්ධය. අධික මානය ඇති බැවින් ආචාර්ය මන් හට නොයෙක් විදියේ හිංසා චෝදනා පැවරීය. ආචාර්ය මන්ගේ මෛත්‍රී, කරුණා ගුණය ඔහුට නොදැනේ. ඔහුගේ සිත බොහෝ කාලයක් දැඩි ලෙස මිථ්‍යා දෘෂ්ටියෙන් සිටි බැවිනි.

රාත්‍රී කාලයේ උන්වහන්සේ සක්මන් භාවනා කරන විට සෙරෙප්පු අඩි ශබ්දය ඉවසිය නොහැකිය. ''ඔබ මොන විධියේ භික්ෂුවක්ද ? කටකලියාව කඩාගත් රේස් අශ්වයෙක් වගේ එහේ මෙහේ ගමන් කරනවා. ඔබ පොළොවේ අඩිය තියන ගානේ පොළොව කම්පා වෙලා මුළු කන්දම දෙදරණවා. ඔබ මෙතරම් අනුන්ට වද හිංසා පමුණුවන බව ඔබ දන්නවාද?''

මෙවැනි දෝශාරෝපණ නගමින් බැණ වැදුනේ ආචාර්ය මන් ඉතා සන්සුන්

ලීලාවෙන් සක්මන් කරන විටය. උන්වහන්සේ තවත් හෙමින් අඩිය තියමින් සක්මන් කළහ. එනමුත් නාගයා නොසතුටු විය. ''ඔබ මොන භික්ෂුවක්ද කුරුලු වැද්දෙක් මෙන් හොර රහසින් ගමන් කරමින් සක්මන් භාවනා කරනවාද ? වැරදිලාවත් ආචාර්ය මන්ගේ පය ගස් මුල් වල හැපී ශබ්දයක් වූ විට ''ඔබ කොයි විධියේ භික්ෂුවක්ද ? නාට්‍ය කණ්ඩායමේ තාලය අල්ලන්නාක් මෙන් එහේ මෙහේ අඩි තබනවාද?

එවිට ආචාර්ය මන් සක්මන් මලුව සමතලා කර ගත්හ. ගල් අහුලා පිළිවෙලට අයිනේ තැන්පත් කළහ. ''ඔබ මොන විදියේ භික්ෂුවක්ද හැම තිස්සෙම ගල් එහේ මෙහෙ ගෙනි යනවා, කිසිම දෙයකින් තෘප්තිමත් නැහැ. ඔබ මේ එහේ මෙහේ අවුස්සන විට අනුන්ට ඉසේ රදයක් දෙන බව තේරෙන්නේ නැත්දැයි ඇසුවේය.

මේ නිසා ගල් ගුහාවේ සිටින විට නිතරම සති සමපජඤ්ඤයෙන් සිටීමට සිදුවුණි. නින්දේදි සුළු වශයෙන් ශරීරය සෙලවුනොත් හෝ ඔහු බැණ වදින බව උන්වහන්සේගේ අවදි වූ විට සමාධි සිතට අරමුණු වේ. ඔබ නින්දෙන් හැරෙනවා, දඟලනවා, ශබ්ද කරමින් හයියෙන් හුස්ම ගන්නවා, ආදී වශයෙන් බැණ වදී. උන්වහන්සේ සමාධි සිතෙන් ඔහු ගැන බලන විට උන්වහන්සේ දෙස ඔරවමින් බලාගත් වනම බලා සිටියි. ඉතා දුෂ්ට බැවින් ක්‍රෝධ ඇති බැවින්ද උන්වහන්සේ පවරණ පිං නොලබයි. ඔහුගේ ද්වේශ ගින්න හද දැවෙමින් පවතී. මෙසේ බලවත් පාප කර්ම නිරන්තරයෙන් කරයි. ආචාර්‍ය්‍ය මන් මොහු ගැන මහත් අනුකම්පාවක් ඇති කළහ. එහෙත් ධර්මය ඇහීමට නොකැමැති බැවින් කිසිම උපකාරයක් කළ නොහැකිය. ඔහු කළේ හැම මොහොතේම වැරදි සෙවීමය.

එක් විටක උන්වහන්සේ භික්ෂුවකගේ ආකල්ප ගැන කියා තමන් වහන්-සේගේ අරමුණු පැහැදිලි කළහ.

''මා මෙහි පැමිණියේ කිසිවෙකුට හිරිහැර කිරීමට නොවේ. මේ ශාසන පිළිවෙත් රැකීමට. මට හා අනෙකුත් අයට එය විශාල ලාභයකි. ඔබ අකුසල් සිත් පහළ කිරීම වැරදියි. මා ඔබට කිසි හංසා පීඩාවක් කර නැත. මා කරන්නේ හැකි තරම් කුසල් කර අනුන්ටත් අනුමෝදන් කිරීමයි. එය ඔබටත් සාධාරණයි. එබැවින් මා ඔබට වධ හිංසා පමුණුවන්ට ආවේ නැත.

සාමාන්‍ය මිනිසා කය සොළවා යම් යම් ක්‍රියා කරති. එය ස්වාභාවිකය. මළ මිණිය පමණක් නොසෙල් වේ. භික්ෂුවක් වශයෙන් මම නිතරම හොඳින් ඉරියව් පවත්වමි. මා මළමිනියක් නොවේ. එබැවින් වාතය ආශ්වාස ප්‍රාශ්වාස කරමි. සමහර විට ඒ වේගය අඩු වැඩි වේ. මා නිදන විටත් ආශ්වාස ප්‍රාශ්වාස කෙරේ. ඒ නිසා යම් යම් ශබ්ද නිකුත් වේ. එය ස්වාභාවිකයි. ඔබ යම් භික්ෂුවක් කිසිවක්

නොකර ගල් ගැහී සිටිනවා දැක ඇද්ද ? මිනිසා එසේ හැසිරෙන්නේ නැත.

මම හැකිතරම් නිශ්ෂබ්දව සක්මන් කරන්ට වෑයම් කරමි. ඒත් ඔබ මා රේස් අශ්වයෙක් වැනි යයි දොස් කියයි. ඇත්තෙන්ම රේස් අශ්වයෙක් සහ භාවනා යෝගී භික්ෂුව අතර අහස පොළොව මෙන් විශාල වෙනසක් ඇත. එවැනි සන්සන්දන කිරීම නොහොබී. ඔබ කරන පාප කර්ම නිසා අපායේ උපත ලබයි. ඔබ කියන විධියට මට හැසිරෙන්ට බැහැ. ඔබට සතුටින් සන්තෝෂයෙන් සිටින්ට අවශ්‍ය නම් ඔබේ සිතේ ඇති තරහ ගින්න නිවා ගන්න. එවිට ඔබට ඉබේම සතුට ලැබේ.

අනුන්ගේ වැරදි තිබුණත් ඒවා විවේචනය කිරීම නිසා හිතේ නොරිස්සන තරහ ගති ඇතිවෙනවා. මගේ හැසිරීම භික්ෂුවකට හොබින විධියක්. එහෙත් ඔබ නිතරම විවේචනය කරනවා. ඔබ මනුෂ්‍යයෙක් නම් ඔබට සාමාන්‍ය මිනිස් ජීවිතයක් ගත කරන්ට බැහැ. මුළු ලෝකයම කුණු ගොඩක් ලෙසත් ඔබ පමණක් පෙරාපු රත්තරන් ලෙසත් පෙනේවි. එවැනි අදහස් ඇති වන්නේ ඔබ අන් අය හෙළා පෙලා කථා කරමින් ලෝකය ප්‍රතික්ෂේප කරන නිසා. ඉන් ඔබ නිතරම කනස්සල්ලෙන් පසුවෙයි. නුවණැත්තෝ වැරදි ලෙස අනුන් විවේචනය නොකරත්. එය බලවත් අකුසල විපාක ගෙන දෙන්නකි. ඔබ එවැනි අකුසල් කරමින් විනෝද වෙයි. තමා වැටෙන ප්‍රපාතය නොදකී. ඔබගේ දෝෂාරෝපණයෙන් දුක් විඳින්නේ මා නොවේ. ඔබමයි. ඔබ මානසික රෝගියෙක් ලෙස ගත සිත දවාලයි. එවැනි දේ ඔබටම වැටහෙනවා නම් කුමක්නිසා ඒ පාප කර්ම කරන්නෙහිද ? ඔබගේ සිතුවිලි සියල්ලම මම දනිමි. ඒ වුනත් මම ඔබට නිතරම සමාව දුනිමි. ඔබ කරන දේ නිසා ඔබේ මනස විකෘති වේ. කෙතරම් දොස් කීවත් ඔබට නොසෑහේ. එය රෝගයක් නම් බෙහෙත් නැත.

ඔබගේ සිතේ පවතින වැරදි දෘෂ්ටිය නැති කිරීමට මම බොහෝ වෙහෙස වුනෙමි. නොයෙක් මිනිස්, ප්‍රේත, දිව්‍ය, බ්‍රහ්ම, යක්ෂ හා ඔබටත් වඩා බලවත් දේව නාගයින්ට මම උපකාර කරමි. ඒ සියලු දෙනා සම්මා සම්බුදු ධර්මය පිළිගනිති. කර්ම විපාක පිළිගනිති. ඔබ හැර අන් කිසිවෙක් මෙසේ ධර්මයට පරුෂ අන්දමින් නිගා නොදෙති. මේ ධර්මය මුළු සක්වලම පිළිගනිත්. ඔබ ඉතා අස්වාභාවිකයි. මේ සත්‍යය ගරු කරන්නේ නැත. ඔබ කරන්නේ නිකරුණේ නිවැරදි අයට දොස් පැවරීමයි. ඔබ සිතාගෙන ඉන්නේ මේවා කුසල් කර්ම කියා. ප්‍රඥාවන්තයෝ මෙ-වැනි දේ නිසා සතුට, සාමය ලැබේ යයි නොසිතති. ඔබේ මේ ආත්මය නැමැති හැව ඇරිය විට මෙම පාප කර්ම ඵල විපාක වශයෙන් ඉතා සතුටුදායක ආත්මයක් ලැබේද ? ධර්මයේ අන්තර්ගත කරුණු පිළිබඳ විවෘතව මෙසේ කිම ගැන මම සමාව අයදිමි. මගේ චේතනාව පිරිසිදුය. ඔබ කෙසේ වරදවා පිළිගත්තත් මම

කිසිවක් දුෂ්ට චේතනාවකින් නොකියමි. මෙහි පැමිණි මුල් දවසේ සිටම මම සියලු කටයුතු නිසිආකාර සිදු කළෙමි. මෙය ඔබගේ වාසස්ථානය බව මම දනිමි. මගේ විසීම ඔබට කරදරයක් බව මම දනිමි. ඔබ අනුන් විවේචනය කර තෘප්තියක් ලබන කෙනෙක් වුවත් ඔබගේ ක්‍රියාව අනුන් හෙලා දකින මානසික ක්‍රියාවකි. ඔබගේ ඒ ක්‍රියාවලිය නිසා මම අසහනයට පත් නොවෙමි. මට කණගාටු ඉන් ඔබට භයානක දුක් විපාක ලැබෙන බැවිනි. මා මෙහි ආවේ පව් කර්ම කිරීමට නොවේ. මම කරන කියන සියළු දේ අවංක පිරිසිදු සිතකින් කරමි. මගේ චේතනාව පිරිසිදු බැවින් ඉන් අනිෂ්ට විපාක නොලැබේ.

නුවණැත්තෝ භෞතික දේ සහ ආධ්‍යාත්මික දේ ගැන වෙනස අවබෝධ කළ විට ගුණවත් ගති පැවතුම් අගය කළහ. සාමය, සතුට සඳහා කරන කුසල කර්ම පිං වැඩ අගය කළහ. අනාදිමත් කාලයක සිට නුවණැත්තෝ ගුණ ගරුක භාවය ගැන කථා කළහ. මිනිසාට ගුණවත් වීමට උපදෙස් දුන්හ. ඔබ ඇයි මේ විධියට ගුණවත්කම පසෙක දා තම හිතුමතේ මෙවැනි අකුසල් වල ඇලී ගැලී සිටීම හොඳ යැයි සිතන්නේ ? සීලාදී ගුණයන් පහත් කරමින් ඔබ දවස ගෙවන විට ඔබේ අකුසල කර්ම ගැන සිතීමට වත් අවකාශ නැත. ඔබට විඳින්නට වෙන දුක් මට විඳීමට සිදු නොවන නමුත් මට ඔබ ගැන භය උපදී. මෙසේ හිංසාකාරී දේ ගැන සිතීම දැන්වත් නවතාලනු. ඔබේ අධම, දුෂ්ට, චේතනා නිසා ඔබේ සියලු ගුණවත්කම් අහෝසි වී යයි. එහි විපාක කෙතරම් භයානකදැයි සිතීමට වත් නොහැකිය. ලෝකයේ වෙන කිසි දෙයකට වඩා මට එය භය ගෙන දේ. මුළු ලෝකයම මහලු වීමට බිය වෙති. ලෙඩ රෝග, මරණයට බිය වෙති. එහෙත් ඒ කිසිවක් මේ කර්ම විපාක තරම් මා බියපත් නොකරයි.

කෙළෙස් බහුල පුද්ගලයෝ ගුණවත්කම් පැහැර හැර සියලු ආගම්වල උගන්වන භයානක දුක් විපාක ගෙන දෙන දේ කරති. අපි භික්ෂූන් වශයෙන් සිවුරු දරා ගන්නා විට මේ ධර්ම විනය අනුගමනය කිරීමට අපේ සම්පූර්ණ චරිතය බොහෝ වීර්‍යය වඩා වෙනස් කරමු. කෙළෙස් යටපත් කිරීම ඉතාමත් අමාරු බව මා දැනගෙන සිටියත්, මම භික්ෂුවක් වී මහත් දුක් ගැහැට විඳිමින් හෝ කෙළෙස් යටපත් කිරීමට තීරණය ගතිමි. පිළිවෙත් පිරීමේ දුෂ්කරතාවය නම් නිතරම කෙළෙස් පැන නගින විට ඒවා යටපත් කිරීමයි. එහෙත් අපට අවශ්‍ය නම් කර්ම ඉකුත් කිරීමට ඒ කර්ම සාදන කෙළෙස් ඉක්මවීමට අප එවැනි දුෂ්කර ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. සම්මා සම්බුදු රජාණන් වහන්සේ දෙසූ ධර්මයට හාත්පසින් විරුද්ධ වන්නේ කෙළෙස්.

මම ඝන වනාන්තරයට පැමිණ ගල් ගුහාවක ලගිමින් සමාජයෙන් කොන් කළ තැනැත්තෙක් මෙන් පිළිවෙත් පුරන්නේ පාපයන්ට සහ එහි විපාකයන්ට

භය බැවිනි. මා මෙහි ආවේ කිසිවෙකුට හිංසා පීඩා කිරීමට නොවේ. කිසිම පණ ඇති සතෙකු හට මම නිග්‍රහ නොකරමි. අපහාස නොකරමි. අගෞරව නොකරමි. ඒ සියලු සතුන්ගේ ජීවිත කර්ම න්‍යායන්ට යටත්වේ. එබැවින්, සියල්ලෝම සමානත්වයෙන් දකිමි. මම රැස් කරන කුසල කර්ම සියලු ලෝක සත්ත්වයාට සමාදන් කරමි. ඒ අය සතුටින් සන්තෝෂයෙන් වෙසෙත්වා. මම මනුෂ්‍යයෙක්මි. භික්ෂුවක් වෙමි ආදී වශයෙන් මගේ උසස්කම ගැන කිසිවිටක නොසිතමි. අපි සියලු දෙනාම ඉපදීම, මහළුවීම, ලෙඩවීම, මරණය නිසා සමාන වෙමු.

ඔබත් මේ කර්ම න්‍යායට යටත් වන්නෙකි. එබැවින් ඔබ නිහතමානීව තම ක්‍රියාවන්ගේ විපාක ගැන සිතා බලනු මැනවි අනුන් නින්දා අපහාස මුඛයෙන් විවේචනය කිරීම කුශල කර්ම නොවන බැවින් දුක් විපාක ගෙන දේ. මේ අකුසල තමා කෙරේ අකුරක් නෑර බලපායි. ඔබ, ඔබ කෙරෙහි පුදුමයට පත් වී මේ භයානක පුරුද්ද අත්හැර ගනු. එය කරන තුරු ඔබට හොඳ කෙනෙක් විය නොහැක. එවිට හොඳ මතු භවයක් ලැබිමට හැකිවේ. එවිට ඔබේ දුෂ්ට, වෛර සිත ටිකින් ටික මෙළොක් වේ. අනාගතයේදී මෙවැනි අකුසල විපාක වලින් වෙලී සිටීමට සිදුවන්නේ නැත.

විශ්වයේ ජීවත්වන සියලු සත්ත්වයෝ මිනිස්, තිරිසන්, දේව, බ්‍රහ්ම, යක්ෂ ආදීන් සතුට ප්‍රාර්ථනා කරති. දුක ප්‍රතික්ෂේප කරති. ධර්මය පිළිබඳ ප්‍රතික්ෂේපයක් නැත. එහෙත් ධර්මය ක්‍රියාත්මක කිරීමට නොහැකි වෙති. ධර්මය යනු විශ්වයේ පවතින ඉතාම වැදගත් ස්වාභාවික රීතියකි. සාර ධර්මයකි. සාරයකි. යම් යම් අය ධර්මයට අනුව ජීවත් වී මහත් සතුටකට ලාභයකට පත්වෙති විශේෂයෙන් මනුෂ්‍යයෝ නැතහොත් මිනිස් ආත්මය, ධර්මය පිළිපැදීමට ඉතා සුදුසු පරිසරයකි.

ඔබ වුවද හරි වැරදි වෙන් කර දැක ගැනීමේ හැකියාව ඇත්තෙකි. ඔබට ඉන් තමාට සුවගෙන දේ තෝරා ගත හැකිය. නමුත් ඔබ කරන්නේ ඊට පටහැනි වූ දෙයකි. මම පුදුමයට පත්වන්නේ ඔබ එවැනි වැරදි දේ කරමින් ගත කරන ජීවිතය ගැනයි. නුවණැත්තන් වර්ජනය කරන දේ ඔබ හොඳ යැයි පිළිගනී. උතුම් ලෙස සළකන දේ ඔබ ගරහයි. ඔබ දක් විඳියි. ඔබට දුක තේරේ එහෙත් ඔබ කරන්නේ දුක් දෙන දේවල්ය. නුවණැත්තෝ අපට පෙන්වා දී ඇති පරිදි අනුන්ගේ වැරදි බැලීමට ගන්නා ව්‍යායාමය තමන්ට දුක් පමුණුවන්නකි. එයම ඔබ විලිලැජ්ජා නැතිව නිතරම කරයි. ඔබට මෙය වැදගත් නොවූවක් ඔබගේ සිතිවිලි මම නිතරම දනිමි. එහෙත් මම තරහ නොවෙමි. උරණ නොවමේ. නිතරම මම සමාව දෙමි. මම ඔබ ගැන අනුකම්පා කරමි. එබැවින් සත්‍යය නොවලහා කියමි. ඔබගේ සිතුවිලි නිසා මම විපාක විඳින්නේ නැත. එවැනි දේ මම නොසිතූ

බැවිනි. මම විඳින්නේ සතුට, සුවය, සැනසුම, මෛත්‍රී, කරුණා ගුණය නිසා. එය මගේ හදවතේ බොහෝ කල් රජ කර ඇත.

දිව්‍ය නාගයා කිසිවක් නොකියා මේ සියලු දේ අසා සිටියේය. ධර්ම කරුණු ඔහු තේරුම් ගත් විට යම්කිසි වෙහෙසක් ඔහුගේ හදවතේ ඇතිවුණි. ''මේ භික්ෂුව හොඳ නුවණක්කාර දේ කියති. එහෙත් දැන්මම මට එය පිළිපැදිය නොහැකිය. ඊළඟ ආත්මයේදී එය පිළිපැදිය හැකිය. මේ භික්ෂුව මා බියපත් කරයි. ඔහු නොදත යුතු දේ දනියි. ඔහු මගේ චින්තනය දනී. මගේ පුද්ගලික සිතුම්, පැතුම් ඔහු දන්නේ කෙසේද ? මම ඉන්නේ සැඟවුණු ලෝකයකය. එහෙත් ඔහු මා දකී. පසුගිය අවුරුදුවල බොහෝ භික්ෂූහු මේ ගල් ගුහාවේ වාසය කළහ. එහෙත් කිසිවෙක් මා නොදනිති. මගේ සිතිවිලි කොහෙත්ම නොදනිත්. මම ඔවුන් බලෙන්ම එළවා දැමුවෙමි. (ආචාර්ය මන් පසුව අප සමඟ කී පරිදි මේ නාගයා විෂ ධූමයක් යවා ඒ භික්ෂූන්ට ඉවසිය නොහැකි දැඩි අපහසුතාවයකට පත් කර එළවා දැමුවේය.) ඔහු නිදා ගන්නා විටද මගේ හිත හඳුනයි. පසුව මා සිතූ කාරණය ඒ ආකාරයෙන්ම කියයි. ඇයි මම මේ තරම් මගේම මතයේ එල්බ සිටින්නේ ? ඔහු කියන පරිදි මට පුරුදු කරන්ට බැරි ඇයි ? මම භයානක අකුසල් කරන්නෙකි. උන්වහන්සේ කී දෙය සත්‍යයකි. මා මෙතරම් භයානක වැරදි කරුවෙක් බව දැන දැනත්, ඔහු මහත් කරුණාවෙන් කිසිම හානියක් මට නොකරන බව පවසයි. මා ගත කරන මෙම ජීවිතය මහා කාළකණ්ණි ජීවිතයකි. මට හරි වැරදි තේරෙන බව ඔහු කීවා ඇත්තයි. එහෙත් මගේ අවාසනාවන්ත මානය නිසා මීළඟ භවයත් කාළකණ්ණිවේමය. දිගින් දිගටම එසේ විය හැකිය.

ටික විරාමයකට පසු ආචාර්ය මන් තමන් දේශනා කළ ධර්මය තේරුණාදැයි නාගයාගෙන් ඇසීය. ''ඔබ ඉතා කරුණාවෙන් විස්තර කළ සියලුම ධර්මය මට තේරුණා, එහෙත් අවාසනාවකට මෙන් මා බොහෝ අකුසල් කළ කෙනෙකි. දැන් විඳින අපා දුක විඳ අවසාන කළ යුතුය. මේ ධම්ම මාර්ගයේ යා හැකිදැයි යන ප්‍රශ්නය මට විසඳා ගැනීමට නොහැකිය. මගේ සිතුවිලි ක්‍රියා කරන්නේ පහත් දේ කිරීමටය. ධර්මයට නැඹුරුවීමට මට නොසිතේ.

ඔබ පහත් දේ කියා කියන්නේ කුමකටද ?

මම ලොකු ප්‍රීතියක් වින්දනය කරනවා. ඔබේ වැරදි කිය කියා නින්දා කරන විට. ඔබ මට කළ අපරාධයක් නැහැ. නමුත් ඒ විදියට තමයි මගේ සිත ක්‍රියා කරන්නේ. මගේ හිතට මේ දේ වැරදියි කියා එහි විපාක ගැන ඔප්පු කරන්ට බැහැ. මේ නිසා මගේ වැරදි හදා ගන්ට බැහැ.

ආචාර්ය මන් උනන්දු කළේය.

ඔබ තීක්ෂණ බුද්ධියකින් පරීක්ෂා කළ විට ඒ වැරදි වැඩ නිසා තමන් දුක් විඳින බව වැටහේවි. ඒ බව පිළිගත් විට වැරදි දේ ඔබේ සිතෙන් තුරන් වෙනවා ඇත. නමුත් ඔබ මේ නරක දේ හොඳ කියා සිතුවොත් ඔබ ඒවා රැක ගැනීමට, පවත්වා ගැනීමට වෙර දරයි. එය කර ගැනීමට දහසක් දේ සිතමින් ක්‍රියාත්මක කරයි. එය තමන්ට මෙපමණ දුක් විපාක දෙන බව නොදනී. එය සැපයක්, සතුටක් යැයි කමතිවේ. ඔබ ඉක්මණින් මේ පුරුද්ද අත් නොහැරිය හොත් එය නවත්වා ගන්ට නොහැකි තත්ත්වයකට වැටේ. මෙය මට කළ නොහැකිය. මට උපදෙස් දිය හැකිය. ඔබ ඔබම අත්හැරිය යුතුය. එය ඔබ සතු වගකීමකි. හැකිතරම් වීර්‍යය යොදා ඉන් මිදීමට උත්සාහ ගන්න. එවිට ක්‍රමයෙන් ඔබගේ නරක ගති අඩු වී හොඳ ගති වැඩි දියුණු වී යයි. අන්තිමේදී ඔබේ සිතේ ඇත්තේ පිරිසිදු, අවංක, ශීලාචාර කුසල් සිත් පමණකි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ ධර්මයට අනුව සියලු දුක් නසන්නට හැකිවේ. ඕනෑම නුවණ ඇති සත්ත්වයෙකුට මෙය කළ හැකිය. ඒ ධර්මය විසින් ඔබ නිතරම ආරක්ෂා කරණ බැවින් සිත සැනසේ. සිතේ භය, සැක, චකිත නැත. තරහ සිතිවිලි නැත. කිසිම දෙයක් ''හොඳයි'' කියා වර්ණනා නොකරයි. ''නරකයි'' කියා අවමන් නොකරයි. එවිට ආසාව හා තරහව දුරු වී යයි.

මේ දේශනය අවසානයේදී ඒ නාගයා ආචාර්ය මන්ගේ අවවාදය පිළිපැදීමට උත්සාහ ගන්නා බවට ප්‍රතිඥා දුනි. ඉන්පසු දෙතුන් දිනක් උන්වහන්සේ මේ නාගයාගේ සිතිවිලි විචාරමින් සිටියහ. යම්කිසි දියුණුවක් දක්නට ලැබුණි. තමාගේ දුර්ගුණ යටපත් කිරීමට ඔහු වීර්‍යය දැරුවේය. එහෙත් ඒ වීර්‍යය වැඩීම නාගයාට මහත් වෙහෙසක් විය. එබැවින් යම් හේතුවක් දක්වා එම ගල් ගුහාව උන්වහන්සේ හැර ගියේය. මෙය නාගයාට සතුටට කාරණයක් විය. නාගයා සමඟ තිබූ සම්බන්ධය ඉන් හමාර විය.

මේ සිද්ධිය අළලා බොහෝ විට උන්වහන්සේ මිනිසුන්ට අවවාද අනුශාසනා කළහ. මනුෂ්‍ය ගතිගුණ පිළිබඳ විචාරීමක් ඉන් සිදුවිය. ඔබගේ දැනුම පිණිස මේ සිද්ධිය පොතට අඩංගු කළෙමි.

හොඳ හෝ නරක සිතුවිලි ඉබේ සිදු නොවේ. එය හට ගන්නේ තමන්ගේ නිරන්තරයෙන් ඇතිවන පුරුදු අනුවය. එය චරිතයේ ලක්ෂණය වේ. අපි දුෂ්ට සිතිවිලි වලින් යුක්ත නම් සෑම අවස්ථාවේදීම එම දුෂ්ට සිතිවිලි නැගී සිටීම සිදුවේ. එය පුරුද්දකි. අපි කාරුණික කුසල් සිතිවිලි වලින් යුක්ත නම් සෑම අවස්ථාවේදීම එවැනි අහිංසක සිතිවිලි නිරායාසයෙන් පහළ වේ. මෙයද පුරුද්දකි. මේ නිසා ගුණවත් දෙමාපයෝ තම දූ දරුවන්ට ඉතා කුඩා කාලයේ පටන් හොඳ දේ වලට පුරුදු කරත්. මෙය වැඩි වයස් ගත වූ විට කළ නොහැකිය. මෙය දැනුවත් කමින් සුදුසු පරිසරය, සුදුසු පුද්ගල ආශ්‍රය තුළින් වගා වර්ධනය කළ යුතුය.

ඉබේ සිදුවීමට අත්හැරිය යුතු නැත.

ඉතා කුඩා කාලයේ සිට දරුවන් යම් යම් අත්දැකීම් අනුව පෙළඹෙති. පන්ති කාමරයේ ඉගෙනීම මෙන් නොව මෙය නිරන්තරයෙන් සිදුවේ. කාලයක්, ඍතුවක් අනුව සිදු නොවේ. පන්ති කාමරයේ ඉගෙන ගන්නා දේවල් වලට වඩා මෙම අත්දැකීම් වලින් ඉගෙන ගන්නා දේ සිතට කා වැදී පෞරුෂත්වය ගොඩ නැගේ. එය තම ඇස්, කන්, නාසා දී ඉන්ද්‍රිය තුළින් ලබා ගන්නා අත්දැකීම් වේ. දරුවාගේ කළු ලෑල්ල තම ඉන්ද්‍රියන්ය. එහි ශීලාචාර බව පිළිඹිබු වේ. අශීලාචාර බවද පිළිඹිබුවේ. නිරන්තරයෙන්ම මේ ගති ලක්ෂණ තම වැඩිහිටියන්ගෙන් හෝ සමාජයෙන් හෝ යහළු මිත්‍රයන්ගෙන් තම මනසට ගලා ඒ. එපමණක් නොව ටී.වී., කම්පියුටර් ආදියෙන් හා විනෝදාස්වාද තුළින් නවීන අදහස් උදහස් වලට දරුවන් ගොදුරු වේ. සැර, පරුෂ, ගති ගුණ ඉතා ඉක්මණින් පුරුදු වේ. එය කල් යාමේදී ඔවුන්ගේ චරිතය බවට පත්වේ. එබැවින් හැසිරීම යනු එහි ප්‍රතික්‍රියාවයි.

සමහරු නිරායාසයෙන්ම හොඳ දේවලට නැඹුරු වන අතර සමහරු නිරායාසයෙන්ම වැරදි නොහොඳ දේ කරා ඇදී යති. තමාගේ අගුණ දුර්වලකම් යටපත් කිරීමට තරම් මානසික ශක්තියක් හෝ අවශ්‍යතාවයක් නැත. එය පු-රුද්ද අනුව සිදුවේ. හොඳ දේ කිරීමෙන් තමා වෙත පැමිණෙන ලාභ ප්‍රයෝජන ගැන හැඟීමක් නැත. එබැවින් එවැනි දේ කිරීමට උත්සාහ නොගනී. අලස බවට පත්වේ. තම සිතුම් පැතුම් නිරවුල් නිරවද්‍ය ලෙස පාලනය කිරීම ඉතා කුඩා කාලයේ සිට සකස් වී තිබිය යුතුයි. එවිට ඔහු පුරුද්ද, පෞරුෂය, හැසිරීම ආදී සාමාජික අවශ්‍යතා නියම ආකාරයෙන් සිදු කරයි. ඉතා සුහද කීකරු වැඩදායී පුද්ගලයන් බිහි කිරීමට මුල් අවදියේ දී වෑයම් ගත යුතුව ඇත. මෙය සිදු කළ හැකි දෙයකි. නමුත් නිසි ආකාර පුහුණුව අවශ්‍ය වේ.

ඕනෑම ක්‍රියාවක් සාර්ථක කර ගැනීමට පුහුණුවක් අවශ්‍ය වේ. තම රැකියාව පිණිස පුහුණුවක් අවශ්‍ය වේ. එමෙන්ම අපේ මනස, හදවත පුහුණුවක් ලැබිය යුතුය. මරණය දක්වා මේ පුහුණුව අවශ්‍ය වේ. තම සිතැඟි ඉටු කර ගැනීමට එම දක්ෂතාවය අවශ්‍යය. ඔබ මේ අවවාදය පිළිපදින විට තම ජීවිතය ඉතා සාර්ථක වනු නොඅනුමානය. ආචාර්ය මන් මෙවැනි දේශනා කරමින් තම ශිෂ්‍යයන් නිසි මඟ ගෙන යති. ධර්මයට අනුකූල මෙම දේශනය ඔබටත් යම් ප්‍රයෝජනයක් වේ යැයි මෙම පොතට අඩංගු කරමි.

## රහතන් වහන්සේගේ පිරිනිවීම

ආචාර්ය මන් චියං ඩාඕ ගල් ගුහාවේ වාසය කරණ කාලයේදී භාවනා නිමිති බොහෝ සෙයින් දර්ශනය විය. සමහර නිමිති පුදුම එළවන සුළුය. ඉන් ටිකක් මම මෙහි සඳහන් කරමි. මධ්‍යම රාත්‍රියෙන් පසු දිනපතාම ඉහළ දෙව්ලොවින් සහ පහළ දෙව්ලොවින් දෙවිවරු උන්වහන්සේ වෙත පැමිණේ. විශාල සංඛ්‍යාවක් සමහර විට පැමිණෙති. කලින් වේලාවක් නියම කර ගනිති. රහතන් වහන්සේලා පැමිණ ධර්ම සාකච්ඡා කෙරෙති. උන්වහන්සේලා නිරුපධිශේෂ පරිනිර්වාණයට පත්වන අයුරු විස්තර කළහ. මින් සමහර රහතන් වහන්සේලා එම චියාං ඩාඕ ගල් ගුහාවේදී පිරිනිවන් පෑහ. අන් සමහරු නොයෙක් ප්‍රදේශයන්හි පිරිනිවන් පෑහ. එම විස්තරය පෙර නොඇසූ විරූ අධික ශ්‍රද්ධා බුද්ධිය එළවන්නකි.

ආචාර්ය මන්ගේ මෙම විස්තරය අසා මම මවිතයට පත්වුනෙමි. කනස්සල්ලට පත්වුනෙමි. මටද ඇස්, කන්, නාසාදී ඉන්ද්‍රිය ඇතත් එවැනි තත්ත්වයකට පත්වීමට නොහැකිවීම අවාසනාවකි. ආචාර්ය මන් පිළිබඳ ඇති ශ්‍රද්ධාව අසීමිතය. සමහර විට මම කඳුළු වගුරවමින් අඬමි. සමහරවිට සිනා-සෙමි. අන් භික්ෂූන් වහන්සේලා මම සිහිවිකල් වී ඇතැයි සිතන බැවින් ආයාස-යෙන් කඳුළු නොහෙළමි. ඇත්තෙන්ම මගේ අභ්‍යන්තරයේ යම්කිසි සිහි විකල් භාවයක් පැවතුණි.

රහතුන් වහන්සේලා සමඟ ආචාර්ය මන් පැවැත් වූ සාකච්ඡාවක් තරම් ගරු ගාම්භීර දෙයක් මේ ලෝකයේ නැතැයි සිතේ. මම මහත් භක්ති ආදරයෙන් එම පුවත් මෙහි සඳහන් කිරීමට උත්සාහ ගතිමි. එහෙත් එහි අරුත හා රසය ඔබ වෙත ගෙන ඒමට තරම් උගත්කමක් මා තුළ නොමැති බැවින් සමාවුව මැනවි. මෙහි දක්වන්නේ එම සාකච්ඡාවන්ගේ අංශු මාත්‍රයක් පමණි.

''සියළුම රහතන් වහන්සේලාගේ අති විශේෂ චින්තනයක් ඇත. එය අද්භූත පුදුමාකාර ලක්ෂණයකි. එවැනි ආවේණික වූ සිතුවිලි පරම්පරාවක් කිසියම් මිනිසෙකුට හෝ දෙවියෙකුට නොමැත. බුද්ධ ධර්මයට අනුව මෙම රහත් භාවය ලබා ගන්නේ ඉතාමත් දුෂ්කර ප්‍රතිපත්ති තුළිනි. යම්කිසි චක්‍රවර්ති රජෙකුගේ රාජධානියේ පැන නගින විශාල රත්රන් පතලයක් මෙන් එය චමත්කාර ජනකය. ඉතාම දුර්ලභ තත්ත්වයකි. රහතන් වහන්සේලාගේ ජීවන රටාව සාමාන්‍ය මිනිසෙකුගේ ජීවන රටාවට වඩා හාත්පසින්ම වෙනස් වේ. එය තනිකර ධර්මයකි. උන්වහන්සේගේ ශරීරය අන් මිනිසෙකුගේ ශරීරය මෙන් සතර මහ භූතයන්ගෙන් සැදුම් ලත් වුවද එම ශරීරය පවත්වන හදවත ඉතාමත් පවිත්‍ර බැවින් මුළු සිරුරද එම පවිත්‍රභාවය සේවනය කරයි.

ඔබ වහන්සේද එවැනි ස්වභාවයකි. නැවත නූපදින ලෙස සියලු කෙළෙස් වලින් මිදුන බැවිනි. එබැවින් අරහත් නම් වේ. නැවත නූපදින බැවින් ඔබ ලෝකයාගේ පිං කෙතකි. ලෝකයාට පිං ලබා ගත හැකි වන බැවින් සියලු

පුද පූජාවලට සුදුසු වේ. අද අපි ඔබ දැකීමට පැමිණියේ ඔබගේ අති විශිෂ්ට ගුණ සමුදායට උපහාර දැක්වීමටය. බොහෝ අය අර්හත්වය සඳහා වීර්ය ගත් නමුත් බාධක ඉදිරියේ නොනවත්වා ගෙන යා ගැනීමට නොහැකි වෙති. මිනිස් ලෝකයේ සියලු දෙනා අනුන්ගෙන් උපකාර සොයති. දෙමව්පියන් ආදී නෑයින්ගෙ ” සම්බන්ධතාවය අගය කරති. කිසිවෙක් හුදකලාව තම ජීවිතය ස්වාධීන ලෙස ගත කිරීමට නොකැමති වේ. එබැවින් සියලුම මිනිස්සු අරමුණක් නැතිව ඒ මේ අත ඉබාගාතේ යත්. එවැනි ජීවීන්ගේ සංඛ්‍යාව අනන්තය. එබැවින් රහතුන් වහන්සේ මුළු විශ්වයට විශාල ශක්තියකි. ඔබ වහන්සේගේ අති පාරිශුද්ධ භාවය මිනිසුන් දෙවියන් බඹුන් හට ලැබුණ විශාල ආශිර්වාදයකි. ඔබ වහන්සේ හදවතින් විශ්ව භාෂාවක් කථා කරති. එය අන්කිසි භාෂාවක් අභිබවා අදහස් දැක්වීමට හැකියාවකි. බුදුවරු සහ සිව්පිළිසිඹියා මහ රහතුන් වහන්සේලා මේ විශ්ව ශක්තිය තුළින් අන් අය සමග සම්බන්ධීකරණය කරති. උදව් උපකාර කරති. අමනුෂ්‍යයන් සමග කථා බහ කරන්නේ මේ විශ්ව ශක්තිය තුළිනි. මේ විධියට කියන දේ වහා වැටහෙන අතර මනුෂ්‍ය භාෂාව තුළින් කියන දේ වැට-හෙන්නේ සීමා සහිතවය.''

මේ රහතන් වහන්සේ තම දේශනය අවස් කර තමන් වහන්සේ පිරිනිවන් පෑ අන්දම විස්තර කළහ. ඒ සෑම රහතන් වහන්සේ නමක්ම තමා පිරිනිවන් පෑ ඉරියව්ව පවත්වා පෙන්නුම් කළහ. සමහරු බද්ධ පල්ලංකයෙන් සමාධි ගත වී පිරිනිවන් පෑහ. සමහරු සිංහ සෙය්‍යාවෙන් දකුණු ඇලයෙන් සයනය කර පිරිනිවන් පෑ අන්දම පෙන්නුම් කළහ. සමහරු සක්මන් මළුවේදී සිටිමින් නිශ්චලව පිරිනිවන් පෑහ. සමහරු ඇවිදිමින් සක්මනේදී පිරිනිවන් පෑහ. හිඳින සහ සයනය කරණ ඉරියව් බහුල වශයෙන් පෙන්නුම් කළහ. සක්මනේ හෝ සිටගෙන පිරින්වන් පාන්නේ කළාතුරකිනි.

උන්වහන්සේලා පිරිනිවීම ඉතාම සියුම් ලෙස පෙන්වන ලදී. අවසාන මො-හොත තෙක් වූ සිද්ධිය දැක්වූහ. හිඳිමින් පිරිනිවන් පාන විට පුළුන් රොදක් මෙන් මුළු සිරුර අප්‍රාණික වී පහත් විය. සිංහ සෙය්‍යාවෙන් පිරිනිවන් පාන මොහොත තේරුම් ගැනීමට දුෂ්කරය. ආශ්වාස, ප්‍රාශ්වාස නැවතීම පමණක් දැන ගත හැකිවේ. නින්දට වැටුනාක් මෙන් මුළු ශරීරය නිශ්චලය. ආශ්වාස, ප්‍රාශ්වාස ක්‍රමයෙන් සියුම් වී නැති වී යයි. හිටගන පිරිනිවන් පාන විට ඉතාම සෘජුව සිට වම් අත උඩ දකුණ අත තබා හිස තරමක් ඉදිරියට නමා ඇස් පියාගෙන විශාල භාවනා මනසිකාරයක මෙන් මොහොතක් තිබී හෙමිහිට බිම වැටුනහ. පළමුව හිඳින ඉරියව්වට වැටී පසුව පුළුන් රොදක් මෙන් පොළොවට පහත් විය. සක්මන් කරමින් පිරිනිවන් පාන විට හය හත්වරක් එහා මෙහා සක්මනේ ඇවිද හෙමිහිට පොළොව මත පතිත වී නිශ්චල විය.

මෙම විස්තර පෙන්වන විට එම රහතන් වහන්සේලා එක් එක් නමක් ආචාර්ය මන් සමීපයට පැමිණ අඩි 6ක් පමණ දුරින් සිට ඉතා පැහැදිලිව ඒ නිරුපාධිශේෂ නිවන් ලබන මොහොත පෙන්නුම් කළහ. එම දර්ශන උන්වහන්සේගේ සිතේ නොමැකෙන දර්ශනයකි. උන්වහන්සේ මෙම විස්තර කරන විට මගේ ඇස් කඳුළින් පිරී ගියේය. මම භිත්තිය දෙස බලා සිටියෙමි. අමුතු වේදනාවකින් ගත සිත කම්පා විය. ඒ වේලාවේදී යම්කිසි දෙයක් සිදු වුණි නම් මේ පුස්තකයකට ඒ සිද්ධිය ඇතුළත් කිරීමට සිදුවේ. මේ රහතන් වහන්සේලාගේ පරිනිර්වාණය ඉතා ලක්ෂණ සම්භාවනීය ලෙස සිදුවුණි. සාමාන්‍ය මිනිසා මරණයට මුහුණ දෙන්නේ මීට හාත්පසින් වෙනස් ආකාරයකටය. ඒ උත්තම වහන්සේලා සම්මුති ලෝකයෙන් සඳහටම සමු ගනිති. නැවත උප්පත්තියක් නැත. දුක් පීඩා අසහන අෂ්ට ලෝක ධර්මය ඉක්මවා ගියහ. මෙය මහා සංවේදනීය ආශ්චර්යකි. එය අසා සිටි සියලු දෙනාම මෙසේ විස්මිත වූ බව මම දනිමි.

තුන් නමක් චියාං ඩඕ ගල් ගුහාවේදී රහත් වී පිරිනිවන් පෑහ. ඉන් දෙනමක් සිංහ සෙය්‍යාවෙන් සැතපෙන ඉරියව්වෙනි. එක් නමක් නමක් සක්මන් කරමිනි. තමා පිරිනිවන් පෑ අන්දම පෙන්වීමට පෙර එම රහතන් වහන්සේ තමන් පිරිනිවන් පාන අන්දම ගැන කලින් සිතා මතා තිබුණ බව සැලකළහ. ආචාර්ය මන්ගේ වැටහීමට අනුව බොහෝ රහතන් වහන්සේලා පසුගිය ශතකයේ තායිලන්තයේ මෙසේ පිරිනිවන් පෑහ. මම දන්නා තරමින් තුන් නමක් චියං ඩඕ ගල් ගුහාවේදී එක් නමක් වොං ෆරා චාන් කඳු මුදුනේදී එක් නමක් ලොප් බූරිවලදී එක් නමක් නබොන් නයොක් ප්‍රදේශයේ බව් යයි හිදී, එක් නමක් කොබා දිස්ත්‍රික්කයේ ධාතුලුවං විහාරයේදී වෙති. මීට වඩා බොහෝ රහතුන් වහන්සේලා පිරිනිවී ඇති නමුත් මට නම් ගම් වශයෙන් මතක ඇත්තේ මෙපමණ වේ.

නිවනයනු බුදු පසේ බුදු රහතුන් වහන්සේලා පමණක් ප්‍රත්‍යක්ෂකරණ ධර්මතාවයකි. ඒ සැවොම තම සන්තානයේ සියලු කෙලෙස් නැවත නූපදිනා ලෙස දුරුකර ඇත. අන් පුද්ගලයෝ තම සිත් තුළ කෙළෙස් ඇති බැවින් නිවන් අවබෝධ කර නැත. මේ අය මැරී ගොස් නැවත උපදිති. පස්පව් ආදී අකුසල් කරණ අය අපා ගත වී අනන්ත දුක් විඳිති. දෙව්, බඹුන් වීමට ඉතා දුෂ්කර නිසා සුළු ප්‍රමාණයක් එහි උපදිති. එහෙත් තිරිසන් ආදී අපාය ලෝකවල සත්ත්වයෝ බොහෝ වෙති. මනුෂ්‍ය තිරිසන් දේව ආත්ම වල ආසාව, තණ්හාව රජ කෙරේ. එබැවින් නැවත නැවත උපදී. මෙහි නිමාවක් නැත. නිවන මේ අයට අදාළ නොවේ.

ජීවත්ව සිටියදී බුද්ධාදී උතුමෝ කෙළෙස් සංසිඳවා ඇත. එබැවින් මරණ මොහොතේදී නැවත සසර ඉපදීමට ආසාව නැත. තම ශරීරය පිළිබඳ වුවද තණ්හාව නැත. කුණු වී යන ශරීරයක් පමණකි. මේ විශ්වයේ කිසිම දෙයක් ගැන

ආසාව නැත. නැවත කර්ම විපාක විඳීමක් නැත. හදවත නිදහස්ය. විමුක්තිය, චිත්තයකි. සම්පූර්ණ සතුට, තෘප්තිය එහි ලක්ෂණයයි. සම්මුති ලෝකය ගැන කිසියම බලාපොරොත්තු නැත. මේ අතිපාරිශුද්ධ සිත තුල සම්මුති ලෝකයේ එකම පරමාණුවක් පිළිබඳවත් සසල වීමක් නැත. කිසි දෙයක් ගැන කනස්සල්ලක්, පසුතැවිල්ලක් නැති එම පිරිසිදු සන්තානය සදහටම නිවී යයි.

නිවන යනු පුද්ගලික අයිතියක් නොවේ. එනමුත් එය බලෙන්, හොරෙන් කිසිවෙකුට අයත් කර ගත නොහැකිය. එය බලවත් වීර්යෙන් අධිෂ්ඨානයෙන් ලබා ගත යුතුවේ. මේ කිසිවක් නොකර නිකම් නිවන් ලැබේවායි ප්‍රාර්ථනා කර ලැබිය නොහැකිය. එය ඉබේ සිදුවන්නක් නොවේ. අපේ කථා නායක වු ආචාර්ය මන් බොහෝ රහතුන් වහන්සේලාගෙන් හා ධර්මයෙන් අද්භූත විධියට උපදෙස් ලබා ගත්හ. උන්වහන්සේ තායිලන්තයේ ජාතික වස්තුවක් වශයෙන් සම්මත වී ඇත. ලෝකයේ නොයෙක් දේශවල බෞද්ධයන්ගේ අති ගෞරව පුජාවන්ට පාත්‍ර වී ඇත. මේ සියල්ලට හේතු වූයේ උන්වහන්සේගේ නොපසුබට වීර්‍යයයෙන් ධර්මය අවබෝධ වන තුරු උග්‍ර ප්‍රතිපත්ති රැකීමයි. සත්‍යය අවබෝධ වීම නිසා තම සිත තුළ කිසිම බොරුවකට ඉඩ නැත. බාහිර ලෝකය බොරුව මත පදනම් වී ඇති බැවින් ඒ සියල්ල බැහැර කළහ. ලෝකයේ කිසිවකින් උන්වහන්සේගෙ ' සන්තානය සෙලවීමට නොහැකිය. උන්වහන්සේ ස්ථාවර තත්ත්වයකි. එම ආධ්‍යාත්මය නොවෙනස් වේ. කාලය අදාළ නොවේ.

## ධාර්මික යුද්ධ භටයා

චියාං මායි ප්‍රදේශයේ ඝන වනාන්තරයේ වාසය කරණ විට කීප විටක් ආචාර්ය මන් රෝගාතුර විය. මරණාසන්න වූ අවස්ථාද තිබුණි. වෛද්‍ය උපදෙස් මත උන්වහන්සේ සිටියා නම් අත්තෙන්ම ජීවිතක්‍ෂය වන්නේය. උන්වහන්සේ ජීවත් වූයේ බෙහෙවින්ම තම ධර්ම ශක්තිය තුළිනි. උන්වහන්සේට යම් ආබාධයක් ඇති වූ සැණින් ධර්මයේ ප්‍රතිකාරක චිතිකිත්සාව ඊට විරුද්ධව හට ගනී. එම රෝගය එවිට සුවපත් වේ. මේ නිසා ලෝක සම්මත වෙද හෙදකම් ගැන උනන්දුවක් නැත. වයස්ගත වී ශරීරය දුබල වූ විටද ''ධර්ම චිකිත්සාව'' තුළින් ප්‍රකෘති සුවය ලබා ගනී.

එක් අවස්ථාවක තවත් බොහෝ භික්ෂූන් සමඟ ආචාර්ය මන් කඳු කරයේ මැලේරියා වසංගත කාලයේ විසූහ. එක් භික්ෂුවකට මැලේරියා රෝගය වැළඳුණි. එහෙත් කිසිම වෛද්‍ය ප්‍රතිකාරයක් නොලැබුණි. තදබල උණ දවස පුරාම තිබුණි. ආචාර්ය මන් උදේ සවස මේ භික්ෂුවට උණ බැසීමට සුදුසු භාවනා උපදෙස් දුණි. තමන් වහන්සේ එවැනි භාවනා සංකල්පනා තුළින් රෝග නිදානය විචාරති. එවිට

රෝගය මර්දනය වේ. එහෙත් ඒ භික්ෂුවට එවැනි ශක්තියක් නැත. උණ ගත් විට ප්‍රතිකාරයක් නොමැතිව සිටී. එවිට ආචාර්ය මන් ඔහුට දොස් කීහ. ඔබ වහන්සේ ''මහා'' යන නාමයට සුදුස්සෙක් නොවේ. මක්නිසාද ඔබගේ දැනුම ඔබට අවශ්‍ය වේලාවට උපයෝගී කර ගැනීමට නොහැකිය. මෙතරම් දුක් මහන්සි වී ''මහා'' වීමට කාලය නාස්ති කරනවා. අන්තිමට කිසිවක් ඇත්තේ නැත. ඔබගේ දැනුම් යම් ආකාරයකින් ප්‍රයෝජන විය යුතුය. මට හිතා ගන්න බැහැ ඔබ මෙපමණ කාලයක් ඉගෙන ගත්තේ මොනවාද කියා කිසිම වැදගත් දෙයක් ඉගෙන ගෙන නැහැ. දැන් ඔබ උණ සෑදී මරණාසන්න වී ඇත. ඔබේ දැනුමෙන් බිඳක් වත් සහනයක් නැත. මේ දැනුම මේ වෙලාවට නැත්නම් කුමටද? කිසි තේරුමක් නැහැ. මම කිසිම පාළි පන්තියකට ගියේ නැහැ. මම ඉගෙන ගත්තේ කර්ම ස්ථාන පහ පමණි. එය මගේ ආචාර්යවරයා උපසම්පදා වීමේදී කිය දුන්නාහ. එය තවමත් මා ළඟ ඇත. මගේ ජීවිතය රැක ගැනීමට මට අවශ්‍ය එපමණයි. එනමුත් එය මා ඔබෙන් දුර්වල කරන්නේ නැහැ. ඔබ උගත් තරමටම දුර්වලයි. ඇත්තෙන්ම ඔබ නූගත් ගෑනියෙකුට වඩා දුර්වලයි. ඔබ පුරුෂයෙක්ද ? ඔබ ''මහා'' කෙනෙක්ද ? ඇයි මෙතරම් බොළඳ ? ඔබ ලෙඩ වූ විට ඔබගේ පුරුෂ ශක්තියක් නැත. ඔබ සතු කිසි ධර්මයක් ද නැත. ඔබේ පුරුෂ අංග ස්ත්‍රී අංග වලට මාරු කර ගනු මැනවි. එවිට ඔබේ ශාරීරික පරිවර්තනයද සම්පූර්ණ වී ඔබ පරිනාමය වනු ඇත. ඔබ ස්ත්‍රියෙක් බව දුටුවිට ඔබේ උණ එතරම් ඔබට වද නොදේවි !.

මා එන හැම විටම තමාගේ ධෛර්‍යය, ආත්ම විශ්වාසය වෙනුවට මට දකින්නට ලැබෙන්නේ ආත්ම පරිහානියයි. මසුරෙක් මෙන් ඔබේ ශක්තීන් ඔබ සඟවා ඇත. ඔබ පාළි භාෂාවෙන් උගත් කර්මස්ථාන මෙනෙහි නොකරන්නේ ඇයි ? ''දුක්ඛං අරිය සච්චං'' යන්න ඔබට වැටහෙන්නේ කෙසේද ? එහි අර්ථය රෝගාතුර වූ විට පසු බැසීමද ? අසරණ වී අඬමින් අම්මා, තාත්තා ඉල්ලා සිටීමද ? ඔබට උණ දරා ගන්න බැරි නම් මරණාසන්න මොහොත ඉවසන්නේ කෙසේද ? ඔබට මේ දුකවත් තේරුම් ගන්ට බැහැ දුක්ඛාර්‍ය සත්‍යය තේරුම් ගන්නේ කෙසේද ? මේ සතර ආර්‍යය සත්‍යය තේරුම් නොගත් කෙනෙකුට ලෞකික දුක්, සංසාරය තරණය කරන්ට බැහැ. ඔබේ දුක හටගත් විගස ඔබ නිදි පැදුරේ දිගා වී පරාජය වේ. මින් ඇති ලාභය කුමක්ද ?''

මෙසේ තදබල ලෙස දොස් පවරා උන්වහන්සේ නිෂ්ශබ්දව මොහොතක් බලා සිටියහ. ඔහුගේ ඇස් වලින් කඳුළු රූරා වැටේ. ඉක්මනට යම් නිදහසට කරුණු පවසා එතැනින් නික්ම ගියේය. ''භය වෙන්න එපා. ඉක්මනට සුව වේවි. මම බොරුවට ඔබ රවටන්ට මේ දේ කීවේ'' කියා අස් වැසූහ.

මේ ගැන රාත්‍රිය පුරා නැවත පුනරාවර්තනය කරමින් ආචාර්ය මන් වෙනත් විධියක ප්‍රතිකර්මයක් ගැන කල්පනා කළහ. දුන්න බෙහෙත් සැර වැඩියි. එය

ඔහුට ඔරොත්තු දෙන්නේ නැහැ. පසුදා උදේ සිට උන්වහන්සේ සම්පූර්ණයෙන්ම වෙනස් විය. නැවත කිසි විටෙක එවැනි පරුෂ භාවයක් නොදැක්වීය. නිතරම ආදරයෙන්, කරුණාවෙන් උවමනාවට වැඩිය සත්කාර කළේ මීට පෙර කිසි දිනෙක නොදැක්වූ ආකාරයටය. වචන ඉතා මෘදු මොළොක්ය. මී පැණි වැගිරෙන්නාක් මෙන් උදේ සවස උන්වහන්සේ සුහදව ආදරය දැක්වීය. එය එම භික්ෂුවගේ දුර්වල කමට කදිම සැනසීමකි. සීනි දැවටූ මේ පෙති උදේ සවස ලැබේ. රෝගී භික්ෂුව සහ අන් භික්ෂූන් මේ පිළිබඳ අතිශය සතුටට පත් වූහ. රෝගියා ක්‍රමයෙන් සුව අතට හැරුණි. මාස ගණනාවක් ගත විය. මේ ප්‍රතිකාරය ඉතා සාර්ථක විය. භික්ෂුව සම්පූර්ණ සුවය ලැබුවේය.

උන්වහන්සේ මෙවැනි අති දක්ෂ වෛද්‍යවරයෙකි. රෝගියාට අවශ්‍ය බෙහෙත් ප්‍රතිකාර දනී. එය නියම ආකාරයට දිය යුතුය. මුලින් දැක්වූ සැර භාවයත්, පසුව දක්වා මෘදු භාවයත් රෝගියා සුව කිරීමට අවශ්‍ය වූයේ යැයි සිතිය හැකිය. අපි වැනි අයට එය ඉතා වටිනා පාඩමකි. එබැවින් සියල්ල නොසඟවා මෙහි වාර්තා කළෙමි. යමෙකුට අවශ්‍ය නම් අගනා උපදෙස් මේ පුවතින් උකහා ගත හැකිය. මේ වනාහි ආචාර්ය මන් වැනි අති දක්ෂ වෛද්‍ය වරයෙකුගේ ප්‍රතිකාර මාර්ගයක් වේ. යම් අවශ්‍යතාවයක් ඇති වූ විට උන්වහන්සේ අක්‍රියකාරී නොවී තත්ත්වය හොඳින් වටහාගෙන එම අර්බුදයට සුදුසු පිළියම් යොදයි. උන්වහන්ස් රෝගී වූ විට හෝ සිතේ යම් කෙළෙස් නැගී ආ විට නිෂ්ක්‍රිය වී ඉවසන්නේ නැත. එම ප්‍රකාශය ගැන තීක්ෂණව විවේචනය කර විසඳුමක් සොයයි. උපායෙහි දක්ෂ, බුද්ධිමත් විසඳුමක් සොයා එම අර්බුදය නැතිවන තුරු ක්‍රියාත්මක වේ. මේ ආකාරයෙන් උන්වහන්සේට පැමිණි සියලු ප්‍රශ්න නිරාකරණය කළහ.

ආචාර්ය මන් සමඟ සිටි භික්ෂූන් රෝගාතුර වූ විට වෛද්‍ය උපදෙස් දීමට පෙර තම භාවනා ශක්තියෙන් රෝග මර්දනය කිරීමට උපදෙස් දෙයි. එයම කර්මස්ථානයකි. කායික මානසික දුක් පීඩා දෙස බලා දුක්ඛ සත්‍යය අවබෝධ කළ යුතුය. එම භික්ෂූන් වහන්සේලා ලෙඩ රෝග ඉදිරියේ අසරණ වූයේ නැත.

තමන් වහන්සේට වැළඳුන ලෙඩ රෝග මර්දනය කිරීමට උන්වහන්සේ නොයෙක් භාවනා මනසිකාර උපයෝගී කර ගත්හ. ශාරීරික මානසික දුකට හේතු සාධක ධර්මයට අනුව සොයති. මෙය සති පඤ්ඤා උපරිම වශයෙන් පුරුදු කිරීමකි. සති පඤ්ඤාවේ අඩුවක් නිසා රෝගය මර්දනය නොවේ යැයි, සති පඤ්ඤාව තව තවත් දියුණු කළහ. එවිට වේදනාව, දුක්ඛ සත්‍යය ඉදිරියේ පරාජය වේ. දුක්ඛ සත්‍යය යනු පරමාර්ථ සත්‍යයකි. වේදනාව යනු හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති වූ අනිත්‍ය දුක්ඛ අනාත්මයකි. මෙසේ බලවත් වීර්ය අධිෂ්ඨානය, සති, සම්පජඤ්ඤය, ශ්‍රද්ධාව ආදී ඉන්ද්‍රිය ධර්මය තුළන් දුක්ඛ සත්‍යය අවබෝධ කරයි.

මේ නිසාම ආචාර්ය මන් තම ශිෂ්‍යයන්ට වේදනාව ගැන විමසීමට උනන්දු කළහ. මරණාසන්න මොහොතේදී ඇතිවන බලවත් වේදනාව ඉවසීමට මෙය පෙරහුරුවකි. වේදනාව ඉදිරියේ දුර්වල වී, භය වී විසංඥා නොවී සතිසම්පජඤ්ඤයෙන් එහි අති ත්‍රිලක්ෂණය මෙනෙහි කළ හැකිවේ. එවිට ඔහුගේ ජීවිතය හා මරණය ජයග්‍රහණයකි. මෙය වනාහි ආධ්‍යාත්මික යුධ භටයාගේ සංකල්පනා වේ. ඔහු තම සිත ජයග්‍රහණය කරයි. සිතට වහල් නොවේ. ඔහු උත්තම පුරුෂයෙකි. අතිශය සැනසීමට පත්වේ. වේදනාව ඉදිරියේ නොබියව මුහුණ දේ. උන්වහන්සේ අති විශිෂ්ට චරිතයකි. නොපසුබට උත්සාහය, අරපිරිමැසීම උපායේ දක්ෂ බව, බුද්ධිමත්, අව්‍යාජ, අවංක, නිර්භීත ආදී ගතිගුණ උපරිම වශයෙන් දක්නට ලැබුණි. එවැනි චරිතයක් අද විද්‍යමාන නොවේ. මේ හැර දිවැස්, දිවකණ, දිව්‍යඥාණය, පර චිත්ත විජානනය වැඩී තිබුණ බැවින් මනසින් නොයෙක් අය සමඟ කථා බහ කරති. අදහස් හුවමාරු කරති. තිරිසන් සතුන්, මිනිසුන්, ප්‍රේත, දිව්‍ය, බ්‍රහ්ම, යම, නාග ආදී සත්ත්ව කොට්ඨාශ වලට අයත් අය සමඟ නිතර සන්නිවේදනය මාධ්‍යයක් තිබුණි. දිව්‍ය, බ්‍රහ්ම, ප්‍රේත ආදී සියුම් ශරීර උන්වහන්සේගේ සමාධි සිතට අරමුණු වේ. මිනිසුන්ගේ පුද්ගලික ආසා, දුක් ගැනවිලි, සතුට ආදී සිතිවිලි පරචිත්ත විජානනයෙන් දකී.

භික්ෂූන් වහන්සේලා සතියෙන් තොරව සිටි නොයෙක් අවස්ථාවන් දැන ගන්නේ ආචාර්ය මන් ඒ අවස්ථාව විදහා පෙන් වූ පසුවය. සමහරු උන්වහන්සේ කියන්නේ තමන් ගැනය බව දැනීමට තරම් සිහි නුවණ නැත. උන්වහන්සේ ඉදිරියේ නොසිටියත් එම ආශ්‍රමයේ කොතැන සිටියත් උන්වහන්සේගේ විපරමට හසුවේ. තම සිත බාහිර අරමුණු කරා ගොස් සිතුවිලිවල සිටියහොත් නිසැකයෙන්ම පසුදා උදෑසන එය සාකච්ඡාවකට ලක්වේ. එම වරදකරුවා උන්වහන්සේගෙ ් සරදමට ලක්වේ.

උන්වහන්සේගේ ජ්‍යෙෂ්ට ශිෂ්‍යයන් බොහෝ විට මේ කරුණු ගැන තම අත්දැකීම් ප්‍රකාශ කළහ. උන්වහන්සේගේ අධිමානුෂික ශක්තීන් විස්මිතය. අනුන්ගේ සිත් දැන ගැනීමට යන්නේ නිමේෂයකි. සියලුම ශිෂ්‍යයෝ සතියෙන් සිටින්නේ මේ නිසාය. එක් වතාවක් භික්ෂුවක් ආචාර්ය මන්ගේ විවේචනය පිළිබඳ උරණ වී සිටියහ. ආචාර්ය මන් එවේලේම ප්‍රශ්නයට උත්තර දුනි.

අපි පාවිච්චි කරණ සියලුම දේ ආහාර, රෙදි පිළි ආදිය සකස් විය යුතුය. අමුද්‍රව්‍ය වශයෙන් පරිහරණය කළ නොහැකිය. වී වගා කොට සහල් නිපදවා තම්බා ගත යුතුය. දැව ඉරා යතු ගා කපා භාණ්ඩ සාදති. පුළුන් කෙඳි නූල් තනා වියා රෙදි සාදා නිමි ඇඳුම් කට්ටල් සදති එහෙම නොවේද ? මේවා නිකම් පහළ වන්නේ නැත. මළමිණී නිකම් සිටී. අජීවී නිසා තම සිරුර පවත්වා ගැනීමට අවශ්‍ය නොවේ. හැසිරීම වෙනස් කිරීමක් නැත. අක්‍රියකාරී බැවිනි. මළමිණියකට

ගුරුවරයෙක් නොයෙක් උපක්‍රම යොදා අනුම් බැනුම් දීමට අවශ්‍ය නැත. එහෙත් ඔබ සැවොම ජීවීන් වෙති. ගුරුවරයාගේ අවවාද ප්‍රාර්ථනා කරති. එහෙත් ඔබ ගුරුවරයා ගැන සැක බය ඇත. වැරදි පෙන්වා දොස් කියන නිසාය. ගුරුවරයා කිසිවක් නොකියා සිටි විට කිසි අවවාදයක් නොලැබේ යැයි කියති. එය ඊටත් වඩා නපුරු දෙයකි. අන්තිමේදී මොනවා කීවත් නොකීවත් ඔබට නුරුස්සයි. ඔබගේ සිතිවිලි එහේ මෙහේ අවිචාරවත්ව හැසිරේ. වඳුරෝ ගස් පනින්නාක් මෙනි. නිතර පනින විට දිරච්ච අත්තක් අසු වී කඩා වැටෙණු ඇත. ඔබට අවශ්‍ය කුමක්ද ? වඳුරෙක් මෙන් පැන පැන දිරච්ච අත්තක් කඩාගෙන වැටීමටද ? භික්ෂුවක් ලෙස ගුරුවරයෙකුගේ මඟ පෙන්වීමක්ද ?

සමහර විට උන්වහන්සේ අදාළ පුද්ගලයාට කෙළින්ම කථා කරයි. තම සිතිවිලි අවිචාරවත්ව සති විහරණයෙන් බව පෙන්වා දෙයි. සමහරවිට පුද්ගලයෙක් සඳහන් නොකොට චක්‍රාකාරයෙන් සිතිවිලි ගැන විමසයි. මින් අදාළ පුද්ගලයාට පණිවිඩ ලැබේ. තම සිතිවිලි නැවත නැවතත් හොල්මන් කරන වග තේරුම් යයි. එවිට තමන් තම සිතිවිලි වල නිමග්නව නොසිටී. එහි අනිත්‍ය, දුක්ඛ, අනාත්මය හඳුනා ගනී.

සමහර විට ප්‍රබල ලෙස තම දේශනය කරයි. ජීවිත පූජාවෙන් තම ප්‍රතිපත්ති රැකීම ගැන තමන් වහන්සේ සාක්ෂි කොට පෙන්වා දෙති

''ඔබ මරණ භයින් ප්‍රතිපත්ති අත්හැරිය විට ඔබට එක්වාරයක් නොව නැවත නැවතත් බොහෝ වාරවල උප්පත්ති මරණවලට යටත් වීමට සිදුවේ. මරණ භය ඉක්ම වූ විට උප්පත්ති මරණ වාර ටික ටික අඩු වී අන්තිමේදී සම්පූර්ණයෙන්ම නැතිවේ. නැවත ඉපදීමක් හෝ දුක් විඳීමක් නැත. මම පිළිවෙත් පුරණ කාලයේ තුන්වාරයක් තද ශාරීරික වේදනාවෙන් සිහි නැති වී මරණයට පත් වී නැවතත් සිහි ලබා ගෙන ජීවත් වුනෙමි. අද මම ඔබගේ ගුරුවරයා වෙමි. මම මළේ නැත. ඔබ කිසිවෙක් එසේ සිහි නැතිව මැරී මැටෙන තාක් ප්‍රතිපත්ති රැක්කේ නැත. ඉතින් මරණය ගැන බිය වන්නේ මක් නිසාද ? මරණය යනු කුමක්දැයි අත්දැකීමක් නැති අයට ධර්මයේ හාස්කම් නොතෙරේ. ඔබ විශ්වාස කළත් නැතත් මම අවබෝධ ලැබුවේ මේ ආකාරයෙනි. එබැවින් මම ඔබට ලේසියෙන් පහසුවෙන් සිටීමට උපදෙස් දෙන්නේ කෙසේද ? ''හොඳ කෑම කන්න. නිදන්න - කම්මැලිකම් කරන්න. එවිට කෙළෙස් පහ වී යයි'' මෙය උගන් වන්නේ නැත්තේ මේ ක්‍රමයෙන් කෙළෙස් මර්දනය කළ නොහැකි බැවිනි. එවැනි දේ නිසා කෙළෙස් විනෝද වෙයි.'' අපි සිතුවේ මේ භික්ෂූන් මහා වීර්ය ගෙන අපි මර්දනය කරයි යනුවෙනි. එහෙත් මේ අය හුස්ම ගන්නා මළ මිනී වගේ. මේ හුස්ම ගන්න මළ මිනී වලට සළකන්නේ කුමකටද ? භය වන්නේ කුමටද ?

මේ දේශනයෙන් පසු එක්තරා භික්ෂුවක් මෙසේ සිතයි. ''නිවන ලබා

ගැනීම සිහි නැති වී මරණය තෙක් වීර්ය දැරිය යුතුනම් ඒ නිවන ලබා ගැනීමට නොකැමැති වෙමි. අන් අය මෙන් ලෝකයේ ඇති දුක් ඉවසා සිටිමි. මට සෑහෙන පිරිස ඇත. මුළු ලෝකවාසීන්ම ඇත. මරණය දක්වා වීර්‍යය වැඩීමට කැමති වන්නේ කවුද ? ජීවිතය දුක් සහිත බව සැබෑය. එහෙත් සිහි නැතිවීම තරම් මරණ දුකක් නැත. සිහි නැති වී ඇත්තේ මළාත් නිර්වාණය හා මත් කුඩු බීම අතර වෙනසක් නැත. කාටද මෙය ඕනේ. මට නම් ඕනේ නැත. මම මැරෙන්ට නොකැමැති වෙමි. වෙන කෙනෙක් මැරී වැටෙනු දුටුවිට වුවද මට මරණ භය ඇති වේ. මම මරණයට පත්වීමේදී කුමක් වේද ?

ආචාර්ය මන් නැවතත් දේශනා පටන් ගනිති. එය වේගවත්ය. එම භික්ෂුවගේ සිතිවිලි විනිවිද යයි. ''ඔබ මා විශ්වාස කරන්නේ නැත. හා ඔබේ හිතේ මම විනෝදයට බොරු කියනවා කියා ඔබ මා විශ්වාස නොකරන්නේ නම් කරුණාකර පිට වී යන්න. මෙම ආශ්‍රමයට බරක් වී ඔබ මෙහි රැඳී සිටින්නේ ඇයි ? මා ඔබට මෙහි පැමිණීමට ආරාධනා කළේ නැත. ඔබ කැමැත්තෙන්ම ආවේ. ඒ නිසා කැමැත්තෙන්ම යන්න. බලෙන් එළවන තුරු සිටින්න එපා. ඔබ මෙහි රැඳී සිටීමේ වැඩක් නැත. බුදු දහම දේශනා කළේ ඔබ වැනි මෝඩයන්ට නොවේ. කසාවත් දරා සිටින භික්ෂුවකට ඔවැනි සිතිවිලි කිසිසේත් යෝග්‍ය නොවේ. බෞද්ධ භික්ෂුවට ධර්මය පිළිබඳ ශ්‍රද්ධාව ඇත. ඔබගේ සිතිවිලි ප්‍රතිපත්ති මාර්ගයට පටහැනි බැවින් ඔබ මා හෝ ධර්මය අදහන්නේ නැත. ඔබ කැමති සේ ආහාර පාන ගෙන නිදාගෙන සුවසේ ඉන්න. මෙහි සිටිමින් භාවනා වැඩීමට වෙහෙසෙන්න එපා. ප්‍රතිපත්ති අනුව ධර්මය අවබෝධ වු විට කරුණා කර පැමිණ මේ මෝඩ නාකි භික්ෂුවට අභියෝග කරන්න. මම දොහොත් මුදුන් නගා දෙවියන්ගෙන්ද ඔබට රාජකීය ගෞරව ආශිර්වාද ලබා දෙමි.

යමෙක් දුක් තරණය කිරීමට මරණ භය ඉක්ම විය යුතුය යන්න මා කියන්නේ එය සත්‍යයක් බැවිනි. නමුත් එය සත්‍යයක් බව ඔබ නොපිළිගනී. ඊට වඩා හොඳයි මේ ලෝකයේ දුක්විඳ මැරී නැවත ඉපදී මේ සසර සැරි සැරීම. එසේම වේවා එය ඔබගේ කැමැත්ත. නමුත් මෙහි ඇවිත් ඔබ බුදු බණ බොරු කරන්න එපා. එසේ කළ විට ඔබ බුදුරජාණන් වහන්සේට විස කටුවක් අනිනවා. එය අනිකුත් අයගේ විමුක්තිය වළක්වනවා. ඔබ බෞද්ධයන්ගේ හතුරෙක් වෙනවා. ඔබගේ අදහස් වැරදි පමණක් නොව එවැනි දේ කථා කළ විට බුද්ධ ශාසනය විනාශ කරනවා. ඔබ මෙහි ආවේ බුද්ධ ශාසනය රැකීමට කියා මා සිතුවේ. මම හිතුවේ නැහැ ඔබත් වැනසී ශාසනයත් වනසාවී කියා. දැන් මට තේරෙනවා ඔබ අළුගෝසුවෙක් මෙන් සියල්ල විනාශ කරන බව. ඔබගේ සිතිවිලි දැන්ම වෙනස් කරන්න. නැත්නම් ඔබ හා ඔබ සමඟ තවත් අය විනාශ වේවි.

අප බුදුරජාණන්වහන්සේ තුන් වරක් සිහි නැතිව ඇද වැටුණු බව

ධර්මයේ සඳහන් වේ. නිවන් ප්‍රත්‍යක්ෂ කිරීමට එතරම් දුෂ්කර වේ. ඔබ එය විශ්වාස කරන්නේ නැද්ද ? එසේ නම් බුදුරජාණන් වහන්සේ බොරු කීවාදැයි සිතන්නෙහිද? ඔබ වැනි ධූතාංග භික්ෂුවක් බුද්ධ, ධර්ම අදහන්නේ නැත්නම් ඔබට මිනිස් ගුණයක්වත් නැත. ඔබේ අදහස් හුස්ම ගන්න මළ මිනියකට සුදුසුයි. කුණු ගඳ ගහන මළ මිනියක් කෙසේ නමුත් හුස්ම ගන්නවා ! ඔබ කුමක් කියන්නේද ? මොන මාර්ගයේද යන්නේ ? මීට වඩා වෙනස් මාර්ගයක් මම නොකියමි. මේ තමයි බුදුරජාණන් වහන්සේ සහ රහතන් වහන්සේලා ගිය මාර්ගය. මීට වඩා ලෙහෙසි ඔබ වැනි දක්ෂයන්ට ගිය හැකි වෙනත් මාර්ගයක් නැත. මම මේ මාර්ගයේ ගමන් කරන්නේ මහණ උපසම්පදා වූ දින පටන් අද වන තුරුත්. මේ ධර්මයට අනුව මම කියාදෙමි.

මා සිතන විධියට මේ තමයි උන්වහන්සේගේ ඉතාම වේගවත් දේශනාව. මා මෙහි සඳහන් කර ඇත්තේ එහි පොඩි සාම්පලයක් පමණි. මෙහි සම්පූර්ණ දේශනාව අඩංගු වී නැත. අසා සිටි අය භයින් ත්‍රස්ත වී පොළොව පලාගෙන යන්ට තරම් ලැජ්ජාවට පත්වූහ. තම ජීවිත කාලය තුළ එවැනි දේ අසා නැත. තම අදහස් කෙළින්ම ප්‍රකාශ කිරීම නිසා සියල්ලන්ට අර්ථය පැහැදිළිය. පිළිගත යුතුය. සැකයක් නැත. වෙන කිසි දෙයක් සිතීමට නැත.

මේ දේශනයේ සත්‍යය වැටහී ගිය එම භික්ෂුව සම්පූර්ණයෙන්ම තම අදහස් අත්හැර සත්‍යය පිළිගත්හ. මේ වන විට ආචාර්ය මන්ගේ දේශනා විලාශය වෙනස් විය. එය ප්‍රකෘති ස්වභාවයට පත් වී සමගි සන්ධානයක් බවට පත්විය. එම භික්ෂුව සත්‍යය පිළිගත් බව අවධාරණය වූ විට දේශනය සමාප්ත විය.

දේශනාවසානයේදී බොහෝ අයගේ කසු කුසුවක් ඇත. ''මෙතරම් බලවත් ලෙස ආචාර්‍ය්‍ය මන් කථා කිරීමට හේතුව කුමක්ද ? මේ වේගවත් දේශනයට අදාළ පුද්ගලයා කවුද ? විදුලි කොටමින් ගොරවන්නාක් මෙන් සියලු දෙනාම මුසපත් වූයේ යම්කිසි හේතුවක් මත විය යුතුය. නිකරුණේ මෙවැනි දේ කීමට හේතු නැත. ඉතාමත් පැහැදිලිව සත්‍යයෙන් සත්‍යය ගලපා මේ දේශනය කළහ.'' එවිට එම භික්ෂුව තමා එවැනි නොමනා සිතුවිලි පහළ කළ බව පාපොච්චාරණය කළේය. සාමාන්‍යයෙන් ධූතාංග භික්ෂූන් තම අදහස් උදහස් සඟවන්නේ නැත. යම් වරැද්දක් ආචාර්ය මන් පෙන්වා දුන් විට තමන් ඒ අදාළ පුද්ගලයා බව කියා සිටී. භික්ෂුවකට මෙසේ තරවටු කරන විට අන් භික්ෂූන් තමන්ගේ අඩු ලුහුඬු ගැන විචාරවත් වෙති. තමන් පිණ්ඩපාතයේ වඩින විට හෝ වෙනයම් අවස්ථාවකදී යම්කිසි අරමුණක් තම සිත අලවා ගත් විට ඒ ගැන සිතීමට, විතර්ක කිරීමට පත් වේ. ආචාර්ය මන්ගෙන් ඒ පිළිබඳ පසුදා හොඳ බැනුමක් අසන්නට වන බව ඒකාන්තය. තම මිත්‍රයන් ඉදිරියේ එසේ අසන්ට සිදුවීම මහත් ලැජ්ජාවට කරුණකි. භය තැති ගැනීම කොපමණද යත් වෙව්ලත්. කම්පනයට පත්වෙත්. හිස

පහත හෙලා තම අසුනෙන් නැගී සිටීමට නොහැකිව වෙව්ලන බව සියල්ලන්ටම පෙනේ. දේශනාවසානයේ එම භික්ෂුව සිතූ නොමනා සිතුවිල්ල සියලු දෙනාට දැන ගන්ට ලැබුණ විට සියලු දෙනාගේම අනුකම්පාව ලැබේ. කෙළෙස් සහිත පුද්ගලයන් මෙන් භික්ෂූන් වහන්සේලා අවට පරිසරයේ අරමුණු නිසා මෙසේ සිතුවිලිවල නිමග්න වෙති. තම සිත්වල ඇති අධිචිත්ත වේගය නවතා ගැනීමට තරම් සතිපඤ්ඤා මඳ වීම මීට හේතුව වේ. එහෙයින් නිතරම ආචාර්ය මන්ගෙ ” දෝෂාරෝපණයට ලක්වේ.

අනුන්ගේ සිත් දැන ගන්නා නුවණ ආචාර්ය මන් ප්‍රගුණ කර ඇත. ඒ පිළිබඳ කිසි සැකයක් නැත. අපේ සිතිවිලි වල වැරැද්ද පෙන්වා දෙන අන්දම විස්මය ජනකය. සමහරවිට නිහඬ වන්නේ ඒ ගැන කථා කීම පලක් නැති බැවිනි. එවැනි අවස්ථාවන්හිදී භික්ෂූන් වහන්සේලා සැනසිල්ලෙන් සිටිත්. එසේ නොවුනේ නම් අප සියලු දෙනාම හුස්ම හිරවී ක්ලාන්ත වී මරණයට පත්වන බව නිසැකය. මම ද මෙවැනි අවස්ථාවන්ට නිරන්තරයෙන්ම පත්වුනෙමි. ඒ මගේ විසිරුණු උද්ධච්ච සිත් නිසාය. මේ සියල්ල ඉවසා දරාගෙන උන්වහන්සේ සමීපයෙහි සිටි අප භාවනා දියුණුවට පත් වුනෙමු. ඒ තරවටු වලින් අප සිත නියම ආකාරයට ගමන් කීමට පුරුදු විය. අනවශ්‍ය දේ ඉක්මණින් සිතෙන් බැහැර වේ. නිතර සති සමාධියෙන් සිටීමට හැකිවිය. ඒ තුළින් බාහිර අරමුණු වල ඇලීම නැතිවිය. එය පුදුම ඇස් බැන්දුමකි. ඉන් සිදුවන්නේ, තම සිතේ කුසලතාවය, දක්‍ෂතාවය උපරිම තත්ත්වයෙන් නැගී සිට ගුරුවරයාට අභියෝග කිරීමකි. අන්තිමේදී එවැනි නොමනා සිත් පහළවීම සම්පූර්ණයෙන්ම නවතී. සිතේ සැනසීම, සමාධිය, නිරවද්‍යතාවය අභිබවා යාම නිසා නිර්භය වේ. ඒ පුද්ගලයා තුවක්කු, කිනිසි වලින් වත් බියපත් නොවේ. බාහිර අරමුණු නිසා ඇතිවන ආවේග, තණ්හා, ආශා සාමාන්‍යයෙන් නැගී සිටින නමුත් දැන් උපේක්ෂාවෙන් වින්දනය කරයි.

ප්‍රශ්නයක් වී ඇත්තේ බොහෝ අය නිවන යනු නොතේරෙන නොපැහැදිලි තත්ත්වයක් ලෙස සිතීමය. එමෙන්ම සිතේ අධෛර්‍යයමත් අකර්මණ්‍ය තත්ත්වයක් ලෙස සිතීමය. ලෝකීය දේ ගැන කථා කරණ විට ලැබෙන ප්‍රබෝධය නිවන ගැන සිතීමෙන් නොලැබේ. නිවන ප්‍රත්‍යක්ෂ කර නැති බැවින් තමන් පුරුදු ඒකාකාරී ඇලීම්, ගැටීම් එහි නැත. වර්තමාන සමාජය පමණක් නොව අපේ මව්, පියා, සීයා, ආච්චි ආදී මුතුන් මිත්තන් වුවද නිවන ගැන වැඩි කැමැත්තක් නොදැක්වූහ. අන් අයට ද නිවන ගැන උන්නදු නොකළහ. කලාතුරකින් දවසක් පන්සලට ගොස් සිල් සමාදන් වී බණ ඇසීමට තම පවුලේ අය උනන්දු කළහ. භාවනාව කලාතුරකින් උපයෝගී කළේ තමාගේ දඩබ්බර සිත මෙල්ල කිරීමට, සන්සුන් කිරීමටය. එවිට හැසිරීම හොඳවන බැවිනි. එනමුත් නිතරම අවවාද දුන්නේ ලෝකයේ ජීවත් වීමේ පිළිවෙළය. එය අසා සන්තෘප්ති වූ බාල පරම්පරාව එම

උපදෙස් භාර නොගත්හ.

නිසැකවම බොහෝ අය සිතන්නේ නිවන යනු නිශ්ශබ්ද තැනක් ලෙසය. එහි සංගීත තූර්යය නාද නැත. විනෝද වීමක් නැත. එහි තම සිත කුල්මත් කරන සංවේදනය කරන කිසිවක් නැත. එබැවින් එහි යාමේ අවශ්‍යතාවයක් නැත. නිහඬ නිශ්චල අපායකි ! කිසිවෙක් නැති ශූන්‍යතාවයකි. පවුලේ අය නෑ හිත මිතුරන්, ශබ්ද, වාහන, කුරුළු නාද, සිනහසීම, හැඬීම නැති පාළුවකි. කිසි අතකින් කැමති විය හැකි දෙයක් නැත. ලෝකයේ දියුණු වී වැජඹීමට කැමති අය නිවන් දැකීමට නොකැමති වෙති. කැමති වුවත් තම ලෞකික කාර්යය භාරය අත්හැරිය නොහැකිය. එය වඩා අවශ්‍යය. නිවන් දැකීමට හැකිවන්නේ ලෝකයෙන් ඉවත් වූ ලෝකය ගැන කිසි අපේක්ෂාවක් නැති අයට වේ. නිවනේ තදබල හැඟීම් ඇත්තේද නැත. නැත්තේ ද නැත. ප්‍රමාණය ඉක්මවා ලිහිල් වීමක් හෝ දැඩි වීමක් නැත. සමබර භාවයකින් තැන්පත්වීමක් ඇත. එය නියම මධ්‍යම ප්‍රතිපදාව වේ. ආසාව, බලාපොරොත්තුව, කැමැත්ත නැති බැවින් ලෞකික සැප ප්‍රතික්ෂේප කරත්. ලෞකික සැප තම සිත කළඹා අපේක්ෂා භංගත්වයට පත් කරයි. කිසිම දෙයක් නොසෙල්වන නිවන ඉතා අනර්ඝ සියුම් වින්දනයක් නිරන්තරයෙන්ම විඳී. මෙය ලෞකික සතුට මෙන් ගොරහැඬි, අදක්ෂ, අකුශලතාවයක් නොවේ. ලෞකික සතුට යනු නිතරම වෙනස්වන, නොපැහැදිලි, සැක සහිත, විශ්වාස තැබිය නොහැකි ආශාවන්ගෙන් දූෂිත තත්ත්වයකි. එය නොපැහැදිලි මඩ වතුරකි. එය ලුණු, ඇඹුල්, මිරිස්, කිවුල් ආදී රසයන්ගෙන් මිශ්‍ර ආහාරයක් වැනිය. එම ආහාර ආමාශයේ රෝග, දිරවීමට අපහසු අතෘප්තිමත් රසකාරකයෙන් යුතුවේ. නිදිමත වැනි මත් ස්වභාවයක් ඇති කරන අතර කෑමට රුචියක් ද නැත. නිතරම කෑම ගැන මිනිසුන් විපරම් කරමින් තෝරා ගත යුතුය. මොන ආහාර හොඳද නැද්ද යන්න දැන ගත යුතුය. එමෙන්ම මිනිසා තමාට අරමුණුවන දේ ගැන ද නිතරම සෙවිල්ලෙන් තෝරා ගත යුතුය. මේ මේ දේ අවශ්‍යය, මේ අනවශ්‍යය. තමා මින් ලාභ, ප්‍රයෝජන ලබයි. මින් අලාභ හානි ඇතිවේ. ආදී වශයෙන් නුසුදුසු අරමුණු බැහැර කර නොගත්තොත් ඒ සියල්ලම සිත තුළ රැස් වී හදවත පීඩාවට පත් වී රුධිර පීඩනය වැනි තත්ත්වයන් හට ගනී. ලෝකය දෙස බලන විට මෙවැනි රැස් කර ගත් අභිතර කර සිතුවිලි වලින් පීඩා විඳීමක් හැම තැනම දක්නට ලැබේ.

ස්වයං හික්මීම ගැන නුවණැත්තෝ ප්‍රකාශ කර ඇත. තමා හිතන, කියන, කරන හැම දෙයක්ම තම අරමුණු සපුරාලීමට ගන්නා වෑයමකි. තමා ලබා ගත් ජයග්‍රහණය ගැන නුවණැත්තෝ උඩඟු නොවෙත්. යමෙකුගේ උපදෙස් තමාට ලැබූ ලාභයක් ලෙස සළකත්. සමහර අය මෙසේ ප්‍රතික්‍රියා නොදක්වත් නුවණැත්තන් අනුකරණ කරන විට අපි බුද්ධිමත්ව යුක්තිගරුකව තීරණයට එළඹෙමු. මධ-්‍යස්ථව තම සිතේ ආශාවන්ට වහල් නොවෙති. තමාගේ ආශාවන් අත්හැරීමට

ගන්නා ප්‍රයත්නය නිසා පුදුම සැනසීමක්, තෘප්තියක් විඳිති. බැංකුවේ කෝටි ගණන් නැතත් අපේ ආදර්ශමත් හැසිරීම සහ අයත් සුළු ධනය තමා බෙහෙවින් සතුටට පත් කරයි.

දක්ෂ අය තම ජීවිතය සහනදායී ලෙස හා සාමකාමී ලෙස පවත්වති. දවස පුරා ධනය ඉපැයීමට ලැබෙන බව සත්‍යයකි. එහෙත් සාධාරණව ලබා ගත් ධනය නිසා වඩා තෘප්තිමත් වෙති. අනියම් මාර්ගයෙන් ලැබූ ධනය තමාට සැබෑ අයිතියක් නැත. එකම නීතිය මේ කර්ම නීතියයි. කර්මයට අනුව වැරදි මාර්ග යෙන් උපයාගත් ධනය නිසා අනාගත විපාක මහත් දුක් පමුණුවයි. නුවණැත්තෝ මේ ගැන බිය උපදවති. එහෙත් අපි කිසි බයක් සැකක් නැතිව එවැනි මාර්ගයේ වේගයෙන් ගමන් කරමු. ආත්මාර්ථකාමීත්වයෙන් ලැබෙන සතුට භුක්ති විඳිමු. එහෙත් අතෘප්තිකර ආශාවන් නිසා කිසිසේත් දුකින් නිදහස් නොවේ. මේ මාර්ග යේ කෙතරම් ගියත් බලාපොරොත්තු වන සැනසීම නොලැබේ.

චියාං මායි හි ගත කළ කාලයේදී උන්වහන්සේගේ ශිෂ්‍යයෙකු වූ ජම් බුං ධම්මජෙදී භික්ෂුවගෙන් බොහෝ ලියුම් ලැබුණි. එහෙත් එන් කිසිවකට පිළිතුරු නොදුන්නේය. නිතරම එම ලිපිවල සඳහන් වූයේ නැවත උදොන් ථානි ප්‍රදේශයට පැමිණෙන ලෙසය. මේ ආරාධනාව උන්වහන්සේ පිළිගත්තේ ද නැත. 1940 දී ජම් බුන් ධම්මජේදි භික්ෂුව උදෙන් ථානි සිට දුර්ග මාර්ගයේ උන්වහන්සේ සොයමින් පැමිණියේය. ඒ අවස්තාවේදී සියලුම ලිපි වලට උත්තර ලැබුණි. එම සියලු ලිපි ලැබුණ බවත් කියවූ බවත් එහි වැදගත් දෙයක් නැති නිසා උත්තර නොලී නමුත් දැන් ඉතාම ''වැදගත් ලියුම'' පණ පිටින්ම ලැබුණ නිසා සියලු උත්තර සපයන බව කියා සිටියේය. එවිට මේ දෙනම සිනාසුනි.

ජම් බුන් ධම්මච්ජේදි භික්ෂුව ආචාර්ය මන්ට හැකි ඉක්මණින් උදෙන් තාහි ප්‍රදේශයට පැමිණෙන ලෙස ආරාධනා කර සිටියේය. උන්වහන්සේ වර්ෂ ගණනාවකට පෙර එහි විසූහ. එකල ශිෂ්‍යයෝ තවමත් උන්වහන්සේ පැමිණෙතැයි බලාපොරොත්තු වෙති. ඔවුන්ගෙන් ආයාචනය මත මෙහි ආ බව ජම් බුන් ධම්මච්ජෙදි භික්ෂුව දැනුම් දුන්හ. මේ ආරාධනාව ප්‍රතික්ෂේප කළ නොහැකි විය. 1940 මැයි මාසයේ පැමිණ වැඩම කරගෙන යන බව සැළ කළේය.

තමන් වහන්සේ මේ කඳුකර වනයෙන් නික්ම යන බව අසා බොහෝ රුක් දෙවිවරු සහ භූමට දෙවිවරු එසේ නොයන ලෙස බැගෑපත්ව ඉල්ලා සිටියහ. සියලු දේව කොටිධාශ මෙපමණ කාලයක් ඉතා සතුටින් සන්තෘප්තියෙන් කල් ගෙවූයේ උන්වහන්සේ මෙහි වැඩ වාසය කරණ නිසා යැයි පැවසූහ. රෑ දවල් කාලයේ උන්වහන්සේගේ කරුණා, මෛත්‍රී හදවතින් විහිදෙන කිරණ දස අත විහිදී සුව එළවන නිසා සියලු දේව සමූහය එකලෙස උන්වහන්සේ ප්‍රිය කළහ.

උන්වහන්සේ නික්ම ගිය විට එම සතුට, සන්තෝෂය පහව යන්නේය. ඔවුන්ගෙ අන්‍යෝන්‍ය සබඳතාවය බිඳ වැටෙන්නේය.

තමන් වහන්සේ පොරොන්දු වූ පරිදි වැඩිය යුතු බව ආචාර්ය මන් පැවසීය. භික්ෂුවගේ වචනය ඇදහිය යුතුය. තමන්ගේ පොරොන්දුව ඉෂ්ට කළ යුතුය. එසේ බොරු පොරොන්දු දුන් විට සීලයට හානි සිදුවේ.

මැයි මාසයේදී ආචාර්ය මන් සහ එම භික්ෂුව මේ ප්‍රදේශයෙන් නික්මුණහ. චියාං මායි හි වට් ජෙඩි ලුඅං පන්සලට විශාල දුර ප්‍රමාණයකි. එය පා ගමනින් ගිය යුතුය. උන්වහන්සේ සතියක් පමණ ආචාර්ය ඌන් සමඟ වට් ජෙඩි ලුඅං පන්සලේ නැවතී සිටියහ. එවිට එම ප්‍රදේශවාසීහු තව කාලයක් එහි වාසය කරන ලෙස ආයාචනා කළහ. එහෙත් උදෝන් තානි වලට ආරාධනාව පිළිගෙන බැවින් එය ප්‍රතික්ෂේප කළහ. එහි වාසය කළ ජම් බුන් රාජකවි භික්ෂුව එදින වෛශ්‍යාඛ උත්සවය නිමිත්තෙන් ධර්ම දේශනා කරන මෙන් ආරාධනා කළහ. මේ අවස්ථාවේදී මම ද එහි සිටි බැවින් එම දේශනයේ සාරාංශය මෙහි සඳහන් කරමි. පැය 3ක් නොනවත්වාම මේ දේශනය විය. එම දේශනය කෙතරම් සිත් ඇද ගත්තේදැයි කිව නොහැකිය. එය මගේ මතකයේ නොමැකෙන දේශනාවකි.

"අද වෛශ්‍යාඛ පූජෝත්සවයයි. මෙවැනි වෛශ්‍යාඛ දිනයන්හි බුදුරජාණන් වහන්සේ බෝධිසත්ත්ව වශයෙන් ඉපදීම, බුදුවීම සිදුවිය. බුදුවී පසුව පිරිනැවීම සිදුවිය. බෝධි සත්ත්වයන්ගේ උප්පත්තිය අවශේෂ අයගේ උප්පත්තිය මෙන් නොවේ. බෝධි සත්ත්වයෝ ඉපදීම හේතු කොටගෙන ලෝකයේ පවතින මායාකාරී උපත, ජීවිත, මරණ වලට පත් වූයේ නැත. තමන් වහන්සේගේ අධි පඤ්ඤාව තුළින් නිවන් ප්‍රත්‍යක්ෂ කර මේ උපත් - ජීවිත - මරණ පිළිබඳ රහස ඉක්මවා ගියහ. තම කාර්‍යය අවසන් වූ විට එම ස්කන්ධයන්ගෙන් වෙන්විය. එම ස්කන්ධයෝ මහබෝසතාණන් වහන්සේට ශීලය සම්පූර්ණ කර ගැනීමට ඉවහල් වූහ. සුගත නම් වූ ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේ තුන් ලෝකයේ ගුරු වූ සේක. තම ශරීර ස්කන්ධයන්ගෙන් සමුගැනීමට පෙර තමන් අවබෝධ කළ ධර්මය ලෝකයාට දායාද කළ සේක. මේ ධර්මය දැන් උන්වහන්සේ නියෝජනය කරයි. මෙම ත්‍යාගය අපගේ ශ්‍රද්ධා බුද්ධියෙන් හිමි කරගෙන ජීවිත පරදුවට තබා රැක ගත යුතුවේ. එනම් ඒ අනුව පිළිපැදිය යුතුය.

අපි මනුෂ්‍යයන් වශයෙන් ඉපදී ඇත්තේ පෙර කළ කුසල් බලයෙන් බව ඔබ දන්නවා ඇත. එහෙත් තමාගේ ඒ කුසල ශක්තිය විනාශ නොකර ගැනීමට වග බලා ගත යුතුය. ඒ කුසලය දියුණු කරමින් තම ගති පැවතුම් කුශලතාවයෙන් දියුණු නොකළහොත් අපේ අනාගත ජීවිත විනාශ වේ. අපේ මිනිස් තත්ත්වය අහෝසි වී නැවත මිනිසත් බවක් ලබා ගැනීමට නොහැකි තරම් වී පහත් දුඃඛිත

උප්පත්තියක් උරුම වේ. උප්පත්තිය උසස් හෝ පහත් වීම මේ අනුව සිදුවේ. මෙසේ අප විඳින සියලු සැප හා අප විඳින දුක්වලට හේතුව අපගේම කර්ම විපාක බව සිතිය යුතුය. දැන් දුක් විඳින අය ගැන පහත් කොට නොසිතුව මැනවි. අපගේ කර්ම විපාක අනුව මීටත් වඩා අන්ත දුඃඛිත උප්පත්තියක් හිමිවිය හැකිය. මේ ලෝකය හැමෝටම සාධාරණ වී ඇතත් අප කරණ කර්ම අනුව අපේ සැප දුක් ඇතිවේ. කර්මය යනු පුද්ගලික දායාදයයි. මේ නිසා කිසිවෙකුට අවමන් නොකරන්න. පහත් ලෙස නොසිතන්න. යමෙක් අනාථ වී දුඃඛිත වී අසරණ වී සිටින විට ඒ දෙස බලා තමන් යම්කිසි අකුසල කර්ම විපාක වශයෙන් මෙසේ දුඃඛිත විය හැකි බව සළකන්න. මීටත් වඩා භයානක අපාය වල උපත ලැබිය හැකිය. තමාට මෙවැනි තත්ත්වයකින් ගැලවීමට නොහැකිය. කර්ම විපාක ඵල දීම ස්වභාව ධර්මයකි. අපි සියලු දෙනාමට කර්ම කිරීමේ ශක්තිය ඇත. මේ දුඃඛිත පුද්ගලයෝ කවදා නමුත් ඉන් මිදී අපි මෙන් සැප විඳින තත්ත්වයකට පැමිණිය හැකිය. එවිට අපගේ නරක කර්ම අනුව අපි ඔවැනි තත්ත්වයක වැටීමටද හැකිය. ශාසනය යනු බුදුරජාණන් වහන්සේගේ පණිවිඩයයි. සත්‍ය ධර්මයයි. මේ ධර්මයට අනුව තමන් හා අනුන් පිළිබඳ සත්‍යය වටහා ගත යුතුය. මේ අනුව තම ගත යුතු මාර්ගය කුමක්දැයි නිතර සිතන්න. ධර්මය සමාන වෙන කිසිම මාර්ගයක් නැත.

භික්ෂුවක් වශයෙන් ජීවත් වූ කාලය තුළ මා නිතර ප්‍රත්‍යවේක්ෂා කළෙමි. නිතරම මගේ සිතේ ඇතිවන කුසල් අකුසල් හඳුනා ගතිමි. හැම මොහොතේදීම මම කළ භාවනාව එයයි. තම සිතිවිලි නිසා කර්ම සිදුවන බව මම දැන් නිඃසැකයෙන්ම දැක අවබෝධ කරමි. මේ කර්ම තමා ස්වකීය කොට ඇත. මා ලුහුබැඳ මා පසුපස ගමන් කරයි. මේ ගැන කිසි සැකයක් නැත. මේ කර්මයේ ක්‍රියාකාරිත්වය නොදන්නා අය තම හිතුමනාපේ හැසිරෙමින් අනන්ත පරිහානියකට පත්වීම කිසිවෙකුට වැළැක්විය නොහැකිය. මේ අය තමන් දෙමව්පියන් නිසා ජීවිතය ලැබ දෙමව්පියන්ගේ අනන්ත ආධාර උපකාරයෙන් ජීවත් වූ නමුත් දෙමව්පියන්ට නොසළකති. කර්ම විපාක නොදන්නා බැවිනි. තමාගේ ආත්මාර්ථකාමී ජීවිතය ගැන මිස වෙන තැකීමක් නැත. එය එතරම් අප්‍රිය බලන්ටත් බැරි තත්ත්වයකි. තමා මෙතරම් කාලයක් දෙමව්පියන්ගේ ආධාර සැළකිලි ලැබූ බව අමතක කරති. මෙසේ අනන්ත උපකාර කිරීම කර්ම නොවන්නේ නම් කර්ම කියන්නේ කුමකටද ? තම ශරීරය ඒ නිසා පෝෂණය ලබන්නේ තමාගේ හොඳ විපාක නිසා නොවේද ?

මිනිසා විඳින සැප දුක් වලට හේතු ඇත. යමෙක් තම ජීවිත ආසාව නැති කර මෝහ චින්තනයෙන් සිය පණ හානි කරත්ද ඒ අවස්ථාවේදී බලවත් කර්ම විපාකයක් ඔහු ලුහුබැඳ පැමිණේ. ඔහු ජීවිතක්ෂයට පත් වූයේ ඒ නිසාය. නමුත් තමා ඉහත කළ කර්ම විපාකයක් නිසා එවැන්නක් සිදුවුන බව ඔහුට

පිළිගැනීමට නොහැකිය. මේ තත්ත්වය කුමක්ද ? අනන්ත මෝහය, අවිද්‍යාවයි. අන්ධ භූත බවයි.

අපේ මුළු ජීවිතය කර්මය හා බැඳී ඇත. අපේ ඉහත කර්මවල විපාක හැම මොහොතේම අප කරා පරිසරයෙන් පැමිණෙන්නාක් මෙන්ම අපි හැම මොහොතේදීම අළුත් කර්ම සිදු කරමු. මේ බව ඔබ නොදන්නේ නම් ඔබ මරණයට කැප වූ වෙකි. ඔබට ගැලවීමක් නැත. කර්මය අප පසු පස එන්නේ ස්වාමියා පසුපස එන බල්ලෙකු මෙන් නොවේ. එය නොවැළැක්විය හැකි විපාකයකි. තමන් විසින් සිතින් වචනයින් ක්‍රියාවෙන් හැම මොහොතේදීම කර්ම උපදවනු ලැබේ. මවනු ලැබේ. නිර්මාණය කරනු ලැබේ. මුළු ලෝකයේ සියලු දෙනා විඳින සැප දුක් එහි විපාක වෙත්. මේ බව ඔබ නොදන්නා විය හැකි වුවද එය ඔබ විඳින්නෙකි කරන්නෙකි. මේ නොදන්නා බව තනිකර මෝහයකි. මෝඩ කමකි. මුලාවකි. මෙසේ මෝහයට පත්වීමක් කර්ම විපාකයකි.

මම බොහෝ කාලයක් සිට ආචාර්ය මන් ගැන අතිශය පැහැදීමක් තිබූ බැවින් මේ දේශනය අවධාරණයෙන් ඇසුවෙමි. ඒ මොහොතේදී මට ලැබුණු ආශ්වාදය, සැනසීම කොතරම්ද යත් සමාධි සුවයකින් අහසේ පාවෙන්නාක් මෙන් දැනුණි. මේ ධර්මය කෙතරම් ඇසුවත් මදි යැයි සිතුණි. මා මේ ඉන් ස්වල්පයක් සඳහන් කරන්නේ ඔබ කර්මය ගැන නොදන්නා දේ දැන ගැනීමටය. කර්මය යනු සර්ව සාධාරණය. එබැවින් ඔබගේ කර්ම විපාක ගැන මේ අනුසාරයෙන් බොහෝ කරුණු එළිදරව් විය හැකිය.

මේ දේශනයෙන් පසු ආචාර්ය මන් නැගිට බුදු පිළිමය ඉදිරිපිට වැඳ වැටි ආචාර දැක්වූයේය. (ඒඕ බුන් රාජකවි භික්ෂුව) එම දේශනය අසා බොහෝ දෙනා අතිශය සතුටට පත් වූ බව කියා සිටියේය. ආචාර්ය මන් මේ උන්වහන්සේගේ අන්තිම දේශනය විය හැකිය. තමන්ගේ ආයුෂ ගෙවී දුර්වල වී යන නිසා යැයි පැවසීය. මේ ආකාරයෙන් තමන් වහන්සේ නැවත වියංමයි දෙසට නොඑන බව වදාළහ. එය එසේම විය. උන්වහන්සේ නැවත එහි නොපැමිණියේය.

ටික දිනක් වට් පේඩි ලුඅං ආරාමයේ වාසය කර උන්වහන්සේ බැංකොක් බලා පිටත් විය. සොම්ඩෙට් ෆරා මහාවීරවොං භික්ෂුව සහ අනිකුත් ජ්‍යෙෂ්ට භික්ෂූන් සහ ගිහි පිරිස උන්වහන්සේ කැටුව දුම්රිය පළට ගියහ. දෙවිවරු විශාල පිරිසක් ඒ සමඟ ගියහ. දෙවිවරු අහස වැහෙන්ට තරම් හතර වටේ පිරී සිටි බව ආචාර්ය මන් පැවසීය. දුම්රිය පළට පැමිණි පසුද ඒ දේව සමූහයා අහසේ විසිර සිටියහ. දුම්රියට නැගී යන තුරුත් බලා සිටියහ. ඒ අවස්ථාව කලබල සහිත විය. බලා සිටින අයට ආශිර්වාද කිරීම සහ ඔවුන්ගේ වැඳුම් පිදුම් ද කථා බහ ද ඇසීමට විය. ඒ අතර අහසේ සැරිසරණ දෙවියන්ටද ආශිර්වාද කළ යුතු විය. පැමිණ සිටි මිනිස්සු මේ බව නොදනිත්. ගිහියන්ට කථා කර ඉන්පසු

දෙවියන්ට සම්පූර්ණ අවධානය යොමුවිය. මේ සියල්ල අවසන් වූ විට දුම්රිය ගමන ආරම්භ විය.

උන්වහන්සේ මහත් සංවේගයට පත් වූයේ ඒ දෙව් කැළ ගැනය. ඒ අය එතරම් ආදර භක්තියක් පිරිනැමූ විදිය විස්මිතය. මිනිසුන් හා සමාන ආදර ගෞරවය පුද කළහ. දුම්රිය ගමන් කරන විට පසුපස අහසින් වඩිති. අන්තිමේදී උන්වහන්සේ කථා කර ඒ දේව සමූහයාට තම විමාන වලට යන ලෙස දැනුම් දුණි. ඔවුන් නැවතුනේ මහත් ආන්දෝලනයකිනි. නැවත උන්වහන්සේගේ පැමිණීම අපේක්ෂා කරමිනි. නමුත් ඒ අයගේ සිතුම් පැතුම් එසේ සිදු නොවීය. ආචාර්ය මන් ඒ ප්‍රදේශයට නොපැමිණියේය. උන්වහන්සේ සිටි උදොන් තානි හා සබොන් නබොන් ප්‍රදේශයට ඒ දෙවිවරු පැමිණි බව දැන උන්වහන්සේ අප සමඟ නොකීවේය.

බැංකොක් නගරයේ වට් බොරොමනිවට් ආරාමයේ ආචාර්ය මන් නැවතුණි. සොම්ඩෙට් ෆරා මහා විරෙවොං භික්ෂුව ටෙලිග්‍රෑම් කළ ආකාරයට එහි ටික දිනක් නැවතී උදොන් තානි වලට යාමට නියමිතය. මෙහිදී බොහෝ දෙනා අවුත් ප්‍රශ්න අසන්නට විය.

ප්‍රශ්නය : මට ආරංචියි. ඔබ වහන්සේ භික්ෂුවගේ 227 නීති රකින්නේ නැත. එකම නීතියක් පමණක් රකිති. මෙය සැබෑවද ?

ආචාර්ය මන් : එසේය මම රකින්නේ එකම නීතියයි.

ප්‍රශ්නය : කුමක්ද ඒ නීතිය

ආචාර්යය මන් : ඒ මගේ සිත

ප්‍රශ්නය : ඉතින් නීති 227 රකින්නේ නැද්ද ?

ආචාර්ය මන් : මගේ සිත රකින්නේ. එවිට බුදුරජාණන් වහන්සේ පැන වූ නීති 227 පමණක් නොව ඊට වඩා නීතිද රැකේ. මක්නිසාද මා වචනය ක්‍රියාව ඉබේම රකින බැවිනි. එසේ විශ්වාස නොගන්නා අය ඇතත් කම් නැත. මම උපසම්පදා වූ දින පටන් මගේ සිත හික්මවා ගතිමි. හිත යනු කය හා වචනයේ හිමිකාරයාය.

ප්‍රශ්නය : ඉන් අදහස් කරන්නේ සිල් ආරක්ෂා කිරීමට හිත හික්මවිය යුතු

යැයිද ?

ආචාර්ය මන් : වෙන මොනවා හික්මවිය හැකිද ? සිත මිස ? මළ මිනියකට විතරයි හිතක් නැත්තේ. ඒ නිසා කය, වචනය හික්මවීමක් නැත. මළ මිනිය, කය වචනය හික්මව වන්නේ නැත්තේ යම් චේතනාවක් නැති නිසා බව නුවණැත්තෝ දනිති. මළමිනියේ සිල් රැකීම යනු මළ දෙයකි. මා ප්‍රාණවත් කෙනෙකි. එබැවින් මළ මිනියක් සේ කය වචන හික්මවන්නේ කෙසේද ? මගේ කුසලතාවයෙන් චේතනාව රකින විට කය වචනය හික්මේ. එවිට සියලු නීතී ආරක්ෂා වේ.

ප්‍රශ්නය : මම දන්නා තරමින් සීලය යනු කය, වචනය හික්මවීමයි. ඒ නිසා සිත හික්මවීම සීලයට අයත් නැත. එබැවින් ඒ ප්‍රශ්නය ඇසුවෙමි.

ආචාර්ය මන් : සීලයට අදාළ වන්නේ කය වචන හික්මවීමයි. එහෙත් කය වචන ක්‍රියාත්මක කරන්නේ කුමක්ද ? එහි නිර්මාතෘවරයා කවුද ? හිමියා, ප්‍රධානියා කවුද ? සිත නිසා යමෙකුගේ කය වචන හසුරුවයි. කය වචනය තමන්ටත් අනුන්ටත් සතුට සැනසුම ලබාදෙන ලෙස හැසිරවීමට ප්‍රධාන වන්නේ සිතයි. සිත සෑම ක්‍රියාවක්ම පාලනය කරයි. සිත නැතිව කිසි කාර්යයක් කළ නොහැකිය. හොඳ දක්ෂ දෙයක් කිරීමට හොඳ දක්ෂ හිතක් අවශ්‍ය වේ.

අසනීපයක් සුවකිරීමට රෝග නිදානය සෙවිය යුතුයි. ඉන්පසු රෝග නිදානයට බෙහෙත් කළ යුතුයි. එවිට රෝග ලක්ෂණ ඉබේම නැතිවේ. එමෙන්ම සීලය රැකීමට සිත පාලනය කළ යුතුයි. නැත්නම් එම ක්‍රියා හිල් සහිත කැඩුණු, බිඳුණු, කඩවුන ක්‍රියාවේ. මක්නිසාද පාලනය නොවූ සිත නිසාය. එබැවින් ඔහුගේ සීලය කැඩුණු බිඳුණු පළුදුවන ස්වභාවයකි. ස්ථිර නොවේ. ශක්තිමත් නොවේ. මෙවැනි සීලය නිසා මිනිසා අරමුණක් නැතිව ඒ මේ අත පා වී යයි. එවැනි අය නිසා ශාසනය පරිහානියට පත්වේ. එය තමාට සතුට එළවන්නේ නැති අතර ළඟ ඇසුරු කරන්නන්ගේ ගෞරවයට පත් නොවේ.

මම කවදාවත් ඉගෙන ගෙන නැත. මගේ මහණ වීමෙන් පසු ඒ ආචාර්ය වරයා ධූතාංග භික්ෂුවක් ලෙස මා කැලෑ ප්‍රදේශයේ කඳුකරයට ගෙන ගියහ. මම ධර්මය ඉගෙන ගත්තේ ගස් වැල් වලින්, තණකොළ වලින්, ගංගා ඇළ දොළ, කඳු හෙල්, ගුහා වලින්. කුරුළු නාද, වන සතුන්ගේ ශබ්ද, ස්වාභාවික පරිසරය තුළින්. මම ත්‍රිපිටකය කියවා සීලය ගැන අධ්‍යයනය කර නැත. ඔබට මම දුන් පිළිතුරු මගේ ඒ පෞරාණික සම්ප්‍රදායෙනි. ඔබට ශාස්ත්‍රීය පිළිතුරක් දෙන්ට තරම් මට දැනුමක් නැත. එබැවින් මම බැරිකම පිළිගන්නෙමි.

ප්‍රශ්නය : සීලයේ ස්වභාවය කුමක්ද ? ඇත්තෙන්ම සීලය යනු කුමක්ද ?

ආචාර්ය මන් : තමාගේ සිතුවිලි ගැන අවධාරණය කිරීම මොන දේ

සිතීමට සුදුසුද ? මොන දේ සිතීමට නුසුදුසුද ? අපි හැසිරෙන්නේ කෙසේද ? අපේ සිතුවිලි, වචන, ක්‍රියා කෙසේද ? මේ තුන් දොර පාලනය කරගෙන සාධාරණ ලෙස හැසිරෙනවාද ? මේ තුන් දොර පාලනය කිරීමෙන් අපේ හැසිරීම ආදර්ශමත් වේද ? දබ්බර නොහික්මුණ ශක්තියක් නොපෙනේද ? මෙසේ තමාගේ ශිෂ්ටත්වය, සංස්කෘතිය වැදගත්කම හැසිරීම මත සීලය දැක්විය යුතු අතර එම පුද්ගලයාගේ සිතිවිලි හා හැසිරීම වෙන් කළ නොහැකිය. සීලය මෙසේ වෙන් කළ හැකිනම් කඩ සාප්පුවල සීලය විකිණීමට පත්වන්නේ මීට බොහෝ ඉහත කාලයක සිටය. එවිට යමෙකුගේ ශීලය හොර සතුරන් අයිති කරගෙන විශාල ලාභ ලබාගෙන විකිණනු ඇත. තමාගේ බඩු මුට්ටු සොර සතුරන් ගන්නාක් මෙන් තමාගේ ශීලයද සොර මැර කමින් ගනිති. එවිට තමාගේ ශීලය අන් භාණ්ඩ මෙන් පවත්වා ගැනීම ඉතා දුෂ්කර වේ. බෞද්ධයෝ සීලය වඩන්ට නොකැමැති වෙති. මක්නිසාද සොර සතුරු උපද්‍රව නිසාය. සැබවින්ම සීලය යනු දුස්සීලභාවයෙන් වන අලාභ හානි හා සිල්වත් වීමෙන් වන ලාභ කීර්ති, ප්‍රශංසා වේ. සීලයෙන් වෙන් වූ විට මෙවැනි භයානක විපාක ගෙන දෙන බැවින් මම කිසි විටෙක සීලයෙන් වෙන් නොවී සිටිමි. යමෙක් සීලයෙන් බැහැර නොවී සිටී නම් ඔහු යන එන තැන් සතුටින් සන්තෝෂයෙන් සිටී. කුමක් කළත් තම සීලය නැතිවේ යැයි සැකයක් නැති බැවිනි. යමෙක් සීලයෙන් වෙන් වී සිටින විට මහත් දුකට කනස්සල්ලට පත් වී මරණයෙන් පසු ප්‍රේතයන් වී තමා ''එකතු කළ ශීලය'' ගැන තණ්හාවට පත්වෙනු ඇත. සමහරු තමා එකතු කළ ධනය මරණින් පසු අරක්ගෙන ඉන්නා ප්‍රේතයන් වැනිවේ. සීලය තමාගෙන් වෙන් කළ හැකි නම් එවැනි තත්ත්වයක් උදාවේ.

## පරිපූර්ණ ආත්ම විශ්වාසය

එක් දිනක් වට් බොරොමනිවට් විහාරයේ ස්ථවිර නමක් ආචාර්ය මන් සමඟ සාකච්ඡාවකට කැමති විය. (ආචාර්ය චම් බුන් උපාලි) උන් වහන්සේගෙ " ප්‍රශ්නයකින් සාකච්ඡාව ඇරඹුණි.

ඔබ වහන්සේ කඳුකරයේ ඝන වනාන්තරයේ අන් භික්ෂූන්ගෙන් හා මිනිසුන්ගෙන් හිස් හුදකලාවේ සිටින විට තම භාවනා පිළිබඳ ගැටළුවක් ඇති වූ විට එය විසඳන්නේ කෙසේද ? මම වාසය කරන්නේ බොහෝ උගත් ධර්මධර භික්ෂූන් වාසය කරන නගරයේ බැවින් බොහෝ විට මට ඒ අයගේ උපකාරයෙන් යම් ගැටළු නිරාකරණය කළ හැකිය. එහෙත් සමහරවිට විසඳිය නොහැකි ගැටළු ඇතිවේ. කිසිවෙකුගෙන් උපකාරයක් ගත නොහැකිය. එසේ හෙයින් ඔබ වහන්සේ තනිවම සියළු ගැටලු විසඳා ගන්නේ කෙසේද ?

ආචාර්ය මන් නිර්භයව පිළිතුරු දුනි. ඔබ වහන්සේට පිළිතුරු දෙන්නේ පරිපූර්ණ ආත්ම විශ්වාසය මත පිහිටා ගෙනය. මේ විශ්වාසය ගොඩ නැගුණේ ප්‍රාථමික ස්වභාව ධර්මය හැදෑරීමෙනි. මම ධර්මය නිතර දෙවේලේ ප්‍රශ්න කරමි. නිදන අවස්ථාව හැර අන් හැම මොහොතේම ධර්මය සොයමි. නින්දෙන් පිබිදුන විගස ධර්මය සොයමි. ගැටළු ගැන මගේ සිතේ නිරන්තරයෙන් තර්ක විතර්ක ඇත. පරණ ගැටළු විසඳු විට අළුත් ගැටළු පැන නගී. එක ප්‍රශ්නයක් විසඳු විට සමහර කෙළෙස් සිඳී යයි. තවත් ප්‍රශ්නයක් ඇති වූ විට තවත් කෙළෙස් හට ගනී. සෑම ආකාරයකම ප්‍රශ්න, දැඩි, චක්‍රාකාර ප්‍රශ්න, තේරුම් ගැනීමට නොහැකි සංකීර්ණ ප්‍රශ්න සියල්ල හට ගන්නේ සිතේය. ප්‍රශ්න සමඟ සටන් කරන්නේ සිතය. ඇත්තෙන්ම සිත යනු කෙළෙස් සටන, සටන් වදින යුද බිම වේ. කෙළෙස් යටපත් කිරීම, පරාජය කිරීම යනු ප්‍රශ්න නිරාකරණය කිරීමයි.

අනාගත ප්‍රශ්න නිරාකරණය කිරීම ගැන මම වෙහෙස නොවෙමි. මම උනන්දු වන්නේ වර්තමාන ගැටළු තම කෙළෙස් නිසා හට ගන්නා විටය. ඒ ඒ අවස්ථාවේදී හටගත් කෙළෙස් ඒ ඒ වේලාවේදීම නිරාකරණය කරමි. මම අන් කිසි භික්ෂුවකගේ උපකාරය නිසා මගේ කෙළෙස් ගැටළු විසඳා ගන්නේ නැත. මගේම සති, පඤ්ඤා ඉතා ඉක්මණින් ප්‍රශ්නය නිරාකරණය කරයි. නිතරම මම බුදු වදන පිළිපදිමි. ''අත්තානි අතතනො නාථො'' - තමා තමාගේම විමුක්ති දායකයාය. එබැවින් මගේ සිහි නුවණින් ප්‍රශ්න වලට විසඳුම් සොයමි. පොත පතෙන් සොයන්නේ නැත. ධර්මය, සති, පඤ්ඤාව සියලු ප්‍රශ්න නිරාකරණය කරයි. සමහර ප්‍රශ්න ඉතා සංකීරණය. ඒවා පිළිබඳ නැවත නැවත විචාරා අන්තිමේදී සති පඤ්ඤාවලට හසුවේ.

අනුන්ගේ උපකාරයෙන් මගේ ප්‍රශ්න විසඳීමට අවශ්‍ය නිසා මම ඒ අය ආශ්‍රය නොකරමි. තනිම වාසය කිරීම ඊට වඩා පහසුවකි. තනිව තම සිත කය සමඟ විසීම නිසා තෘප්තිමත් වෙමි. මරණ මොහොත පැමිණ විට අත්හරින්ට කිසිවක් නැත. මගේ හුස්ම නැවතුන විගස සියලු දේ අවසන් වේ. ඔබගෙ ' ප්‍රශ්නයට මෙසේ පිළිතුරු දීම ගැන සමාවුව මැනව. මම ශාස්ත්‍රීය ලෙස කථා කිරීමට නොදනිමි. මගේ අත්දැකීම පමණක් දනිමි.

ප්‍රශ්නය ඇසූ එම ආචාර්යවරයා ඒ සියලු දේ ගැන එකහෙලා එකඟ විය. ''ඔබ වහන්සේ සුවිශේෂ පුද්ගලයෙකි. ඝන වනාන්තරයේ හුදකලා වාසය කිරීමට හැම අතින්ම සුදුස්සෙකි. ඔබ දේශනා කළ ධර්මය පොත පතේ සඳහන් වී නැත. පොතේ සඳහන් ධර්මය සහ සිතේ අවබෝධය නිසා වන ධර්මය වෙනස් වේ. මුල් අවස්ථාවේදී බුදු වදන ලීවේ අවබෝධයෙන් පරිපූර්ණ රහතන් වහන්සේලා විසිනි. එහෙත් පසුව ධර්මය පිළිබඳ ලියවී ඇත්තේ එවැනි පාරිශුද්ධ අය විසින් නොවේ. එබැවින් මුල් දේශනා දැන් තනුක වී ඇත. ඒ නිසා ඔබ අත්දැකීමෙන්

දේශනා කරණ ධර්මය දැන් පොත පතේ සඳහන් ධර්මයට වඩා පිළිගත යුතුවේ. මේ සියල්ල ''ධර්මය'' නමින් හඳුන්වති.

මගේ මෝඩ ප්‍රශ්නයට ලැබුණ පිළිතුර ගැන කිසි සැකයක් නැත. එහෙත් ඒ මෝඩ ප්‍රශ්නය හොඳ දෙයකි. මක්නිසාද මෙවැනි දැනුම් සම්භාරයක් ලබා ගැනීමට හේතු වීම නිසාය. මගේ මෝඩකම විකුණා මහත් ප්‍රඥාව මිලදී ගතිමි. මගේ මෝහය අත්හැර ප්‍රඥාධනට ලබා ගතිමි.

එහෙත් මට තව එක ප්‍රශ්නයක් ඇත. යම් යම් භික්ෂූහු බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ලබා ප්‍රත්‍යන්තයට ගොස් තනිව පුරුදු කරණ අවස්ථ ාවේදී පැන නැගුණු ප්‍රශ්න වලට විසඳුම් ලබා ගැනීමට විටින් විට බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණෙති. බුදුන් වහන්සේ ඒ සියල්ල විසඳුම් දුන් පසු ඒ භික්ෂූහු නැවත හුදකලාවේ පුහුණු වෙති. එවැනි නිරාකරණය කර දුන් ප්‍රශ්න මොනවාද ?

එවැනි අති ශ්‍රේෂ්ඨ උතුමෙකුගෙන් ක්ෂණයකින් විසඳුම් ලබා ගැනීමට හැකි විට තමන් තනිව වෙහෙසෙන්නේ කුමකටද ? එහෙත් ඉතා දුර බැහැර නම් එය වුවද ක්‍රියාත්මක කළ නොහැකිය. එවිට තමන්ම එම ප්‍රශ්නය විසඳීමට වීර්‍යය ගත යුතුය. එය තනිව විසඳා ගැනීමට කල්ගත විය හැකිය.

බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයෙන් යම් යම් ගැටළු නිරාය- ාසයෙන් විසඳිය හැකිය. එබැවින් එම ශිෂ්‍යය භික්ෂූහු එසේ ප්‍රශ්න විසඳා ගනිති. අද බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටිනවා නම් මම ද එහි යාමට හැකි නම් ගොස් ඒ විසඳුම් ලබා ගතිමි. එවිට මම තනිව බොහෝ වෙහෙස විය යුතු නැත.

එහෙත් තනිව විසඳුම් ලබා ගැනීම සුදුසු වන්නේ අවසානයේදී අවබෝධය ලබන්නේ තනිව බැවිනි. දක්ෂ ගුරුවරයෙක් සිටී නම් ඉක්මනට අපේ අවබො- ්ධය ලැබිය හැකිය. තනිව නිරාකරණය කරණ විට අනුමාන ඥානයෙන් නැවත නැවත විචාරිය යුතුය. එය දුෂ්කරය. එහෙත් මට වෙන විසඳුමක් නොතිබුණි. මට වැටී වැටී නැගිටින්ට සිදුවිය. බොහෝ වැරදි මති මතාන්තර, නිගමන වලට පැමිණුනෙමි. එහෙත් එහි වටිනාකම වූයේ අප්‍රතිහත ධෛර්‍යය හා අධිෂ්ඨානය බලවත් වීමයි. මෙය තදින් ක්‍රියාත්මක වූ නිසා මගේ ගොරෝසු චිත්තය සුමට විය. මෘදු මොළොක් විය. අන්තිමේදී එය ඉතාම නිවැරදි විය. එවිට මා සමබර විය. ප්‍රතිපත්ති උපේක්ෂා සහගත විය. මෙය තුළින් ස්වභාව ලක්ෂණ විනිවිද දැක්කෙමි. ධර්මය දැක්කෙමි. එම ස්ථවිරයන් වහන්සේ තව බොහෝ ප්‍රශ්න ඇසූ නමුත් ප්‍රධාන වශයෙන් ඇසූ ප්‍රශ්න පමණක් මෙහි ඇතුළත් කර මම අනිත් ප්‍රශ්න සඳහන් නොකරමි.

ආචාර්ය මන් බැංකොක් හි වාසය කරණ කාලයේදී බොහෝ පොහොසත් ගිහියන්ගෙන් දානය පිණිස ආරාධනා ලැබීය. එහෙත් එම දානයෙන් පසු තම ශාරීරික වැඩ කිරීම අපහසු බැවින් එය ප්‍රතික්ෂේප කළහ.

ටික කාලයක් බැංකොක්හි සිට නඛොන් රචස්සිමා ප්‍රදේශයේ කෝරට් නුවර බලා පිටත් විය. එහි වට් පා සලවන් ආරාමයේ වාසය කරන විට බොහෝ අය උන්වහන්සේගෙන් ප්‍රශ්න ඇසීමට පැමිණුනි. ඉන් එක් ප්‍රශ්නයක් උන්වහන්සේ මට කීහ. එය මගේ මතකයේ හොඳාකාර රැඳී ඇත. බොහෝ කරුණු මට අමතක වුවද මෙය කවදා නමුත් උන්වහන්සේගේ ජීවන ප්‍රවෘත්තිය අඩංගු කළ යුතු යැයි මට එවිට අදහසක් පහළ විය. ප්‍රශ්නය වූයේ ආචාර්ය මන්ගේ අවබෝධය ගැනය. ඇත්තෙන්ම උන්වහන්සේගේ ප්‍රසිද්ධියට අනුව එවැනි ආර්ය පුද්ගලයෙක්ද ? ප්‍රශ්නය අසන ලද්දේ කර්මස්ථාන පිළිබඳ බොහෝ අත්දැකීම් ඇති කෙනෙක් විසිනි.

ප්‍රශ්නය : ඔබ වහන්සේ කෝරට් නුවරට පැමිණියේ මෙහි සිටින දායක පිරිසට අනුග්‍රහ පිණිසද ? නැතහොත් මග්ග ඵල නිවන ශාක්සාත් කිරීමටද ?

ආචාර්ය මන් : ''මම යමක් දුක්ගෙන දෙන්නේද කරදර ගෙන දෙන්නේද? එවැන්නක් නොසොයමි'' යි - කිසි සැකයක් බියක් නැතිව පිළිතුරු දුනි. කුස ගින්-

# 5

# අසාමාන්‍ය ප්‍රශ්න බුද්ධිමත් පිළිතුරු

නන් පෙළෙන්නන් තමන්ට ඉවසිය නොහැකි බැවින් ඕනෑම ආහාරයක් සොයමින් එහේ මෙහේ යති. එය හොඳ හෝ නරක වේවා අන්තිමේදී එම ආහාරය දිරවා ගත නොහැකි විය හැකිය. එහෙත් මට එවැනි අවශ්‍යතාවයක් නැත. මෝහයක් ද නැත. මෝහය නැති අයගේ සෙවීමක්ද නැත. සැමවිටම තම සිත තෘප්තිමත් වී තිබේ. එබැවින් අවශ්‍ය වන්නේ කුමක්ද ? සෙවණැලි අල්ලන්ට යන්නේ එය සෙවණැලි බව නොදන්නා අය වෙති. චතුරාර්‍ය්‍ය සත්‍යය ඒකාන්ත සත්‍යයකි. එය සියලු දෙනා කෙරෙහි විද්‍යමාන වේ. මේ සත්‍යය දන්නා මම මුලාවමට පත් නොවෙමි. ඉතින් මම කුමක් සොයන්නෙමිද ? මම තවමත් ප්‍රාණවත් වෙමි. බොහෝ දෙනා මගේ උපකාර සොයති. ඒ අයට මම උපකාර කරමි. එපමණකි. මැණික් සොයා ගැනීම පහසුය. එහෙත් හදවතෙ ධර්මය ඇති හොඳ මිනිසුන් සෙවීම දුෂ්කරය. එක් සදාචාර සම්පන්න හොඳ මිනිසෙක් ලෝකයේ සියලුම ධනයට වඩා වටී. මක්නිසාද ඒ සියලුම ධනයට වඩා හොඳ මිනිසාගෙන් ලෝකයට වන සෙත් ශාන්තිය වැඩි නිසාය. එකම පුද්ගලයෙක් කෙතරම් ලෝකයට සාමය, සතුට ගෙන දෙන්නේද ? සම්මා සම්බුදුරජාණන් වහන්සේ සහ රහතුන් වහන්සේලා මෙවැනි ආශ්චර්යමත් පුද්ගලයෝ වෙති. හොඳ කර්ම මිල මුදල්වලට වඩා වටනේය. ඒ සීලාචාර ගුණවත් මිනිසා නිසා අවට සිටින සියලු දෙනා සතුටින් සාමයෙන් ජීවත් වෙති. දුප්පත් වුවද සැප විඳිති. එහෙත් මෝඩයෝ මිල මුදල් සොයමින් තමාගේ ගුණවත් කම්වලින් පිරිහෙති. තමන්ගේ කර්ම විපාක ගැන සිතීමට නුවණ නැත. තමන් කෙතරම් දුෂ්ට, දුරාචාරයේ යෙදුනත් එහි විපාක නොදනිති. අපායේ සිටින දුෂ්ට යක්ෂයන් තමන් මහා භයානක දුක් විඳිමින් තිරිසනුන්ට භයානක දුක් පමුණුවති. අපායේ වාසය කර අන්ත තිරිසතුන් ලෙස ඔහු නොදනී. එවැනි භයානක මිනිස්සු ද ඇත. ඒ මෝඩ මිනිස්සු මොන යම් අපරාධයක් කොට හෝ මුදල් ලබා ගනිති. ඒ පව්කාරයන්ගේ කර්ම අපාය බැංකුවේ තැන්පත් වී ඇත. ඒ අයට ඒ නිසි දඬුවම් අපායේදී ලැබේ. කුසල් හෝ අකුසල් අතර පරතරයක් ඇත. හොඳ නරක අතර ද ආධ්‍යාත්මික ගුණය හා භෞතික ධනය අතරද අහස

පොළොව මෙන් පරතරයක් ඇත. නුවණැත්තෝ මේ පිළිබඳ ගැඹුරින් අවධානය කළ යුතුයි. ප්‍රමාද විය යුතු නොවේ.

අවසානයේදී අප විඳින සැප දුක් මේ කර්ම විපාක මත සිදුවේ. තම කර්ම විපාක පිළිගන්වා හැර ඉන් මිදීමක් නැත. දුක් විපාක පැමිණි විට ඒ ගැන ප්‍රශ්න කිරීමක් නැත. එය තමන් බලහත්කාරයෙන් වැළඳ ගනී. සුනාමි ව්‍යසනයට හසු වූවාක් මෙනි. මේ කර්ම විපාක නිසා ජීවත් වන සත්ත්වයෝ එකිනෙකාගෙන් වෙනස් වේ. උප්පත්තිය, ශරීර ලක්ෂණ, ගතිගුණ පවා ආවේණික වූ කර්ම විපාක වේ. එය අපේ දෛවය හා බැඳී පවතී. එහි වගකීම තමා සතුවේ. ඒවා තමාගේම කර්ම විපාක බැවිනි. මේ කර්ම විපාක භාරය අප විඳිය යුතුය. හොඳ හෝ නරක, සැප හෝ දුක, මේවා අන් අයට පවරන්ට නොහැකිය. අප සන්තක දායාද වේ. කර්ම නීතිය මිනිසුන් සදාගත් සම්මුතියක් නොවේ. එය එක් එක් කෙනා තනි තනිව කළ දෙයකි. මේ ප්‍රශ්නය ඔබ ඇසුවේ ඇයි ?

''මට සමාවන්න. ඔබ වහන්සේගේ ගුණ, කීර්ති, වර්ණනා මා බොහෝ අසා ඇත. භික්ෂූන් වහන්සේලා හා ගිහි අය ඒ පිළිබඳ ප්‍රකාශ කරති. ඔබ වහන්සේ අවශේෂ භික්ෂූන් මෙන් නොවේ ඔබ වහන්සේගෙන් ධර්ම කථාවක් ඇසීමට මම පුල පුලා සිටියෙමි. ඒ නිසා මේ ප්‍රශ්නය ඇසුවෙමි. මම ඇසූ ආකාරය වැරදි විය හැකිය. එබැවින් එය ඔබ වහන්සේට වෙහෙසක් වුනිදැයි නොදනිමි. මම අවුරුදු ගණනාවක් නොකඩවා ප්‍රතිපත්ති රැක්කෙමි. මගේ සිතුම් පැතුම් මේ කාලය තුළ ඉතාමත් සැනසිලිදායක, සාමකාමී වී ඇත. මගේ ජීවිතය ඵලදායි වී ඇත්තේ බුද්ධ ශාසනය හමු වූ බැවිනි. අද මම මෙවැනි අනගි ධර්මයක් ඔබ වහන්සේගෙන් ඇසුවෙමි. ඉතා සරල, නිවරදි, සංක්ෂේප වාක්‍ය වලින් ඔබ වහන්සේ අදහස් ප්‍රකාශ කළ අන්දම මා මවිතයට පත් කරයි. කෙළෙස් සහිත පුද්ගලයෙකු වූ මගේ සැක අද බොහෝ සෙයින් දුරු වී ඇත. මින් මතුවට මගේ ප්‍රතිපත්ති තනිවම ගෙන යමි.''

''ඔබ ප්‍රශ්නය ඇසූ අන්දම නිසා මම එසේ පිළිතුරු දුනිමි. ඇත්තෙන්ම මට කිසි දෙයක් අවශ්‍ය නැත. මගේ මෝහයක්ද නැත. මම කිසිවක් නොසොයමි. මගේ පිළිවෙත් පුරණ කාලයේදී සැක තිබුණි. මාර්ගය හා පිළිවෙත් පිළිබඳ නිතර සෙවුවෙමි. හුදකලාවම වීර්‍යය වඩමින් මරණාසන්නව ඇද වැටුණි. කඳු මුදුන්වල ඝන වනාන්තරවල හුදකලා භාවනා කරන විට බොහෝ ගැටළු මතුවිය. ඒවාට තනිව විසඳුම් සෙව්වෙමි. දැන් ඒ සියල්ල අවසන් වී ඇත. ඒ කාලයේදී මා පිළිබඳ කිසිවෙක් නොදනිති. දැන් දැන් බොහෝ අය ප්‍රශංසා කරති. මා මරණය හා සටන් වදිමින් පිළිවෙත් පුරණ කාලයේ කිසිවෙක් ප්‍රශංසා නොකළහ. මේ ගැන කීමටවත් ජීවත් වේදැයි නොසිතුවෙමි. මෙසේ තුන් වරක් සිහි නැතිව ඇද වැටුනි. දැන් බොහෝ කාලයකට පසු නොයෙක් ප්‍රශංසා ලබමි. ඉන් ඇති

වැඩය කුමක්ද?

ඔබ තුළ සැඟ වී ඇති දක්ෂතා කුමක්දැයි හඳුනා ගැනීමට අවශ්‍ය නම් ඔබ පිළිවෙත් පූරණය කළ යුතුයි. මැරුණාට පසු භික්ෂූන් වහන්සේලා අවුත් ගාථා සජ්ඣායනා කර පිං අනුමෝදන් කරණ තුරු සිටිය යුතු නැත. ''කසන තැන කසන්ට ඕනෑ'' මම අනතුරු ඇඟවීමක් නොකළා යැයි කියන්ට එපා. ඔබට ඔය කැසිල්ල සුව කරගන්ට නම් ඉක්මණින් ඒ කසන තැන කසන්න. එනම් හැකි තරම් වීර්‍යය වඩා හොඳ දේ කරන්න එවිට ඔබේ ඇති තණ්හාව ලෝකයේ ඇති දේ ගැන ආසාව නැති වී යයි. මිල මුදල්, වතුපිටි ආදියයි. අපට අයත් නොවේ. අපි මගේ යැයි කියන්නේ සම්මුති ලෝකය නීතිය නිසා. එසේ සිතන නිසා අපේ ඇත්ත වටිනාකම දකින්නේ නැත. මිල මුදල් ලෝකයේ අවශ්‍ය දේ සඳහා යොදා යම් තරමක සතුටක් ලබා ගත හැකිය. එහෙත් අපේ මෝහය නිසා එය බුර බුරා නැගෙන ගින්නක් වී අප දැවී යනු ඇත.

දුක් නැති කරගත් ඒ අතීතයේ සිටි ක්ෂාණා ශ්‍රවයන් වහන්සේලා මේ ගුණ වර්ධනය කරමින් තම සිත පිරිසිදු කර අප සැමගේ සරණාය වී ඇත. ඒ අයට යම් යම් අයිති දේ ආසා කරණ දේ නොතිබුණා යැයි ඔබ සිතන්නට පුළුවනි. මිල මුදල් මනස්කාන්ත හැඩ රුව ඇත්තේ දැන් පමණදැයි ඔබ සිතනවාද? එබැවින් මේවා අගයකරමින් ඇලී ගැලී සිටිනවාද ? අපෙ රටේ මිනී කනත්ත අඩු බවක් ඇද්ද ? මළමිනී භූමදාන කිරීමට, ආදහන කිරීමට තැන් නැද්ද ? ඔබ නොමැරෙනවා යැයි සිතනවාද ? ඒ නිසා කිසි බියක් නැතිව සැප සම්පත් විඳිනවාද ? ඔබ නිතරම වෙහෙසෙන්නේ කෑම සෙවීමට, හොඳට නිදා ගැනීමට, ඇස් කන් නාසාදිය පිනවීමට, හරියට මේ ලෝකය විනාශ වීමට ප්‍රථම සියල්ල ලබා ගැනීමට අවශ්‍ය යැයි සිතාද ? ඒ නිසා නොයෙක් දේ රැස් කරගෙන පුරවා ගෙන ඇත. ඉන්න ඉඩක් ද නැත. සතුන්වත් මෙපමණ තණ්හාවෙන් නොයෙක් දේ රැස් කරන්නේ නැත. ඔවුන්ට වඩා ඔබ ඉතා දක්ෂ ගුණ නුවණ ඇති අය යැයි සිතනන. එවැනි අන්ධ භූත මුලාව නිසා තව තවත් දුකට පත්වෙනවා ඇත. මීට වඩා දුෂ්කර ජීවිතයක් අනාගතයේ ගත කරන්නට වුවහොත් කුමක් වේද ? කවුද දන්නේ ඔබ පහත් කොට සිතන තිරිසන් සතුන්ටත් වඩා දුකට පත්වේද කියා මේ ගැන සිතීමට හා ක්‍රියා කිරීමට දැන් දැන්ම පටන් ගත යුතුයි. තවමත් පිළියමක් කරගත හැකිව ඇත.

මෙතරම් පරුෂ විදියට කථා කිරීම ගැන මට සමාවන්න. එහෙත් මෙසේ තදින් නොකීවොත් තම ගතානුගතික ඇලීම් ගැටීම් වලින් මිදීමක් සොයන්නේ නැත. කිසිවෙක් චතුරාර්ය සත්‍යය පිළිගන්නේ නැතිවිට මේ ශාසනය නැති වී යයි. අප සැම දෙනාම ගොරහැඩි, පාපකර්ම අතීතයේ සිදුකර ඇත. ඒවායේ දුර්විපාක අනිවාර්යෙන්ම අප විඳිය යුතුයි. මේ බව නොදන්නා අය තම වැරදි සදා ගන්නට

මහන්සි නොගනිත්. ඒ වෙනුවට ධර්මය ගැඹුරුය. නොතේරේ. ප්‍රතිපත්ති දුෂ්කර යැයි සිතති. ඒ නිසා මේ තත්ත්වයෙන් බැහැර වීමට නොහැකිය.

මේ අවස්ථාවේදී මෙය ලියන මම ඔබගෙන් සමාව අයදිමි. ඒ මම කිසි බියක් සැකක් නැතිව මෙසේ අදහස් පළ කිරීම ගැනය. මගේ එකම අධිෂ්ඨානය වූයේ ආචාර්ය මන්ගේ කථා ශෛලිය ඒ ආකාරයෙන්ම ලෝකය වෙත වාර්තා කිරීමය. මෙය වාර්තා කරන්නේ අනාගතයේ යමෙක් උන්වහන්සේගේ ඉගැන්වීම් ගැන තර්ක විතර්ක සංකල්පනා කරනු ඇති බැවිනි. එම බලවත් දේශනා ඒ ආකාරයෙන්ම නොලීවොත් එහි ශක්තිය තනුක වේ. එබැවින් මේ ගැන මම සැක හැර ලීවෙමි.

ආචාර්ය මන් යම් තැනක විසුවොත් ප්‍රශ්න ඇසීමට බොහෝ දෙනා එතැනට පැමිණෙති. මට දැන ගන්නට ලැබුණු එම ප්‍රශ්න හා උත්තර සියල්ලම මෙහි සඳහන් නොවේ. භික්ෂූන් වහන්සේලා බොහෝ කාලයක් තුළ එවැනි දේ මා සමඟ කී නමුත් මට අමතක වී ඇත. තදබල ප්‍රශ්න පමණක් මගේ සිතේ රැඳී ඇත.

ආචාර්ය මන් කැමති තාක් කල් නබොන් රචජසිමා හි වාසය කර උදෝන් තානි බලා පිටත් විය. අතර මග බොන් කළුන් හි දුම්රිය නැවතූ විට බොහෝ දෙනා එහි රැස් වී උන්වහන්සේට එහි නැවතී යන මෙන් ආරාධනා කළහ. එහෙත් ඒ ආරාධනාව පිළිගැනීමට නොහැකි වීම නිසා ඒ අය මහත් සේ දුක් වූහ.

අන්තිමේදී උදෝන් තානි නගරයේ වට් බෝධිසොම්ෆෝන් ආවාසයේ ජම් බුන් ධම්මජේදී භික්ෂුව සමඟ නවාතැන් ගත්තේය. සෙනඟ රැස්වී උන්වහන්සේ පිළිගත්හ. එහි ටික කලක් ගත කර වට් නොන් නිවෙට් ආරාමයට වැඩ එහි වස්සාන සෘතුව ගත කලහ. සතියකට වරක් සිල් සමාදන් වී බණ ඇසීමට උසස් රජයේ නිලධාරීන් සහ අනිකුත් දායක පිරිස් සමඟ ජම් බන් ධම්ම ජේදී භික්ෂුව නොකඩවා පැමිණියේය. උන්වහන්සේ ඝන වනාන්තර පසු කරමින් පා ගමනින් වියාං මායි හි වාය කළ ආචාර්ය මන් හමු වී උදෙන් තානි නගරයට එන ලෙස ආරාධනා කළහ. මේ නිසා අප සියලු දෙනාටම උදෙන් තානි හිදී උන්වහන්සේගෙ ධර්මය ශ්‍රවණය කිරීමට අවස්ථාව ලැබුණි. අපි සැවොම ජම් බුන් ධම්ම ජේදී භික්ෂුවට මේ පිළිබඳ අතිශය කෘතඥ වෙමු. ධම්ම ජේදී භික්ෂුව නිතර ධම්ම සාකච්ඡාවේ යෙදේ. විශේෂයෙන්ම භාවනා පිළිබඳ උපදෙස් ලබා ගනී. මේ නිසා ආචාර්ය මන් කෙරෙහි විශාල ගෞරවයක් හා ශ්‍රද්ධාවක් ඇති. බොහෝ ගිහි පින්වතුන් ආචාර්ය මන් හමුවීමට අවස්ථාව ලබා දුනි.

වස්සාන කාලය අවසන් වූ විට ආචාර්ය මන් අවට ගම්මාන වල හුදකලාව සැරිසරමින් පුරුදු භාවනා පිළවෙත්හි යෙදුනාහ. උදොන්තානි සිට සැතපුම් 7ක් පමණ ඈතින් පිහිටි බංනොං නම් බෙම් ගමෙහි වැඩි කාලයක් ගත කළේ එහි

අවට වනාන්තර පරිසරයේය. මේ කාලයේදී ගිහි පැවිදි පිරිස් උන්වහන්සේගෙන් කර්ම ස්ථාන ලබා ගෙන භාවනා කළහ. මීට පෙර එහි සිටි පිරිස් උන්වහන්සේගේ පැමිණීම බලාපොරොත්තු වූහ. නැවත වාරයක් උන්වහන්සේ දැක ගැනීමට සතුටු වූහ. ඒ වන විට වයස අවුරුදු 70ක් පමණ විය. තවම ගමන් කිරීමට ශක්තිය ඇත. නිතරම නැගී සිටි වීර්‍යය ඇති බැවින් ක්‍රියාශීලී විය. වන සෙනසුන්වල සක්මන් භාවනාවෙන් කල්ගත කළහ.

## ඉහත ආත්ම

උද්‍රෝන් තානි පළාතේ වාසය කරන කාලයේ ගමේ මිනිස්සු ආචාර්ය මන් හමුවී ප්‍රශ්න ඇසූහ. වරෙක අතීත ජාතිවල පුරුදු කළ ගුණ ධර්ම මේ ආත්මයේදී තමාගේ චරිතයට බලපාන අන්දම විචාලහ. අතීතයේ අඹු සැමි වශයෙන් සිටි අයගේ එම කැමැත්ත අනුව නැවත ආත්මවල එසේ අඹුසැමි වීමට පත්වේද ? මෙවැනි ප්‍රශ්න ගැන මිනිස්සු නිතර සැක පහළ කරතියි ආචාර්‍යය මන් පැවසීය. මුල් ප්‍රශ්නයට මෙසේ පිළිතුරු දුනි. අතීත කර්ම තම චේතනාව අනුව සිදු වී ඇත. ඒ චේතනාවේ බලවත් ශක්තිය අනුව මෙසේ තම චරිතයට බලපායි. දෙවෙනි ප්‍රශ්නය ගැන මෙසේ පැවසීය. තමන්ගේ වර්තමාන ජීවිතයේදී ඇතිවන නෑ සබඳකම් පෙර ආත්මයේ සිට එන්නක් බව තීරණය කිරීම අපහසු දෙයකි. බොහෝ විට ස්ත්‍රී පුරුෂයන් විවාහ වෙන්නේ අන්ධ ආලයෙනි. බඩගිනි කාරයා යම් ආහාරයක් දුටු විගස එය ඉක්මණින් උපාදානය කරයි. තමන්ගේ අවශ්‍යතාවය අනුව එය භුක්ති විඳියි. අතීතයේ ඇති සම්බන්ධයක් නිසා විවාහ වූයේ යැයි සෙවීම දුෂ්කර වන්නේ එබැවිනි. කෙළෙස් ඇතිවීම නිසා එහි ආදීනව, අතීත පුරුදු ආදියට අනුව සිතීමට අවකාශ නැත. රාග ගින්න ඇති විගස ඊට ප්‍රතිකර්ම සොයයි. එබැවින් අතීත පුරුදු අනුව සිදු නොවේ. බාහිර හැඩ රුව ආදී කරුණු අනුව ස්ත්‍රී පුරුෂ සම්බන්ධය ඇති කෙරේ. කෙළෙස් වල ස්වභාවය නම් තම ආදරය නොලැබුණොත් පළිගැනීම නිසා බොහෝ අපරාධ කිරීමයි. තමාගේ වරද දුටුවත් එය නොපිළිගනිති. මරණය වුවද කම් නැත. මේ කෙළෙස් ගින්න රාගය යැයි හඳුන්වනු ලැබේ. එය තම හදවතේ පැන නැගී සිටි විට පාලනය කිරීම දුෂ්කර වේ.

යමෙකුට සාධාරණ ලෙස, වගකීමක් ඇතිව ජීවත් වීමට අවශ්‍ය නම් කෙළෙස් ගින්නෙන් මුසපත් නොවිය යුතුයි. පාලනයක් නැතිව කෙළෙස් හට ගැනීම නිසා එය බලවත් අකුසල ශක්තියක් බවට පත්වේ. අතීතයේ සිද්ධීන් ගැන සිතීමට වඩා තමාගේ කෙළෙස් පාලනය කිරීම වඩා සුදුසු වේ. එවිට තමා

අන්ධ භූත භාවයෙන් මහත් පාතාලවලට නොවැටේ. භාවනා බලයක් ඇති අයට පමණක් තම අතීත ජීවිතය මතක් කළ හැකිය. මොන හේතුවක් නිසා වුවත් කාමාසාව මැඩ ගැනීමට ආත්ම පාලනය අවශ්‍ය වේ. භයානක කෙළෙස් පිටාර ගලමින් ගං වතුරක් මෙන් පාලනයෙන් තොර වූ විට තෝන් ලනුව කඩා ගත් අශ්වයා මෙන් මෙල්ල කිරීම නොහැකිය.

ප්‍රශ්නය : යම් ස්වාමි භාර්යයා දෙදෙනෙක් මේ ආත්මයේදී සුහදව ජීවත් වී මතු ආත්මයේදීත් මුන ගැසේවා යන ප්‍රාර්ථනාව ඉෂ්ට කර ගැනීමට කළ යුත්තේ කුමක්ද ? තමන්ගේ අධිෂ්ඨානය පමණක් සෑහේද ?

ආචාර්ය මන් : සිතීම, අධිෂ්ඨානය පමණක් නොසෑහේ. ඊට අවශ්‍ය කටයුතු කළ යුතුය. යමෙක් පොහොසත් වීමට බලවත් කැමැත්තක් ඇත. එහෙත් කම්මැලි කමින් මුදල් උපයා ගැනීමට වෙහෙස නොවේ. ඔහු පොහොසත් නොවේ. ඒ කැමැත්ත ඉටු කර ගැනීමට දක්ෂතාවය තිබිය යුතුයි. එසේම එවැනි අධිෂ්ඨානයක් ඇති ස්වාමි භාර්යයා දෙදෙනා නිතර සමගියෙන් සිටිය යුතුයි. දෙදෙනාම එකම අරමුණ කැමති විය යුතුයි. භක්තිය, විශ්වාසය, ඇදහිල්ල එකම විය යුතුයි. අන්‍යෝන්‍ය අවංක ආදරය තිබිය යුතුයි. තමාගේ වාසිය, ලාභය, සතුට පිණිස අනෙකාගෙන් වැඩ ගැනීම නොකළ යුතුයි. එවිට විශ්වාසය භංග වේ. අතෘප්තිමත් ජීවිතයක් ඇතිවේ. සිල්වත් විය යුතුයි. හොඳ හැසිරීම තුළින් සහකාරිය හෝ සහකරුවා මින් මතු ආත්මභවයේදීත් මුණ ගැසීමට කැමති විය යුතුයි. එහෙත් එක්කෙනක් පමණක් මෙසේ හැසිරුණත් අනිත් තැනැත්තා ඊට විරුද්ධ හැසිරීම අතිවිට එනම් තමන්ට කැමති පරිදි ජීවත් වේ නම් එවිට කෙතරම් නැවත හමුවීමට අධිෂ්ඨාන කළත් එය සඵල නොවේ. ඒ තමන්ගේ වැරදි ක්‍රියාවල විපාක නිසා තම පැතුම සාර්ථක නොවේ. ඔබගේ පැතුම කුමක්ද ? ඔබ අන් හැම දෙයකටම වඩා තම භාර්යයාව නැවතත් ලැබේවා යන කැමැත්ත ඇත්තෙහිද ?

ප්‍රශ්නය : මම වෙන කිසිවක් ප්‍රාර්ථනා නොකරමි. එකම පැතුම මගේ බිරිඳ නැවත ආත්මයේදීත් හමුවේවා යන්නයි. මිල මුදල්, තත්ත්වය, රජ සැප, දෙව් සැප, නිවන් සැප වුවද මගේ භාර්යයාව නැත්නම් වැඩක් නැත. යමෙකුගේ විශාලතම බලාපොරොත්තුව මෙය විය යුතුයි. ඒ සතුට ඇතිවිට පමණක් අනිත් ලෞකික සැප අර්ථවත් වේ. මෙය මගේ දර්ශනයයි. එබැවින් මේ ප්‍රශ්නය ඇසුවෙමි. එහෙත් මම ලැජ්ජා භය වුනෙමි ඔබ වහන්සේ මට නින්දා කෙරෙත්දැයි සැක ඇති විය. මේ ලෝකයේ සැබෑ තත්ත්වය මෙය වුවත් බොහෝ අය ඒ ගැන කථා නොකරත්.

ආචාර්ය මන් සිනාසුනි. ''එසේ නම් ඔබ යන යන තැන භාර්යයාව කැටුව යා යුතුයි ?''

ප්‍රශ්නය : මෙය පිළිගැනීමට මම ලැජ්ජා වෙමි. මගේ භාර්යයාවට ඇති කැමැත්ත නිසා මම මහණ නොවෙමි. ඈ තනි වේවි. රැක බලාගෙන අවවාද දීමට කිසිවෙක් නැතිවේයැයි මට සිතේ. මගේ දරුවෝ නිතර මිල මුදල් ආදී දේ ඉල්ලමින් ඈට වධ හිංසා කරත්. මා නැති කළ ඒ අයගේ ආදර, කරුණාව නොලැබේයැයි සිතේ. මම මේ ගැන බලවත් ලෙස කම්පා වෙමි. මට නොතේරෙන තව දෙයක් ඇත. ධර්ම පුස්තකවල සඳහන් පරිදි දේව ලෝකවල සිටින දෙවිවරුන්ගේ ස්ත්‍රී, පුරුෂ භේදය ඇත. මිනිස් ලෝකයේ මෙනි. දෙවිවරු ඉතාමත් සතුටින් නොයෙක් විධියේ ආස්වාද ලබමින් ප්‍රීතිවෙත්. එය ජීවත් වීමට සුදුසු පරිසරයකි. එහෙත් බ්‍රහ්ම ලෝකවල එවැනි ස්ත්‍රී, පුරුෂ භේදයක් නැත. එහි ජීවත්වීම එතරම් සතුටු එළවන්නක් නොවේ. එහි කිසිවෙක් විහිළු, විනෝද නොකරති. එහි තනිකමක් නොදැනේද ? නිවන ඊටත් වඩා නිහඬ, නිශ්චල තැනකි. කිසිම සම්බන්ධයක් නැත. තමා ඒකාන්තයෙන්ම ස්වාධීන වේ. කිසිවෙකුගේ උදව් උපකාර නැත. කිසිවෙක් අවශ්‍ය නොවේ ඉතින් එහිදී තමාගේ අභිමානය දක්වන්නේ කාටද ? එවැනි අති උත්තම තත්ත්වයකට පත්වුන විට සියල්ලන්ගේ සැළකිලි සම්මාන ලැබිය යුතුය. මේ ලෝකයේ යමෙක් උසස්, ධනවත්, උගත් ආදී සෞභාග්‍යවත් දියුණුවකට පත් වූ විට අන්‍යයන්ගේ වැඳුම්, පිදුම් ආදර ගෞරව ලබති. එහෙත් නිවනේ ඇත්තේ දැඩි නිහඬතාවයකි. කිසිවෙකුගේ ආදර සැලකිලි නැත. මට හිතෙන විධියට එවැනි තැනක සතුටක් විනෝදයක් නැත. මට සමාවන්න මෙවැනි මෝඩ පිස්සු ප්‍රශ්න ඇසීම ගැන. එහෙත් මගේ හිතේ මේ සැකය දුරු කරන තුරු මම නිරන්තරයෙන් දුක්වෙමි.

ආචාර්ය මන් : දේව ලෝක, බ්‍රහ්ම ලෝක, නිවන ඔබ වැනි මෝඩ, සැක සහිත පුද්ගලයන්ට යන්ට හැකි තැන් නොවේ. එවැනි තැන්වලට යන්නේ තමාගෙ ඉ ආධ්‍යාත්මික ශක්තිය ඇති අය. තමන්ගේ ගුණ නුවණ වැඩි වන විට දෙව් ලොව, බඹ ලොව හා නිවන යන්නේ තේරුම අවබෝධ වේ. ඔබ වැනි අයට සිහිනෙන්වත් එහි යා නොහැක. ඔබට යා හැකි වුවත් භාර්‍යාව ජීවත් වන තුරු එහි යා නොහැක. ඈ මළ පසු ඒ දුක ඉවසාගන්ට නොහැකිව කල් ගත කරනු විනා දේව ලෝක ගැන සිතීමට වත් නොහැක. ඔබ සිතන අන්දමට දේව ලෝක බ්‍රහ්ම ලෝක වුවත් ඔබගේ භාර්‍යාව තරම් වටනේ නැත. එවැනි තැන්වල ඔබ බලා ගන්නට භාර්‍යාවක් නැත. ඔබ එහි යන්ට නොකැමැති වන්නේ ඔබගේ සියලු සැප සම්පත් ලබා දෙන භාර්‍යාව නැති නිසාය.

ආචාර්ය මන් සහ එම ප්‍රශ්නය ඇසූ පුද්ලයා මහත් සේ සිනාසුනි. මේ ලෝකයේ විඳින සැප වුවද තම තමන්ගේ කැමැත්ත අනුව වෙනස් වේ. අපේ ශරීරයේ ඇති ඉන්ද්‍රිය එකම ශරීරයක ඇතත් වෙනස් අරමුණු ගනිති. ඇස රූප දකිති. කණ ශබ්ද අසති. නාසය ගඳ සුවඳ පමණක් ගනිති. දිවට රස පමණක්

දැනේ. ශරීරය කැමති වන්නේ හොඳ ස්පර්ශ වලට. ඒ ඒ ඉන්ද්‍රියන්ගේ හැකියාව අනුව වෙන වෙන අරමුණු ලබා ගනිති. එක ඉන්ද්‍රියකට මේ සියලු අරමුණු ගන්ට බැහැ. රස ඇති ආහාර ගැනීම එක විනෝදයකි. විවාහ සැප තවත් විනෝදයකි. මේ ලෝකයේ විනෝද ආස්වාද වලින් තොර නැත. ඒ ජීවත් වන අයට අත්‍යාවශ්‍ය බැවිනි. ඒවා සොය සොයා ගොස් ලබා ගනිති. මෙවැනි සතුට සන්තෝෂය මිනිස් ලොව ඇත. දේව ලෝකවල වෙනත් ආස්වාද ඇත. බ්‍රහ්ම ලොක්වල ඊට වෙනස් ආස්වාද ඇත. නිවනේ ඇති ආස්වාදය කෙළෙස් දැවිලි නිවීමෙනි. ඒ සතුට කෙළෙස් සහිත පුද්ගලයන්ගේ සතුටට වඩා හාත්පසින් වෙනස් වේ.

ඔබට අවශ්‍ය වන්නේ භාර්‍යයාවගෙන් ලැබෙන ආස්වාදය පමණක් නම් ඔබ ඇස්වලින් නොයෙක් දේ බලන්නේ ඇයි ? කනින් ශබ්ද අසන්නේ ඇයි ? කන්නේ මොකටද ? නිදන්නේ මොකටද ? පිං කරන්නේ කුමකටද ? දන් දෙන්නේ කුමකටද ? සිල් රකින්නේ කුමකටද ? භාවනා කරන්නේ කුමකටද ? ඔබට කරන්ට තියෙන්න් එක් දෙයකි. භාර්‍යයාව සමඟ වාසය කරමින් ඒ සියලු සැප ලැබීම නොවේද ? එවිට අනිත් සැප සොය සොයා කරදර වීමක් නැත. ඇත්තෙන්ම ඔබට එසේ කළ හැකිද ?

ප්‍රශ්නය : අපොයි එසේ කරන්ට බැහැ ස්වාමීනි. කොහොමද මා එහෙම කරන්නේ ? ඒ ඇරත් අපි කොතරම් රණ්ඩු කරනවාද ? මම කෙසේ සියලු සැප භාර්‍යායගෙන් පමණක් ලබම්ද ? එවිට මගේ ජීවිතය මහ අවුලක් වේ.

මේ මිනිසා ඉතා අවංක නිර්භය පුද්ගලයෙකි. ඔහු සිල් ආරක්ෂා කරතියි. ආචාර්ය මන් පැවසුවේය. ඔහු ආචාර්ය මන් හට බොහෝ ගෞරව ආදර දක්වයි. නිතර නිතර අවුත් ආචාර්ය මන්ගේන් ප්‍රශ්න අසයි. සාමාන්‍ය අය මෙවැනි ප්‍රශ්න ආචාර්ය මන්ගෙන් අසන්නේ නැත. ඔහු තම බිරිඳට හා දරුවන්ට බොහෝ ආදරය ඇත. ආචාර්ය මන් කෙරෙහි ඇති ආදරය, භක්තිය නිසා නිතර ආරාමයට එයි. එවිට අමුත්තන් සමඟ ආචාර්ය මන් කථා කරන්නේ නම් ඔහු ආරාමයේ අනිත් භික්ෂූන්ට උදව් උපකාර කරන්නේ තමාගේ ගෙදර අයට සළකන විදියටය. ආචාර්ය මන් ඔහුගේ ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු සපයයි. යම් යම් අයගේ චරිත ලක්ෂණ හඳුනා ගැනීමට ආචාර්ය මන් අති දක්ෂ වේ. ඒ ඒ අයට වෙනස් ආකාරයෙන් සළකයි. සාමාන්‍ය කථාවේදී හෝ දේශනයේදී තම ප්‍රේක්ෂයන්ට ගැලපෙන කථා කියත්. මම ලිව් මේ කථා පුවත් වලින් ඒ බව ඔබට ඔප්පු වෙනවා ඇත.

ආචාර්‍ය වන් නොන් නිවෙට් හි වාසය කරණ කාලයේදී බොහෝ භි-ක්ෂූන් උන්වහන්සේගෙන් උපදෙස් ලබා ගැනීමට පැමිණියහ. වස්සාන කාලය උන්වහන්සේ සමඟ ගත කළහ. අද මෙන් නොව ඒ කාලයේ මෙම විහාරය ඉතාම නිස්කලංක ප්‍රදේශයකි. කිසිවෙක් එහි ආවේ නැත. යම්කිසි භාවනා යෝගීන්

පමණක් දුර කතර ගෙවා පැමිණියහ. එහෙත් දැන් විශාල වශයෙන් සෙනඟ රැස්වෙති. භාවනා යෝගී භික්ෂූන්ට මෙය පළිරෝධයකි. ඒ කාලයේ භික්ෂූන් වහන්සේලා හුදකලාව කැමති පරිදි පිළිවෙත් පිරූහ. එබැවින් බොහෝ භික්ෂූන් අධිමානුෂික ගුණ ධර්ම වඩා ගත්හ. ඉන් තමාට පමණක් නොව අවට ජනයාට හා පරිසරයට සෙතක් විය.

සවස් යාමයේදී ආචාර්ය මන් භික්ෂූන්ට දම් සෙති. ආරම්භ කරන්නේ ශීලය පිළිබඳ කථාවකිනි. ඉන්පසු සමාධි, පඤ්ඤා විස්තර කරති. ක්‍රමානුකූලව මේ දේශනය ගැඹුරු වී අර්හත්වය දක්වා විස්තර වේ. එය ධර්මයේ අවසාන ඉලක්කය වේ. ඉන්පසු අංග සම්පූර්ණ දේශනයක් ප්‍රතිපදාව ගැන විස්තර වේ. ඒ අවස්ථාවලදී භික්ෂුවකගේ ආකල්ප, හැසිරීම, දෛනික වැඩ පිළිවෙල, භාවනා කර්මස්ථාන ගැන සඳහන් වේ. නිරන්තරයෙන්ම විනය ශික්ෂා රැකීම හා සති සමපජඤ්ඤය කෙරෙහි තදින් බැඳී සිටිය යුතු බව අවධාරණය කෙරේ.

යම් භික්ෂුවක් විනය හා හැසිරීම පිළිබඳවද, තමා පුහුණු වෙන ශික්ෂා පිළිබඳවද ගෞරවය ඇත්නම් ඔහු භික්ෂුවක් ලෙස සැළකිය යුතුය. ඛුද්දානු ඛුද්දක ශික්ෂා කඩ කරණ භික්ෂුව එය වැදගත් ශික්ෂා ලෙස ගණන් නොගනී. එවැනි අතපසු වීම දුස්සීල බවකි. අන්තිමේදී ඊට වඩා ලොකු ශික්ෂා වුවද කඩ කරති. විනය නීති රකින්නේ තමන්ගේ හැසිරීම අඛණ්ඩව පවත්වා ගැනීමටය. නැතහොත් විටින් විට ඔහුගේ හැසිරීමේ දෝෂ ඇත. මෙවැනි අවස්ථාවන්ට මුහුණ දීමට පත් වූ විට අන් සුපේශල ශික්ෂාකාමී සුබ්‍රහ්මචාරීන් ඉදිරියේ මහත් ලැජ්ජාවකි. එබැවින් ඒ සුළු වරද හෝ අත්හැරීම නිසා තම ගුරුවර සහ වාසය කරණ අන් භික්ෂූන්ගේ ගෞරවය හිමිවේ. තමන්ට කිසි සැකක් භයක් නැතිව ජීවත් විය හැකිවේ. ඔබේ හදවතේ පිරිසිදු භාවය සොතාපන්න මග්ග ඵල සිට අරහත්ත මග්ගඵල දක්වා ක්‍රමයෙන් වැඩී යා යුතුවේ. එසේ වීමට සමාධි, පඤ්ඤා නොකඩවා වැඩී ගිය යුතුවේ. වීර්‍යය බලවත් විය යුතුය. මේ ඉන්ද්‍රිය ධර්ම වැඩී යන විට තම සිතේ පවතින කෙළෙස් කුණු කැඩී බිඳී සුණු විසුණු වී යයි.

භික්ෂුවකගේ කථාව, හැසිරීම ඉතාම නිරවද්‍ය විය යුතුය. සිත අති පිරිසිදු වී ඇත්තේ සමාධි, පඤ්ඤා, විමුක්ති, විමුක්ති ඥාණදස්සනය තුළිනි. කිසි විටක තම සිතේ කුසීත, අඳුරු, දුක්මුසු භාවයක් නැත. පිටතින් තේජාන්විත භාවයක් පෙනේ. කිසිවෙක් මඟ හරින, තම සිතේ තැන්පත් කර ගත් ඊර්ෂ්‍යා වෛර ආදියක් නැත. සැඟවියුත්තක් නැත. කණස්සල්ලක් නැත. බුදුරජාණන් වහන්සේගෙ අභ්‍යන්තර සිතේ හා බාහිර හැසිරීමේ ඒකාකාර පිරිසිදු භාවයක් ඇත. එම බුදුගුණ තමා තුළ වඩා ගැනීමට භික්ෂුව වීර්‍යය වැඩිය යුතුය. බුදුවරු අනුග මනය කරණ ආර්ය සංඝයාගේ මේ ගුණ දක්නට ලැබේ. සියලු පව් දුරු කිරීමත්, කුසල් කිරීමත් ඉතාම සුදුසු වේ. අවංක භාවය තම සිත තුළ ඇති විට ධර්මයට

අනුකූලව සිතුම් පැතුම් පවත්වති. මේනිසා යන එන තැනකදී සියල්ලන්ගේ ආදර භක්තියට පත්වේ. තම සිතේ ඇති ආලෝකය ඉතිරී පැතිරී පවතී. කිසි විටක මෝහයෙන් මුලාවෙන් යම් උගුලකට හසු නොවේ. මෙසේ අති උතුම් ගුණ ආර්ය සංඝයා තුළ දක්නට ලැබේ. මේ කරුණු අධ්‍යයනය කර හදවතේ තැන්පත් කර ගන්න. අනුගමනය කරන්න. එවිට ඒ ගතිගුණ තමා තුළ වගා වර්ධනය වේ. ඒවා තමාගේ පුද්ගලික ගතිගුණ වේ.

මෙවැනි ධර්ම නිරන්තරයෙන්ම ආචාර්ය මන් තම ශිෂ්‍යයන්ට කියා දෙති.

ආචාර් මන්ගේ දෛනික චාර්යා රටාවක් ඇත. භාවනාවෙන් හිමිදිරියේ නැගී සිට සක්මන් කරමින් පිණ්ඩපාත කාලය පැමිණෙන තෙක් සිටිති. ඉන්පසු ගමට ගොස් පිඩු සිඟා ආපසු කුටියට වඩිති. දානේන පසු නැවත සක්මන් කර කෙටි විවේකයක් ගනිත්. ඉන්පසු නැවත සක්මන් කර භාවනාවේ යෙදෙමින් සවස 4 වන තුරු සිටිති. සවස 4ට කුටිය අවට ඇමද ස්නානය කොට නැවත සක්මන් කරත්. ඉන්පසු කුටිය තුළ පැය ගණනක් ගාථා පිරිත් සජ්ඣායනා කරත්. ඉන්පසු නැවත භාවනා කරත්. රාත්‍රී කාලයේ දිගටම භාවනාවේ යෙදෙති. පැය 4ක් පමණ සැතපෙති. බොහෝ විට නොනිදාම දවස ගතවේ. තරුණ කාලයේදී තිබූ වීර්යය අසීමිතය. අන් කිසිවෙකුට එතරම් වීර්‍යය වැඩිය නොහැකි විය. වයස් ගත වූ විට ද එම වීර්‍යය අත්හළේ නැත. ටිකක් හෙමින් වැඩ කළේ ශක්තිය දුර්වල වූ විටය. දිනපතා මෙසේ ටිකින් ටික දුර්වල විය. එහෙත් අපි සියලු දෙනාගෙන්ම වෙනස් වූයේ කෙතරම් රෝගී තත්ත්වයක් තිබුණත් සිතේ කිසි පසු බැසීමක් නොවීමය.

අප සැමට විශාල ආදර්ශයක් වූ උන්වහන්සේ මහත් ආශ්චර්යකි. උන්වහන්සේ පුද්ගලික වගකීම් පැහැර හැරියේ නැත. තම බලවත් වීර්යය අත්හළේ නැත. ඒ නිසා වියං මයි කඳුකරයේදී අද්විතීය ජයග්‍රහණය කළහ. මනුෂ්‍යයන් වශයෙන් අප තුළ ඇත්තේ එවැනි ශක්ති සම්භාරයකි. එහෙත් එය නියම විධියට හසුරුවා එවැනි අසාමාන්‍ය ජයග්‍රහණයක් කරන්නේ ටික දෙනෙකි. මිනිස් ලොව ජනගහනය වැඩි වෙමින් පැවතුණත් මෙවැනි අති උතුම් තත්ත්වයකට පත් වන්නේ කවරෙක්ද ?

උන්වහන්සේ සතර ඍද්ධිපාද වඩා ඇත. ඡන්ද, චිත්ත, වීරිය, විමංසා උන්වහන්සේ හා අප අතර වෙනස වේ. මේ ඍද්ධිපාද වල වැඩීම අනුව එක් එක් පුද්ගලයාගේ කර්ම වෙනස් වෙති. කර්ම ශක්තියේ වෙනස අනුව විපාක වෙනස් වේ. එමනිසා එක් එක් කෙනා විඳින සැප දුක් වෙනස් වේ. ලෝකයේ වාසය කරණ පුද්ගලයන් දෙස බැලූ විට මෙය හොඳාකාර විද්‍යමාන වේ. අප සැමට මේ අනුව සැප, දුක, සතුට, නොසතුට වරින් වර ලැබීම වෙනස් කළ නොහැක.

උන්වහන්සේගේ මුළු ජීවිත කාලයේදීම තම බලවත් කර්ම ශක්තියේ විපාක වශයෙන් මල්ඵල නෙලා ගති. සියලු දෙනාගේ ගෞරව සම්මානයට සුදුසු විය. මුළු ලෝකය පුරාම එම කීර්ති රාවය පැතිරී ඇත. එහෙත් බෞද්ධයන් පවා උන්වහන්සේගේ ජීවමාන කාලයේදී ඒ කිසිවක් නොදැන සිටියහ. ඊට හේතුව වූයේ ජනගහනය ඇති පෙදෙස් වල උන්වහන්සේ වාසය කිරීමට මැලි වීමයි. මුළු ජීවිතයම කඳු මුදුන්, වන පෙදෙසෙහි ගත විය.

බොහෝ භික්ෂූන් උන්වහන්සේගේ ජීවමාන කාලයේදී හමුවීමට ගිය නමුත් හමුවීමට නොහැකි විය. මාර්ග අපහසුතාවය, කැලෑබද ප්‍රදේශ කඳුමුදුන් නිසා ගමනා ගමනය අති දුෂ්කර විය. පා ගමනින් දවස් ගණන් නාඳුනන ප්‍රදේශයේ ආරංචි මාත්‍රයෙන් ගොස් සොයා ගත යුතු විය. සමහර භික්ෂූහු එවැනි දුෂ්කර ප්‍රතිපත්ති නිසා උන්වහන්සේ හමුවීමට නොගියහ. ධර්මය නොසඟවා සත්‍ය ලෙස පෙන්වා දීම ගැන සමහරු නොකැමති විය. ආහාර ප්‍රශ්නය උග්‍ර වූයේ දිනකට එක් වේලක් වැළඳීම හා නීරස ආහාර ගැනීමය. දුක් විඳීමට නොහැකි භික්ෂූන් නොයෙක් බැරිකම් කියා නිදහසට කරුණු ඉදිරිපත් කළහ. එම භික්ෂූහු නිවන් මාර්ගයේ යාමට කැමති වුවද නොයකේ බාධක මනසේ තිබුණි. ආචාර්ය මන්ගෙ අභාවයෙන් පසු එම භික්ෂූහු දැඩි ලෙස පසුතැවිලි වුහ. ඈත අතීතයේ බුද්ධ කාලීන රහතන් වහන්සේලාගේ ප්‍රතිපත්ති අනුව යමින් උන්වහන්සේ ශාසනය සංකේතවත් කර වර්තමාන ලෝකයාට පෙන්වා දුනි. මග්ගඵල ලාභී රහතන් වහන්සේලා මෙසේ රුක් මුල්, වන සෙනසුන් සුඤ්ඤාගාර, සුසානවල භාවනා වැඩූ හැටි උන්වහන්සේගේ චර්යා රටාවෙන් සවුට වී ඇත. එවැනි ආර්ය සංඝරත්නයට අයත් වූ උන්වහන්සේගේ ගුණ සුපටිපන්න, උජුපටිපන්න, ඤායපටිපන්න ආදී සඟ ගුණ මනා පිළිඹිබු කළහ. නිවන නම් මහා සාගරයට අවතීර්ණ වූ මහා ගංගාවක් හා සමානය. බුදු දහම ඒ ආකාරයෙන්ම පිළිපදින ලදී.

ආචාර්ය මන් වර්තමාන යුගයේ සිටි මහරහතන් වහන්සේ නමකි. උන්වහන්සේගේ පරිනිවර්වාණය 1949 නොවැම්බර් 10 වෙනි දිනයේදී සිදු විය. එනම් මීට අවුරුදු 20කට පෙරය. සම්මුති ලෝකයේ මරණ අනන්ත සසර පුරා අති දෙයකි. එය වැළැක්විය නොහැකිය. හෙත් බුදු කෙනෙකුගේ මහා කරුණාව, ප්‍රඥාව, විමුක්තිය හේතු ප්‍රත්‍ය ඉක්මවා ගිය මහත් වු විශ්මිත දෙයකි. මේ සියලු ගුණ ශාසනයේ ගැබ් වි ඇත. ආචාර්ය මන් තුළ එවැනි විස්මිත කරුණාව, ප්‍රඥාව, විමුක්තිය දක්නට ලැබුණි. ඒ බුද්ධ ශාසනය පිළිපැදීම අප සතු වගකීමකි. සාර්ථකත්වයට හේතු වන්නේ අපි කොපමණ කාලයක්, ශ්‍රමයත් ඒ සඳහා වැය කරන්නේද යන්නයි. මෙසේ ප්‍රතිපත්ති රැකීමෙන් පමණක් ඒ ප්‍රතිඵල ලබා ගත හැකිය. එසේ නැත්නම් මේ අවස්ථාව නැවත නොලැබෙනවා ඇත.

නබොන් රචෂාසිමා නගරයේ මිනිසුන්ට ආචාර්ය මන් කළ දේශනයක් මගේ

සිතේ රැඳී ඇත. එහි සාරාංශය මෙහි අඩංගු කරමි.

''ඔබ, ඔබගේ පවුල, නෑදෑ හිතමිතුරන් කනත්තට යන බව අමතක නොකරනු මැනවි. නැත්නම් මරණයට මුහුණදීමට ඔබ සූදානම් නොවී සිටී. ලෝකයේ සියලු දෙනා මරණයට පත්වේ. ඊට සූදානම් විය යුතුයි. නැත්නම් ඔබ මරණ භය නිසා මැරී අභව්‍ය ස්ථානයක උපදී. ඔබ සිතන, කථා කරණ, ක්‍රියා කරණ හැමවිටම කනත්ත මතක් කරන්න. එනම් මරණය, මරණය හා කනත්ත එකම අදහසක් ගෙන දේ. කනත්ත හා කර්මය එකම දම් වැල් පුරුක් දෙකකි. මරණය මතක් කරන විට කර්මය මතක් වේ. එවිට ඔබගේ සිතිවිලි, වචන, ක්‍රියා කුසල් පිණිස යොමුවේ.

ඔබ හරි දක්ෂයෙක් යැයි ආඩම්බර නොවන්න. ඇත්තෙන්ම ඔබ ඔබගේ කර්ම විපාක වලට හසු වී ඇති කෙනෙකි. ආඩම්බර වන්නේ කෙසේද ? ඔබ කර්ම විපාක වලට යට වී සිටින්නෙක් නොවේද ? බුදු කෙනෙකුට වඩා ඔබ දන්නවා කියා සිතන්න එපා. ඒ අසාමාන්‍ය මහා උත්තමයා කෙළෙස් සහිත පුද්ගලයන් මෙන් මාන ආඩම්බර නැත. අනාගත සැක නැත. අනුමාන නොකරති. සත්‍යය දක්නා බැවිනි. කෙළෙස් සහිත පුද්ගලයෝ තම අහංකාර, උඩඟුකම් නිසා අකුසල කර්ම කර එහි සිර වී සිටිති.

මේ ආකාරයෙන් උන්වහන්සේ අදහස් කෙළින් ප්‍රකාශ කරන විට අසා සිටින අය තුළ සැක නැති වී ඒකාන්තයෙන් පිළිගනිත්. කර්මය ගැන මෙසේ කියන විට ''මම මගේ'' යනුවෙන් සාදාගත් මහා මන්දිර කඩා වැටේ. තමා ජීවත් වන තත්ත්වය කුමක්දැයි සිතේ. කර්මය ගැන මීට ප්‍රථම සඳහන් වී ඇති නමුත් ආචාර්ය මන් කර්මය ගැන කියන ඍජු, අවංක ස්වභාවය නැවත මතක් කරමි. මේ ආදී කරුණු මට අමතක වී ඇත. විටින් විට මතක් වූ විට එය සඳහන් කරමි. මේ ගැන ඔබගේ සමාව අයදිමි.

ආචාර්ය මන් මෙසේ ගෝලයන්ට ධර්මය කියා දෙති. ඒ හේතුවෙන් උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස ඉතාමත් දක්ෂ ''බෝධි වෘක්ෂ'' බවට පත් වූහ. මෙවැනි බෝධි වෘක්ෂ රෝපණය කිරීමට ඉතාම දුෂ්කරය. එය ආරක්ෂා කිරීමත්, ලොකු මහත් වී විශාල රුක්ෂයක් බවට පත් කිරීමත් දුෂ්කරය. උන්වහන්සේගේ ශ්‍රාවකයන් ජ්‍යේෂ්ට ආචාර්යවරු ලෙස දැන් ජීවතුන් අතර දක්නට ලැබේ. ඉන් සමහරු නම් වශයෙන් මම කලින් සඳහන් කළෙමි. ඉන් සමහර නම් මෙහි සඳහන් කරමි. ආචාර්ය සිං සහ ආචාර්ය මහා පිං - උබෝන් රචජතානියෙහි වෙසෙති. නොං බයි හි ආචාර්ය ථෙට්, සංබොං නබොං හි ආචාර්ය ෆෑන් උදෙන් තානි හි වට් ටම් ක්ලොංෆේන් හි ආචාර්ය ඛඕ, ඩොංයෙන් ගමේ ආචාර්ය ෆ්රොම්,

වට් අසොකාරාම්හි ආචාර්ය ලී ලියොඉ ප්‍රදේශයේ ආචාර්ය චොබ් සහ ආචාර්ය ලුඉ, චියාංමායි හි ආචාර්ය සිම් හා ආචාර්ය තේ, සබොන් නබෝන් හි ආචාර්ය කොංමා සහ තවත් බොහෝ ආචාර්යවරු සිටියහ. මට ඒ නම් අමතක වී ඇත. මේ සැම ආචාර්ය කෙනෙකුටම විශේෂ දක්ෂතා තිබුණි. ඒ දක්ෂතාවල නිපුණත්වයක් තිබුණි. සමහරුන්ගේ කීර්ති රාවය මුළු රට පුරා විහිදී ගියේය. මුළු රටේ ප්‍රසිද්ධ වූ අය වෙති. සමහරු නිහඬව තම භාවනා පූර්ණත්වය ලැබ සිටියහ. බොහෝ උසස් ආචාර්යවරු තවත් සිටිති. ඒ අය නමින් හෝ හඳුන්වා ගැනීමට නොකැමති වූහ.

වෙන කිසි ආචාර්යවරයෙකුට වඩා ආචාර්ය මන් තම ශ්‍රාවකයන් ''බොධි'' හෙවත් නිවනට යොමු කලහ. ඒ සියලුම දෙනා වහන්සේලා ධූතාංග පූරණය කළහ. ධූතාංග පුරුදු පුහුණු කිරීම ඉතා දුෂ්කර කාර්යයකි. පොඩි දරුවෙක් රැක බලා ගන්නාක් මෙනි. ප්‍රථමයෙන්ම තම ශීලය පූර්ණ කළ යුතුය. ඉන්පසු ශීලය මත පිහිටා භාවනාවෙහි යොදවති. ඒ තුළින් තම කයේ සහ සිතේ සංවරය ඇති කරයි. එවිට ස්වාධීනව වැඩ කටයුතු කරගත හැකිවේ. කෙළෙස් සහිත පුද්ගලයන් මෙවැනි ත්‍රිශික්ෂාවේ යෙදවීම අසිරු කරුණකි. කෙතරම් අවවාද අනුශාසනා කළත් එය ශිෂ්‍යයාගේ සන්තාසයට තදින් බැසගෙන ක්‍රියාත්මක වන්නේ කළාතුරකිනි. ගුරුවරයා නිතරම මුරකාරයෙක් මෙන් මේ අයගේ සිතුම් පැතුම් ආචාර සමාචාර හැසිරීම් ආදිය සෙවිය යුතුය. ඉඩක් ඇති හැම අවස්ථාවේදීම පරණ පුරුදු වලට අවතීර්ණ වන බැවිනි. නොයෙක් ආකාර කෙළෙස් සමඟ සටන් වැදීමට සිදුවේ. ඉතා දක්ෂ ගුරුවරයෙකුට පමණක් ශිෂ්‍යයන් අවනත කළ හැකිය. චරිතය ධර්මානුකූලව හැඩ ගැස්විය යුතු බැවිනි. අපි සැවොම කෙළෙස් වලින් දුකට පත්වෙමු. ආචාර්යවරයෙකු වෙත පැමිණෙන සියලු දෙනාම එවැනි කෙළෙස් වලින් යුක්ත අය වෙති. එබැවින් එකිනෙකාගේ ශක්තියෙන් නැගී සිටීමට නොහැකි වෙත්. මගේ දැනුම අනුව ලෝකයේ ඇති ඉතාම දුෂ්කර දෙය නම් සාමාන්‍ය භික්ෂුවක් එවැනි ආර්ය සංඝරත්නයට හරවා ගැනීමයි. කෙළෙස් සහිත පෘථජ්ජන භූමියේ සිට ආර්ය භූමිය වූ සෝවාන් සකෘදාගාමී, අනාගාමී, අර්හත් තත්ත්වයට නගා ලීමට ගුරු උපදෙස් ලැබිය යුතුය. මේ කාර්යය එක් එක් අවස්ථාවේදී තව තවත් සංකීර්ණ වේ. මෙසේ රෝපණය වී හැදී වැඩී එන වෘක්ෂය කෘමීන් ආදී සතුන් විදගෙන මුල් විනාශ කර ගසද පෙරලා දමයි. දලු කාලයේදී මෙසේ විපත් සිදුවේ. ගස නැගී ශක්තිමත් වී අතු පතර විහිදී යන තුරු ආරක්ෂා කළ යුතුය. මෙවැනි දේ අපි නිතර දුටුවෙමු. කලාතුරකින් පමණක් මුල් බැසගෙන යන ශක්තිමත් ගසක් බවට හැරේ. වැසි, ඒ ඇතැම්විට සුළං, සතුන්ගෙන් වහා වැනසී යන බැවිනි. සාමාන්‍ය ගසක් මෙසේ ආරක්ෂා කළ විට හැදී වැඩී ගිය නමුත් භික්ෂුවක් මෙම ප්‍රතිපදාවේ ගමන් කරවන විට නිතරම මුලින්ම ඇද වැටීමට පත්වේ. සිතේ ඇති කෙළෙස් වල ස්වභාවය යටපත් කර

යම් දියුණුවක් ලැබූ නමුත් කැමැත්තෙන් හෝ අකමැත්තෙන්ම තමා කෙළෙස් වලට වසඟ වේ. එය බොහෝ මහන්සියෙන් මෙපමණ කාලයක් වැඩූ ධර්මය එකවරම ඇද වැටීමකි. ප්‍රතිපත්ති රැකීම දුෂ්කර බැවින් නිතරම ඇද වැටෙන ස්වභාවය ඇත. තමාට යම්කිසි ආබාධයක් නැතත්, යම් දෙයක් පසුපස ගොස් එය නිදහසට කරුණු දක්වා ආබාධයක් කර ගනී. මේ සිතේ ස්වභාවයයි. මෙසේ තමා තමන්ටම විශාල හානියක් සිදු කර ගනී. පිළිවෙත් පිරීම, එතරම් දුෂ්කර දෙයකි. ඔබ මා කියන දේ විශ්වාස නොකරනවා නම් අත්හදා බලන්න. භික්ෂුවක් ලෙස සසුන්ගත වී බුද්ධ නීති රැකීමට උත්සාහ කරන්න. ඔබට සවස ආහාර ගැන මතක් වේ. හිස මුඩුකර කසාවක් දරා සිටි නමුත් එහේ මෙහේ ගමන් කිරීමට සිතේ. උඩ බිම බලමින්, රූප, ශබ්ද වලට යොමු වෙමින් ආඝ්‍රාණය, රසාස්වාදය කරමින් ශරීරයට සැප පහසුව, පහස ලැබීමට සිත්වේ. හොඳ ස්පර්ෂ වලට කැමති වේ. කෙතරම් මේ ඇස් කන් නාසාදියෙන් හොඳ අරමුණු ලැබුණත් තෘප්තියක් නැත. ඔබ භික්ෂුවක් බව අමතක වී ඒ අරමුණුවලට ගොදුරු වේ. එවිට බුද්ධ නීති අනුගමනය කිරීම, පිළිවෙත් පිරීම අතපසු වේ. සිත තැන්පත් කර ගැනීමට අවශ්‍ය උත්සාහය, අවශ්‍යතාවය අඩු වී භික්ෂුවකගෙ පුහුණුව මුල් බැස ගෙන ශක්තිමත් වන්නේ නැත. මේ නිසා සිත සමාධි කර ගැනීමට කෙතරම් උපදෙස් ලැබුණත් එය සාර්ථක නොවේ.

මෙසේ ඉතා උනන්දුවෙන් මහණ වී සිටි නමුත් එම රෝපණය කළ බෝධි චිත්තය හැදී වැඩී අතුර පතර යාමක් හෝ මුල් බැස ගැනීමක් නැති නිසා ඉක්මණින් මැලවී යයි. කෙළෙස් වලින් කුඩා අංකුරයට හානි සිදුවේ. එවිට භික්ෂුවගේ සිත පාලනය කර ගැනීමට නොහැකි බැවින් අංකුරයක් පමණක් නොව සැදී වැඩී ගිය ගසක් වුවද පෙරලා වැටේ. මෙසේ සිතේ සමාධිය ලබා ගැනීමට කිසියම් උත්සාහයක් නොගත් අය මේ කෙළෙස් නිසා වන භයානක උපද්‍රවය ගැන නොදනිති. ඒ අය තම බෝධි අංකුරය පෝෂණය කරන්නේ කෙළෙස් වලිනි. එවිට ඒ අංකුරය හැදී වැඩී යා නොහැක. ඉතාමත් දක්ෂ අන්දමින් කුසලතාවයෙන් බෝධි අංකුරය පෝෂණය කළ යුතුය. ''සබ්බ පාපස්ස අකරණං'' සියලු පව් වලින් දුරු වී සිටිය යුතුය. මේ නිසා බොහෝ බෝධි චිත්තය ඇති අය වුවත් තම කෙළෙස් වලින් එම අංකුරය විනාශ කර දමති.

මගේ අත්දැකීම අනුව මම මෙම බෝධි අංකුරය නියම ආකාරයෙන් පෝෂණය කර හදා වඩා ගැනීමට උත්සාහ ගතිමි. එහෙත් බොහෝ විට මගේ විනිශ්චය, තීරණය වැරදි නිසා කෙළෙස් වලට පත් වී බෝධි අංකුරයට හානි සිදුවිය. එබැවින් එය කෙතරම් අසීරු දෙයක්දැයි මම දනිමි. නිතරම ඒ අංකුරය මැලවී මැරී යන්නාසේය. අද වුවද මෙම අංකුරය විශාල ගසක් බවට පත්වේදැයි මම නොදනිමි. ඒ සිත නිතරම කෙළෙස් වලින් පීඩාවන බැවිනි. මගේ දියුණුව

කෙතරම්දැයි මට මැනීමට නොහැකිය. පහත වැටීම නිතර සිදුවෙමින් පවතී. නිතරම සිත ඉල්ලන්නේ බාහිර අරමුණු බැවින් ඉන් බෝධි චිත්තය පීඩාවට පත්වේ. ගුරුවරයෙකුගේ මඟ පෙන්වීම නැතිවිට බෝධි අංකුරය විනාශ වේ.

යමෙක් බලවත් ශාරීරික මානසික දුක් ඉවසා දරාගෙන තම සිතේ පවතින ප්‍රකෘති කෙළෙස් පරාජය කරමින් බෝධි චිත්තය වඩා ගත්විට ධර්මයේ ප්‍රබල ශක්තියෙන් සියලු කෙළෙස් පරාජය කරයි. ඔහු පූර්ණත්වය හෙවත් අර්හත්වයට පත්වේ. එවැනි පුද්ගලයෙක් සියලු වැඳුම්, පිදුම් වලට සුදුසු වේ. ආචාර්ය මන් එවැනි ආශ්චර්යමත් ගුරුවරයෙකි. තම ශිෂ්‍යයන් නියම මාර්ගයේ ගමන් කරවයි. උන්වහන්සේගේ බෝධි අංකුරය හැදී වැඩී ගොස් අතුපතර විහිදමින් මල් ඵල හට ගත්තේය. එම සෙවණෙහි වෙසෙන සියලු දෙනා ඉමහත් සතටක් සාමයක් විඳිති. උන්වහන්සේ පරිනිර්වාණයෙන් ජීවතය සමාප්ත කළ නමුත් ඒ ජීවිත ප්‍රවෘත්තිය කියවන විට පවා අපගේ සිත් සතන් ශ්‍රද්ධා බුද්ධියෙන් ධර්මටය නැඹුරු වේ. ඇත්තෙන්ම උන්වහන්සේ මිය ගියේ නැත.

චියාං මයි සිට ආචාර්ය මන් උදෙන් තානි ප්‍රදේශයට පැමිණ එච් වට් නොං නිවෙට් ආරාමයෙහි වස් දෙකක් ගත කළහ. ඉන්පසු බුන් මයි නම් චුවෙනොන් භික්ෂුව සහ බොහෝ අයගේ ඉල්ලීම අනුව සබෝන් නබෝන් ප්‍රදේශයට ගියහ. 1941කේ වට් සුදධවට් ආරාමයෙහි වාසය කරන කාලයේ බොහෝ අය උන්වහන්සේ දැක ගැනීමට හා ධර්මය ඇසීමට පැමිණියහ.

එහිදී යමෙක් කැමරාවක් ගෙන උන්වහන්සේගේ සේයා රූප ගැනීමට අවසර ඉල්ව්ය. ජීවිත කාලයේදී එසේ සේයා රූ ගැනීමට තුන් වතාවක් අවසර දුනි. මීට ප්‍රථම නබෝන් රචස්සිමා සහ අවසාන කාලයේ බැන් ෆැං ඩෘං හිදී ආචාර්ය සාඕගේ අවමඟුල් දිනයේදී එසේ අවසර දුන්හ. අද දහස් සංඛ්‍යාත අනුගාමිකයින්ගේ වන්දනාමාන පුද පූජා වලට මෙම ඡායාරූප ලක් වී ඇත. අපගේ හේතුවකට මෙම ඡායාරූප අද විද්‍යමාන වේ. නැතහොත් උන්වහන්සේගේ ස්වරූපය අපට දැන ගැනීමට ක්‍රමයක් නැත. ආචාර්ය මන් ඉන්පසු ටික කාලයක් බන් නා මොන් ගමේ කැලෑබද අසපුවක වාසය කළහ. එහි සිටි අනිකුත් භික්ෂූන් සැවොම ඉතා හොඳ ප්‍රතිපත්ති රකිමින් භාවනායෝගී වූහ. සක්මන් භාවනා කළේ එම වනයේ තැන් තැන්වල විසිරී ගොස්ය. කථා කිරීමෙන් වැළකුනාහ. සවස හතරට සියලු දෙනාම ගෙමිදුල අතුගෑම ශුද්ධ කිරීම ආදියෙහි නිරත වූහ. වතුර ගෙනැවිත් බැරල් පුරවා පරිහරණය පිණිස තැන්පත් කළහ. ඉන්පසු සියලු භික්ෂූන් ස්නානය කර තම තමන්ගේ කුටිවලට පිවිස නැවත භාවනාවේ යෙදුනහ.

සියලු වැඩ නිහඬව සති සමපජඤ්ඤයෙන් සිදු කරති.

යමෙක් මෙම ප්‍රදේශයට පැමිණි විට කිසි භික්ෂුවක් දක්නට නැත. කිසිවෙක් කථා සල්ලාපයෙන් නොසිටී. සියලුම භික්ෂූන් තම කුටිවල භාවනාවෙන් කල් ගෙවති. උදේ වරුවේ පිණ්ඩපාතය පිණිස නැවත හමුවෙති. භාවනාවෙන්ම පිණ්ඩපාත කෙරෙති. කිසි කෙනෙක් සමඟ කථා බහ කිරීමක් නැත. එම භික්ෂූන් වහන්සේලාට දකින අය ශ්‍රද්ධා භක්තියෙන් නමස්කාර කරති.

ආහාර වළඳින විට ප්‍රත්‍යවේක්ෂා කරත්. තම පාත්‍රය තුළ ඇති ආහාරවල අනිත්‍ය දුක්ඛතාවය මෙනෙහි කරමින් රස තෘෂ්ණාව යටපත් කරති. උඩ බිම බැලීමක් හෝ කථා කිරීමක් නැත. ආහාර මුඛයට ගැනීම, විකීම, ගිලීම, ඉතා සිහි නුවණින්, නිහඬව කරති. පසුව ශාලාව අතු ගා පිරසිදු කර තම පාත්‍රය සෝදා රෙදි කැබැල්ලකින් පිස අව්වේ වේලා තැන්පත් කරති. මේ සියල්ල සතියෙන් නිහඬව සිදු කරණ භාවනා මනසිකාරයකි. ඉන්පසු තම කුටියට ගොස් නැවතත් භාවනාවේ යෙදෙත්. සමථ භාවනාවෙන් එකඟ වූ සිත විපස්සනාවට නගමින් පටිපච්ච සමුප්පන්න ධර්ම, නාම රූපයන්ගේ ස්වභාවය ගැන ගැඹුරින් භාවනා කරමින් ප්‍රඥාව වර්ධනය කෙරේ. අර්හත්වය කෙරෙහි සිත යොමු කරමින් කෙළෙස් යටපත් කරති. සතිය පැවැත්වීම ඉතාම අවශ්‍ය වේ. දෛනික වැඩ කිරීමේදී සිහි නුවණින් කුසල් සිතින් සියලු වැඩ කරති. සතිය නැතිවිට වීර්‍යය නැතිවේ. එවිට සක්මන් කිරීම, වාඩි වී භාවනා කිරීම කිසි වැඩක් නැති හිස් දෙයකි. සතිය නැති විට සම්මා වායාමය නැත. මේ නිසා ආචාර්ය මන් සතියෙන් සියලු ශරීර චලනය, ශරීර ක්‍රියාකාරිත්වය සිදු කිරීමට නිතර උපදෙස් දෙති. ඇත්තෙන්ම සතියෙන් තොර කිසිම් භාවනාවක් හෝ කුසල් සිතක් නැත. සතිය බලවත් වූ විට සිත නිරායාසයෙන් සමාධිගත වේ. සති සමපජ්ඤ්ඤය හා ප්‍රඥාව විපස්සනා භාවනාව දියුණු කරයි.

යම් භික්ෂුවක් මෙසේ භාවනා මනසිකාරයෙන් බැහැර වූ විට ආචාර්ය මන් සමඟ වාසය කිරීමට නොහැකි වෙති. දින හතකට වරක් සියලුම භික්ෂූන් කැඳවා භාවනා උපදෙස් දෙනු ලැබේ. එවිට ආචාර්ය මන් ඔවුන්ගේ සැක, බිය, ප්‍රශ්න වලට විසඳුම් දෙති. උන්වහන්සේ ඉතා කරුණාවෙන් යම් යම් අයගේ ප්‍රශ්න නිරාකරණය කරති. ධර්මය තමා තුළ ඇති බවත් මග්ගඵල නිබ්බාන තමාට ලබා ගත හැකි බවත් එම භික්ෂූන් වහන්සේලාගේ අධිෂ්ඨානය වේ. ආචාර්ය මන්ගේ දේශන තුළින් තමන්ගේ පාරමිතා ගුණ පූරණය, සිදු කර ගැනීමට අවශ්‍ය ශක්තිය ලැබේ. භාවනාවේ යෙදෙන විට රෑ දවල් ගැන තැකීමක් නැත. දවස, කාලය ගැන දැනීමක් නැත. හඳ එළිය නැති විට ඉටිපන්දම් ලන්තෑරුම් වලින් සක්මන් මළුව ආලෝකමත් කරති. සඳ ඇති කාලයේ සඳ එළියේ සක්මන් කරති. භාවනාවට යොමු වූ විට නිදා ගැනීමට ඉතා ස්වල්ප වශයෙන් සිදුවේ.

ආචාර්ය මන්ගේ සූත්‍ර සජ්ඣායනාව ඉතා මිහිරිය. දිනපතා රෑ බෝ වන තුරු උන්වහන්සේ සූත්‍ර සජ්ඣායනා කරති. ධම්මචක්ක පවත්තන සූත්‍රය, මහා සමය සූත්‍රය, වැනි සූත්‍ර දිනපතා සජ්ඣායනා කෙරෙති සමහරවිට අපගේ දැනුම සඳහා පාළි සූත්‍ර පරිවර්තනය කෙරේ. එය පාළි ව්‍යාකරණ අනුව නොව අර්ථ ය විදහා දක්වමිනි. එහි අර්ථය සාරවත්ය. ඉතා පැහැදිලිය. අසා සිටින අයට බුදු රජාණන් වහන්සේගේ ඒ පණිවිඩය ඉතා මැනවින් ප්‍රකාශ වේ. පෞරාණික පොත පතේ සඳහන් වූ මෙම සූත්‍ර සාරය පුදුමාකාර විධියට අපට ගැලපේ. එම පරිවර්තනය කිසියම් පාළි මහාචාර්යවරයෙකුට කළ නොහැකිය. එහෙත් උන්වහන්සේ කිසි දිනක පාළි භාෂාව හදාරා නැත. පාළි වාක්‍ය උච්ඡාරණයත් සමඟම එහි පරිවර්තනය සැනකින් කියති. සූත්‍ර පරිවර්තනය ''දසවෙනි ශ්‍රේණිය'' සමර්ථය. ආදී වශයෙන් කීමට ''නව වන ශ්‍රේණිය'' යනු අමාරුවෙන් පාළි වචනවල අර්ථ සැපයීමකි.

ආචාර්ය මන් ඉතා ඉක්මනට හා නිර්භයව එම අර්ථ ප්‍රකාශ කරති. ඊට හේතුව උන්වහන්සේගේ භාවනා අත්දැකීම් තුළින් අර්ථය වටහාගෙන ඇති බැවිනි. පාළිගාථා නිරන්තරයෙන් මතකයේ ඇත. එහි අර්ථය සාමාන්‍ය ව්‍යා-ාකරණානුකූල නොවේ. ''වාතා රුක්ඛා න පබ්බතො'' යන්න අර්ථ කථනයේදී ''කුණාටුවෙන් ගස් පෙරළේ එහෙත් පරිවර්ත නොසැලේ'' මෙසේ ධර්ම දේශනා කරණ විට පාළි වාක්‍ය චමත්කාර අන්දමින් යොදා ගනිත්.

මම කලින් සඳහන් කළ 9වෙනි 10වෙනි ශ්‍රේණියේ පාළි භාෂාව එතරම් වැදගත් දෙයක් ලෙස නොසළකනු මැනවි. එය ධූතාංග භික්ෂූන් වහන්සේලා භාවිතා කරන භාෂා විලාසයකි. ඉන් කිසිවෙකුට අවමන් කිරීමක් නැත. අප බොහෝ කල් වනගත වී සිටි බැවින් සමහරවිට වඳුරු ගති ඇත. වඳුරෝ කෙතරම් හීලෑකර සුරතල් කළත් කැලෑ ගතිය අත් නොහරිත්. මා ආචාර්ය මන්ගේ පරිවර්තන පිළිබඳ ලීවේ පාළි ආචාර්යවරුන්ට සරදමක් ලෙස නොවේ. මට සමාවුව මැනව. සමහර පාඨකයෝ මා සීමාව ඉක්මවා ඇතැයි දොස් නැගිය හැකි බැවිනි.

යථා කාලයේදී ආචාර්ය මන් බන් නා මොන් ප්‍රදේශයේ නික් මී බන් බොක් ප්‍රදේශයේ සැතපුමක් පමණ ඈතට ගොස් වස් විසූහ. අසපුව ගමෙන් සැතපුම් භාගයක් පමණ ඈතය. එහෙත් දැඩි නිහඬතාවයක් ඇත. ඒ කාලයේ භික්ෂූන් 10-12 නමක් පමණ එහි වාසය කළහ. මෙහි වාසය කරන කාලයේදී මම ප්‍රථ ම වරට ආචාර්ය මන් හමුවුනෙමි. උන්වහන්සේගේ කරුණා ගුණය නිසා මා ශිෂ්‍යයෙක් ලෙස භාර ගත්හ. එහෙත් මගෙන් කිසි ප්‍රයෝජනයක් නැත. දිරච්ච ලී කොටයක් මෙනි. මා මෙහි ජීවත් වූයේ හොද්දේ රස නොදන්නා හැන්ද මෙනි.

අද වුවද මම ඒ ගැන ලැජ්ජා වෙමි. මා වැනි වැඩකට නැති පුද්ගලයෙක් මේ මහා ගුණ සාගරයක් සමඟ ජීවත් වුනෙමි.

ඒ කෙසේ වෙතත් මින් මතු මා මේ ප්‍රවෘත්තිය ලියන්නේ මගේ පුද්ගලික අත්දැකීම් තුළිනි. මීට පෙර ලියවුන විස්තරය ඉතා ආයාසයෙන් එකතු කර ගත් අන් ආචාර්ය වරුන්ගේ අත්දැකීම් බැවින් බොහෝ විට මම දුර්මුඛ වුනෙමි. මෙම කථා පුවත සකස් කිරිමට අවුරුදු ගණනාවක් තුළ නොයෙක් ප්‍රදේශයන්හි විසූ ආචාර්යවරු හමු වී සාකච්ඡා පැවැත් වූයෙමි. ඒ අයගේ මතකයෙන් කියවෙන කථා පුවත් පටිගත කළෙමි. ඒ සියලුම කරුණු ගොනු කිරීම ඉතා දුෂ්කර විය. ඒවා අනුපිළිවෙළින් වාර්තා කිරීම, එය කියවා වටහා ගත හැකි පරිදි පාඨක-යාගේ අවධාරණය පිණිස යම් රසාස්වාදයක් තුළින් එළිදැක්වීම අවශ්‍ය විය. එහි අන්තර්ගත ධර්මකරුණු ඒ ආකාරයෙන් ඉදිරිපත් කිරීම ගැන මම නොයෙක් විට අවබෝධයෙන් යුක්තව සඳහන් කළෙමි. මින් මතු මගේ අත්දැකීම් තුළින් ආචාර්ය මන්ගේ අවසාන කාල පරිච්ඡේදය ලියමි. මෙම විස්තරය ඔබ මෙතෙක් කිය වූ විස්තරය තරම් රසවත් නොවිය හැකිය. එහෙත් කතෘවරයා වශයෙන් මා වඩාත් භක්ති පූර්වක අත්දැකීම් පළ කරන්නේ සිතට එකඟවය.

වස්සාන කාලය ආචාර්ය මන් බන් බොක් හි වන සෙනසුනේ තව භික්ෂූන් ස්වල්ප දෙනෙක් සමඟ විසූහ. එම තුන් මාසය සියලුම භික්ෂූන් ඉතා නිරෝගිව භාවනා කාර්‍යයෙහි යෙදුනාහ. සතියකට වරක් ධර්ම දේශනා කරති. එය පැය 2-4ක් පමණ කාලයක් පැවැත්වේ. අසා සිටින අය සමාධි සිතකින් ම අවධ-ාරණය කරති. මැලිකමක් හෝ නිදිමතක් නැත. සියලු දෙනාම අවදියෙන් බලවත් ශ්‍රද්ධාවෙන් අසා සිටිති. ආචාර්ය මන් දේශනා කරන්නේ සමාධි සිතකින් බැවින් එහි නැවතීමක් හෝ අනවශ්‍ය වචන මාත්‍රයක් නැත. හේතු ප්‍රත්‍ය කර්ම විපාක, පටිච්චසමුප්පන්න ධර්ම අසා සිටි අයගේ සිත් විනිවිද ගියේය. සියලු දෙනාම පුල පුලා බලා සිටින්නේ මේ ධර්ම කරුණු අවබෝධ කර උතුම් අර්හත්වය සාක්ශාත් කිරීමටය. එම දේශනා ඉතා සරලය, ගැඹුරුය, සත්‍යයෙන් සත්‍යය ගලපා ඇත. කිසිවෙකුගේ සිතේ සැකයක් නැත. එකම එක සැකයක් ඇත. මේ ධර්ම වටහා ගැනීමට අවශ්‍ය සති සමාදි දියුණු කළ හැකිද ? යන්නයි.

උන්වහන්සේගේ දේශනය අසා සිටි අපට සිහිපත් වූයේ සම්මා සම්බුදු රජාණන් වහන්සේ සිව් පිරිසට ධර්ම දේශනා කරන විලාසයක්ය. බුදුරජාණන් වහන්සේගේ දේශනය ඒකාන්තයෙන්ම ගැඹුරු වූ ධර්ම කරුණු අර්හත්වය පිණිස යොමු කරති. අසා සිටින්නෝ මග්ගඵල නිවන ශාක්සාත් කරති. එබැවින් බුදු වදන ඇසූ අසංඛ්‍යයක් සත්ත්වයෝ නිවන් දුටහ. බුදු දහම මග්ගඵල පිණිස දේශනා කරන්නේ අසීමිත දයාව අනුකම්පාවෙන් යුතු සර්වඥතා ඥානයෙනි. එය පිරිසිදුය. සරලය. අසා සිටින්නන්ට වහා වැටහේ.

ආචාර්ය මන් දේශනා කරන්නේ එම මොහොතේ සිතට ආ කරුණු බැවින් එය ගලා යන ප්‍රවාහයකි. ආයාසයෙන් ඉගෙන ගත් උගතෙකුගේ පාණ්ඩිත්වයක් නොවේ. උන්වහන්සේ කරුණු ඉදිරිපත් කරන්නේ අසා සිටින්නන්ගේ සිත් විපරීත කිරීමට හෝ සැක, තර්ක, විතර්ක ඇති කිරීමට නොවේ. එය කෙළින්ම තම අත්දැකීම් තුළින් නිරවුල්ව කරණ ප්‍රකාශයකි. අසා සිටින්නන්ගේ නොයෙකුත් සැක, ප්‍රලාප, මතිමතාන්තර සැනකින් අහෝසි වී යයි. තව තවත් සිතේ ආකූල, ව්‍යාකූල කරුණු ඉතිරි වී නැත. තමාගේ වැරදි, කෙළෙස් තමාටම අවබෝධ වී නිසි පිළියම් යෙදීමට උනන්දු වේ. සති සමාධි දියුණු වේ.

රාත්‍රී කාලයේ ආචාර්ය මන් පැය ගණනාවක් සියුම් ස්වරයකින් සූත්‍ර සජ්ඣායනා කරත්. එක් දිනක් මගේ දඟකාර සිත උන්වහන්සේ සජ්ඣායනය කරණ සූත්‍ර ඇසීමට කුටිය අසළට ගොස් අසා සිටියෙමි. එහෙත් කිසිවක් නෙ-ාඇසේ. එවිට ඈතට ගියෙමි. නැවත සජ්ඣාජනය ඇසේ. එහෙත් රහසිගතව ළංවී ඇසීමට ගියවිට නොඇසේ. මීට හේතුව කුමක්ද ? සූත්‍රය කුමක්දැයි මට අසා ගැනීමට නොහැකි විය. මමබිය පත් වුනෙමි. රහසිගතව අසා සිටීම නිසා විදුලි සැරයක් මෙන් හෙන හඬක් ඇසේ වීද ? අනවශ්‍ය දේ කිරීම ගැන දොස් අසන්නට වේදැයි සිතුවෙමි. පසුදින මම උන්වහන්සේ සමීපයට නොගියෙමි. මගේ සිතේ චකිතයක් ඇත. මම මුහුණ දෙස නොබැළුවෙමි. උන්වහන්සේ මා දෙස බැල්මක් හෙළුවේය. එයම මට පාඩමක් විය. නැවත කිසිවිටක සූත්‍ර සජ්-ඣායනා ඇසිමට නොගියෙමි. උන්වහන්සේ මගේ ක්‍රියා පටිපාටිය දනිති. එයට නිසි දඬුවම් ලැබෙන බව දැන ගතිමි.

ඊට බොහෝ කාලයකට පසු මට තේරුම් ගියේ කෙතරම් සූක්‍ෂම අවධා-නයකින් උන්වහන්සේ අවට පරිසරය නිරීක්ෂණය කරණ අන්දම ගැනය. ඒ ගැන මම දැන් සිතන විට උන්වහන්සේ මා වැනි මෝඩයෙක් කළ නොමනා හැසිරීම දැන සිටියහ. එහෙත් ඒ පිළිබඳ කථා නොකර මේ මෝඩ භික්ෂුවගේ ක්‍රියා ගැන විපරම් කර බැලූහ. තවදුරටත් මා එවැනි ක්‍රියාවන්හි යෙදුනා නම් මට සෑහෙන බැණුමක් අසන්නට තිබුණි. කුටිය ළඟට ගිය විට සජ්ඣායනාව නෑසුනේ ඇයි ? උන්වහන්සේ හොඳාකාර මගේ ක්‍රියාව දැක ඇත.


## ඌරන් සමඟ සහවාසය


මා නවකයෙක් ලෙස ආචාර්ය මන් ළඟ පැවිදි වී සිටි නමුත් මගේ සිත දෙගිඩියාවකි. මේ පිළිවෙත් රැකීම මට රුචි නැත. දිනක් දවල් කාලයේ මා වැතිරී සිට නින්දට ගියෙමි. මම භයානක සිහිනයක් දුටුවෙමි. ආචාර්ය මන් මට බැණ වදිති. ''නුඹ ඌරෙක් මෙන් දවල් කාලයේ නිදයි. මේ ඌරු කොරටුවක් නොවේ.


මෙහි පැමිණෙන භික්ෂූන් ඌරන් මෙන් හැසිරීමට පුහුණු කරන්නේ නැත. ඔබ වැනි අය නිසා මේ ස්ථානය ඌරු කොටුවක් බවට පත්වේ.'' උන්වහන්සේගෙ " වචන සැර පරුෂය මා බියෙන් තැතිගෙන පිබිදුනෙමි. තවමත් සිහින ලොවේ සිටිමින් ඒ මේ අත බැලුවෙමි. දොර ළඟට ගොස් හිස එළියට දමා ආචාර්ය මන් සිටිත්දැයි බැලුවෙමි. කොහොමටත් මම උන්වහන්සේට බිය ඇත්තෙක්මි. ඒ වුවද බලවත් අධිෂ්ඨානයකින් රැඳී සිටියෙමි. ඊට හේතුව එය මට හොඳ නිසා විය යුතුයි. උන්වහන්සේ මා වැනි ඌරන් පුහුණු කිරීමට අති දක්ෂ බව මට වැටහී තිබුණි. මම වටපිටාව බැලූ නමුත් උන්වහන්සේ නොපෙනේ. ඉන්පසු මා සිහිනයක් දුටු බව දැන තරමක සැනසීමකට පත්විය. පසුදින මා ආචාර්ය මන් හමු වී මේ සියලු පුවත නොවලහා කීවෙමි. උන්වහන්සේ දක්ෂ ලෙස සිහිනය තේරුම් කළහ. එය මට අස්වැසිල්ලක් විය. එහෙත් මගේ මැලිකම නැති කර ගැනීමට එවැනි ආදර බර වචන නුසුදුසුයැයි සිතුවෙමි.

''ඔබ නවකයෙක් ලෙස ළඟදී මෙහි පැමිණ ඇත. ඔබ වීර්‍යය වඩමින් අධිෂ්ඨාන කරගෙන සිටින කෙනෙකි. ඒ හිතේ ස්වභාවය කැඩපතක් මෙන් ඔබ සිහිනයකින් දැක ඇත. ඒ බැණුම ඔබට ඌරෙක් මෙන් මෙහි කල් ගෙවන්නට එපා යැයි ධර්මය විසින් ඔබට කළ අනතුරු හඟවීමකි. භික්ෂුව, ධර්මය යන්න අති උත්තම මිනිසත්බව ඉක්මවා ගිය ලෝකෝත්තර ගති පැවතුම්ය. බොහෝ දෙනා කරන්නේ තමන්ට කැමති කැමති දේවල්ය. මිනිසත් භාවය හෝ කර්ම විපාකය යනු කුමක්දැයි ඔවුහු නොදනිති. පැරණි කියමනක් ඇත. ''තමන් තමන්වත් නොදනී'' ඉන් අර්ථවත් වන්නේ මිනිසා තිරිසන් සතුන්ට වඩා උසස් බව නොදනිති. සමහරු තිරිසන් සතුන් මෙන් ජීවත් වෙති. ඒ කර්ම විපාක නොදන්නා බැවිනි. මිනිස් සිරුරක් ඇතත් එහි අභ්‍යන්තරය තිරිසන් ගතිපැවතුම්ය. තමන් එවැනි දූෂිත පුද්ගලයෙක් බව නොදනී. කිසි පාලනයකින් තොරව කැමති කැමති දේ කරති.

සති, පඤ්ඤා වඩන විට ධර්මය තුළින් තමන් කවරෙක්ද යන්න දැකගත හැකිය. ඔබගේ සිහිනය හොඳ අනතුරු ඇඟවීමකි. ඉන් පාඩමක් ඉගෙන ගන්න. මින් මතු ඔබ මැලිකම් වලට ගොදුරු වීමට ඉඩ නොදී සිහිනය මතක් කර ගන්න. මෙවනි සිහින ඉතා බලවත් ලෙස අපට නියම මාර්ගය පෙන්වා දෙයි. හැමෝටම මෙවැනි සිහන නොපෙනේ. මේ සිහිනය තුළින් ඔබ සති, පඤ්ඤා වඩයි. එවිට ඉක්මණින් සිත සමාධිගත වේ. මේ සිහිනය ධර්මය කියා දෙයි. ඔබ ඉක්මණින් මගඵල ලබා ගනියි. අනිකුත් භික්ෂූන්ට වඩා ඉක්මණින් ඔබ නිවන් දකීදැයි කියන්ට බැරි ඇයි ? ඇතැම් විට බොහෝ කල් භාවනා කළත් නිවන් ලබා ගැනීමට නොහැකි වේ. ඔබගේ සිහිනය ඉතා හොඳයි. එය නරක සිහිනයක් නොවේ.'' ඔබ අනවශ්‍ය ලෙස ගුරුවරයාට බිය නොවන්න. ඒ හේතුවෙන් ඔබ නිතරම කනස්සල්ලෙන් සිටියි. තම ගෝලයින් නිසි මග ගමන් කරවීමට ගුරුවරයාට















6

# අවසාන කාලය

වගකීමක් ඇත. ඔබ ඔබගේ ගුරුවරයාට නොව ඔබගේ අකුසල් වලට බිය පත්විය යුතුයි. ඒ අකුසල් නිසා නිතර දුකට පත්වේ. මා ගෝලයින් භාර ගන්නේ අනවශ්‍ය ලෙස ඔවුන්ට දුක්පීඩා ගෙන දීමට නොවේ. භික්ෂුවක් පුහුණු කිරීමට දැඩි විනය ශික්ෂා අවශ්‍ය වේ. එය බුදුරජාණන් වහන්සේ පැනවූ ශික්ෂාවෝ වෙති. ගුරුවරයා මේ ශික්ෂා අනුව තම ශිෂ්‍යයින් පුහුණු කළ යුතුය. මෙය උල්ලංඝනය කළ විට ගුරුවරයා සහ ගෝලයා යන දෙදෙනාම අනාථ වේ.

එබැවින් සිත තැන්පත් කරගෙන පිළිවෙත් පුරන්න. වීර්යය යනු දොර විවෘත කරන යතුර වේ. අධෛර්‍යය නොවී සන්සුන් වන්න. ධර්මය යනු එය පිළිපදින පුද්ගලයාගේ අයිතියකි. නියම ආකාරයට ධර්මය අනුව ජීවත් වන්නාට ධර්මයේ අයිතිවාසිකම් ලැබේ. ඒ භාග්‍ය සම්පන්න සිහිනය අමතක නොකරන්න. නිතර මෙනෙහි කරන්න එවිට ඌරු ගති නැත්තට නැති වී යයි. එවිට මග්ගඵල නිබ්බාන ඔබ ළඟ ඇත. ඉන්පසු නියම වේලාවේදී ඔබ සියලු දුක් ඉක්මවා යයි. එය නොවැළැක්විය හැකි කරුණකි. මම බලවත් විනය ගරුත්වයකින් ප්‍රතිපත්ති රැක්කෙමි. එහි කුසල විපාක මට ලැබී ඇත. එවැනි තදබල නීති නැතුව මේ මාර්ගයේ ගමන් ගත නොහැකිය. මගේ අත්දැකීම් තුළින් මම ශිෂ්‍යයන්ට උප-දෙස් දෙමි.

තරුණ මට ආචාර්ය මන් මෙසේ අවවාද අනුශාසනා දුනි. මගේ සිහිනය මේ ආකාරයෙන් විසඳා මට මහත් සැනසීමක් අත්පත් කර දුනි. මේ තරුණයා බිය පත් වී වීර්‍යය අත්හැර ඌරන් සමඟ සහවාසයට යතියි උන්වහන්සේ කරුණාව දැක්වූහ. මෙය එක්තරා ඉගැන්වීම් ක්‍රමයකි. එම ක්‍රම ඉතා විවෘතය. දක්ෂය. අවබෝධයෙන් යුක්තය. නිරවද්‍යය, උන්වහන්සේගේම නිපදවීමකි. ඍ-ජුය. එබැවින් සමහරවිට වරදවා තේරුම් ගත හැකිය. උන්වහන්සේ එවිට මහත් සේ කම්පාවට පත් වී තමාගේ අදහස සුහදව ප්‍රකාශ කර එසේ නොකීමටද

අධිෂ්ඨාන කරති. මම නිතරම පාහේ උන්වහන්සේ හමුවීමට ගොස් කථා කළෙමි. ඒ මුල් කාලයේ මගේ සිත නිතරම චංචල විය. ටික වේලාවක් තැන්පත් වුවහොත් ඊළඟට විසිරී යයි. මෙසේ දියුණුවක් සමඟම පසුබැසීමක් විය. ඒ කාලය මම වික්ෂිප්තව විසුවෙමි. කුමක් කරම්දැයි නොදනිමි. එවිට උන්වහන්සේ මට සුහදව කථා කරයි. මා දුටුවිට මගේ සිත කෙසේදැයි අසති. එය දැන් හොඳින් දියුණු වී ඇතැයි කී විට සතුටට පත් වී තව තවත් හොඳට භාවනා කරන්ට යැයි කියති. එවිට ඉක්මණින් සියලු දුක් ඉක්මවා ගිය හැකිය. මගේ භාවනාව පසුබසිතියි කී විට ඒ ගැන අනුකම්පා කරති.

''අපරාදේ, සිත කොහේ ගිහින්ද ? තව මහන්සි ගන්න. සිත ආපසු ඒවි. කොහේදෝ රස්තියාදුවේ ගිහින් ! තව වීර්යය වඩන්න. එවිට සිත අල්ලා ගත්ත හැකිය. සිත බල්ලෙක් වගේ. අයිතිකාරයා පසුපස නිතර යයි. අතහැර යන්නේ නැහැ. තව තවත් වීර්යය වඩන්න. එවිට නිරායාසයෙන්ම එයි. හිත කොහේ ගියාදැයි සොයමින් කාලය නාස්ති කරන්න එපා. කොහේ ගියත් ආපසු එනවා. ඉක්මනට අල්ලා ගන්ට නම් දැඩි උත්සාහයක් ගන්ට ඕනේ. බැරිකම පෙන්නුවොත් සිත බලවත් ලෙස ඉබාගාතේ යයි. ඔබට අල්ලන්ට නොහැකි යැයි, ගණන් උස්සනවා. සිත ගැන සිතන්ට එපා ගියා නම් ගියාවේ. ඒ වෙනුවට බුද්ධෝ, බුද්ධො භාවනා කරන්න. නොනවත්වාම කරන්න. නැවත නැවත කරන්න. එවිට සිත ආපසු එයි. ඊත් බුද්ධො අත්හරින්න එපා. බුද්ධො යනු සිතේ ආහාරයයි. ආහාරය තියෙන තාක් කල් සිත එනවා. දුවගෙන එනවා. ''බුද්ධො'' භාවනාව කරගෙන යන්න. එවිට සිත ඇති තරම් ආහාර ගෙන තෘප්තිමත් වේවි. ඉන්පසු නිශ්චලව විවේක ගනීවි. එවිට ඔබටත් ලොකු විවේකයක් ලැබෙනවා. සිත එකඟ වූ විට පිස්සුවෙන් දුව ඇවිදින්නේ නැහැ. ඔබට කරදරයක් නැහැ. මේ ප්‍රඥාව කරගෙන ගිය විට සිත එලෙව්වත් යන්නේ නැහැ. එතැනම වැටිලා ඉන්නවා. මේ ක්‍රමය හරියටම හරි. පරිපූර්ණයි. මුළුමනින්ම නිරවද්‍යයි. මගේ අවවාදය පිළිග න්න. ''බුද්ධො'' යනු දොරේ යතුරයි. ආහාර තියෙන තාක් කල් සිත දුවන්නේ නැහැ. මේ ආකාරයෙන් සිත බැඳ තබන්න. ඉන්පසු කවදාවත් ඉබාගාතේ යන්නේ නැහැ.

මෙවැනි ක්‍රම සහ විධි උපයෝගි කර අප වැනි අන්ධ භූත, මෝඩ, සිහි විකල් අයට භාවනා උපදෙස් දෙති. මගේ මෝඩකම තුළින් වුවද මම උන්වහන්සේ විශ්වාස කළෙමි. නැතහොත් මා තවමත් සිතුවිලි පස්සේ යමින් අතරමං වෙලා. සිත අල්ලා ගන්ට බැරිව දඟලනවා. මා මේ ගැන සඳහන් කළේ සමහරවිට ඔබට මෙය ආදර්ශයක් වේ යැයි අදහසිනි. දක්ෂ ගුරුවරයෙක් මෝඩ ශිෂ්‍යයන් හොඳින් හෝ නරකින් අවනත කරයි. මෙය ලීවේ මගේ මෝඩකම විදහාපෑමට නොව උන්වහන්සේගේ දක්ෂකම විදහාපෑමටය.

වස් කාලය අවසානයේ උන්වහන්සේ ටික දිනක් බන් නා මොන් ගමේ වැස පසුව බන් හුයේ කළුන් කැලෑ ප්‍රදේශයේ ටික කාලයක් රැඳී සිට කඳුකරයේ පාළුවට ගිය ආරණ්‍ය සේනාසනයට ගොස් මාස කීපයක් එහි විසූහ. එහිදී උණ සෑදී දින ගණනක් රෝගී විය. එහෙත් කිසි බෙහෙතක් නොගෙන භාවනා බලයෙන් රෝගය යටපත් කළහ.

1942 අප්‍රේල් මායේ උන්වහන්සේ උබොන් රචඡතානි නගරයට පැමිණියේ උන්වහන්සේගේ ආචාර්යවරයෙක් වූ ආචාර්ය සාඕගේ අවමඟුල් උත්සවයට සහභාගි වීමටය. ඉන්පසු බන් නා මොන් ගමේ වස් විසූහ. මේ කාලයේදී නොයෙක් උපක්‍රම යොදා තම ශිෂ්‍ය පිරිස නිසි මාර්ගයේ හැසිරවීය. දින 4කට වරක් රැස් වී භාවනා උපදෙස් දෙති. ඒ තුළින් බොහෝ භික්ෂූහු උසස් අධිමානුෂික ශක්ති ලදහ. එක් එක් අයට ලැබුණ අත්දැකීම් එවිට ආචාර්ය මන් සමඟ පවසති. මගේ පූර්ව හේතුවකට එයට සවන් දීමට හැකිවිය. මම එකල එතරම් භාවනා දියුණුවක් නොලබා සිටි නමුත් අමතක නොවන ආශ්චර්යමත් සිද්ධීන් අත්දුටුවෙමි. ජීවිතය ඇති තාක් එය මගේ මතකයේ රැඳී ඇත.

මේ කාලයේදී උන්වහන්සේ අපට සැළකුවේ පා පිස්නාවක් ලෙසය. සැර පරුෂ ගතියක් තිබුණි. මින් පෙර තරමක ආදර කරුණාවක් දැක්වූහ. අපේ වැරදි දෙස නොබලා සිටියහ. දැන් තදින් සිටීමට කාලය හරි යැයි උන්වහන්සේ සිතුවා විය හැකිය. දිගටම අපේ වැරදි නොබලා සිටියා නම් උන්වහන්සේට එය ඉසලිය නොහැකි බරකි. ශිෂ්‍යයෝ නිදිමතේ කල් යවති. ඇස් හැර අහස පොළොව තාරකා දෙස හෝ නොබලති. දැන් වූයේ සැවොම අවදිවීමකි. භාවනා කිරීමට උද්‍යෝග යක් ඇත. තමා ලැබූ අත්දැකීම් ගැන කුල්මත් වූහ. ඔවුහු ආචාර්ය මන් නිතර හමු වී තමා යන මාර්ගය නිවැරදි කර ගනිති. එම ප්‍රශ්න හා උත්තර භාවනා උපදෙස් වෙති. ප්‍රායෝගික භාවනා තුළින් හට ගන්නා නොයෙක් අත්දැකීම් වෙති. සිතීමට පවා නොහැකි අද්භූත දේ කියති. එය නිරාකරණය කිරීමට ආචාර්ය මන් සැම අතින්ම සමර්ථ වෙති. මෙය අද මිනිස් ලෝකයේ නොලැබිය හැකි වරප්‍රසාදයකි. ඒ හැම දෙනාටම අවශ්‍ය උපදෙස් දෙති. අසා සිටි අපි විස්මිතව අතිශයින්ම චිත්තාකර්ෂණයට පත්වීමු. එම සාකච්ඡා කෙතරම් වුවද ඇසීමෙන් තෘප්තිමත් නොවේ. සිත නිරන්තරයෙන් ධර්මය කෙරෙහි යොමු විය.

මෙම අවස්ථාවලදී ආචාර්ය මන් නොයෙක් මාතෘකා යටතේ ධර්මය දේශනා කළහ. අතීත ජීවිත ගැන ද තමන් වහන්සේගේ මුල් කාලය ගැනද, තමන් වහන්සේගේ ගෙන ගිය පිළිවෙත් මාර්ගයද, සම්මුති ලෝක තරණය කර සසර කතරින් එතරවීම ගැනද, ලෝකෝත්තර තත්ත්වය ගැනද බොහෝ කරුණු එළිදරව් කළහ. උන්වහන්සේගේ අවබෝධය පිළිබඳව අසා අපි සැවොම මේ

අත්බැව්හිදී උතුම් අර්හත්වය ප්‍රාර්ථනා කළෙමු. සමහරු දුක්මුසු වූහ. අප තුළ එවැනි ශක්තීන් ඇද්දැයි විමතියට පත්වීමු. අපි සදාකාලයේම මේ සසර මඩ ගෙහොරුවේ එරී සිටිමුද ? මේ වලෙන් ගොඩ වෙන්නේ කවදාද ? උන්වහන්සේ මෙවැනි විස්කම් පාති. එහෙත් අපට බැරි ඇයි ? තවමත් අප අඩ නින්දේ. කෙතරම් බාධක තිබුණත් ඉදිරියට යාමට අපි තීරණය කළෙමු. මෙය අපට විශාල රුකුලක් විය. ධර්මයේ ශක්තියෙන් අපි ශක්තිමත් වීමු. අපි නැගී සිටියෙමු. ප්‍රබෝධමත් වීමු. බුදුරජාණන් වහන්සේ අපට දුන් අවවාදයක් නම් නුවණැත්තෝ ඇසුරු කිරීමටය. මෙහි සත්‍යතාවය අපට දැනුනේ උතුම් ගුරුවරයෙකුගේ ආශ්‍රය ලැබුණු බැවිනි. රෑ දවල් දෙකේ අපේ දෙසවනට යොමු වුනේ අපි දිරිගන්වන ධර්මයකි. එහි ගම්‍යතාවය සීඝ්‍රයෙන් වර්ධනය විය. ධර්මය ඇට මිඳුළු වලට කිඳා බැස ඇත. උන්වහන්සේගේ ගුණ සමුදාය අපගේ චරිත වර්ධනයට හේතු විය. ඊට සමාන කමක් නොලැබුණත් කිට්ටුවෙන් යන්ට අපි සැවොම මහන්සි ගත්තෙමු. මෙහි අනිත් පැත්තක්ද ඇත. අප බාල අඥාන අය ඇසුරු කළා නම් ඒ හේතුවෙන් තව තවත් පාතාලයට බසින බව සක්සුදක් සේ පැහැදිලි වීමය. මේ බුදු වදන අපට මොනවට පැහැදිලි විය. ඉතා ගුණ ගරුක පුද්ගලයන්ගෙ ඇසුර නිසා තමා ගුණවත් වන බවත් මෝඩ ආඥානයන් නිසා තමන් එවැනි මෝඩයන් වන බවත් පැහැදිලිය.

මෙහිදී මම සඳහන් කරන්නේ බාහිර සමාජයේ සිටින මෝඩයන් පිළිබඳවය. ඊට අමතරව අපේ චරිතයේ සැඟවී සිටින අභ්‍යන්තර මෝඩයන් ගැන ද අපි අවබෝධ කළ යුතුය. එනම් බාහිර ''හොඳ'' හැසිරීම ඇති පුද්ගලයන්ය. මේ කොට්ඨාසයට භික්ෂු භික්ෂුනීන් ද අයත් වේ. බුදු සව්වන් වූ මේ අය උතුම් බුද්ධ චීවරය දරාගෙන සිටින්නන් වෙති. අභ්‍යන්තර මෝඩයන් යනුවෙන් සඳහන් කරන්-න් තණ්හාවෙන් මුලා වී, බියපත් වී තම සිතේ නිරන්තරයෙන් හට ගනනා කෙළෙස් සමඟ ජීවත් වන අය වේ. මේ කෙළෙස් කිනම් මොහොතක හෝ දුශ්චරිතයෙන් එළිදරව් වේ. මෙවැනි අශික්ෂිත සිතිවිලි තමන් තුළ ඇති බවත් ඒවායේ ප්‍රබල ශක්තිය පිළිබඳවත් ඇතැමුන් නොදනී. මේ සිතිවිලි යටි සිතේ කිඳා බැසගෙන ඇත. තමන් තුළ මෙවැනි ස්වභාවයක් ඇති බව දන්නා නමුත් ඇතැමෙක් එය වරදක් සේ නොදනිති. ඒ තම වචනය හා ක්‍රියාව තුළින් එළිදරව් නොවී සැඟවී සිටින බැවිනි. එබැවින් එය ගැන කිසි අවධාරණයක් නැත. මෙම කෙළෙස් සැඟ වී සිටීම මහත් පිළිකුල් දෙයකි. ඒවා එළිදරව් නොකර ලෝකයාට ''හොඳ'' යැයි පෙන්නුම් කිරීම තවත් වරදක් වේ. මොන ආකාරයෙන් සිටියත් කෙළෙස් ඉතාම පිළිකුල් වේ. අති උතුම් බුදුරජාණන් වහන්සේ තම කෙළෙස් මුලින් උදුරා දැමිය යුතු බව දේශනා කර ඇත. උන්වහන්සේ සහ තම අර්හත් ශ්‍රාවක පිරිස කෙළෙසුන් කෙරෙන් මිදුනහ. උන්වහන්සේලාගේ යටි සිත අභ්‍යන්තරය සහ බාහිර හැසිරීම කෙළෙස් රහිත බැවින් ඉතාම පිරිසිදු වේ. මේ නිසා නිරන්තරයනේ සිත සැනසීමට

පත් වී ඇත. බාහිර අරමුණු නිසා කෙළෙස් නැගී ඒමක් නැත. මා සිතන විදියට මගේ පුද්ලික අත්දැකීම අනුව ආචාර්ය මන් එවැනි නිකෙළෙස් කෙනෙකි. මා මෙය සඳහන් කරන්නේ ශ්‍රද්ධා භක්තියෙන් පමණක් නොව සම්පූර්ණ වගකීමක් ඇතිවය. මෙය සත්‍යයක් බව මම ඒකාන්තයෙන්ම දනිමි. මේ පිළිබඳ සැකයක් ඇතොත් එය මා වෙත පවරනු මැනවි. එය ආචාර්ය මන් කෙරෙහි නොකෙරේවා. මාර උගුලෙන් උන්වහන්සේ ගැලවී ගියේය.

වස් කාලයෙන් පසු ආචාර්ය මන් බන් නා මොන් ගමේ මාස කීපයක් වැඩ සිටියහ. ඊළඟ වස් කාලය වන විට බන් බොක් ගමට වැඩියහ. එහි වෙනත් ආරාණ්‍ය සේනාසනයකට ගියහ. එය ආචාර්ය කොංමා චිරපුඤ්ඤ භික්ෂුව විසින් සාදා පූජා කරන ලදී. එය ඉතා සුව පහසු බැවින් නිරෝගී විය. වෙනදා මෙන් නිරන්තරයෙන්ම භාවනා උපදෙස් භික්ෂූන් වහන්සේලාට දෙන ලදී.

අවුරුදු තුනක් පමණ කාලයක් මේ අවට පරිසරයේ ගම් නියම් ගම් නුදුරින් වනවාසී සෙනසුන්වල ආචාර්ය මන් වාසය කළහ. නිරන්තරයෙන් අමනුෂ්‍යය දේව පිරිස සමඟ ධර්ම සාකච්ඡා පැවතුණි. එහෙත් මේ සකොන් නබොන් ගමේ චියාං මායි මෙන් දෙවියන් වැඩියේ නැත. ඊට හේතුව ගම් ආශ්‍රිත බැවිනි. පුද පූජා පවත්වන විට බොහෝ දෙව් කැල පැමිණෙති. පොහෝ දිනයන්හි ද, මාස පුජා වෛශාඛ පූජා දිනයන්හිද වස් එළඹීම වස් පවාරණ දිනයන්හිද දෙවිවරු විශාල වශයෙන් පැමිණෙති.

මේ සෙනසුනේ කුටි අඩු බැවින් භික්ෂූන් වහන්සේලා ටික දෙනෙක් පමණක් වස් එළඹ සිටියහ. නවක භික්ෂූන් භාර ගැනීම නොහැකි වූයේ කුටි නැති බැවිනි. මෙසේ වූයේ වස් තුන් මාසය තුළය. අනිත් කාලවල බොහෝ භික්ෂූහු වැඩ සිටියහ. බොහෝ භික්ෂූහු කර්මස්ථාන ලබාගෙන තම ආරණ්‍යය සෙනසුන්වලට ගොස් පුහුණු වූහ.

වස් අවසානයේදී ගිහි පින්වතුන් රාශියක් සකොන් නබොන් ප්‍රදේශයෙන් අවුත් උන්වහන්සේට ඊළඟ වස් විසීමට ආරාධනා කළහ. එහි යාමට තිබූ ගමන් මාර්ගය ඝන කැළෑ තුළිනි. දිවා කාලයේ ගමන් කරමින් රාත්‍රී කාලයේ කැළෑව තුළ ලැගුම් ගෙන දින ගණනාවකට පසු එහි ගියහ.

එහෙත් ටික දිනකට පසු උන්වහන්සේට මැලේරියා රෝගය වැළඳුණි. එම රෝග ලක්ෂණය නම් වරින් වර සීතල වී ගැහි ගැහී සිට පසුව තදින් උණ ගනී. මෙය මාස ගනන් දුක් විඳිය යුතු රෝගයකි. ඒ උණය ඉවරයක් නැතිව පවතී. නැවත නැවතත් මේ රෝග ලක්ෂණ මතුවේ. මාසයක් පමණ සුව වී සිට නැවතත් රෝගය මතුවේ.

මම කලින් සඳහන් කළ අන්දමට බෑනාට මැලේරියා උණ සෑදුන විට නැන්දම්මා උරණ වේ. ලෙඩා අනිකුත් නෑයින්ට මහත් වදයකි. නිතරම නිදා ගනී. නිතරම ආහාර ගනී. එහෙත් කිසිම වැඩක් කළ නොහැක. මැලේරියා රෝගය එබැවින් බොහෝ කාලයක් දුක් දේ. ඒ කාලයේ මැලේරියා රෝගයට බෙහෙත් ඖෂධ නොතිබුණි. එය ඉබේම නැතිවේ. නැතහොත් මරණයට පත්වේ. අවුරුදු ගණනාවක් මේ රෝගයෙන් පෙළෙන අය සිටිති. පොඩි දරුවන්ගේ ආමාශය එළියට නෙරා එති. ඉදිමුණ පිලිහාවක් නිසා මන්ද පෝෂණය ඇත. කැළෑ බද දුප්පත් ජනයා මෙම රෝගයට ගොදුරු වේ. පිට පළාත්වලින් පැමිණි අයට මෙම රෝගය ඔරොත්තු දෙන්නේ නැත.

ධුතාංග භික්ෂූන් අතර නොයෙක් විට මැලේරියා රෝගය පැතිරී ගියේය. කැළෑ බද කඳුකරයේ හැසිරෙන භික්ෂූන්ට මෙය වැළඳුනි. මැලේරියාව අභිමානවත් දෙයක් නම් මටත් මැලේරියා වැළඳුන බව ආඩම්බරයෙන් කිව හැකිය. මක්නිසාද ඉතාම දැඩි ආබාධයට පත් වී මා තරම් ඔත්පල වූයෙක් නැති තරම් වේ. වස් තුන් මාසයම උණ ගැනී ගැහි ගැහී සිටියෙමි. අවුරුදු ගණනාවක් එය මගේ ශරීරගත වී තිබුණි. පැවිදි වී දුෂ්කර දිවියක් ගත කරන නමුත් මෙවැනි රෝග නිසා ඉවසන්නට බැරි තත්ත්වයක් උද්ගත වේ. මම මේ දුක තුළින් තව තවත් ලෝක ස්වභාවය අවබෝධ කළෙමි.

සකොන් නඛොන් ප්‍රදේශයේ බං නොං ෆිව් ගමේ වාසය කරණ කාලයේ බොහෝ භික්ෂූහු එහි ධුතාංග පිරීමට පැමිණියහ. සමහරවිට 20-30 නමක් සිටිති. අනිකුත් භික්ෂූන් අවට ගම්වල වාසය කරමින් ආචාර්ය මන්ගෙන් උපදෙස් ලබති. උපොසථ දිනයන්හි මේ අවට ගම්වාසි භික්ෂූන් 30-40ක් පමණ ආගන්තුකව පැමිණෙති. මුළු සංඛ්‍යාව 50-60ක් තරම් වේ. ආචාර්ය මන් සොයමින් බොහෝ ඈත සිට එන සිය ගණන් භික්ෂූහු ද වෙති. දවල් කාලයේ ඒ භික්ෂූන් දක්නට නැත. ඝන වනාන්තරයේ ගස් මුල් ආදී තැන්හි භාවනාවේ යෙදෙති. සැතපුම් 10ක් පමණ අවට පරිසරය කැලෑවෙන් ගහණ විය. කඳු අතර පිහිටි මේ වනාන්තරවල දිග පළල ඉමක් කොනක් නැතිව පැතිර පැවතුණි.

මේ නිසා ආචාර්ය මන්ගේ වාසස්ථානය ධුතාංග භික්ෂූන්ට සුදුසු පරිසරයක් විය. ප්‍රාතිමොක්ෂා දේශනා කිරීමට හා නොයෙක් වත් පිළිවෙත් පිළිබඳ විනයා-නුකූල පුහුණුවට ද භාවනා පුහුණුවටද මේ ප්‍රදේශය සුදුසු විය. නිතර ආචාර්ය මන් හමු වී ප්‍රශ්න නිරාකරණය කරගත හැකි බැවිනි. ගිරිසිඛර අතර ගල් ගුහා, ලෙන් ස්වාභාවිකව තිබුණි. කඳු පල්ලම් සහිත විසම භූමි භාගය, ගල් පර්වත කඳු වලින් ගහනය. ඈතින් ඉතා කුඩාගම්මාන පිහිටියේය. අතු සෙවිලි කළ කුඩා පැල්පත්වල වාසය කරන ගැමියෝ පවුල් 4-5 පමණ වෙති. ඔවුහු කුඩා බෝග වැවිලි, හේන්, ගොවිතැන් කළහ. ධුතාංග භික්ෂූහු මෙම පැල්පත් වලින්

පිණ්ඩපාත කෙරෙති. අතරින් පතර කුඩා ගම්මාන අත. එහි පැල්පත් 10-30 ක් පමණ විසිරී ඇත.

මෙම බං නං හිව් ගම්මානය පිහිටියේ හතර වටින් කඳු ගැට වලින් ආවරණය වූ නිම්නයකය. හැකිතරම් කැලෑ පෙදෙස එළිකර ගම්මු වගා කළහ. ඉන් පිටත ඇත්තේ ඝන වනාන්තරයයි. මේ තැන් වල ඇති වාසස්ථාන ධූතාංග භික්ෂූන්ට අවශ්‍ය නිහඬ පරිසරයකි. වස් කාලය තුළ ද ග්‍රීෂ්ම සෘතුවේද බොහෝ ධූතාංග රකින භික්ෂූහු මේ වනාන්තරයේ භාවනා කළහ. වියලි දේශ ගුණික කාලයේ ගමනාගමනය පහසු බැවින් බොහෝ දුර කතර සිට භික්ෂූහු ආචාර්ය මන් හමුවීමට පැමිණියහ.

පා ගමනින් එන ගිහි පිරිසද බොහෝ වූහ. මෝටර් වාහන පහසුකම් හෝ මාර්ග නැත. සියලු දෙනාම සැතපුම් ගණනාවක් පා ගමනින් යති. කලාතුරකින් කරත්ත පාරක් දිගේ ගොන් කරත්ත වල නැගී වයසක ස්ත්‍රීහු ගමන ගත්හ. හැතැප්ම 12ක් පමණ මාර්ගය කරත්ත පාරකි. කඳු අතරින් සෑදී ඇති මාර්ගය, වල ගොඩැලි නිසා අති දුෂ්කරය. කඳු වටේ යන කරත්ත පාර සැතපුම් 15ක් පමණ වේ. විඩා සංසිඳුවා ගැනීමට අතර මග ගම් නැත. ආහාර හෝ නැවතී රාත්‍රිය ගත කිමට නවාතැන් නැත. ප්‍රාදේශීය පාර දිගේ එකම වාහනයක් දිනපතා යයි. එය නොලැබුණොත් මුළු දවස පුරා ඊළඟ වාහනය එන තුරු බලා සිටිය යුතුය.

ධූතාං භික්ෂූහු මෙම වාහන වල නොයත්. පා ගමනින් යෑම ඊට වඩා පහසු වේ. මේ වාහන මිනිසන්ගෙන් පිරී ඇත. සක්මන් භාවනාවෙන් මෙසේ දුර්ග මාර්ග දිගේ ගමන් කිරීම එම භික්ෂූන්ගේ එක්තරා ප්‍රතිපත්තියකි. අසවල් කඳුකරයට යාමට තීරණය කරගත් පසු අඩිපාර දිගේ හුදකලාව ගමන් ගනිත්. ඊළඟ මනුෂ්‍ය වාසය ඇත්තේ කෙතම් දුරදැයි නොදනිති. කළුවර වැටීමට පෙර එවැනි ගම්මානයකට යාමට හැකිවේදැයි නොදනිති. සවස් වන තුරු ගමන් කර යම්කිසි සුදුසු භූමියක රාත්‍රිය ගත කර පසුදා උදෑසන නැවත ගමන ආරම්භ කරති. ගම්මානයකට ගිය පසු පිණ්ඩපාතය ලැබේ. ගමේ මිනිසුන්ගෙන් ලැබුණ ආහාරය එකතු කර පාත්‍රයේ බහාගෙන නැවත ගමන ආරම්භ කරති. ඒ අය පිළිග න්වන ඕනෑම ආහාරයකින් යැපේ. ආහාර ඉතා දුප්පත් අයගෙන් ලැබෙන බැවින් රස ගුණයෙන් තොර වුවද, එය සතුටින් පිළිගනිති. දවස ගත කිරීමට යැපෙන ආහාර ප්‍රමාණයක් ලබා ගනිති. ඉන්පසු සන්සුන් ගමනින් නැවත තම මාර්ගය දිගේ ගමන් ගනිති. තමන් අරමුණු කළ ස්ථානයට පැමිණි පසු සුදුසු පරිසරයක් සොයා ගනිති. තමන්ගේ පුද්ගලික සැප පහසුව පිණිස එම ස්ථානය සකස් කර ගනිති. පිරිසිදු ජල පහසුකම් ඇති තැනක් ලබා ගැනීම ඉතාම අවශ්‍ය වේ.

තාවකාලික කුඩාරමක් ඉදිකර ඉන්පසු බලවත් පරිශ්‍රමයෙන් භාවනාව ආරම්භ කරති. රෑ දවල් දෙකේ විටින් විට සක්මනේ හෝ වාඩි වී හෝ භාවනාවේ යෙදේ. සති, පඤ්ඤාවෙන් සම්මා සංකල්පනාවෙන් යම්කිසි ධර්මයක් මෙනෙහි කරති. එවිට සිත එකග වී සමාධි වී නිහඬ වේ. සිතිවිලි නැති බැවින් සිත සන්සුන් වේ. ඉන්පසු සමාධියෙන් නැගී සිට සිතට ආ යම් අරමුණක් විපස්සනා කරති. බාහිර ලෝකයෙන් එන අරමුණු නිතරම තම ඉන්ද්‍රියන්ට සංවේදි වේ. එමෙන්ම තම සිතේ ඇති සිවිලි ගැන ද ශරීරයේ අති ඉන්ද්‍රිය එම අරමුණු වලින් චලනය වීම දෙස ද බලා සිටිති. එහි විපරිනාම ධර්මය හඳුනා ගනී. සෑම දෙයක්ම ඇති වී නැති වී යයි. වෙනස් වෙමින් පවතී. සිත ආකර්ෂණය වූ යම් අරමුණක් අතොත් එය තීක්ෂණ පරිඤ්ඤාවෙන් ප්‍රහාණය කරයි. පඤ්ඤාවෙන් සියලු නාම රූප ධර්ම විමර්ෂණය කරයි. ඒ ඒ ස්වභාවය හඳුනා ගනී. සත්‍යය වූ පරමාර්ථ ස්වභාවය අවබෝධ වූ විට අරමුණු කෙරෙහි ඇලීම්, ගැටීම්. දුරුවේ. කෙළෙස් මුලින් උපුටා දැමීමට පඤ්ඤාව උපයෝගී කරයි. ඉන්පසු අරමුණු අත්හරී. මේ ආකාරයෙන් කෙළෙස් මුලින්ම උපුටා දමයි. සිත තුළින් නිරන්තරයෙන්ම බාහිර අරමුණු ස්ටුට වීම දෙස බලා සිටින විට එහි ඇති තිලක්ෂණය හෙවත් අනිත්‍යය, දුක්ඛ, අනාත්ම ස්වභාවය හඳුනා ගනී. මෙම විදර්ශනාව පිළිබඳ යම් සැකයක් ඇතොත් ධූතාංග භික්ෂූහු ආචාර්ය මන් වෙත පැමිණ තම ගැටළුව නිරාකරනය කර ගනිති. ඉන්පසු නැවතත් තම හුදකලා පරිසරයට පැමිණ භාවනා කරති.

බොහෝ ධූතාංග භික්ෂූහු ආචාර්ය මන්ගෙන් භාවනා උපදෙස් ලබා ගනිති. උන්වහන්සේගේ අසපුවෙහි මේ භික්ෂූන් නවතා ගැනීමට ඉඩ කඩ නොමැති බැවින් උපදෙස් ලබාගෙන වෙනත් හුදකලා සෙනසුන් අවට කැලෑ ප්‍රදේශයේ සාදාගෙන භාවනාව අරඹති. සමහර විට දෙදෙනෙක් යති. පයින් ඇවිදින දුර ප්‍රමාණයක මේ සෙනසුන ඇති බැවින් නිතර ආචාර්ය මන් හමුවීමට හැකිවේ. සමහරු සැතපුම් 4-8 දක්වා දුර ප්‍රමාණයක් තෝරා ගනිති. සමහරු සැතපුම් 12-15 පමණ දුර වෙසෙති. එවැනි දුර සිට පැමිණෙන භික්ෂූහු රාත්‍රී කාලය ආචාර්ය මන්ගේ අසපුවේ නතර වෙති.

එකල පැවති අඩි පාර හෝ කරත්ත පාර දැන් දක්නට හැකි පාරවල් මෙන් නොවේ. ඒවා කානු හෑරී වැසි ජලයෙන් කැඩී ගිය වල ගොඩවල් වේ. ඈත අතීතයේ සිට එහි පුරාණ මුතුන් මිත්තෝ ගමන් ගත් පාරවල් වේ. ගමේ මිනිස්සු මේවා සොයා ගනිති. බොහො කලාතුරකින් කිසිවෙක් මේ පාරේ ගමන් ගනිත්. එබැවින් ගස් ගුම්බයන්ගෙන් වැසී ගොස් පාර සොයා ගැනීම දුෂ්කරය. යමෙක් මෙ අඩවියේ අඩිපාර ජාලය නොදන්නේ නම් පාර වැරදී භයානක විපතට පත්වේ. අතු බෙදී ඇති අඩිපාර වන සතුන් ගමනා ගමනය කර සෑදී ඇතොත් ගම්මා-නයක් සොයා ගැනීමට නොහැකිව අතරමං වේ. ආහාර, වර්ෂාව, රාත්‍රිය, වන

සතුන්ගෙන් වන බිය ආදිය නිසා ද අධික වෙහෙස නිසාද ජීවිතක්ෂයට පැමිණේ. සැතපුම් 12-15 අතර කුඩා ගම්මානයක් රෑ බෝ වීමට පෙර සොයා ගත යුතුය. කලාතුරකින් දඬයම්කාරයෙක් මුණ ගැසේ. එවිට පාර අසා දැන ගත හැකිය.

## රළු පරුෂ හික්මවීම් ක්‍රම

ධර්ම රසයෙන් පිනාගිය ධූතාංග කර්මස්ථාන භික්ෂුව ජීවිත පරිත්‍යාග යෙන් නොයෙක් කම් කටොලු ඉවසයි. ජීවිත පරදුවට තබා ඝන වනාන්තරයේ ජීවත් වෙති. අති දක්ෂ ගුරුවරයක් වූ ආචාර්ය මන් සෙයා ගැනීම දුර්වල දෙයකි. සතුටින් වත පිළිවෙත් පිරීමට යොමු කිරීම පහසු නොවේ. උන්වහන්සේ හමුවන හැම මොහොතකදීම කුඩා දරුවන් දෙමාපියන් දැකීමේදී මෙන් හැඟීම් උත්තේජනය වේ. සතුටින් පිනා යති. ඉන් නැගෙන ශ්‍රද්ධාව ගෞරවය අසීමිතය. සියලු දෙනාගේ ජීවිත ආරක්ෂාව උන්වහන්සේ වෙත පැවරී ඇත. එමෙන්ම උන්වහන්සේට ජීවිත පරිත්‍යාග කිරීමට වුවද සතුටකි. ඈත දුර පළාත්වල වාසය කරන විට වුවද මෙවැනි සැබැඳියාවක් ඇත. කෙතරම් දුක් වින්දත් කෙතරම් රළු පරුෂ දේ ඇසුවත් කම් නැත. තම ගුරු භක්තිය නොසැලේ. අඟ හිඟකම් කෙළවරක් නැත. එහෙත් හදවත ධර්මයෙන් පිරී ඇත. අන් සියලුම දෙයට වඩා ධර්මය අවශ්‍ය වේ. සමහර රාත්‍රිය තුළ නිදා ගන්නේ එළිවන තුරු කඩා හැලෙන ධාරාණිපාත වැස්සේය. කුරුළු පැටව් මෙන් ගත සිත වෙව්ලති. එහෙත් බලවත් වීර්යයයෙන් අධිෂ්ඨානය ධර්මය අවබෝධ කිරීමය.

ධූතාංග භික්ෂූන් කැලෑවේ ජීවත් වන විට ලැබෙන අත්දැකීම් ගැන ඇසීම පවා විස්මය ගෙන දේ. වන සතුන් මෙන් මහත් දුකින් කල් ගෙවති. ආවරණයක් නොමැතිව බිම නිදා ගනිති. සිතට සැප පහසුවක් දෙන්නේම නැත. තද දුක් නිසා සිත සැප ප්‍රාර්ථනා නොකරයි. මෙය ස්ව කැමැත්තෙන්ම කරන වීර්යයකි. තමන්ට විඳින්නට හැකි ප්‍රමාණය කුමක්දැයි තමන් විසින්ම සොයා ගනී. දින ගණනක් නොනිඳා සිටීම, ආහාර නොගැනීම, දින ගණනක් සක්මනේ සිටීම, වාඩි වී සමාධියෙන් සිටීම, රෑ දවල් නොකඩවා එකම ඉරියව්වෙන් සිටීම, කොටින්ගෙ ” ගමන් මාර්ගයේ වාඩි වී සමාධිගත වීම, දින ගණන් සොහොන් භූමියේ රාත්‍රිය ගත කිරීම, එදිනම ආදාහනය කළ මළ මිනියක් දෙස බලා සිටීම, මහ කඳු බෑවුම් වල භාවනා කිරීම, රාත්‍රියේ වහ වනාන්තරයේ සොයමින් ගොස් භයංකර පෙ- දෙසක භාවනා කිරීම, කොටින්ගෙන් ගහණ වූ කැලෑ රොදවල ගස් යට භාවනා කිරීම ආදිය වේ. මේ නිසා සිත භයින් ත්‍රස්ත වී එක්තැන් වී, සමාධි ගත වේ. මේ සියල්ල අත්හදා බැලුවේ එකම අරමුණකිනි. සිතට දුක් දී සිත මෙල්ල කිරීමටය. දුකින් භයින් ත්‍රස්ත වූ සිත ඉබාගාතේ අරමුණු සොයමින් නොයයි.

යම් භික්ෂුවක් මේ යම්කිසි පුහුණු වීමේ ක්‍රම එකක් හෝ ඊට වැඩි ගණනක්

භාවිතා කර තම අවශ්‍ය චිත්ත සමාධිය ඇති කර ගනී ද ඒ අතර වටිනා පාඩම් ඉගෙන ගනී. ඒ නිසා ධූතාංග භික්ෂූහු මෙවනි රූක්ෂ ප්‍රතිපත්ති අනුගමනය කරති. ආචාර්යය මන් වුවද මෙවැනි ප්‍රතිපත්තියෙහි යෙදී තම අනුගාමිකයින්ට එය පුරුදු කළහ. තමන් දක්ෂ ලෙස තම සිත හික්මවා ගන්නා ක්‍රමය පැහැදිලි කළහ. මෙසේ ශක්තිමත් වූ සිත බොළඳ දේ නිසා නොසැලේ. අතීතයේ මෙවැනි රූක්ෂ ප්‍රතිපත්ති අනුගමනය කර ඇත. එහෙත් මේ ක්‍රම මෑතකදී අත්හරින ලදී. නමුත් ඒවා අද වන තුරුත් ධූතාංග භික්ෂූන් අනුගමනය කරති. ශරීරයට දැඩි දුක් දීම මෙහි අභිප්‍රාය වුවද චේතනාව ඉතා පිරිසිදු බැවින් ධර්ම මාර්ගයේ සිත හසුරුවයි. මෙවැනි පුහුණුවක් සාර්ථක වීමට නම් සිතට බලහත්කාරයෙන් තර්ජන වර්ජන කිරීමට අවශ්‍ය වේ.

අපි විඳි දුක් ගැන සළකා බලන විට ඉන් ඇතිවන විපාක හා සංසන්දනය කළ නොහැකිය. ඉන් ඉතා එලදායි විපාක ලැබේ. ශීලය, ඉවසීම ලද දෙයින් සතුටු වීම, විනය ආදී ප්‍රබල අඩිතාලමක් මත සමාධිය ගොඩ නැගේ. මෙම ගති ගුණ මිනිසා ඉතා අගය කරනවා. එම ගතිගුණ රැක ගැනීම, එමෙන්ම දුෂ්කර බැවින් සෑම මොහොතේම සති පඤ්ඤාවෙන් කල් ගෙවති. වැඩකට නැති දුර්වර්ණ, දූෂිත දේ මෙසේ ආරක්ෂා කිරීමට අවශ්‍ය නොවේ. පුද්ගලයාගේ වටිනාකම රඳා පවතින්නේ හෘද ශාක්ෂියට අනුව යුතුකම් කරමින් තම චරිත වර්ධනය සිදු කිරීමෙනි. ඊට බොහෝ වෙහෙස විය යුතුය. මේ වටිනා ගුණ ධර්ම සපිරීම නිසා අපි දැනුත් අනාගතයේත් සතුට ලබමු. ධූතාංග භික්ෂූන් අපි අගය කරන්නේ උන්වහන්සේලාගේ අප්‍රතිහත ධෛර්‍යය තුළින් තම පිළිවෙත් රකින බැවිනි. ඒ තුළින් සිතේ ධර්මය ප්‍රතිෂ්ඨාපනය කෙරේ.

ධර්මය හොඳාකාර රකින තාක් කල් බුද්ධ ශාසනය පවතී. ශාසනයේ ප්‍රතිවිපාක ලැබෙන්නේ ඒ අනුව හැසිරෙන අයට පමණි. එවිට විශිෂ්ට ප්‍රතිඵල ලැබේ. මෙය මොහොතින් මොහොත විඳිය හැකි විපාක වේ. බුදුරජාණන් වහන්සේ මේ සත්‍යාවබෝධය ලබා ලෝකයාට එම පණිවිඩය දුන් සේක. මේ සත්‍ය ගවේෂණය කරන්නෝ බුදු දහම පිළිපදිති. එහෙත් ඕනෑවට එපාවට, මෝඩ අදක්ෂ භාවයෙන් බුදු දහම පිළිපදින විට ශාසනයේ බලය හීන වේ. එවැනි අය අබෞද්ධයන්ගෙ ” පවා ගැරහීමට පත්වේ. සැබෑ සත්‍යය මේ චතුරාර්ය සත්‍යයයි. එම මුළු විශ- ”වයම එකහෙළා පිළිගත යුතු සත්‍යයකි. බුදු කෙනෙකුගේ අතිපාරිශුද්ධ මහා බලවත් සිතකින් දේශනා කළ සත්‍යයන් බැවිනි. යමෙක් තුළ මේ සත්‍යය පිළිබඳ උනන්දුවක් නැත්නම් හෝ අවබෝධයක් නැත්නම් ඔහු ලෝකයා ඉදිරියේ නිමක් නැති වාද භේද, කෙළෙස් දාහයට, හසුවන්නේ ප්‍රාණ ඇප කරුවෙකු ලෙසිනි. මෙම යටට කිඳා බැස ඇති කෙළෙස් මුල් ජාලාව ශාසනය විසින් මුලින් සිඳ දමා ඇති බවට සාක්ෂි වශයෙන් බුදුවරුන් වහන්සේලා සහ රහතන් වහන්සේලා පෙනී සිටිති. මා තාවකාලික මාතෘකාවෙන් පිට පනින බැවින් මට සමාවුව මැනව.

ඉන් ඔප්පු වන්නේ මා තවමත් නීති ගරුක නැති බවකි. ඊට හේතුව උද්ධච්ච නිසා විසිරී ගිය සහජ ගති පැවතුම් වේ. රළු පරුෂ ධූතාංග පුහුණු වීම් ගැන කථා කිරීම මගේ චරිත ස්වභාවයක් වී ඇත. ඒ පුහුණුව එතරම් ඇට, මස් ලේ වලට විනිවිද ගොස් ඇත. අවංක මේ ප්‍රතිපත්ති රැකීමෙන් ඒකාන්ත ප්‍රතිඵල ලැබේ. සිතේ ඇති දඩබ්බර, නැහැදිච්ච, ආඩම්බර, ගතිය ටිකින් ටික දුරුවේ. ශාරීරික ශක්තිය ඇතිවිට මෙම ගති තව තවත් ශක්තිමත් වී පැන නගී. කෑම අඩු කිරීම, නිරාහාර වීම, නිදි වැරීම, සක්මන, හිඳිමින් බොහෝ වේලා භාවනා කිරීම නිසා සිත මෙල්ල වී ධර්ම මාර්ගයේ යාමට එකඟ වේ. අන් ක්‍රම යෝග්‍ය වන්නේ කොටින්ට භය, හොල්මන් වලට භය ගැන තම සිතත් සමඟ සටන් වැදී ඒ බිය පරාජය කිරීමටය. භය මේ ආකාරයෙන් අඩු වී නැති වී යයි. එවිට සිතේ බල පරාක්‍රමය තමන්ටම අවබෝධ වේ. තමන්ට කර කියා ගන්ට බැරි විට අමුතු ශක්තියක් සිතේ හට ගනී. උදා: ශරීරයේ ඉවසන්ට බැරි වේදනාවක් හටගත් විට එය අභිබවා යාමට සිත වීර්‍ය්‍ය ගනී. සිත යම්කිසි තීරණාත්මක අභියෝග යකට මුහුණ දුන් විට තම සති, පඤ්ඤා තියුණු වේ. මාරාන්තික සටනකට එළඹුන විට කළ නොහැකි දෙයක් නැත. මේ වනාහි සිතේ ස්වභාවයයි. මෙනි කිසි අභියෝගයකට මුහුණ නොදී සිටින විට සිතේ සම්පූර්ණ ශක්තිය පැන නැගීමට අවස්ථාවක් නැත.

සති, පඤ්ඤා වර්ධනය කිරීමට ඉතාම සුදුසු වන්නේ තමන්ට ඇති යම් ප්‍රශ්නයක් විසඳීමට යොදා ගන්නා ආත්ම පරිත්‍යාගයයි. එය ඉෂ්ට කර ගැනීමට තමන්ට සුදුසු අත්හදා බැලීම් වලින් එකක් තෝරා ගත යුතුයි. එය ක්‍රියාත්මක වන විට තම සිත නිහඬ වේ. මේ හැම ක්‍රමයකින්ම විස්මය ජනක ඵල විපාක ලැබේ. හොල්මන් වලට භය පුද්ගලයා මිනී කනත්තක රාත්‍රිය ගත කළ විට ඒ බිය තුරන් වේ. කොටින්ට ඇති බිය දුරු කිරීමට රාත්‍රිය කාලය කොටින්ගෙන් ගහන වූ පරිසරයක විසීමට සිතට බල කළ යුතුය. ආහාරවලට ඇති කෑදරකම නැති කිරීමට ආහාර ගැනීම අඩු කිරීමට හෝ නිරාහාරව සිටීමට බල කළ යුතුය.

අපි සැවොම හොඳ ආහාර රුචි කරමු. හොඳ ආහාර කෑමෙන් අපි සතුටට පත්වේයැයි විශ්වාස කරමු. ප්‍රශ්නය වන්නේ තණ්හාවේ අතෘප්තිකර භාවයයි. කෙතරම් ලැබුණත් තව තවත් බලාපොරොත්තුවේ. කෙතරම් අපහසු වුවත් තම අතෘප්තිකර තණ්හාව සෑහීමකට පත් කිරීමට වෑයම් කරන බව නොතේරේ. ධර්මයේ හැසිරෙන අය තම අතෘප්තිකර ආශාව කුමක්දැයි අවබෝධ කර එය යටත් කිරීමට තදබල තීරණවලට එළඹිය යුතුවේ. ධූතාංග භික්ෂූන් මෙය අවබෝධ කර ගත් විට තමාම තමන්ට විනය පනවා ගනිති. තම කර්කශ පැවැත්ම තුළින් ඒ ආසාව යටපත් කරති. යම් ආහාරයක් ගැන වැඩිපුර කැමැත්තක් ඇතොත් තමාට දඬුවමක් වශයෙන් ඒ ආහාරය වර්ජනය කරයි. ඒ වෙනුවට තමන් නොකැමති ආහාර වළඳියි. ඔහුට ආහාර වැඩිපුර ගන්ට සිතුන විට ආහාර

ප්‍රමාණය අඩු කරයි. කෙතරම් හොඳ ආහාර වර්ග තිබුණත් සියල්ල ප්‍රතික්ෂේප කර බත් පමණක් වළඳති. ශක්තිය ගෙන දෙන ආහාර නිසා ශාරීරික ක්‍රියාකාරිත්වය මනසේ ක්‍රියාකාරිත්වය යටපත් කරයි. එවිට භාවනා කිරීමට නොහැකි වේ. එවිට තමා වීර්‍ය්‍ය වැඩීමේ ප්‍රතිඵලය හීන වේ. මේ ගැටළුව උද්ගත වූ විට දැඩි මුරණ්ඩු භාවයකින් ඒ තණ්හාව වර්ධනය වීමට ඉඩ නොදේ. දක්ෂ ගුරුවරයෙකුගේ ආභාෂය ලත් භික්ෂුව තමාගේ අගුණ දුර්වලකම් මෙසේ යටපත් කරයි. තමාගෙ ‍ පුරුදු ආසාවන් කපා හරී.

මෙසේ ආහාර පිළිබඳ සුපරික්ෂාකාරීව ප්‍රත්‍යවේක්ෂා කරණ ධුතාංග භික්ෂුව තම තණ්හාවට පහර ගහන්නාක් මෙන්ම නින්ද ගැනද සුපරික්ෂාකාරී වෙයි. නින්දට යන්නේ අසවල් වේලාවට පිබිදෙන බව සිතාගෙනය. කැමති වෙලාවට නින්දට ගොස් කැමති වෙලාවට පිබිදීමට පුරුද්දක් නැත. ධර්මයට විරුද්ධ යමක් කිරීමෙන් වළකියි. විනය නීති රැකීමට වඩා තම සිතේ පවතින ධර්මතාවය ගැන වඩාත් අවධාරණය කෙරේ. තම සිතේ ධර්මය නිතරම පවතී. එය පසුබැසීමක් නැත. මෙසේ තම සිත ආරක්ෂා කිරීම ඉතාම අසීරු කරුණකි. ඇත්තෙන්ම එවැනි දුෂ්කර අන් දෙයක් විශ්වයේ නැත.

ලෝක සම්මතයට යටත් වී සිටින විට කෙළෙස් වර්ධනය වීමට ඉඩ ඇත. යම්කිසි ප්‍රමාද දෝෂයක් නිසා කෙළෙස් උත්සන්න වේ. එවිට එය පාලනය කිරීමට නොහැකිය. මොහොතකින් එය සිත තුළට රිංගා ගත් පසු වර්ධනය වීමේ වේගය නිර්ණය කළ නොහැකිය. ඉන් තමාට විපතක් වන බව නිසැකවම පිළිගත යුතුය. ඇසිපිය ගසන කාලයක් තුළ ලක්ෂ සංඛ්‍යාත කෙළෙස් වර්ධනය වේ. එය පාලනය කිරීමට නොහැකි බැවින් අපි අසරණ වෙමු. ලිංගික ආස්වාද මෙවැනි පාලනය කිරීමට නොහැකිව නැගී එන්නා වූ කෙළෙස් වන අතර එයින් මිදීමට ද නොහැකි වේ. ලිංගික ආස්වාදයට ඇති ආශාව විනාශකාරී, වරදකාරී ගතියකින් සිතට බලපායි. මෙතරම් ලැජ්ජා භය සුන් වී යන අන් කිසි කෙළෙස් නොමැති තරම්ය. ලෝකයේ සියලු දෙනාම කැමති බැවින් මේ කෙළෙස් ශක්තිමත් වී, මහත් සේ විනාශකාරී වීම පමණක් නොව සීලාචාර ගති බිඳ දමයි. ධර්මය රකින අය ගැන පමණක් මෙම කෙළෙස් තරමක බියක් දක්වයි. වෙන කිසි දෙයකට වඩා භය ඇතිවන්නේ බුදුවරු සහ රහතුන් ඉදිරියේය. මේ ආර්යය පුද්ගලයෝ සම්පූර්ණයෙන්ම එම කෙළෙස් රඟපාන සෙල්ලම්පිටිය විනාශ කර ඇති බැවින් උන්වහන්සේලාගේ සිතට පිවිසීමට නොහැකිය. සිත අල්ලා ගැනීමට කුරුමානමක් නැත. එහෙත් අන් සියලු දෙනාම එම බලයට යටත් කර මහත් දුක් කරදර ව්‍යසනයන්ට පාත්‍ර කරති.

ධුතාංග භික්ෂූන් මෙම කෙළෙස් වලින් ඇතිවන පීඩාකාරී ස්වභාවය හඳුනා ගනිත්. එබැවින් කෙළෙස් සිඳ බිඳ දැමීමට මෙතරම් දැඩි, රළු ප්‍රතිපත්ති අනුග

මනය කරති. භික්ෂූන් වහන්සේලා හිස මුඩු කර චීවර දරාගත් අය වුවද කෙළෙස් වලින් නිදහස් වීමක් නැත. කහ චීවරය යනු මාර බලය බිඳ දමන ජයග්‍රාහී සංකේතයකි. නමුත් කෙළෙස් වලින් සිත මැඩගත් කල්හි සිවුරු හැර යාමටද, කෙළෙස් සමග සටන අත්හැරීමටද එම භික්ෂුවගේ වයස හෝ ජ්‍යෙෂ්ටත්වය නොසළකා අන්ධ භූත ලෙස මෝහයෙන් නිවන වසාලීමටද පෙළඹේ. මේ කෙළෙස්වල ස්වභාවයයි. මේ බව වටහා ගත් ධූතාංග භික්ෂුව බලහත්කාරයෙන්ම කෙළෙස් දුරු කිරීමට නොයෙක් ක්‍රම සහ විධි උපයෝගී කර ගනිත්. නොයෙක් දුක් කම්කටොලු සටනෙහි යෙදෙත්. එසේ නොකරණ විට කෙළෙස් ජයගෙන භික්ෂුවට හා චීවරයට නින්දා අපහාස පමුණුවා සිනාසෙත්. ඊටත් වඩා විනාශකාරී වන්නේ ''සංඝරත්නයට'' කරණ නිග්‍රහයයි. මෙවැනි දුෂ්කර ප්‍රතිපත්ති තුළින් තම චීවරය හා ධර්මය ආරක්ෂා වේ. සංසාරික දුක් ඉක්මවා යාමට ධර්මය පිළිබඳ ශ්‍රද්ධා බුද්ධිය ඇති කරගෙන කිසියම් දිනයක තමා ජයග්‍රාහී වන බව සිතා ධූතාංග භික්ෂුව තම අධිෂ්ඨාන අනුව සිත ශක්තිමත් කර ගනිත්. බුදු දහමින් පමණක් මෙම මාර්ගය සෙවිය යුතුය. එය එකම මාර්ගය වේ. එය විශේෂ දැනුමක් හා උනන්දුවක් ඇති අයට පමණක් සීමාවේ. එය වෙන කිසි පහසු ක්‍රමයකින් කළ හැකි දෙයක් ද නොවේ. වෙනත් මාර්ග ඇතොත් ඒවා බාධක අවහිර වලින් ගහන බැවින් එහි ජයග්‍රහණයක් නොමැත. එම මාර්ගයේ යමෙක් ගමන් ගත් විට නිසැකයෙන්ම මහත් පීඩාවට පත්වී තමා තුළ ඇති ශ්‍රද්ධාව හීන වී මාර්ගය පිළිබඳ සැක ඇති වී මෙය නොකළ හැකි දෙයක් යැයි අත්හරී. එබැවින් වෙනත් මාර්ග තුළින් සම්පූර්ණ විමුක්තිය නොලැබේ.

මෙවැනි උතුම් ආචාර්යවරයෙක් වීමට කලින් ආචාර්ය මන් ප්‍රතිපත්ති දෙයක් වැඩීමේදී සුසාන භූමිය අදාළ නැති අනවශ්‍ය දෙයක් ලෙස සිතූහ. තමන් අවසාන හුස්ම හෙළු පසු කොතැනක ආදාහනය කළත් කම් නැත. ධර්මය වෙනුවෙන් කොතැනදී මළත් කම් නැත. පසුව තම අනුගාමිකයන්ට කරුණු ඉදිරිපත් කරණ විට තමන්ගේ සිත දියුණු තියුණු කරගත් බවක් අතීන්ද්‍රියන්ගේ ක්‍රියාකාරිත්වය තුළින් අධිමානුෂික කරුණු අවබෝධ කළ බවත් පැහැදිලි විය. ඒ තුළින් අදහස් ප්‍රකාශ කරන විට සියල්ලන්ගේ සිත් උත්තේජනය වී ක්‍රියාත්මක කිරීමට උනන්දු කරවයි. කෙළෙස් වල අති මායාකාරී රැවටීම උන්වහන්සේගේ මුවහත් ප්‍රඥාවෙන් අරමුණු කර තම ශිෂ්‍යයන්ට පහදා දුන්විට එම කෙළෙස් මුලින් උපුටා දැමීමට හැකිවේ. මේ ආකාරයෙන් එම ශිෂ්‍ය පිරිස තම කෙළෙස් ජයග්‍රහණය කරමින් දුක් ඉක්මවති. සසර ඉපදීම හා මරණය ඉක්මවති. සසර තරණය කරති. සසර යනු එක් උපතක් තවත් උපතකට පරිවර්තනය වීමකි. එහෙත් හද තුළ පවතින දුක එකසේ පවතී. කෙතරම් වාරයක් ඉපදුනත් හදවතේ දුක නැතිවීමක් නැත. අළුත් ජීවිතය යනු නැවතත් දුක් ගෙන දෙන උපකරණයකි. ඉන් නැවත නැවතත් විනාශයට පත්වීමකි. කිසියම් භවයක ඉපදීමට බලාපොරොත්තු නොවිය යුතුයි.

එය හිරකරුවෙක් එක් සිර ගෙයක සිට තවත් සිරගෙයකට මාරු වීමකි. ඔහු තවමත් සිර භාරයේ සිටියි. එහි ඇති නිදහසක් නැත. නුවණැත්තෝ මෙම උප්පත්ති මරණ දෙක නිසා සංසාරයේ භයානක බව දනිති. හදවතේ සිතුවිලි එක් ගිනිගෙන දැවෙන ගෙයකින් පිට වී තවත් ගිනිගෙන දැවෙන ගෙයකට පිවිසීමකි. කොතැනක ඉපදුනත් මේ තත්ත්වය මෙසේ මැයි. මේ ආදී දේශන ආචාර්ය මන් නිතිපතා තම ධූතාංග භික්ෂූන්ට දෙමින් හික්මවති. සමහරවිට මේ කියවන ඔබ මෙවැනි දේශනා වලට කැමති වෙනාව ඇත.

උපොසථ දිනයන්හි නුදුරින් සිටින භික්ෂූන් වහන්සේලා 40-50 ක් පමණ පැමිණි විට ඒ අයට ධර්මානුශාසනා කෙරෙති. ආචාර්ය මන් කරන මේ දේශන එහි නේවාසිකව වැඩ සිටින භික්ෂූන්ට කරණ දේශන වලට වඩා බෙහෙවින් වෙනස් වේ. එහි සාරය ඉතා වැදගත් වුවද ධූතාංග භික්ෂූන්ට දෙන දේශනා සිත විනිවිද ගොස් කෙළෙස් සුනු විසුණු වෙති. සිත කුසලතාවයෙන් සමාධි ගත වී තමා ඉන්නේ කොහේදැයි දන්නේ නැත. එම ප්‍රත්‍යක්ෂය කෙතරම් සුවදායක දැයි වචනයෙන් කිය නොහැකිය. දින ගණනාවක් යන තුරු සිතේ කෙළෙස් නොනගී. එය උන්වහන්සේ අභියෝගයට මුහුණ දීමකි. එහෙත් ටික දිනකට පසු නැවතත් කෙළෙස් නමැති නාගයා පෙනය පුප්පා සිත වසඟ කරයි. ඒ වන විට ඊළඟ දේශනයට සවන් දීමට ඇත. නැවතත් කෙළෙස් යටපත් වී භික්ෂූන් වහන්සේලා කීප දිනක සහනයට පත්වේ.

සියලුම ධූතාංග භික්ෂූහු ධර්මයේ හැසිරීමට මහත් වෙහෙස දරත්. සසර දුක් තරණය කිරීම එකම අරමුණයි. කෙළෙස් උදුරා දැමීම තනි තනිවම කළ යුතුයි. එබැවින් ගුරු උපදේශනය ඉතා වැදගත් වේ. තමාට විසඳිය නොහැකි මානසික ශාරීරික ගැටළුවක් පැමිණි විට යුහුසුළුව තම ආචාර්යවරයා හමු වී සියලු තතු ප්‍රකාශ කරත්. දක්ෂ ආචාර්යවරයා එම ගැටළුවට හේතු සාධක සොයා දී ඉන් මතුවන ප්‍රශ්න, සැක, බය, දුක, නිවාරණය කරයි. සමහරවිට උන්වහන්සේගේ දේශනය තුළින් ඉබේම ප්‍රශ්නයට පිළිතුරු ලැබේ. ඉන්පසු තම භාවනා බාධක මඟ හැරී යයි.

මෙසේ භාවනා කරන යෝගී භික්ෂූන්ට තම තීක්ෂණ බුද්ධියෙන් තමාගෙ දියුණුව පිළිබඳවද අන් අයගේ දියුණුව හා ආචාර්වරයාගේ දියුණුව පිළිබඳ වැටහේ. මේ නිසා අන්‍යෝන්‍ය විශ්වාසය, සබඳතාවය තහවුරු වේ. යම් භික්ෂුවක් තමාගේ භාවනා අත්දැකීම් ගැන ප්‍රකාශ කරන විට ඔහුගේ ගමන් මාර්ග යේ සැතපුම් කණු පසුකර ඇති තතු වැටහේ. ඉන් උන්වහන්සේගේ භාවනා දියුණුව නිර්ණය කළ හැකිය. ගුරුවරයාට තම භාවනා අත්දැකීම් කියන විටද අසන ප්‍රශ්න තුළින්ද, ඔහුගේ දියුණුවේ මට්ටම හෙළි වේ. ගුරුවරයාගේ ක්ෂණික පිළිතුරු විසඳුම් තුළින් ඒ ගුරුවරයාගේ දියුණුවේ මට්ටම හෙළිවේ. ගුරුවරයා

තුළ එම අත්දැකීම් ඇතිවිට ඉන් ඉදිරියට යාමට උපදෙස් දෙයි. යම් ගැටළුවක ඇති හේතු සාධක ඉතා දක්ෂ අන්දමින් පෙන්වා දුන් විට ශිෂ්‍යයා එය පිළිගනී. සමහර විට යෝගීන් වැරදි නිගමනවලට බැස ගනිත්. තමා සියලු කෙළෙසුන් නසා උතුම් නිවන් අවබෝධය ලබා ඇතැයි සිතති. එය වැරදි නම් ගුරුවයා ඊට හේතු සාධක පෙන්වා දෙයි. එවිට තමාට වැරදුන කාරණය වැටහී ඉන් මිදී නැවත භාවනාව අරඹයි.

ධුතාංග භික්ෂූහු තම තමන්ගේ භාවනා අත්දැකීම් සාකච්ඡා කරණ විට තමන් පැමිණී සිටින තත්ත්වය ගැන සැක දුරු කර ගනිති. එය තමාට ප්‍රත්‍යක්ෂ වූ අවබෝධයකි. ගුරුවරයා සිට නවකයා දක්වා මෙසේ තමාගේ භාවනා දියුණුව ගැන සැක දුරු කර ගනිති. මෙය තම සහජ බුද්ධියෙන් තේරුම් කර ගන්නේ කෙසේදැයි මම නොදනිමි. එම දක්ෂතාවය මම ඔබ වෙත පවරමි. එය විශේෂ දක්ෂතාවයක් බැවින් සුවිශේෂ කුසලතාවයන්ගෙන් ලැබිය යුතුය.

ආචාර්ය මන් සමඟ නිරන්තරයෙන් සාකච්ඡා කිරීම හේතුවෙන් ධුතාංග භික්ෂූන් වහන්සේ සමඟ කිට්ටු සබඳතාවයක් ඇති කර ගනිති. උන්වහන්සේ කෙරෙහි තිබූ අසීමිත ගෞරවය හා විශ්වාසය නිසා තම ජීවිතය උන්වහන්සේට පිරිනැමූහ. මෙම අචල ශ්‍රද්ධාව නිසා උන්වහන්සේගේ වචනය හිස් මුදුනින් පිළිගත්හ. ඊට හේතුව උන්වහන්සේ නිතරම සත්‍යයෙන් සත්‍යය ගලපා කථා කිරීමයි. පුද්ගලික මතය හෝ නිගමනය හෝ අනුමානය නොදක්වති.

මේ ලියන මමද තරමක පුද්ගලික මතධාරි කෙනෙක් වෙමි. අන් අයගේ විනිශ්චයට නොනැමෙමි. මේ නිසා ආචාර්ය මන් සමඟ වුවද වාද කරමි. තර්ක කරමි. මම උන්වහන්සේගේ විවාදපන්න කරදරකාරී එක්තරා ශිෂ්‍යයෙක් වෙමි. සමහරවිට මගේ වාදය උග්‍ර වී මා උන්වහන්සේගේ ගෝලයෙක් බවත් උන්වහන්-සේගේ අනුශාසනා ලැබිය යුතු කෙනෙක් බවත් අමතක වේ. මා උන්වහන්සේගෙ " ගුරුවරයකේ නොවන බව අමතක වේ. මගේ මතයේ එල්බෙමින් මාන ස්ථ ම්භයෙන් නිර්භය වෙමි. මේ හැමවිටම මා බැට කාගෙන පරාජයට පත්වෙමි. එහි වැදගත්ම වූයේ සත්‍යය ගැබ් වී ඇත්තේ මගේ මතය තුළද නැත්නම් ගුරු-වරයාගේ ප්‍රඥාව තුළදැයි මම හොඳාකාර අධ්‍යයනය කිරීමයි. මා වාද කරණ විට එය ඝෝෂා තරංගයක් වේ. මම ශබ්ද නගා වාදයට එළඹෙමි. සියලුම සත්‍යය ඇත්තේ උන්වහන්සේගේ පැත්තේ. මගේ මුලාව අහස උසට නැග ඇත. හැම විටම පරාජිත සටනකි. මම සිහිසන් වූ විට බොහෝ වේලා බොහෝ ගැඹුරින් කල්පනා කරමි. උන්වහන්සේ කී දේ ඒකාන්ත සත්‍යය බව මට වැටහී ගෞරව නමස්කාරයෙන් එය පිළිගනිමි. ඒ සමඟම මගේ වැරදි දෘෂ්ටිය බිඳ වැටේ. සමහර විට උන්වහන්සේගේ බුද්ධිමත් තර්ක හා එහි යුක්ති සහගත බව මට නොතේරේ. එබැවින් තවමත් තර්ක අත් නොහරිමින් වෙනත් අවස්ථාවක් යොදාගෙන විවාදය

නැවත කරගෙන යමි. එහෙත් උන්වහන්සේගේ බුද්ධිමත් විචාරීම තුළින් මම බැට කා ගෙන පසු බසිමි. මගේ මතයේ නොයෙක් ගැටළු ඇත. එවිට මම නිහඬව සතුටට පත්වෙමි. සිනාසෙමි. ධර්මයේ හාස්කම හා බලය මා කුල්මත් කරයි.

ආචාර්ය මන් මගේ තර්කය, නිගමනය, මතය සම්පූර්ණයෙන්ම වැරදි බව දැන දැනත් මට බැණ වදින්නේ නැත. එය වෙනස් කරන්ට යැයි නොකියාම සිනහ මුසු මුහුණින් මේ අණුවන මෝඩයා ගැන අනුකම්පා කරත්ද ? මේ මාරා-වේක්ෂයකින් කෑ ගසන පුද්ගලයාගේ ආත්ම විශ්වාසය ගැන විස්මිතයෙන් බලා සිටිත්ද ? එය මට තවමත් සැකයකි මම බොහොම හොඳ කෙනෙක් නොවන බව මම පිළිගතිමි. තවමත් ජ්‍යෙෂ්ට ආචාර්යවරු සමඟ නිර්ලජ්ජිව වාදයට එළඹෙමි. එහෙත් එහි ලාභය සුළු පටු නොවේ. බොහෝ අස්වාභාවික පාඩම් මම ඉගෙන ගතිමි. මේ ක්‍රමය මම තවමත් අනුගමනය කරමින් වටිනා අධ්‍යයනයක් කරමි. මේ ජ්‍යෙෂ්ට භික්ෂූන් වහන්සේලා තුළ මගේ බලහත්කාර කමින් මතු කරන ප්‍රශ්න ගැන කිසියම් කළකිරීමක් දක්නට නැත. බොහෝ විට උන්වහන්සේලා විහිළුවකට මෙන් සිනාසෙති. කලාතුරකින් වයස්ගත වූ මුරණ්ඩු භික්ෂුවක් යම්කිසි විරෝධයක් පළ කරයි. සාමාන්‍යයෙන් මෙම ආචාර්යවරු සමඟ කිසිවෙක් වාදයට නොපැමිණෙති. එබැවින් අනිකුත් භික්ෂූන් වහන්සේලා මේ වාද විවාද ගැන විස්මයට පත්වෙති. සැක බිය ඇති කර ගනිති.

චියාං මයි හි ගත කළ කාලය තුළදී ආචාර්ය මන් මහත් වූ මග්ගඵල ප්‍රතිලාභයට පත්වුණි. උප්පත්ති මරණයෙන් සැදුම් ලත් ඝන වනාන්තරයක් වූ සසර තරණය කළහ. ඉන්පසු කාලය ගත කළේ යම් විශිෂ්ට හේතුවක් නිසා විය හැකිය. නබොන් රච්ඡසිමාහි දිගු කලක් වාසය කළහ. බොහෝ ගිහි පැවිදි පිරිස කාලයක් සිට මහත් වූ ශ්‍රද්ධා භක්තියෙන් ධර්මය අනුව ජීවත් වෙති. භාවනා දියුණු අය විශාල පිරිසක් සිටියහ. පසුව ඉන් සමහරෙක් උන්වහන්සේ කැටුව උදොන් තාහි සහ සකොන් නබොන් වෙත ගියහ. උන්වහන්සේගේ අපවත් වීම මෙහිදී සිදුවුණි. නබොන් රච්ඡසිමාහි ගිහි පැවිදි පිරිස භාවනා දියුණු කළහ. ඒ සමහර භික්ෂූන් දැන් ප්‍රසිද්ධ ආචාර්යවරු වී ඇත. උන්වහන්සේලා තුළ ධර්මය ස්ථිරව ප්‍රතිෂ්ඨාපනය වී ඇත. අද වන තුරුත් ගිහි පැවිදි පිරිසට භාවනා උපදෙස් දෙති. ගිහි යෝගී පිරිස ඒ අනුව යමින් දාන පාරමිතාව සපුරති. සීල පාරමිතා ආදී නොයෙක් ගුණ ධර්ම වර්ධනය කර ගනිති.

උන්වහන්සේ උදෝන් තානිවල ඊළඟ වස් කාලය ගත කළහ. එම ආරාමාධිපති ජඕ බුන් ධම්මජේදී භික්ෂුව විශාල භික්ෂු සමූහයකගේ නායකත්වය ඉසිලූහ. උන්වහන්සේගේ නොමඳ සහාය ආචාර්ය මන් හට ලැබුණි. ගම්වාසීන් ගෙන් දාන මාන පුද පූජා ලබමින් ඒ පිරිස් ධර්මයට හා භාවනාවට යොමු වූහ. ධම්මජේදී භික්ෂුව උන්වහන්සේගේ ගෝල නමකි. අසීමිත කරුණා, මෛත්‍රියකින්

ආචාර්ය මන් මේ සියලු කටයුතුවල නිරත වූහ.

පසුව ආචාර්ය මන් සකොන් නබොන් ගමට වැඩියහ. එහිදී වයස් ගත වූ සුදු චීවර දැරූ එක්තරා උපාසිකාවක් මුණ ගැසුණි. එතුමියට කුඩා උපාසිකා රාමයක් තිබුණි. එතුමියට අනුග්‍රහයක් වශයෙන් ආචාර්ය මන් බොහෝ කලක් එහි රැඳී සිටියහ. එතුමිය භාවනා දියුණු කර ඇත. ධර්මය හද තුළ අචල ශ්‍රද්ධාවෙන් පිහිටියේය. නිරන්තරයෙන්ම එතුමියට උන්වහන්සේගේ අවවාද අනුශාසනය ලැබුණි. එතුමිය වැනි භාවනා වැඩී ගිය අයෙක් දකින්නේ කලාතුරකින් යැයි ආචාර්ය මන් පැවසූහ.

මෙම ගම පිහිටියේ කඳු වලින් වට වූ නිම්නයකය. එහි කාලය පරිසරය ධුතාංග භික්ෂූන්ට ඉතා සුදුසු පරිසරයක් විය. මේ ගමේ තව සුදු වස්ත්‍රයෙන් සැරසුන ගිහි උපාසිකාවක් සිටියාය. ඈ වයස අවුරුදු 80ට ආසන්න විය. එතුමිය ද භාවනා දියුණුවක් ලැබ සිටියාය. මහත් ආයාසයෙන් එතුමිය තම නිවසේ සිට ආචාර්ය මන් හමුවීමට අවුත් භාවනා උපදෙස් ලැබුවාය. දෙතුන් වරක් මඟ නැවතී ගිමන් හැර හති දමමින් ඈ පැමිණෙයි. අපි සැවොම එතුමියට මහත් අනුකම්පාවක් දැක්වූයෙමු. ''ඔබට මෙතරම් වයස්ගත වී ඉතා අමාරුවෙන් මෙහි පැමිණෙන්නේ ඇයි ?'' එවිට එතුමිය නිර්භයව පිළිතුරු දෙයි. ආචාර්ය මන් ඉන්පසු භාවනාව ගැන විමසා ධර්ම කරුණු පහදා දෙති. එතුමියට පරචිත්ත විජානන ඥානය තිබුණි. ඒ තුළින් යමෙකුගේ සිතිවිලි හඳුනා ගනියි. ආචාර්ය මන් ගැන එතුමිය කථා කරන විට සියලු දෙනාම පහන් සංවේගයට පත්වුණි. ආචාර්‍යය මන් සිනාසෙති.

ඈ නිර්භයව ප්‍රකාශ කරයි. ''ඔබ වහන්සේ සසර තරණය කර ඇත. මම බොහෝ කලක් ඔබ වහන්සේගේ සිත දුටුවෙමි. එහි අසාමාන්‍ය පිරිසිදු බවක් ඇත. මෙතරම් පරතෙරට ගිය ඔබ වහන්සේ තව තවත් භාවනාවේ යෙදෙන්නේ ඇයි ?''

''මම මරණය තෙක් භාවනා කරමි. බුද්ධ ශ්‍රාවකයෝ තම අධිෂ්ඨානය අත් නොහරිත්.''

''ඔබ වහන්සේට තව අවබෝධ කටයුතු ධර්ම නැතිවිට කුමටද භාවනා කරන්නේ ? ඔබගේ සිතෙන් ආලෝක විහිදේ. මුළු ලෝකය පුරා මෙම ආලෝකය විහිදී යයි. ඔබට බොහෝ දේ දක්නා නුවණ ඇත. එහෙත් මගේ සිත එතරම් ප්‍රබල නැත. එබැවින් මම මෙහි පැමිණ උපදෙස් ලබා ගනිමි. ඔබ වහන්සේ තරම් සිත දියුණු කිරීමට මට උපකාර කරන්න.''

මෙම කතා සල්ලාපය අසා සිටි සියලු දෙනාම එතුමියගේ භාවනා දියුණුව

ගැන සතුටුවෙති. යම්කිසි ගැටළුවක් ඇතොත් තම හැරමිටියේ වාරුවෙන් අවුත් ඒ ගැටළුව නිරාකරණය කර ගනී. ආචාර්ය මන් එතුමියට මහත් ආදර ගෞරවයෙන් සළකති. තරුණ භික්ෂූන් වහන්සේලා මේ සාකච්ඡාවට කන්දීමට සැග වී සිටිති. එතරම් ප්‍රියජනක සාකච්ඡාවක් විය. ඊට හේතුව එම ප්‍රශ්න නගන්නේ තම භාවනා අත්දැකීම් තුළිනි. බොහෝ විට චතුරාර්යය සත්‍යය ගැනද, දිව්‍ය බ්‍රහ්ම ලෝක ගැනද ප්‍රශ්න කරති. ආචාර්ය මන් එම අත්දැකීම් සුදුසුදැයි බලා එය දියුණු කිරීමට උපදෙස් දෙයි. නැතහොත් මාර්ගය නුසුදුසුයැයි ප්‍රතික්ෂේප කරයි. ඉන්පසු නියම ක්‍රමය පහදා දෙත්.

එතුමියට තිබූ හැකියාව ගැන අන් භික්ෂූන් වහන්සේලා සතුටු වූ අතර බියපත් වූහ. පරසිත් දන්නා නුවණ තුළින් තමන්ගේ අභ්‍යන්තර කෙළෙස් දනිති. සිතුම් පැතුම් දනිති. රහස් දනිති. මෙය සෑහෙන අභියෝගයක් විය. එහෙත් එතුමිය නිතරම කීවේ කුඩා සාමණේර භික්ෂුව පටන් වැඩිහිටි භික්ෂූන් වහන්සේලාගේ ශරීරයෙන් දීප්තිමත් ආලෝක කිරණ විහිදෙන බවකි. රාත්‍රී අහසේ තරු බැබලෙන්නාක් මෙනි. එය ඉතා දුර්ලභ දර්ශනයකි. කිසිම කුඩා සාමණේර භික්ෂුවකගේ වුවද අඳුර, ශෝකී කිරණ නැත. ඒ සිත්වල පිරිසිදු භාවය නිසා මේ දීප්තිය විහිදී යයි. උන්වහන්සේලාට දෙන දාන මානාදියෙන් මහත් ඵල විපාක ලැබේ. ඒ භික්ෂූන් නිතරම මාර්ගඵල ලැබීම සඳහා වීර්යය වඩති. එක් විටෙක එතුමිය බ්‍රහ්ම ලෝකයට ගොස් තමන් දුටු පරිසරය විස්තර කළාය. ''එහි බොහෝ පැවිදි අය සිටිති. එහෙත් ගිහියන් කිසිවෙක් නැත.'' මීට හේතුව කුමක්දැයි ප්‍රශ්න කලාය.

''බ්‍රහ්ම ලෝකවල සිටින්නේ භාවනා දියුණු අනාගාමී ඵලයට පත් බ්‍රහ්ම රාජවරුය. අනාගාමී ඵලයට පත් භික්ෂුවක් අපවත් වූ විට බ්‍රහ්මතල වල උපදී. ගිහියන් අතර එසේ මගඵල ලාභීන් සිටින්නේ ඉතා ටික දෙනෙකි. ඔබට එතරම් අවශ්‍ය නම් ඇයි ඔබ ඒ ගැන ප්‍රශ්න නොකළේ ? එසේ අසා දැන ගන්නේ නැතිව දැන් මගෙන් අසයි.''

එතුමිය සිනාසුනාය. ''මට අමතක වුනා ඒ ගැන අසන්ට, මට ඒ කුතුහලය ඇති වුනේ පසු කාලයක. එබැවින් ඔබ වහන්සේගෙන් අසන්නට සිතුණා. මට මතක් වුනොත් ඊළඟ වතාවේ ගිය විට අසා දැන ගන්නෙමි.'' ආචාර්ය මන්ගේ පිළිතුරු නිතර අරමුණු දෙකක් ඉටු කරති. එනම් සත්‍යය විදහා පෑම සහ වැරදි සැක නිගමන ආදිය විසඳීම. පසුව උන්වහන්සේ බාහිර දේ ගවේෂණය කිරීම නවතා තම සිත කය පිළිබඳ ගවේෂණ කිරීමට උපදෙස් දුනි. බාහිර දේ ගැන සිත යොමු කිරීමෙන් තමන්ගේ වටිනා කාලය අපතේ යයි. මග්ග ඵල සඳහා ප්‍රඥාව දියුණු කළ යුතුය. එනම් සිත - කය පිළිබඳ අනිත්‍ය දුක්ඛ අනාත්ම

සෙවීමයි. එම උපදෙස් පරිදි එතුමිය භාවනා කළාය. ආචාර්ය මන් බොහෝ විට එතුමියගේ සාර්ථක භාවය ගැන භික්ෂූන්ට කියත් භික්ෂූන්ට පවා එතරම් ගැඹුරු අවබෝධයක් නොතිබුණි.

එතුමියගේ දියුණුව පිණිස ආචාර්ය මන් බන් නොං ෆීම් හි බොහෝ කාලයක් වැඩ සිටියහ. මේ ප්‍රදේශය අවට පළාත්වල භික්ෂූන්ට ගමනා ගමනය පහසු විය. පා ගමනින් යාමට හැකි විය. එහි නිසංසල පරිසරය භාවනාවට ඉතා යෝග්‍ය විය. කඳු, ගල් ගුහා, තැනිතලා, නිම්න වලින් යුත් රමණීය ප්‍රදේශයකි.

ආචාර්ය මන් මෙහි අවුරුදු 5ක් පමණ කාලයක් වැඩ සිටියහ. වයස අවුරුදු 75ක් පමණ බැවින් නොයෙක් රෝගාබාධ තිබුණි. මුළු දවසම ආරණ්‍යයේ වැඩ විසූහ. වෙනදා මෙන් සංචාරය නොකළහ. බොහෝ ශිෂ්‍යයෝ ඇවිත් උපදෙස් ලබා ගනිති. මේ පරිසරය ගම් ආශ්‍රිත බැවින් දෙවියන්ගේ පැමිණීම කලාතුරකිනි. විශේෂ පූජා දිනයන්හි දෙවියන් රැස් වූහ. එබැවින් තම ශිෂ්‍ය භික්ෂූන්ට හා ගිහි උපාසක උපාසිකාවන්ට උන්වහන්සේගේ උපදෙස් නොමඳව ලැබුණි.

## ධර්මය තුළින් රෝග චිකිත්සාව

බන් නොං ෆව් ආශ්‍රමය පිහිටියේ ඝන වනාන්තරයක් තුළය. මැලේරියා රෝගය එහි පැතිරී ගියේය. ආචාර්ය මන් ආගන්තුක භික්ෂූන්ට වර්ෂා කාලයේ එහි වාසය නොකර ඉක්මණින් පිට වී යන්ට කියති. වියලි කාලයේ විසීම අනතුරු නොවේ. මැලේරියා රෝගය වැළඳුන භික්ෂූන්ට ප්‍රතිකාරයක් නැත. බෙහෙත් වර්ග නැත. ඒ කාලයේ එම බෙහෙත් සොයා ගෙන නැත. එබැවින් රෝග චිකිත්සාවට ඇත්තේ ධර්මය පමණි. එනම් ශාරීරික දුක් වේදනා සියල්ල සති සමාධියෙන් ගවේෂණ්‍ය කිරීමය. මේ හැර දුක් නැති කර ගැනීමට ක්‍රමයක් නැත. සති සමාධි දියුණු වූ විට රෝගය ඉක්මණින් මර්දනය වේ.

මෙසේ රෝග මර්දනය කිරීමට සති සමාධි තුළින් හැකිවීම ඉතා විශාල ජයග්‍රහණයකි. එය ස්ථාවර පදනමකි. සියලු සැප වේදනා, දුක් වේදනා විදර්ශනාවට ලක්වේ. මරණයට මුහුණ දීමට බිය නොවේ. එවැනි කටුක වේදනා ඒ සති සමාධියෙන් යටපත් කිරීමට හැකියාව ඇති බැවිනි. දුක්ඛ සත්‍යය අවබෝධ වේ. එහි ස්වභාවය තේරුම් ගත හැකිය. ඒ පිළිබඳ බිය සැක පහ වේ. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, පටිච්ච සමුප්පන්න කරුණු තම බුද්ධියට ගෝචර වේ. ඕනෑම දුකක් ඉවසා දැරීමට හැකිවේ. තම සති පඤ්ඤා තුළින් දුක දකියි. දුකට හේතුව දකී. එබැවින් තම දුකට භාජනය වී දුක් විඳින්නේ නැත. දුක දෙස සති පඤ්ඤාවෙන් බලා අවබෝධ කරන බැවිනි. දුක යන සතුරා සමඟ සටන් වදී. ශරීරය රෝගයට වසඟ වුවද සිත නිරෝගි වේ. සති පඤ්ඤා යුධ භටයන් මෙන්

දුක පරාජය කරයි. සිත තදින් ලුහු බඳින්නේ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාය පිළිබඳය. ඒ පිළිබඳ තිබූ සුඛ, සුභ, නිත්‍ය, ආත්ම ස්වභාවය තම ප්‍රඥාවට හසු වී අවිද්‍යාව දුරු කෙරේ. මෙය තියුණු ලෙස ඉලක්ක වේ. ධර්මය ඉතා පැහැදිලිය. ශ්‍රද්ධාව අචල වේ. සති පඤ්ඤා තුළින් දුක්ඛ සත්‍යය අවබෝධ කිරීමට තව තවත් උනන්දු වේ.

එක් වරක් හෝ මෙසේ දුක්ඛ සත්‍යය අවබෝධ වූ විට, ඊළඟට එන දුක් ගැන නැවත විචාරීමක් නැත. එය ගවේෂණය කර අවබෝධය ලබා ඇති බැවිනි. එය දෙස වර්තමානයෙන් බලා සිටීම පමණක් සෑහේ. මෙසේ සති පඤ්ඤා තුළින් පැහැදිලි අවබෝධයක් නැවත නැවත ඇතිවේ. සතිය පැවැත්වීමට වීර්යය ඇතිවිය යුතුයි. මෙසේ බලන විට වේදනාව, ශරීරය, සිත වෙන් වෙන්ව දකී. ඒවා එකිනෙක හා මිශ්‍ර වීමක් හෝ ගැටීමක් නැත. මෙම අත්දැකීමෙන් දුක්ඛ සමුදය හඳුනා ගනී. තමාට දුක් දෙන, රෝග කරන, මරණය ගෙන දෙවන ''කාරක'' හඳුනා ගනී. තමා භය වූයේ තමාගේ බලවත් උද්වේගයට කාරක වූ ප්‍රතික්‍රියාවටය. ඒ තුළින් තමා අසහනයට පත් විය. මෙය හොඳින් වටහා ගත් පසු රෝගය නිවාරණය වේ. රෝග ලක්ෂණ ඇතත් ඉන් සිත අසහනයට පත් කරවන ප්‍රතික්‍රියා නැත. කයේ දුක ඇතත් සිතේ දුක නැත.

නොඉවසිය හැකි රෝගයක් ඇති විට ධූතාංග භික්ෂුව වේදනානු පස්ස-නාව කරයි. තම ශක්ති උරගා බැලීමට, තම සති පඤ්ඤාවේ තත්ත්වය මෙයින් වටහා ගත හැකිවේ. එය සාර්ථක ප්‍රතිඵල ලැබෙන තුරු වඩයි. යම් භික්ෂුවක් තම රෝගය පිළිබඳ දුක, සැප, භය, සැක ඇති කෙරේ නම් එය ඔහුගේ සති පඤ්ඤාව දුර්වලකම බව අනිකුත් භික්ෂූහු හඳුනා ගනිත්. ඔහුගේ සමාධි, පඤ්ඤාව ශක්තිමත් නැත. ඔහුගේ ප්‍රතිපදාව ගැන විශ්වාස තැබිය යුතු නැත. ඉන් අදහස් වන්නේ එම භික්ෂුව තුළ සති පඤ්ඤා වර්ධනය වී නැති බැවින් අවශ්‍ය වේලාවට එය උපයෝගී කළ නොහැකි බවය. ප්‍රායෝගිකව පුහුණුවේ යෙදෙන භික්ෂුව තුළ සතිය වර්ධනය වී ඇති බැවින් නිරන්තරයෙන්ම ආත්ම සංයමය පිහිටා ඇත. ඕනෑම දුෂ්කර අවස්ථාවකට නොසැලී මුහුණ දීමට හැකි යුද පුහුණු වූ සෙබලෙක් මෙනි. එවැන්නන් පසු බසින්නේ නැතිව තම තත්ත්වය රැක ගනී. මෙය තමා සමඟ වාසය කරන අන් භික්ෂූන්ට හඳුනා ගත හැකි, ප්‍රශංසා ලැබිය හැකි දෙයකි. අන් භික්ෂූන් මෙම නිර්භීත ධර්මයේ හැසිරෙන සෙබලා ගැන විස්මිතව බලා සිටිති. අගය කරති. කෙතරම් ප්‍රාණ හානි අවස්ථ ාවක් වුවද ධූතාංග භික්ෂුව නොසැලී මුහුණ දෙන බව ශ්‍රද්ධාවෙන්, භක්තියෙන් බලාපොරොත්තු වෙති. ඔහුගේ සති පඤ්ඤා කිසි විටක පරාජය වී කෙළෙස් ජය ගන්නා බවක් නොපෙණේ. අවසාන මරණ මොහොතේදී තම සිත කය නඩත්තු කළ නොහැකි විට සති පඤ්ඤා නැමැති ආවුද අමොරා නොසැලී සිටිති.

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය යමෙක් අවබෝධ කළ විට එහි විශ්ව පිළිගැනීම ගැන සැක නැත. එහි ශක්තිය හඳුනන බැවින් සතුරු බලකාය ඉදිරියේ පසු නොබසියි. මරණය දක්වා සටන් කරයි. තම ශරීරයට එම දුක් වේදනා ඉසිලිය නොහැකි නම් මරණයට පත්වෙයි එහෙත් සිත අත් නොහරී. සිත ආරක්ෂා කරණ සති පඤ්ඤා අත් නොහරියි. පරාජය ඔහුගේ මනාපය නොවේ. අන්තිමේදී වීර්‍යය අත් නොහරින මේ සෙබලාගේ සිත ඉතාම ස්ථාවර වූ නිරුපද්‍රිත වූ නිර්වාණ අභය භූමිය ස්පර්ෂ කෙරේ. අචල ශ්‍රද්ධාවෙන් භික්මෙන එම සත්‍යතාවය ඇසුරු කරන්නා එයින්ම ආරක්ෂා වේ. ''ධම්මො හවෙ රක්ඛති ධම්මචාරී'' යම් ලෙසකින් ධර්මය දෙගිඩියාවෙන්, අවිනිශ්චිතව පුරුදු කරන්නා ලබන ඵලය සත්‍යය අවලංගු කරන බැවින් සවාක්ඛාත ධර්මය ඇසුරු නොකරයි. මෙය හේතු ඵල න්‍යාය වේ.

ලෝකය පෙරොන්දු දෙන සියලුම සැප සම්පත් ප්‍රතික්ෂේප කරමින් ධූතාංග භික්ෂුව ශාසනය පොරොන්දු දෙන අභ්‍යන්තර සැප ප්‍රාර්ථනා කරයි. උදාහරණයක් වශයෙන් සමාධි සිතෙන් ලැබෙන සැනසුම සහ තම සිත විනිවිද ගිය කෙළෙස් ප්‍රඥාවෙන් උදුරා දැමීම නිසා ඇතිවන සතුට, මොහොතෙන් මොහොත වින්දනය කරමින් නිරන්තරයෙන් තෘප්තිමත් සතුටකින් ඔහු කල් යවයි. මේ ප්‍රත්‍යක්ෂ සතුට ධූතාංග භික්ෂුව අපේක්ෂා කරයි. මෙය කිරීමේදී තමන් ඉසිලූ ප්‍රශ්න හා ගැටළු විසඳේ. ලෝකෝත්තර ගුණය ලබා ගැනීමට අද හෝ හෙට හෝ මසකින් හෝ අවුරුද්දකින් හෝ හැකි වන්නේ එම මොහොතක් මොහොතක් පාසා පුරුදු කරණ අප්‍රතිහත ධෛර්‍යය තුළිනි.

ආචාර්ය මන් තම ශිෂ්‍යයන් පුහුණු කළේ යුද වදින සෙබළුන් මෙන් තමන්ගේ ශාරීරික, මානසික රෝග ඇතත් නැතත් සටන් කළ යුතුය යනුවෙනි. තමන් සටන් කරන්නේ තමාම බේරා ගැනීමටය. ලෙඩ රෝග පීඩා ඇති වූ විට අභියෝගයකි. අභියෝග ඉදිරියේ පසු බැසීමට ඉඩ නොදෙයි. රෝගී භික්ෂුවක් තම දුබලතාවය ගැන කනස්සල්ලට පත් වුවහොත් ආචාර්ය මන් නිසැකවම තරවටු කරණ බව දනී. ආචාර්ය මන් අනිකුත් භික්ෂූන් ගිලානෝපස්ථාන කිරීමෙන් වළක්වති. ඊට හේතුව ඔහුට ස්වාධීනව දුක දරා ගැනීමට පුහුණු කිරීමටය. සාමාන්‍ය රෝගීන් එසේ අනුකම්පාව ආදරය බලාපොරොත්තු වුවත් ධූතාංග භික්ෂුව කළ යුත්තේ තමාගේ දුක විභාග කිරීමය. පරීක්ෂණය, ගවේෂණය කිරීමය. රෝගී භික්ෂුව උවටැන් බලාපොරොත්තු වීම නරක ආදර්ශයකි. පරාජය වීමකි. එවැනි දේ අනිකුත් අයට බෝවෙන රෝගයක් මෙන් පැතිරීමට ඉඩ ඇත.

එවැනි තත්ත්වයක් උද්ගත වූ විට සිදු වන්නේ කුමක්ද ? මැරෙන්ට පණ අදින සතුන් මෙන් භික්ෂූන් වහන්සේලා කෙඳිරි ගාමින් ඒ මේ අත පෙරළෙමින් අඬමින් වැළපෙමින් සිටිනවාද ? ඔබ භාවනා කරන භික්ෂූන් වහන්සේලා සතුන්

වගේ හැසිරෙනවාද ? ඔබ සතුන් මෙන් සිතන්නට, හැසිරෙන්ට පටන් ගත්තොත් මුළු බුද්ධ ශාසනය තිරිසන් ලක්ෂණ විදහා පානවා මහත් වික්ෂිප්ත වූ මුලා වූ අය දකින්නට ලැබෙනවා. මෙය බුදු ගතිය නොවේ. අප නොයෙක් විට ලෙඩ රෝග වලින් පෙළී ඇත. එබැවින් අනුන්ගේ රෝග ගැන හොඳින් දනිමු. තමාගෙ ' දුක් ගැනවිලි ලෝකයාට ප්‍රදර්ශනය කරන්ට එපා. අඬමින් වැළපෙමින් විලාප තියමින් ලෙඩ සුව කරන්ට හැකිනම් බෙහෙත් මොනවාටද ? ලෙඩක් සැදුන විගස කෑ ගසමින් සිටිවිට ලෙඩේ සුවවේවි. එච්චරට ලස්සනයි. ලෙඩ්ඩුන්ට මෙතරම් විය හියදම් කරමින් ප්‍රතිකාර කරන්ට ඕනේ නැහැ. ඔබ අනේ ! අම්මේ! කිය කියා කෙතරම් කෙඳිරි ගෑවත් ලෙඩේ සුවවේද ? එසේ නොවේ නම් අහළ පහළ ඉන්න අයට පවා අප්‍රිය අප්‍රසන්න විදියට ඇයි මේ කෑ ගහන්නේ ?'' මෙවැනි දේ කියමින් ආචාර්ය මන් ලෙඩාට අපහාසාත්මක ලෙස දොස් කියති. ඔහුගේ හැසිරීම ආරණ්‍යයේ අනිකුත් භික්ෂූන්ටද හිරිහැරයකි.

අනිත් අතට යම් භික්ෂුවක් තමාගේ දුක් ඉවසාගෙන ශක්තිමත් ලෙස විඳ දරා ගන්නා විට, සති පඤ්ඤාවෙන් තම දුක ප්‍රකාශ නොකරන විට ආචාර්ය මන් ඔහුට ප්‍රශංසා කෙරෙති. ඔහුගේ ඉවසීම ගැන සතුට ප්‍රකාශ කර තව තවත් ධෛර්‍යයමත් කරති. සුව වූ පසුත් ඔහුගේ ගුණ වර්ණනා කරමින් අනිකුත් අයට ආදර්ශයක් ලෙස හුවා දක්වති.

''මේ වගේ තමයි නිර්භය සෙබලා තම ජයග්‍රහණය අත්පත් කර ගන්නේ. සතුරන්ගේ බලය ගැන පැමිණිලි කරමින් පසු බසින්නේ නැත. හැකි අන්දමින් සතුරා සමඟ සටන් කරයි. පරාජය පිළි නොගනී. වැටී සිට සතුරා ඉදිරියේ බැගෑපත් නොවේ. අපි වැනි ධුතාංග භික්ෂූන් සටන්කාමී සෙබලන් වේ. ලෙඩේ මෙතරම් දුක් දෙන වගකීමෙන් වැඩක් නැත. දුක දෙන වේදනාව දෙස සිත යොමු කර එහි ස්වභාවය තේරුම් ගන්න. වේදනාව වැඩි හෝ අඩු වුවත් එහි ස්වභාවය දුක්ඛ ස්වභාවයකි. එනම් චතුරාර්ය සත්‍යයේ පළමුවන සත්‍යයයි.''

යම් භික්ෂුවක් තමන්ගේ ආබාධය ගැන දුර්වල වී සිටින විට ආචාර්ය මන් වෙනත් ගායනාවක් ගයයි.

''ඔබ සත්‍යය සොයන්නේ නම් සත්‍යය ඉදිරියේ වේදනාවට බයේ පළා යන්නේ නම් ඔබ සත්‍යය දකින්නේ කෙසේද ? බුදුරජාණන් වහන්සේ සත්‍යය සොයා ගත්තේ සෑම දෙයක්ම දෙස විභාග කර, පරීක්ෂණ කර, ගවේෂණය කර, අවබෝධ කර ගැනීමෙනි. මේ වැඩකට නැති භික්ෂුව වගේ අඬමින් දොඩමින් තමන්ටම නින්දා කර ගනිමින්ද ? මේ වගේ මැසිවිලි කිය කියා කෙඳිරි ගගා සත්‍යය අවබෝධ කළ හැකියැයි බුදුරජාණන් වහන්සේ වදාරා ඇත්තේ කොතැනද ? මම වැඩිපුර පොත් කියවා නැත. එබැවින් මට ඒ තැන සොයා ගැනීමට නොහැකි විය.

මොන සූත්‍රයේද දේශනා කළේ මැසිවිලි කිය කියා කෙඳිරිගාන්ට ? සූත්‍ර පිටකය හදාරා ඇති කෙනෙක් ඉන්නවා නම් මෙසේ කෙඳිරි ගගා අඳෝනා කීමේ කුසලය පිළිබඳ වදාරා ඇති තැන කරුණාකර මට එය පෙන්වා දෙන්න. එවිට භික්ෂූන්ට මා මෙසේ දුක් විඳිමින් තමාගේ දුක අරමුණු කර පරීක්ෂණ පවත්වන්නට කිය කියා වධ කරන්නේ නැහැ. ඔබට පුළුවනි ඕනෑ තරම් දුක් අඳෝනා කිය කියා චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමට. එවිට අපට දකින්නට හැකි මහා හයියෙන් අඳෝනා කිය කියා නිවන් අවබෝධ කරගත් අය. ඒ අයට හැකිවේවි. බුදුරජාණන් වහන්සේට අභියෝග කරන්නට මේ ධර්මය දැන් අවුරුදු 2500ක් ඉක්ම ගොස් අවලංගු වී ඇතැයි කීමට.

''මේ කාලයට ඔබින ධර්මයක් ඒ අය දේශනා කරාවි.'' එය අවබෝධ කිරීමට වෙහෙස වීමක් නැත. අපහසුවෙන් ගවේෂණය කරන්නට අවශ්‍ය නැත. මග්ගඵල ලබා ගැනීමට ගායනා කිරීමය. මෙම චකවානුවට එය සුදුසු වන්නේ, බොහෝ අය සොයන්නේ අකුශල ශක්ති තුළින් කුශල විපාක ලැබීමට බැවිනි. අද මුළු ලෝකයම මෙවැනි විනාශකාරී මතයන් නිසා ප්‍රපාතයට ඇද වැටී ඇත. වැඩි කාලයක් යන්ට ප්‍රථම මුළු පෘථිවි ග්‍රහයා එවැනි නිවන් අවබෝධ කරගත් සාන්තුවරයන්ගෙන් පිරී යනවා ඇත. මම නම් පැරණි මතයම ප්‍රකාශ කරමි. මම බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය අදහමි. කෙටි පාරවල් එහි සඳහන් කර නැත. මක්නිසාද යත් එවැනි කෙටි පාරට අඩියක් තැබූ විගස මම මුනින් අතට බිම වැටී නින්දා අපකීර්තියට පත්වී මැරී යන බැවිනි. එය මගේ හදවත පුපුරා යන දුකකි.''

තමන්ගේ දුබලගති පෙන්වන යම් රෝගාබාධයකින් පෙළෙන භික්ෂුවකට මෙවැනි දේශනාවක් ඇසීමට නියමිතයි. එවැනිම දෝෂාරෝපණයක් ලැබීමට හැකි දෙයක් නම් තම කටුක ප්‍රතිපත්ති මිදීමට විශාල අභියෝගයකට මුහුණ දිය යුතු මොහොතකි. අප ජීවිත කාලයේදී ස්වාධීන තම ප්‍රශ්නවලට මුහුණ දීමට පුරුදු වී ඇත්නම් එය පහසුවක් වේ. එහෙත් මුලාවෙන්, උමතුවෙන් සිත විසිරී ගිය විට සිත මුදවා ගැනීමට නොහැකිව ඉරණමට මුහුණ දේ. අසරණ වේ.

බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කර ඇත. ''කොනුහාසො කිමානන්දෙ...'' මුළු ලෝකයම රාග ද්වේශ මෝහ ගිනි ඇවිලී දිවා රෑ දැවෙමින් පවතිද්දී ඔබ සිනා සී සතුටු වන්නේ කෙසේද ? මින් බේරීමට සුදුසු සරණක් සොයා ගන්න. අතපසු කරමින් කල් ගෙවන්නේ ඇයි ? මරණ මොහොත දක්වා අතපසු කරන්න එපා. නැත්නම් දුක් විපාක ඉමක් කොනක් නැතිව එල දේ.'' බුදුරජාණන් වහන්සේ මිනිසාට දුන් අවවාදය ''අප්පමාදෙන සම්පාදෙථ'', එනම් ''ප්‍රමාද නොවී පිහිටක් සොයා ගන්න.'' එහෙත් බුදු වදන මිනිසාට අද ඇසුන විට ලැජ්ජාවට පත්වන්නේ තම මුළු කාලයම ප්‍රමාදයෙන් ඉන්ද්‍රිය පිනවීමට ගත

කරන බැවිනි. ලැජ්ජාව කෙතරම් තිබුණත් තම ආසාවන්ට වසඟ වෙමින් මෙය ඕනේ, මෙය එපා'' යන අනිත්‍ය වූ ලෞකික සැප ප්‍රාර්ථනා කරති. ඉන් නික්මෙන්නේ කෙසේදැයි නොදනිති. එබැවින් අනතුරු අඟවන බුදු වදනට ඇති එකම ප්‍රතිචාරය ලැජ්ජාව පමණකි.

බන් නො ෆිව් හි භික්ෂුවගේ අභාවය ඔබ සැමට වටිනා පාඩමක් උගන්වයි. අපි සැවොම මේ ඉරණමට මුහුණ දිය යුතුය. උන්වහන්සේ අවසාන මොහොත ගත කළ අන්දම ගැන හොඳාකාර සිතා බලන්න. අන්තිම මොහොත ළඟා වූ විට ආචාර්ය මන් සහ අන් භික්ෂූන් පිඩු සිඟා යන ගමන් එහි නැවතී මේ දුක් මුසු වේලාවට සහභාගි වූහ. ආචාර්ය මන් විනාඩි කීපයක් සමාධි ගත වී සියල්ලන් අමතා මෙසේ ගෞරවාන්විතව කීහ.

''ඔහු ගැන කනස්සල්ලට හේතු නැත. දැනටමත් 6 වෙනි බ්‍රහ්ම ලෝකය වූ ආභස්සරයෙහි ඉපදී ඇත. දැනට ඔහු සතුටින් පසුවෙයි. එහෙත් එහි පාඩුව නම් තව ටික කලක් ජීවත් වුවා නම් විපස්සනාව දියුණු කර ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකයක උප්පත්තිය ලැබීමට තිබුණි. එහි සිට අර්හත්වය දක්වා යති. නැවත මේ මනුලොව නූපදිති නොහැකි භික්ෂුවයි. තම දුක විඳිමින් ඊට හේතු ප්‍රත්‍යක්ෂ කළ යුතුය. තමාගේ දුබලකම් නිසා ප්‍රතිපදාව අත්හරින භික්ෂුව උන්වහන්සේගෙ බලවත් විවේචනයට ලක්වේ. ආචාර්ය මන් නිතරම යුද භටයෙකුගේ නිර්භීත භාවය මෙන් භික්ෂුවගේ ප්‍රතිපදාව නිර්භීතව ගෙන ගිය යුතු බව උද්වේගවත්ව මතක් කර දෙති. උන්වහන්සේගේ මෙම දේශනය අසා භික්ෂූන්ගේ ආත්ම ශක්තිය දැඩි අධිෂ්ඨානය ක්‍රියාත්මක වී සියලු රෝගවලට ප්‍රතිකාරයක් බවට පත්වේ. මෙසේ තම සිත ශක්තිමත් වී ප්‍රාණවත් වී ඉදිරියට ජයග්‍රාහික ලීලාවෙන් අඩියෙන් අඩිය මාර්ගයේ ගමන් කරති. ධර්මය පෙන්වා දෙන එම ශාන්ති සුඛය කරා යති. අප්‍රාණික ස්වභාවය, මැලිකම ආදී සසර බැඳ තමන බැමි කැඞී බිඳී යත්.

බන්නං ෆිව් ආරණයේ ආචාර්ය මන් වාසය කරන කාලයේදී භික්ෂූන් වහන්සේලා දෙනමක් අපවත් වූහ. පළමුව අපවත් වූයේ මධ්‍යම වයසේ සිටි භික්ෂුවකි. උන්වහන්සේ මහණ වූයේ භාවනා පුහුණු කිරීමටය. ආචාර්ය මන්ගෙ ශිෂ්‍යයෙක් වශයෙන් චියාං මායි සිට පසුව උන්වහන්සේ සොයාගෙන උදොන් තානි හා සකොන් නඛොන් ගමට පැමිණියහ. සමහරවිට තනියම ද සමහරවිට ආචාර්ය මන් සමඟ ද විසූහ. උන්වහන්සේ සමාධි භාවනාවෙන් උසස් ප්‍රතිඵල ලදහ. ආචාර්ය මන්ගේ උපදෙස් පරිදි විපස්සනාවෙහි යෙදුණි. උන්වහන්සේ ඉතාමත් ශුද්ධාවන්ත වූ, වීර්‍යාධික චරිතයකි. හැඟීම් උද්වේගවත්ව ගීතයක් වැනි මිහිරි ලෙස ධර්ම දේශනා කරති. මල පොතේ අකුරක් වත් නොදනී. එහෙත් වාග් මාලාව අති දක්ෂ ලෙස පැහැදිලි කරයි. අසා සිටින අයට පහසුවෙන් අර්ථ

ය පැහැදිලි වේ. අවාසනාවකට මෙන් උන්වහන්සේට ක්‍ෂය රෝගය වැළඳුනි. කාලයක් දුක් විඳ ආරණ්‍යයේ වාසය කරණ කාලයේදී රෝගය උත්සන්න විය. එදින උදේ 7ට පමණ සන්සුන්ව ශික්ෂාකාමී සංඝ රත්නයකට සුදුසු අන්දමින් අවසන් හුස්ම හෙළුවේය. එය බලා සිටි මම මහත් ආදර ගෞරවයකින් මේ භාවනායෝගී භික්‍ෂුව පිදුවෙමි.

මරණාසන්න මොහොතේදී අපේ ඉරණම විසඳන්නේ අපිමය. තම අනාගතය ගැන සම්පූර්ණ වගකීම භාරගත යුතුය. අන් කිසිවෙකුට කෙතරම් කැමැත්තක් ඇතත් ඒ ඉරණම වෙනස් කළ නොහැකිය. එබැවින් කලින්ම අපි මෙම තත්ත්වය මුහුණ දීමට සැරසී සිටිය යුතුය. කුශලතාවයකින් මේ මොහොත ඉක්මවිය යුතුය. එවිට නිරුපද්‍රිතව ඊළඟ භවය ගනී. මේ මොහොත එහෙත් ඔබ සියළු දෙනා කිනම් ලෝකයකට යාමට සූදානම් වී සිටිත්ද ? තිරිසන් ලෝකය, ප්‍රේත ලෝකය, අපාය ? නැත්නම් මිනිස් ලොව, දිව්‍ය හෝ බඹලොව ? නැත්නම් නිවන ? මින් කුමන ලෝකයද ? ඔබට මෙය දැන ගන්නට උවමනා නම් ඔබගෙ ' හදවතේ ඇති මාලිමා යන්ත්‍රය කුමන දිසාවට හැරී ඇද්දැයි බලන්න. විභාග කර දැන් බලන්න. ඔබගේ ගමන් මාර්ගය හොඳද නැද්ද. මැරුණාට පසු එය ප්‍රමාද වැඩි නිසා මාර්ගය වෙනස් කළ නොහැකිය. මරණය යනු අවසානය බව කවුරුත් දනිති. ඉන්පසු කරන්නට දෙයක් නැත.

දෙවෙනි මරණය උබොන් රච්ඡතාහි සිට ආ භික්‍ෂුවකි. උන්වහන්සේ මැලේරියා රෝගයෙන් කළුරිය කළහ. උන්වහන්සේගේ මරණය තවත් භික්‍ෂුවක් භාවනා කරන විට ඊට ටික දිනකට පෙර දුටුවේය. පසුදා ආචාර්ය මන් හමු වී කථා කර එම සිද්ධිය දැනුම් දුනි.

''අමුතු දර්ශනයක් ඊයේ රාත්‍රියේ භාවනා කරණ විට මම දුටිමි. මම විපස්සනා කරමින් යම් සමාධියකට පත් වුනෙමි. එකවරට මම ඔබ වහන්සේ දර සෑයක් ඉදිරියේ සිටගෙන ඉන්නවා දුටිමි. ඒ භික්‍ෂුව මේ ස්ථානයේ ආදාහනය කළ යුතුයැ''යි මෙය තමයි හොඳම භූමිය කියා අණ කළා. මට මෙය හොඳාකාර නොතේරේ. ඒ මැලේරියාවෙන් පෙළෙන භික්‍ෂුව අපවත් වේද ? උන්වහන්සේ එතරම් අසාධ්‍ය තත්ත්වයක සිටීද ? ආචාර්ය මන් මොහොතකින් පිළිතුරු දුනි.

''මම මේ භික්‍ෂුව ගැන බොහෝ කාලයක් පරීක්ෂාවෙන් ඉන්නේ. උන්වහන්සේ අපවත් වේවි. එය වළක්වන්ට බැහැ. එහෙත් එය දුක් වීමට හේතුවක් නොවේ. උන්වහන්සේගේ චිත්ත ස්වභාවය මම දකිමි. එය අති විශිෂ්ටයි. ඒ නිසා ඉතාම හොඳ තත්ත්වයක සිටී. නමුත් මේ බව එම භික්‍ෂුවට දැනුම් නොදෙනු. ඔහු මරණයට පත්වන බව දැන ගත්විට බලාපොරොත්තු සුන් වී රෝගී තත්ත්වය අසාධ්‍ය වේ. එවිට තම සිතේ ශක්තිය දුර්වල වී තමා ලබන්නට ඇති

උසස් භාවය නැතිවීමට ඉඩ ඇත. මේ අවස්ථාවේදී බලාපොරොත්තු සුන්වීම විශාල පාඩුවකි.

ටික දිනකට පසු එම භික්ෂුවගේ තත්ත්වය එක්වරම අසාධ්‍ය විය. ඉන්පසු අළුම 3 ට අපවත් විය. ආචාර්ය මන් මේ භික්ෂුවගේ සිතිවිලි ගැන තීක්ෂණ බුද්ධියකින් බලා ඇති බව මට ඔප්පු විය. ඔහුගේ සමාධි සිත වැඩී යන අන්දම දැක එහි විපාක ගැන සිතා එසේ ඉදිරියට යාමට දී නිහඬ විය.

එක් දිනක් ආචාර්ය මන්ගේ එක්තරා ශිෂ්‍යයෙක් මැලේරියා රෝගය වැළඳී උණ ගැහී ඉතා දුර්වල බැවින් පිණ්ඩපාතයට යාම ප්‍රතික්ෂේප කර එදින නිරාහාරවීමට තීරණය කළහ. උන්වහන්සේ තමාගේ ශාරීරික දුක් වේදනා අරමුණු කරමින් සිටියේය. දවල් කාලයේ බලවත් ක්ලාන්ත ස්වභාවමය දරමින් තම සිරුරේ බලවත් වේදනා ඇති තැන් දෙස බලා සිටියහ. එහෙත් එම පඤ්ඤාවෙන් එම වේදනාව විපස්සනා නොකළේය. එවේලේ ආචාර්ය මන් එම භික්ෂුවගෙ ' සිත් දෙස බලමින් සිටියහ. පසුව සවස් යාමයේ උන්වහන්සේ ආචාර්ය්‍ය මන් හමුවීමට පැමිණියහ.

''ඇයි ඔබ ඒ ආකාරයෙන් වේදනාව දෙස බලා සිටියේ ? එසේ සිට ඔබ කය වේදනාව, සිත පිළිබඳ සත්‍යය අවබෝධ කරන්නේ කෙසේද ? ඔබ ඒකාග්‍රතාවයෙන් වේදනාව දෙස බලා සිටියේ. එසේ නොව පඤ්ඤාවෙන් මේ තුන දෙස බැලිය යුතුය. එවිට ඒවායේ ස්වභාවය අවබෝධ වේ. ඔබ භාවනා කරන්නේ හින්දු යෝග ක්‍රමයට. එය ඒකාග්‍රතාවය දියුණු කරණ බලු පොරයකි. ඉන් භික්ෂුවකට සුදුසු ධර්මය අවබෝධයක් ඇති නොවේ. එසේ මින් මතු නොකරන්න. ඒ විධියට කයේ ඇතිවන අනේවිධ සත්‍යය ගවේෂණය කළ නොහැකිය. චිත්ත හා වේදනාව ගවේෂණය කළ නොහැකිය. මම දවල් වරුවේත් ඔබගේ භාවනාව ගැන විමසුවෙමි. ඔබගේ උණ ඉහළ නැගීම නිසා ඇති ශාරීරක වේදනාව දෙස බලන්නේ කෙසේදැයි බැලුවෙමි. එවිට මට පෙනී ගියේ ඔබ නිකම් වේදනාව අරමුණු කරමින් සිටින බවකි. ඔබ සති පඤ්ඤාවෙන් එය විශ්ලේෂණය කර එහි හේතු ප්‍රත්‍ය විමසුවේ නැත. කාය, චිත්ත, වේදනා, අනුපස්සනා කළ යුතුය. මේ ක්‍රමයෙන් පමණක් වේදනාව පහවේ. රෝග ලක්ෂණ උදාසීන වේ. මධ්‍යස්ථ වේ. ඒ වේදනාවට පටහැනි බැවිනි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ද පටිච්ච සමුප්පන්න ධර්ම වශයෙන්ද මේ සියල්ල මෙනෙහි කළ යුතුය.

## කොටි ඉතා හොඳ ගුරුවරු වෙති

යම්කිසි භික්ෂුවකට එක්තරා උපදේශයක් අවශ්‍ය යැයි සිතුන විට ආචාර්ය

මන් ඔහුට එය කෙළින්ම කියති. ඇතැම් භික්ෂූන්ට රුචි විධියට ගරු සර නැතිව කථා කරයි.

''ඔබ මේ ආරණ්‍යයේ වාසය කිරීමට සුදුසු නැත. ඔබ අසවල් ගල් ගුහාවට යනු මැනවි. ඊටත් වඩා හොඳයි කොටියෙක් තම ගුරුවරයා වශයෙන් සොයා ගැනීම. ඌට ඇති භය නිසා ඔබේ මානාධික සිත යටපත් වේ. එවිට සිත බලෙන්ම සමාධිගත වේ. ධර්මය මේ ආකාරයෙන් අවබෝධ කර යම් සැනසිල්ලක් ලැබිය හැකිය. මේ ආරණ්‍යවාසය ඔබට සුදුසු නැත. මුරණ්ඩු දරදඬු අයට තදබල දේ වලින් මෘදු මොළොක් කර කර්මණ්‍ය කළ යුතුය. කොටින්ගේ සැර පරුෂ ගති නිසා සිත තදබල බියට පත් වන බැවින් කොටි හොඳ ගුරුවරු වෙති. ගුරු භක්තිය නැති බිය නැති ගුරුවරයෙකුට වඩා එය ඔබට වැඩදායී වේ. ඔබ හොල්මන් වලට බිය නම් හොල්මන් ඔබට හොඳ ගුරුවරු වෙති. එවිට සිත හික්මේ. ඔබට යම් භයක් උපදී නම් එය ඔබගේ ගුරුවරයා කර ගන්න. මේ විධියට දක්ෂයෙක් පුහුණුව ලබා ගනී.

ආචාර්ය මන් මෙසේ අමතා කථා කළ භික්ෂුව කලින් ඉතා හැඩි දැඩි පුරුෂයෙකි. කිසිවෙකුට අවනත නැත. තමා යමක් කරන්නට තීරණය කළ පසු කිසි වග විභාගයක් නැතිව එය කරයි. ආචාර්ය මන්ගේ උපදෙස් ලත් වහාම ඒ අනුව අවනත වීමට ඔහු තීරණය කළේය. ඔහුගේ සිතිවිලි සමුදාය මෙසේ විය. ''ආචාර්ය මන් තරම් උසස් ගුරුවරයෙක් මා කොටින්ට බිලි දෙත්ද ?'' මම ඒ ගල් ගුහාවට යමි. මැරුණත් කම් නැත. මොනවා කරන්ටද ? මම මරණය භාර ගතිමි. උන්වහන්සේ කියන්නේ කී දේ සත්‍යයක් නම් මම මරණයට බිය වන්නේ කුමටද ? උන්වහන්සේ කියන්නේ පිළිගත යුතු තර්කානුකූල දේ බව මා අසා ඇත. එසේ කියන්නේ යම් හේතු මත පිහිටා නොවේද ? ඒ කියන අන්දමට හැසිරෙන කෙනෙකුට හොඳ ප්‍රතිඵල ලැබේ. උන්වහන්සේ මේ කියපු දේ මම බරපතල ලෙස ගාම්භීර ලෙස පිළිගනිමි. එය කීවේ මගේ චරිතය දිවැසින් දුටු නිසාය. මගේ අභිවෘද්ධියට මෙය කියන ලදී. මගේ හදවත උගුල්ලා බලා පරීක්ෂණය කර ඇත. මා ගැන සියළු දේ දනිති. මම කෙසේ සැක කරම්ද ? මම ඒ උපදෙස් අනුව ක්‍රියා නොකළොත් මට භික්ෂු භාවයක් නැත. මොනවා වුනත් කම් නැත. මම ඒ ගල්ගුහාවේ සිටිමි. මැරුණොත් මැරුණාවේ. නොමැරුණොත් මම ඉල්ලන්නේ මේ මහා විස්මිත ධර්මය අවබෝධ කිරීමටය. උන්වහන්සේ ''මුරණ්ඩු දරදඬු කෙනෙක්'' කීවේ මට විය යුතුය. ඇත්තෙන්ම උන්වහන්සේ මහා බුද්ධිමත් අතිදක්ෂ කෙනෙකි. මම මා ගැන දන්නවාට වඩා උන්වහන්සේ මා ගැන දනිති. මම තමයි ඒ කිව් පුද්ගලයා. ඒ බව සීයට සීයක් හරි. මගේ හොඳටයි මෙය කීවේ. කොටි ගැන කී දේ මම ඇදහිය යුතුයි. මේ විධියට මම භය භ්‍රාන්ත වී ඕන දුකක් විඳිමි.

මේ භික්ෂුව ඇත්තෙන්ම ''මුරණ්ඩු'' කෙනෙකි. කිසි අවවාදයකට නොනැමෙන කෙනෙකි. එහෙත් ආචාර්ය මන්ගේ උපදෙස් පරිදි ඔහු එහි යාමට සූදානම් වී ආචාර්ය මන් කෙරෙන් සමුගැනීමට ගියේය.

''ඔබ කොහේ යන්නද මේ සිවුරු පිරිකර අවශේෂ පරික්ෂකාර සමග යුද්දෙට යනවා වගේ ?''

''ඒ කිව් ගල් ගුහාවට ගොස් මැරුණත් කමක් නැහැ. මම එහි යනවා.''

''මොනවා ? මම කීවාද එහි ගොස් මැරෙන්න කියා ? මම කීවේ ගල් ගුහාවට ගොස් භාවනා කරන්ට නොවේද ?''

''මට භාවනා කරන්ට කීවා. මැරෙන්ට කීවේ නැහැ. එහෙත් අනිත් භික්ෂූන් වහන්සේලාගෙන් මට දැන ගන්ට ලැබුණා එහි උඩ විශාල කොටියෙකුගේ වාසස්ථානය බව. නිතරම එම කොටියා එහි යනවා එනවා. ඌ දඩයමේ යන්නේ ඒ ගල් ගුහාව ඉදිරියෙන්. ඒ නිසා මම වැඩි කාලයක් එහි ජීවත් වේදැයි සැකයි මම කීවේ මගේ එම බිය පිළිබඳවයි.''

''මීට පළමු බොහෝ භික්ෂූන් එම ගල් ගුහාවේ වාසය කළා. එහෙත් ඒ කිසිවෙක් කොටියා කෑවා කියා ආරංචියක් නැත. කොටියා ඔබ දුටු විගස කා දමන්නේ ඇයි ? ඔබගේ මස් සහ ඒ අයගේ මස් වල වෙනසක් ඇද්ද ? කොටියා ඔබගේ මස් ප්‍රිය කරන්නේ ඇයි ? ඔබට කොටින්ට රසවත් ශරීර මාංශ ලැබුණේ කෙසේද ? ඔබ විතරක් කා දමන්ට හිතන්නේ ඒ නිසාද ?''

ඉන්පසු ආචාර්ය මන් සිතේ ඇති වංචනික ස්වභාවය ගැන විස්තර කළහ. ''සිත විජ්ජාකාරයෙකි. මිනිසා ලේසියෙන් රැවටී යන වාර අනන්තයි.''

ඔබ සුපරික්ෂාකාරීව සිතිවිලි දෙස බලා විවේචනාත්මකව පැහැදිලි ලෙස සිත හඳුනා නොගත්තොත් සිතේ ලක්ෂ ගණන් වංචා, ප්‍රෝඩා වලට රැවටේ. එවිට කිසි කලෙක ඉබාගාතේ යන මේ සිත මෙල්ල කළ නොහැක. ඔබ දැන් යන්ට සූදානම් නමුත් දැන්ම සිතේ වංචාවට රැවටී කෙළෙස් වල යටවී ගුරුවරයාට වඩා කෙළෙස් අදහති. එසේ නම් එහි වසන්නේ කෙසේද ? ලෝකයේ සියලු දෙනාම මැරෙන නමුත් මරණයට භය වෙති. එහෙත් උප්පත්තියට ජීවිතයට භය නොවෙති. සියලු දෙනාම උප්පත්ති තණ්හා ආසා ඇත. මිනිසා උප්පත්තියට මෙතරම් තණ්හා කරන්නේ ඇයිදැයි මට නොතේරේ. ඉපදුනා යනු අනන්ත දුකට පත්වීමකි. උණ බම්බු පඳුරු දා තවත් උණ බම්බු වගා කරන්නාක් මෙන් මිනිසාට තම සිරුරෙන් තවත් බොහෝ දෙනා උපදවා ගන්නවා. එවිට උප්පත්ති තණ්හාව නිසා සීයක් දාහක් දෙනා එකට සිටිති. මේ සියලු දෙනා එකවර මැරී යන ස්වභාවය ගැන සිතන්නේ නැත. එසේ වුවහොත් සියලු දෙනාගේ එකවර

මැරීම නිසා මහත් දුකකට පත්වේ. ජීවත් වීමට නිර්භය ස්ථානයක් නැතිවේ. ඇත්තේ එකම ස්ථානයක් බැවිනි.

ඔබ ප්‍රතිපත්ති පූරණ කරණ භික්ෂුවකි. පුහුණු සොල්දාදුවෙකි. කෙළෙස් සටන ජය ගැනීමට පුහුණු කරණ ලදී. එහෙත් ගිහියෙකුටත් වඩා ඔබ මරණයට පත් වෙති. ඔබගේ කෙළෙස් මෙපමණ දුකට පත්වීමට ඉඩ දෙන්නේ ඇයි ඔබට සති, පඤ්ඤා ඇත. කෙළෙස් සතුරන්ගෙන් ආරක්ෂා නොවන්නේ ඇයි ඔබ ආක්‍රමණශීලීව සතුරන්ට විරෝධ නොවන්නේද ? කෙළෙස් සතුරන් ඔබ හදවතෙහි සැඟ වී ඇත. ඔවුන් පලවා හරිනු. ඊටපසු ඔබටම තේරේවි කොතරම් මෝඩ-යක්ද යන්න. ඔවුන්ගේ බලයට යටත් වී අන්ධකෙු මෙන් ඔවුන්ටම සේවය කරයි. සෙබළාගේ ජයග්‍රහණයට හේතු වන්නේ ජීවිත පූජාවෙන් යුද බිමේ සටන් කිරීමයි. ඔබට මැරෙන්ට බැරිනම් යුද බිමට ඇතුල් වෙන්ට එපා. මාරාන්තික සටන් කර යුද්ධය ජයගත යුතුය. ඔබ ඇත්තෙන්ම දුක් ඉක්මවීමට කැමති නම් ඔබේ මරණ භය දුක වශයෙන් මෙනෙහි කරන්න. ''බිය'' යනු ඔබ සන්තානයේ රැස් කර ඇති කෙළෙස් වල නිෂ්පාදනයක්. මෙම ප්‍රශ්නය නිරාකණය කිරීමට යුද බිමට පිවිස යුද ආරම්භ කරනු. වීර්‍යය කරන්න. එවිට ''භය'' යන්නෙහි දුක් විපාක වැටහේ. භය නිසා සිතිවිලි තරංග කලබල වී ඔබේ ශක්තිය හීන කරයි. මහත් දුකට පත් කරයි. දැන්ම නිර්භය වීමට අධිෂ්ඨාන ගන්න. ඔබ බයට යටත් වී වහල්කම් කරන්ට එපා. පපුවට තදකරගෙන හදවත වියරු වී භය භ්‍රාන්තයෙන් කෑ ගසන තෙක් බලා සිටින්නේ ඇයි. මේ මොහොතේම නියම මාර්ගය තෝරා නොගත්තොත් අනන්ත දුකට පත්වේවි.

ඔබගේ ගුරුවරයාගේ ධර්මයේ ඇති උතුම් භාවය ඔබ විශ්වාස කරනවාද නැතහොත් ඔබ හදවතට නිකුත් කළ කෙළෙස් පිළිබඳ විශ්වාස කරනවාද ? ඒ කෙළෙස් ඔබගේ සති, පඤ්ඤා දුර්වල කරමින් සිටින දෙස බලා සිටිනවාද ? සති, පඤ්ඤා යනු කෙළෙස් පරාජය කරණ අවි ආයුධ වේ. වට පිට බලන විට ඔබට පෙනෙන්නේ කොටි පමණයි. ඔවුන් ඔබගේ මස් කඩා ඉරාගෙන කනවා විතරයි පේන්නේ ඒ මක්නිසාද ? කරුණා කර මේ ගැන ගැඹුරින් මෙනෙහි කරන්න. මම මේ ක්‍රමය අනුගමනය කර විශාල ජයග්‍රහණයක් කළ බවට සාක්ෂි වෙමි.

ආචාර්ය මන්ගේ මෙම දේශනය අසා එම භික්ෂුව මහත් සේ ප්‍රීතියට පත් වී තම සිතේ වීර්‍යය අධිෂ්ඨානය ශක්තිමත් කර ගත්හ. ආචාර්ය මන්ගෙ ් තරවටුව ඔහුට රුකුලක් විය. ඉන්පසු වැඳ සමුගෙන ගල් ගුහාවට යාමට පිටත් විය. ඉතාමත් සතුටින් ඉපිල ගිය සිතකින් එම ගල් ගුහාවට පැමිණියේය. තමා ඔසවාගෙන ආ බඩු බිම තබා අවට ප්‍රදේශය නිරීක්ෂණය කළේය. යම් අහේතුවකට මෙන් මෙම ගල්ගුහාව කොටියෙකුගේ වාසස්ථානය යැයි ඔහුට සිතක් ඇති විය. මෙසේ සිතා ගල් ගුහාවේ ඉදිරිපස බැලූ විට ඇත්තෙන්ම කොටි

පා සටහන් මිදුලේ පෙනේ. එම අඩිපාරවල් දුටු විගස ඔහුගේ සිරුර තුළින් භය භීත ප්‍රකම්පන තරංග ගමන් කළේය. එය ඔහුගේ සිහි විකල් වීමට හේතුවිය. සැණෙකින් තම ගුරුවරයාගේ උපදෙස් හා ඔහුගේ සිතේ පැවති ධෛර්‍යය පහ විය. අධිකතර භයට පත් වී ගත සිත වෙව්ලා යයි. එය නවත්වා ගැනීමට නොහැකිය. ඔහු ඒ දෙස ගොස් තම පාදයෙන් එම සළකුණු මකා දැමීය. භය එසේමය එහෙත් දැන් සළකුණු නැත.

රාත්‍රී මුළුල්ලේ භය ත්‍රස්තය නිසා ශරීරය අක්‍රියකාරී විය. දවල් වරුවේද එසේමය. රාත්‍රී වන විට වියරු වී භය බුර බුරා නගී. මුළු ප්‍රදේශම විශාල කොටින්ගෙන් ගහන වූ බව ඔහුට හැඟේ. මෙසේ මහත් වූ කණස්සල්ලෙන් පසුවන අතර ඔහුගේ මැලේරියා රෝගය මතු වී උණ නැගී ගොස් ඉන්පසු සීතල වී වේවලයි. ඔහු මහත් දුක් ඇති අපායකට වැටී ඇත. කිසිම සරණක් පිහිටක් නැත. එහෙත් ඔහුගේ පෞරුෂත්වය බලවත් බැවින් මේ දුෂ්කර මාර්ගය අත්හැරීමට නොසිතූහ. උණ සහ කොටින්ට ඇති බිය ඔහු වියරු කරයි.

බොහෝ වේලාවකට පසු ආචාර්ය මන්ගේ වචන සිහිපත් විය. ආචාර්ය මන්ගේ කරුණාවන්ත උපදෙස් මතක් වූ විට තරමක සිසිලක් ඇත. උණ ගැහී උත්සන්න වී ඇත. එවිට ඔහුගේ මුල් තීරණය මතක් විය. ''මැරුණොත් මැරුණා-වේ'' මම මුලින්ම එසේ සිතුවෙමි. ආචාර්ය මන් කොහේ යන්නේදැයි ඇසූ විස එම ගල් ගුහාවට ගොස් මැරෙමියි කීවෙමි. මෙහි එන විට සිතේ පුදුම උද්යෝගයක් දැනුණි. අහසේ පාවෙනවාක් මෙන් සිත නිර්භය වී සතුටින් පිනා ගියේය. මරණයට මුහුණ දීමට කිසි බියක් නොවීය. එහෙත් ගල් ගුහාවට පැමිණි විගස මරණයට මුහුණ දීමට අකමැති විය. ඊට හේතුව කුමක්ද ? මරණ බියෙන් තැති ගත්තෙමි. මේ එකම පුද්ගලයා නොවේද ? මගේ හදවත යම් බිය සුල්ලෙකුගේ හදවතට පරිවර්තනය වී ඇත. දැන් මා වෙන පුද්ගලයෙක්. ආරණ්‍යයේදී මා මැරෙන්ට වුවද කැමති විය. දැන් මගේ සිතත් වෙනස් වී ඇත. ඒ මම ද ? මේ මම ද? ඉක්මණින් තීරණයකට බැස ගනු ! තව බලා සිටින්නේ කුමකටද ? මැරුණත් කම් නැහැ මම අර අයිනේ කඳු බෑවුමේ ගිහින් භාවනා කරමි. මගේ සතිය නැතිනම් එම ප්‍රපාතයට වැටී මැරී ගියාවේ. උකුස්සෝ සහ මැස්සෝ මගේ ශරීරය අයිති කර ගනිත්. ගමේ මිනිසුන්ට කරදරයක් නැත. මෙවැනි වැඩක් නැති භික්ෂුවකගේ මළ සිරුර කිසිවෙක් අල්ලන්නේ කුමකටද ? ඊත් දැඩි කොටියා යන මාර්ගයේ හිඳිමින් භාවනා කිරීමට මට සිතේ. කොටියාට ආහාර සොයා යාමට අවශ්‍ය නැත. ඔහුට එය පහසුවකි. උගේ දත් මගේ වැඩක් නැති බෙල්ලට කිඳා බසී. ඔහුට හොඳ ආහාර වේලකි. මොකක්ද කරන්නේ? ඉක්මණට හිත සදා ගන්න !

ඔහුගේ සිත දැන් රැකුල් ගනිති. මඳ වේලාවක් බලා සිට ගුහාව ඉදිරි පිටට ගියේය. කඳු බෑවුමේ හිඳිමින් භාවනා කිරීමට තීරණය ගත්හ. සතිය නැති විගස

ගිජු ලිහිණියෝ, මැස්සෝ වට කර ගනිති. කමක් නැහැ. ඔහු එම භයංකර කඳු බෑවුම වෙත ගියේය. කොටියාගේ ගමන් මාර්ගය එය පිටු පසිනි. එහි හිඳිමින් ''බුද්ධෝ'' භාවනාව තියුණු ලෙස වැඩීය. මරණය ඉතා ලං වී ඇත. ''බුද්ධෝ'' භාවනාව කරමින් විටින් විට ''වැඩි භයංකාර ඇත්තේ කොටියාටද නැත්නම් පාතාලයට දැයි'' විමසීය. පාතාලයට වඩා බිය විය. ඉන්පසු විටින් විට ''බුද්ධෝ'' භාවනාව සහ මරණා සතිය වැඩුහ. මෙසේ භාවනාව කරමින් සිටින විට ඔහුට නොදැනීම සිත සමාධිගත විය. අර්පනා ධ්‍යාන වලට වැටී සිත ඒකාග්‍රතවයෙන් නිශ්චල විය. දැන් ඔහුගේ සිතේ තිබූ බලවත් කණස්සල්ල අතුරුදහන් වී ඇත. ඇත්තේ සිත පමණි. සිත හුදකලාව පවතී. එහි විස්මිත නිහඬතාවය මහා පුදුමයකි. මරණ බය නොදැනේ. එය අදහාගත නොහැක. වේලාව රාත්‍රී 10 විය. සිත උග්‍ර ලෙස අර්පනා ධ්‍යාන ගත විය. පසුදා උදේ 10 වන තෙක් එකම ඉරියව්වකින් සිත ඒකාග්‍රතාවේ පසු වුණි. ඇස් හැර බැලීමට වුවද අවශ්‍ය නැත. එතරම් ගැඹුරු තියුණු, සියුම් ආවේගයකි. අන්තිමේදී ඇස් හැර බැලූහ. ඉර මුදුන් වීමට ළඟා වී ඇත. හීල් දානයට පිණ්ඩපාතය යන කාලය ඉක්ම වී ඇත. ගමට යාමට අවශ්‍යතාවයක් නැත. මුළු දවසම ප්‍රීතිය භුක්ති විඳිමින් නිරාහාරයෙන් සිටියේය. සමාධියෙන් පිබිදී බැලූ විට සිතේ බිය තුරන් වී ඒ වෙනුවට පුදුමාකාර නිර්භය, නිර්භීත භාවයක් සිතේ ඇත. මැලේරියා උණ පහ වී ඇත. නැවතත් එම රෝගය වැළඳුනේ නැත. ධර්මයේ ඇති රෝග නිවාරණය කිරීමේ ශක්තිය මහා පුදුමයකි. කොටින්ට තිබූ භය ද නැත. කැමති තැනක යා හැකිය. ඕනෑම තැනක ජීවත් විය හැකිය. සැක, බිය, දුක තුරන් වී ඇත.

වරෙක ඔහු කොටියෙක් දැකීමට කැමති වේ. තම සිත නැවත කුලප්පු වේදැයි පරීක්ෂණ කිරීමට සිතේ. සන්සුන්ව කොටියා ඉදිරියට ගමන් කරන සැටි මනඃකල්පිතයට නැගේ. තමාට ඇති වූ අත්දැකීම පිළිබඳ ආචාර්ය මන් කෙරෙහි අසීමිත භක්තියක් ඇත. භය නිසා සිත විකෘති වන අන්දම ඔහුට හොඳාකාර වැටහේ. බලහත්කාරයෙන්ම සිත මෙල්ල කිරීමට උනන්දු වේ. භාවනා කිරීමට සුදුසු මහා භයංකර තැන් සොයා යයි. එහි වාසය කරන තාක් කල් මෙසේ තම භාවනා මනසිකාරය ශක්තිමත් කළහ. කොටි යන ගමන් මාර්ගයේ වාඩි වී භාවනා කළහ. මදුරු දැලෙන් වසා නොගෙන කොටියාට පෙනෙන ආකාරයෙන් භාවනා කරයි. සිතේ භය උපදවා නොගෙන එම සමාධියට පත්වීමට නොහැකි විය.

එක් විටෙක මධ්‍යම රාත්‍රිය තෙක් එළිමහනේ වාඩි වී භාවනා කළ නමුත් සිත සමාධි ගත කර ගැනීමට නොහැකි විය. දැඩි ලෙස කණස්සල්ලෙන් බොහෝ වේලා සිට කොටියා මතක් කළහ. ''ඒ කොටියා කොහේදැයි නොදනිමි. මගේ සිත සමාධිමත් කර ගැනීමට කොටියා එනවා නම් හොඳයි. කොටියා මා පසු කර මගේ සිත එකවරම සමාධිගත වේ. එවිට මෙතරම් ආයාසයක් නොමැත. මෙසේ

සිත සිතා පැය භාගයක් පමණ ගත විය. මේ මහා සතාගේ අඩි ශබ්දය ඇසුණි. දැන් දැන් ශබ්දය වැඩිවෙමින් පවතී. ඔහු තමන්ටම කථා කළේය. ''හා දැන් තවමත් ගණනක් නැද්ද ? බය නැද්ද ? උගේ තියුණු නිය ඔබේ බෙල්ල පසාරු කරනවා. හොඳ ආහාර වේලක් ඔබ. කොටියාට ආහාර වීමට නොකැමති නම් ඉක්මණින් සැඟවී සිටීමට තැනක් සොයනු.''

මෙසේ සිතූ වහාම කොටියා පැන තමාගේ බෙල්ල කොටි දත්වලින් සපා කන අන්දම මනසේ දිස්විය. මෙම මානසික ඡායා මාත්‍රය දුටු විගස සිත එකවිටම සමාධි වී ක්ෂණිකව අර්පනා ධ්‍යානයට සමවැදුනි. ඒ සමගම බාහිර ලෝකය අවලංගු විය. තමා හා කොටියා සමඟ සියලු දේ අතුරුදහන් විය. ඉතිරි වී ඇත්තේ ප්‍රබල නිහඬතාවයක්. සිත සහ ධර්මතාවය එකක් විය. එහි ආශ්චර්ය, අද්භූතභාවය කියා නිමකළ නොහැකිය. මේ උදාර නිහැඬියාව තුළ පැය අටක් පමණ සිටියේය. පසුදා උදේ 10 වන තුරු සිටියහ. ධ්‍යානයෙන් නැගී සිට ඉර මුදුන් වී ඇත. එබැවින් පිණ්ඩපාතයෙන් වැළකී නිරාහාරයෙන් සිටියේය. ඉන්පසු සක්මනේ යෙදෙමින් ඊයේ රාත්‍රී කාලයේ කොටියාගේ අඩි ශබ්දය ඇසුණු පැත්තට ගියේය. කොටියාගේ අඩි සටහන් ඇද්ද ? නැත්නම් තම කණට ඇසුණේ විපරීත සංඥාවක්ද ? පොළොව දෙස බැලූ විට ඇත්තෙන්ම මහා සතාගේ අඩිපාර දිස් විය. තමා සිටි තැනින් අඩි 12ක් පමණ ඈතින් කොටියා ඇවිදගෙන ගියේය. එම පා සළකුණු කොටියාගේ ගල් ගුහාව තෙක් දිගටම ඇත. එය කෙළින් පාරක් ඔස්සේ ඇත. තමා සිටි තැනට ආ බවක් නැත. යාළුවා භාවනා කරනු බැලීමටවත් නැවතී නැත. මෙය මහත් අසිරිමත් දර්ශනයක් විය. පුදුම එළවන දෙයකි.

මෙසේ සිත එකඟ වී අර්පනා සමාධියට පත් වන්නේ එක් එක් අයගෙ ' පුරුදුතාවයෙනි. සමහරු මෙසේ ක්ෂණිකව සමවැදේ. එය සැබවින් ගැඹුරු ළිඳකට වැටීමක් වැනිය. එහෙත් බාහිර අරමුණු නැත. මේ භික්ෂුවගේ අත්දැකීම එවැන්නකි. සිත එම අරමුණේ එල්බ ගත් විට මුළු ලෝකයම අහෝසි විය. නැවත සමාපත්තියෙන් නැගී සිටි විට ප්‍රකෘති සිහිය එළඹේ. නමුත් මේ තත්ත්වයට පත්වීමට මහත් දුක් සහිත අත්දැකීමක් අවශ්‍ය විය. එබැවින් උන්වහන්සේ එවැනි ස්ථාන සොයමින් ගියේය.

''ඇත්තෙන්ම මම ඝන කැළෑ ප්‍රදේශයේ කොටින්ගෙන් ගහන වූ අඩවිය ප්‍රිය කරමි. ඔබට ඔප්පු වන අන්දමට මා වැනි හැඩි දැඩි චරිතයකට එය ගැලපේ.''

මෙම ගල් ගුහාවේ වාසය කරණ කාලයේදී අනිකුත් අද්භූත අත්දැකීම් තිබුණි. භූමාට වූ දෙවිවරු ඇවිත් මා සමඟ කථා සල්ලාපයේ යෙදුනහ. ඊටත් වඩා පුදුම වූයේ ඒ ගම්වාසී යමෙකුගේ මරණය ගැන දැනුම් දීමයි. කෙසේ එය

දැනුණා දැයි නොදනිමි. එය ඉබේම මගේ මනසට දැණේ. එය සත්‍ය ප්‍රවෘත්තියකි. මක්නිසාද එම ගම්මානය සැතපුම් 5ක් පමණ ඈතින් පිහිටි නමුත් එදිනම ගම් වැස්සෝ මා සොයා ඇවිත් භූමදානය පිණිස චාරිත්‍ර, වත් පිළිවෙත් ඉටු කිරීමට කියති. ගමේ යම් මරණයක් වූ විගස මට දැනේ. එවිට ගම්වැස්සෝ එන බව මම නිතැතින්ම දනිමි. මෙය මට සෑහෙන කරදරයක් විය. භික්ෂුවක් විසින් අවසාන කටයුතු කළ විට මළගිය ඇත්තන් හොඳ ආත්මභාවයක් ලබා ගනිතියි ඔව්හු විශ්වාස කළහ. ඔවුන් කෙරෙහි කරුණාවෙන් මම එහි යමි. නිරාහාරව දැඩි වීර්‍යයකින් භාවනා කරන කාලයේදී ඔවුන්ගේ පැමිණීමට නොකැමති වුවද ඔවුහු පැමිණියාහ.

ගල් ගුහාවේ සිටින මුළු කාලය තුළම මා මිත්‍ර කොටියා ඇවිත් මගේ සිත උද්වේගවත් කරයි. රැයක් ඇර රැයක් නොකඩවාම බඩගිනි වූ කොටියා මගේ ගල් ගුහාව ළඟින් ගමන් කරයි. එහෙත් මා ගැන කිසි වගක් නැත. මගේ ගල් ගුහාව අසළින් උගේ ගමන් මාර්ගය ඇත.

මේ භික්ෂුවගේ අස්වාභාවික චරිත ලක්ෂණ ඇත. මහ රෑ යාමයේ තම ගුහාවෙන් නික්ම ගොස් කඳු මුදුනේ කළුගල් තලාවේ භාවනා කරති. වන සතුන්ගෙ න් වන පීඩා, භය උන්වහන්සේ නොදනී. තනිව වනාන්තරයේ සංචාරය කිරීමට කැමති වේ. උන්වහන්සේගේ මේ කථා පුවත ඇතුළත් කළේ ඔබ සැමට වටිනා පාඩමක් වේ යැයි සිතුන බැවිනි. උන්වහන්සේ නොකඩවා තම ප්‍රතිපත්ති රකිමින් වීර්‍යය වඩා තම නොහික්මුන සිත දමනය කළහ. කලින් මහත් අභියෝග වූ කොටියා තම මිත්‍රයෙක් බවට පරිවර්තනය විය. ඔහු තම භාවනාවට උපකාරයකි. වනචාරී මහා බියකරු කොටියා තම භාවනාවට උද්වේගයක් කරගනිමින් සාර්ථ ක ප්‍රතිඵල ලදහ.

බන් නොං ෆිව් ආශ්‍රමයේ ආචාර්ය මන් වාසය කරණ කාලයේදී බො-හෝ ධූතාංග භික්ෂූහු වැඩ සිටියහ. වස් කාලයේදී 20-30 භික්ෂූහු අවට වන ප්‍රදේශයේ වාසය කරති. එතරම් දුෂ්කර ජීවිත ගත කරණ උන්වහන්සේලාට යම්කිසි ප්‍රශ්න ගැටළු කිසිවක් නැත. සියලු දෙනාම සමගි සම්පන්න වෙති. සතුටු සාමීචි ගුණයෙන් සහෝදරත්වයෙන් උන්වහන්සේලා ජීවත් වූහ. දිනපතා සතුටින් සාමයෙන් ගම් පෙදෙසට පිණ්ඩපාතය පිණිස එකවර වඩිති. බලා සිටින අයට එය රමණීය දර්ශනයකි. ගම් මායිමේ දිගු බංකු ලෑල්ලක උන්වහන්සේලා වාඩි වී ගාථා සජ්ක්ධාජනය කර දන් දුන් අයට ආශිර්වාද කෙරෙති. ආපසු ආරණ්‍ය-යට පැමිණ හුදකලාව ආර්ය තුෂ්ණීම්භූත භාවයෙන් දන් වළඳති. වැඩිමහළු පිළිවෙලට පේලියට වාඩි වී දන් වළඳති. දානෙන් පසු තම පාත්‍රය සෝදා රෙදි කැබැල්ලකින් පිසදා රෙදි කවරයේ බහා තැන්පත් කරති. උදේ වතාවත් කිරී-මෙන් පසු තම තමන්ට රුචි පරිදි නිහඬ ස්ථානයක් අවට කැලෑවෙන් පවිත්‍ර කර

එය සක්මන් භාවනාවට හෝ වාඩි වී භාවනාවට යොදා ගනිති. සවස 4 වන තුරු මෙසේ භාවනාවේ යෙදී ආශ්‍රමයට පැමිණ අතුපතු ගා ශුද්ධ කර වතුර ගෙනැවිත් භාජන පුරවා ගනිත්. බීමට පරිභෝජනයට වෙන් වෙන් බඳුන්වල ජලය රැස් කර ඇත. ඉක්මණින් ස්නානය කොට නැවත භාවනාවේ යෙදෙති. යම් රැස්වීමක් නැත්නම් දිගටම රෑ බෝ වන තුරු භාවනාවේ යෙදෙති. සතියකට පමණ පසු ආචාර්ය මන්ගේ දේශනයක් ඇත. එහෙත් තමාට පුද්ගලික ප්‍රශ්නයක් ඇතොත් ආචාර්ය මන් කැමති වේලාවකට හමුවිය හැකිය. සාමාන්‍යයෙන් දවල් ආහාරයෙන් පසු හමුවේ. නැත්නම් සවස 5 ට හෝ රාත්‍රී 8ට හමුවේ. උන්වහන්සේගේ ධර්ම දේශනාවට සවන් දීමට සෑම දෙනාම ඉතා කැමැත්තෙන් බලාපොරොත්තු වෙති. සමහරවිට නොයෙක් අසාමාන්‍ය ප්‍රශ්න භික්ෂූන් අසති. එම පිළිතුරු චිත්තාකර්ෂණීය බැවින් කිසිවෙකු එහි අවසානය දැකීමට නොකැමති වෙති. හැම විටම අගනා පාඩම් ලැබේ. ඉතා ප්‍රායෝගික උපදෙස් අපගේ භාවනාව දියුණු කිරීමට අතිශයින් සුදුසු වේ.

කලාතුරකින් ආචාර්ය මන් උන්වහන්සේගේ ජීවිත කතා ප්‍රවෘත්ති කියති. මුල් කාලයේදී ගිහි ජීවිතය ගත කළ අන්දම, පැවිදි වීම, සාමණේර වශයෙන් සහ උපසම්පදාව ආදී තොරතුරු ගෙන හැර දැක්වීය. සමහර පුවත් හාස්‍ය ජනකය. අපි සියල්ලෝම මහා හඬින් සිනාසෙමු. සමහර පුවත් ඉන් දුක්මුසු විය. සමහර විට භාවනා අත්දැකීම් ගැන කියති. එය මහත් සේ විස්මය ජනකය. දිගටම හොඳ ආචාර්යවරයෙකු සමඟ ජීවත්වීම ඉතාම එලදායී වේ. තම වැරදි දෘෂ්ටි, හැසිරීම් සහ තම මානසික ශක්තිය හොඳ අතට හැරේ. එබැවින් ගුරුවරයා අනුකරණය කරති. පරිසරය ඉතාම නිර්භය වේ. නිතරම ධර්ම අවවාද තුළින් සිත කුසලතාවයට නැඹුරු වේ. නිතර උන්වහන්සේ ඇසුරු කරන බැවින් තම සති පඤ්ඤා දියුණු වේ. ආත්ම සංයමය රැකෙන්නේ ගුරු ගෞරවය සහ බිය නිසාය. කෙතරම් සුපරීක්ෂාකාරීව හැසුරුණත් පොඩි වරදක් හෝ සිදු වුවහොත් සියලු දෙනාම ඉදිරියේ නින්දාවට පත්වන බව නියතය. තමාගේ අඩු ලුහුඬුකම් මෙසේ අසා සිටීම සිත් තැවුලකි. ඒ නිසාම සංවර වේ.

උන්වහන්සේ සමඟ ජීවත්වීම අපට මහත් සතුටක් විය. එහෙත් අප අනවශ්‍ය වැරදි දෘෂ්ටි ගත් විට සතුට අතුරුදහන් වේ. මම මගේ ගැන කථා කරමි. අනුන්ගේ අදහස් නොදන්නා බැවිනි. මම සාමාන්‍යයෙන් ගොරෝසු චරිතයකි. ආචාර්ය මන් මා තලා පෙළා මට සිඑට කර ඇත. මගේ කෙළෙස් වලින් මා තුරන් වන්නේ උන්වහන්සේ මෙසේ මා මෙච්චල් කරණ බැවිනි. උන්වහන්සේගේ අත්දැකීම් ගැන අසා මම මහත් උද්යෝගයට පත් වුනෙමි. මගේ සිත පුළුන් රොදක් මෙන් සැහැල්ලු වී අහසේ පා වෙනවා දැනේ. එහෙත් තනිව භාවනා කරන විට මගේ අකර්මණ්‍යය සිත මහ ගලක් මෙන් බර වේ. මගේ භාවනාව දියුණු නැත. මම හිස පහත් කර ලැජ්ජාවෙන් කම්පා වෙමි. මා

එතරම් දුෂ්චරිතයක් වෙමි.

මගේ චරිතය පිළිබඳ මෙසේ සඳහන් කළේ කෙළෙස් වල තත්ත්වය පැහැදිලි කිරීමටය. කෙළෙස් වලට වසඟ වූ විට කෙතරම් දුර්ගුණයන්ට භාජනය වේද ? එපමණක් නොව ඉන් මිදී නිවන් මාර්ගයේ යෑම කෙතරම් දුෂ්කර කාර්‍යයක්ද ? මේ පිළිබඳ ඔබට යම් අවබෝධයක් දීමටය. මහත් ධෛර්‍යයක් යොදා මෙසේ සිත කෙළෙසුන්ගෙන් මුදවා නොගත්තොත් අපි කවුරු හෝ වේවා කොතැන හෝ වේවා මහත් ව්‍යවසනයකට පත්වනවා නියතය. කෙළෙස් යපටත් කර සිත හික්මවා ගැනීමට විර්ය අවශ්‍ය වේ. තම අසංවර සිත හික්මවා නිදහසේ ජීවත්වන බුදු රහතන් වැනි අසිරිමත් පුද්ගලයන්ට අපි හද බැතියෙන් නමස්කාර කරමු.

ආචාර්ය මන් ඉතාමත් ධෛර්‍යයමත් කෙනෙකි. ඒ නිසා කෙළෙස් වලට වසඟ නොවූයේය. වයස් ගත වූ විට තම දුර්වල ශාරීරිකත්වය තිබියදී පුරුදු පරිදි සක්මන් භාවනා කළහ. බාල වියේ භික්ෂූන්ට ඒ හා සමාන සක්මන් කළ නොහැකිය. ධර්මය උගන්වමින් තම ශ්‍රාවකයන් උනන්දු කළහ. යුද සෙබලෙක් මෙන් අධිෂ්ඨාන ශක්තියෙන් ශ්‍රාවකයන්ට ධර්මය දේශනා කරමින් භාවනාවේ යෙදුවේය. වේගවත් ලෙස ධර්මය දේශනා කළේ තම ශ්‍රාවකයින් දුකින් මුදවා ගැනීමටය. එක් එක් කෙනාගේ අග හිඟකම්, නැති බැරිකම් වලට තැනක් නැත. දුර්වල අය නැලවිලි ගී වලින් නිදි කළේ නැත.

බුද්ධ ශාසනයේ පෙන්වන සූත්‍ර ධර්ම හා ප්‍රතිපත්ති ඉතා ගරු කොට උන්වහන්සේ සැළකුවේය. එය අවබෝධය පිනිස අනුගමනය කළහ. මේ වකවා-නුවේ මෙවැනි බුද්ධ ශ්‍රාවකයින් සෙවීම උගහටය. උන්වහන්සේ ධූතාංග 13ක් පිරීමට අන් භික්ෂූන් නිතර උනන්දු කළහ. බෞද්ධයෝ ධූතාංග පිරීම අත්හැර දමා තිබුණි. එහි ඇති අගය දැක්වීමට නොහැකි වූයේ ධූතාංග පූරණය නොකළ බැවිනි. ආචාර්ය සඕ සහ ආචාර්ය මන්ගේ මහත් ධෛර්‍යය තුළින් උතුරු තායිලන්තයේ ධූතාංග දරණ භික්ෂූන් දැන් සිටිති. මේ දෙනම ධූතාංග 13නම යම් යම් කාලවලදී සපුරා ඇත. දෛනික වශයෙන් මූලික ධූතාංග පමණක් අනුගමනය කළ බව මම සඳහන් කළෙමි. සුසානයේ හා රුක්මුල් වාසය නිරන්තරයෙන්ම පුරුදු කළ බැවින් එය උන්වහනසේලාට ඉතා හුරු පුරුදු විය. උතුරු නැගෙනහිර භික්ෂූන් මේ පරපුරට අයත් වේ.

ආචාර්ය සඕ සහ ආචාර්ය මන් තම අත්දැකීම් තුළින් මේ ධූතාංග 13 අවශ්‍ය බව පිළිගනිති. මේ ධූතාංග පූරණය තුළින් කෙළෙස් ගලා එන විවර වසා දැමේ. මේ තාපස ක්‍රම අනුගමනය නොකළ විට ධූතාංග භික්ෂූන් නමින් පමණක් ධූතාංග වේ. ඔවුන්ගේ කෙළෙස් නිදැල්ලේ ගලා යති. ඉන් තමන්ටත් අනුන්ටත් සෑහෙන වධ හිංසා පැමිණේ. ධූතාංග ප්‍රතිපත්ති රකින විට තම හැසිරීම, ශීලය

කිසි කෙනෙකුට විවේචනය කළ නොහැකි සේ නිතරම සිහි කල්පනාවෙන් සති පඤ්ඤාවෙන් වාසය කරන බැවින් නිවන් මාර්ගයේ ගමන් කරයි. අනවශ්‍ය සිතිවිලි, වචන, ක්‍රියා වලින් බැහැර වේ. නිතරම මුර භටයන් මෙන් සිත, කය හා වචනය ආරක්ෂා කරයි. හැම ධූතාංගයකින්ම විශේෂ කාර්‍යයක් සිදුවේ. ඉන් කෙළෙස් මුලින් උපුටා දැමීමට හැකිවේ. ධූතාංග ඉදිරියේ කෙළෙස වලට නැගී සිටිය නොහැකිය.

මෙවැනි තපස් ව්‍රත රැකීමට භය චකිත ඇත්නම් කෙළෙස් නැගී සිටිති. කෙළෙස් වලට වසඟ වූ විට විඳින දුක් ඉක්මණින් අමතක වේ. ඒ නිසා ධූතාංග රැකීමේ දුක පමණක් දකිති. එය ඉතා දුෂ්කර, කටුක ඇත්තෙන්ම යල් පැනපු අභාවයට ගිය ප්‍රතිපත්ති ලෙස සළකති. අපේ සිතිවිලි අපේ සතුරන් වන්නේ කෙළෙස් රහසිගතව පැන නැගීම නිසාය. තම වින්දනය නිසා මේ බව අමතක වේ. කෙළෙස් වලට මෙසේ රහසිගතව අනුග්‍රහය, අනුමතය, ආධාරය ලැබේ. එහි විපාක අනන්ත අප්‍රමාණ බව පැහැදිලිය.

යම් භික්ෂුවක් ධූතාංග එකක් හෝ කීපයක් රකින විට ඔහුගේ බාහිර පෙනුම තේජාන්විතය. ඔහුගේ අවශ්‍යතා අඩු බැවින් වැඩ බහුල නැත. කන්නේ, නිදන්නේ කෙසේද යන්න ප්‍රශ්න නොවේ. තමන්ගේ අවම බඩු බාහිරාදියෙන් සතුටට පත්වේ. මානසික ශාරීරික බැඳීම් වලින් නිදහස් බැවින් සැහැල්ලු ඉපිල යන ප්‍රීතිමත් මනසක් ඇත. ගිහි අයට වුවද සමහර ධූතාංග රැකිය හැකිය. ගිහි පැවිදි සැමටම කෙළෙස් ඒකාකාරව පැන නගී. ධූතාංග ප්‍රතිපත්ති රකින්නේ කෙළෙස් මැඩ පැවැත්වීමටය. මේ කරුණ නිසා ධූතාංග රැකිය යුතුය. ධූතාංග යනු සංකීර්ණ ධර්ම ස්වභාවයකි. එහි ක්‍රියාකාරිත්වය කියා නිම කළ නොහැකිය.

මේ ලියන මට ද ධූතාංග ප්‍රතිපත්ති ගැන සතුටුදායක් අවබෝධයක් නැත. එහෙත් හැකි පමණින් ධූතාංග රකිමි. මේ පිළිබඳ ඔබගේ සමාව අයදිමි. කෙටියෙන් කියත හොත් ධූතාංග යනු ඉතා ගැඹුරු ප්‍රඥා ගෝචර ප්‍රතිපත්ති වෙති. ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරයක් කිරීම උගහටය. ධූතාංග පූරණය නිසා යමෙක් ප්‍රාථමික ධර්ම මාර්ගයේ සිට වුවද ඉතා උසස් ආර්ය භූමියට පත්විය හැකිය. මේ වනාහි ධූතාංගයන්ගේ ශක්තිය වේ. ධූතාංග තුළින් ලබාගත නොහැකි ධර්මයක් නැත. ගුරුවයෙක් වශයෙන් ආචාර්ය මන් ධූතාංග වැනි තපස් කිරීමට තම ශිෂ්‍යයන් පොළඹවා ගත්හ. ශාරීරික ශක්තිය වැය වී අවසාන මොහොත දක්වාද ධූතාංගයන්හි නියැලී සිටියහ. මරණ මොහොතේදී පමණක් අත්හළහ. යමෙකුගේ සියලු කෙළෙස් දුරු කිරීමට මේ ධූතාංග රැකිය යුතු බව නිසැකය.

ධූතාංග රැකීමේ කුසලතාවය ගැන විස්තර කිරීමෙන් මම වළකිමි. යමෙකුට

මෙහි අගය දැන ගැනීමට අවශ්‍ය නම් එය තමාම අත්දැකීමෙන් දැනගත යුතුය. අනුන් විසින් ලියන ලද විස්තරයට වඩා තමා යම් ධූතාංග පුහුණුවකින් ලබා ගන්නා සියුම් දැනුම වටනේය. මම මුල් කාලයේදී සිට ධූතාංග පූරණයෙන් ලබාගත් අත්දැකීම් හා ධර්මාවබෝධය අද දක්වා නොසැළී පවතී. මගේ ප්‍රතිපත්තියේ ඉතාම අගනා අංශය මෙය වේ. යමෙකුට තමාගේ මිලේච්ච අකුසල හා සියුම් අකුසල දුරුකටයුතුකම් ධූතාංග තුළින් එය කළ නොහැකියි නොසිතුව මැනවි.

## උන්වහන්සේගේ අවසාන රෝගය

1949 මාර්තු මන විට ආචාර්ය මන් බන් නොං ෆිව් ආරාමයේ වර්ෂ 5ක් වැඩ සිටියහ. චන්ද්‍ර මාසයෙන් හතරවෙනි මාසයේ 14 වෙනි දින උන්වහන්සේගේ ශාරීරික දුබලතාවය උත්සන්න වී මරණාසන්න බවක් පෙනුණි. එවිට වයස අවුරුදු 79කි. උන්වහන්සේගේ මුළු ගත වෙව්ලා රෝගා තුර වූ අතර අපි සියලු දෙනාගෙ " ගත සිත කම්පා විය. මුලදී ලා උණයක් හා කැස්සක් තිබුණි. එය දිනෙන් දින වඩිවිය. එය අස්වාභාවික බව අපට වැටහුනි. උන්වහන්සේ හොඳාකාර තම ජීවිතය අවසාන වන බව දනිති. එම රෝගයට ප්‍රතිකාර නැත. සියලු දෙනාට මේ බව දැනුම් දී බෙහෙත් ගැනීමෙන් වැළකුනි. බෙහෙත් ගන්ට උනන්දු කළ විට ප්‍රතික්ෂේප කළහ.

''මේ වනාහි වයස් ගත මිනිසෙකුට වැළඳෙන රෝගයකි. එයින් මිදීමක් නැත. මොන බෙහෙත ගත්තත් සුව නොවේ. දැන් ඉතිරිව ඇත්තේ ප්‍රාණ වා-යුවයි. නියම වේලාව එනතුරු සිටිය යුතුයි. ඉන්පසු එයද නිරුද්ධ වේ. මැරිච්ච ගසක් තවම කෙළින් සිටින්නාක් මෙනි. පෝර වතුර දා ප්‍රකෘති කළ නොහැකිය. එය කිසි කළෙක මල් එල හට නොගනී. මේ මැරිච්ච ගස යම් වේලාවක ඇද හැලී පොළොවට පහත් වේ. මගේ ශාරීරික තත්ත්වය මම මීට බොහෝ කලකට පෙර දුටිමි. එබැවින් නිතරම ඔබට අනතුරු ඇඟවූයෙමි. ඉක්මන් කරන්න. වීර්යය වඩන්න. මම ජීවත්ව ඉන්නා තුරු ඔබට උපකාර කරමි. යම් යම් ප්‍රශ්න නිරාකරණය කරමි. මේ අවස්ථාව පැහැර හැරියොත් අනන්ත කාලයක් සසර සැරි සරන්නට වේ. මම වැඩි කලක් ජීවත් නොවෙමි. අනිත්‍යතාවයේ නීතියට යටත් වෙමි. සියලුම පටිච්ච සමුප්පන්න ධර්මයෝ මෙසේ විනාශ වෙති. මීට අවුරුදු 3කට පෙර මගේ ආයුෂ තව අවුරුදු 3ක් බව කීවෙමි. ඊට වඩා කුමක් කියම්ද ? මම කීවේ සත්‍යතාවයකි. සසර සැරිසරණ මනුෂ්‍යන් හා සත්ත්වයන් කය හා සිත තුළ කර්ම ශක්තිය නොකඩවා ක්‍රියාත්මක වේ. එය ස්වාභාවිකයි. තව මාස ගණනකින් එහි ක්‍රියාකාරිත්වය නිමාවට පත්වේ. එහි ස්වභාවය වෙනස්

කරන්නේ කෙසේද ?

බොහෝ දෙනා පැමිණ නොයෙක් විධියේ ප්‍රතිකාර දීමට මහත් ප්‍රයත්නයක් දැරූ නමුත් ඒ සියල්ල ප්‍රතික්ෂේප කළහ. මේ රෝගයට මෙය ප්‍රත්‍යක්ෂය බොහෝ දෙනා මේ බෙහෙතින් සුව වූ මැනව''යි බැගෑපත්ව ආයාචනා කරති. ''ඔබ වහන්සේගේ සේවය අවශ්‍යය. බොහෝ දෙනාට අනුකම්පා කර මේ ප්‍රතිකාරය කරන්ටයැ''යි ඉල්ලා සිටියහ. එවිට තමන් වහන්සේගේ ශරීරයට අවශ්‍ය වන්නේ බෙහෙත් නොව දර සෑයට දර යයි කියති. තව තවත් කියන විට ඒ සියලු දෙනා තව තවත් ඇවටිලි කරති. බැරිම තැන ඉතා ස්වල්ප වශයෙන් බෙහෙත් ගනිති. තමන් වහන්සේ ශරීරය අත්හැර ඇතැයි මිනිසුන් මුලාවෙන බැවින් ඔවුන් සතුටු කිරීමට එසේ කරති.

උන්වහන්සේගේ රෝගී තත්ත්වය ගැන ආරංචි වී හතර දිග් භාගයේ බොහේ අය පැමිණෙන්ට විය. ඉතා දුර බැහැර සිට අව් වැසි නොබලා භික්ෂූන් වහන්සේලා ද ගිහි පිරිසද වැසි වසින්නාක් මෙන් පැමිණෙති. උන්වහන්සේ වාසය කරණ බන් නොං ෆිව් ආරාමය පිහිටියේ ඝන වනාන්තරයෙන් වට වූ නිම්නයකය. මහ පාරේ සිට සැතපුම් 12-15 පමණ ඈතිනි. පා ගමනින් මේ මාර්ගය ඔස්සේ සියලු දෙනා පැමිණෙති. තමා විඳින බලවත් ආයාසය ගණනක් නැත. ඉතා වයස් ගත වූ අය ගොන් කරත්තයකින් පැමිණෙති.

ආචාර්ය මන් නිතර කැමති වූයේ හුදකලා ජීවිතයකටය. ආවාසයේ වෙසෙන භික්ෂූන් වුවද උන්වහන්සේ බැහැ දකින්නේ කලාතුරකිනි. එබැවින් බොහෝ අයගේ පැමිණීම උන්වහන්සේට ප්‍රශ්නයක් විය. අසනීප වූ විට ළඟම ශිෂ්‍යයන්ට වුවද පැමිණ සාත්තු කිරීමට නොසතුටු වෙති. සාත්තු සේවා කරන විට ඉතා සුපරීක්ෂාකාරී විය යුතුය. ඉතාම සුහඳ භික්ෂූන් වහන්සේලා පමණක් එසේ සාත්තු කිරීමෙහි යෙදේ. ජ්‍යෙෂ්ඨ භික්ෂූන් ඒ පිළිබඳ අවධානයෙන් කාලය නොවරදවා සුදුසු අය පමණක් යොදවති. ඒ අයගේ කථාව හැසිරීම ඉතාම උසස් තත්ත්වයකින් තිබිය යුතුයි.

එහි පැමිණි පිරිස යම් කාලයක් රැඳී සිට සුදුසු අවස්ථාවක් ලබාගෙන උන්වහන්සේට වැඳ බැහැ දකිති. මෙපමණ දෙනා උන්වහන්සේ දැකීමට පැමිණ ඇති බව කලින් කුටියට ගොස් එක් භික්ෂුවක් දන්වා සිටියි. එවිට අවසර ලැබුණ විට පමණක් ඒ අය ඇතුල් කරත්. මඳ වේලාවක් ඔවුන් සමඟ කථා කළ විට ඔවුහු ඉතා ගෞරවයෙන් නමස්කාර කර ඉන් පිට වී යති. සාමාන්‍ය අමුත්තන්ට මෙසේ වුවත් උන්වහන්සේගේ ප්‍රියතම ගෝලයින් වූ ආචාර්යවරුන්ට විශේෂ ලැදියාවක් ඇත. ඒ අය කිසි විචාරීමක් නොමැතිව උන්වහන්සේ සමඟ පිරිසඳරෙහි යෙදෙති. සතුටු සාමීචි භාවයෙන් ''සාමීචිපටින්නො'' වෙති.

මෙසේ මාස ගණනාවක් පසුවිය. රෝග ලක්ෂණ උත්සන්න වූයේ නැත. එහෙත් ත්‍රස්තවාදීන් ක්‍රමයෙන් සන්නද්ධ යුද්ධයක් කර තම ප්‍රතිගාමීන් විනාශ කරන්නාක් මෙන් නිතරම රෝගී තත්ත්වයෙන් කල්ගත කළහ. උන්වහන්සේගේ ශ්‍රාවකයින්ට මෙය ඉවසිය නොහැකි විය. ඔවුන්ගේ හද පත්ලෙන් පුදකළ භක්ති ආදරය සුන් බුන් වී ගියේය. සියලු දෙනාගේ සිත් දුකින් කම්පා වෙති. ආචාර්ය මන්ගේ රෝග පිළිබඳ එකම කථාවය. වෙන කිසිවක් කථා කළත් අවසන් වන්නේ ආචාර්ය මන්ගේ රෝගය ගැනය.

කෙතරම් දුර්වල වුවද ආචාර්ය මන් ධර්මය දේශනා කරති. තම ගෝලයින්ට ඇති අසීමිත කරුණාවේ අඩුවක් නැත. ඉතා කෙටි දේශනයකින් පසු ප්‍රශ්න විචාරති. ඉන්පසු ඉක්මණින් නැගී සිට තම කුටිය කරා ගමන් කරන්නේ දැඩි වෙහෙස සංසිඳවා ගැනීමටය. එහෙත් එහි ආශ්චර්ය නම් උන්වහන්සේ ධර්මය දේශනා කරණ විට කිසිවෙකුට උන්වහන්සේ අසාධ්‍ය රෝගියෙක් බව නොපෙනීමයි. උන්වහන්සේගේ වචනවල ප්‍රබල තියුණු ස්වරයක් ඇත. ශබ්ද නගා සාමාන්‍ය විලසින් ධර්මය දේශනා කරති. යමක් ගරු ගාම්භීර ලෙස කිය යුතු නම් මහත් හඬින් නිර්භයව කියති. කිසිවක් සඟවා කථා නොකරයි. ඒකාන්තයෙන්ම විවෘතව කියාපාන අන්දම නිසා රෝගී තත්ත්වය නොපෙනුණත් අවසානයේදී කෙතරම් වෙහෙසකට පත් වී ඇත්දැයි අපට වැටහේ. එබැවින් ඉක්මණින් දේශනාව නිමාවට පත් කරති.

මාස පූජා පොහොය දිනය පෙබරවාරි 1949 යෙදී තිබුණි. එදින බොහෝ භික්ෂූන් රැස්ව සිටියහ. එදින රාත්‍රී අටට ධර්ම දේශනාව පටන් ගෙන අවසාන වූයේ මධ්‍යම රාත්‍රියේදීය. එනම් පැය 4 ක් පමන නොනවත්වා දේශනා කළහ. අසා සිටි අය විස්මයට පත් වූහ. එපමණක් නොව සියලු දෙනාගේ චිත්තාකර්ෂණය කෙතරම් බලවත්දැයි නම් තමා ඉන්නේ කොහේද ? මුළු විශ්වය අතුරුදහන් වී ඇත. සිත ඒකාග්‍රතාවයෙන් සමාධිගත වී ධර්මයට සවන් දෙති. ධර්ම දේශනාව පටන් ගත්තේ 1250 රහතන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ හමුවීමට මාස පොහොය දිනයේ රැස් වූ සිද්ධිය මතක් කරමින්ය.

''එදින 1250ක් මහරහතන් වහන්සේලා බුදුන් දැකීමට නොයෙක් පළාත් වලින් පැමිණ සිටියහ. උන්වහන්සේලා ඉතාම පිරිසිදු චිත්ත සන්තානයෙන් යුතු බැවින් නිකෙළෙස් ක්ෂීණාශ්‍රවයන් විය. එදින ''විසුද්ධි උපොසථයකි'' බුදුරජාණන් වහන්සේ ප්‍රාතිමොක්ෂය දේශනා කළහ. එදින එම සිද්ධිය හා අද මෙතැන රැස් වී ඇති ඔබ සියලු දෙනා ගැන සිතා බලමු. ඔබද ප්‍රාතිමොක්ෂය දේශනා කර අද පොහොය කිරීම සිදු කරති. එහෙත් මෙහි සිටින ඔබ කිසිවෙක් නිකෙළෙස් ක්ෂීණාශ්‍රවයන් නොවෙති. මෙය පිළිගන්නේ කෙසේද ? ඔබ මහණ දම් පුරණ බුද්ධ පුත්‍රයේ වෙත්ද ? ඔබ එම රහතන් වහන්සේලාගේ තත්ත්වයට හා සමාන

කරන්නේ කෙසේද ? එය අර්ථ සූන්‍ය දෙයකි. ''Good man'' කියා නම් දරණ පුද්ගලයෙක් ඇත. නමුත් ඇතුල් අකුශල බරින් පීඩිත වී ඇත. ඔහුගේ නම හිස් ප්‍රලාපයක් වේ. බුද්ධ කාලීන භික්ෂූන් ඇත්තෙන්ම ධර්මය අනුගමනය කර අර්හත්වය ලැබූ සත්‍ය වශයෙන්ම භික්ෂූහු වෙති. අද භික්ෂූන්ගේ යසෝ රාවය ඉර හඳ මෙන් දීප්තිමත්ය. එහෙත් කරන කර්ම ඉතා පිළිකුල් වූ නිසා අවීචි මහ නරකාදියට පමුණුවන්නේය. ඔවුන් තුළ සත්‍යය, පාරිශුද්ධිය, ශීලය සොයා ගැනීමට හැකිද ? මේ අය කරන්නේ කෙළෙස් රැස් කිරීමකි. එය ඔවුන් පසු පස යයි. අද භික්ෂූන් තම සන්තානයේ කෙළෙස් උදුරා දැමීම නොකරති. එවැනි අයගේ රැස්වීමක් ''විශුද්ධි උපොසථයක්'' වෙත්ද ? මහණ උපසම්පදා වූ පසු තමන්ගේ නම, කීර්තිය, තත්තවය රැකගෙන බෞද්ධ භික්ෂුවගේ සිල් ගුණයන් සංකේතවත් කරති. එහෙත් බෞද්ධ භික්ෂුවගේ සීලාදී ගුණයන් මොනවාදැයි නොදනිත්. බුදුරජාණන් වහන්සේ උපොසථ දිනය දී දේශනා කරන ප්‍රාතිමොක්ෂ දේශනයේ බලවත් බව, ගාම්භීරත්වය දන්නවා නම් ශීලය යනු කුමක්දැයි වටහා ගත හැකිය. ඉතා කෙටියෙන් ඔවාද ප්‍රාතිමොක්ෂය නම් ''සබ්බ පාපස්ස අකරණං'' සියලු පව් දුරු කිරීම කුසල හෙවත් ගුණ නුවණ බහුල වශයෙන් පුරුදු කිරීම - සිත ඉතා දීප්තිමත්ව බැබලීමට පත්වන සේ පිරිසිදු කිරීම හෙවත් සති - සමාධි වැඩීම වේ. මෙය වනාහි ප්‍රාතිමොක්ෂ දේශනයේ කෙටි සාරාංශයකි.

සියලු පව් දුරු කිරීම යනු කුමක්ද ? සමහරු කයින් පව් නොකරති. එහෙත් වචනයෙන් පව් කරති. සමහරු කයින් හා වචනටයනි පව් නොකරති. එහෙත් සිතින් පව් කරති. උදේ සිට රෑ වන තුරු මෙසේ පව් රැස් කරති. නින්දට ගොස් පසුදා උදෑසන පිබිදී කරන්නේත් පව්මය. දිනපතා මෙසේ පව් රැස් කරති. මෙසේ දිනපතා රැස්වන අකුසල් ගැන වගක් වත් නැත. තමා ඉතා හොඳයයි සිල්වත් යැයි සිතති. නමුත් ඒ සීලය වචනයක් පමණි. නමට පමණි. එසේ හෙයින් කිසි කළෙක සීලයක් නැත. ඒ වෙනුවට ඇත්තේ කෙළෙස් වැඩීම සහ සිතේ නොසන්සුන් බවකි. මෙය එසේ මැයි යමෙක් කරදර සොයා යන විට ලැබෙන්නේ කරදරමයි. වෙන මොනවා ලැබෙත්ද ? සම්මුති ලෝකයේ මේවා බහුල වශයෙන් ඇත.

මේ ආදී වශයෙන් ආචාර්ය මන් සීලය ගැන භාවනා යෝගී භික්ෂූන්ට තර්ජන ගර්ජන කරති. එසේ කරන්නේ සත්‍යය අවබෝධ කිරීමටය. ඉන්පසු සමාධි පූර්ණය ගැන දේශනා කළහ. ඉන්පසු පඤ්ඤා ගැනද අවබෝධය ගැනද නිවන ප්‍රත්‍යක්ෂ කිරීමද කියා දෙති. මෙය වනාහි අති පාරිශුද්ධ මිදීම හෙවත් විමුක්තියයි. එදින දේශනය වේගවත්ව විවෘතව කිසිවක් නොසඟවා අදහස් ප්‍රකාශ කිරීමකි. එම දේශන ගැන කලින් සඳහන් කර ඇති බැවින් නැවත නොලියමි. එම භික්ෂූන් සමූහයා පැය හතරක් ගල් ගැසී සිටියහ. කිසිම කෙනෙකුගේ ශබ්දයක් නැත. ධර්මය ගලා යන්නාක් මෙන් ව්‍යක්ත ලෙස මනා කථිකත්වයකින් නොනවත්වාම ඇද හැලෙති. එය විශ්මිතය. අපූර්වය. මෙය උන්වහන්සේගේ අවසාන දෙසුම

විය.

අනතුරුව ඇඟවීමක් වශයෙන් මෙය තමාගේ වයස් ගත වූ ජීවිතයේ අවසාන දේශනය බවත් නැවත එවැනි දේශනා නොකරණ බවත් පැවසූහ. ඉන් මසකට පසු උන්වහන්සේ බලවත් ලෙස රෝගාතුර විය.

කෙතරම් ශාරීරික දුබලතා තිබුණත් ගමට පිණ්ඩපාතය පිණිස වඩිති. අන්තිමට මුළු ගමන යා ගන්ට නොහැකි බැවින් මගක් දුර පමණක් ගොස් පිණ්ඩපාතය ලබා ගනිත්. ඉන්පසු ගිහි පැවිදි පින්වතුන් ආරාමයේ දොරටුව සමීපයේ සිට පිණ්ඩපාතය පූජා කරති. ක්‍රමයෙන් ශරීරයේ බලවත් දුර්වලතාවයක් ඇති විය. මේ කෙතරම් ආගාධ ඇතත් දිනකට එක් වරක් පමණක් ආහාර වැළඳූහ. එය තම පාත්‍රයෙන් පමණක් වැළඳූහ. අපි මේ උතුම් සාන්තුවරයා දෙස බලමින් පුදුම වූවෙමු. කෙළෙස් වලට තැනක් නැත.

අපට එවැනි තත්ත්වයක් උදා වූයේ නම් අප ඔසවාගෙන ගෙනියන්ට සිදුවේ. මෙය ඇත්තෙන්ම ලැජ්ජාවකි. අප ලොහොඹුවේ තබා පෙති ගසන්නාක් මෙන් සිටින හැටි බලා කෙළෙස් සිනාසෙති. මරා මස් කරණ තෙක් මේ අභිමානවත් පුරුෂයන් කෙළෙස් වලට යටත් වේ. මෙවැනි අවස්ථාවන්ට මුහුණ දීමට හැකි නිසා අප නිතර ආචාර්ය මන්ගේ ප්‍රතාපවත් චරිතය ගැන සිහිපත් කළ යුතුය. එවිට බෞද්ධ ප්‍රතිපත්ති රැකීමට උනන්දු වේ. නැතහොත් කෙළෙස් සතුරන්ගෙන් බැට කාගෙන පරාජයට පත්වෙති.

ක්‍රමයෙන් ආචාර්ය මන්ගේ රෝගය බලවත් විය. අපි සැවොම රහසින් කතිකා කර රාත්‍රියේ කණ්ඩායම් වශයෙන් උන්වහන්සෙගේ කුටිය යට මුර කළෙමු. උන්වහන්සේ ඒ පිළිබඳ විරෝධය පළ කරන බැවින් එසේ රහසිගත වීමු. ඉන්පසු අපගේ බලවත් ඉල්ලීම පරිදි උන්වහන්සේගේ කුටිය ඉදිරිපිට ආලින්දයේ භික්ෂූන් දෙනමකට රාත්‍රියේ හිඳීමට හැකිවිය. දෙනමක් පහත මාලයේ වැඩ සිටිති. අන් සියලු දෙනා මාරුවෙන් මාරුවට මෙසේ සේවා කළහ.

වස් කාලය අවසන් වූ විට ජ්‍යේෂ්ඨ ශිෂ්‍ය භික්ෂූන් නොයෙක් පළාත් වලින් ඇදී ආහ. උන්වහන්සේට වැඳීම්, පිදීම් කිරීමට හා උපස්ථාන කිරීමට බොහෝ භික්ෂූන් රැස්වූහ. එක් දිනක් ඉතාම අසාධ්‍ය තත්ත්වයේ සිට තමන් වහන්සේගෙ " පරිනිර්වාණයෙන් පසු පිළිපැදිය යුතු අන්දම පිළිබඳ සියලුම භික්ෂූන් අමතා කථා කළහ.

මම දැන් අවසාන කාලයට ළං වී ඇත. මම මළ පසු සිදු වන්නේ කුමක්දැයි සිතා බලමු. සියල්ල සැලසුම් කළ යුතුය. මා මැරෙන බව කීප වතාවක්ම පැවසුවෙමි. මගේ මරණය මනුෂ්‍යයන්ට පමණක් නොව තිරිසන් සතුන්ට වුවද

බලපාන කරුණකි. මම මේ බංනොං ෆිව් ආරාමයේ මරණයට පත්වීමට කැමති නැත. මෙහි මලොත් මා බලන්ට එන මහා සේනාවට ආහාර පිණිස සත්ත්ව ඝාතනය සිදු කරති. එක්කෙනෙකුගේ මරණය නිසා බොහෝ සතුන් මරණයට පත්වෙති. මෙහි ආහාර ලබා ගැනීමට වෙළෙඳ සැල් නැත. මම මහණ වූ දින සිට සත්ත්ව හිංසාවෙන් වැළකුණෙමි. කරුණාව නිතර මගේ සිත තුළ රජ කෙරේ. මම නිතර මෙත් වඩා සියලු සත්ත්වයින්ට පිං අනුමෝදන් කරමි. මගේ මරණය කිසිවෙකුට හිංසාවක් නොවේවා.

ඔබ මා සකොන් නබොන් කරා ගෙන යනු මැනවි. එහිදී මගේ මරණය සිදු විය යුතුයි. එහි විශාල වෙළෙඳ සැල් ඇත. නිතර දෙවේලේ මෙහි එන පිරිස වැඩිවෙමින් පවතී. මෙය සැමට විශාල ප්‍රශ්නයකි. බොහෝ දෙනා මගේ මරණය ගැන කම්පා වෙති. එහෙත් එය ප්‍රශ්නයක් නොවේ. මගේ මරණයට මම සූදානම්ව සිටිමි. මගේ ශරීරයෙන් ගැලවී යාම ගැන කිසි කණස්සල්ලක් නැත. ඒ පිළිබඳ නියම ආකාරයට විචාරා ඇත. මූල ද්‍රව්‍ය රැසක් එක් වී සැදුම් ලත් මෙම ශරීරය කැඩී බිඳී එම මූලද්‍රව්‍යයන්ට පරිවර්තනය වනු ඇත. මට ඇලීම් කිරීමට කිසිවක් නැත. ගමේ කොරටුවල සතුන් ජීවිතක්ෂයට පත්වීම ගැන පමනක් දුක්වෙමි. පාර දෙපිගේ මස් ගාත් පිටින් විකුණන තැන් දැකීමට කැමති නොවෙමි. එබැවින් මම ඉක්මණින් පිට වී යා යුතුය. මේ පිළිබඳ යමෙකුට කීමට දෙයක් ඇත්නම් දැන් කථා කරන්ට අවස්ථාවයි.

කිසිවෙක් කථා නොකරති. මුළු සේනාව තුෂ්ණීම්භූතව බලා සිටිති. ''යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං'' තත්ත්වය ඉතා බැරෑරුම්ය. මෙහි සිටීම හෝ සකොන් නබොන් ගෙන යැම ප්‍රශ්නයක් නොවේ. උන්වහන්සේගේ අභාවය පිළිබඳ සියල්ලෝම දුක් වූහ. අන්තිමේදී උන්වහන්සේගේ මතය අනුව සියලු දේ කිරීමට තීරණය ගත්හ.

කලින් බන්නොං ෆිව් ගම්වැසියෝ උන්වහන්සේගේ අපවත් වීම එම ගමෙහි සිදුවීම තමන්ට ලොකු නම්බුවක් ලෙස සැළකූහ. ''අපි ඉතා දිළිඳු වුවත් අපේ හදවත් පොහොසත්ය. අපි සියලු ආදාහන කටයුතු සිදු කරමු. මෙවැනි මහා ආචාර්යවරයෙකුගේ අවමඟුල් උත්සවය අපට සිදු කිරීමට හැකියාව ඇත. අපි සැවොම අපේ ජීවිතය වුවද පිදීමට සූදානම් වෙමු.'' අපි මේ මෘත දේහය ගෙන යන්ට ඉඩ නොදෙමු. අපේ අන්තිම හුස්ම දක්වා ඒ ගැන සටන් කරමු.

ආචාර්ය මන්ගේ කථාව අසා එම ගම්වැසියෝ අධික සිත් තැවුලකට පත් වූහ. උන්වහන්සේ දැක්වූ කරුණු මත කිසිවෙකුට කථා කළ නොහැකිය. නමුත් එය ඔවුන්ගේ හදවත් දෙදරා ගියේය. ඇත්තෙන්ම ඒ පිරිස අපගේ අවංක කරුණාවට හා අනුකම්පාවට පත්වූහ. ඔවුන් ජීවිත පූජාවෙන් ආචාර්ය මන්

පුදන බව මම දැනුත් සිහිපත් කරමි. ඔබ සියලු දෙනාම ඔවුන් කෙරේ අනුකම්පා කරණ බව මට විශ්වාසයි.

සියලු ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය පිරිස සහ රැස්ව සිටි පිරිස උන්වහන්සේ ඔසවාගෙන යාමට කලින් ඇඳක් සැදීමට විධි විධාන කළහ. පසුදා විශාල පිරිසක් එම ගිලන් ඇඳ උන්වහන්සේගේ කුටිය අසළට ගෙනාහ. සියලු දෙනාම දුකින් ඇලලී ගියහ. තමන් බොහෝ සෙයින් ප්‍රිය කළ වස්තුවක් නිසැකයෙන්ම නැතිවේ. එහි සිටි සියලු දෙනාම දරා ගන්ට බැරි ශෝකයෙන් හඬා වැලපුනාහ.

හීල් දානයෙන් පසු ගමන ආරම්භ කිරීමට නියමිතයි. ගමේ මිනිසුන්ගෙ" දුක, අප්‍රමාණය. සියලු දෙනාගේ හදවත් තුළ ඇති බලවත් සංවේගයෙන් ඇස් වලින් කඳුළු සලති. ඒ මොහොතේදී ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ ආචාර්ය මන් ඔසවාගෙන අවුත් ඇඳෙහි තැන්පත් කළහ. සියලු දෙනාගේ ආදරය, ගෞරවය, දුක නිම් හිම් නැත. ගිහි ස්ත්‍රී පුරුෂ පිරිස ශ්‍රාවක භික්ෂූන්, සාමණේරවරු එකසේ කඳුළු සළති. ඒ දුක කියා ගන්ට බැරි තරම් විය. මම ද ඒ හා සමඟ මහත් සේ දුක් වුනෙමි. එහෙත් මම එම ගමන යාමට නියමිතයි. මිනිස්සු විලාප තියමින් ''ඔබ වහන්සේ සුව වී නැවත එන්න'' යැයි වැළපුනාහ. ''අප අතරමං කර මේ ලෝකයෙන් යන්ට එපා'' ඔවුන්ට කිසි අස්වැසිල්ලක් නැත. මේ අය කෙතරම් අසරණදැයි ආචාර්ය මන් කම්පා විය. ඒ අය දැන උගත් වුවද ඉවසන්ට බැරි විය. උන්වහන්සේ අප හැර යති. නැවත මෙහි නොඑතියි මහත් සේ කම්පා වූහ. හීල් දානයෙන් පසු සියලු දෙනා ගමනාරම්භය ගැන මහත් සූදානමින් සිටියහ. ගමේ මිනිස්සු කුටිය වටා එක්රොක් වූහ. තම දුක ප්‍රකාශ කළේ බැගෑපත්ව හඬමිනි. භික්ෂූන්ට සහ සාමණේරවරුන්ට ද ඉවසිය නොහැකිය. ආචාර්ය මන් මේ මධ්‍යයේ ඔසවාගෙන යන මඟ දෙපස භූමි කම්පාවක් නිසා ඇති වූ මුහුදු රැල්ලක් මෙන් කලබලය අතිශය දුක්මුසු විය. උන්වහන්සේ රැගෙන යන පිරිස ගිය පසු මුළු ප්‍රදේශය මහා ඝන අඳුරක් මෙන් නිහඬ විය. ඔවුන්ගේ ජීවිත එකවරම නැතිවිය. ගස්, කොළං පවා නිහඬතාවයකින් නොසැලී සිටිති. ආචාර්ය මන් තම ශිෂ්‍ය පරම්පරාවක් සමඟ විසූ වන පෙදෙස හිස්විය. අවුරුදු ගණනාවක් ගමේ වැසියෝ නිතර අවුත් තම දුක් ගැනවිලි නිරාකරණය කළ ආවාස භූමිය හිස්විය. තව භික්ෂූන් එහි වාසය කළත් විශාල වෘක්ෂ රාජයා පෙරළී ඇත. එම රුක් සෙවණේ අභය දානය ලබාගත් පිරිස, ගිමන් හරිමින් තම කෙළෙස් දුරු කරගත් පිරිස, ජීවිත පූජාවෙන් ශාසනය රකින්නට අධිෂ්ඨාන ගත්හ. ධර්මයේ හැසුරුණ එකම පුද්ගලයාගෙ" ශක්තිය කාටත් වැටහුණි.

ආචාර්ය මන් සමඟ ගමන් ගත් පිරිස ගම හරහා ගොස් නොපෙනී ගිය විට බොහෝ දෙනා ඒ ගමන් මාර්ගයේ ගමන් ගත්හ. නිහඬව දුක්මුසු

මුහුණින් ගමන් කළේ අවමඟුල් පෙරහැරක යන ලීලාවෙනි. තම ළඟම ලේ ඥාතියෙකුගේ අභාවයක් මෙන් ඔවුන් පසුපස ගමන් කරත්. තමාගේ සුනු විසුනු වී ගිය බලාපොරොත්තු ඉවසා ගත නොහැකිය. සියල්ල නැසී වැනසී හමාර යැයි ඔවුන්ට සිතේ. තවම ජීවත් වෙමින් සිටියත් උන්වහන්සේගේ යාම ඔවුන්ට දරාගත නොහැකිය.

මම ද මේ අන්දමින් අතිශය සංවේගයට පත් වූ බව පාපොච්ඡාරණය කරමි. මුළු ගමන පුරා මගේ සිතේ පැවතුණේ මට තිබුණ එකම පිහිට සරණ නැති වූ විට කාගේ පිහිටක්ද යන ප්‍රශ්නය විය. භාවනා ගැටළු වලදී උන්වහන්සේ මට එකම පිහිට විය. ළඟම නැවතුම් පලට සැතපුම් 15ක් පමණ දුර ඇත. එහෙත් දිග ගමන නොදැනුවත්වම ගියෙමු. උන්වහන්සේ පසුපස යමින් උන්වහන්සේගෙ ් මරණයට පසු කුමක් කරන්නෙම්ද ? උන්වහන්සේ ජීවත් වේ යැයි මම සුන් වූ බලාපොරොත්තුව අතරින් වරින් වර සිතුවෙමි. මගේ භාවනාවේ සියුම් අවස්ථ ාවකට මම එළඹ ඇත. ඊළඟට උපදෙස් ලබන්නේ කෙසේද ? තවම මට තනිවම නිරාකරණය කළ නොහැකි ගැටළු ඇත. මම උන්වහන්සේ අහිමි වේ යන්න සිතන තාක් අනාගතය අඳුරු විය.

මුළු ගමන පුරාම කිසිම රෝගී ස්වභාවයක් උන්වහන්සේගේ නොපෙනේ. සුව නින්දේ පසුවෙතියි දැනේ. එහෙත් උන්වහන්සේට නින්ද ගියේම නැත. මධ්‍යාහ්නයේ ගස් ගුම්භයක සෙවණේ මඳ කාලයක් විඩාව සංසිඳවා ගැනීමට නැවතීමට අවසර ඉල්ලුවෙමු. ''අපි දැන් කොහේද''යි උන්වහන්සේ එවිට ඇසූහ. ඒ වචන ශබ්දය ඇසූ විගස මා වික්ෂිප්ත විය. මා ආයාසයෙන් ඉවසා දරාගත් ආදරය ඉදිරියට පැන නැගුණි. මම මේ තරම් උන්වහන්සේගේ කටහඬට ඇළුම් කරම්ද ? උන්වහන්සේ නැවත ඉපදී ඇතැයි හැඟුණි. එම වචන ශබ්දය එතරම් මිහිරිය.

''තුන් ලෝකයේ ඇති එකම උතුම් පුද්ගලයා මා අතහැර යති. මම ඉතා අසරණ වූ අනාථ දරුවෙක් වෙමි. මගේ හදවත පුපුරා යාමට යන්නේය. මගෙන් වෙන්වී උන්වහනසේ යයි. එය මගේ ප්‍රාණ වයුවේ හැර යාමකි. සදාකල් මම තනිවෙමි.'' උන්වහන්සේගේ වචන ශබ්දය ඇසුණ විගස මෙවැනි විපරීත අදහස ගලා යයි. සමහරු මම පිස්සු ඔල්මාද කාරයෙක් යැයි සිතනු නිසැකය. ඒත් කරන්ට දෙයක් නැත. මම එකහෙළාම එය පිළිගනිමි. ආචාර්ය මන් පිළිබඳ මගේ පුදුම පිස්සුවක් ඇත. උන්වහන්සේ වෙනුවෙන් මගේ ජීවිතය සතුටින් පරිත්‍යාග කරමි. උන්වහන්සේට අවශ්‍ය නම් මම ඒ පිළිබඳ දෙවරක් නොසිතමි. එහෙත් අහෝ උන්වහන්සේට මගේ ජීවිත පුජාව අවශ්‍ය නැත. සත්‍යය නම් උපන් සැවොම මරණයට පත්වන බවයි. මේ අවස්ථාවෙන් බේරීමක් නැත.

මුළු ගමන අදියර දෙකකින් නිමාවීමට සැළසුම් කර ඇත. පළමු දින බන්

ෆු විහාරය දක්වා ගමන් ගතිමු. එහි දින කීපයක් ගතකර ආචාර්ය මන්ට විඩා සංසිඳුවා ගැනීමට සළසා ඇත. මේ විහාරයට පැමිණුණේ කළුවර වැටීමෙන් පසුවය. කඳු පාමුල වටේ ගමන් ගත් හෙයින් මාර්ගය දික්විය. කඳු මුදුනෙන් වැටී ඇති පාර උන්වහන්සේට හා එක්ව ගිය වයසක අයට යා ගැනීම දුෂ්කර නිසා කෙටි පාරක් වුවද, අපි දීර්ඝ මාර්ගයේ ගමන් ගත්තෙමු. එහි පහත් භූමියක උන්වහන්සේට සැතපීමට කුටියක් සූදානම් කළෙමු. බොහෝ භික්ෂූන් සහ ගිහි පිරිස් අවුත් වැඳුම් පිඳුම් කිරීමට සුදුසු ලෙස එය පිළියෙල කර තිබුණි.

මෙම බන් ෆිව් ආරාමයේ කීප දිනක් නැවතීමට සිදු වූයේ උන්වහන්සේගේ රෝගීතාවය ඉතා බැරෑරුම් වූ නිසාය. එහෙත් ඒ හේතුවෙන් විශාල ජනකායක් එහි ඇදී ආහ. රාත්‍රී කාලයේ පවා අවුත් බැහැදැක වැඳුම් පිඳුම් කළහ. බො-හෝ අය උන්වහන්සේ පිළිබඳ අසා ඇති නමුත් දැක ගැනීමට නොහැකි වූයේ උන්වහන්සේ නිතර මහා කැළෑවේ විසූ හෙයිනි. පිරිනිවන් පාන්නට ආසන්න වූ නවීන ලෝකයේ අති උත්තම රහතන් වහන්සේ නමක් දැක ගැනීමට සියලු දෙනාම උනන්දුවෙනි. එසේ වන්දනා මාන කිරීමෙන් බොහෝ පිං ලැබෙන බවත්, තමාගෙ ” දුක නැතිවෙන බවත් ඔවුහු විශ්වාස කළහ. මනුෂ්‍යත්වයේ උතුම් ප්‍රතිලාභයක් ලෙස ඔවුහු මෙය සැළකූහ.

එහි පැමිණි මුල් දිනයේදීම ආචාර්ය මන් තමන් වහන්සේ සකොන් නබොන් ගෙන යන්නේ කවදාදැයි විමසූහ. තමන් වහන්සේ බන් ෆිව් හි පිරිනිවන් පෑමට නොකැමති බවක් තම ශිෂ්‍යයන්ට දැනුම් දුන්හ. එහි නවාතැන් ගන්නේ උන්වහන්සේගේ රෝගීත්වය මඟහැර ගැනීමට බව ඔවුන් කීහ. ඉන්පසු නිහඬ වී පසුදින එසේ නැවතත් ඇසූහ. ශිෂ්‍යයෝ නැවතත් එම පිළිතුරු දුන් පසු නිහඬ විය. එහෙත් කීප වාරයක්ම මෙසේ අසන ලදී. මෙසේ නැවතී සිටීම නිසා එහි යාමට නොහැකි වන බව උන්වහන්සේ පැවසූහ. පසුව තරමක් වේගයෙන් දොස් කීහ.

''ඔබ මාව මෙහි මරණයට පත් කිරීමටද මේ යන්නේ ? මම මුලින්ම සකොන් නබොන් වලදී මරණයට පත්වන බව කීවෙමි. ඉක්මන් කරන්න. කාලය ඉක්ම වී යයි.'' අවසාන දින උන්වහන්සේ සියලුම ශිෂ්‍යයන් ගෙන්වා තමන් වහන්සේ මේ රාත්‍රිය එළිවන තුරු ජීවත් නොවන බවත් දැන්මම ගෙන යා යුතු බවත් පවසා ඇඳේ සයනය කිරීමට අකමැති විය. එවිට උන්වහන්සේ භාවනා ඉරියව්වෙන් ඉතා ආයාසයෙන් හිඳුවා බද්ධ පර්‍යංකයෙන් සිටීමට ආධාරක සළස්වා දුනිමු. සකොන් නබොන් දිශාවට මුහුණ ලා උන්වහන්සේ සමාධිගත විය. ඉන්පසු සමාධියෙන් නැගී සිට දැන්ම එහි යා යුතු බව පැසූහ. පසුදා උදෑසන නොවරදවා ගෙන යන බව ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ පැවසූහ. එහෙයින් තරමක අස්වැසිල්ලක් ලබා

උන්වහන්සේගේ තත්ත්වය පිළිබඳ කථා කළහ.

‘‘මගේ කාලය අවසානයි. තවත් ජීවත් වීමට නොහැකිය. දැන්ම පිට වී ගියොත් අළුයම වන විට එම අති ශ්‍රේෂ්ඨ මොහොතේ දී එහි යා ගත හැකිවේ. මේ ශරීරයේ මූලධාතූන්ගේ බර ඉසිලීමට මට තව දුරට නොහැකිය. මේ සිරුර සදාකාලිකව මම නිරුද්ධ කරමි. නැවත ඉන් හට ගන්නා දුක් පීඩා නැත. මම දැනුත් අභාවයට යමින් මරණයට පත්වන බව නොදැනේද ? මගේ ශරීරයෙන් ඇති වැඩක් නැත. මෙවැනි ශාරීරික දුක් වේදනා විඳීමේ ඇති ඵලය කුමක්ද ? මම සකොන් නඛොන් යන්ට කැමති වන්නේ මක්නිසාදැයි ඔබ සියලු දෙනාම දනිති. ඒ නිසාම නොවේද මම මෙහි ආවේ ? ඇයි ඔබ මගේ ගමන ප්‍රමාද කරන්නේ මේ සකොන් නඛොන්ද ? වහාම මා එහි නොගෙන යන්නේ ඇයි ? මම දැන්ම යා යුතුයි. ඔබ බලා සිටින්නේ කුමකටද ? මළ සිරුරක ඇති වැඩේ කිම ? කිසි වැඩක් නැහැ. මාළු හොද්දක්වත් හදන්න බැහැ.

මගේ ශරීරයේ අවසාන මොහොත ළඟා වී ඇත. මම කියන දේ කිසිවෙකුට නොඇසේද ? මම කියන දේ කරන්නේ නැද්ද ? මට උවමනා දේ කොපමණ කීවාද ? කිසිවෙකු ඇහුම්කන් නොදෙති. ඔබ ඔවැනි ආකාරයට දඩබ්බර නම් සත්‍යය වටහා ගන්නේ කෙසේද ? ඔබ මා ජීවත්ව සිටියදීම, මගේ ඉදිරිපිටම අකීකරු දඩබ්බර වෙති. මම කියන දේ නොපිළිදිති. මා මළ පසු ඔබ සුවච කීකරු වන්නේ කෙසේද ? මම කියන්නේ සත්‍යයකි. මගේ තත්ත්වය ඉතා පැහැදිලිව ඔබට කියා දී ඇත. එහෙත් එය දැඩි සේ පිළි නොගනිති. මගේ සිතේ ලොකු සැකයක් ඇත. සාසනය පවත්වා ගැනීමට අවශ්‍ය න්‍යාය ධර්ම ඔබට පිළිපැදිය හැකිද ?

ආචාර්ය මන් මොහොතේදී ඉතාම දැඩි මුරණ්ඩු ගතියක් දැක්වූහ. රෑ එළිවන තුරු නිදා ගැනීම ප්‍රතික්ෂේප කරමින් සිටියහ. නින්දට වැටුණොත් නැවත පිබිදෙන්නේ නැති බව උන්වහන්සේ දනිත් දැයි මට සැක පහළ විය. ඒ වේලේදී උන්වහන්සේ සැතපෙන්නේ නැත්තේ ඇයි දැයි අපට නොතේරුණි. පසුදා උදේ 7 වන විට විශාල ට්‍රක් රථ කීපයක් ප්‍රාදේශීය මහා මාර්ග දෙපාර්තමේන්තුවෙන් පැමිණ ඇත. නුම් චුවනොත් මහත්මිය මෙම පෙරහැරේ ඉදිරියෙන් යාමට නියමිතය. උන්වහන්සේ මෙම එක් රථයක ගමන් කිරීමට එකඟ විය. අනිකුත් සියලුම  භික්ෂූන් වහන්සේලාට ගමන් කිරීමට සෑහෙන රථ ඇද්දැයි විමසූහ. එම රථ තුනේ යා නොහැකි නම් එම වාහන නැවත පැමිණ ඉතිරි සෙනඟ ගෙන යනු ලැබේ. එවිට ආචාර්ය මන් මේ පිළිවෙල හොඳින් අවබෝධ කර නිහඬ විය. හීල් දානයෙන් පසු උන්වහන්සේට නින්ද යාමට බෙහෙතක් එන්නත් කළහ. එම පාරවල වල ගොඩැලිවලින් යුත් බැවින් ගමනාගමනය ඉතා දුෂ්කරය. උන්වහන්-සේ ගිලන් ඇඳක තබා ඔසවා එම රථයක තැන්පත් කළහ. උන්වහන්සේ නින්දට වැටුනහ. එම රථ ඉතා සෙමින් ගමන් කර මධ්‍යාහ්නයේදී සකොන් නඛොන් වලට

සම්ප්‍රාප්ත විය.

එහිදී තවමත් නින්දේ පසුවෙන උන්වහන්සේ වට් සුද්ධවත් ආරාමයේ කුටියක තැන්පත් කරන ලදී. මධ්‍යම රාත්‍රිය වන තුරු උන්වහන්සේ පිබිදුනේ නැත. අවදි වී පැයකට පසු උන්වහන්සේ තම අඳ බිහිරි ශිෂ්‍යයන්ට නිරන්තරයෙන් කියා ඇති පරිදි අන්තිම හුස්ම හෙලන්නට ආසන්න විය. ''දැන් පේනවාද ඇයි මම මෙතරම් කෑ ගැසුවේ. මගේ දුක් කන්දරාව ඉක්මණින් නිරුද්ධ වේ. එම මරණ සංඥා දැන් දැන් පෙනේ. ඔබට නොතේරේ නම් හොඳින් බලාගත මැනවි. ඔබ ඉදිරියේ ඇති දර්ශනය දෙස බලා සිටිනු. මම කීවේ ඇත්තද බොරුද ? මින්පසු අඳ ගොළු බිහිරි ගති පහකර ගනු. ඔබේ සිහිවිකල් ගති අත් හරිනු. ඔබට දැන් පෙනී යන දේ ගැන ගැඹුරින් සිතනු. ගණනක් නැතිව සිටින්න එපා...'' මේ ආදි දේ කියන්නාක් මෙන් අප සැම ත්‍රස්ත වී සිටියෙමු.

''භාරා නවෙ පංචක්ඛන්ද'' මේ පංචස්කන්ධය ඇත්තෙන්ම මහා බරකි. අළුයම පැය ගණනින් උන්වහන්සේ තම සිරුරෙන් සමුගනිති. මේ අතිශය දුක වේදනාවන්ගෙන් සදහටම සමුගනිති. කිසිම නුවණැත්තෙක් මෙවැනි දේ නැවත සසරදී විඳීමට නොකැමති වේ. මුළු ආරාමය එළිවන තුර නිහඬය. කිසිවෙකු එම දැඩි නිහඬතාවය කඩ නොකළහ. එවෙලේම මහා ආචාර්වරයෙකු වූ චඕ කු බුන් ධම්මපේඩී වට් බෝධි සොම්ෆොන් සිට පැමිණියහ. උදෝන්තානි සිට මහත් සංවේගයෙන් මේ ප්‍රවෘත්තිය අසා පැමිණියහ. එහි ඉතා ශාන්තව භාවනා මනසිකාරයෙන් වාඩි වී සිටිති. එහෙත් බලවත් සංවේගයකින් හදවත දෙදරා යති. මොන මොහොතේදී අවසන් හුස්ම හෙලතියි බලා සිටියහ. භික්ෂූන් වහන්සේලා පේළි 3කින් සිටිති. වැඩිමහල් ස්ථවිරයන් ඉදිරියෙන් සිටිති. සියලු දෙනාම උන්වහන්සේ දෙස සූක්ෂමව බලමින් සිටිති. කඳුළු වගුරුවමින් තම සිතේ බලවත් ශෝකය දරාගත නොහැකිව සිටිති. මෙය නොවැළැක්විය හැකිය. තමන්ගේ ජීවිතයෙන් දැන් එලක් නැතැයි දැනේ.

මුලදී ආචාර්ය මන් දකුනැලයෙන් සිංහ සෙය්‍යාවෙන් සිටියහ. එය උන්වහන්සේට අපහසුවක් යැයි සිතා පිටුපස කොට්ට ඉවත් කර උඩු අතට දිගා කළහ. උන්වහන්සේට මෙය දැනුන විගස නැවත හැරීමට මහන්සි ගත්හ. එහෙත් එය කළ නොහැකිය. යම් ජ්‍යෙෂ්ඨ ආචාර්යවරු උන්වහන්සේගේ ඉරියව්ව වෙනස් කිරීමට තැත් කළහ. නමුත් එය නුසුදුසු බව තේරුණි. අවසානයේදී උන්වහන්සේ පිරිනිවන් පෑවේ දකුණැලයෙනුත් නොවේ උඩු අතටත් නොවේ ඒ දෙකේ මැද ඉරියව්වකිනි. කිසිවෙකුට කර කියා ගැනීමට නොහැකිව බලා සිටිති. උන්වහන්සේගේ අවසාන මොහොත දුකෙන් භයෙන් සැකෙන් නිරාවුධව සිටියේ හුස්ම ගැනීමටවත් අමතක වීමෙනි.

විනාඩි, තත්පර ගණන් පසුවෙනවාත් සමඟ උන්වහන්සේ හුස්ම සියුම් විය. ආශ්වාස, ප්‍රාශ්වාසයෝ නිරුද්ධ වීම දෙස ඇසිපිය නොහෙලා සියලු දෙනා බලා සිටිති. එකවරම නිරුද්ධ වූයේ ඉතා සන්සුන්ව. අදහා ගන්ට බැරි ලෙසය. බාහිර ලක්‍ෂණ කිසිවක් වෙනස් වූයේ නැත. සාමාන්‍ය කෙනෙකුගේ මරණයට වඩා හාත්පසින් වෙනස් විය. කිසිවෙකුට අවසාන මොහොත හඳුනා ගැනීමට නොහැකි විය. එහෙත් උන්වහන්සේ මේ අති භයංකර විශ්වයෙන් අවසාන වරට සමුගත් මොහොත එය විය.

ජම් බුන් ධම්මජේඩී මහා ස්ථවිරයෝ මේ සියල්ල අවධාරණයෙන් බලා සිට ''උන්වහන්සේගේ ආශ්වාස ප්‍රාශ්වාසයෝ දැන් නිරුද්ධ වූහ.'' තම අත් ඔරලෝසුව බලා වේලාව අළුයම 2.23 බව සැලකළහ. මේ අවස්ථාව සියලු දෙනා මහත් සංවේගය දැක්වූයේ කඳුළු පිරි දෙනෙතින් සියුම් කැස්සකින් සහ කොඳුරන වචන ගලා යාමකිනි. කාමරය තුළ නිසොල්මන් දැඩි නිහඬතාවයකි. දරුණු කළකිරීමකින් යුත් සුන් වු බලාපොරොත්තුවෙන් සිටි පිරිසකි. හදවත තුළ රැඳී ඇත්තේ සූන්‍යතාවයකි. වචනවලින් කියාගත නොහැකිය. ශරීරය හිස් වී නිශ්චලය, ගල් ගැසී ඇත. විශ්වය මොහොතකට නැවතුනි. ආචාර්ය මන් තම සම්මුති ජීවිතය අත්හැර ඒකාන්ත ශාන්ත ප්‍රනීත අසංඛත සත්‍යයට ප්‍රවිෂ්ඨ වී ඇත. මින් මතු සංඛත ධර්මයෝ උන්වහන්සේට පීඩා නොදෙති.

මම ද හදවත පැලී ගොස් මරණයට පත්වෙන්නාක් මෙන් තදබල දුකින් උන්වහන්සේ අසළ සිටියෙමි. මගේ හදවතේ අඳුර බලවත් සංවේගය ගත සිත වෙලාගෙන සිටී. ඉන් මිදීමක් නැත. මගේ සිත මැරෙමින් පවතින බව හැඟේ.

මඳ වෙලාවකට පසු උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ එම මෘත ශරීරය නිසි ආකාර තැන්පත් කර පසුදා උදේ ඊළඟ පියවර ගැන සාකච්ඡා කිරීමට සම්මත කළහ. භික්‍ෂූන් කීප දෙනෙක් කාමරය ඇතුළේ සහ පිට ආලින්දයේ සිටියහ. මුළු පළාතම ''කිට්සන්'' ලාම්පු වලින් ආලෝකමත් විය. බොහෝ ශිෂ්‍යයෝ ඉබාගාතේ එහෙ මෙහෙ යති. ඇත්තටම කීප නමක් ක්ලාන්ත වී වැටුනහ. ඒ අයට පිළිසරණක් නැත. ජීවිතයෙන් ඇති තේරුමක් නැත. ආරාමයේ සියලුම භික්‍ෂූහු තම ජීවිතයේ අභාග්‍ය සම්පන්න කාලයක් ඇතිවන බව සුන් වූ බලාපොරොත්තුවෙන් සිටිති. උන්වහන්සේගේ දීප්තිමත් ආලෝකය අප හදවත් ප්‍රබෝධමත් කළහ. එකවිටම ඒ සියල්ල අතුරුදහන් වී ඇත. කිසි පිළිසරණක් නැතිව ඉදිරි ජීවිතයට මුහුණ පෑ යුතුය. මුළු විශ්වයේ කිසිම ආධාරකයක්, සරණක් නැත. සත්ත්වයා යම්කිසි ආධාරයක එල්බගෙන තම ජීවිත යාත්‍රාව ගෙන යන බව අමතක වී ඇත. ඒ මොහොතේ සිතේ ඇත්තේ තමා අසරණ වූ බව පමණි. ආචාර්ය මන් එකම සරණ විය. උන්වහන්සේ ජීවිත පූජාවෙන් අදහාගෙ

න හද පත්ලෙන් විශ්වාස තබා සිටියහ.

මම බුද්ධ ධර්ම සංඝ යන තෙරුවන් ගුණ අදහා නිතර සරණ ගියෙමි. එහෙත් ඒ මොහොතේ ඒ රතනත්‍රය ඈත දුර වී, පිහිට ලබා ගැනීමට නොහැකි විය. ආචාර්ය මන් ඇස් ඉදිරිපිට මනුෂ්‍යය ලීලාවෙන් අපගේ සියලු දුක් දොම්නස් සැක බය තුරන් කළහ. මහත් කණස්සල්ලෙන් උන්වහන්සේ වෙත පැමිණ නොයෙක් ගැටළු ඉදිරිපත් කළ නමුත් ඒ සියල්ල විසඳී සිතේ දුක අතුරුදහන් වේ. මගේ ප්‍රශ්න නිරාකරණය කළ හැකි අන් කිසිවෙක් නැති බව දැනේ මට එවැනි කරුණාවක් දක්වන්නේ කවුද ? කාගෙන් උපදෙස් ලබම්ද ? මගේ තනිකම ගැන මම බිය වුනෙමි. මගේ මෝහය සිත් තැවුල මා වෙලාගෙන ඇත. උන්වහන්සේගෙන් ලැබූ උපදෙස් තව දුරට නොලැබේ. කාට කියම්ද ? මගේ සිතේ ඇති සැක බව, අවිනිශ්චිත බව ඉහවහා ගොස් ඇත. දුක් දොම්නස් පිරි ලෝකයක් මා ඉදිරියේ දිගටම පෙනේ. උන්වහන්සේගේ මෘත දේහය ඉදිරියේ සිටින මගේ සිත තුළ වෙන කිසිම දෙයක් නැත. ශාරීරික විඩාවක් කුසගින්නක් නොදැනේ. කාලය හෝ දවල් රෑ නොදැනේ. මම ආශ්වාස ප්‍රාශ්වාස කරන හොල්මනකි. මහණ වීමෙන් පසු කිසි කළෙක මෙවැනි දුක්ඛිත තත්ත්වයකට වැටී නැත. මේ ප්‍රපාතයෙන් ගොඩ වීමට ක්‍රමයක් නැත. උන්වහන්සේගේ මෘත දේහය දෙස බලන හැම විට කඳුළු ගලා යයි. කොපුලෙන් ගලා යන කඳුළු නවතා ගැනීමට නොහැක. මා ඉකි බිඳමින් හැඬුවෙමි. උගුර කට වියළී හිර වී මගේ සිතිවිලි තුළ නාමග්න වී සිටියෙමි.

අන්තිමේදී මගේ ප්‍රකෘත්ති සිහිය ලැබුවෙමි. මගේ සිතත් සමඟ කථා කළෙමි. ''මට උවමනා වන්නේ පපුව පැලී මරණයට පත්වීමටද ? උන්වහන්සේ කිසිම දෙයක් ගැන නොතකා නිදහස්ව, අභාවයට පත්විය. මා ඉන්නේ කෙළෙස් වලින් වෙලීගෙනය. මා දැන් මරණයට පත් වුණොත් මගේ තණ්හාව සහ සිත් තැවුල සමඟ මැරී මහත් දුකකට පත්වේ. මගේ දොම්නස හෝ මරණය මට හෝ ආචාර්ය මන් හට කිසි වැඩක් නැත. උන්වහන්සේ ජීවත්වන කාලයේ මෙසේ මාරාන්තික භක්තියක් ඇල්මක් ගැන කියා දී නැත. මෙවැනි ඇලීම් ලෞකික පෘථජ්ජන ගතියකි. මගේ ධර්මය පිළිබඳ වුවද මෙය ලෞකික ඇලීමකි. එය බෞද්ධ භික්ෂුවකට නොතරම් වේ. නිවන් කරා යොමු වූ මට මෙවැනි අදහස් යෝග්‍ය නොවේ. ''යො ධම්මං පස්සති - සො මං පස්සති'' ධර්මය දකින්නා බුදුන් දකී යන්න බුද්ධ දේශනාවකි. මගේ සිතිවිලි ධර්මානුකූල නොවේ. මම ආචාර්ය මන් උගැන්වූ ධර්මය පිළිපදිමි. එවිට මම උන්වහන්සේට උසස්ම සැළකිම කරමි. උන්වහන්සේ ඉගැන් වූ දැඩි ප්‍රතිපත්ති පූරණය කරමින් මරණයට පත් වන්නේ නම් එය උන්වහන්සේට කරණ උතුම් පූජාවකි. මේ වනාහි මගේ හැසිරීම් විය යුතුය. මගේ ඉදිරි ගමන වසාලන මෙවැනි අසාමාන භක්ති ආදරය නිසා මා විනාශ වේ.''

මෙසේ මගේ ප්‍රකෘති සිහිය ලබා ගතිමි. ප්‍රඥාවෙන් සහ සිහි බුද්ධියෙන් මගේ සිතේ පැවති මහත් වූ කැළඹීම සමථ පත්විය. කිසි වැදගැම්මකට නැතිව මා පණ පිටින් වැළලී යන්නේ ඇයි ?

## ආදාහනය

අසල්වැසි ගම් නියම් ගම් වලට ආචාර්ය මන්ගේ අභාවය පිළිබඳ තොරතුරු පැතිරී ගියේය. ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා සහ රජයේ නිළධාරීන් නොකඩවා පැමිණ දේහයට ආචාර පවත්වති. ආදාහනය සිදු කිරීමට සැළසුම් කරති. උන්වහන්සේට නිසි ගෞරව පැවැත්විය යුතුය. රේඩියෝ සහ පුවත්පත් වල සන්නිවේදනය කළහ.

මේ ආකාරයෙන් මුළු රට පුරා මේ දුක්මුසු පුවත ඇසූ දස දහස් සංඛ්‍යාත සෙනඟ පැමිණියහ. ඈත පළාත්වලින් පැමිණි අයට රාත්‍රී නවාතැන් සැපයීමට සිදුවිය. බොහෝ පිරිකර උන්වහන්සේට පූජා කරණ ලදී. උන්වහන්සේ ජීවත්ව ඉන්න කාලයේදී වැසි වර්ෂාවක් මෙන් පිරිකර ගලා ආවේය. ආචාර්ය මන් තම ජීවිත පරදුවට තබා සේවය කර ඇත. ඒ සියලුම පිරිකර සියලු දෙනාට බෙදා හැරියේය. උන්වහන්ස් තරම් දිළිඳු දුප්පත් කිසි භික්ෂුවක් නොවීය. උන්වහන්සේට ලැබුණ දේ අනන්තය. එහෙත් ඒ සියල්ල දන් දුනි. කිසිවක් නැත්නම් තමන් වහන්සේ පරිහරණය කරන දේ පවා අවශ්‍ය කෙනෙකුට දෙති. මේ නිසාම උන්වහන්සේගේ අපවත් වීමෙන් පසුවද බොහෝ දෙනා පිරිකර රැගෙන ආහ.

වැඩිහිටි ආචාර්යවරු රජයේ නිළධාරින් සමඟ සාකච්ඡා කර මෘත දේහය මාස කීපයක් තැන්පත් කර පසුව ආදාහනය කිරීමට සංවිධානය කළහ. 1950 ජනවාරි පුර පක්ෂයේ ආදාහනය කිරීමට විශේෂ රන් සිවි ගෙයක් සහ මිනී පෙට්ටියක් සෑදුන.

එම නියමිත දිනයේදී සවස 4ට බොහෝ භික්ෂූන් සහ ගිහි පින්වතුන් පැමිණ මෘත දේහය නාවා සිවුරු හඳවා සුදු රෙදි වලින් එතුහ. පෙට්ටියේ ඉදිරිපස වීදුරු බැවින් මෘත දේහය දැක ගත හැකිය. සෑමදාම රාත්‍රිය එළඹෙන තුරු සූත්‍ර සජ්ඣායනා කළහ. ජ්ඕ බුන් ධම්ම ජෙඩි ආචාර්යවරයා ප්‍රධාන සංඝයා වහන්සේලා බණ දේශනා කළහ. බොහෝ දෙනා පැමිණ මෙම සජ්ඣායනා වලට සවන් දුන්හ.

බොහෝ දෙනා සිය කැමැත්තෙන්ම අවුත් ගෞරව පූජා කරමින් කාර්යය භාරය ඉසිලූහ. සකොන් නබොන් ප්‍රදේශයේ ජනයා ඒ සියලුම අමුත්තන්ගේ සංග්‍රහ විධි විධානය කළහ. රෑ දවල් නොබලා මහත් පරිශ්‍රමයකින් සියලු කටයුතු සම්පාදනය කළහ. අන්තිමේදී එය අති විශාල ආදාහන උත්සවයක් විය. භික්ෂූන්

වහන්සේලා සියයකට අධික ගණනක් එහි මාස ගණනාවක් ලැගුම් ගත්හ. දාන මාන කිසි දිනක අඩුවක් නොවීය. දිගටම පේලි සැදී දානය බෙදති.

දායක පිරිස කෙතරම් උනන්දුවෙන් මේ කාර්යය සිද්ධ කලාදැයි මම ඇස් ඉදිරියේ දුටිමි. එය මට කිසි දිනක අමතක නොවේ. එවැනි හෘදයංගම ආදර භක්තියක් මම කිසි දිනක දැක නැත. ඒ සියලු දෙනා ඇප කැප වී මාස ගණන් සිදුකළ සේවය අද්විතීය ආශ්චර්යයකි. මගේ හදවතින්ම ඒ අයට ස්තුති පූර්වක අගය කිරීම පළ කරමි.

ආදාහන කටයුතු කිරීමේ නිතර වූ භික්ෂූන් වහන්සේලාට මගේ ආදර භක්තිය පුද කරමි. රෑ දවල් නොකඩවා පැමිණි පිරිසට අවශ්‍ය සියලුම දේ සම්පා-දනය කිරීම සුළු පටු නොවීය. දස දහසකට අධික සෙනඟක් ආදහන දිනයට පැමිණීමට නියමිතය. ආවාස ගෙවල් මුළුතැන් ගෙවල ඉදි කිරීමට සිදුවිය. මාස ගණනක් තුළ මේ වැඩකටයුතු කිරීමට බොහෝ දෙනාගේ ශ්‍රමය අවශ්‍ය විය.

අවසාන දිනය ළඟා වූ විට මුළු ප්‍රදේශයම බැති මතුන්ගෙන් පිරී ඉතිරී ගියේය. භික්ෂූන් වහන්සේලා සහ සාමණේර භික්ෂූන්ගෙන් මුළු ප්‍රදේශය වැසී ගියේය. බොහොමයක් වනාන්තරයේ ළැගුම් ගත්හ. භික්ෂූන් වහන්සේලා 1000කට වැඩි පිරිසක් විය. ගිහි පින්වතුන් ගස්යට වෙල් යායේ සිටි අතර අවට නගරයේ සියලුම විශ්‍රාම ශාලා පිරී ගියේය.

මේ මහා සේනාව රැස් වී ආදාහන උත්සවය පැවැත්වීමට සූදානම් වූ නමුත් දැඩි නිහඬතාවයක් එහි ඇත. ශබ්ද විකාශන යන්ත්‍රයෙන් විසුරුවා හරින ප්‍රවෘත්ති හොඳාකාර ඇසේ. සියලුම වත් පිළිවෙත් කර්මස්ථාන භික්ෂූන්ගෙ " සම්ප්‍රදායට අනුකූල විය. ආහාර ආදී පිරිකර කඳු ගැසී ඇත. හාල් ගෝනි සිය ගණනක් ඇත. වාහන පුරවාගෙන සෙනඟ බඩු රැගෙන එති. මතක වස්ත්‍ර වශයෙන් ලැබුණ සිවුරු ගෙයක් පුරවා ඇත.

මගේ මේ විස්තරය අතිශයෝක්තියක් යැයි හැඟේ නම් මම සමාව අයදිමි. මගේ සිත මානයෙන් කුල්මත් විය. අපේ තායි ජාතිකයෝ මෙපමණ ශ්‍රද්ධා සම්පන්න, ත්‍යාගවන්ත අය දැයි මම දැන නොසිටියෙමි. මා පුදුමයට පත් වී සිටිමි. ලෝකය ගැන සිතන විට තායිලන්තය කුඩා රටකි. එහෙත් මේ අයගේ ත්‍යාගවන්ත භාවය කිසිවෙකුට දෙවෙනි නොවේ. බෞද්ධ සම්ප්‍රදායකට සරිලන කරුණා, මෛත්‍රී ගුණය මේ තායි ජාතිකයන් තුළ ඇත. අපි හදවතින්ම ආදර භක්තිය පුද කරණ පරිත්‍යාගශිලී ජාතියකි.

මේ ලක්ෂණ කැපී පෙනුණේ ආචාර්ය මන්ගේ ආදාහන උත්සවයේදීය.

දිනපතා විශාල උදුන් වල පිසින ආහාර භාජන අති විශාලය. බලන්ටත් බිය ඇති කරයි. ඒවා ඔසවාගෙන යාමට කීප දෙනෙක් අවශ්‍ය වේ. දාන සාලා කීපයක් ඇත. භික්ෂූන් 30-40-50 ආදී වශයෙන් එකතු වී දන් වළඳති. කර්මස්ථ ාන ආචාර්යවරුන්ගේ සම්ප්‍රදාය අනුව පාත්‍රයෙන් ආහාර වළඳති. එබැවින් ආහාර බඳුන්වලින් පිණ්ඩපාත කරති. මේස, පුටු ආදිය සකස් කළේ විශේෂ අමුත්තන්ටය.

භික්ෂූන් වහන්සේලා වැඩිමල් පිළිවෙලට පැමිණ ආහාර පාත්‍රයට බෙදා ගනිති. බත්, එළවළු, මාළු, අතුරුපස සියල්ල එකට දමා වළඳති. ආචාර්ය මන්ගෙ ඍද්ධි ප්‍රාතිහාර්යය සහ දායකයින්ගේ දාන චේතනාව නිසා නිරන්තරයෙන්ම ආහාර සුලභ විය. පාත්‍ර වලින් ආහාර වළඳන බැවින් භාජන දීසි, පිඟන් ආදී නොයෙක් භාණ්ඩ අනවශ්‍ය විය.

කිසිවෙක් මත්පැන් බීමක් හෝ වාද විවාදයක් නොකළහ. සොරකමක් නැත. අමතක වූ පාවහන් ආදී දේ සමහර විට වටිනා රන් රිදී ආභරණ නිළධාරීන්ට ගෙනත් දී අයිතිකාරයින්ට පහසුවෙන් ලබා ගත හැකිවිය. අසවල් දේ ලැබී ඇති හෙයින් අයිතිකරුවන්ට එන ලෙස ශබ්ද විකාශනයෙන් ඇරයුම් කරයි. නැති වූ මිල මුදල් පසුම්බි පවා අයිතිකරුට ලබාගත හැකිවිය. පසුම්බියේ ඇති මුදල් ප්‍රමාණය කී විට අයිතිකරුවා හඳුනාගෙන එය භාර දෙයි. යම්කිසි සංඥාවකින් එය තමාගේ බව ඔප්පු කර සිටී.

ආදාහන පූජා උත්සවය දින 4ක් සහ රාත්‍රී 3ක් පුරා පැවැත්විය. එහි තිබූ කැපී පෙනෙන ලක්ෂණ බොහෝය. කිසිවෙක් කථා නොකරති. සියලු දෙනාම ඉතා විනීතව හැසිරෙති. මෙවැනි අති විශාල ජනකායක් ගමන් කරන ක්‍රියා කරන සංයමය පුදුම එළවන්නකි. සියලු දෙනාගේ සිත් එකම අරමුණක පිහිටා ඇත.

රාත්‍රී 8 සිට භික්ෂූන් වහන්සේලා සූත්‍ර සජ්ඣායනා කරෙති. ගිහි පින්වතුන් සුදුරෙදි, චීවර ආදිය පූජා කරති. එක් භික්ෂුවක් ධර්මානුසාසනාවක් කරයි. පසුදා අළුයම හීල් දානයෙන් පසු ගිහි පින්වත්තු විශාල වශයෙන් සංඝයාට පිරිකර පූජා කෙරෙති. බොහෝ දුර සිට ජනයා රැස් වූයේ පිරිකරක් පූජා කර ගැනීමටය. මේ දහස් ගණන් පිරිකර සමහර විට භික්ෂූන් සමූහයක් භාර ගති. සමහර විට එක් එක් භික්ෂුව භාරගති. එය කිසිසේත් පාලනය කිරීමට නොහැකි විය. සියලු දෙනා රිසි සේ පුද පූජා කෙරෙති. ශබ්ද විකාශනයෙන් අපට පිරිකර පූජා කිරීමට මෙපමණ භික්ෂූන් ලැබේවායි ආරාධනා කරති. අසවල් භික්ෂුවට පිරි කරක් දීමට නම් ඒ මහා සේනාව තුළ යම් භික්ෂුවක් සෙවීමට දුෂ්කර බැවින් ශබ්ද විකාශනයෙන් නම කියා ඇරයුම් කළ යුතුය. සියලුම භික්ෂූන් වහන්සේලාගෙ නම් ලැයිස්තුවක් සංවිධායකයන් සතුව ඇත. එබැවින් නිවැරදිව එම අදාළ

භික්ෂුවගේ නම ප්‍රචාරය කරයි.

අළුයම කාලයේ භික්ෂූහු අවට ගම්මානවලට වැඩ පිණ්ඩපාත කළහ. ආදාහන දිනයේදී සියලුම භික්ෂූන්ට සියලු දාන දායකයින් විසින් සැපයූහ. භික්ෂූන් වහන්සලා පෙළ ගැසී ගමන් කරන විට එක් එක් වහන්සේගේ පාත්‍රයට ගිහියන් විසින් නොයෙක් ආහාර වර්ග පූජා කරනු ලැබීය.

තුන්වන චන්ද්‍ර මාසයේ චන්ද්‍රයාගේ දසවෙනි දිනයෙහි ආදාහන පූජාව ආරම්භ වී 13වන චන්ද්‍රයාගේ දිනයෙන් සමාප්ත විය. ඉතා සුවිශේෂව සරසන ලද රන් සිවිගෙයි දේහය තැන්පත් වූ අනර්ඝ මිනී පෙට්ටිය තැන්පත් කර ඇත. එය උපොසථ ගේ දැන් පවතින තැනය. දක්ෂ කැටයම් කරුවෝ ඒ සියල්ල අලංකෘතව නිම කර ඇත. එවැනි ආචාර්යතුමෙකුට සරිලන පරිදි ඒ සියල්ල ඉතාම ලක්ෂණය විසිතුරුය. චන්ද්‍රමාසයෙන් 14 වෙනි දින භෂ්මාවශේෂ එකතු කරන ලදී. මෙම දිනය සූර්‍ය්‍ය මාසයෙන් කුමන දිනය දැයි මට කිය නොහැකිය.

මෘත ශරීරයට සියලුම භික්ෂූහු වැඳ නමස්කාර කර සමාව අයැදූහ. ඒ අවසාන ගමන බොහෝ අයගේ දුක්මුසු අවස්ථාවක් විය. සමහරු ශබ්ද නගා වැළපෙති. එය මහා කළබල, ව්‍යාකූල, අවුල් සහිත මොහොතකි. උන්වහන්සේ අති පිරිසිදු ශාන්ත ප්‍රාණීත නිර්වාණ ක්ෂේම භූමියට පැමිණ ඇත. නැවත මේ ලෝකයට පැමිණීමක් නැත.

සියලු දෙනාම තම හදවතේ තිබූ දුක් උන්වහන්සේ දෙසූ ධර්මය නිසා සමථ යකට පත් වූ බව සිතමින් සිටියහ. අකුශලයන්ගේ බැරෑරුම් බව තේරුම් ගත්හ. මාත දේහයට මෙසේ ගෞරව කළේ හදවතේ ඇති කෘතඥතාව පූර්වකවය. මේ අවසාන මොහොත ඔවුන් රිසි සේ වැළපුනාහ.

එහෙත් රහතන් වහන්සේ කෙනෙකුගේ අති පූජනීය ආදාහන උත්සවයකට සහභාගි වීමට තරම් මේ අය වාසනාවන්ත විය. උන්වහන්සේට ඇති ගෞරවය අසීමිතය. ''අපි කවදා මාරයාගේ දැලින් මිදී මෙසේ නිවන් ශාක්සාත් කරම්ද ? '' අවසානයේදී මෘත දේහය ආදාහනය පිණිස තැන්පත් කළ විට සියලු දෙනාම නිහඬ විය. එය නැරඹීමට බොහෝ දෙනා එක් රොක් වී තද බද වී මහත් අපහසුතාවයකට පත්වූහ.

රාත්‍රී 12ට ආදාහනය පිණිස ගිනි දැල් වූ විට පුදුම ආශ්චර්යයක් දිස්විය. කුඩා වළාකුලක් ගින්දර දළු මුදුනින් සෑදී දර සෑ ගිනි මත සියුම් වර්ෂාවක් පතිත විය. රාත්‍රී පුර සඳ දස අත ආලෝකමත් කරති. පසුව මුළු පළාතම සියුම් වර්ෂාවකින් තෙමී ගියේය. එය ඉතා අස්වාභාවික ආශ්චර්යයකි. නිල් අහස දිස් වේ. වර්ෂා ලකුණු කිසිවක් නැත. මල් වර්ෂාවක්ද ? අමා වැස්සක්ද? එම

චමත්කාර දර්ශනය මට කිසි විටෙක අමතක නොවේ.

ආචාර්ය මන්ගේ දර සෑය සඳුන් දර වලින් සාදා ඇත. ලාඕස් රටෙන් මෙම සඳුන් දැව ආනයනය කර ඇත. එය මීකොන් ගඟ හරහා ගෙන්වන ලදී. මෙම සඳුන් දර ඉන්පසු සුවඳ කූරු සමඟ මිශ්‍ර කර ඇති බැවින් ඉතා සුවිශේෂ දෙයක් විය. ආදාහන කටයුතු අවසන් වන තුරු රජයේ නිළධාරීහු සහ ගිහි පැවිදි පිරිස රැඳී සිටියහ.

පසුදා උදේ 9ට භෂ්මාවශේෂ එකතු කරණ ලදී. එය වගකීම් සහිත බොහෝ දෙනා අතර බෙදා දී සුරක්ෂිතව කරඩුවල බහා දිනපතා පූජා සත්කාර කිරීමට ඇප කැප වූ අය විය. එහෙත් සෙනඟ ඉතා වැඩි බැවින් සියලු දෙනා-ටම ධාතු ලබා ගැනීමට නොහැකි විය. ප්‍රදේශ 20 කින් පැමිණි නිළධාරි ඒ ඒ ප්‍රදේශයට නිල වශයෙන් රැගෙන ගියහ.

මෙසේ භෂ්මාවශේෂ බෙදා නිම කළ විට විශේෂ සිද්ධියක් සිදුවුණි. එනම් බොහෝ ජනයා අඟුරු හා භෂ්මාවශේෂ දර සෑයෙන් එකතු කිරීමට පොර කෑහ. අවසානයේදී එම දරසෑයේ එක කුඩා අංශුවක්වත් නැතිව සම්පූර්ණයෙන්ම ශුද්ධ විය. සියලු දෙනාම සතුටින් තමා මසුරන් පොදියක් ලබා ගත්තාක් මෙන් ප්‍රීතිමත් වූහ. මෙයද පුදුම එළවන දෙයක් විය.

අන්තිමේදී මේ ජනයා අවසාන වරට දර සෑය තිබූ තැන වාඩි වී භාවනා යෝගීව මඳ වේලාවක් සිටියහ. ඒ අය නැගිට ගිය පසු වෙන කණ්ඩායමක් වාඩි වී භාවනා කළහ. මෙය පැය ගණනාවක් දකින්නට ලැබුණි. එය බලා හිත තදින් කම්පා විය.

මම මෙතෙක් වේලා විස්තර කළ සියලුම සිද්ධීන්ට හේතු වූයේ හදවතේ පැන නගින ශ්‍රද්ධා බුද්ධියයි. දස දහසක් භික්ෂූහු සහ ගිහි පිරිස තම හදවතේ පැන නැගි භක්තියෙන් මෙසේ පුදුම එළවන ලෙස හැසිරුණහ. ඔවුන් සියලු දෙනාගේ හදවතෙහි ධර්මය පැවතුනි. ඒ සිත්වල තිබූ චේතනා පිරිසිදු බැවින් මරණින් මතු සුගතියක ඉපදීමට ඉවහල් වේ. එහෙත් ලෝකයේ වැඩි සංඛ්‍යාවක් පිරිස ලැජ්ජා භය නැතිව අකුසල්වල යෙදී අපායේ උපදිති. එසේ උප්පත්තියක් ලැබීමෙන් හදවත තව තවත් පහත් දුර්වල බවට පත්වේ. ඉන් මිදීම ඉතාම දුෂ්කරය.

හදවත යනු මිනිසා සසර ගමන කරවන ප්‍රබල ශක්තියකි. එම හදවතේ ගුණ සමුදායක් ඇතොත් ඔහුට සතුට සන්තෝෂය ඉවසීම සැනසීම ලැබේ. තම සංසාරික ගමන පහසු වේ. උපදින උපදින ආත්මයන්හි සතුට සන්තෝෂය බහුල වශයෙන් ලැබේ. අවසානයේදී හදවත ඉතා පිරිසිදු වේ. ආචාර්ය මන්ගේ හදවත

එසේ බොහෝ කාලයක් පරිනාමය වී සුවිසුද්ධ භාවයක් ඇති විය.

ආචාර්ය මන් පිරිනිවන් පෑ බව දස අත පතල විය. රහතුන් වහන්සේගෙ " මරණය පිරිනිවන් පෑමකි. මා පමණක් නොවේ බොහෝ ජනයා උන්වහන්සේගේ අර්හත් භාවය අවිවාදයෙන් පිළිගෙන මෙසේ පූජා උපහාර දැක්වූහ. උන්වහන්සේගේ චරිතයෙන් මේ පිළිබඳ කිසි සැකයක් නැති බව ඔප්පු වේ. උන්වහන්සේ දේශනා කළ ධර්මය අමත ධර්මයකි. එවැනි පිරිසිදු හදවතකින් දේශනා කරන්නේ එවැනි ධර්මයකි. යමෙකුගේ හදවත මෙසේ පිරිසිදු කළ විට මේ ආකාරයට පත්වේ. ධර්මය හා ප්‍රතිපත්ති තුළින් පමණක් මෙය කළ හැකිය. එම සිතිවිලි ආර්ය චිත්තයන්ය.

හදවත යනු ලෝකයේ ඉතාම වටිනා වස්තුවකි. එය පිරිසිදු වූ කල හෝ අපිරිසිදු වූ කල සත්ත්වයාගේ හැසිරීම ඒ අනුව යයි. අපගේ හදවත පිරිසිදු කිරීම ඉතාම අවශ්‍ය වන්නේ ඉන් අප සහ අවට පරිසරය සුරක්ෂිත වන බැවිනි. එවිට ලෝකයේ ජීවත්වීම මහත් වූ ප්‍රීතියකි. කිසි දුකක් කණගාටුවක් නැත.

ආචාර්යය මන්ගේ ආදාහනයෙන් පසු උන්වහනසේගේ ගෝල පිරිස බෙහෙවින් කණස්සල්ලට පත්වුණි. තම ජීවිතයේ එකම ආධාරකයා වූ උන්වහන්සේ නැතිවීම බලවත් පාඩුවකි. නූල කඩා ගිය සරුංගලය මෙන් උන් වහන්සේලා ඒ මේ අත විසිර ගියහ. දෙමාපියන් නැති කුඩා දරුවන් මෙන් කම්පනයට පත්වූහ. ටික කාලයකට පසු එක් වූ විට මෙවැනි ආචාර්යවරයෙකුගේ අවවාද අනුශාසනා නොලැබීමේ අභාග්‍ය වැටහුණි.

උන්වහන්සේලාගේ මුල් පදනම දෙදරා ගියේය. ශිෂ්‍යයන් යම්කිසි බල ශක්තියක් ලබා අත්නම් යථා කාලයේදී එම මාර්ගය ඔස්සේ ගමන් කළ හැකි වේ. ප්‍රධානියෙකුගේ අභාවය, පවුලේ හෝ ගමේ හෝ රටේ හෝ යම් ආයතන ආදියේ එම පිරිස අසරණ වන තත්ත්වයකි. එබැවින් ජීවත්ව ඉන්න අය එම පාඩුව පිරිමැසීමට ඉදිරිපත් විය යුතුය.

ආචාර්ය මන් පිරිනිවන් පෑ අවස්ථාවේදී මට මේ පාඩුව විඳ ගැනීමට නොහැකි වියි. උන්වහන්සේ තනි පුද්ගලයෙකි. ගිහි පැවිදි මහා සේනාවක් දුකට පත් වූහ. ගොඩනැගිල්ලේ අත්තිවාරම කැඩී සියල්ල කුඩු වී යන්නා මෙනි. මම ද අනාගතය පිළිබඳ බියපත් වුනෙමි. ඉතාමත් අගනා ගුරුවරයෙකුගේ මඟ

පෙන්වීම නොමැතිව අපි අතර මං වුනෙමු. ජීවත්ව ඉන්න කාලයේදී එවැනි ගුරු- වරයෙක් යටතේ පුහුණු වී ශක්තියක් ගොඩ නගා නොගත්තොත් උන්වහන්සේගෙ ' අභාවයෙන් පසු අප ජීවත් වූවත් මළවුන් වැනිය.

මම ද මේ තත්ත්වයට මුහුණ දීමට සූදානම් නැති බව තේරුණි. මහා සුළි සුළඟක් මගේ හදවත සුණු විසුණු කරමින් හමායයි. එක් අතකින් මා තනිවිය. අනිත් අතින් දැන් කාගේ සරණ ලබා ගනිම්දැයි සැක බිය ඇත. මා හිස් පුද්ගලයෙක් මෙන් අල්ලා ගන්ට අත්තක් නැතිව අවදානම් තත්ත්වයකට පත් විය. තව බියක් ඇත. මෙතරම් වටිනා ධර්ම පිළිවෙත් මාර්ග අහෝසි වී යයිද ? යන්තම් ඇවිදින්ට පුළුවන් වූ විට පියා අභාවයට පත් වී ඇත. මොන අවාසනාවක්ද ? මම විනාශ වීමි. කෙළෙස් සහ ධර්ම අතර බිහිසුණු සටනකි. ආචාර්ය මන්ගෙන් මෙතෙක් උපදෙස් ලදිමි. මේ යුද්ධය දිනා ගන්නේ කෙසේද? මින් පසු මා කාගෙන් අසම්ද ? මෙවැනි අති බියකරු ප්‍රපාතයකට මීට පෙර මා වැටී නැත. ජීවත් වනනේ කෙසේද ?

මෙසේ මගේ සිත විසිරී ගියේය. එම අත්දැකීම තුළින් මම මානසික ශක්තිය ක්‍රමයෙන් ලබා ගතිමි. හික්මුනෙමි. එය දඬුවමක් විය. අන් භික්ෂූන් ද මෙසේ අසරණ වීම දැකීමට දුක්වුනෙමි. තමාම ශක්තිමත් අඩිතාලමක් සාදා නැගී සිටින්ට අවශ්‍යතාවය වැටහුණි. අනුන්ගේ ආභාෂය ලැබීමේ භයානක තත්ත්වය අනුන්ට වටහා දුනි. ඉර බැස යන තුරු නොසිට තමාට සුදුසු නිවහනක් සාදාගත යුතුය. අන් භික්ෂූන් වහන්සේලාද මා මෙන් හිස්, අප්‍රාණික තත්ත්වයක සිටී දැයි බිය වුනෙමි. එබැවින් නිතර අනතුරු ඇඟවීම් කරමින් වීර්යය වඩන ලෙස අවවාද කළෙමි. තම ශරීරයේ ශක්තිය හා තම සිතේ උද්‍යෝගය තුළින් අවශ්‍ය දේ සිදු කළ යුතුය. මග්ගඵල නිබ්බාන අද අදම ලබා ගත යුතුය. මෙතරම් ධර්ම බල ශක්තියක් ඉදිරියේ අදක්ෂව දිළිඳුව ඉන්නේ ඇයි ?

## ධාතු පරිවර්තනය

ආචාර්ය මන්ගේ ධාතු ලබා ගත් සියලු දෙනාම ඒවා සුරක්ෂිතව කරඬුවල තැන්පත් කර දිනපතා වැඳුම් පිදුම් කළහ. එක් එක්කෙනා තම තමන්ගේ ගම් නියම් ගම්වලට ගිය නිසා හමුවීමක් නැත. අවුරුදු 4කට පසු සිරිෆොන් ස්ටෝ- රුව සහ සෘද්ධිෆෝන් හෝටලය අයිතිකරු වූ බුන් වන් බොම නමුන් නැමැත්තා නබෝන රචජසිමා සිට සබෝන් නබෝන් ප්‍රදේශයට පූජාවක් කිරීමට පැමිණි-

යේය. ආචාර්ය මන් පිරිනිවන් පෑ ස්ථානයට වස්ත්‍ර පූජාවක් කළේය. එහි විසූ නායක හිමියෝ එතුමාට ආචාර්ය මන්ගේ ශරීර ධාතුවක් දුනි. ඔහු එය රැගෙන තම නිවාස කරා පැමිණ එහි අවුරුදු 4කට පෙර තැන්පත් කළ ධාතූන් සමඟ තැන්පත් කිරීමට කරඬුව විවෘත කළේය. ඔහු පුදුමයට පත්විය. එම ඇට කැබලි ඉතාම විනිවිද පෙනෙන පළිඟු වැනි ධාතු රාශියකට පරිවර්තනය වී තිබුණි. ඔහු විස්මයට පත්වී ඉක්මනට ගොස් සද්ධිෆෝන් හෝටලයේ තැන්පත් කළ අනික් ධාතූන් පරීක්ෂා කළේය. එම ධාතූන් ද එවැනිම පළිඟු කැට වැනි ධාතූන් වී ඇත. ඉන් ඉතා ස්වල්පයක් කුඩු වී ගොස් තිබුණි. කල්යාමේදී ඒවාද එම පළිඟු මෙන් විනිවිද පෙනෙන කුඩු බවට පත්විය. අන්තිමේදී මේ සියලුම ධාතූන් වහන්සේලා ගණන් කර බැලූ විට 344ක් තිබුණි. මේ එක් සිද්ධියකි. මෙම සිද්ධිය පිළිබඳ පුවත දස අත පැතිරී ගියේය. බොහෝ දෙනා ධාතු ඉල්ලන්ට විය. බූන් වන භික්ෂුව ඒ සියලු දෙනාටම ධාතු බෙදා දුනි. දෙවාරයක් මට ද ධාතූන් ලැබුණි. මුල් වතාවේ පහක් ද පසුව දෙකක් ද ලැබුණි. මෙය ලබා ගැනීමට පසු මා සතුව ඉතා වටිනා ධාතූන් ඇති බව මම ප්‍රසිද්ධ කළෙමි. මා කෙතරම් සතුටු වූ නමුත් අන්තිමේදී යම් ස්ත්‍රීහු අවුත් මේ සියලු ධාතූන් ඉල්ලා ගත්හ. එහෙත් මම දුක්මුසු නොවූයෙමි. මින් පසු ඒ පිළිබඳ ප්‍රසිද්ධ කිරීමක් නැති බැවිනි.

මුලින්ම ධාතු ඉල්ලා සිටියේ කාන්තාවන්ය. ඒ අය බලන්නට යැයි ධාතූන් අතට ගෙන රහසින්ම තම පසුම්බියට දමා සඟවා ගත්හ. එය නැවත ඉල්ලන්නේ කෙසේද ? අන්තිමේදී මට කිසිම ධාතූන් වහන්සේ නමක් අයත් නොවීය. බූන් වන් භික්ෂුව බොහොමයක් දී අවසානය නැවත මට ඉල්ලන්නට නොහැකි විය.

බූන් වන් භික්ෂුව සන්තකව තිබූ භෂමාවශේෂ ධාතූ බවට පරිවර්තනය වූ පසු බොහෝ තැන්වලින් එවැනි සිද්ධීන් වාර්තා විය. අද දක්වා මේ ධාතූන් වහන්සේලාට ගෞරවාදරයෙන් බොහෝ දෙනා පුද පූජා පවත්වති. එය රහසිගතව කරන්නේ යම් යම් අය මේ අති උතුම් ධාතූන් වහන්සේලා මැණික් මෙන් වටනා බැවින් ඉල්ලන බැවිනි. ආචාර්ය මන් සමඟ ඉතාමත් කිට්ටු උන්වහන්සේට අසීමිත ගෞරව දක්වන අයට පමණක් මෙම ධාතූන් වහන්සේලා ලබා ගැනීමට හැකිවිය. මට සිදු වූ දෙයින් මේ බව වැටහුණි.

මෙම ධාතූන් වහන්සේලා ඍද්ධි ප්‍රාතිහාර්යය පාන බව බොහෝ දෙනා කියති. එක් අයෙක් සතුව ධාතු දෙනමක් තිබුණි. ඔහු වැඳුම් පිදුම් කර තව එක් නමක් වඩින්වා. ''ත්‍රිවිධ රත්නය සංකේතවත් කිරීමට තුන් නමක් මට ලැබේවා'' ආදී වශයෙන් ඉල්ලා සිටියහ. ඔහුට තව ධාතුවක් ලැබුණි. නමුත් ධාතු තුනම එකට බද්ධ විය. තව කෙනෙක් ධාතු දෙකක් ඇතිව තව ධාතූන් වහන්සේලා ලැබීමට ආයාචනා කළේය. එවිට එම ධාතු දෙක එකට බද්ධ විය. මේ බව මට දැනුන් දුන්

විට මේ සියල්ල ආචාර්ය මන්ගේ ශාරීරික ධාතූන් බැවින් එහි අසීමිත ශක්තියක් ඇති බව පහදා දුනිමි. ඒ සිදු වූ දෙය ආශ්චර්යය දෙයක් වේ. උන්වහන්සේගේ කෙස් මෙවැනි පුදුම ආකාරයට ධාතු බවට පරිවර්තනය වී ඇත.

අද උන්වහන්සේගේ ධාතු සොයා ගැනීමට නොහැකිය. මක්නිසාද යත් එම ධාතූන් වහන්සේලා අයිති අය නොයෙක් පුද සත්කාර පවත්වමින් එය තම පරම්පරාවට අයත් දෙයක් ලෙස ආරක්ෂා කරති. තමන් ළඟ ඇත්තේ ඉතා ස්වල්පයක් බැවින් කිසිවෙක් එය දිමට නොකැමති වේ.

ආචාර්ය මන් සමඟ ආශ්‍රය කළ අය තමන් ලැබූ පුදුම අත්දැකීම් ගැන පවසති. තමාගේ තරහව ඉවසන්ට බැරිවිට ආචාර්ය මන් මතක් කිරීම නිසා තරහව පහවේ. තමාගේ දුක් දොම්නස් මෙසේ ආචාර්ය මන් මතක් කිරීමෙන් පහ කර ගනිති. ගින්නෙන් රත් වූ තම සිතට සීතල වතුර වත් කරන්නාක් මෙනි. එවිට ලැබෙන සහනය කෙතරම් ද යත් ඒ වෙලාවේම වැඳ වැටී වන්දනා මාන කරති. මෙවැනි අනන්ත සිද්ධීන් අපට වාර්තා නොකර ඇති බව කිය යුතුය. භික්ෂූන් වහන්සේලා තම සිතට ඇවිලුන කෙළෙස් මේ ආකාරයෙන් ආචාර්ය මන් සිහිපත් කිරීම නිසා බැහැර කර ගනිති.

උන්වහන්සේගේ ජීවිත කාලයේදී සීමාවක් නැති තරම් පුද්ගලයන් නිවැරදි මාර්ගයේ යාමට පුහුණු කර ඇත. ඉන් අවුරුදු 40 ක් පමණ භික්ෂූන් පුහුණු කිරීමේ නිරත විය. ඉන් ඉතාම දක්ෂ භික්ෂු පරපුරක් බිහිවිය. උන්වහන්සේලා දැන් ආචාර්යවරු වෙති. උන්වහන්සේ ගත් දෘඪ අධිෂ්ඨාන ශක්තිය හා වීර්යය නිසා මෙම ධර්මය අන් බොහෝ අයට ඉගැන්වීමට හැකිවිය.

සිත තුළ කුසලතාවයක් නගා ගැනීම ඉතා වැදගත් හා අසීරු දෙයකි. එය සිතේ නිරන්තරයෙන්ම පවත්වා ගැනීම දුෂ්කර වේ. තම හදවතේ අවංක භාවය මත මෙය රඳා පවතී. හදවත කුසල් අකුසල් දෙකටම මඟ පෙන්වයි. සිතා මතා තීරණ ගැනීම තම හදවතේ කාර්යයකි. තමා සිතේ ඇති කුසල් අකුසල් ඒ මොහොතේදී හඳුනා ගැනීම නිසා අකුසල් බැහැර කිරීමට කුසල් වර්ධනය කිරීමටත් හැකිවේ. එවැනි අය තම ජීවිතය සතුටින් සන්තෝෂයෙන් කුසලතාවයෙන් ගත කරයි. අපි ආචාර්ය මන්ගේ චින්තනයේ ඇති කුසලතාව, දක්ෂතාවය, උන්වහන්සේගේ දැනුම, ඥාණය ආදී විශිෂ්ට ගුණ ගැන දනිමු. එබැවින් අචල ශ්‍රද්ධාව ඇත. ජීවත්ව ඉන්න අවදියේදී එම අනුශාසනා තුළින් නිරන්තරයෙන්ම උන්වහන්සේගේ හැකියාව දැන ගතිමු. දැන් උන්වහන්සේගෙ ' පරිනිර්වාණයෙන් පසු එවැනි අවවාද අනුශාසනා නොලැබෙතත් ඒ ලබා ගත් දැනුම් සම්භාරය නමස්කාර පූර්වක කෘතඥතාවයෙන් සිහිපත් කරමු.

මිනිස් සිත දියුණු කිරීමේ දක්ෂතාවය ආචාර්ය මන් තුළ තිබුණි. මිනිස්

ලෝකයේ ඇති අති උත්තම ගුණ ධර්ම වර්ධනය වන ලෙස උන්වහන්සේ උපදෙස් දුනි. මෙසේ ධර්මයෙන් ආලෝකමත් වූ සිත කිසි කලෙක වරදෙහි නොබැඳේ. පරම පවිත්‍රතාවයට පත් වූ අරහත්ත චිත්තය කිසි කළෙක වැරදි කිරීමට නොහැකි වේ. එබැවින් ඒ සියලුම සිතිවිලි වචන ක්‍රියා සියල්ලන්ටම සුව දායක වේ. යම් ලෝකයක භෞතික දියුණුව මෙවැනි අධ්‍යාත්මික දියුණුව සමඟ සමබරව ඇත්තේ නම් එය සාර්ථක ලෝකයක් බව කිව යුතුය. එවැනි ලෝකයක සියල්ලෝම සතුටින් සහතෘප්ත වෙති. නමුත් භෞතික දියුණුව අධ්‍යාත්මික පරිහානිය සමඟ යන විට මිනිසාගේ සිත නිරන්තරයෙන් ගින්නෙන් දැවේ. ලෝකයේ යුද කෝලාහල, අනුන් පෙළීම, තර්ජන, වර්ජන, දුක් දොම්නස් අහස උසට නැග යයි. එවැනි ''සංවෘද්ධිය'' අපාය ලෝකයේ දක්නට ලැබේ. එක මොහොතක් ධර්මිෂ්ඨ සිතුම් පැතුම් වලින් විරහිත සිතක් දෙස බැලූ විට පෙනී යන්නේ සිත තුළ වහනය වන් දුර්ගන්ධ අසූචි ගොඩකි. කෙළෙස් වැගිරීමකි. ආපය යනු කුමක්දැයි ඔබට දැන ගැනීමට අවශ්‍ය නම් භෞතික දියුණුව සමඟ ඇති අධ්‍යාත්මික පරිහානිය දෙස බලන්න. සිතේ ක්‍රියාකාරිත්වය දෙස බැලීම, අතපසු වූ විට මිනිසාගෙ හැසිරීම, අශීලාචාර, දුරාචාර, අධම, වරදෙහි පොළොඹවන, හිංසාකාරී තත්ත්වයකි. කොටින්ම කියතහොත් එහි සතුට අතුරුදහන් වී යයි. හොඳ යැයි අගය කිරීමට කිසිවක් නැත. මේ බව වටහා ගත් ගුණ නුවණ ඇති අය සියලු භෞතික වර්ධනයට වඩා අධ්‍යාත්මික වර්ධනය අගය කළහ. ඒ සියල්ලට සිත ප්‍රධාන වන බැවිනි. සිත දියුණු වූ විට යමෙකුගේ හැසිරීම ඒ අනුව පිරිසිදු වේ. එවැනි අයගේ මඟ පෙන්වීම අනුව මුළු ලෝකය සාමය සතුටින් පිරී යයි. ඒ අය තමනුත් අධ්‍යාත්මික දියුණුව ලබා සමාජය ද ධර්මයට අනුව සාධාරණ අන්දමින් පාලනය කරත්.

යමෙක් කෙතරම් ලෞකික වශයෙන් දියුණු වුවත් ඉර, සඳ, තාරකා ගවේෂණය කළත් ඔහුගේ අධ්‍යාත්මික වර්ධනය නැති නම් ඔහු විශ්වාස කටයුතු නොවේ. ඒ සියලුම ජයග්‍රහණ වැදගත් නොවේ. ඔහු ම නොදියුණු මනසින් නිකුත් කරන වචන සහ ක්‍රියා විෂ සහිත බැවින් සමාජය දූෂණය කරයි. මේ ''දක්ෂ'' තැනැත්තා තිරිසන් සතුන් මෙන් එකිනෙකා වැනසීමට යොමුවේ. ඒ දක්ෂකම් තමාගේ අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමට මාන බලයි. ගුණ නුවණ දියුණු පුද්ගලයාට ඩිප්ලෝමා නැතත් තම හැසිරීමම උසස් චරිත සහතිකයක් වේ. සහතික අනුව අපි සිත උදුම්මවා ගත යුතු නොවන්නේ ඒ බැවිනි. ඇත්තෙන්ම එම සහතික තම වංචනික වංක චරිතයට ආවරණයක් විය හැකිය. තමා කෙතරම් සැඟවී සිටියත් අනුන් වෙත පමුණුවන වද හිංසා සැඟවිය නොහැකිය. ඔහුගෙ ක්‍රියාකාරකම් සැමවිටම එළිදරව් වේ.

මෙවැනි අවාසනාවන්ත තත්ත්වයක් උදාවන්නේ ආධ්‍යාත්මික ගුණ හීන වූ විටය. මේ ලෝකයට සතුට සැනසුම ලබා දෙන්නේ ඉතා දූෂිත සිත් වලින්

සැළසුම් කළ භෞතික දියුණුව නිසා යැයි අපි පිළිගන්නේ කෙසේද ? ඔවුන්ගෙ අරමුණු කෙළෙස් වලින් පිරුණු ආත්මාර්ථකාමී අදහස් වේ. මෙවැනි අයගෙ නිපදවීම් තුළින් සාමය, අභිවෘද්ධිය ළඟාවේ යැයි කියන්නේ එවැනිම දූෂිත චරිත ඇති පුද්ගලයන් බව කිව යුතුය. ආධ්‍යාත්මික දියුණුව හා භෞතික දියුණුව අතර පරතරය විශාලය. රෑ දවල් මෙන් විරුද්ධය. මෙවැනි හේතූන් නිසා අප බුදුරජානන් වහන්සේ සමාධි බලය තුළින් සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය පෑම තහනම් කළහ. එම භික්ෂූන්ට දිව්‍යස් දිව කණ, දිව්‍ය ඥාණ ආදී බල ශක්ති තුළින් අහසේ ගමන් කිරීම පොළොවේ කිඳා බැසීම, ජලය මත ඇවිදීම ආදී නොයෙක් ප්‍රාතිහාර්ය පෑමට ශක්තිය තිබුණි. මෙවැනි දේ බුදුරජාණන් වහන්සේ අගය කර නැත. අගය කර ඇත්තේ ප්‍රඥාව වර්ධනය කිරීමට සීල, සමාධි උපයෝගී කර ගැනීමය. මෙසේ සිල්වත් ප්‍රඥාව ඇති අයගෙන් ලෝකයාට මහත් සේවයක්, ආශිර්වාදයක් සැලසේ. ලද පමණින් සතුටු වීම හැර අනවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීමක් බුදු දහමේ නැත. එම ශක්තීන් වැරදි ලෙස යොදා ගත හැකි බැවිනි. සිතේ සතුට, තෘප්තිය ඇතොත් ලෙඩ රෝග, ව්‍යවසන, මහළුවීම, මරණය ආදියට මුහුණ පෑමට පහසුවේ.

ආචාර්ය මන් සහ ආචාර්ය සඕගේ භෂ්මාවශේෂ ධාතු බවට පරිවර්තනය වීම ගැන බොහෝ අය ප්‍රශ්න කර ඇත. ආචාර්ය මන්ගේ ඇට ධාතුවීම ගැන අසා අවශේෂ අයගේ ඇට එසේ ධාතු නොවන්නේ ඇයි දැයි බොහෝ අය ඇසූහ. ඒ සියලුම ඇට කටු එකම පඨවි ධාතු වෙති. රහතුන් වහන්සේලාගේ පමණක් ධාතු බවට හැරෙන්නේ කෙසේද ? මෙහි ඇති වෙනස කුමක්ද ?

ඉතා කෙටියෙන් මගේ අදහස මෙසේය. සිතේ වෙනසයි. සිත යනු සැමට සාධාරණ වූ නමුත් එහි බලය සහ ගුණය එකිනෙකාගේ වෙනස් වේ. රහතන් වහන්සේගේ සිත ආර්ය සිතකි. එනම් ඉතාම පිරිසිදු වේ. සාමාන්‍ය මිනිසාගෙ සිත කෙළෙස් වලින් දූෂණය වී ඇත. මේ සිතේ බලය ශරීරය පාලනය කරයි. අරහත්ත චිත්තයේ පිරිසිදු භාවය නිසා ශරීරයේ ක්‍රියාකාරිත්වය පිරිසිදු වේ. මේ හේතුව නිසා එම ඇට පරිවර්තනය වීමට හැකිවේ. සාමාන්‍ය මිනිසාගේ සිත නිසා ඇතිවන ශාරීරික ක්‍රියාකාරිත්වය අපිරිසිදු වේ. එම දැවී ශේෂ වූ ඇට කටුවල මෙම වෙනස විද්‍යාමාන වේ. ආර්ය චිත්තය නිසා ඇති වූ ධාතු පිරිසිදු බැවින් මෙසේ පරිවර්තනය වේ.

සියලුම රහතන් වහන්සේලාගේ භෂ්මාවශේෂ මෙසේ වෙනස් වේදැයි මම නොදනිමි. සමහර රහතුන් වහන්සේලා අර්හත්වයෙන් පසු වැඩි කල් ජීවත් නො-වේ. සමහරු බොහෝ කල් ජීවත් වේ. එවැනි ශාරීරික ධාතු මෙසේ පරිවර්තනය වේ යැයි සිතිය හැකිය. එම සිතේ පිරිසිදුතාවයක් ඇත. රහතන් වහන්සේගේ සිත ඉතා සියුම් සමාධියකින් යුක්ත වේ. ඒ කුසල සමාධිය නිසා ශරීරයේ රෝග

බිජ අඩු විය හැකිය. ශරීරය පිරිසිදුතාවයක් ඇත. මේ නිසා ඇට ධාතු බවට පරිවර්තනය වන බව නිගමනය කළ හැකිය.

සමහර රහතන්වහන්සේලා ''දන්ධාභිඤ්ඤාද'' වශයෙන් හඳුන්වනු ලැබේ. උන්වහන්සේ බොහෝ කාලයක් තුළ සෙමින් සෙමින් කෙළෙස් දුරු කරති. අනාග ාමී වශයෙන් බොහෝ කාලයක් ජීවත් වේ. අරහත් මග්ග සහ අරහත්ඵල අතර බොහෝ කාලයක් ඉදිරියට හා පසුපසට යමින් විචාරති. මේ ආකාරයෙන් සිත පමණක් නොව සිරුරද පිරිසිදු වේ. පරිනිර්වාණයෙන් පසු මෙවැනි රහතුන්ගේ භෂ්මාවශේෂ ධාතු බවට පත්වේයැයි අනුමාන කෙරේ. ''ඛිපපභිඤ්ඤාද'' රහතන් වහන්සේ ඉක්මණින් රහත්භාවය ලබති. ඒ සමඟ පිරිනිවන් පානා කල්හි බොහෝ කාලයක් සිත හා කය පිරිසිදු වීමට නැත. සාමාන්‍ය කෙනෙකුගේ භෂ්මාවශේෂ මෙසේ ධාතු බවට පරිවර්තනයක් ගැන අසා නැත.

ආචාර්ය මන්ගේ භෂ්මාවශේෂ මෙසේ ධාතු බවට පරිවර්තනය වූවා පමණක් නොව නොයෙක් ආශ්චර්ය දේ සිදුවුණි. සමහරු ධාතුන් වහන්සේලා දෙනමකට වැඳුම් පිදුම් කරණ විට තවත් නමක් එහි වැඩියහ. එවිට තුන් නමකි. එසේම අනෙක් අයගේ ධාතූන් වහන්සේලා දෙනමගෙන් එක් නමක් අතුරුදහන් විය. එක් රජයේ නිලධාරියෙක් ආචාර්ය මන්ට බොහෝ පුද සත්කාර කරමින් සිට ආදාහන උත්සවට ඉතා උනන්දුවෙන් වැඩ කළේය. පසුව එහි භික්ෂුවක් ඒතුමාට ආචාර්ය මන්ගේ ධාතුන් වහන්සේලා දෙනමක් දුනි. ඔහු එය තබා ගැනීමට සුදුසු කරඬුවක් නැති බැවින් කුඩා හිස් කුප්පියක දමා මූඩිය තදකර තම ෂර්ට් සාක්කුවේ තැන්පත් කර එය සුරක්ෂිතව බොත්තම් දමා ගමට ගියේය.

සවස තම පවුලේ උදවියට පෙන්වීමට සියළු දෙනා කැඳවා ඉතාමත් සතුටින් තමා ළඟ මිළ කළ නොහැකි අගනා වස්තුවක් ඇතැයි බෝතල් කුප්පිය විවෘත කර බැලූ විට ඔහු පුදුමයට පත්වුනි. එහි ධාතු 3ක් පමණි. ඔහුගේ සතුට නිම් හිම් නැත. මෙය ආශ්චර්යකි. ආචාර්ය මන් රහතන් වහන්සේ නමකි කියමින් වැඳ වැටුණි. පවුලේ උදවිය එම ධාතු දෙනමක් ලැබුණු බවත් දැන් එය තුනක් බවත් ගැන සැක පහළ කළහ. ඔහු එම සැකය ප්‍රතිකෙෂ්ප කරමින් තමාට ලැබුණේ ධාතූන් වහන්සේලා ''දෙනමක්'' කියමින් භාවනාවක් මෙන් දවස පුරා කියමින් සිටි බව පැවසුවේය. හෙට උදේ මුළු පවුල සමඟ පන්සලට ගොස් මේ පිළිබඳ අසන්නට සැරසුණි. පවුලේ උදවිය හෙට වෙන තුරු නොසිට අදම යන්ට තීරණය කළහ. එහි ගොස් එම භික්ෂුවගෙන් ඇසීය. ''ඔබ වහන්සේ අද උදේ මට ධාතුන් වහන්සේලා කී නමක් දුන්නෙහිද ?'' ''මම ඔබට දෙනමක් දුනිම්, ඇයි අසන්නේ ? එකක් අතුරුදන් වීලාද ? ''නැත අතුරුදහන් වී නැත. තවත් එකක් වැඩියෙන් තිබේ.'' දැන් මට ධාතූන් වහන්සේලා 3 නමක් ඇත. අප මෙහි ආවේ අපේ පවුලේ උදවියගේ සැක දුරුකිරීමට. ''දැන් ඔබ මා කී දේ

විශ්වාසදැයි'' ඇසුවේය.

ඔහුගේ බිරිඳ සිනා සී ''මම හිතුවා ඔබට වැරදි ඇත කියා'' නැත්නම් විහිළු කළා කියා. දැන් මට කිසි සැකයක් නැත.''

එවිට එම භික්ෂුන් වහන්සේ ''මම අද උදේ ඔබගේ සැමියාට ධාතූන් වහන්සේලා දෙනමක් දුන්නා. ඔහු අපට බොහෝ උදව් උපකාර කරනවා. මට මේ ධාතූන් ලැබුණේ නබොන් රචඡසිමාහි බුන් වන් ගෙන්. එම ධාතූන් වහන්සේලා දැන් ලබා ගැනීමට දුෂ්කරයි. ආචාර්ය මන්ගේ භෂ්මාවශේෂ පමණයි මම දැක ඇත්තේ මේ ආකාරයෙන්. ධාතු බවට පරිවර්තනය වීමක් අපේ පැරණි පොත පතේ මෙවැනි සිද්ධීන් ගැන සඳහන් නමුත් කිසිවෙක් එය දැක නැත. මෙම ධාතූන් වහන්සේලා ඉතා සුරක්ෂිතව තබා වැඳුම් පිදුම් කරන්න. මේවා අතුරුදහන් වුවහොත් ඔබට මහත් දුකකට පත්වීමට සිදුවේ. මම නොකීවා කියන්ට එපා. ආචාර්ය මන්ගේ ධාතු නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍ය පානවා. ඔබට නොසිතූ සැප සම්පත් ළඟා වේවි. හොඳින් උදේ හවා පුද පූජා පවත්වන්න. ''ආචාර්ය මන් පිළිබඳ මට ලෝකයාට කියන්ට බැහැ. ඒ අය විශ්වාස නෙකරන නිසා මට පිස්සු යැයි සිතයි. ලෝකයේ මිනිස්සු යම් යම් අයගේ අගුණ දුර්වලකම් විශ්වාස කරනවා.









# 7

# දායාදය

නමුත් ගුණය පිළිබඳ විශ්වාස කරන්නේ නැහැ. හොඳ අය සොයන්ට අමාරුයි. නරක අය ලේසියි. තමන් ගැන කල්පනා කර බලන්න. අනුන්ගේ දොස් දකින නමුත් අනුන්ගේ ගුණය සළකන්නේ නැහැ නොවේද ?'' මේ දේශනා අසා සියලු දෙනාම අතිශය සතුටින් නිවෙස කරා ගියහ.

මෙම මෙවැනි සිද්ධීන් පොතට අඩංගු කළේ පාඨක ඔබගේ අවධානය පිණිසය. විද්‍යානුකූලව මෙවැනි දේ ඔප්පු කිරීමට නොහැකිය. කෙළෙස් සහිත පුද්ගලයන්ට මෙයට විශ්වාස කළ නොහැකිය. කෙළෙස් සහිත පුද්ගලයන් කෝටියකවත් භෂ්මාවශේෂ මෙසේ ධාතු බවට පරිවර්තනය නොවේ. මින් පැහැදිලි වන්නේ රහතන් වහන්සේගේ පිරිසිදු සිතිවිලි හා එම ශක්තිය ඇට මිදුළු වලටත් කා වැදී ඇති බවය. මුළු ලෝකයම ආචාර්ය මන්ගේ උතුම් ගුණයට උපකාර දැක්වීමට සුදුසු වේ.

## අනිකුත් ප්‍රාතිහාර්යය

සාමාන්‍ය මිනිසා තමාගේ 'මමත්වය'' නිසා අන් කෙනෙකුගේ උසස් භාවය පිළිගැනීමට නොකැමති වෙති. එහෙත් එය පිළිගැනීම සිදු වන්නේ තමාගේ මෙ-ා්හය නිසා තමා අවශ්‍යාවට පත්වන බැවිනි. ආචාර්ය මන්ගේ ගෝල පරම්පරාව භික්ෂු, භික්ෂුණී, සාමණේර ආදී සියල්ලෝම උන්වහන්සේගේ ගුණ සමුදාය එක සිතින් පිළිගත්හ. උන්වහන්සේගේ ඉගැන්වීම් කිසිවෙක් ප්‍රතික්ෂේප නොකළහ. ජීවිත පූජාවෙන් එම ප්‍රතිපත්ති ගුරුකොට රැක ගත්හ.

උන්වහන්සේ දේශනා කළ සත්‍යය හා පරිශුද්ධතාවය ඉතා විද්‍යානුකූලය. ගණිතයේ එන ගැටළු නිරාකරණය වැනිය. 1ෑ 1 = 2 යන්න නොවෙනස් වේ. මේ

ආදී ගණිත ගැටළු ඉතාමත් සත්‍යය වේ. එය කාලයෙන් කාලයට හෝ රටින් රටට වෙනස් නොවේ. කුඩා දරුවෙක් හෝ ගණිතඥයෙකුට හෝ එකම ගැටළුවකට එකම විසඳුම ලැබේ. එය එකිනෙකාගේ සිතුම් පැතුම් මති මතාන්තරයෙන් වෙනස් කළ නොහැකිය. එමෙන්ම බුදුරජාණන් වහන්සේ සහ එම ශ්‍රාවක සංඝයාගේ වචන නිවැරදි වේ. කාලය - රට - ලාභ - ලෝභ අනුව වෙනස් නොවේ. එහෙත් පසු කාලීන අදහස් බුද්ධ භාෂිතය මෙන් වරදවා ඇති තැන් ගැන සුපරීක්ෂාකාරී විය යුතුවේ. ආචාර්ය මන් තමන් තුළින්ම සත්‍යය අවබෝධ කළහ. එය උන්වහන්සේගෙ ' අත්දැකීම් තුළින් නිරවුල්ව දේශනා කළහ. බාහිර ලෝකයාගේ ප්‍රශංසාව හෝ අප්‍රසශාව උන්වහන්සේට ප්‍රශ්නයක් නොවීය. සීල, සමාධි, පඤ්ඤා, විමුත්ති, නිබ්බාන උන්වහන්සේගේ ප්‍රත්‍යක්ෂ ධර්මයන්ය. එය නිර්භයව, විවෘතව ප්‍රකාශ කරති. අසා සිටින අයගේ කැමැත්ත නොකැමත්ත හෝ විශ්වාස හෝ අවිශ්වාස කිරීම ප්‍රශ්නයක් නොවේ. උන්වහන්සේ නොසඟවා දේව, බ්‍රහ්ම, ප්‍රේත ආදී අමනෂ්‍යයන් ගැන විස්තර කළහ. අසා සිටින අය තම අධිමානුෂික ප්‍රඥාවෙන් එය තහවුරු කර ගනිති. එවැනි අය ධර්ම මාර්ගයේ නොපැකිල ගමන් ගත්හ. තම ප්‍රශ්න ගැටළු තමා විසින්ම විසඳා ගත්හ.

උන්වහන්සේ තරම් තීක්ෂණ පරිඥ්ඥාවක් නැතත් සමහරු යම් තරමින් මේ අමනුෂ්‍යයන් ගැන අවබෝධ කළහ. උදා: එක් රාත්‍රියක ආචාර්ය මන් හමුවීමට දේව පිරිස පැමිණියහ. මැදියම් රාත්‍රිය පසුවී බැවින් උන්වහන්සේට වෙහෙස විය. එබැවින් සැතපීමට අවශ්‍ය විය. එවිටම තවත් දෙවි පිරිසක් පැමිණුනි. උන්වහන්සේට ඉතා වෙහෙස බැවින් විවේකයක් අවශ්‍ය බව වදාළහ. එනමුත් එහි වැඩ සිටි ගෝල නමකගේ ධර්ම දේශනාවට සවන් දෙන මෙන් දැනුම් දුනි. එම භික්ෂුව එසේ ධර්ම දේශනා කර පසුව සාකච්ඡා කළ පසු දෙවි කැළ සමුගෙන ගියහ.

පසුදා උදෑසන එම භික්ෂුව තම ආචාර්ය මන් සමඟ එම ප්‍රවෘත්තිය සැළකලහ. ''ඔබ වහන්සේ බැහැ දැකීමට පැමිණි බවත් ඔබ වහන්සේට දැඩි වෙහෙස බැවින් විවේක අවශ්‍ය වූ නිසා මා හමුවට යොමු කළ බවත් ඒ දෙවි කැළ පැවසීය. මේ සැබෑවක් දැයි නොදනිමි. ඔවුන් කීවේ සත්‍යයක්ද ? මේ ගැන සැක ඇති නිසා මම අසමි''යි කීය.

''ඇත්තෙන්ම දේව පිරිස් ගණනාවකට ධර්ම සාකච්ඡා කර මම ඉතාම දැඩි වෙහෙස වුනෙමි. එබැවින් ඇත්තෙන්ම ඒ පිරිස ඔබ වහන්සේට මම යොමු කළෙමි. හොඳට හිතා ගන්න. දෙවිවරු කවදාවත් භික්ෂූන්ට බොරු නොකියත්. මනුෂ්‍යයන් මෙන් කපටි, බොරු රැවටිලි නැත. දෙවියෝ ප්‍රතිඥාවක් දුන්නොත් එය අනිවාර්යෙන්ම ඉෂ්ට කරති. නියම කරගත් වේලාවට නොවරදවා පැමිණෙති. මම භූමාටු සහ ආකාසට්ඨ දෙවිවරු සමඟ බොහෝ ඇසුරු කර ඇත. ඒකාන්තයෙන්ම

තම වචනය අනුව හැසිරෙති. තම වචනය බොරු කරණ අය ගැන කුපිත වෙති. ඔහු හැර දමති

සමහර විට මා වුවද විවේචනය කරති. මම හිතාමතා නොකළ නමුත් සුළු ප්‍රමාද දෝෂ ගැන විචාරති. සමහරවිට දෙවි කැළ එන වේලාවේදී මම තද සමාධියට පත් වී ඇත. එවිට දෙවිකැළ පැමිණ බලා සිටිති. සමාධියෙන් බැස ඒ අය සමඟ කථා කරන විට මෙපමණ වේලා බලා සිටි බව කියා දොස් නගති. නියම වේලාවට සමාධියෙන් පිබිදීමට නොහැකි වූ බව මම නිදහසට කරුණු මෙන් දැක්වූයෙමි.

සමහර විට මම දෙවිකැළට දොස් කියමි. ''මම එකම තනි පුද්ගලයෙකි. ඔබ සීයක්, දාහක්, දස දාහක් මා හමුවීමට පැමිණෙති. මම කෙසේ නියම වේලාවට මේ පිරිස් හමුවෙම්ද ? සමහරවිට මම අසනීපයෙන් පසුවෙමි. ඔබ මා ගැන අනුකම්පා කරන්න. සමහරවිට මම විවේක සුවයෙන් සමාධි වෙමි. එවිට කාලය ඉක්මවා ගිය නිසා මට දොස් නගති. මේ වැනි දේ සිදුවීම මට අපහසුවකි. එබැවින් මම ඔබ හමුනොවෙමි. මම තනිව විසිමින් මගේ කාලය හා ශක්තිය මිඩංගු නොකරමි. ඔබ ඒ ගැන කුමක් කියන්නේද ? දෙවිවරු එවෙලේම තම වරද පිළිගෙන සමාව අයදිති.

නිතර නිතර පැමිණෙන දෙවි කැල මගේ චර්යා රටාව දනිති. එබැවින් යම් ප්‍රමාදයක් ඉවසති. ස්වාභාවිකව දෙවියන් සත්‍යය ගරු කරත්. සියලුම ආක්‍යට්ඨ, භූමට්ට දෙවිවරු සතයය ගරු කරති. ඒ අය සමඟ කථා කිරීමට මම සමාධියෙන් නැගී සිටිය යුතු බැවින් එහි පාපය ගැන බිය වෙති''. මම ද දුන් පොරොන්දුව ඉටු කිරිමට ජීවිතය වුවද පරදුවට තබමි. එහෙත් මා සමාධියෙන් සිටින විට එය ධර්මයට කරණ මෙහෙවරක් නිසා දෙවියන්ට කළ පොරොන්දුවට වඩා වටිනා දෙයකි. දෙවියන් බ්‍රහ්මයන් හට මට මෙන් ඝන ශරීර නැත. ඉතා සියුම් විනිවිද පෙනෙන ශරීර ඇත. එහෙත් මගේ සිතේ ඇති සත්‍යයතාවය තරම් සත්‍යතාවයක් දෙවියන් හෝ බඹුන්ට නැත. එහෙත් සමහර මුග්ධයන් මෙන් මම මගේ වර්ණනාව නොකරමි. මෙය කියන්නේ ධර්මය යනු කෙතරම් වටිනා දෙයක්දැයි පහදා දීමටය. එබැවින් මේ දේ ගැන විමසු මැනව.'' මෙසේ කාරණාව පැහැදිලි කළ විට දෙවිවරු තමා අතින පාපයක් සිදු වුණිදැයි මහත් කම්පාවට පත්වෙත්. සියළු දෙනාම එකවිට සමාව අයදිති. ''මම මුළු විශ්වයේ කිසියම් කෙනෙක් හට තරහ වෛර නොකරමි. නිතර කරුණා මෛත්‍රී සිතින් සිටිමි. එහි කිසි විටෙක ද්වේශයක් නැත. මගේ සියලු කාර්‍යයන් ඉටු වෙන්නේ පිරිසිදු චේතනාවෙනි. දෙවියන්ට කුසල චේතනා ඇත. විශ්වාසනීය වෙති. මෙම ගති එතරම් විශිෂ්ට නොවේ. බුද්ධාදී රහතන් වහන්සේලාගේ සිත් සෑම අතින්ම

ඉතා පිරිසදු සිතුවිලි වේ. විශ්වයේ සිටින අයට එතරම් පිරිසිදුතාවයක් ගැන හැඟීමක් නැත. දෙවියන්ට ඇත්තේ සම්මුති සත්‍යයෙන් ඇති පිරිසිදු භාවයකි. බුදුන් රහතුන් එය ඉක්මවා ගොස් පරමාර්ථ සත්‍යයේ පිරිසිදු භාවයක් ඇත. එවැනි අවබෝධයක් නැති අයට එහි පිරිසිදුතාවය නොවැටහේ. මට එවැනි පිරිසිදුතාවයක් ඇත යන්න මගේ හපන්කමක් නොවේ. එය ස්වභාව ධර්මයකි. නමුත් දෙවියන්ට බඹුන්ට ඇති සිතේ කුසලතාව බුද්ධාදී රහතුන් වහන්සේලාගේ පාරිශුද්ධියට සමාන කළ නොහැකිය. එය සාමාන්‍ය විශ්ව සම්මුතියකි. මේ කරුණ ඔබ තරයේ වටහා ගනු මැනවි.''

මෙවැනි දේ දෙවියන්ට පමනක් ආචාර්ය මන් දේශනා කරති. මිනිසුන්ට එය වටහාගත නොහැකිය. නමුත් දෙවිවරු ධර්මතාවය ගැන ඇසීමට මහත් උනන්දුවක් දක්වති. තමන් උන්වහන්සේ පිළිබඳ දැරූ ආකල්ප වැරදි බවත් මෝහයෙන් තමා එසේ සිතූ බවත් පිළිගනිති. මින් මතු තම හැසිරීම ගැන වඩාත් පරික්ෂාකාරී වෙති. මෙසේ දෙවිවරු ස්වල්පයක් හෝ උරණ නොවී ඉතාමත් සුහද ලීලාවෙන් හැසිරෙති. එය දෙවියන්ගේ උසස් දේව පරිසරයේ ගති ලක්ෂණ වේ යැයි ආචාර්ය මන් පැවසීය.

මේ පොඩි උදාහරණයෙන් අධිමානුෂික තත්ත්වයන් ගැන ඔබට යම්කිසි අවබෝධයක් ලැබේයැයි මම සිතමි. මෙම ජිවිත ගුප්ත රහස් වී ඇත්තේ මිනිසාගේ ඇස්, කන් නාසාදී ඉන්ද්‍රියන්ට ගෝචර නොවන හෙයිනි. එහෙත් අතීන්ද්‍රිය සමාධි සිතට එහි කිසි ගැටළුවක් නැත. මේ සත්‍යතාවය ධර්මාභිසමය පිළිබඳව ද එකම බව කිය හැකිය. සම්මා සම්බුදුරජාණන් වහන්සේ අවබෝධ කළ මෙම සත්‍යය උන්වහන්සේට පමණක් විෂය විය. එහෙත් මම මේ ලියන කරුණු ගැන එබැවින් සමාව අයදිමි. මා මෙය ලියන්නට හේතුව උන්වහන්සේ ළඟින් ඇසුරු කළේ සුරතල් සතෙක් තම ස්වාමියා හැර නොයන්නාක් මෙනි. අවංක භක්තියක් තිබූ බැවිනි. මේ ලියවුන කරුණු ඔබගේ රසාස්වාදය පිණිස පමණි. මෙහි ඇති ආශ්චර්ය අද්භූත සත්‍යතාවය වචනයෙන් කියා පෑ නොහැකිය.

වර්තමාන යුගයේ තායිලන්තයේ මෙවැනි ආධ්‍යාත්මික හා බාහිර අතීන්ද්‍රිය දේ ගැන උනන්දුවක් දැක්වීමට ප්‍රධාන හේතුව වූයේ ආචාර්ය මන් බව කිව යුතුය. එවැනි ඥාණ පිළිබඳ අත්දැකීම ඇති අය විරලය. උන්වහන්සේගේ ප්‍රතිපදාව, තීක්ෂණ ප්‍රඥාව හා තියුණු අවබෝධය ලබාගැනීම පිණිස ගත් වෑයමකි. අපි සැවොමගේ ප්‍රතිපත්තිය අන්ධභූත මෝහයෙන් කළ නිසා එවැනි අත්දැකීම නොලැබිණ. එම වටිනා අත්දැකීම් අපට විස්තර කරන විට මා තුළ තිබුණේ මෝහයකි. එබැවින් එහි තත්ත්වය අදහාගත නොහැකිවිය. උන්වහන්සේගේ ශිෂ්‍ය පිරිස අතර මෙවැනි ඥාණ වැඩී ගිය අය සිටියහ. ඒ අය කිසි විටෙක ආචාර්ය මන්ගේ අත්දැකීම් අසත්‍යය යැයි විරුද්ධ නොවූහ. ඒ සියල්ල අනුමත කළහ.

තම අත්දැකීම් තුළින් එහි සත්‍යය වටහා ගත්හ. මෙයම අපේ සැක දුරු කිරීමට ප්‍රමාණවත් වේ. අපට නොවැටහුණත්, නොපෙනුණත් මෙවැනි අද්භූත සිද්ධීන් ගැන කිසිම සැකයක් නැත. අපේ ඉන්ද්‍රියන්ගෙන් සැඟවී ඇත. මේ අනුව සම්මා සම්බුදුරජාණන් වහන්සේ මෙවැනි අතිශය චමත්කාර දර්ශනයක් ප්‍රථම වරට තම ඤාණයෙන්ම අවබෝධ කර ගත්හ. එහි සත්‍යතාවය යම්කිසි ප්‍රමාණයකින් ඒ අර්හත් ශ්‍රාවක පිරිස හඳුනා ගත්හ. ඒ ගැන සාක්ෂි දරත්.

වර්තමාන යුගයේදී වුවද ආචාර්ය මන්ගේ අද්භූත අත්දැකීම් සමහර භික්ෂූන් වහන්සේලාට අද්භූත නොවීය. ඒ උන්වහන්සේලාට යම්කිසි අධිමානුෂික ශක්තියක් තිබුණු බැවිනි. මෙවැනි අද්භූත දෙයක් ගැන ආචාර්ය මන් පැවසූ විට එය අප වැනි ස්වාධීන මතධාරී විචිකිච්ඡා ඇති අයට පිළිගැනීමට නොහැකි විය. උන්වහන්සේ බන් නොං ෆිව් ආරාමයේ වැඩ සිටින කාලයේ මේ සිද්ධිය විය. යම් තලතුනා සුදු ඇඳ පොරවා ගත් කාන්තාවක් එම ගමේ විසුවාය. ඈ තුළ ආචාර්ය මන් ගැන පුදුම පැහැදීමක් තිබුණි. ඇගේ භාවනා අත්දැකීම් පිළිබඳ ආචාර්ය මන් හට පැවසුවාය. එක් රාත්‍රියක ඈ භාවනාවෙන් සිටින විට ඇගේ සිත ඒකාග්‍රතාවයෙන් සමාධිගත විය. මේ ආකාරයෙන් බොහෝ වේලා නිශ්චලව බලා සිටින විට ඉතා සියුම් කෙන්දක් වැනි නූලක් ඇගේ සිතෙන් නිකුත් වී එය ශරීරය විනිවිද පිටතට ගලා ගියේය. ඈ ඒ දෙස බලාගෙන සිටින විට මෙම සිත් ධාරාව එතුමියගේ ලේලියගේ කුසේ පිළිසිඳ ගැනීමට යන බව හැඟුණි. ඈ තවමත් ජීවත් වේ. ඈ ඉක්මනට සමාධියෙන් මිදී සිටියාය. මෙය එතුමියට විශාල වධයක් විය. මක්නිසාද එම ලේලියගේ කුසේ එක් මාසයක දරු ගැබක් තිබූ බැවිනි.

මේ ප්‍රවෘත්තිය පසුදා ආරාමයට අවුත් ආචාර්ය මන් සමඟ පැවසුවාය. නිහඬව බොහෝ භික්ෂූන්ද අසා සිටියහ. අපි සැවොම පුදුම වුනෙමු. මා විස්මිතව බලා සිටියේ ආචාර්ය මන් කුමක් කියාවිදැයි දැන ගැනීමටය. උන්වහන්සේ ඇස් පියාගෙන විනාඩි දෙකක් පමණ සිට මෙසේ කීහ.

''මීළඟ දිනයක මෙසේ සිත සමාධිගත වන විට යන්නේ කොහේදැයි බලා සිටින්න. එවිට එය සමාධියෙන්ම කඩා දමන්න. එසේ කළ හැකිනම් එය නැවත සිදු නොවේ. එය විශාල ශක්තියකින් කළ යුතුයි. නැත්නම් කැඩෙන්නේ නැත. නැත්නම් මම අනතුරු ඇඟවීමක් කරමි. එනම් ඔබ මැරී ලේලියගේ කුසේ උපත ලබයි. එබැවින් මහත් වීර්යකින් එය කඩා දැමිය යුතුයි.''

මෙම උපදෙස ලබා ඈ නිවසට ගියාය. දවස් දෙකකට පසු මුහුණේ උද්‍යෝගයක් ඇතිව ඈ ආරාමයට පැමිණියාය. ඈ දෙස බැලූ විගස ඈ සමර්ථ වූ බව පෙණුනි. ආචාර්ය මන් ප්‍රශ්න කළහ.

''කුමක් වුනාද ? ඔබ මැරිගොස් යෙහෙලියගේ කුසේ උප්පත්තිය නැති කරගත්තේද ?''

''එසේය ස්වාමීනි, මම පළමුවන රාත්‍රියේම එම බන්ධනය කඩා දැමුවෙමි. මම සමාධිගත වූ විගස එම දර්ශනය නැවතත් ඒ ආකාරයෙන්ම දුටුවෙමි. ඔබ වහන්සේ කී පරිදි ප්‍රතිභා ඥානයෙන් මම එය කඩා දැමුවෙමි. පසුදා රාත්‍රියේද මම එසේ දකී දැයි බැලුවෙමි. එය නොපෙණුනි. අද මට නැවත බැලීමට තරම් ඉවසා සිටීමට නොහැකි බැවින් මෙය දැනුම් දීමට පැමිණියෙමි. මෙය හොඳ උදාහරණයක්. සිත කෙතරම් සියුම්ද ? භාවනා ශක්තියක් ඇති අයෙකුට පමණක් මෙය දැකිය හැකිය. වෙන කිසි විධියක් නැත. ඔබ ඔබගේ කෙළෙස් වලට වසඟ වීමටයි අවස්ථාව තිබුණේ. ඔබ මැරී යෙහෙළියගේ කුසේ ඉපදීම නොදැනුවත්ම ඔබට සිදුවේ. භාවනාවේදී මෙය තේරුම් ගෙන වළක්වා ගත්තා.

මෙම සිද්ධියෙන් දින කීපයකට පසු ගැබ්ගෙන සිටි යෙහෙළිය ගබ්සා වී ගියේය. එම සම්බන්ධය එතනින් නැවතුනි.

ආරාමවාසී භික්ෂූන් මේ පිළිබඳ කුතුහලයක් ඇති කර ගත්හ. එකක් නම් යමෙක් ජීවත්ව සිටියදී ඊළඟ ආත්මයක් සැළසුම් කිරීමය. අනික ගබ්සා වීමය. එම වයසක ස්ත්‍රිය මේ පිළිබඳ ගමේ කිසිවෙකුට නොකීවාය. එහෙත් භික්ෂූන් වහන්සේලා අසා සිටි බැවින් දැන ගත්හ. එබැවින් ආචාර්ය මන්ගෙන් ප්‍රශ්න කළහ.

යමෙක් ජීවත්ව සිටියදී ඊළඟ උපත සැළසුම් කළ හැකිද ? ආචාර්ය මන් මෙසේ පිළිතුරු දුනි ''ඈ ඊළඟ භවය පිණිස සැළසුම් කළා පමණයි. එය ක්‍රියාත්මක වූයේ නැත. යමක් ආරම්භ කිරීමට පෙර සැළසුම කිරීම බොහෝ විට සිදුවේ. එබැවින් මේ සිද්ධියේදී තමා ජීවත්ව සිටියදී ඊළඟ භවයක් ඉපදුනා යැයි කීම වරදකි. එහෙත් ඈ ඒ සංඥාවන්ගෙන් හඳුනාගෙන එය කඩා නොදැමුවා නම් ඈ මැරී ගොස් එහි උපදී.

දෙවෙනි ප්‍රශ්නය ''එම ස්ත්‍රියගේ චුති සිත් පරම්පරාව කඩා දැමීම නිසා මිනිස් උපතක් නසා දැමුවාද ?''

මොකක් ද නැසුවේ ? ඈ තමන්ගේ චිත්ත පරම්පරාව කඩා දැමුවා ඈ ජීවත්ව ඉන්න කෙනෙකුගේ හිස ගසා දැමුවේ නැහැ. ඇගේ සිත ඈ තුළම තිබුණා. ඒ සිතේ අත්තක් පමණක් ගියා එම යෙහෙළිය කරා. එම අත්ත කැඩු විගස එය නැවතුණා.

මෙහි ඇති වටිනා දෙය නම් ආචාර්ය මන් එම ස්ත්‍රියගේ ප්‍රවෘත්තිය නිශ්ප්‍රභා නොකිරීමයි. එතුමියගේ භාවනා අත්දැකීම සැක කළේ නැත. එය

ඇගේ විකෘති මනසකින් හෝ ඈ දුටු දේ එසේ අර්ථ නිරූපණය කිරීම වැරදි බවක් නොකියා එයට පිළියමක් යෙදූහ. එය සත්‍යයක් ලෙස උන්වහන්සේ පිළිගෙන ඇත.

මෙම ප්‍රවෘත්තිය යම් ගුප්ත දෙයක් වුවද සැක කිරීමට හේතු නැත. ඈ ඉතාමත් ආදරයෙන් එම යෙහෙළියට සිටි බව හෙළි කළහ. නිතරම ඈ බැලීමට ගොස් ආදරය කළාය. එහෙත් මෙවැනි අද්භූත දෙයක් දෙදෙනා අතර ඇතැයි නොසිතුවාය. ආචාර්ය මන් මෙසේ උපකාර නොකළා නම් ඈ මැරීගොස් යෙහෙළියගේ කුසේ ඉපදීමට සිදු වේ.

සිතේ ඇති සංකීර්ණ භාවය සාමාන්‍ය කෙනෙකුට අවබෝධ කළ නොහැකිය. මේ නිසා තමාගේ සිත පාලනය කර තමාගේ සුභ සිද්ධිය සාදාගැනීම දුෂ්කර වේ යැයි ආචාර්ය මන් පැවසූහ. ඒ ස්ත්‍රියට සමාධිය නොතිබුණා නම් මේ සිතේ ක්‍රියාකාරිත්වය හඳුනාගැනීමට නොහැකි වේ. සමාධි සිතකින් පමණක් සිතේ ක්‍රියාකාරිත්වය හඳුනාගත හැකිය. ජීවිත ගමනේදී ඇතිවන සංකීර්ණ තත්වයන් විසඳාගැනීමට සති පඤ්ඤා ඉතාමත් අවශ්‍ය වේ. තවද මරණ මොහොතේදී ඇතිවන දුක් වේදනා ඉක්මවීමට නම් සති පඤ්ඤා දියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ.

මරණ මොහොතේදී ඇති චුති සිත ඉතාමත් වැදගත් සන්ධිස්ථානයකි. චුති සිත පැරදුනොත් අප නිරය තිරිසන් ආදි දුක්බිත පටිසන්ධියක් ගනී. එම ජීවිත කාලය එම පරිසරයේ අනේකවිධ දුකට පැමිණේ. චුති සිත දිනුවොත් එනම් කුශලතාවයක් ඇතොත් සති පඤ්ඤා ඇතොත් පමණක් අඩු තරමින් මිනිසත් බවක් ලබාගැනීමට හැකි වේ. නැතහොත් දේවලෝකවල උපත ලැබේ. මිනිසත් බව ලැබුවත් තම කුශලතාවල පුරුද්ද ඇත. මේ ආකාරයෙන් සසර ඉපදෙමින් ක්‍රමයෙන් කුශලතා දියුණුවීමට පත් වේ. මරණය එවිට භයානක දෙයක් නොවේ. එක් ස්වර්ගයකින් තවත් සවර්ගයකට යාමකි. මෙසේ පරිනාමයට පත්වූ සිත් අපි පාරමිතා සම්පූර්ණයැයි කියමු. එවැනි අය නිවන් මාර්ගයට පැමිණේ. බුදුන් රහතන් වහන්සේලා ජාති ජාති මෙසේ පාරමිතා පුරා දියුණු සිත් ඇතිව අවසාන උපත ලදහ. එම සිත නිවන අරමුණු කරයි. මේ සියල්ල ක්‍රමානුකූලව කුසල් සිත දියුණු කිරීමෙන් ලබාගත යුතු වේ. එබැවින් නුවණැති ස්ත්‍රී පුරුෂයෝ නිතරම බණ භාවනාවේ යෙදෙමින් කුසල් සිත දියුණු කරති. එසේ තම වර්තමාන ජීවිතය හා අනාගතය සමෘද්ධිමත් කරගනිති.

ආචාර්ය මන්ගේ ජීවිත කථාව ලිවීමේදී මම මෙසේ අනිකුත් මාතෘකා යටතේ කරුණු දැක්වීම පිළිබඳ ඔබගෙන් සමාව අයදිමි. මෙම ජීවිත කථාව නියම ආකාරයෙන් පිළියෙල කිරීමට මහත් උත්සාහයක් දරමි. එහෙත් මගේ

මතකයේ දුර්වලකම නිසා මුලින් සඳහන් විය යුතු දේ පසුව සඳහන් කරමි. පසුව සඳහන් කළ යුතු දේ මුලින් ලියමි. දැන් මෙම කථා පුවතේ අවසාන ඡේදය වුවද තවමත් නොයෙක් කරුණු මතකයේ ඇති බැවින් සඳහන් කරමි. ඒ නිසා මෙහි අවසානය නොපෙනේ. ඔබ මෙය කියවන විට මෙය ශාස්ත්‍රීය සංග්‍රහයක් නොවන බව වැටහේ.

එක් දිනයක් බන් නොං ෆිවි ආරාමයේ වැඩ සිටින කල උන්වහන්සේ අළුයම සමාධියෙන් පිබිදී තම කුටියෙන් එළියට අවුත් එහි සිටි භික්ෂූන්ට තම කුටිය යට ඇති දූවිලි ගොඩේ විශාල නාගයකුගේ ගමන් පාර තිබේදැයි බලන්ට කීහ. පෙර දින රාත්‍රියේ විශාල නාගයෙක් පැමිණ උන්වහන්සේගෙන් ධර්මය ශ්‍රවණය කළේය. ඔහු නික්ම යාමට ප්‍රථම තමා පැමිණි බව දැන ගැනීමට යම් සලකුණක් කරන්නට අවසර ඉල්වීය. භික්ෂූන් වහන්සේලා කුටිය යට බලා විශාල නාගයෙකුගේ ගමන් මාර්ගය දැකිය හැකි බව කීහ. එය කැලෑවට ඇදී ගොස් ඇත. එහෙත් එය එහි පැමිණුන මාර්ගයක් නැත. කුටිය යට පිරිසිඳුව අතුගා තිබුණි. වෙන යම්කිසි සලකුනක් පහසුවෙන් දැකිය හැකිය නමුත් එහි තිබුනේ මේ සලකුණ පමණි. වෙන සලකුණු සෙවිය යුතු නැතැයි උන්වහන්සේ දැනුම් දුනි. ධර්ම දේශනාවෙන් පසු එම නාගයා එම කුටිය තුළින් යටට ඇදී ගිය මාර්ගය එයයි.

මෙම සලකුණ පළමුව භික්ෂූන් වහන්සේලා දැක උන්වහන්සේට දැනුම් දීම නිසා මෙම ප්‍රවෘත්තිය එළිදරව් වූයේ නම් එය පුදුමයක් නොවේ. ආචාර්ය මන් එම ප්‍රවෘත්තිය කලින්ම දැනුම් දීම මෙහි පුදුමය විය. උන්වහන්සේ මේ නාගයා දුටුවේ සමාධි සිතකිනි. එහෙත් එහි සත්‍යතාවය අන් භික්ෂූන්ට වටහාදීමට නො-හැකි බැවින් මෙසේ විශේෂ සළකුණක් තබන ලෙස ඉල්ලා ඇත.

පසුව සුදුසු අවස්ථාවක් ලැබුන විට භික්ෂූන්වහන්සේලා එම නාගයා පැ-මිණියේ නාග වේශයෙන් හෝ වෙනයම් වේශයකින්දැයි ප්‍රශ්න කළහ. නාගයන් එන්සේ මොන වේශයෙන්දැයි කීමට නොහැකිය.

ඒ අය ධර්මය ඇසීමට පැමිණෙන විට මනුෂ්‍ය වේශයකින් උසස් සමාජ මට්ටමක ඇඳුමින් සැරසී පැමිණෙති. නාග රාජයෙක් පැමිණෙන්නේ රජෙකුගේ විලාසයෙන් රාජකීය පිරිස පිරිවරාගෙනය. මහා තේජාන්විත ලීලාවකිනි. එබැවින් මගේ වචන ඊට සුදුසු පරිදි රජෙක් සමඟ කථාකරන විලාසයෙන් කථා කරමි. අවශේෂ පිරිස නිලධාරින් ලෙස සැරසී සීරුවෙන් සිටිති. ඒ අයගේ හැසිරීම ඉතාම ආචාරශීලී ගෞරවාන්විතය. මිනිසුන්ට වඩා ඉතා ලක්ෂණ හික්මීමක් ඇත. ධර්මය අසා සිටින විට එකම ඉරියව්වෙන් ගල්පිළිම මෙන් සිටිති. සිතේ කයේ විසිරයාමක් නැත. ප්‍රශ්න අසන විට නායකයා පමණක් අනිත් පිරිස වෙනුවෙන් අසයි. යමෙකුට ප්‍රශ්ණයක් ඇතොත් එය නායකයාට කලින් දැනුම් දෙති. සියලුම ප්‍රශ්නවලට

පිළිතුරු ලැබුන විට සියලු දෙනාම එකවර නැගිට පිටවී යති.

මෙයද ආචාර්ය මන්ගේ විශේෂ ශක්තියකි. එහි නියම ස්වභාවය අපට දැන ගැනීමට නොහැකි වුවත් යම් අදහසක් ලැබේ. එක් දිනක් එක් භික්ෂුවක් ආචාර්ය මන් එක්තරා සිගරට් දුම් වර්ගය පානය කරන බව දැන එක් ගිහියෙකුට මුදලක් දී එම සිගරට් වර්ගය ගෙන ඒමට කීවේය. ගිහි පින්වතා එය මිලදී රැගෙන ආ විට එම භික්ෂුව එය පිළිගැන්වීය. එවේලේ ධර්ම දේශනාවක් කරණ බැවින් කිසිවක් නොකියා භාරගත්හ. එහෙත් පසුදා එම භික්ෂුව පැමිණි විට එම සිගරට් ආපසු රැගෙන යාමට නියෝග දුන්හ. එම සිගරට් භාවිතා නොකරන්නේ සාමූහික මිල මුදල් නිසා යැයි පැවසීය. එම භික්ෂුව ඒ මුදල තමා සන්තක බවත් එම ගිහි පින්වතා මිලදී ගත් බවත් පැවසීය. එය උන්වහන්සේට දුන් පූජාවකි. නමුත් එය බොහෝ අයට අයත්යැයි ප්‍රතික්ෂේප කළහ.

ඒ ගැන තව දුරට විමසීමට හයින් එම සිගරට් ආපසු රැගෙන ගියේය. පසුව ඒ ගිහි භවතා කැඳවා එම සිද්ධිය විස්තර කළහ. එවිට එම පුද්ගලයා භික්ෂූන් වහන්සේලා කීප නමක් ඔහුට මුදල් දුන් බවත් යම් යම් දේ මිලදී ගත් බවත්, ඉන් ඉතිරි වූ මුදලින් ද සිගරට් මිලදී ගත් බවත් පැවසීය. එම භික්ෂූන් වහන්සේලාගේ නම් අසා දැන ඒ පිළිබඳ විමසීමට උන් වහන්සේ ගියේය. ඒ සියලුම දෙනා ඉතා සතුටින් එම මුදල සිගරට් සඳහා වියදම් කිරීමට කැමති බව එකහෙලාම කියා සිටියහ. ඉන්පසු එම භික්ෂුව ආචාර්ය මන් හමුවේ එම සිගරට් නැවත තැන්පත් කර ඒ මුදල අනිකුත් භික්ෂූන්ගෙන් ලබාගත් බව නොදැනීම ගැන සමාව අයදින බවත්, ආචාර්ය මන් කී පරිදි එම ගිහි පින්වතා අනිකුත් භික්ෂූන්ගේ ඉතිරි මුදල් ගත් බවත් ඒ සියලුම භික්ෂූන් ඒ පිළිබඳ සතුටින් දායක වන බවත් පැවසීය. එවිට ආචාර්ය මන් කිසිවක් නොකියා එය භාරගත්හ. ඒ පිළිබඳ කිසි දෙයක් ඉන්පසු පැවසුවේ නැත.

පසුව භික්ෂූන් වහන්සේලා අතර කථා බහ ඇතිවිය. ''මම කෙතරම් උත්සාහ දැරුවත් ආචාර්ය මන්ගේ තීරණය වැරදි යැයි කීමට අවසානයේදී මම ම වැරදි බව පිළිගතිමි. උන්වහන්සේ මේ මුදල බොහෝ අයගෙන් එකතු වූ බව දැනගත්තේ කෙසේද? උන්වහන්සේට සිගරට් මිලදී ගැනීම ගැන කිසිවෙක් කියා නැත'' මේ අතර එක් භික්ෂුවක් නැගී සිට සිංහ නාදයක් දුනි.

''උන්වහන්සේ අපි වැනි අයෙක් නම් මේ පිළිබඳ කිසිවක් නොදනී. උන්වහන්සේ එසේ නොව අපට වඩා අතිවිශිෂ්ඨ ප්‍රඥාවක් ඇති කෙනෙකි. ඒ නිසා අපි මෙහි රැඳී සිටිමු. අපේ දැනුම සහ උන්වහන්සේගේ දැනුම අහස පොළොව මෙන් වෙනස් වේ. උන්වහන්සේ සෑම අතින්ම නිවැරදියි. ඒ නිසා මගේ ජීවිතය මෙසේ පුද කරමි. මෙම පුහුණුව මම භක්ති ප්‍රණාමයෙන් නිහතමානීව

පිළිපදිමි. මගේ සිතේ තවමත් කෙළෙස් ඇත. එහෙත් උන්වහන්සේගේ ඉදිරියෙහි ඒ කෙළෙස් දුර්වල වී යටපත් වේ. මීට හේතුව මම භයෙන් සහ ගෞරවයෙන් උන්වහන්සේට යටහත් වීමයි. මේ ශක්තිය නිසා කෙළෙස් වලට නැගී සිටිය නොහැකිය. ගුරුවරයාට අභියෝග නොකරයි. දැන් ආචාර්යවරු සමග සිටින විට කෙලෙස් ඉබාගාතේ නැගී සිට ආචාර්යවරයාට අභියෝග කරයි. එසේ නොව, මෙහිදී උන්වහන්සේට සම්පූර්ණයෙන් යටත් නොවුවොත් උන්වහන්සේගේ උපදෙස් නොලැබේ. එවිට අප මහත් ව්‍යසනයකට පත් වේ. මේ සිගරට් සිද්ධිය ගැන වෙන කුමක් කියම්ද?''

රාත්‍රි කාලයේදී තම සිත වසඟ වූ යම් අකුසල සිතිවිලි පරම්පරාවක් නිසා පසුදා උදෑසන ආචාර්ය මන්ගේ බලවත් ප්‍රතික්‍රියාවක් ඇතිවීම නියතය. ඒ බලන බැල්ම වුවද තම සිත දෙදරා භය සැක ඉපදී මුළු ගත සිත විසිරී යයි. එවැනි අවස්ථාවලදී උන්වහන්සේ සම්මුඛ වීම හෝ යම්කිසි උපස්ථානයක් කිරීමට ළං වීම කළ නොහැකිය. මක් නිසාද උන්වහන්සේ එය ප්‍රතික්ෂේප කරයි. මේ ආකාරයෙන් එම භික්ෂුවගේ දඩබ්බර ගතියට පහර දෙයි. එහෙත් පුදුමය නම් එම භික්ෂුව අතිශය කනස්සල්ලට ඉන් පත්වුවද පසුව ආචාර්ය මන් ස්වභාවික විධියට කථා කලවිට ඒ සියලු කනස්සල්ල දුරු වී යයි. එම වැරදි ක්‍රියාව නැවත කරයි. එම සිතුවිලි නැති කිරීමට තරම් භාවනා බලයක් නැත. වඳුරෙක් ගස් පනින්නාක් මෙන් සිතුවිලි විසිරී යයි. එම භික්ෂුව පසුව ආචාර්ය මන් හමුවීමට ගිය විට තමා පිළිගැනීමක් නැති බව වැටහේ. උන්වහන්සේගේ මුහුණින් සංඥාව පැහැදිලිය. නැවතත් පාඩම ඉගෙන ගත යුතුය. නැතහොත් නැවතත් එවැනි සිතිවිලි මාලාවේ නිමග්න වී එහි වරදක් නැතැයි සිතයි. එබැවින් උන්වහන්සේගෙ '' විරෝධය මත තමා සති සම්පජක්ඤයෙන් පසුවන විට ඔහුගේ සිත සතුටින් සැනසිල්ලෙන් පවතී. ඉන්පසු ආචාර්ය මන් හමුවීමට භය සැක දුරු වේ.

මගේ සිත ද මේ ආකාරයෙන් බොහෝ විට ක්‍රියා කළේය. සිත පාලනය කර ගැනීමට නොහැකි බැවින් ආචාර්ය මන් ගෙන් ඈත් වී සිටීමට නොහැකිය. උන්වහන්සේ ළඟ සිටීම නිසා නිතරම භය සැක ඇතිව සිත රැකගනී. ඉන් සිදුවන්නේ සිත යථාමාර්ගයට පත්වීමය. සිත වැරදි මාර්ගයේ ගිය විගස ඉන් මුදවා ගැනීමට මහත් වීර්යයක් දරන්නේ එහි ඵලවිපාක දන්නා බැවිනි.

ආචාර්ය මන් මගේ සිත් දන්නා බව මම නිසැකයෙන්ම දනිමි. අන් අයගේ සිතුවිලි දන්නා බව මට ප්‍රශ්නයක් නොවේ. මට අදාල වන්නේ උන්වහන්සේ මගේ සිතිවිලි දකිමින් මට හොඳ පාඩම් ඉගැන්වීම නිසා මගේ දඩබ්බරකම් නැතිකර ගැනීමට මට කරන උපකාරය වේ. එක් අවස්ථාවක මම උන්වහන්සේ සමඟ වාසය කරන කාලයේ මගේ සිත විපරීත විය. ''ආචාර්ය මන්හට අනුන්ගේ සිත් දැකීමට හැකියැයි කියති. මෙය සැබෑවක්ද? මෙය සත්‍යයක් නම් මේ මොහොතේ මගේ

සිතුවිලි උන්වහන්සේ දනිත්ද? එය දන්නේ නම් මම පිළිගනිමි. මට දැන් පවතින සිත දනී නම් මම උන්වහන්සේට නමස්කාර කරමි. එය පමණක් මට ඇත.

එදින සවස මුණ ගැසුණ උන්වහන්සේ මගේ දෙස ඇසි පිය නොගසා බලා සිටිති. උන්වහන්සේ මා දෙස හැරී දැන් දැන් බැන වදිති. එහෙත් උන්වහන්සේ ස්වභාවික විධියට අනිකුත් භික්ෂූන්වහන්සේලාට දේශනය පවත්වති. උන්වහන්සේ ගැන සැක පහළ කරමින් උන්වහන්සේ පරීක්ෂා කිරීම ගැන සිතමින් මම වික්ෂිප්ත වුනෙමි. වැඩිකාලයක් යන්ට ප්‍රථම උන්වහන්සේගේ කටහඬ කසයකින් පහර ගසන්නාක් මෙන් මා අවට වැදුණි. මම යන්තම් බේරී සිටි නමුත් අවසානයේදී කස පහර වැදී මගේ සිත දෙදරා ගියේය. මගේ මුහුණ රතු වී ශරීරය වෙව්ලන්ට විය. වෙව්ලීම නැවැත්විය නොහැක. උන්වහන්සේගේ කටහඬ වේගවත් වේ. මුළු දේශනය මටම එල්ල විය. අවසානයේදී මගේ දඩබ්බර සිත මෙල්ල විය. ''මා එසේ සිතුවේ ඔබවහන්සේට සැබවින්ම අනුන්ගේ සිත් දැනගැනීමට හැකිදැයි විමසීමටය. ඔබවහන්සේට අවමන් කිරීමට නොවේ. ඔබවහන්සේ ශ්‍රේෂ්ඨ ගුරු-වරයෙක් බව මම දැන් දනිමි. මගේ ජීවිතාන්තය දක්වා ඔබවහන්සේගේ ශිෂ්‍ය-යෙක් වෙමි. මට අනුකම්පා කොට උගන්වන සේක්වා! මේ සිද්ධිය නිසා මා ගැන කළිකරීමට පත් නොවේවා!''

මෙසේ මගේ මුළු හදවතින්ම මම අවනත වීමි. එවිට උන්වහන්සේගේ කටහඬ මෘදු විය. අවසානයේදී එක්තරා න්‍යාම ධර්මයක් දේශනා කළහ.

''හරි වැරදි දෙකම ඇත්තේ ඔබ තුළය. ඇයි ඒ දෙස ඔබ නොබලන්නේ. අනුන්ගේ හරි වැරදි බලන්නේ කුමකටද? එසේ බලා ඔබට හොඳ යහපත් දක්ෂ කෙනෙක් විය හැකිද? වෙන කෙනෙක් දක්ෂ හොඳ කෙනෙක් බව දැනගත් නමුත් ඔබ හොඳ දක්ෂයෙක් නොවේ නම් අති වැඩය කුමක්ද? අනිත් අය ගැන විමසීමට ඔබ ඉතාම ගුණවත් දක්ෂයෙක් විය යුතුයි. එවිට නිරායාසයෙන්ම අනුන් ගැන දැනගත හැකි. අනුන් ගැන පරීක්ෂණ කිරීමට උවමනා නැත. ගුණවත් දක්ෂ උදවිය එසේ පරීක්ෂණ නොකරති. ධර්මය තුළින් තමාගේ කුශලතාවය දියුණුවූ විට පරීක්ෂණ නොමැතිව අනුන්ගේ සිත් ඉබේම දනිති.

දේශනාවසානයේදී මම ක්ලාන්ත ස්වභාවයකට පත්වුනෙමි. දාඩිය ගලා සිවුරු තෙත බරිත වී ඇත. එදා අවනත වූ සිද්ධිය මුළු ජීවිතයටම බලපා ඇත. නැවත කිසිදිනක උන්වහන්සේ විවේචනය නොකළෙමි. එදා දුන් පරිභවය මෙන් මගේ ප්‍රතිපත්තිවලටත් උන්වහන්සේ පරිභව කළා නම් මම මීට ප්‍රථම සසර දුක ඉක්මවමි. එහෙත් ඉන්පසු කිසිවිටෙක මට එවැනි දඬුවමක් නොලැබුනි! එය අභාග්‍යයකි!

පසුව භික්ෂූන්වහන්සේලා මේ පිළිබඳ කථා බහ කළහ. මෙය මගේම

අත්දැකීමක් නිසා සිගරට් කථාව සමඟ මෙය ඇතුලත් කළෙමි. මින් අදහස් කළේ සත්‍යය මුළු විශ්වයේ හැමතැනම පවතින බවයි. සත්‍යය අකාලිකයි. අවශ්‍යවන්නේ ශ්‍රද්ධා බුද්ධියෙන් යුතුව ප්‍රතිපත්ති රැකීමයි. එවිට ඇත්තෙන්ම මේ සත්‍යය කරා පැමිණේ. සියලුම සත්‍ය ධර්මයන් මේ ආකාරයෙන් දැනගත හැකි වේ. එක් එක් පුද්ගලයාගේ ගුණ වගාව වෙනස් වන බව අමතක නොකරන්න. සසර පැවැත්මේදී කළ පුරුදු හා ගත් අධිෂ්ඨාන ඇත. එහෙත් මගඵල සහ නිබ්බානයෙහි වෙනසක් නැත. මේ ඵල සියලු දෙනාටම එකාකාරීව අවබෝධ වේ.

## ආචාර්ය චොබ් ගේ නිර්භීත ක්‍රියා

ආචාර්ය මන් ආශ්‍රයට ලැබුන අපි උන්වහන්සේගේ ප්‍රතිපදා කිසි කලෙක අමතක නොකරමු. උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් කීප දෙනෙක් තවමත් ජීවතුන් අතර ඇත. මේ සෑම ආචාර්යවරයෙක්ම තම ආවේනික ගති පැවතුම් අනුව තරමක් වෙනස් වෙති. උන්වහන්සේලා ලැබූ අත්දැකීම් සහ ප්‍රඥාව වෙනස් වේ. මීට ප්‍රථම මම ඉන් සමහර ආචාර්යවරුන්ගේ නම් සඳහන් කළෙමි. තව බොහෝ ආචාර්යවරුන්ගේ නම් ගම් නොදනිමි. එහෙත් ආචාර්ය මන්ගේ ජීවන ප්‍රවෘත්තිය අවසානයේ එක් ශිෂ්‍යයෙකුගේ ජීවන ප්‍රවෘත්තියක් ඇතුළත් කිරීමට සිතුවෙමි. ඒ අය ප්‍රතිපත්ති අනුගමනය කළ අන්දම හා වෙනත් අත්දැකීම් ඇතුළත් කිරීම ප්‍රේක්ෂකයාට වැදගත්වන බැවිනි. බුදු සව්වෝ බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ පරිදි ආචාර්ය මන්ගේ ශ්‍රාවක පිරිස උන්වහන්සේ අනුගමනය කළහ. එනමුත් තමා නොයෙක් අත්දැකීම් ලබා අන්තිමේදී එකම අවබෝධයට එළඹුනාහ. මේ එක් එක් භික්ෂුව ප්‍රියකළ පරිසරය ඉතාම දුෂ්කර වූ අතර කොඳු නාරටිය කැඩී යන බලවත් පරිශ්‍රමයකින් යුක්ත විය.

මේ පිළිබඳ ආචාර්ය මන් ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෙකු වූ මගේ ප්‍රියතම පුද්ගලයෙක් ඇත. ධුතාංග භික්ෂූන්ගේ අත්දැකීම් අන් භික්ෂූන්ට වඩා බෙහෙවින් වෙනස් බැවින් මහත් ආශ්චර්යමත් අද්භූත දේ මෙසේ වාර්තා කරන්නේ බුද්ධ කාලයේ නිතර සිදුවූ මෙවැනි අද්භූත සිද්ධීන් අදත් පැවතිය හැකි බව පෙන්වීමටය. බුද්ධ චරිතයේ සමහර සිද්ධීන් උදා. ඇතෙකුගේ ආරක්ෂාව, වඳුරෙක් මී වදයක් පූජා කිරීම සමාන ආචාර්ය මන්ගේ අත්දැකීම් බොහෝ ඇත. මෙම කථා පුවත් සත්‍ය තොරතුරු බවට සාක්ෂි වශයෙන් තවමත් ජීවතුන් අතර වැඩ සිටින 70 වයස් ඉක්ම වූ ආචාර්ය චොබ් ගැන සඳහන් කරමි. උන්වහන්සේ ඝන වනාන්තරවල අද වනතුරුත් වාසය කරයි. රාත්‍රි කාලයේ වනයේ සංචාරය කරන විට නොයෙක් වන සතුන් හමුවීම පිළිබඳ නොයෙක් පුවත් කියති.

එක් සන්ධ්‍යාවක ලොම්සක් හි සිට චියාං මායිහි ලම්පං ප්‍රදේශයට ආචාර්ය චොබ් ගමන් ගත්හ. ගම් මායිමේදී යම් යම් ගම්වාසීන් මේ රාත්‍රි කාලයේ වනයට

පිවිසීම භයානක බව දැනුම් දුන්හ. එම කැලෑ ප්‍රදේශය විශාල බැවින් එහි රාත්‍රි කාලය ගත කිරීමට සිදු වේ. එසේ වුවහොත් කොටින්ගේ ගොදුරක් වනු නියතය. එහි දැන්වීම් පුවරුවක් ඇත. රාත්‍රි කාලයේ ''යක්කුන්ගෙන්'' ගහනය, ගමන් කිරීමෙන් වලකින්න. උන්වහන්සේ බොහෝ කථාපුවත් අසා ඇති නමුත් කොටියෙක් මුණ ගැසී නැත. ''යක්කු'' යන්නෙන් අදහස් කරන්නේ කවරෙක්දැයි ආචාර්ය චොබි විමසීය. එනම් වයිරන් වලින් වැසී ගිය විශාල කොටි බව ගැමියෝ කීහ. ආපසු ඔවුන් සමඟ රාත්‍රි කාලය ගත කිරීමට ගමට වඩින ලෙස ඔවුන් ඉල්ලා සිටියහ.

එහෙත් ආචාර්ය චොබි වනයේ සංචාරය කිරීමට කැමති බැවින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. ''ඔබ කොටින්ට භය නැද්දැයි ඔවුහු ඇසූහ. ''භය ඇතත් කම් නැතැ''යි උන්වහන්සේ පිළිතුරු දුනි. ඔවුන් නැවත නැවතත් ආයාචනා කළ විට ''මා කොටින්ගේ ගොදුරක් වී මරණයට පත්වීමට කර්‍ම කර ඇත්නම්, එසේ වේවා! තව ජීවත්වීමට හේතු ඇතොත් කොටින්ගෙන් හානියක් නැතැයි පැවසීය.

මරණයට පත්වීමට වුවත් නොබියව ගම්මුන්ගෙන් සමුගෙන ගමන ආරම්භ කළේය. කැලෑ අඩිපාරට පිවිසූ විගස උන්වහන්සේ දෙපස කොටින්ගේ අඩිපාර දුටුවේය. කොටි මළපහ කර දිගටම ඇත. සමහර පරණ වුවත් සමහ දැන් දැන් පහකළ මළ විය. උන්වහන්සේ භාවනා මනසිකාරයෙන් ගමන් ගත්හ. කැලෑවේ මැදට පැමිණි විට හතර පැත්තෙන් අඳුර ගලා ආවේය.

එකවරම මහත් කොටියෙකුගේ ගෙරවීම පසුපසින් ඇසෙන්නට විය. එවිටම තවත් කොටියෙක් ගොරවාගෙන ඉදිරියෙන් එති. කොටි දෙදෙනා උන්වහන්සේ ළඟට ගොරවමින් පැමිණෙති. අන්ධකාරයේ කොටි දෙදෙනා ඉදිරියට පැන ආහ. එකෙක් අඩි 6ක් පමණ ඉදිරියෙන් අනිකා අඩි 6ක් පමණ පසු පසිනි. ගෙරවීම කන් බිහිරි කරන තරම් ශබ්දයකි. මේ මධ්‍යයේ ආචාර්ය චොබි ගල්ගැසී සිටියි. පසුපස බැලූ විට අනිත් කොටියාද කුරුමානම් කරමින් පනින්ට යයි. එවිට භය භ්‍රාන්ත වී සිත නිශ්චල විය. එක අඩියක් ව.ත් යා නොහැක. එහෙත් සතිය බලවත් විය. උන්වහන්සේ තම සිත දෙස බලමින් කලබල නොවී සිටියේය. කොටින්ගෙ න් මරණයට පත්වුවද කමක් නැත. තම සිතදෙස බලා සිහිසන් ඇතිව සතියේන සිටින විට අවට පරිසරය නොදැනී ගියේය. ඒ සමඟම සිත බලවත් සමාධියකට පත්විය. එවිටම කොටින්ගෙන් හානියක් නොවන බව දැනුණි. ඉන්පසු සිත නිරුද්ධ විය. අවට පරිසරය නොදැනී ගියේය. මේ ලෙස පැය ගණනාවක් ගත විය.

මෙසේ පැය ගණනකට පසු ප්‍රකෘති සිත ඇති වී බැලූ කල තවමත් සිටගෙ න සිටිති. කුඩය සහ පාත්‍රා උරහිසේ එල්බෙමින් තිබේ. එක් අතක ඉටිපන්දම්

ලන්තෑරුම ඇත. එය ගෙවී නිවී ගොස් බොහෝ වේලාය. ඉන්පසු උන්වහන්සේ ඉටිපන්දම් ලන්තෑරුම පත්තුකර අවට ප්‍රදේශය බලා කොටි ඇද්දැයි බැලූහ. කොටි කොහේදැයි නොදැනේ.

එදින රාත්‍රියේ සමාධියෙන් නැගී සිටි විට භය කිසිවක් නොදැනේ. හදවතේ නිර්භීත භාවය කෙතරම් බලවත්ද යත් කොටි සියයක් පැමිණියත් සිත වික්ෂිප්ත නොවේ. තම ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් සිතේ බලය වැටහේ. විශාල කොටි දෙදෙනෙකුගේ ග්‍රහණයෙන් මිදීම මහත් පුදුමයකි. ඒ විශ්මය වචනවලින් කිය නොහැකිය. එතැනම සිටගෙන හුදෙකලාවේ කළුවරේ තම සිත තුළ බැලූ විට දැන් ඇත්තේ කොටින් කෙරෙහි බලවත් කරුණාවකි. ඔවුන් තම මිතුරන් වෙති. ධර්මය තේරුම්කර දුන් ආචාර්යවරු වෙති. ඔවුන් පාඩම උගන්වා අතුරුදන් විය. ඔවුන් කෙරෙහි භය වෙනුවට දැන් ඇත්තේ ඔවුන් දැකීමට කැමැත්තකි.

ආචාර්ය චොබ් මේ කොටි අතිවිශාල බව කීවේය. රේස් අශ්වයෙක් මෙන් විශාලය. එහෙත් ශරීරයේ දිග අශ්වයකුට වඩා වැඩිය. හිස අඟල් 16 පමණ පළල් වේ. මුළු ජීවිතේදී මෙවැනි විශාල කොටි දැක නැත. සිත සමාධි ගත වී ඉන් නැගී සිටි විට ඉතාම සැපදායක ප්‍රීතියක් දැනේ. තමන් කැමති තැනක යාමට බියක් නැත. තම සිත ධර්මයෙන් සන්තෘප්ත වූ විට විශ්වයේ ඇති අතිවිශාලතම ශක්තිය සිත බව වැටහේ. කිසිවකින් තමාට හානියක් නැතැයි දැනේ.

මෙම උතුම් ධර්මය සිත තුළ ඇතිව ගමන ආරම්භ කළහ. සති පඤ්ඤාවෙන් කායානුපස්සනාවෙන් ඇවිදියි. කොටි යාළුවෝ දෙදෙනා නිතරම මතක් වේ. ඔවුන් දුටුහොත් ළඟට ගොස් ආදරයෙන් පිට අතගෑමට සිතේ. එහෙත් කොටි එය නොඉවසන බව දනිති. මුළු රාත්‍රිය පුරා ආචාර්ය චොබ් සතුටින් සැනසීමෙන් සතියෙන් ගමන් කර එළිවන විට තවමත් වනාන්තරයේය. පාන්දර 9 ට පමණ කුඩා ගම්මානයකට පැමිණියේය. තම බඩු බාහිරාදිය පසෙක තබා සිවුරු හැඳ පොරවා පිඩු පිණිස ගමට වැඩියේය. ගම්මු පාත්‍රය දැක එකිනෙකාට හඬ ගා දානය දෙන ලෙස සංවිධානය විය. සමහරු උන්වහන්සේ සමඟ නැවත කැලෑවට පැමිණ බඩු තැන්පත් කළ බව අසා කොහේ සිට පැමිණියේදැයි ඇසූහ. මේ පිරිස රාත්‍රියේ වනාන්තරය තුළින් පැමිණීම ගැන විස්මිත වූහ. නොයෙක් ප්‍රශ්න විචාළහ. රෑ එළිවන තුරුත් නිරාහාරව පා ගමනින් වැඩි බවත් උතුරු ප්‍රදේශයට යන බවත් පැවසීය. කොටින්ගෙන් බේරී රාත්‍රිය පසුකර ගැනීම ඔවුන්ට මහත් ප්‍රහේලිකාවකි. සියලු පුවත් ආචාර්ය චොබ් කී නමුත් ගැමියෝ විශ්වාස නොකළහ. උන්වහන්සේ භාවනා බල මහිමයෙන් ඍධි ප්‍රාතිහාර්යයක් පෑ බව ඔවුන්ට තේරුම් ගිය පසු එය සාමාන්‍ය කෙනෙකුට නොකළ හැකි දෙයක් බවට පිළිගත්හ.

හදවතේ ගමන් මාර්ගය වේවා වනාන්තරයේ ගමන් මාර්ගය වේවා එහි ඇති

බියකරු බව හා දිග අපට පීඩා ගෙන දෙයි. පාර නොදැනීම විශාල පසුබෑමකි. දැනුම ඇති කෙනෙකුගේ මග පෙන්වීම අවශ්‍ය වේ. අපි මේ ගමන් අවසානයේ ක්ෂේම භූමියක් සතුටින් සන්තෝෂයෙන් බලාපොරොත්තු වෙමු. එසේ නම් ගමන් මාර්ගය හා දැනුම තිබිය යුතුයි. අපි නොයෙක් විට හිතු මනාපේ යම් යම් දේ කළත් එය සැබෑ ගමන් මාර්ගය යැයි සිතිය යුතු නැත. ඇත්තෙන්ම අපේ පුරුදු ගති පැවතුම් වැරදි මාර්ගයේ අප මෙහෙයවත්.

ආචාර්ය චොබ් මෙවැනි වන සතුන් සමඟ ගත කළ කාලයේ අත්දැකීම් අපමණය. එක් විටක බුරුමයේ මහ වනාන්තරයේ ගල් ගුහාවක වාසය කළේය. විශාල කොටි එහා මෙහා යති. නමුත් කිසිවකුගෙන් හානියක් නැත. එබැවින් ඒ පිළිබඳ බියක් නැත. නමුත් එක් දිනක් සවස 5 ට පමණ භාවනාවෙන් නැඟී සිටිවිට ගුහාවේ දොරටුව දෙස විශාල ඉරි ඇති කොටියෙක් එනවා දුටුහ. ඌ ඉතාම විශාලය. බියංකාරය. එහෙත් ආචාර්ය චොබ් නොසැලී සිටියේ වෙනදා මෙන් ඔවුන්ගෙන් කිසි හානියක් නොවූ නිසා විය හැකිය. උන්වහන්සේ ඔහු දෙස බැලූ විගස ඔහුද බලා සිටියි. සාමාන්‍යයෙන් ශබ්ද නගා ගොරවා යන්නේය. නමුත් මේ සතා ගෙදර ඇති කරන සුරතල් බල්ලෙක් මෙන් බලා සිටියි. ඉන්පසු සාමාන්‍ය ලෙස ඔබිනොබ බලා එක්වරම ආචාර්ය චොබ් ඉදිරියේ ගල්තලාවේ අඩි 18ක් පමණ ඈතට පැන්නේය. ඉන්පසු වාඩිවී උගේ කකුල් ලෙවකයි. උන්වහන්සේ ගැන කිසි වගක් නැත. උන්වහන්සේ එහි සිටින බව දනිති. සුරතල් බල්ලෙක් ගේ ඉදිරිපිට සිටින මෙන් ඔහු නිදැල්ලේ සිටී. ටික වේලානකින් කකුල් දිග හැර හාන්සි විය. විටින් විට ශරීරය ලෙව කයි. ගෙදර පැමිණි සුරතල් බල්ලෙක් මෙනි.

උන්නවහන්සේගේ සක්මන් මළුව එහි විය. එනමුත් සක්මන් කිරීමට උනන්දු වූයේ නැත. ඌ ඉතාම කිට්ටු නිසා තරමක බියක් දැනුනි. මෙසේ වනචාරී කොටියෙක් නිදැල්ලේ සිටින හැටි උන්වහන්සේ මීට පෙර දැක නැත. එබැවින් ගුහාවේ තුල බම්බු පැලලි මත වාඩිවී භාවනාවේ යෙදුනේය. බොහෝ වේලාවකට වරක් පැරනි මිත්‍රයෙක් මෙන් උන්වහන්සේ දෙස බලයි. ඔහු යන බවක් පේන්ට නැත. රෑ බෝ වී ඇති බැවින් ආචාර්ය චොබ් ඉටිපන්දම දල්වා මදුරු දැල තුළට ඇතුල් විය. ඉටිපන්දම මුළු ගල්ගුහාව එළිය කළේය. කොටියා තවමත් ඒ ආකාරයෙන් සිටී. වෙහෙස වූ බැවින් මැදියම් රාත්‍රියේ උන්වහන්සේ නිදාගන්ට විය. අළුයම තුනට පමණ නැගිට ඉටිපන්දම දල්වා බැලූ විට කොටියා තවමත් එතනමය. මුහුණ කට සෝදා භාවනා කිරීමට වාඩිවී එළිය වැටෙන තුරු භාවනා කළහ. මදුරු දැල ඉවත්කර බැලූ විට කොටියා තවමත් සිටී. අත් කකුල් දිගහැර සැප පහසුවෙන් වැතිරී ඇත. විශාල බල්ලෙක් තම ස්වාමියාගේ ගේ ඉදිරිපිට නිදන්නාක් මෙනි. පිණ්ඩපාත යාමට කාලය පැමිණ ඇත. කොටියා ඉදිරියෙන් යා යුතුය. කොටියා කුමක් කරයිද නොදැනේ. සිවුරු අඳින විට කොටියා ඒ දෙස ඉතා

කරුණාවන්තව ඇස් හැර බලයි. උන්වහන්සේට වෙන කරකියාගත හැකි දෙයක් නැත. අඩි කීපයක් අසලින් කොටියා ලගී. ඉන්පසු සිවුරු හැඳ පොරවා ගල්ලෙන ඉදිරි දොරටුව ළඟට පැමිණ කොටියාට කථා කළේය. ''දැන් පිණ්පාතයේ යාමට වෙලාව හරි. වෙන සතුන් මෙන් මගේ කුසගින්න ඇත. යමක් කා බඩ පුරවාගත යුතුයි. ඔබට කරදරයක් නොවේ නම් මම ආහාර පිණිස පිටවී යමි. කරුණාකර මට යාමට ඉඩ දෙන්න. ඔබට මෙහි සිටින්ට අවශ්‍ය නම් කමක් නැහැ සිටින්න. නැතහොත් කෑම සොයා යාමට අවශ්‍ය නම් එසේ යන්න.

කොටියා එතන වැතිරී සිට කන් දෙක කෙළින් කර වචන ශබ්දය අසා සිටියේය. ආචාර්ය චොබ් ඉන්පසු ඔහු ඉදිරියෙන් ගමන් කරයි. කොටියා කාරුණික බැල්මකින් ඒ දෙස බලා සිටියි. ''ඕනෑ තැනක යන්න. මා ගැන භයවෙන්න එපා. මා මෙහි ආවේ ඔබ ප්‍රවේශම් කරන්නැ''යි කියන්නාක් මෙනි.

ආචාර්ය චොබ් ළඟ පහත ගම්මානයට ගොස් පිඬු සිඟා ගත්හ. කොටියා සිටින වග කිසිවෙකුට නොකීවේය. ගම්මු ඔහු මරතී'යි යන බියෙනි. ආපසු ගල්ලෙනට පැමිණ බැලූ විට කොටියා නැත. මින්මතු කිසිදිනෙක කොටියා දක්නට නොලැබුණි. ආචාර්ය චොබ් හට සැකයක් ඇත. එම කොටියා සාමාන්‍ය වන සත්වයෙක් නොවේ. වෙස් වලාගත් දෙවි කෙනෙක් විය හැකිය. ඒ නිසා එතරම් හීලෑ සුරතලෙක් මෙන් හැසිරුණි. උන්වහන්සේ කොටියා නැවත දැකීමට කැමති වූ නමුත් කිසිදිනක ආවේ නැත. කොටින්ගේ ගොරවන නාදය සැමදාම ඇසුණ නමුත් එහි තම යාළුවා ඇද්දැයි දැනගත නොහැකිය. එම වනාන්තරය කොටින්ගෙන් ගහනය. සාමාන්‍ය කෙනෙකුට එහි වාසය කළ නොහැකිය. එම කොටි තුළ තිබූ ගතිය ඉතා ප්‍රියජනක බැවින් භය වෙනුවට ආදරය ඇති විය. මේ අත්දැකීම තුළින් විශේෂ ධර්මතා උන්වහන්සේට අවබෝධ වූ බව ආචාර්ය චොබ් පැවසුවේය.

ආචාර්ය චොබ් වර්ෂ 5ක් බුරුමයේ ගත කර බුරුම භාෂාව තම මව්බස තරම් පහසුවෙන් හැසිරවීමට ඉගෙන ගත්තේය. එහෙත් තායිලන්තයට ආපසු පැමිණීමට සිදුවුනේ දෙවෙනි ලෝක මහා යුද්ධයේදී ඉංග්‍රීසීන් හා ජපනුන් අතර ඇති වූ යුද කෝලාහල නිසාය. ඉංග්‍රීසි සොල්දාදුවෝ බුරුමේ වාසය කරන තායි ජාතිකයින් අත්අඩංගුවට ගත්හ. තායි ජාතිකයෝ ජපානයට ඔත්තු සපයන්නන් යැයි සැක කළහ. එබැවින් ස්ත්‍රී පුරුෂ, භික්ෂූන් බොහෝ දෙනා මරණයට පත්කළහ.

ආචාර්ය චොබ්ගේ ගමේ දායක පිරිස උන්වහන්සේට මහත්සේ ආදර ගෞරව දැක්වූහ. ඉංග්‍රීසි සෙබලුන්ගෙන් ආරක්ෂා කිරීමට උන්වහන්සේ ඝන වනාන්තරයට ගොස් සැඟවූහ. එහෙත් උන්වහන්සේ දිනක් ගැමියන්ට ධර්ම

දේශනාකරන විට සෙබලුන් වටකරගත්හ. ගැමියෝ දිවිරුම් දෙමින් උන්වහන්-සේගේ ගුණ වර්ණනා කළහ. උන්වහන්සේ බොහෝ කාලයක් බුරුමයේ වාසය කළ බවත් රාජ පරිපාලන වැඩෙහි නොයෙදෙන බවත් කියා අභියාචනා කළහ. අන්තිමේදී ගැමියෝ උන්වහන්සේ විශාල කැලෑ ප්‍රදේශයකට නැවතත් ගෙන ගියහ. ඉංග්‍රීසි භටයෝ උන්වහන්සේ සොයමින් කැලෑව දෙවනත් කරති. දිනෙන් දිනම තත්ත්වය උග්‍ර විය. ගම්මු උන්වහන්සේ තායිලන්තයට පිටත් කිරීමට එකඟ වූහ. එහෙත් කැලෑබද පාර ඉතාමත් භයානකය. කඳු පල්ලම් හා වනසතුන්ගේ බිය ඇත. එහෙත් ඉංග්‍රීසි සෙබළුන්ගෙන් බේරී යාමට වෙන මඟක් නැත. ගැමියෝ උන්වහන්සේට මඟ සලකුණු කියා දී පාර වැසී තිබුණත් අන් කිසි මගක නොයන ලෙස අවවාද දුනි. මෙය එකම අඩිපාර විය. අතීත පරම්පරා ගණනක් ආදි මුතුන් මිත්තන් ගිය පාරකි.

උන්වහන්සේ දින 4ක් රෑ දවල් නොනවත්වා ගමන් කළහ. නිදාගත්තේ හෝ ආහාර වැළඳුවේ නැත. මහා වනාන්තරයේ හුදකලාව ගමන් කරති.හැම තැනම කොටින්ගේ හා අලිඇතුන් ගේ මග සලකුණු ඇත. උන්වහන්සේ අතිශයින් ක්ලාන්ත විය. බුරුමයෙන් පලායාමට නොහැකි වේ යැයි සිතූහ. යම්කිසි වැරදි පාරකට වැටුනොත් මං මුලාවනු නියතය.

4 වෙනි දින උදයේ තායි මායිමට යාමට තව දුර ඇත. සිතන්ට බැරිතරම් මහත් පුදුමාකාර දෙයක් සිදුවුණි. ඔබ මේ කථාව සම්පූර්ණයෙන් කියවන තුරු කරුණාකර විවේචනය නොකරන ලෙස ඉල්ලමි. උන්වහන්සේගේ ගත සිත අතිශයින් දුබල විය. විටින් විට කෙටි කාලයක් විඩා හරිමින් දින 3ක් නිරාහාරව ඇවිද ඇත. ඉතා ආයාසයෙන් තම දුබල ශරීරය ඉදිරියට මෙහෙයවන විට මෙබඳු සිතක් පහළ විය. ''මෙතරම් දුර ප්‍රමාණයක් මගේ ජීවිත පරදුවට තබා යමි. දැන් දැන් හති වැටී ඇත. මෙපමණ කලක් එකම මිනිස් ආවාසයක් හෝ මිනිසෙක් නොදැක්කෙමි. දැන් මම නිරාහාරව මැරී යන තැනට පත්වී ඇත. මෙතරම් දුක් මුළු ජීවිතයේදී කිසිවිටක වින්දේ නැත. මම යුද්ධයෙන් බේරී දැන් නිරාහාරව මිය යම්ද? බුදුරජාණන් වහන්සේ වදාරා ඇති පරිදි ඈත දෙව් බඹතල වල දිවැස් ඇති දෙව් බඹුන් ඇත්නම් දිව කන ඇත්නම් මේ මරණයට ළඟාවන භික්ෂුව නොපෙනේද? මගේ දුක් ගැනවිලි නොඇසේද? දෙවිවරු බුද්ධ කාලයේ සිට භික්ෂූන් වහන්සේලා දෙන පිං අනුමෝදන් වී ඇත්නම් මගේ මේ දුකට පිහිට නොවන්නේ කෙතරම් අනුකම්පා විරහිතවද? උන්වහන්සේලාගේ දිවැස් දිව කණ දිව්‍ය ඥාණය ඇති බව ඔප්පු කිරීමට මට උපකාර කරණු මැන''

මෙම සිතිවිලි ඇතිවූ විගස මහත් පුදුම සහිත දෙයක් සිදුවුණි. එය අදහාගත නොහැකිය. උන්වහන්සේ තවමත් මහත් ආයාසයෙන් අඩියෙන් අඩිය

තියති. එවිට ඉතා විනීතව ඇඳ පැළඳ ගත් පිරිමියෙක් දුටුවේය. එම කඳුකරයේ මලේච්ඡයන් මෙන් නොව, පාර අයිනේ වාඩිවී සිටියි. හිස මත බන්දේසියේ ආහාර,පළතුරු පුරවා ඇත. මෙය විශ්වාස කරන්නේ කෙසේද? දැක්ක විගම ආචාර්ය චොබ් ගේ මවිල් කෙළින් විය. ඇඟ හිරිවැටුණි. බඩගින්න හා විඩාව අමතක විය. අඩි 25 පමණ ඈතින් කරුණාවන්ත පුරුෂයෙක් වාඩිවී දානය පිළිග ැන්වීමට සූදානමින් සිටී. ළඟා වූ විට ඔහු කථා කළේය.

''අවසර ස්වාමීනි, මෙහි මඳක් නැවතී සිට ආහාර ගෙන විඩාව සංසිඳවා ගන්න. ශරීර ශක්තිය ලැබුන විට ගමන් කරන්න පුළුවන් වේවි. අදම මේ මහා කැලෑව තරණය කළ හැකියි''

ආචාර්ය චොබ් නැවතුනි. අත තිබූ බඩු බිම තැබූහ. පාත්‍රය එළියට ගෙන එම ආහාර පිළිගත්හ. මහත් පුදුමයකි. එම ආහාරවලින් නිකුත් වන සුවඳින් මුළු පළාතම සුවඳවත් විය. ආහාර ප්‍රමාණය වැඩිත් නැත. මදිත් නැත. එය දිව ගෑ පමණින් රස නහර පිනා ගියේය. එහි රස කෙබඳු දැයි කිව නොහැකිය. මෙය ආසාමාන්‍ය අතිශයෝක්තියක් යැයි සිතුනත් උන්වහන්සේ ඉන්ද්‍රියන්ට දැනුන පිනවීම කිසිසේත් කියන්නට නොහැකි බැවින් අතිශයෝක්තියක් නොවේ.

ආහාර ටික තම පාත්‍රයේ බහා එම පින්වත් පුරුෂයා සිටින විට ආචාර්ය චොබ් ඔහුගේ ගෙවල් කොහේදැයි විමසීය. ''මම දින 3ක් මේ කැලෑ පාරේ ගමන් ගතිමි. කිසිම මිනිස් ආවාසයක් හෝ මනුෂ්‍යයෙක් මුණ ගැසුනේ නැත. එම පුද්ගලයා යම් කිසි සංඥාවක් ඉහළට අත දිගුකර එහි වෙසෙන්නෙමියි කීය. ඔබ මේ ආහාර පිළියෙල කළේ කෙසේද? මෙම ආහාර පිළිගැනීමට භික්ෂුවක් එන බව දැන සිටියේ කෙසේද? ඔහු මඳක් සිනාසී කිසි උත්තරයක් නොදුනි. උන්වහන්සේ පිං අනුමෝදනා කොට අවසානයේදී එම පුද්ගලයා තමන්ගේ වාසස්ථාන ඉතා දුර බැවින් යා යුතු බව කීය. ඔහුගේ ඉරියව් ඉතා ප්‍රසන්නය. පුදුම ශාන්ත භාවයක් ඇත. කථාකලේ ඉතා ස්වල්ප වශයෙනි. මුහුණේ කාන්තියක් විහිදේ. මැද වයසේ කෙනෙක් මෙනි. උසත් නැති කොටත් නැති ශරීරයකි. පුදුම හැදියාවක් ඇත. ඔහු යන්ට අවසර ගෙන නික්මුණි. ආචාර්ය චොබ් තවමත් විස්මිතව මේ අරුම පුදුම පුද්ගලයා දෙස බලා සිටියේය. ඔහු අඩි 25ක් පමණ ඈතට ගොස් ගසකට මුවා විය. ආචාර්ය චොබ් ගස පසුකර ඔහු එනතෙක් බලා සිටියහ. නමුත් ඔහු පෙනෙන්ට ඇත. ආ ගිය අතක් නැත. එවිට ඒ ගස ළඟට ගොස් සතර දිග බැලුවේය. කිසිවෙක් නැත. මෙය ඊටත් වඩා විස්මයකි. තවමත් පුදුමයෙන් මේ ප්‍රහේලිකාව ගැන සිතමින් ආපසු අවුත් ආහාර වළඳන්නට විය. එම රස මිනිස් ලොව නැත. ආහාරවල පුදුම සුවඳක් සහ රසයක් ඇත. තම ශරීරයට අවශ්‍ය සියලු ගුණයන් ඇත. මෙවැනි ආහාරයක් කවදාවත් වළඳා නැත. එම ආහාරවල රසය මුළු ශරීරය පුරා විහිදී ගියේය. සෑම රෝම කූපයකටම දැනේ. මෙතරම්

කල් නිරාහාරව තිබූ ක්ලාන්තය පහව්ය. අන්තිමේදී මෙම ආහාරය මෙතරම් රසවත්වූයේ තමාගේ කුසගින්න නිසාදැයි සැකයක් ඇති විය. එසේ නැත්නම් මේ ඇත්තෙන්ම දිව බොජුන් විය යුතුය. ආහාරය මුළුමනින්ම වැළඳූහ. එය නියම ලෙස ප්‍රමාණවත් විය. තව බිඳක් හෝ වැඩිපුර ආහාර ඇත්නම් වැළඳිය නොහැකිය.

ආහාර වැළඳීමෙන් පසු ආසාමාන්‍ය ශරීර ශක්තියකින් ගමන ආරම්භ කළහ. ඒ මඳ වෙලාවකට ප්‍රථම සිටි මරණාසන්න ක්ලාන්ත දුර්වල පුද්ගලයා නොවේ. ගමන යනවා මිස සිත ඇත්තේ එකාග්‍රතාවයෙන් අරුම පුදුම පුරුෂයා ගැනය. මෙසේ විඩාව නොතේරේ. තමන් හරි පාරේ දැයි විමසිලි නැත. සවස් වන විට එම පුරුෂයා කී පරිදි උන්වහන්සේ මේ මහා කැලෑව තරණය කළේය. උන්වහන්සේ තායිලන්ත සීමාවට පැමිණියේ මුළු දවස පුරා තිබූ අසීමිත සතුටිනි. කයේ සහ සිතේ තිබුන දැඩි දුක පහවී ඇත. තම ගම රට පෙදෙස වූ තායිලන්තයට පා තැබූ විගස තමන්වහන්සේ තව කාලයක් ජීවත්වන බව දැනුණි.

එම පුද්ගලයා දෙවි කෙනෙක් මිස මනුෂ්‍යයෙක් නොවන බව ආචාර්ය චොබ් පැවසීය. සිතා බලන්න. එම පුද්ගලයා හමුවීමට පසු තායි මායිමට එනතුරු කිසි මනුෂ්‍යයෙක් මුණ ගැසුනේ නැත. මුළු සිද්ධියම මහත් ප්‍රහේළිකාවකි. සාමා-න්‍යයෙන් කුඩා ගම්මානයක් හෝ දක්නට ලැබේ. එහෙත් මුළු ගමන තුළ කිසිම ගම්මානයක් නැත. බුරුමේ සිට තායිලන්ත සීමාවට තිබූ මෙම පැරණි මාර්ගය තනිකර ඝන වනාන්තරයකි. ඉංග්‍රීසි සෙබළුන් පමණක් නොව කිසි මිනිසෙක් හෝ ආහාරයක් නැත. එය කෙතරම් දුර්ග මාර්ගයක් දැයි සිතිය නොහැකිය. මාරාන්තික ගමනක් වුවද මෙසේ ජයග්‍රහණ ලීලාවෙන් ගමරට බලා පැමිණියේය.

තමන් එවැනි භයානක වනය තරණය කළේ දෙවියන්ගේ උපකාරයෙන් යැයි ආචාර්ය චොබ් පැවසීය. වල් අලි, කොටි, වලස්, නයි, පොළොං ආදී භයානක සතුන්ගෙන් ගහණ වූ නමුත් එකම සතෙක් වත් උන්වහන්සේ දැක්කේ නැත. ඇසට පෙනුනේ අහිංසක සතුන් පමණි. මේ ගමන කිසිවෙකුට යා නොහැකිය. නිසැකවම කොටියාට හෝ වල් අලියාට අසුවේ. මෙය ධර්මයේ හාස්කම සහ දෙවියන්ගේ හාස්කමකි. බුරුමේ ගම්වැසියෝ උන්වහන්සේ ජීවත්වෙතියි නොසිතූහ. එහෙත් යුද හටයන්ගෙන් බේරීමට වෙන ක්‍රමයක් නැත. යුද හටයන්ගෙන් බේරීමට වඩා මෙය පහසුවේයැයි ඔවුන් මන්ත්‍රණය කළහ.

මේ කථා පුවත මම සවන් දුන් ආකාරයෙන්ම වාර්තා කළෙමි. කරුණා-ාකර ඔබ මේ පිළිබඳ විමසන්න. මෙවැනි සිතන්ට බැරි සුරංගනා කථාව සත්‍ය ප්‍රවෘත්තියකි. ආචාර්ය චොබ්ගේ ධුතාංග පූරණය ඉතාම දැඩි ප්‍රතිපත්ති මත ගෙන ගිය බැවින් මෙවැනි අරුම පුදුම කතන්දර බොහෝ වෙති. උන්වහන්සේ

මහ කැලෑවේ වාසය කරන බැවින් කිසිවෙකුට උන්වහන්සේ හමුවීමට නොහැකිය. සමාජයේ ආශ්‍රයෙන් ඈත් වී ඇත.

## අවසානය

ආචාර්ය මන්ගෙන් පැවත එන ශිෂ්‍ය පරම්පරාව වනාන්තරයේ වෙසෙමින් තම භාවනා ප්‍රතිපත්ති රැකීමට පුහුණු වී ඇත. ආචාර්ය මන් එසේ කිරීමට උනන්දු කරති. නිතරම වනාන්තර ජීවිතය වර්ණනා කෙරෙති. ඊට හේතුව එම ස්වභාවික පරිසරයෙන් ධර්මය අවබෝධ කිරීම පහසු බැවිනි. ජනාකීර්ණ ගම්, නියම් ගම් නගර බදව එම ස්වභාවික අත්දැකීම් ලබාගත නොහැකිය. සිතේ කයේ විවේකය එහි නැත. උන්වහන්සේගේ ශිෂ්‍යයින් වර්තමානයේ දේශනාකරන ධර්මය මෙසේ මාරාන්තික දුෂ්කර පරිසරයේදී අවබෝධ වූ තමාගේ අත්දැකීම් සම්භාරයක් බැවින්, ප්‍රත්‍යක්ෂ ධර්මතාවන්ය.

ආචාර්ය මන් අභාවයට පත්වී දැන් වසර ගණනාවක් පසු වී ඇතත් උන්වහන්සේගේ ශිෂ්‍යයන් භාවනාවේ යෙදී සිටින විට ප්‍රකෘති ආකාරයෙන් උන්වහන්සේ දකිති. යම් භාවනා පිළිබඳ ගැටළුවක් ඇතත් ආචාර්ය මන් භාවනා සමාධි සිතට අරමුණු වේ. ඉන්පසු එම ගැටළුව නිරාකරණය කිරීමට පිළිවෙල දැනගනී. උන්වහන්සේ ජීවමානව මෙන් එම ප්‍රශ්නයට පිළිතුරු සපයති. රහතන්වහන්සේලා තම සමාධි සිතට අරමුණු වී ධර්ම කරුණු පහදා දෙන බව මා ඉහත සඳහන් කර ඇත. තමාගේ භාවනාව යම් තරමක් දියුණු වී ඉන් ඉදිරියට යාමට නොහැකි වූ විට ආචාර්ය මන් පෙනී සිට ඊට සුදුසු ප්‍රතිකර්ම දේශනා කරති. ඉන්පසු එම දර්ශනය පහවී යයි. එම භික්ෂුව ඒ කී ආකාරයට හැකි පමණ විතර්ක විචාර කරමින් තම ප්‍රශ්නය විසඳා ගනිති. ඉන්පසු භාවනාව සාර්ථක වේ.

එම භික්ෂුන්ට දිවැස්, දිව කණ ආදී අධි මානුෂික බල ඇත. භාවනාවේ දී දකින ''නිමිති'' තුළින් ධර්මය ඇසීම යැ'යි කියනු ලැබේ. එනම් ගුරුවරයා යම් යම් නිමිති දක්වති. ශිෂ්‍යයා එම නිමිති තේරුම් ගනියි. මෙය බොහෝ අයට අද්භූත දෙයක් වුවද එය භාවනා යෝගින්ට සාමාන්‍ය දෙයකි. පිළිවෙත් පුරණ භාවනාවේ දියුණු පුද්ගලයින්ට මෙසේ නොයෙකුත් නිමිති පහළ වේ. එහෙත් හැමෝටම මෙය සාධාරණ නොවේ. මෙසේ ඥානය පහළවන්නේ ඉහත ආත්ම වලදී පුරුදු පුහුණු කළ ඍධි ප්‍රාතිහාර්ය තුළිනි. බුදුවරු රහතන්වහන්සේලා ආචාර්ය මන්ට පෙනී සිට ධර්ම දේශනා කර ඇත. ඒ හා සමානව ආචාර්ය මන්ගෙ ශිෂ්‍යයන්ට උන්වහන්සේ පෙනේ. උන්වහන්සේ දේශනා කරණ ධර්මය ඇසේ. බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ තම මව්තුමියට තුසිත භවනයට වැඩ

ධර්මය දේශනා කළ බව අප අසා ඇත. එම නිමිති විශේෂ දක්ෂතා තුළින් ඇතිවිය හැකි බව හිතන්ට හැකිය. බුදුරජාණන් වහන්සේට එවැනි ආශ්වර්යය අද්භූත දේ සිදුකළ හැකි වුවද අවශේෂ රහතන් වහන්සේලාට එසේ කළ හැකි යයි යමෙක් පිළිනොගනිති. එහෙත් එම සුවිශේෂ දක්ෂතාවය යම් අයෙකුට අංශුමාත්‍රයක් හෝ ඇතිවීමට හැකිබව අප පිළිගත යුතු වේ.

මේ පිළිබඳ වැඩිපුර අදහස් දැක්වීමට නොකැමති බැවින් භාවනා යෝගී ඔබට එය ප්‍රත්‍යක්ෂයෙන් දැනගැනීමට ඉඩ හරිමි. එය අනුන්ගෙන් අසා දැනගන්නක් නොවන බැවින් වඩා ස්ථාවරය. මට මේ පිළිබඳව කිසිම සැක-යක් නැත. කවුරු කුමක් ඇදහුවත් නැතත් ඉන් වෙනසක් නොවේ. කොතරම් විශ්වාසනීය වුවත් සැක ඇතිවීමට ඉඩ ඇත. ප්‍රශ්නය වන්නේ සාමාන්‍ය ජනයා එතරම් චිත්ත පාරිශුද්ධියක් නැති බැවින් සත්‍යය වුවත් පිළිගැනීමට නොහැකි වේ. තමාම ප්‍රත්‍යක්ෂ කළ විට එහි සැක නැත. අපි සැවොම කර්මවිපාක වලට මුහුණ දෙමු. දුක සැප යනු තමන්ගේ කර්ම විපාක වේ. මෙය සත්‍යයෙන්ම සත්‍ය වේ. ඉතාම සරල වේ.

ආචාර්ය මන්ගේ කථා පුවත චිත්තාකර්ශනීය වේ. ගිහි කාලයේ සිට උන්වහන්සේ සාන්තුවරයෙකි. නිතර සකසුරුවමින් ස්ථාවරයකින් ජීවත් විය. තම දෙමාපිය නෑ හිතවතුන්ට කිසිම දුකක් කණගාටුවක් අවනම්බුවක් නොවීය. පැවිදි වූ පසු මහත් අධිෂ්ඨානයකින් තම භාවනා දියුණු කර අන් භික්ෂූන්ට එම මාර්ගය විවෘත කළහ. උන්වහන්සේගේ මුළු ජීවිතය දීප්තිමත්ය, ආලෝකමත්ය. ගුණ සමුදාය, සීල සමුදාය, අද ජීවත්වන්නන්ට ආදර්ශයකි. භාවනා ප්‍රතිපත්ති ඉතා දැඩි විය. විස්මයට පත්කරණ මහත් වූ මානසික ප්‍රවණතාවයකි. කෙළෙස් ක්‍රමානුකූලව යටපත් කළේ දැඩි උත්සාහයෙනි. උන්වහන්සේ රහතන්වහන්සේ නමක් යැයි ළඟින් ආශ්‍රය කළ සියලු දෙනාගේම මතය විය.

සති, පඤ්ඤාවෙන් තම සිත දියුණු කළේ මුල සිට අන්තිම දක්වා ධර්මානුකූලවය, තම ශිෂ්‍යයන්ගේ අදහස් උදහස් දනී. ඉතාම නුගත් කඳුකරයේ කැලෑබද ග්‍රෝතික මිනිසුන් පටන් උසස් සමාජයේ උගතුන්ට උන්වහන්සේ මහත් සේවයක් කර ඇත. අවසාන හුස්ම දක්වා කරුණාව පැතිර විය. යමෙක් ප්‍රශ්නයක් ඇසූ විට පැය ගණනක් වුවද සාකච්ඡා කරමින් එම ප්‍රශ්නය හොඳාකාර වටහා දෙති. සියලුම ශ්‍රාවකයන් තුළ උන්වහන්සේගේ වචන සිත කා වැදී ප්‍රබෝධ වී ඇත. මෙවැනි ආචාර්යවරයෙකුගේ හමුවීම නිසා තම ජීවිතයේ උපරිම ප්‍රයෝජනය ලබාගත් බව පිළිගනිති. එම ධර්මය තමා තුළ වර්ධනය වීම නිසා ඒ සියලුම ශ්‍රාවකයෝ අද ප්‍රසිද්ධ ආචාර්යවරුන් වෙති. මෙසේ බුදු රජාණන්වහන්සේගෙ උතුම් ධර්මය නොනැසී පවතී. අද දක්වා බොහෝ ශ්‍රාවක පරම්පරාවක් ධර්මය හදාරමින් ප්‍රතිපත්ති රකිති. එය ලෝකයාට ප්‍රදර්ශනය නොකළ නමුත් නිහඬ ධර්

සේවාවකි.

ගුරුවරයෙක් වශයෙන් ගිහි ජනතාව තුළ ද ධර්මය පුබුදුවා ලීමට උන්වහන්සේට හැකිවූ බැවින් ඒ අයද කර්ම විපාක, හේතුඵල ආදි ධර්මතා අනුව ධර්මය අවබෝධ කර ධර්ම මාර්ගයේ ගමන් කළහ. ආධ්‍යාත්මික ගුණවගාව යනු ලෝක සාමයේ මූලික සිද්ධාන්තයකි. ලෝකය විනාශ වී යන්නේ මනුෂ්‍යයාගේ ගුණධර්ම විනාශ වූ විටය. අධ්‍යාත්මික ගුණ හීන වූ විට මිනිසා කරන කියන සෑම දෙයක්ම ලෝක විනාශය පිණිස පවතී. තවද ධර්මය යටපත් කිරීමට සාධක වේ. අධර්මය රජ කෙරේ. මිනිසාගේ ආධ්‍යාත්මික ගුණවගාව දියුණු වූ විට මිනිසාගෙ " වචනය, ක්‍රියාව ලෝක සමෘද්ධිය පිණිස පවතී. ඒ අතර ධර්මය වහා වර්ධනය වේ. තම හදවතේ ධර්මය හොඳාකාර තැන්පත් වූ කෙනෙක්ගේ ක්‍රියාවලිය නිසා හානියක් සිදුවෙන්නේ කෙසේද? පසුතැවිල්ලක් නැතිව වරදෙහි බැඳේද? එවැනි හැසිරීම ඔවුන්ට අස්වාභාවිකය. ධර්ම කරුනු ගිරව් මෙන් කටපාඩම් කර, ධර්මයේ හැසිරීමෙන් තොරවූ අයට එසේ කළ හැකි වේ. ඒ අය ධර්මධර වුවද ධර්මයේ නොහැසිරෙති.

ආචාර්ය මන් හමු වූ සියළු දෙනාම උන්වහන්සේගේ ගුණ එක හඬින් ප්‍රකාශ කරති. සමහරු තම ජීවිතය පුද කිරීමට හෝ කැමති වූහ. ධර්ම කරුණු තම සිත තුළ ශක්තිමත් වූ විට එයම ඒ පුද්ගලයාගේ බලවත් ශක්තියක් බවට පරිවර්තනය වේ. එවැනි ශක්තියක් ලෝකයේ වෙන කිසි ශක්තියකට සමාන කළ නොහැකිය. මෙය මෙසේ නොවේ නම් තම චේතනාවේ පිහිටා හොඳ හෝ නරක කළ නොහැකිය. කුසල් හෝ අකුසල් තම සිත තදින් ග්‍රහණය කළ විට නොබියව එම කාර්යයේ යෙදේ. එවැනි තද සිතුවිලි ඇතිවූ විට එහි ප්‍රතිඵල වැලැක්විය නොහැකිය.

මෙය හොඳාකාර දැකිය හැක්කේ ආචාර්ය මන්ගේ ගෝල පිරිස තුළය. ධර්මය හොඳාකාර සිතේ තැන්පත් වූ විට උන්වහන්සේට අසීමිත ආදර භක්තියක් පිරිනමති. තම සිතේ ඇති ශ්‍රද්ධාව කෙතරම් බලවත්ද යනු උන්වහන්සේට ජීවිත පූජා කිරීමට වුවද පෙළඹේ. මේ අසාමාන්‍ය ආකර්ෂණය උන්වහන්සේගේ ජීවිත කාලය තුළදී සහ පිරිනිවන් පෑමෙන් පසුද විද්‍යමාන විය.

මා ගැන කියතොත් මා කවදත් කිසි වැඩකට නැති පුද්ගලයෙක් ලෙස සිටි නිසා මගේ ආකල්ප වෙනත් ආකල්ප වලට වඩා වෙනස් විය හැකිය. දැනට අවු. 20 ගතවී ඇති වුවද, මට දැනෙන්නේ උන්වහන්සේ ඊයේ අපවත්වූ ලෙසය. උන්වහන්සේගේ ශරීරය අභාවයට ගිය නමුත් සිත අභාවයට ගියේම නැත. උන්වහන්සේ මා ළඟ සිටිමින් මට නිතරම උපකාර කරන්නාක් මෙන් සිතේ.

උන්වහන්සේගේ ජීවිත කථාවේ අවසාන පරිච්ඡේදය වශයෙන් උන්වහන්-

සේ උගන්වන ශෛලිය පිළිබිඹු වන යම් වාක්‍ය හා වාක්‍ය ඛණ්ඩ ගෙන හැර දක්වමි. මෙය අවසාන කාලයේ සිට අභාවය දක්වා සිදුවූ ප්‍රවෘත්ති වේ. මේ අවසාන කාලයේ දෙසූ දහම මගේ ජීවිතයට විශාල ලෙස බලපා ඇත. තම රෝගය ගැන කථාකරණ විට එය තම ශරීරය අවසාන වශයෙන් විනාශ වන අන්දම දැක්වීමකි.

''මම මේ ශරීරයේ උප්පත්තිය හා මරණය ගැන බොහෝ සෙයින් විචාරා ඇත. පසුගිය අවු. 60 තුළ මේ ශරීරයේ ස්කන්ධ පිළිබඳ සංකල්පනා කළෙමි. මෙහි එකම කොටසක් හෝ කුඩා අංශුවක්වත් ඇලීම් තුලින් ග්‍රහණය කළ නොහැකිය. එබැවින් මේ ශරීරය කැඩී බිඳී විනාශ වීම ගැන කිසි කනස්සල්ලක් නැත. ධර්මය අවබෝධ වූ මොහොතේ සිට මේ ශරීරය ගැන කිසිම පසුතැවිල්ලක් නොතිබුණි. මේ භෞතික වස්තු ශරීරය හෝ බාහිර ලෝකය හෝ වේවා සියල්ල එකමය. එකම මූලද්‍රව්‍ය වලින් නිර්මාණය වී තිබේ. දවස් පතා ඒවා කැඩී බිඳී යති. මුල් ස්වභාවයට පරිවර්තනය වෙති. නැවත නැවත ආහාර-වතුර-වාතය-උෂ්ණය ආදියෙන් ඒ සියල්ල අඩුවූ විට පිරවිය යුතුය. මේ ශරීරය අපේ මගේ කීවත් එහි සියලුම අංශු මේ පෘථිවි පරිසරයේ හැම තැනම පවතින දේ මය.

මට ඇති එකම දුක මගේ ශ්‍රාවක පිරිස ගැනය. බොහෝ දුර කතර සිට පැමිණි පිරිස ඇත. මම මරණයට පත්වීමට පෙර ඔබසැමගේ සිත් ධර්මයෙන් පිරී ඇතිදැයි මට සතුටුවිය නොහැකිය. එබැවින් නිතරම වීර්‍යයෙන් තම භාවනා කටයුතු කිරීමට මම උනන්දු කරමි. කෙළෙස් යනු අනන්ත උප්පත්ති මරණවලට හේතුවෙන ධර්මයන්ය. කෙළෙස් සුළු පටු ලෙස නොසිතන්න. නැත්නම් අහිංසක ලෙස නොසිතන්න. එසේ නොසිතා කෙළෙස් සමග සටන් කර යටපත් කිරීමට දැන් කාලය එළඹ ඇත. මරණයට පත්වූ විට කෙළෙස් සමඟ සටන් කිරීමට නොහැකිය. මම ඔබට අනතුරු ඇඟවූයේ නැතැයි නොකියනු මැනවි.

මේ ලෝකයේ ජීවත්වන සියලුම මිනිස් තිරිසන් ආදී සත්ත්වයෝ දුක් විඳිති. දුකට හේතුව වරදවා හිතන්න එපා. දුකට හේතුව ඔබ ඔය සිතන අහිංසක, සුළුපටු කෙළෙස් බව සිතන්න. මම ජීවිතය, උප්පත්තිය, මරණය පිළිබඳ උපරිම ප්‍රඥාවෙන් දැකගතිමි. උප්පත්ති මරණයට හා සියලුම දුක්වේදනා වලට එකම හේතුවක් ඇත. එනම් ඔබ සුළු යැයි සිතන කෙළෙස්ය. මෙය ලෝකයේ සියලු දෙනාම ගණන් නොගන්නා දෙයකි. ඇත්තෙන්ම මේ කෙළෙස් නිසා සියලු දුක් හටගනී. ඔබ සියලු දෙනාගේ සිත් කෙළෙස් වලින් පීඩිත වී ඇත. ඔබ ඒ ගැන සිතන්නේ කෙසේද? මේ කෙළෙස් එතරම් ගණන් ගත යුතු නැතැයි ඔබත් සිතනවාද? එසේ නම් ඔබ මගේ ශ්‍රාවකයන් වශයෙන් කෙතරම් සිටියත් ඔබ හෙ-ාද්දේ රස නොදන්නා හැන්දක් මෙනි. ඔබට හොද්දේ රස බලන්ට ඕනෑ නම් මම කියන ධර්ම හොඳින් සිතේ දරාගන්න. ධර්ම රසය මෙතරම් අමාරුවෙන් කියා දෙන

විට හොඳ්දේ හැන්ද වෙන්න එපා. එය මට මහත් බාධාවකි. මගේ ඉගැන්වීමෙන් ඵලක් නැත. ධර්‍මයේ වටිනාකම ඔබ නොදනිති. ඔබ ඉපදී මැරියන්නේ මේ වටිනා ධර්‍මය අත්පත් කරගන නොවේ. එය සතුන්ටත් වඩා කිසි වැදගත් කමක් නැති තත්ත්වයකි. සතුන් මැරුන විට උන්ගේ මස් සහ හම යම් වටිනාකමක් ඇත. ප්‍රමාද වූ සති විරහයෙන් අකුසල් කරන්නාගේ ජීවත්වීම හෝ මරණය කිසි වටිනාකමක් නැත.

ශාරීරික රෝගය ඇතිවූ දින සිට මගේ ජීවිතය දිනෙන් දින ගෙවී යයි. යමෙක් දුක් ඉක්මවා ඇත්තේ නම් හැම අතින්ම තෘප්තිමත් වේ. ඔහු මරණයට පත්වන්නේ කිසියම් වගකීමක් නැතිවය. සදාකාලික නිර්දෝෂ වූ ඔහුට ලබාග ැනීමට කිසිවක් නැත. කිසිම දෙයක් අවශ්‍ය නොවේ. එහෙත් කෙළෙස් සහිතව මරණයට පත්වූ විට ඔහුට තෘප්තියක් නැත. යම් තැනක උප්පත්තියක් ලැබූ විටද එම අතෘප්තිමත් දුක් හටගනී. කෙළෙස්වල බලය වැඩිවීම දුක් වැඩි වේ. අසවල් අසවල් ලෝක ඉතා තෘප්තිමත් යැයි නොසිතනු මැනවි. එසේ සිතුවිලි ඇතිවිට එම තණ්හාව නිසා සැප ආත්මයක් නොලැබේ. එහි තේරුම ඔබ තවමත් කෙළෙස්වල භයානක කම නොදන්නා බවය. කෙලෙස් ඔබගේ හතුරන් මෙන් සිත විකෘති කරයි. මෙසේ සිතේ පවතින දුක, අසතුට නිසා ඔබට හොඳ ආත්මයක් ලැබේද? නැවත ඉපදීමට ඇති තණ්හාව දුරු කරන්නේ නැත්නනම් ඔබට පිහිටවන්නේ කෙසේද?

සති, සමාධි දියුණු නැති භික්ෂූන් මේ ලෝකයේ කිසිම සතුටක් බලාපොරොත්තු විය යුතු නැත. ඒ වෙනුවට මත මානසික අසහනය සිතේ සැඟවී ඇත. එවැනි අසහනයෙන් මිදීමට ඔබ මහත් වෑයමක් දැරිය යුතුය. ධර්‍මයට විරුද්ධ වූ කෙළෙස් පරාජය කළ යුතුය. එවිට ධර්‍මයේ උතුම් සැනසිල්ල ඉතා ඉක්මනින් ළඟා වේවි. සසර සැරිසරමින් දුක් වින්ද කාලය සමග සසඳා බලන කල මෙය ඉතා කෙටි කාලයකි.

බුදු දහම දේශනා කර ඇත්තේ සසර දුක් නැති කිරීමටය. එය අඩියෙන් අඩියට ගමන් කර ලබාගත යුතුය. ඉන්පසු කිසිකලෙක නැවත උප්පත්තියක් නැත. නැවත උප්පත්තියක් නොලැබීමට කැමති අය මුළු විශ්වයේ ඇති ජීවිතවල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය මෙනෙහි කළ යුතුය. මෙය ඉතා ගැඹුරින් අවධාරණය කළ විට සියලු සැක දුරු කෙරේ. එවිට තදබල බැඳීම් බිඳීයන්නේ නිමේශයකිනි. සියලු සැකදුරුකිරීමට අවශ්‍යවන්නේ ප්‍රඥාවයි. තුන්ලෝකයේ විද-ෲමාන වන සියළු කෙලෙස් දුරු කිරීමට සති, පඤ්ඤා සමත් වේ. බුදුරජාණන් වහන්සේ සහ සියලු රහතුන් වහන්සේලා සති පඤ්ඤාවෙන් සියලු කෙළෙස් දුරු කළහ. අන් සියලු කුශල ධර්‍මයන් සති පඤ්ඤාවට උපකාර කෙරෙති. එය යුද බිමේ සටන්කරන සෙබළුන්ට අවශ්‍ය ආහාර ජලය ආදි උපකාර වැනිය.

එහෙත් යුද්ධයට අවශ්‍යවන්නේ සෙබලා සහ අවි ආයුධය. මෙහි අපි දකින්නේ නොපසුබසින සෙබලා මෙන් කෙලෙස් සමඟ සති පඤ්ඤාවෙන් සටන් කරණ පුද්ගලයාය. එම කෙළෙස් නැවත නැගී සිට ඔහු සමච්චලයට පත්කරන්නේ නැත. ඔහුගේ අවි ආයුධ ශක්තිමත් වූ සතිපඤ්ඤා වේ. හැම මොහොතේම කෙළෙස් පරාජය කිරීමට අවශ්‍ය වූ සතිපඤ්ඤා අත ළඟ තිබිය යුතු යි අවි ආයුධ වේ.

ඔබගේ භාවනා දියුණුවක් නැති විට ඒ පිළිබඳ නොබියව තර්ක විතර්ක කළ යුතුය. ඔබගේ මරණය නිර්භයව මුහුණ දිය යුතු අවස්ථාවකි. පරාජය වී මරණයට පත්වූ විට අනන්ත කාලයක් සසර දුකට පත්වේ. එබැවින් විශාල ලෙස කෙළෙස් සමඟ සටනෙහි යෙදිය යුතුයි. සසරේ මුලාවූ සත්වයින් ඉන් මුදවා සසර දුක් නැති කළ යුතුය. එවිට අවිද්‍යාවෙන් සත්වයෝ සසර නූපදිති. ඔබ මහන්සි ගන්නේ නැවත සසර ඉපදීමටද? ඔබ තවමත් ජීවත්වී සිටියත් අනාගත භවයකට සැලසුම් කරන්නේය. ඒ ඇයි? ඔබ භාවනාව අත්හිටවූ හැම මොහොතේම කරන්නේ ඊළඟ ආත්මය සැලසුම් කිරීමයි. උප්පත්ති මරණයට සුදුසු වීමයි. ඔබේ සිත එවිට දුකට භාජනය වේ.

මම ඔබට ධර්මය තේරුම් කර දීමට සෑම ප්‍රයත්නයක්ම ගත්තෙමි. ඔබ චතුරාර්‍ය සත්‍යය සහ සතර සතිපට්ඨානය හොඳාකාර අවබෝධ කර සති, පඤ්ඤාව දියුණු කළ යුතුයි. යම් යම් අධිමානුෂික සෘද්ධි ඔබට නොකීවේ ඒවා නිවන් අවබෝධයට අවශ්‍ය නොවන බැවිනි. එහෙත් යමෙකුට එවැනි ශක්තීන් ඇතොත් ඒ ගැන ඇසීමට මම සතුටුවෙමි. මගේ මරණයෙන් පසු මේ පිළිබඳ දන්නා කෙනෙක් සෙවීම ඉතාම දුෂ්කර කරුණකි. ඔබ හොඳින් අවධාරණය කළ යුත්තේ ධර්මයේ උගත්කම සහ ධර්මයේ ප්‍රායෝගික හැසිරීම යනු කරුණු දෙකකි. යමෙක් ධර්මය උගත් නමුත් සමාධි-පඤ්ඤා මග්ග ඵල නැතිනම් අනුන්ට නියම මාර්ගය පෙන්වීමට අසමත් වෙති.

මෙසේ ආචාර්ය මන් උන්වහන්සේගේ පශ්චිම අවවාද දුන්හ. සංඛාර ධර්මයන් ගැන විස්තර කළේ සම්මා සම්බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පාන සමයේදී දෙසූ දහම් මෙනි. ආචාර්ය මන් ආරම්භ කළේ බුද්ධ වචනය ගෙන හැර පාමිනි. ''අප්පමාදෙන සම්පාදෙථ'' වය ධම්මා සංඛාරා'' ආදී වශයෙනි. ''උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූප සමො සුඛො''. ඉන්පසු උන්වහන්සේ මේ ගාථා ධර්මය විස්තර කළහ.

''සංඛාර'' යන පශ්චිම බුද්ධ වචනය ඉතාම උසස් ධර්මතාවයකි. සියලු හේතුප්‍රත්‍යයෙන් නිශඵන්නා සිද්ධාන්ත ''සංඛාර'' වචනයට ඇතුළත් වේ. එහෙත් චේතනාවේ හටගන්නා සංඛාර හෙවත් කර්ම ඉතාම වැදගත් වේ. මක්නිසාද යත්

මෙම සංඛාර දුක්ඛ සමුදය සත්‍යය වේ. එනම් මේ සංඛාර දුකට හේතුවේ. මේ සංඛාර පහළ වූ විට සිත වික්ෂිප්ත වේ. එවිට මෝහ හෙවත් මුලාවට පත්වේ. එවිට සිතේ ඒකාග්‍රතාවය, සති සමාධි බිඳ වැටේ. සිතේ ස්වාධීනභාවය විනාශ වේ. මෙම සංඛාර ගැන විමසා බලන විට පෙනීයන්නේ අපේ ඉතාම අශික්ෂිත සිතුවිලි සිට ඉතාම ශික්ෂිත සිතුවිලි මේ සංඛාර ගණයට අයත් වන බවයි. මේවා-යේ ගතිලක්ෂණ සම්පූර්ණයෙන්ම අවබෝධ වූ විට ඒවා යටපත් වේ. සංඛාර නැති විට සිත වික්ෂිප්ත නොවේ. සිතුවිලි අදහස් සිතේ හටගත් නමුත් ඒ සිතුවිලි ඉතාම පිරිසිඳු ස්කන්ධයක් ආශ්‍රිත බැවින් කිසියම් කෙළෙස් අන්තර්ගත නොවේ. එහි තණ්හා අවිජ්ජා නැත. තද නින්දක් බඳුය. මෙම සිතට වූපසම චිත්ත යැයි කියනු ලැබේ. එය ඉතාම සංසුං කෙළෙස් නැති ශාන්ත ප්‍රනීත චිත්ත ස්වභාවයකි. බුදුන් රහතන්ගේ මේ චිත්ත ස්වභාවය ප්‍රකෘති වශයෙන් ඇත. උන්වහන්සේලාට එබැවින් කිසිවක් පිළිබඳ ආසාවක් හෝ අපේක්ෂාවක් නැත. කෙළෙස් නැතිවූ විගස සිත තුළ මහත් සැනසීමක් පිරිසිඳු බවක් හටගනී. මීට සෝපාදිශේෂ නිර්වාණ ධාතුව යැයි හැඳින්වේ. රහතන්වහන්සේ පත්වෙන මේ නිවන වැනි අති උතුම්, විශ්මිත පුදුම දෙයක් මේ තුන් ලෝකයේ විද්‍යමාන නොවේ.''

මේ දේශනය ඉන්පසු අවසාන විය. ඉන්පසු කිසිම දේශනයක් නොකරණ ලදී. එබැවින් මම මේ දේශනය උන්වහන්සේගේ පශ්චිම දේශනය ලෙස ඇතුළත් කරමි.

ග්‍රන්ථ කතුවරයා වශයෙන් මම ආචාර්ය මන්ගේ ජීවිත කථාව හැකිතාක් නිවැරදි ලෙස ඉදිරිපත් කළෙමි. මගේ මුළු ජීවිත කාලයේ මෙවැනි අන් දෙයක් කර නැත. මෙහි ඇති ප්‍රමාද දෝශ වලට සමාවුව මැනව. මම මෙම ලිපි ගොනු සකස් කිරීමට බොහෝ කාලයක් ගත කළෙමි. එහෙත් තව අවුරුදු තුනක් මේ ආකාරයෙන් කරුණු එකතු කළත් නිමාවක් දකින්නේ නැත. එහෙත් මගේ පාඨ-කයන් සඳහා හැකි තරම් කරුණු ඉදිරිපත් කිරීමට හා එය සුඛ නම්‍ය විධියට දැක්වීමට මහත් ආයාසයක් දැරුවෙමි. ඔබ කිසිවෙක් උන්වහන්සේ දැක කථා බස්කර නැත. එබැවින් මෙම කථා පුවත් ඇසුරෙන් යම් කිසි දැනුමක් ලබාගත හැකිය. උන්වහන්සේගේ මෙම ජීවිත ප්‍රවෘත්තියෙන් උන්වහන්සේගේ ප්‍රතිපදාව පැහැදිලි වේ යැයි සිතමි. එය සම්පූර්ණ කථා පුවතක් නොවූවත් උන්වහන්සේගේ අසාමාන්‍ය චරිතය ඔබ වෙත ප්‍රදර්ශනය කිරීමට ගත් වෑයමකි.

මෙම කෘතියට මම තෝරාගත්තේ ඔබට සුදුසු වේයැයි සිතූ කථා පුවත් පමණි. අනවශ්‍ය දේ බැහැර කළෙමි. මම ගොනු කළ කරුණු වලින් 70% පමණ මෙහි අඩංගු වේ. බොහෝ කරුණු ගැඹුරු හෙයින් ඔබගේ අවබෝධයට ඉවහල්

නොවේයැයි සිතුවෙමි. 30% පමණ කරුණු පහසුවෙන් තේරුම් ගත නොහැක-වන්නේ භාවනා අත්දැකීම් බැවිනි. සාමාන්‍ය ජනයාට එය කුතුහලයක් විය හැකිය. එබැවින් එය අත්හළෙමි. එසේ වුවත් සමහර කරුණු මෙම ග්‍රන්ථයේ අඩංගු කළෙමි. ඒ පිළිබඳ යම් විපිළිසරයක් මා තුළ ඇත. ඒවා අත්හැරීමට පුද්ගලික තිබූ කැමැත්ත මා බලෙන්ම ඉවත දමා ඇතුළත් කළෙමි. සමහර කරුණු ඉදිරිපත් කිරීමට නොහැකි බව මම වටහා ගතිමි.

ආචාර්ය මන්ගේ ජීවිත කථාව ඉතා චමත්කාර, අද්භූත සිද්ධීන්ගෙන් මෙන්ම සරල ලක්ෂණයෙන් පරිපූර්ණය. අද ලෝකයේ මෙවැනි චරිතයක් සෙවීම උගහටය. බුද්ධ කාලීන රහතන් වහන්සේලා පිළිබිඹු වේ. මම උන්වහන්සේගෙන් ධර්මය අසා ඇත. උන්වහන්සේ ගේ අධිමානුෂික ගුණ ගැන පුදුම වෙමි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක පිරිස මෙන් අපද එම ධර්මය අසා පුදුම අස්වැසීමක් ලද්දෙමු. ධර්මය නමැති අමාවැස්සෙන් අපි නෑවෙමු.

උන්වහන්සේගේ ධර්ම ඥාණය ගැන කීමට මට නොහැකි බැවින් ලැජ්ජාවට පත්වෙමි. මා ධූතාංග භික්ෂුවක් වුවද උන්වහන්සේ ඉදිරියේ මා ව්‍යාජ රඟපෑමක් ලෙස දැනේ. හොරෙන් සසුන් ගත වී ධූතාංග භික්ෂුවක් ලෙස පෙනී සටින ප්‍රතිරූපකායක්ද? මගේ නොදැනුවත්කම නිසා උන්වහන්සේගේ කීර්ති නාමයට යම් කිසි කැලලක් වේදෝයි මම නිතර කල්පනා කරමි. එම කීර්තිනාමය අපි සදාකල් සුරක්ෂිතව තැබිය යුතුය. මුලදී මම සඳහන් කළ පරිදි මෙම ජීවිත කථාව එකල සිටි රහතන්වහන්සේලා බුද්ධ චරිතය ලියූ අන්දමට ලිවීමට අදහස් කළෙමි. නමුත් මම මහත් අපහසුවකට හා ලැජ්ජාවකට පත්වන්නේ මේ කථාව මෙවැනි කෘත්‍යයකට සරිලන කථා ශෛලියෙන් ලිවීමට අපොහොසත් වීම ගැනය. එනමුත් මට හැකි පමණ ශක්තියෙන් මෙය ලීවෙමි. එයින් ඔබ සෑහීමකට පත්නොවූයේ නම් මට සමාවන ලෙස ඉල්ලමි.

දැන් මෙම ජීවිත කථාව නිම කරමි. මෙහි යම් ප්‍රමාද දෝෂ ඇත්නම්, වැරදි ලෙස ඉදිරිපත් කර ඇත්නම් ඒ පිළිබඳ නැවතත් සමාව අයදින්නේ ආචාර්ය මන්ගෙනි. උන්වහන්සේ මගේ ආදරණීය පියතුමා වේ. මම උන්වහන්සේගේ සිසු පුත්‍රයෙක් වෙමි. මා තුළ ධර්මය උපදවා ඇත්තේ උන්වහන්සේය. මෙත්තා කරුණා බලයෙන් ඔබ සැමට සතුට සාමය ලැබේවා! ඔබ තුල ශ්‍රද්ධාව පින් ඇතිවීම නිසා උන්වහන්සේගේ අඩිපාරේ ගමන් කිරීමට හැකිවේවා! තායිලන්තය දිනෙන් දින සමෘද්ධිමත් වෙමින් කිසියම් සතුරු ව්‍යසනයකින් පීඩා නොවේවා! ස්වභාවික විපතින් මිදේවා! තායි ජාතිකයින් නිරන්තරයෙන් බබලවත්වා!

මා වනගත වූ කැලෑ පරිසරයකට ඇබ්බැහි වූ කෙනෙක්මි. එබැවින් මගේ කෘත්‍යය ශාස්ත්‍රීය නොවන බව පිළිගනිමි. මෙහි අන්තර්ගත කරුණු හා

ඉදිරිපත්කිරීම න්‍යායානුකූල නොවීම ගැන මම නැවතත් සමාව අයදිමි. මගේ ජීවිතය හැසිරීම, චරිතය, කැලෑ පරිසරයට පුරුදු වූ නිසා උගත් සමාජයට සරිලන ලෙස පරිවර්තනය කළ නොහැකි වෙමි. මගේ නූගත්කම නිසා මෙම ග්‍රන්ථය කඩින් කඩ වී පිළිවෙලක් නැතිව නොගැලපෙන ස්වභාවයක් ඇත. පාඨක ඔබට නොපැහැදිලි පුනරුක්ත ආදියෙන් වෙහෙසට පත්වූයේදැයි සිතමි. එබැවින් මගේ අඩුලුහුඬුකම් ගැන මෙතරම් සමාව අයදිමි.

මෙම කථා පුවත ලිවීමට පෙර මම බොහෝ කාලයක් මේ පිළිබඳ සුපරීක්ෂාවෙන් කල්පනා කළෙමි. එබැවින් නොයෙක් ආචාර්යවරු හමුවී ඒ අය ආචාර්ය මන් පිළිබඳ දැරූ මත විචාලෙමි. එම ආචාර්යවරු ආචාර්ය මන්ගෙ ගෝල පිරිස වූ නිසා ඉතා කිට්ටු සම්බන්ධතාවයක් තිබුණි. අන්තිමේදී මමද උන්වහන්සේගේ ඇසුරින් ලබාගත් කරුණු ඉදිරිපත් කළෙමි. මේ සඳහා අවුරුදු ගණනාවක් කරුණු එකතු කළෙමි. එහෙත් එම කරුණු ගොනු කිරීමේදී අනුක්‍රමය සහ අනුපිළිවෙල බොහෝ විට වෙලී පැටලී අවුල්සහගත විය. මෙය පාඨක ඔබට වෙහෙසක් වූ බව නිසැකය.

මෙම චරිත කථාවේ සම්පූර්ණ වගකීම මම භාරගනිමි. මගේ දුර්වලකම් ගැන මට සෑහෙන අවබෝධයක් ඇති බැවින් ඔබගේ විවේචනාත්මක අදහස් දැක්වීම ගැන සතුටුවෙමි. එමෙන්ම ඔබගේ සිතේ ඇතිවූ සතුට ප්‍රකාශ කිරීමද මට වැදගත් වෙත්. මක්නිසාද යත් මෙම පොත් ඉතා සුළු වූ හෝ සේවයක් සිදු කිරීම නිසා මට විශාල කුශලතාවයක් ඇතිවන බව දැනගැනීමට හැකිවීමයි.

මෙම පුස්තකය ලියා ලබාගත් පින ඔබ සැමට හා මට උදව් උපකාර කළ සැමට ඒකාකාරව ලැබේවා. කර්තෘ වශයෙන් මම ඉල්ලා සිටින්නේ ආචාර්ය මන්ගේ නාමය ඔබ මතකයේ නොසැනසෙන ගෞරව භක්ති ප්‍රණාමයක් වේවා යන්නයි.

අවසාන වශයෙන් බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රයේ ආනුභාවයෙන් ද ආචර්ය මන් ගේ ආනුභාවයෙන්ද මගේ සීලාදී ගුණයන්ගේ ආනුභාවයෙන්ද පාඨක ඔබ සුවපත් වේවා. ශ්‍රීසපාද ග්‍රන්ථ ප්‍රකාශකයන්ගේ අප්‍රතිහත ධෛර්යය නිසා මා කොටස් වශයෙන් සැපයූ අත් පිටපත මුද්‍රණ දෝෂ රහිතව යථා කාලයේදී එළිදැක්වූ බව ස්තූතිපූර්වකව සඳහන් කරමි. කිසිවිටක එතුමන්ලා මට මෙහි දුෂ්කරතාවය ගැන පැමිණිල්ලක් කර නැත. ඒ සැවොම නිදුක් නිරෝගී වෙත්වා ! උතුම් නිවනින් සැනසෙත්වා !

# උපග්‍රන්ථය I

## නොයෙක් සැක වලට පිළිතුරු

ආචාර්ය මන් ගේ ජීවිත කථාව මුලින්ම මුද්‍රණගත වූ විට උන්වහන්සේගෙ " චයයීාව, ජීවිතය, පිළිවෙත් පිළිබඳ බොහෝ අයගේ සැක සහිත විවේචන ආචාර්ය මහා බූවා වෙත යොමු විය. රහතන්වහන්සේ පිළිබඳ බොහෝ කාලයක් දැරූ මතිමතාන්තර අනුව යම් යම් ප්‍රවෘත්ති සැසඳෙන්නේ නැති බව ඔවුන් කීහ. ආචාර්ය මහා බූවා එම ප්‍රශ්නවලට ඉක්මන් පිළිතුරු සැපයූහ. මුලින්ම සාමාන්‍ය මිනිසාගේ ඉන්ද්‍රියන්ට ගොදුරු වූ සම්මුති සත්‍යයෙන් ඉතා ගැඹුරු අස්වාභාවික දැනුම මනින්ට බැරි බව පහදා දුන්හ. පාළි භාෂාව දැන උගත් පණ්ඩිත උගතුන් පොත පතේ සඳහන් නුවණ වලට සීමා වී ඇත. එහෙත් බෞද්ධ භාවනා තුළින් අත්දකින අනන්ත දැනුම ඒ අයට නැත. ඒ ප්‍රායෝගික භාවනා දියුණුව නැති බැවිනි.

ආචාර්ය මන් නිතරම තම ශිෂ්‍යයින්ට ප්‍රකාශ කලේ තමන් වහන්සේට අවබෝධ වන ධර්ම කරුණු අනන්ත අප්‍රමාණ බවත් ඒ සියල්ල වචනෝද්ගත කිරීමට නොහැකි බවත්ය. උන්වහන්සේටවත් අදහාගත නොහැකි විස්මිත දේ නිතර දකින්ට ලැබුණි. එම අනුසාරයෙන් උන්වහන්සේ තුළ කිසියම් සැකයක් නැති බවත් බුද්ධා දී රහතුන් වහන්සේලාගේ දැනුම කියා නිමකළ නොහැකි බවත් එය සිතීමට පවා නොහැකි බවත් පැවසීය.

පාළි ත්‍රිපිටකයේ සඳහන් ධර්මය කුඩා බඳුනක ඇති ජලය වැනිය. එහි සඳහන් නොවූ ධර්ම මහා සාගර ජලය හා සමානයැයි ආචාර්ය මන් පැවසීය. බුදුරජාණන්වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු සියගණන් ගතවූ පසු ත්‍රිපිටකය සකස් වූ බව පිළිගත යුතුය. මෙය බලවත් බේදවාචකයකි. පසුකාලීන ග්‍රන්ථ කතෘවරුන්ගේ මති මතාන්තර හා වෙනත් අයගේ දෘෂ්ටි මෙහි ග්‍රන්ථාරූඪ වී ඇත. එබැවින් අප කරා පැමිණ ඇති නිකාය ග්‍රන්ථ ගැන සෑහීමකට පත්විය නොහැකිය. එය සම්පූර්ණ බුද්ධ වචනය ලෙස පිළිගත නොහැකිය.

ආචාර්ය මන් නිතර පැවසුවේ බුද්ධ වචනය. එනම් බුදුන් වහන්සේගේ ධර්ම දේශනාව අතිශයින් විස්මිත වූ අති පාරිශුද්ධ චිත්ත සන්තානයකින් ගලා එන අතිපාරිශුද්ධ නිවැරදි එකාන්ත සත්‍යතාවයක් බැවින් අසා සිටින බොහෝ දෙනාට මග්ග ඵල ලබාගැනීම පහසු වූ බවයි. එවැනි අව්‍යාජ, පරම සත්‍යය ධර්මය බුදුරජාණන් වහන්සේ හෝ රහතන් වහන්සේලා දේශනා කරන විට

එය පහසුවෙන් අවබෝධ වී අසා සිටි අයගේ සිතේ විශාල විපර්යාසයක් සිදුවීම පුදුමයක් නොවේ. එහි අදහස හදවත වේගවත්ව විනිවිද යයි. නමුත් ත්‍රිපිටකය අපි ඉගෙන කටපාඩම් කළ යුතුය. කිසිවෙක් ත්‍රිපිටකය මෙසේ ඉගෙන ගන්නා විට මාර්ගඵල වලට පැමිණ ඇද්ද? සූත්‍ර ඇසීමෙන් හෝ සජ්ඣායනා කිරීමෙන් මගඵල ලබාඇද්ද? මෙයින් අදහස් කරන්නේ ත්‍රිපිටකයෙන් වැඩක් නැත යන්න නොවේ. බුද්ධ වචනයෙන් කියන ධර්මය හා සසඳා බලන කල එය එතරම් සාර්ථක නොවන බවයි.

මා කියන දේ සාවධානව අසත්වා. බුදුවදන බුදු මුඛයකින් දේශනා කිරීමේ ආශ්චර්‍යය නම් අසා සිටින්නන්ගේ කෙළෙස් දුරුවීමයි. එය සියලු දුක් නැසීමකි. මේ ධර්මය දේශනා කරන හැම විටම බුදුවරු මෙම ආශ්චර්‍යය පෑහ. එය ඉතා ශක්තිමත් තුන්ලෝකයම කම්පාවන සත්‍යතාවයකි. එබැවින් බෞද්ධ පින්වතුන් පොතට සීමාවී කටපාඩම් කර නොයෙක් මතිමතාන්තර වලට බැස ගැනීම මානා දෘෂ්ටි ඇතිවීමට ඉවහල් වේ. මේ අය චතුරාර්‍ය සත්‍යය තම සිත කය තුළින් අවබෝධ කිරීම වෙනුවට බුදුවදන ඉගෙන පාඩම්කර එය තමාගෙ " පුද්ගලික අයිතියක් ලෙස ආරක්ෂා කරති. ධර්මය මෙසේ ඉගෙන අනුන්ටත් කියා දී තමන් ධර්මධරයෙක් ලෙස පෙනී සිටියත් කෙළෙස් අහස උසට තම සන්තානයේ ඇතිවිය හැකිය.

ඔබ සති පඤ්ඤාවෙන් ආරක්ෂා විය යුතුය. ධර්මය ඉගෙන ගෙන එය තමා සමඟ අනිත් අත්බවට රැගෙන ගිය නොහැකිය. ඒ දැනුම මෙහිදීම අහෝසි වේ. බුදුදහම ඉගෙනීම හෝ ඉගැන්වීම ගැන මම විවේචනය නොකරමි. ධර්මය ඉතා වැදගත්ය. එහෙත් එය ශ්‍රී මුඛයෙන් දේශනා කරණ බුදු වදන තරම් ශක්තිමත් නැත. බුදු වදනේ එවැනි අතිපාරිශුද්ධ මනස්කාන්ත පුදුම ස්වර ගැලපීම ද අදහසද කෙතරම් චමත්කාර වේද? ඒ බුදු කෙනෙකුගේ අති පාරිශුද්ධ සිතින් පැන නගින සූවාසු දහසක් ධර්ම ස්කන්ධයකි. සූවිසි කෙල ලක්ෂගණන් මහා වජිර සමාපත්ති ඥාණයෙන් වදාරණ බුදු බණ පසුකාලීනව ලීවේ රහතන්වහන්සේලා විසින් පමණක් යැයි අප අදහන්නේ කෙසේද? යම් යම් මතිමතාන්තර බුදුවදන ලෙස රහත් නොවූ අය විසින් ග්‍රන්ථාරූඪ කර ඇති බව සිතිය හැකිය''

මේ ආචාර්‍ය මන්ගේ දේශනාවල සාරාංශය වේ.

රහතන් වහන්සේලා පැමිණ ආචාර්‍ය මන් සමඟ ධර්මය සාකච්ඡා කර ඇති බවත් නිවන් අවබෝධ කළ විධිය පවා කාය සාක්ෂියෙන් පෙන්වා ඇති බවත් සඳහන් වේ. ත්‍රිපිටකයේ සඳහන් නොවූ බොහෝ ධර්ම කොටස් තිබිය හැකි බව අප පිළිගත් විට ධර්මය ප්‍රායෝගිකව පුරුදු කිරීමේදී ලැබෙන අත්දැකීම් තිබිය හැකිබව පිළිගත යුතුය. රහතන්වහන්සේලා ධර්මය අවබෝධ කළේ යම්

යම් පොත්පත් ඉගෙනීමෙන් නොවේ. උන්වහන්සේලා අත්දැකීමෙන් භාවනා පිළිවෙත් තුළින් සාක්ෂාත් කළ ධර්මය ඉතාම සත්‍ය විය යුතුය. එය වැරදි යැයි සම්මත කිරීම මුළු ත්‍රිපිටකයම වැරදි යැයි කීමකි. රහතන්වහන්සේලා සංඝරත්නයට අයත් මහා ධර්ම සංකේතයකි. එබැවින් අපි සරණ යමු. ඔබ සරණ යන්නේ මේ අති උතුම් බුද්ධ ධම්ම සංඝ යන තෙරුවන්ද නැත්නම් පොත පතේ සඳහන් වූ යම් ස්වල්ප කරුණු ඔබට වැටහීමට අනුව සත්‍යය යැයි ඔබේ පිළිගැනීමද? යමෙක් ප්‍රවේසමින් තම ආහාර අනුභව කළ යුතුයි උගුරේ කටුවක් හිරවීමට හැකිය.

# උපග්‍රන්ථය II

## චිත්තය - යනු දැනීමේ ස්වභාවයයි

ආචාර්ය මහා බුවාගේ යම් දේශන තුළින් සිත පිළිබඳ උපුටාගත් ධර්ම කරුණු මෙහි දක්වා සිටිමු.

සිත පූර්වංගම වේ. සිත යනු දැනීම ගෙන දෙන්නකි. එය ප්‍රාථමික, පිරිසිඳු දැනීමයි. සිත යනු දැනීම වේ. හොඳ නරක දෙක දැනීමකි. විචාරාත්මක නිරීක්ෂණයක් ඉන්පසු සිතේ ඇති කෙරේ. සිතේ මෙම කාර්ය සම්භාරය සමහරවිට ''සතිය'' යනුවෙන් හැඳින් වේ. සමහරවිට ප්‍රඥාව නමින් හැඳින් වේ. එහෙත් පිරිසිඳු ප්‍රාථමික චිත්තයේ සිතිවිලි නැත. එහි ඇත්තේ ''දැනීම'' පමණි. සිතේ ඇති විඤ්ඤාණ නිතර උප්පාද - මය වශයෙන් සැදි සැදී බිඳි බිඳී යයි. විඤ්ඤාණය තුළින් බාහිර අරමුණු ස්පර්ශ කෙරේ. ඇස සහ රූපය නිසා සිතේ සංඛාර හටගනී. ඉන්පසු සිතිවිලි ධාරාවල් නොකඩවා ක්‍රියාත්මක වේ. මෙය සිදු නොවන විට සිතේ ප්‍රකෘති ශක්තිය වූ ''දැනීම'' පමණක් පවතී.

එහෙත් සාමාන්‍ය පුද්ගලයාගේ සහ රහතන්වහන්සේගේ ''දැනීම'' වෙනස් වේ. සාමාන්‍ය අයගේ දැනීම කෙළෙස් වලින් දූෂිත විය හැකිය. ඛීණාස්ව රහතුන්ගේ දැනීම එවැනි කෙළෙස් නැති බැවින් ඉතා පිරිසිඳු දැනීමකි. එය විස්මිතය. එහි සතුට අසීමිතය. ඉන් රහතන්වහන්සේලා ශාන්ත ප්‍රණීත නිවන ඇසුරු කරති. එය නොකඩවා සිත්හි රැඳී ඇත. හේතු ප්‍රත්‍ය නිසා වෙනස් නොවේ. එවැනි වෙනස්වීම් සිදුවන්නේ සාමාන්‍ය පුද්ගල සන්තානයේය. එම හේතුප්‍රත්‍ය අනිත්‍ය, දුක්ඛ, අනාත්මයෙන් පීඩාවට පත්වේ. එවැනි ලෞකික තත්ත්වයක් රහතන්වහන්සේගේ සන්තානයේ නැත. එය නිතරම පිරිසිඳුව පවතී.

ඉතා පිරිසිදු වූ ඒ සිත, දැනීම පමණක් ඇති කෙරේ. මෙය ප්‍රකෘති සිතය - අවසාන සිතය. නැවත ඉපදීමක් නැත. එබැවින් ජාති, ජරා ව්‍යාධි මරණ නිමාවකට පත්වේ. ඊට හේතුව ඒ සැඟවී තිබූ කෙළෙස් ඉවත්වීමය.

එවැනි තත්වයකට පැමිණෙන තුරු නැවත උප්පත්තියක් ඇති කෙරේ. නොයෙක් දෙනා පුනර්භවය විශ්වාස කළත් නොකළත්, මරණයෙන් අවසාන වෙතියි උච්ඡේද දෘෂ්ටියට පත්වුනත්, ඒ කිසිවකින් සත්‍යය වෙනස් නොවේ. සිතේ දැනීම ස්වභාවිකය. එය යම් මතිමතාන්තරයෙන් වෙනස් කළ නොහැකිය. එක් එක් දෘෂ්ටි මාත්‍රයෙන් වෙනස් නොවේ. කර්මය හා ස්වභාවය යටපත් කිරීමට නොහැකිය.

ඒ නිසා උපන් සත්වයා මරණින් මතු උප්පත්තියක් ලබයි. එය කර්මානුකූලව පොළොවේ, අහසේ, ජලයේ සත්ව, ප්‍රේත, දේව බ්‍රහ්ම වශයෙන් ලබති. දේව ආදී ජීවීන් මිනිස් ඇසට නොපෙනුණත් සිත එවැනි පරිසරයකට පත්වීම සිදුකරන්නේ ඊට අදාළ කර්ම හේතුවෙනි. කර්ම යනු සිත මෙහෙයවන ශක්තියයි. කර්මය විසින් මෙහෙයවන චිත්තය සසර සැරිසරති. සිත ඉතා සූක්ෂම ස්වභාවයක් නිසා සිත යනු කුමක්දැයි අපේ වචනවලින් හැඳින්වීම දුෂ්කරය. භාවනා තුළින් සිත සමාධිගත්විට පමණක් සිතේ ස්වභාවය දැනේ. සිත හඳුනාගැනීමට සමාධි වනතුරු නොහැකි වේ.

සිරුර තුළ සිත පවතින නමුත් සිත හඳුනා ගැනීම දුෂ්කරය. එය ඉතාම සූක්ෂම ප්‍රයෝගකාරී තත්ත්වයකි. ශරීරය පුරා විහිදී ඇත. සිත යන්න කොටස් වශයෙන් හෝ ක්‍රියා වශයෙන් හෝ විස්තර කළ නොහැකිය. භාවනා යෝග ීන්ට මේ සිත කය වෙන් වශයෙන් අවබෝධ වේ. සමාධි ගත වූ සිතට මේ වෙනස නිර්ණය කළ හැකි වුවද සමාධියෙන් නැගී සිටි විට සිතේ ස්වභාවය හඳුනාගත නොහැකිය.

සිත ශරීරයෙන් වෙන්වුවද එහි එකට බැඳී ඇති වේදනා සඤ්ඤා සංඛාර වෙන්කළ නොහැකිය. එය කළ හැක්කේ ප්‍රඥාවෙන් පමණි. මේ සිත ශරීරයෙන් පරිබාහිර බව තේරුම් ගිය විට ''මගේ ශරීරය'' යන පිළිගැනීම දුරු වේ. එහෙත් සිතේ වේදනාව, මතකය, මනසිකාරය, සිතිවිලි, විඤ්ඤාණය වෙන් වශයෙන් හඳුනාගැනීමට නොහැකි වේ. පඤ්ඤාවෙන් මේ වෙනස් වූ සිතේ සාධක අවබෝධ වේ. එවිට ''සංදිට්ඨික'' ගුණය වූ ධර්මය පිහිටා ඇත. මේ පංච ස්කන්ධයම සිතේ පරිබාහිර සාධක බව එවිට වැටහේ. මේ තුන්වන විශ්ලේෂණයයි.

අවසාන වශයෙන් අපේ සියලුම මුලාවට හේතු වූ අවිද්‍යාව ගැන සිත යොමු වේ. අපි අවිද්‍යාව වචනයක් ලෙස දැන ඇති නමුත් මේ අවිද්‍යාව සිතේ සැඟවී

ඇති අන්දම නොදනිමු. ඇත්තෙන්ම අවිද්‍යාව හලාහල විශයක් මෙන් මුළු සිත තුළ කිඳා බැස ඇත. අපට එය නොපෙනුනත් එය සැඟවී ඇත. මේ අවස්ථාවේදී බලවත් සති පඤ්ඤා, විරිය යොදා එම විෂ ඉවත් කළ යුතුය. අවසාන වශයෙන් මේ අවිද්‍යාවද සිතින් තුරන් වේ.

සිතේ තිබූ මේ සාධක එකින් එක ඉවත් වූ විට සිත සියලු කෙලෙස් වලින් මිදී පිරිසිදු වේ. මේ අවසාන වශයෙන් අවිද්‍යාව ඉවත් කළ විට එය නැවත හටගැනීමක් නැත. සිතට ඇත්තේ සත්‍ය වූ මිදීමකි. විමුක්තියකි. ශරීරය රෝගාතුර වූ විට එය ශරීරය බව තේරුම් ගනී. එබැවින් රෝග ලක්ෂණ වලින් පෙළීමක් නැත. සාමාන්‍ය පුද්ගලයාගේ ශාරීරික රෝග නිසා මානසික පෙළීමක් ඇති වේ. එහෙත් සිත සම්පූර්ණයෙන්ම නිදහස් වූ විමුක්තිය ඇති විට ඒ බලවත් ශාරීරික දුක් නිසා සිතේ දුකක් නැත. සිතේ සතුට නිතරම සන්තෘප්තව පවතී. ශරීරය සහ වේදනාව සිත ඇසුරු කළ නමුත් සිතේ කොටසක් නොවේ. එබැවින් සිත වේදනාව දෙස බාහිර අරමුණක් ලෙසින් බලයි. එහෙයින් වේදනාවට සිත යටත් නොවේ. මෙසේ සිත සමඟ ශරීරය හා වේදනාවේ එකතුවීමක් නැති වේ. මෙය වනාහි සිතේ අද්විතීය විමුක්තියයි. සිත නිදහස් වේ.

ඉතාමත් පිරිසිදු දීප්තිමත් භාවයක් ඇති මේ සිත සියලුම දේ ස්පර්ශ කරයි. සියළුම ලෞකික දේ අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාවයට යටත් වූ නමුත් මේ සිත ඒවායින් කම්පා නොවේ. මෙම තිලක්ෂණයට සියලු දේ අයත් බැවින් අරමුණු සිතට බලපායි. එම අරමුණු බඹරයක් මෙන් සිත කළඹා දමයි. එනමුත් සිත ඒ හා සමග යමින් විනාශ නොවේ. මේ අමත ගුණය නිසා සිත ඒකාකාරව පවතී. විනාශ කළ නොහැකි බැවින් අනිත්‍ය දුක්ඛ අනාත්මයෙන් වෙනස් නොවේ. එසේම සියලු විශ්ව ධර්‍මතා අදාළ මේ සිතට නොවේ. සාමාන්‍යයෙන් අපගේ සිත සම්මුති සත්‍යයෙන් අරමුණු ගෙන ඒ හා සම්බන්ධ වී යටත් වී ඒ ප්‍රකෘති අතිපිරිසිදුතාවය වසා සිටී. ඒ බව අප නොදන්නා බැවින් ඊට වසඟ වේ.

කෙළෙස් වලට වසඟ වූ සිත උප්පත්ති මරණයට පත් වේ. එහෙත් අපගෙ මෝහය මේ කෙළෙස් නිසා ඇතිවන බැවින් අපට මේ සත්‍යය නොතේරේ. උප්පත්ති මරණ කෙළෙස් නිසා සිදුවන්නකි. අපගේ එකම ගැටළුව, ප්‍රාථමික ස්වභාවය නම් සිතට ස්වාධීන වී සිටිය නොහැකි බවයි. ඒ නිසා ව්‍යාජ අරමුණු ඇත්ත හැටියට පිළිගනී. එබැවින් සිතේ ප්‍රකෘති ස්වභාවය යටපත් වී ඇත. ඒ වෙනුවට සිත වසඟ කළ කෙළෙස්, මායාකාරයෙක් මෙන් කපටි ලෙස රවටා ගනී. එසේ හෙයින් නිතරම භය සැක දුකට පාත්‍ර වේ. සිත ජීවත්වීමට හා මැරීමට බිය වේ. පොඩි වේදනා හෝ ලොකු වේදනා නිසා බලවත් ලෙස

කම්පා වේ. ඉතාම සුළු දෙයකින් වුවද කම්පා වේ. මේ නිසා සිත නිතරම හයින් සැකෙන් පීඩා විඳී. සිතේ ප්‍රකෘති ස්වභාවය මෙය නුවූවත් කෙලෙස් තුළින් මෙය සිදු කරයි.

සිත කෙලෙස් වලින් සම්පූර්ණයෙන්ම වෙන් වූ විට, පමණක් සිත නිර්භය වේ. එවිට භය හෝ නිර්භය කියා දෙයක් නැත. සිතේ ස්වභාවික ගතිය පමණක් ඉතිරි වේ. සදාකාලිකව කිසියම් දෙයක් මත රඳාපවතින්නේ නැත. කාලය හෝ අවකාශය අදාළ නැත. එය විද්‍යමානවීමක් පමණි. මෙය වනාහි ''සැබෑ චිත්තයයි''. සැබෑ චිත්තය යනු සියලු කෙළෙසුන්ගෙන් මිදුනු අතිපිරිසිදු - සඋපාධිශෙෂ නිර්මාණ හෙවත් රහතුන් වහන්සේගේ සිතයි. මේ හැර අන් කිසි සිතක් ''සැබෑ චිත්තය'' නොවේ. මේ සිත අන් කිසි තත්ත්වයකට සමාන නැත.

''පභ සසරම්දං භිකඛවෙ චිතතං තඤච ඛො ආගනතුකෙහි

උපකකිලෙසෙහි උපකකිලිටඨං'' යන බුද්ධ වචනය අංගුත්තර නිකා-යේ සඳහන් වේ. එහි අදහස වනුයේ මහණෙනි මුල් සිත ප්‍රභාෂ්වරය. එය ආගන්තුක කෙළෙස් වලින් ගැවසී ගත් විට කිළිටු වේ. මෙහි මුල් සිත යනු සම්මුති සිතයි. එය ප්‍රකෘති සිත නොවේ. මේ සම්මුති සිත අරහයා පභසසර මිදං චිත්තං ..... ආදි වශයෙන් දේශනා කරන ලදී. එය ප්‍රභාසසර වුවද පාරිශුදධිය පරමාතථ වශයෙන් නැත. බුද්ධ දේශනාව ඒකාන්ත සත්‍යයකි. ඒ පිළිබඳ විවේචනයක් නැත. එහෙත් බුදුරජාණන් වහන්සේ මුල් සිත ප්‍රකෘති සිත වශයෙන් හඳුන්වා නැත. එසේ වූයේ නම් මෙවැනි ප්‍රශ්නයක් මතු වේ. ''ප්‍රකෘති සිත පිරිසිඳු නම් එය නැවත ඉපදෙන්නේ ඇයි? රහතන්වහන්සේ තම සිත පිරිසිඳු කළ පසු නැවත නූපදියි. එම සිත මුලදී පිරිසිඳු නම් නැවත පිරිසිදු කිරීමක් අවශ්‍ය නොවේ. එම ප්‍රභාස්වර සිත පිරිසිඳු කළ හැකිය. මක්නිසාද යත් එහි පවතින අවිද්‍යාව නිසා ප්‍රභාස්වර වීමක් සිදු වී ඇත. මේ ප්‍රභාස්වර සිත ඉක්මවා යන භාවනායෝගී පින්වතා එම අවිද්‍යාවෙන් මිදී පරම විමුක්තිය වූ නිවන සාක්ශාත් කරයි. එම රහතන්වහන්සේගේ සිත ප්‍රභාස්වර නොවේ. මේ මොහොතේදී අද්විතීය සත්‍යය වූ නිවන සාක්ශාත් කරයි. එවිට සිත යනු කුමක්දැයි වැටහේ.

චිත්තය ඉතාම පිරිසිඳු වූ විට මහත්සේ ආලෝකමත් වූ ප්‍රභාස්වර ගතියක් ඇත. නිහඬ පරිසරයක හෝ රාත්‍රි කාලයෙන් තම සිත මෙවැනි ආලෝකයෙන් බබළයි. සමාධි නොවූ විටද මේ බැබළීම ඇත. එය වචනාතික්‍රාන්ත බැවින් විස්තර කළ නොහැකිය. මේ සියුම් ආලෝකය දස අත විහිදී යයි. එවිට

ඇස් කන් නාසා දී ඉන්ද්‍රියන්ගෙන් අරමුණු නොගනී. ඒ වෙනුවට එම සිතේ දෘෂ්‍යමාන ආලෝකය අරමුණු වේ. එය මෝහනය කිරීමක් වැන්න. එතරම් ශක්තිමත්ව අරමුණ අල්ලාගන්නා බැවිනි. සමාධි නොවුවද මෙය සිද්ධ වේ.

ශරීරයට අදාල නොවූ මෙම ඉතාමත් සූක්ෂම වූ දැනුම සිතේ පවතී. සිත ඉතා බලවත්ය. දැනුම එතරම් බලවත්ය. වෙන කිසි අරමුණක් හෝ ප්‍රතිබිම්බයක් එහි නැත. මෙම දැනීම හිතේම ස්වභාවයකි. මේ සිතේ එක් ලක්‍ෂණයකි.

වෙනත් ලක්‍ෂණයක් ඇතිවන්නේ මේ සිත සමාධිගත වූ විටය. එහි සිතිවිලි හෝ මනඃකල්පිත කිසිවක් නැත. සියලුම ශාරීරික මානසික ක්‍රියාවලිය නිශ්චලය. හුදකලා විවේකයකි. එහි ඇත්තේ සිතේ ''දැනීම්'' මාත්‍ර පමණි. මෙය ඉතාම තියුණු තීක්ෂණ දැනීමකි. මුළු විශ්වය වසා සිටී. ආලෝක ධාරාවක් ඈත හෝ දුර යා හැකි සීමාවක් ඇත. එහෙත් මේ සිත එසේ සීමා නොවේ. විදුලි බල්බයක එහි ඇති ''watt'' ප්‍රමාණයට සීමා වූ ආලෝකයක් විහිදුවයි. එහෙත් මේ සිතේ ක්‍රියාකාරිත්වය ඊට වඩා හාත්පසින් වෙනස් වේ. ඇත්තෙන්ම මේ සිත කාලය හෝ අවකාශ වැනි සංඥාවලින් නිදහස්ය. ඈත දුර ළඟ මෙනි. මේ සිතේ එවැනි ස්වභාවයක් ඇත. මුළු විශ්වය පුරා පැතිරී ඇති. ''දැනුම්'' ස්වභාවයකි. මේ දැනීම හැර විශ්වය තුළ කිසිවක් නැත. සිතේ කෙළෙස් ආවරණය නැති බැවින් ලෝකය සුහදත්වයකින් දැනේ.

මේ අතිපාරිශුද්ධ චිත්තය වචන වලින් විස්තර කළ නොහැකිය. ලෝකයේ ඇති සම්මුති සත්‍යය වචනයෙන් විස්තර කළ හැකි නමුත් සම්මුතිය විනිවිද දකින පරමාර්ථ සත්‍යය මේ සම්මුති වචනයට සීමා කළ නොහැකිය.

ඇයි අපි සම්මුති සිතක් සහ පාරමාර්ථ සිතක් වශයෙන් විග්‍රහ කරන්නේ? මේ සිත් දෙකක්ද? නැත. එකම චිත්ත ස්වභාවයකි. එහෙත් සිත කෙළෙස් හා ආසා වලින් පාලනය වන විට එහි වෙනස් ලක්ෂණයකි. ප්‍රඥාව නමැති ශෝධකයෙන් පිරිසිදු වූ විට, එම සිත කෙළෙස් පීඩාවෙන් චංචල වී අනිත්‍යතාවයට පත් නොවේ. හේතු ප්‍රත්‍යවලට අයත් වූ අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්ෂණ එහි විද්‍යමාන නොවේ.

කෙළෙස් යනු අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාවයක් බැවින් සම්මුති සත්‍යයට අයත් වේ. මේ සම්මුති ස්වභාවය සිත අරක් ගත් බැවින් එහි සම්මුති ලක්‍ෂණය තිබූ නමුත් මේ කෙළෙස් දුරු කිරීමේදී විද්‍යමාන වන සිත එම සම්මුතිය පරිහරණය නොකරයි. මෙය වනාහි පරම විමුක්තියයි. පරම පවිත්‍රතාවයයි. සියලු සංසාරික බැඳීම්වලින් නිදහස් වේ. සිතේ ප්‍රකෘති ''දැනීම'' එහි ඇති එකම ස්වභාවයයි.

ශරීරයේ කොතැනක ''දැනීම'' විද්‍යාමාන වේදැයි කිව නොහැකිය. සමාධිගත වූ සිත තුළින් මුලදී හෘද වස්තුව ඇසුරු කරණ බවක් හැඟේ. විශාල ආලෝක ශක්තියක් මෙම ප්‍රදේශයෙන් විහිදෙන බව දැනේ. භාවනායෝගී පින්වතුන් මේ බව දනිති. එය මොළයේ විද්‍යාමාන වේයැයි නොකියති.

එහෙත් චිත්ත පාරිශුද්ධියට පත්වූ විට මේ කේන්ද්‍රස්ථානය අතුරුදහන් වේ. ශරීරයේ උඩ යට සිරස හෝ කිසියම් තැනක සිත ඇතැයි කිය නොහැකිය. එම පරමාර්ථ සත්‍යය අප අතිපාරිශුද්ධ වශයෙන් සම්මුතියෙන් කිව යුතුය. සිත දැන් මේ ස්කන්ධ ඇසුරුකර පවතින නමුත් මිශ්‍රවීමක් නැත. මේ ස්වභාවය වෙන් වෙන් බව අවබෝධ වේ.

සාධු සාධු සාධු.

ඉදමව එයැ ඔර්බික්එදර සබ එද ඤබටකසිය

ඊදරබ සෲසපය්රා ඍ ඊහරාල නරග එ උසබපයිැඑැර සබ 1948 ඊයසනනයම ිසක්ර්ඒබද ඒ දරා්සබැ ි ඊමාායසිඑ එදබන එ ඊබටනදනල ඔය්සක්බා සබ 1977ල ඒඩසබට කරඍහ මබාැරටදබැිඩැර්ක හැරි දං ඊමාායසිඑ එර්සබසබට සබ ෂබාස් බ ිරස බ්බන්ලි සබජැ යසි රාසබ්එසදබල යැ යී ඉැබ රිසාැබඑ සබ ඔය්සක්බාල චර්පඑසිසබට මබාැර එයැ ඒඑැක්ටැ දං ජ්රහ් ඒය් ඊදදඅ්ග

සිංහල පරිවර්තනය

ශ්‍රී ලාංකික ගරු ආචාර්ය කුසුමා භික්ෂුනීන්වහන්සේ, උපන් වර්ෂය 1929යි. මහණ උපසම්පදා ලැබුවේ දඹදිව සාරානාත්හි 1996 දී. ලොක බෞද්ධ සංඝ

සභාවේ සාමාජිකාවක් වූ එතුමිය ඉන්දියාවේ සහ ලංකාවේ පුහුණුව ලැබ ලංකාවේ සුප්‍රසිද්ධ භික්ෂූන්වහන්සේලා වූ ගරු බලංගොඩ ආනන්ද මෛත්‍රිය නාහිමි, කඳුබොඩ විසූ ගරු කහටපිටියේ සුමතිපාල හිමි, ගරු ඥාණපොණික නාහිමි, ගරු බදුරලියේ චන්දිම හිමි, ගරු පණ්ඩිත ආදාවල දේවසිරි නාහිමි, මහාචාර්ය හේන්පිටගෙදර ඥාණවාස නාහිමි ආදී භික්ෂූන්වහන්සේලාගෙ ් ශිෂ්‍යාවකි.

විද්‍යා ගුරුවරියක් ලෙස අවුරුදු 12ක් සේවය කර එතුමිය ශිෂ්‍යත්වයක් ලබා ඇමෙරිකාවේ ඉන්ඩියානා විශ්ව විද්‍යාලයේ එදකැජමක්ර ඊසදකදටහ හැද-ඊරුවාය. ඉන්පසු ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ 20 අවුරුද්දක් ඉංග්‍රීසි උපදේශිකාවක් ලෙස සේවය කරන අතර පාළි උපාධියක්ද බෞද්ධ දර්ශනය පිළිබඳ පශ්චාත් උපාධි දෙකක්ද දර්ශන සූරි උපාධියක්ද ලබා ඇත. දැනට ලංකා විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ සහ ඔලබොඩුවේ ආයෂී බේමා මධ්‍යස්ථානයේ වැඩ වෙසෙති.